# මංගල ධර්ම විස්තරය

(දස වන මුද්‍රණය)

සම්පාදනය :

**මහාචාර්ය රේරුකානේ චන්දවිමල**

මහා නායක ස්ථවිරපාදයන් වහන්සේගේ
ප්‍රධාන ශිෂ්‍ය වූ ද,

ශ්‍රී ලංකා ශ්වේජින් නිකායික මහා සංඝ සභාවේ
සම ලේකම්වරයකු වූද,

**ගොඩිගමුවේ සෝරත**

ස්ථවිරයන් වහන්සේ විසිනි.
(රේරුකානේ නාහිමියන් ලියූ සදහම් අමා පත්‍රිකා හා
වෙනත් ලිපි ලේඛන ඇසුරිනි)

*Non-commercial distribution*

දහම් පොත් සංරක්ෂණ මණ්ඩලයෙන් ප්‍රකාශිත

# රේරුකානේ නාහිමියන්ගේ පොත් සහ වෙනත් පොත්

**විනය ග්‍රන්ථ**

ශාසනාවතරණය
විනය කර්ම පොත
උපසම්පදා ශීලය
උභය ප්‍රාතිමෝක්ෂය (අනුවාද සහිත)

**අභිධර්ම ග්‍රන්ථ**

අභිධර්ම මාර්ගය
අභිධර්මයේ මූලික කරුණු
පට්ඨාන මහා ප්‍රකරණ සන්නය
අනුවාද සහිත අභිධර්මාර්ථ සංග්‍රහය

**භාවනා ග්‍රන්ථ**

විදර්ශනා භාවනා ක්‍රමය
පෞරාණික සතිපට්ඨාන භාවනා ක්‍රමය
චත්තාලීසාකාර මහා විපස්සනා භාවනාව
සතිපට්ඨාන භාවනා විවේචනය හා වෙනත් කෘති

**ධර්ම ග්‍රන්ථ**

චතුරාර්‍ය සත්‍යය
පාරමිතා ප්‍රකරණය
බෝධිපාක්ෂික ධර්ම විස්තරය
පටිච්ච සමුප්පාද විවරණය
ධර්ම විනිශ්චය
බෞද්ධයාගේ අත් පොත
මංගල ධර්ම විස්තරය
පුණ්‍යෝපදේශය
සූවිසි මහා ගුණය
පොහොය දිනය
කෙලෙස් එක්දහස් පන්සියය
චෛතසික ධර්ම හා චිත්තෝපක්ලේශ ධර්ම
බුද්ධනීති සංග්‍රහය
නිර්වාණ විනිශ්චය හා පුනරුප්පත්ති ක්‍රමය
බෝධි පූජාව
Four Noble Truths (චතුරාර්‍ය සත්‍යය පරිවර්තනය.)

**වෙනත්**

මෙකල නිවුණු ඇත්තෝ
(නාහිමි චරිත වත හා අනුමෙවෙනි දම් දෙසුම් 15 ක්.)
සුරාධූර්තය හෙවත් මද්‍යලෝලය (වෛද්‍ය නීල් කෙසල් - පරිවර්තන)
බුදුසසුන පුබුදු කළ ශ්‍රී ලංකා ශ්වේජින් නිකාය සියවස (ශාස්ත්‍රීය සමරු කලාපය)

---

විමසීම් :- ගරු ලේකම්
ශ්‍රී චන්ද්‍රවිමල ධර්ම පුස්තක සංරක්ෂණ මණ්ඩලය,
ශ්‍රී විනයාලංකාරාරාමය, පොකුණුවිට.
දුරකථනය : 034-2263958, (2263979) ෆැක්ස් : 034-2265251

*Non-commercial distribution*

# හැඳින්වීම

## ධර්මන්‍යාය

නීතිගරුක සමාජය දියුණුය. නො දියුණු සමාජයක නීති රීති ද නැත. පුද්ගලයකුගේ හෝ ජාතියකගේ ආධ්‍යාත්මික හෝ භෞතික දියුණුව ලබාගත හැක්කේ නීතිරීති මගිනි. නීතිරීති ගරු කිරීම යම්තාක් දුරට දියුණු ද ඒ තරමට ඔවුහු දියුණු වෙති. වැද්දන් ගැන සිතන්නකුට මේ ගැන හරි අවබෝධයකට පැමිණිය හැකිය. ඔවුහු නො දියුණු මිනිස්සුය. ඊට හේතුව: නීති ගරුක මිනිසුන් වශයෙන් ඔවුන්ගේ පරිණාමයක් නො දක්නා ලද හෙයිනි.

ජීවිතයක බාහිරව පැවති නීතිරීති භෞතික දියුණුව ගෙන එයි. එය ලෞකිකය. එමෙන් ම තාවකාලිකය. හොඳින් හෝ නරකින් යමක් උපයා ගැනීමත් පරිභෝගයත් යන දෙක ම ජීවිතයේ එක ම අවධියකදී අවසන් වන්නේත් එතැන් සිට ඔහු පසුතැවිල්ලට යොමුවන්නේත් ඒ නිසා ය. එයින් සැනසීමක් ලද නො හැකිය. ආධ්‍යාත්මික දියුණුව සඳ සුන්දරය. ඉන් විපුල ඵල ලැබේ. බුද්ධ ධර්මය ආධ්‍යාත්මික දියුණුවේ මාර්ගයයි. ඒ ඒ පුද්ගලයන්ගේ චරිත වර්ධනයට පොහෝනා ධර්මනීති ඔවුන්ගේ ම ජීවිතයේ අවයව කොට දැක්වීම දේශනා මාර්ගයෙහි එන සාමාන්‍ය පිළිවෙළයි. **මංගල සූත්‍රය** ද එවැනි ධර්මනීති පද්ධතියකි.

එහිලා කියයුතු විශේෂය නම් චරිත පුද්ගල විසින් බැඳීමක් නැති බවයි. කාගේත් අවධානයට මෙන් ම අභ්‍යාසයට ද සුදුසු බවයි. එක ම මූලික කාරණයක් පදනම් කොට ගත් ජීවිතය අඩියෙන් අඩිය පරම ආධ්‍යාත්මික සැපය කරා ළංවීමක් මෙහි දී දැක්ක හැකි ය. මංගල සූත්‍රය නො සිඳුනු එක ම ධර්ම න්‍යාය මාර්ගයකින් වෙළී තිබේ.

Non-commercial distribution

## ත්‍රිවිධ මංගල

ශ්‍රී සිද්ධාර්ථ ශාක්‍යමුනීන්ද්‍ර සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ විසින් දේශනා කොට වදළ මෙලොව හා පරලොව පිළිබඳ අභිවෘද්ධියට හේතු වූ අතිශ්‍රේෂ්ඨ ධර්ම සමූහය **"මංගල ධර්ම"** නමින් හැඳින් වේ. පුරා දෙළොස් වසක් මඟුල් නම් මොනවාදැයි සෙවූ දඹදිව වැසියනට බුදුරජාණන් වහන්සේගේ මංගල ධර්ම දේශනාවෙන් පසුව එතෙක් ඒ පිළිබඳව ඔවුන් දරා සිටි විවිධ අදහස් බිඳී ගියේය. එද ඇතැම් කෙනෙක් "මුලින් දුටු දේ මඟුලැයි"යි කීහ. තවෙකෙක් "මුලින් ම ඇසූ දේ මඟුලැ" යි ගත්හ. ඒ මතවල නො පිහිටි ඇතැම්හු "මුලින් ලද සුවඳ හෝ රසය හෝ ස්පර්ශය මංගල"යයි කීහ. **මෙසේ දිට්ඨ මංගල, සුත මංගල හා මුත මංගල** වශයෙන් මංගල කරුණු පිළිබඳ නානත්ත්වයක් ඉසුලූ, විවිධ මත දැරූ භාරතීයයනට දෙළොස් වසක් ඉකුත්ව ගියේය. ඒ තාක් ඔවුහු සිතූහ. සාකච්ඡා කළහ. ඒ ඒ අදහස්වලට විරුද්ධව වාද කළහ. එතෙකින් නො නැවතී දෙවියන් අතරට ද මේ සාකච්ඡාව ගියේය. ඔවුහු ද "මංගල කරුණු මොනවා දැ"යි සෙවූහ, දිනක් බුදුරජාණන් වහන්සේ හමුවට පැමිණි දේවතාවෙක් "සමස්ත දිව්‍ය මනුෂ්‍යයන් තුළ මංගල කරුණු පිළිබඳව ඇති වී තිබෙන කුහුල දුරුකොට වදරන ලෙස" අයැදීය. බුදුරජාණන් වහන්සේ මංගල ධර්ම දේශනා කොට වදළේ ඒ අයැදුමෙහි ප්‍රතිඵලයක් වශයෙනි.

## මංගල ශබ්දය

**"මංගල"** යනු ඉෂ්ටාර්ථ සූචක පදයකි. ඒ හැර ග්‍රහභේදය, ශ්‍රේෂ්ඨාර්ථය, දුර්ගාව, ශුභ, පතිව්‍රතාව, පව් නැස්ම ආදිය හා අභිවෘද්ධිය යන විවිධාර්ථයන්හි යෙදෙන මංගල ශබ්දය බුදුරජාණන් වහන්සේ පාවිච්චි කොට වදරන ලද්දේ "අභිවෘද්ධිය" යන අරුත ඔස්සේය. පසු කල එය විග්‍රහ කළ අටුවා ඇදුරෝ **"මං වුච්චති පාපං, තං ගලතීති මංගලං"** යි නිරුක්ති දැක්වූහ. **"මංගල"** යනු පාප සමනයෙන් අභිවෘද්ධියට හේතුවන කරුණු රාශිය යනු ඒ නිරුක්ති අනුව පැහැදිලි ය. මේ සූත්‍රයෙන් අනාවරණය වන කරුණුවලට උත්තම මංගලයයි වදළ හෙයින් ඉන් ඔබ්බෙහි මංගල නාමයෙන් ව්‍යවහාර කළ හැකි දේ වේත් නම් ඒ හැම ආරූඪ වශයෙන් මංගල

Non-commercial distribution

වන නමුත් අර්ථානුගත නො වන්නේ ය. මේ සූත්‍රය එබඳු මඟුල් කරුණු තිස් අටකින් පරිමිත ය.

| | | | | | |
|---|---|---|---|---|---|
| 1,2,6 වැනි ගාථාවන්හි කරුණු | තුන බැගින් | 9 | කි. | } | 38 |
| 3,4,5,8,9,10 ,, ,, | සතර ,, | 24 | කි | | |
| 7 වැනි ගාථාවෙහි මංගල කරුණු | | 5 | කි | | |

මංගල සූත්‍රය දෙස එකවරට බලන්නකුට පෙනී යන්නේ එය ස්වප්‍රධාන වූ වෙන් වෙන් කරුණු තිස් අටක් සංග්‍රහ කළ සූත්‍රයක් වශයෙනි. එහෙත් මුල් ම ශාසනික ප්‍රතිපදාවෙහි පටන් අර්හත් ඵලය කුළුගන්වා පවත්වන දේශනා විලාශයක් මෙහි ලා දැක්ක හැකිය. බාලයන් සේවනය නො කළ යුතු බවත්, සේවනය කළ යුත්තන් දැක්වීමත් මේ සූත්‍රයෙන් ඉදිරිපත් කරන ප්‍රධාන ශීර්ෂයයි. මිනිසාගේ ජීවිතය අඳුර පහවී විද්‍යාවේ ආලෝකය ලබා සැනසීමට පැමිණිය හැකි ක්‍රමය පිළිබඳව අනතුරුව විස්තර වෙයි. අර්හත්වය තෙක් එය ක්‍රමානුකූල නැඟීමකින් යුක්තය. අවසන මංගල කරුණු කීපයකින් ක්ෂීණාශ්‍රවයකුගේ පැවැත්ම පිළිබඳව විස්තර වේ. බුදුරජාණන් වහන්සේගේ දේශනාවන්හි ප්‍රකටව පෙනෙන ආදි, මධ්‍ය, පරියෝසාන කල්‍යාණතාව මෙහිදී ද පැහැදිලිව දැක්ක හැකිය.

**මංගල සූත්‍ර භාවය**

"පිදිය යුත්තන් පිදිය හැක්කේ පණ්ඩිත ජන සේවනය කළහොත් පමණි. මේ කරුණු දෙක සුදුසු ප්‍රදේශයක වාසය කරන බවට මෙන්ම පෙර පින් ඇති බවට ද සාධකය. එබඳු අයගේ සිත්සතන් දාන්තය, මනා පැවැත්මෙන් යුක්තය. එයින් තෘප්ත නොවූ ඔහු තම බහුශ්‍රැත බවත් ශිල්පයත් ආත්ම දමනය පිණිස යොදයි. හොඳ වචන කියන්නෙක් වේ. ගිහියන් වශයෙන් මව් පිය උපස්ථානයත් අඹුදරු සංග්‍රහයත් නිසි සේ කෙරේ. දැහැමිව වස්තුව සපයා ගනී. එයින් දන් දෙයි. දහම්හි හැසිරෙයි. ශක්ති පරිදි නෑයන්ට ද සංග්‍රහ කෙරේ.

නිදෙස් කටයුතු ඇති ඔහු පවින් වෙන් වෙයි. මත්පැන් නො බොයි. කුසල ධර්මයන්හි තත්පරවූයේ බුද්ධ, බුද්ධ ශ්‍රාවක, ආචාර්‍ය උපාධ්‍යායාදීන් කෙරෙහි පැවැත්විය යුතු ගරු බවත්, යටත් පහත්

Non-commercial distribution

පැවතුම් ඇති බවත් එළඹ සිටී. යථා ලාභයෙන් සතුටු වෙයි. කළගුණ දන්නකු බවට පැමිනෙයි. සුදුසු කාලයෙහි ධර්ම-ශ්‍රවණය කරයි. අධිවාසන ක්ෂාන්තිය පෙරදැරිව ඇතිවන කීකරු කම එළඹ සිටී, මෙසේ භික්ෂූන් හමුවීමෙන් සාකච්ඡා පැවැත්වීමෙන් තපසට බැසගනී.

ඉන්ද්‍රිය සංවරයෙන් තපසට බැසගත් හේ බඹසර හැසිරෙන්නකු වෙයි. අවසන චතුරාර්‍ය සත්‍ය ධර්මයන් පිළිබඳ අවබෝධය ලබා නිර්‍වාණය ප්‍රත්‍යක්ෂ කරන්නෙක් ද වේ. ඉන්පසු ඔහුට අටලෝ දහමෙහි නො සැලී සිටීමට හැකි වෙයි. ශෝක රහිත වෙයි. කෙලෙස් ධූලි නැතිවෙයි. සියලු උවදුරු නැතිවෙයි." මෙසේ මංගල සූත්‍රය එක ම ධර්ම වර්ෂාවෙකි.

**මංගල ධර්ම සමාජය**

අවුරුදු ගණනාවක් මහජනයා තුළ භාවිතයට ආ මතධර්ම පහසුවෙන් මකනු නො හැකි බව පෙනෙන්නේ මඟුල් යන්නෙහි අරුත අදත් පෙර පරිදිම තිබෙන හෙයිනි. මංගල ධර්ම දේශනාවෙන් පසුව මඟුල් කරුණු පිළිබඳව භාරතීයයන් දැරූ අදහස් දෙදරා ගිය බව මුත් ඔවුන් ගෙනා මතධර්ම නො වෙනස්ව පැවති බව පෙනේ. ත්‍රිපිටකයෙන් හා හින්දූන්ගෙන් එකවර ලංකාවට සංක්‍රමණය වූ මංගල ශබ්දය එහි අදහස් සමග පැහැදිලිව දෙමගක ගමන් කෙළේ ය. බුදුරජාණන් වහන්සේගේ මංගල කරුණුත් එහි ඇති ක්‍රියාත්මක ශක්තියක් මුවහත්කොට, ශාන්තිකර්ම ස්වරූපයක් ගෙන, අස්වසා ගැනීමෙන් පමණක් ස්වකීය අභිමතාර්ථයන් ඉටුකර ගැනීමේ තත්ත්වයකට පෙරළින. මඟුල් කරුණුවලට වඩා මංගල ශබ්දයට තැනක් ලැබිණි. හින්දූන්ගේ දර්ශනික බලපෑම්වලට ගොදුරු වූ බෞද්ධයෝ මංගල සූත්‍රයට ආශීර්වාද ස්වරූපයක් ආරෝපණය කළහ. පසු කලෙක හින්දූන් ශාන්තිකර්මයෙන් බලාපොරොත්තු වූ පිහිට බෞද්ධයෝ මංගල සූත්‍රය අස්වා ගැනීමෙන් බලාපොරොත්තු වූහ. අදත් ඉන්දියාවේ ජෛන සාධුවරුන්ගේ ශාන්ති ගීතය "මංගලම්" යන වචනය යි.

**"මංගල සූත්‍රය"** පිරිත් පොතට ඇතුළත් කළ නිසා එය මහජනයාගේ ආදර සම්මානය දිනාගත් බවට සැකයක් නැත.

*Non-commercial distribution*

ඒ නිසාමය අනික් සූත්‍ර අතර එය ඉතා ප්‍රසිද්ධියක් ද උසුලනුයේ. ඒ එක්ක ම කියයුතු කාරණය නම් ධර්මය පිළිබඳව යථාර්ථය වැසීගිය සූත්‍ර අතර මංගල සූත්‍රය ප්‍රධාන බවය. බුදුරජාණන් වහන්සේ මංගල කරුණු පිළිබඳව දරා සිටි අදහස් ඉන් ඉවත්ව යාමට පටන්ගත්තේ මංගල සූත්‍රය පිරිත් පොතට ඇතුළත් කිරීමෙන් පසුවය. කවර ආගමක වුවත් දර්ශනික පක්ෂයෙන් සාමාන්‍ය මහජනයාගේ බැඳීමක් නැත. හුදෙක් යථාර්ථ හැඟීම්වලට වඩා පුදපූජා හා ශාන්ති කර්ම වැනි ලෞකික දෙයින් බැඳීම ස්වභාව හෙයිනි. පුද පූජාවන්ගෙන් හා ශාන්තිකර්මයෙන් ආගමක් හා මහජනයා අතර ඇතිවන බැම්මේ ස්ථිරත්වය දුටු මහායානික අනුශාසකයෝ ක්‍රමානුකූල පූජාවිධි පළිවෙළක් සකස් කළහ. මෙයින් වූයේ ථෙරවාදය කෙරෙහිත් මෙබඳු හැඟීම් බලවත්ව පැන නැඟීමයි. මංගල සූත්‍රය නිවන කරා දුවන ක්‍රියා මාර්ගයක් බව අමතක කිරීමට වැඩිකලක් ගත නොවූයේ යථෝක්ත බලපෑම්වලට ගොදුරු වූ හෙයිනි.

නො එසේ නම් මංගල සූත්‍රය වැනි වටිනා උපදේශ මාලාවක් අනාවරණය කරන සූත්‍රයක් තවත් නැති තරම් ය. මිනිස් සමාජය අමතක කළ ගුණදහම් මංගල සූත්‍රය නැවත නැවත මතක්කර දෙන සූළුය. බඩකට පුරා කා බී සැපසේ ජීවත් වන පෞද්ගලික සැප විහරණය පමණක් සලකන්නවුන් කෙරෙහි බුදු දහමින් යොමුවන්නේ උදාසීන බැල්මකි. එහෙයිනි, යමක් උපයාගත් පමණින් තම නෑදෑයන් අමතක කරන මිනිසුන් කෙරෙහි "ඤාතීන්ට සංග්‍රහ කිරීම" වැනි මංගල කරුණුවලින් ඔවුන් තෙදගන්වන්නේ. මව්පිය උපස්ථානය, කළගුණ දන්නා බව, ඉවසීම, වැනි පුරුදු කළ යුතු ගුණාංග ජීවිතයක් ගුණබරින් බර වීමට දමන පඩි ය. මේ ගුණදහම් නමැති හණගල්වල අතුල්ලා ඔප මට්ටම් නො කළ ජීවිතවල කිසි ම වටිනා කමක් නැත. එයින් සුවඳ කැවූ ජීවිතවලින් ම් දස දෙස ගුණ සුවඳ හමයි. බුදුරජාණන් වහන්සේ දියුණුවට හෝ පිරිහීමට හෝ හේතු වදළ හැම තැනකදී ම මත්පැන් පානය හෙළා දුටහ. මෙහිද මත්පැන් නො බීම මංගල කාරණයක් කොට වදරා තිබේ. මෙසේ මෙහි සඳහන් අටතිස් කරුණුවලින් එකක් පාසා මිනිසාගේ දැහැමි දිවි පෙවෙතට සම්බන්ධය ලැබෙන අයුරුත් එයින් ඇතිවන සාමකාමී ජීවිතයත්,

Non-commercial distribution

දෙස බලන විට එක ජීවිතයකට, එක රටකට නොව සමස්ත ලෝකයටම මංගල ධර්ම ගැන හරි අවබෝධයක් ලබාදීම වැදගත් ලෝකශාසනික සේවයක් වනු නො අනුමානය.

## අපගේ ප්‍රාර්ථනය

මෙම සම්බද්ධ ජයන්ති වර්ෂය ගත වූ වර්ෂවලට වඩා බෞද්ධයන්ගේ ආගමික භක්තිය දියුණු කරමින් පවතී. අද දිවයිනේ හැම තැනක ම පාහේ පිළිවෙත් ගරුක බෞද්ධයන් දක්නට ලැබීම සැනසීමට කරුණකි. මෙය බෞද්ධයන්ගේ වියළී ගිය භක්ති ලතාවට තාවකාලික දියත්තක් වේවා. එයින් සම්බුද්ධ ජයන්තියේ පරමාර්ථය ඉටුවූවා නො වෙයි. දෙදහස් පන්සියයේ සම්බුද්ධ ජයන්තියෙන් පසුව ලෝකයෙන් බුද්ධ ධර්මය වඳවී යා හැකියයි කියන ක්‍රිස්තියානි කතෝලික පින්වතුන් මෙන් ම බෞද්ධයන් ද සිටීම කණගාටුවට මෙන් ම අනුකම්පාවට ද කරුණකි. එහෙත් එහි සත්‍යය බොහෝ ඈතය. මෙහිදී එකක් කිය හැකිව තිබේ. **"බෞද්ධයන්ගේ පිරිහීම කවද හෝ විය යුතු නම් එය අනිත් ආගමිකයන් නිසා නොව බෞද්ධයන් ගෙන් ම වන බවය."** මේ කාරණය ගැන පමණක් සිතා බැලුව හොත් ඉදිරියෙහි පැමිණිය හැකි ආගමික ආපදාවෙන් වැළකීගත හැකිය.

ගත වූ වර්ෂ කීපය තුළ මේ දිවයිනේ බෞද්ධයන්ගේ ආගමික දැනීම පුළුල් කළ ධර්මධරයන් අතර අපගේ ගුරුදේව වූ **"ආචාර්ය රේරුකානේ චන්දවිමල"** මාහිමිපාණන් වහන්සේට ද හිමි වන්නේ සාමාන්‍ය තැනක් නො වෙයි. උන්වහන්සේ ලියූ ආගමික පොතපත බලා තම අදහස් දන්වා එවූ බෞද්ධයන්ගේ මෙන් ම ක්‍රිස්තියානි කතෝලික පින්වතුන්ගේත් ලියුම් සිය ගණනක් වුව ද අප වෙත තිබේ. අප මෙයින් සතුටුවන්නේ බුදුරජාණන් වහන්සේගේ ශාන්ත්‍යාලෝකය, අමා පණිවුඩය ලැබීමෙන් ඔවුන්ගේ සිත් සතන් පිනායාම ගැනය. මේ කාරණය අපට සඳහන් කිරීමට සිදුවූයේ මේ **"මංගල ධර්ම විස්තරය"** ලිවීමට හේතු වූ කරුණු පිළිබඳ මතක් කළ යුතුව තිබුණ හෙයිනි.

පොකුණුවිටින් පළ වූ ඒ දහම් පොත් කිය වූ පින්වතුන්ගේ එක්තරා අදහසක් ක්‍රියාවට නැඟීමක් වශයෙනි, මෙසේ මංගල ධර්ම

Non-commercial distribution

පිළිබඳ විස්තරයක් ලිවීමට අප උත්සාහවත් වූයේ. අප ගුරු දේවයන් වහන්සේ වරින් වර රෝගී වීම නිසාත්, මේ බුද්ධ ජයන්ති කාලයෙහි පළාතේ අවශ්‍යයෙන් ම කිරීමට සිදුවී තිබෙන ධර්ම සංග්‍රහ නිසාත්, මේ කටයුත්තෙහි ලා උන්වහන්සේ අප මෙහෙයවා වදළහ. එබැවින් මේ සම්බුද්ධ ජයන්ති වර්ෂය තුළ ම මංගල ධර්ම පුස්තකයත් බෞද්ධයන් අතට පැමිණවීමෙන් වටිනා ශාසනික සංග්‍රහයක් කිරීමට යොමු වූ අපි ද මංගල ධර්ම යටතේ එන කාරණයක් පාසා මිනිසාගේ ලෞකික ප්‍රයෝජනය මෙන් ම ලෝකෝත්තර සැපය පිළිබඳවත් වර්තමානයට ගැළපෙන අන්දමින් අවබෝධයට ද පහසුවන පරිදි පොත් පිංචක් සකස් කෙළෙමු. ඒ මේ දහම් පොත කියවා **මංගල ධර්ම** පිළිබඳ අවබෝධයක් ඇතිකර ගැනීමෙන් තම තමන්ගේ ජීවිත, ලෞකික හා ලෝකෝත්තර දියුණුවේ මාවත ඔස්සේ ගෙන ගොස් ශාන්ත අති සුන්දරතර සැපය ළංකර ගැනීමේ භාග්‍යවන්තයෝ වේවා යි ඉත සිතින් ප්‍රාර්ථනා කරමු.

**උපකාරානුස්මෘති**

මෙම ග්‍රන්ථය සැපයීමේ දී අපගේ ගුරු දේවයාණන් වූ **අතිගරු රේරුකානේ නාහිමිපාණන් වහන්සේ විසින් මෙයට පස්විසි වසකට ඉහත දී මාසික ධර්ම පත්‍රිකාවක් වශයෙන් "මංගල ධර්ම" අළලා ලියන ලද වටිනාලිපි රැසක් හා උන්වහන්සේ විසින්ම පත්‍ර සඟරා ආදියට සැපයූ තවත් ලිපි ලේඛන සමූහයක් ගුරුකොට** ගත් බව ද, ඇතැම් ගැඹුරු කරුණු පිළිබඳව උන්වහන්සේ අතින් ලියැවුණු දෑ එසේ ම වචනයකුදු වෙනස් නො කොට මෙහි ඇතුළත් කළ බව ද කෘතඥතා පූර්වකව සාතිශය ගෞරවයෙන් සඳහන් කරමු.

වර්තමාන සමාජයෙහි බලපාන **"තාපස කලබලය, සමාජ සේවක භික්ෂුව, වනවාසී භික්ෂුව"** ආදී සාමාන්‍ය බොහෝ කරුණු පිළිබඳව විවේචනාත්මකව ලියැවුණු දෑ අප සතු ය. එබැවින් ඒ පිළිබඳ ලෝකයාගෙන් යම් සම්මානයක් හෝ අවමානයක් ලැබෙතොත් එද අප සතු විය යුතු බව මෙහිලා විශේෂයෙන් සිහිපත් කරමු.

Non-commercial distribution

ග්‍රන්ථයක් මුද්‍රණය කරවීමේ දී ගත්කරුවන්ට කරන්නට සිදුවන ප්‍රෘප් බැලීම් ආදි සියලු ම කටයුතු මේ පොත මුද්‍රණයේ දී ඉතා සැලකිලි ලෙස කරදුන් අපගේ පැවිදි සොහොයුරාණ කෙනකු වූ **හේන්ගොඩ කල්‍යාණධම්ම** ස්ථවිරයන් වහන්සේට කෘතඥතා පූර්වකව පිං දෙමු.

**බුදුසසුන බැබලේවා!**

මෙයට, ලෝවැඩ කැමති

**ගොඩිගමුවේ සෝරත ස්ථවිර.**

ශ්‍රී. බු. ව. 2499
ක්‍රි. ව. 1956 මාර්තු 1 වැනි දින

පොකුණුවිට
ශ්‍රී විනයාලංකාරාරාමයේ දී ය.

*Non-commercial distribution*

## ලේකම්ගේ සටහන්...

මංගල ධර්ම විස්තරය, රේරුකානේ මහා නාහිමිපාණන් විසින් ලියා පළ කළ ධර්ම පත්‍රිකා ඇසුරු කොට උන්වහන්සේගේ ශිෂ්‍ය, අපවත් වී වදාළ ගොඩිගමුවේ සෝරත හිමිපාණන් විසින් රචිත පොතකි. 2500 බුද්ධ ජයන්තිය වෙනුවෙන් නිකුත් කළ මේ පොත අදටත් නවක භික්ෂූන් වහන්සේලාගේ හා පාඨකයන්ගේ ආදර ගෞරවයට බඳුන් වෙයි. නවක සාමණේරයන් වහන්සේලාගේ දේශනා චාතුර්ය සඳහා මංගල ධර්ම විස්තරය අත්වැලකි.

පොතෙහි හැඳින්වීමේ කතු හිමියන් දක්වන ....බෞද්ධයන් ගේ පිරිහීම කවද හෝ විය යුතුනම් එය අනෙක් ආගමිකයන් නිසා නොව බෞද්ධයන්ගෙන්ම වන බවය...'' යන වැදගත් අදහස මේ කාලයේ දී අවධානයට ලක් කිරීමත්, ඒ සම්බන්ධයෙන් ගත හැකි ක්‍රියාමාර්ග කෙරෙහි බලධර ආයතනයන්හි අවධානය යොමු වීමත් අවශ්‍ය ය. ඈත අතීතයේ සිටම ලක්දිවට පැමිණි නොයෙකුත් ආගමිකයන්ගේ ආභාෂයන් නිසා නාමික බෞද්ධයන් පිරිසක් දිවයිනෙහි නිර්මාණය වී ඇත. මේ පිරිස 'මොනම ආගමකටවත් නැති පිරිසක් වීම' ජාතියේත්, ආගමේත්, රටේ ආර්ථිකයේත් දියුණුවට බාධාකර බව කිවයුතු තරම් නොවේ.

විදේශීය ආධිපත්‍යයෙන් අප නිදහස් වුව ද, අපේ පැරණි සිංහල නීතියත්, බුදු සමයේ එන විනය නීතියත් අතර තිබූ සම්බන්ධය යළි ඇති කරන්නට අප සමත්වී නැතඃ යුරෝපීය චින්තනය, ඔවුන් විසින් පැන වූ අණපනත්වලින් නිදහස් වීමට අප නො පොළඹවයි. විහාර දේවාලගම් පනතේ 'ලියාපදිංචි භික්ෂුව' හා 'ශිෂ්‍යානු ශිෂ්‍ය පරම්පරාව' යන තේමා ඔස්සේ ඇති කළ විහාරාධිපති පදවිය නිසා වෘද්ධ පටිපාටියට හානි වීමත්, භික්ෂූන් වහන්සේලා අතර අයිතිය පිළිබඳ ගැටළු මතු වීමත් වැළැක්විය නො හැකියඃ මේ නිසා බුද්ධාගම්කාරයන් වශයෙන් සිටීමට අවස්ථාව රටේ නීතියෙන් තහවුරු කිරීම මොන මොන තැන්වලින් විය යුතුදැයි සොයා බැලීමත් කළ යුතුව ඇත.

Non-commercial distribution

ක්‍රියාකාරී ජීවිතයේදී හුරු කළ යුතු ගුණධර්ම, සංගායනාවට සීමා කිරීම අද නිරතුරුව ම දැකිය හැකි ය. මහා මංගල සූත්‍රය, කරණීය මෙත්ත සූත්‍රය ආදියෙහි දක්වෙන, අප අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ගය ශාන්තිය අපේක්ෂාවෙන් උදෑසන, රාත්‍රියේ, වැඩක ආරම්භයේදී හා විවෘත කිරීම්වලදී සංගායනා කිරීම අපේ සිරිතක් වී ඇත. අරුත ගැන නොසිතා විරිත ගැන පමණක් සිතා කරන මේ මැතිරීම පූජ්‍ය-පූජක දෙපිරිස ම පත් ව ඇති මංමුළාව පෙන්නුම් කරයි. බුදු දහමේ පෙන්වා ඇති පරිදි කළ යුතු වැඩ කිරීමෙන් මිස කීමෙන්, ආවැඩීමෙන් කිසිදු ප්‍රතිඵලයක් නොවන බව බෞද්ධයන්ගේ කල්පනාවට බඳුන් විය යුතු ය.

සෑම යුගයක ම වැඩිහිටියන්ගේ චෝදනාවක් බවට පත්වී ඇති 'ළඟ පරපුර තමන්ට වඩා ගුණ දහමින් පිරිහීමට ලක් වී ඇත' ය යන කරුණ ද මේ යටතේ ම අපේ සැලකිල්ලට භාජනය විය යුත්තකි. ඊළඟ පරපුරේ ගුණධර්ම පරිහානියට තමන් කොතෙක් වගකිව යුතු ද? අපේ ධර්මය ඉගැන්වීමට හා ඒ අනුව හැසිරීමට උපදෙස් දෙන ආකාරය නිවැරදි ද? එම අධ්‍යාපන ක්‍රම නැවත සකස් විය යුතු ද? එසේ කරන්නේ නම් ඊට සහභාගී විය යුත්තේ කවුරුන් ද? එම තෝරාගැනීම්වලදී භාවිත කරන මිණුම්දඬු ප්‍රමාණවත් ද? ආදී ගැටළු ද අප ඉදිරියේ මතු වෙයි. මේ සියල්ල ජය ගැනීම සඳහා එක් එක් ආකාරයෙන් එල්බ ගෙන ඇති මානයන්ගෙන් ලිහිල් වීමට අපට හැකි විය යුතු ය. නොයෙක් ආගමිකයන් සමග එක්ව ජීවත්වීම බුදුරජාණන් වහන්සේ විසින් ම ආදර්ශයෙන් පෙන්නුම් කර ඇත. කුමන ගඟෙන් ගැලුවත් මහසයුරේ ජලකඳ එකක් වන්නා සේ විවිධ ජාතීන්ගෙන් සැදුම් ලද නමුත් ලාංකික ජනතාව එක ම කණ්ඩායමක් වශයෙන් සැළකීමට අපට දුෂ්කර නොවිය යුතු ය.

බඹයක් පමණ වූ මේ ශරීරයෙහි ලෝකයත්, නිවනත් පැනවීමෙන් බුදුරජාණන් වහන්සේ අපට පෙන්වූ සත්‍යය, සියලු ගැටළු තම තමන් විසින් ම නිරාකරණය කළ හැකිය යන පණිවුඩය ද අපට ගම්‍යමාන කරයි. අප එකිනෙකාගෙන් ඉටුවිය යුතු කාර්යභාරය හරිහැටි තේරුම් ගෙන කිරීමට තරම් නුවණක් මේ පොත කියවීමෙන් ලබන්නට සැදැහැවතුන් උත්සාහ ගනී නම් අපේ ප්‍රයත්නය සාර්ථක වූවා වෙයි.

මේ පොතෙහි මුද්‍රණ කටයුතු ඉටුකළ සිකුරු ප්‍රකාශකයෝ ආයතනයෙහි ගිහාන් අනුරංග ජයවර්ධන මහතා ඇතුළු කාර්‍ය මණ්ඩලය ද, සංශෝධිත පරිගණක අක්ෂර සංයෝජනයෙන් දයක වූ සාලිය ජයකොඩි මහතා ද සහෘදව සිහිපත් කරමි. දයාවතී අබේසිංහ

Non-commercial distribution

මහත්මිය සම්බන්ධ වූ පළමු සෝදුපත් සටහන් මෙයට ද ප්‍රයෝජනවත් විය. මට ශක්තියක් වූ කිරිඔරුවේ ධම්මානන්ද සමිඳුන් ද, මට උපකාර කරන උන්වහන්සේගේ ශිෂ්‍ය ස්වාමීන් වහන්සේලා ද දයාබරය. ධර්මයට ලැදිව කටයුතු කරන, ධර්ම ගරුකව කියවන සියලු දෙනා ද අප සත්පුරුෂ සමාගමේ සාමාජිකයෝ ය.

අප බොහෝ කාලයක් අපේක්ෂා කළ ඒ ''දියසෙන් සංකල්පය'' අද යථාර්ථයක් බවට පෙරළී ඇත. විවිධ හේතු නිසා සමාජ ක්‍රමයේ විචිත්‍රත්වයක් දක්නට ඇතත් මහින්ද චින්තනයෙන් තහවුරු කළ ජනමූල චින්තන ධාරාව ඉදිරියට ගලා යන්නට සැලැස්වුව හොත් අප එකිනෙකා තුළ ඇතිවන ආත්මාභිමානය, අප ලෝකයේ උසස් ස්ථානයකට ඔසවා තබනු නොඅනුමානය.

සියල්ලෝ දහම් රසයෙන් සැනසෙත්වා!

**තිසරණ සරණයි!**

**සී. තනිප්පුලි ආරච්චි**
ගරු ලේකම්
ශ්‍රී චන්ද්‍රවිමල ධර්මපුස්තක
සංරක්ෂණ මණ්ඩලය

2010 ජනවාරි මස 01 වන දින,
පොකුණුවිටදී ය.

*Non-commercial distribution*

# මංගල ගාථාවල පටුන


| | | | පිට |
|---|---|---|---|
| 1. | අසෙවනා ච බාලානං - යනාදී ගාථාව | | 33 |
| 2. | පතිරූප දෙසවාසො ච | ,, | 82 |
| 3. | බාහු සච්චං ච සිප්පං ච | ,, | 98 |
| 4. | මාතා පිතු උපට්ඨානං | ,, | 122 |
| 5. | දානඤ්ච ධම්ම චරියා ච | ,, | 150 |
| 6. | ආරති විරති පාපා | ,, | 192 |
| 7. | ගාරවො ච නිවාතො ච | ,, | 208 |
| 8. | ඛන්තී ච සොවචස්සතා | ,, | 256 |
| 9. | තපො ච බ්‍රහ්මචරියඤ්ච | ,, | 313 |
| 10. | පුට්ඨස්ස ලොකධම්මෙහි | ,, | 349 |


*Non-commercial distribution*

# පටුන


| | | පිට |
|---|---|---|
| හැඳින්වීම | | v |
| ලේකම්ගේ සටහන් | | xiii |
| මංගල සූත්‍රය | | 25 |
| සූත්‍ර නිදානය | | 26 |
| **1.** | **බාලයන් සේවනය නො කිරීම** | **34** |
| | බාලයාගේ ලක්ෂණ | 34 |
| | සේවනය හා එහි බලය | 35 |
| | ආශ්‍රයෙන් වෙනස් වූ සොහොයුරන් දෙදෙන | 37 |
| | ආශ්‍රයට කෙනකු තෝරා ගැනීම | 39 |
| | ආශ්‍රයට නුසුදුසු මිත්‍රයෝ | 39 |
| | බාල සේවනයෙහි ආදීනවයෝ | 42 |
| | මව්පියන් සතු යුතුකමක් | 42 |
| | ආශ්‍රය ගැන උතුමන්ගේ අදහස් | 46 |
| **2.** | **පණ්ඩිතයන් සේවනය කිරීම** | **46** |
| | පණ්ඩිතයාගේ ලක්ෂණ | 47 |
| | පණ්ඩිත සේවනයෙහි වටිනාකම | 47 |
| | නො මග ගිය බෝසත් තුමා පණ්ඩිතාශ්‍රය නිසා පැවිදිවීම | 48 |
| | පණ්ඩිතයාගෙන් යහපතක් මිස විපතක් නො වන බව | 49 |
| | උතුමන් තමා මැරීමට ආ සතුරාට පවා සෙත සැලසූ සැටි | 50 |
| | ආශ්‍රයට සුදුසු මිත්‍රයෝ | 52 |
| **3.** | **පිදිය යුත්තන් පිදීම** | **56** |
| | බුදුන් පිදූ උත්තර මහරහතන් වහන්සේ | 56 |
| | වැඳීම් පිදීම් මෝඩ වැඩකැයි කියන ශාසන නාශකයෝ | 58 |
| | වැඳුම් පිදුම් කිරීමෙහි අනුසස් | 59 |
| | පදවීතිහාරානිසංසය | 60 |


*Non-commercial distribution*

| | | පිට |
|---|---|---|
| | අග්‍ර වූ පූජාවෙන් අග්‍ර වූ අනුසස් ලැබෙන බැව් | 60 |
| | සිත පැහැද වීමෙන් නිවන් දුටුවන්ගේ සංඛ්‍යාව ම අතිවිශාල බැව් | 61 |
| | බුදුන් වැඩ සිටින කල මෙන් සමාන විපාක පිරිනිවියත් - ලැබෙන බැව් | 62 |
| | අති පණ්ඩිතයන් අපායගාමි වන බැව් | 62 |
| | බුද්ධ පූජාව නො කළ යුතුයයි කියන මිථ්‍යාවාදීනට නිසි පිළිතුරු | 63 |
| | **වැඩිහිටියන් පිදීම** | **71** |
| | **ආමිස පූජාව හා ප්‍රතිපත්ති පූජාව** | **75** |
| | ආමිස පූජාව ද කළ යුතු බව | 76 |
| | වෙසක් සැරසිලි | 78 |
| **4.** | **සුදුසු ප්‍රදේශයන්හි වාසය කිරීම** | **81** |
| | උපන් මිනිසා | 84 |
| | අෂ්ට දුෂ්ටක්ෂණය පිළිබඳ විස්තර | 85 |
| | මේ කුඩා රට | 88 |
| **5.** | **පෙර කරන ලද පින් ඇති බව** | **90** |
| | පින් කළ තැනැත්තා දෙලොව ම තුටු පහටු වන බැව් | 91 |
| | පින් කළ තැනැත්තාගේ සහ නො කළ තැනැත්තාගේ වෙනස | 92 |
| | පින් නැවත නැවත කළ යුතු බව | 94 |
| **6.** | **තමා මනා කොට තබා ගැනීම** | **96** |
| **7.** | **උගත්කම** | **99** |
| | බුඩ ධර්මය උගෙනීමෙහි වටිනාකම | 100 |
| | ධර්මය සොයා වනගත වූ රජතුමෙක් | 101 |
| | පැරණි උතුමන්ගේ ආගම දැනීම | 102 |
| | බණ උගෙනීමෙන් මහත් සම්පත් ලද උපාසිකාවක් | 103 |
| **8.** | **ශිල්ප දැනීම** | **105** |
| **9.** | **මනා කොට හික්මෙන ලද විනය** | **108** |
| | කර්මයෝ | 108 |
| | අන්තරායකර ක්ලේශයෝ | 109 |

*Non-commercial distribution*

පිට


විපාකාන්තරායයෝ 109

උපවාදන්තරාය 110

ආඥා ව්‍යතික්‍රමණය 111

**10. යහපත් වචනය 113**

අනුන් කරන දේට ඇඟිලි නො ගසා සිටිනු බැරි පිරිසක් 117

සුභාෂිතය හා දුර්භාෂිතය පිළිබඳ වදාළ ධර්ම පද 119

**11. මව්පිය උපස්ථානය 123**

මව් පියන් කෙරෙහි පිළිපැදිය යුතු පිළිවෙළ 125

ණය කාරයන් වූ දරුවනට ණයින් නිදහස්වීම දුෂ්කර බැව් 126

පැරණි උතුමන් මව් පියන් පිදූ හැටි 127

මාපියන්ට අද සලකන හැටි 128

මාපියන් සතු දේපල 129

මාපියන් පිදීමෙහි අනුසස් හා නො පිදීමෙහි විපාක 130

**12. දරුවනට සංග්‍රහ කිරීම 133**

ගුණවත් දරුවා ම උතුම් බැව් 134

දරුවන් තැනීම 135

නරක දරුවන් තනන මාපියන් රටට විපතක් කරන බැව් 135

මව් පියන් සතු යුතුකම් පස 136

දරුවන් සතු යුතුකම් පස 140

**13. භාර්‍ය්‍යාවන්ට සංග්‍රහ කිරීම 140**

ස්වාමි පුරුෂයා සතු යුතුකම් 141

පවුලේ අවුලේ මුල 142

භාර්‍ය්‍යාව සතු යුතුකම් 143

**14. නිරවුල් කර්මාන්තය 145**

කර්මාන්ත පිරිහීමට හේතු 146

කර්මාන්ත දියුණුවට හේතු 147

**15. දානය 151**

මොලොවම ලැබෙන දානානිසංස 151

ප්‍රීතිය හා එහි ප්‍රභේද 152


*Non-commercial distribution*

| | | පිට |
|---|---|---|
| | සාමිෂ ප්‍රීතිය | 152 |
| | නිරාමිෂ ප්‍රීතිය හා එහි ප්‍රභේද | 153 |
| | දන් දෙන තැනැත්තාට ඇතිවන ප්‍රීතිය | 155 |
| | දීමෙන් මෙලොවම ලැබෙන සෙසු අනුසස් | 158 |
| | දනයාගේ උත්තමතාව | 159 |
| | දන් දිය යුත්තේ කෙසේ ද | 161 |
| | දීමේ පරමාර්ථය | 165 |
| **16.** | **ධර්මවයඃාව** | **168** |
| | ධර්මවයඃා නිසා මහලු නොවී නො මියන ධර්මපාල පරපුර | 171 |
| **17.** | **නෑයන්ට සංග්‍රහ කිරීම** | 178 |
| | නෑයන් සමඟ සුළු දෙයකින් අමනාප නො විය යුතු බැව් | 179 |
| | නුවණැත්තා අසමගි වුවත් වහාම සමගි වන බැව් | 180 |
| | අනුන්ගේ උපකාර නුවමනා කෙනෙක් නැති බැව් | 181 |
| | මිත්‍රයන්ට සංග්‍රහ කිරීම | 182 |
| | ගුණයෙන් යහපත් නම් හැම තරාතිරමක මිත්‍රයකු ආශ්‍රය කළ යුතු බැව් | 182 |
| **18.** | **නිරවද්‍ය කර්මයෝ** | **185** |
| | නිරවද්‍ය කර්මයෙන් සැපතට පත් මඝමානවක ප්‍රමුඛ පිරිස | 185 |
| | කළ කළ හැටියට හොඳ නරක විපාක දෙන බැව් | 190 |
| **19.** | **පාපයෙන් වැළකීම** | **193** |
| **20.** | **මත්පැන් පානයෙන් වැළකීම** | **196** |
| | සුරාවෙන් හා සුරාපානය කරන්නන් ගෙන් ද වෙන්විය යුතු බව | 198 |
| **21.** | **කුශල් කිරීමෙහි අප්‍රමාදය** | **201** |
| | දෙලොව ම දියුණුව නම් කුමක් ද | 203 |
| | මනුෂ්‍යයා ජීවත් විය යුත්තේ කෙසේ ද | 204 |
| | කා බී ප්‍රීති වීම තිරිසනුන් ද කරන වැඩක් බැව් | 205 |
| | පිරිහීමේ මග | 206 |
| | දියුණුවේ මග | 206 |

Non-commercial distribution

පිට

**22. ගරු කළ යුත්තන්ට ගරු කිරීම** **209**
ගරු කළයුත්තන්ට අගරු කිරීමෙන් ලැබෙන දරුණු විපාක 211

**23. යටහත් පැවැත්ම හෙවත් නිවාත ගුණය** **214**
සැරියුත් හිමියන් සත් හැවිරිදි සාමණේර නමගෙන් ලත් අවවාදය 217
සැරියුත් හිමියන් තමන් වහන්සේගේ නිහතමානී බව උපමා නවයකින් පැවසූ සැටි 218

**24. ලද දෙයින් සතුටු වීම.** **222**
තමන් අයත් දේ පහත් කොට සැළකීමෙන් පිරිහුණු සිංහලයා 223
මහිච්ඡතාව ද පිරිහීමට හේතුවක් බැව් 224
ධනය රැස්කර තබා නො යා යුතු බැව් 225
වස්තුව සපයා තෘප්තියකට පත්විය නො හැකි බව 226
ලද දෙයින් සතුටු වීම සියලු සම්පත් ලැබීමකි 227
ලද දෙයින් සතුටු නො වීම විපත්වලට හේතුවකි 228
ලද දෙයින් සතුටුවීම චිත්තාරෝග්‍යයට ද ප්‍රබල හේතුවක් බැව් 230
චිත්තයට වැළඳෙන රෝග 231
සිතට වැළඳෙන දරුණු ලෙඩ 232
නිරෝගී චිත්තය නිසා වර්‍ණවත් වූ තේමිය කුමාරයෝ 233

**25. කෙලෙහි ගුණ සැලකීම** **236**
සැරියුත් හිමියන්ගේ ගුණ සැළකීම 238
අසත් පුරුෂයාට කළ උපකාරය ගින්නෙහි ලූ බීජයක් වැනි බව 239
ප්‍රථමෝපකාරය සුළු වුව ද ඉතා අගනා බැව් 240
මහා අස්සාරෝහ ජාතකය 240
සෙවන දුන් ගසට පවා නපුරක් නො කළ යුතු බැව් 244
උපකාර ඇතියනට කළ ද්‍රෝහිකම් තමන් කරා එන බැව් 245
මෙකල කළ ගුණ දන්නන් දුලබ බැව් 247

**26. සුදුසු කාලයෙහි ධර්මශ්‍රවණය කිරීම** **250**
ත්‍රිවිධ වූ පාප විතර්කයන් 251
පාප විතර්කයන් නිසා පිරිහෙන බැව් 252
පාප විතර්කයන් නිසා රෝගාතුර වූ රජෙක් 253

*Non-commercial distribution*

| | | පිට |
|---|---|---|
| **27.** | **ඉවසීම** | **257** |
| | ඉසීමෙන් සැනසීම ලැබෙන බැව් | 257 |
| | ඉවසීම නීරෝගීවීමට ද හේතුවක් බව | 259 |
| | ඉවසීම ගුණ ධර්මයනට මූල ධර්මයක් බැව් | 259 |
| | ඉවසන්නා සතුරන් දිනන බැව් | 260 |
| | කකචූපමාවවාදය | 262 |
| | උතුම් ඉවසීම | 263 |
| | සැරියුත් හිමියන්ගේ ඉවසීම | 264 |
| | බෝසතාණන්ගේ ඉවසීම (ක්ෂාන්තිවාදී ජාතකය) | 266 |
| **28.** | **උත්තමයන්ගේ අවවාද පිළිගැනීම** | **271** |
| | අවවාද නො ලැබිය යුත්තකු නැති බැව් | 271 |
| | බුදුන් වහන්සේ පවා ගුරුවරයකු සෙවූ බැව් | 272 |
| | කෙබඳු කෙනකුගේ වුව ද හොඳ අවවාද පිළිගත යුතු බව | 274 |
| | අවවාද ලැබීමට නොව භික්ෂූන්ට අවවාද දීමට සූදානම් වන ඇතැම් පින්වතුන් | 275 |
| | සීලයෙහි පිහිටා සියල්ල කිරීමේ චාරිත්‍රය | 276 |
| | තමා සිල්වත් නොවී දන්දීමට සීලවන්තයන් සෙවීම අනුවණ වැඩක් බව | 277 |
| **29.** | **ශ්‍රමණයන් වහන්සේලා දැකීම** | **278** |
| | කෙනකු පහසුවන් හැඳින ගත නො හැකි බැව් | 279 |
| | ලෝකයේ හැටි | 281 |
| | **තාපස කලබලය 282** | |
| | තාපසවරුන්ගේ ලොව පහළ වීම | 283 |
| | තාපසයන්ට නියමිත ඇඳුම් හා වේශය කුමක් ද? | 284 |
| | ඔවුනට භාවිත කළ යුතු නාමය කුමක් ද? | 285 |
| | ඔවුන්ගේ ගුණ ධර්ම හා භාවනාව කුමක් ද? | 286 |
| | ඔවුන්ගේ පැවැත්ම කුමක් ද? | 287 |
| | පමණට වඩා දුක් විඳීමත් ගුණයක් ද? | 288 |
| | මධ්‍යම ප්‍රතිපදාව නම් කුමක් ද? | 288 |
| | **ආරණ්‍ය සේනාසන හා භික්ෂූන් වහන්සේලා** | **289** |
| | සමාජ සේවක භික්ෂූන් වහන්සේ | 290 |

*Non-commercial distribution*

| | | පිට |
|---|---|---|
| | ඇතැම් වනවාසී භික්ෂූන්ගේ සිල්වත්කම හා ගුණවත්කම | 291 |
| | සිල්වත් කම හා ගුණවත්කම එකක් ද? | 293 |
| | ගුණ නම් කිම? | 296 |
| | මනුෂ්‍ය ධර්මයවත් නැති ඇතැම් වනවාසික භික්ෂූන් | 296 |
| | මහායෝගී මහාස්ථවිර නමකගේ පශ්චිමාවවාදය | 297 |
| | **නියම ශ්‍රමණයන් වහන්සේ කෙබඳු ද?** | **300** |
| | **වර්තමාන භික්ෂූන් වහන්සේ** | **302** |
| | ශ්‍රමණයන් වහන්සේලා නො දැකීම පරිහානියට - හේතුවක් බැව් | 304 |
| | භික්ෂූන් ආශ්‍රය කළ යුත්තේ කුමකට ද? | 305 |
| | බෞද්ධ ප්‍රතිපත්තිය කුමක් ද? | 305 |
| | ප්‍රතිපත්ති පූරණයත් උගතයුතු බැව් | 306 |
| | දන් දෙන ඇතැම් පිංවතුන් | 307 |
| | වරදවා කළ පිංකම් නැවත සකස් කළ නො හැකි බැව් | 309 |
| **30.** | **සුදුසු කල්හි ධර්ම සාකච්ඡා කිරීම** | **311** |
| **31.** | **තපස** | **314** |
| **32.** | **බ්‍රහ්මචර්‍ය්‍යාව** | **320** |
| | පෙර උතුමන් බඹසර රැකි අයුරු උදයභද්ද ජාතකය | 321 |
| | දෙව්ලොව තතු විචාරීම | 326 |
| | දෙව්ලොව තතු පැවසීම | 326 |
| | දෙව්ලෝ මහ විචාරීම | 327 |
| | දෙව්ලෝ මහ පැවසීම | 328 |
| **33.** | **ආර්‍ය්‍යසත්‍යයන් දැකීම** | **332** |
| | චතුරාර්‍ය්‍ය සත්‍යය | 333 |
| | මාර්ගසත්‍ය පිළිබඳ විස්තර | 341 |
| **34.** | **නිර්වාණය ප්‍රත්‍යක්ෂ කිරීම** | **344** |
| | උතුම් ම සුවය | 346 |
| **35.** | **අෂ්ටලෝක ධර්මයෙන් කම්පා නො වීම** | **350** |

*Non-commercial distribution*

| | | පිට |
|---|---|---|
| **36.** | **ශෝක නැත්තා වූ සිත් ඇති බව** | **355** |
| **37.** | **රාගාදි රජස් රහිත සිත් ඇති බව** | **360** |
| | රාගය නිසා භාය්‍යාවගෙන් සතර වරක් මැරුම් කෑ පුරුෂයෙක් | 361 |
| | ද්වේෂය රාගයට ද වඩා භයානක බැව් | 362 |
| **38.** | **චතුර්යෝග භයින් මිදුණු සිත් ඇති බව** | **365** |
| | යෝගයන් සත්ත්වයා දුකෙහි යොදවන බැව් | 365 |
| | **මංගල ධර්ම දේශනය නිම කිරීම** | **367** |


*Non-commercial distribution*

# මංගල සූත්‍රය

එවං මෙ සුතං, එකං සමයං භගවා සාවත්ථියං විහරති ජේතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ, අථ ඛො අඤ්ඤතරා දෙවතා, අභික්කන්තාය රත්තියා අභික්කන්ත වණ්ණා කෙවලකප්පං ජේතවනං ඔභාසෙත්වා යෙන භගවා තෙනුපසංකමි උපසංකමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි, එකමන්තං ඨිතා ඛො සා දෙවතා භගවන්තං ගාථාය අජ්ඣභාසිः-

**බහූ දේවා මනුස්සා ච - මංගලානි අචින්තයුං**
**ආකඞ්ඛමානා සොත්ථානං - බෲහි මංගලමුත්තමං**

1. **අසෙවනා ච බාලානං - පණ්ඩිතානං ච සෙවනා**
   **පූජා ච පූජනීයානං - එතං මංගලමුත්තමං**

2. **පතිරූප දෙස වාසො ච - පුබ්බේ ච කත පුඤ්ඤතා**
   **අත්තසම්මා පණිධි ච - එතං මංගලමුත්තමං**

3. **බාහු සච්චං ච සිප්පං ච - විනයො ච සුසික්ඛිතො**
   **සුභාසිතා ච යා වාචා - එතං මංගලමුත්තමං**

4. **මාතා පිතු උපට්ඨානං - පුත්තදාරස්ස සංගහො**
   **අනාකුලා ච කම්මන්තා - එතං මංගලමුත්තමං**

5. **දානඤ්ච ධම්මචරියා ච - ඤාතකානඤ්ච සංගහො**
   **අනවජ්ජානි කම්මානි - එතං මංගලමුත්තමං**

6. **ආරති විරති පාපා - මජ්ජපානා ච සඤ්ඤමො**
   **අප්පමාදෙ ච ධම්මෙසු - එතං මංගලමුත්තමං**

7. **ගාරවො ච නිවාතො ච - සන්තුට්ඨි ච කතඤ්ඤුතා**
   **කාලෙන ධම්ම සවනං - එතං මංගලමුත්තමං**

*Non-commercial distribution*

8. ඛන්ති ච සොවචස්සතා - සමණානඤ්ච දස්සනං
කාලෙන ධම්මසාකච්ඡා - එතං මංගලමුත්තමං

9. තපො ච බ්‍රහ්මචරියඤ්ච - අරියසච්චාන දස්සනං
නිබ්බාන සච්ඡිකිරියා ච - එතං මංගලමුත්තමං

10. ඵුට්ඨස්ස ලොකධම්මෙහි - චිත්තං යස්ස න කම්පති
අසොකං විරජං ඛෙමං - එතං මංගලමුත්තමං

11. එතාදිසානි කත්වාන - සබ්බත්ථමපරාජිතා
සබ්බත්ථ සොත්ථිං ගච්ඡන්ති -
තං තෙසං මංගලමුත්තමන්ති

## සූත්‍ර නිදානය

සමස්ත ලෝක මංගල වූ, ක්ලේශ මලාපගමයෙන් සුවිශුද්ධ වූ, පුණ්‍ය පිණ්ඩායමාන වූ, බුද්ධ ප්‍රත්‍යෙක බුද්ධාදි මහෝත්තමයාණන් වහන්සේලාට ජන්මභූමි වූ, නරනාරී ගණාකීර්ණ ග්‍රාම නිගම රාජධානි ශතයෙන් සමලංකෘත වූ, උතුම් ජම්බුද්වීපයෙහි නගරද්වාර සන්ථාගාරාදි ඒ ඒ තන්හි කථිකයනට වැටුප් දී **රාමායන ගීතාභරණාදි** ශ්‍රවණ මධුර සගමොක් වළක්වන මිථ්‍යා කථා කියවන්නා වූ සිරිතක් පෙර පැවැත්තේය.

එකල පැවැත් වූ ඇතැම් කථාවක් නිමකිරීමට දක්ෂ කථිකයෝ සාරමසකුදු ගත කළෝ ය. මේ කාලයෙහි එක් දවසක් රැස්ව කථා කරන ස්ථානයකදී **මංගල ප්‍රශ්නය** පහළ වූයේ ය.

ලෝකයෙහි ඉතා කුඩා සත්ත්වයාගේ පටන් ඉතා මහත් සත්ත්වයා දක්වා සියල්ලෝම සැප කැමැත්තෝය. සැප සොයන්නෝය. "**මංගල**" යන්නෙන් අදහස් කරනු ලබනුයේ සත්ත්වයන් විසින් කැමතිවන සොයන පතන එකී සුභ සිද්ධියට හෙවත් සැපයට හේතුවන කරුණුය. එබැවින් මේ මංගල ප්‍රශ්නය මිනිසුන්ගේ පමණක් නොව දෙවියන්ගේ ද කල්පනාවට භාජන වූවක් විය.

තථාගත ධර්මය නො දන්නා වූ බොහෝ සත්ත්වයෝ "සත්‍ය වූ මංගල ධර්මයෝ කවරහුද? යන බව නො දැන මංගලාමංගල වූ නොයෙක් දේ මංගලාමංගල වශයෙන් සලකති. ඔවුනතුරෙන්

Non-commercial distribution

**ඇතමෙක්** උදෑසන හෝ කටයුත්තක් පටන් ගැන්මෙහි හෝ ඇසින් දක්නා ලද යම් යම් දේ ශුභාශුභ සිද්ධියට හේතුහු යයි සලකති.

**ඇතමෙක්** කනින් ඇසූ යම් යම් ශබ්දයෝ ශුභාශුභ සිද්ධියට හේතුහු යයි සලකති. **ඇතමෙක්** නාසයෙන් ආඝ්‍රාණය කරනු ලැබූ යම්යම් ගන්ධයෝ ශුභාශුභ සිද්ධියට හේතුහු යයි සලකති. **ඇතමෙක්** අනුභව කරනු ලැබූ යම් යම් ආහාරයෝ ශුභාශුභ සිද්ධියට හේතුහු යයි සලකති. **ඇතමෙක්** ශරීරයෙන් ස්පර්ශ කරන ලද යම්යම් දේ ශුභාශුභ සිද්ධියට හේතුහු යයි සලකති.

ඔවුන් අතුරෙන් දක්නා ලද දෙයින් ශුභාශුභ සිද්ධිය සලකන්නෝ **"දිට්ඨ මංගලික"** නම් වෙති. ඇසූ ශබ්දයෙන් ශුභාශුභ සිද්ධිය සලකන්නෝ **"සුතමංගලික"** නම් වෙති. ආඝ්‍රාණය කළ, ආශ්වාදනය කළ, ස්පර්ශ කළ දෙයින් ශුභාශුභ සිද්ධිය සලකන්නෝ **"මුත මංගලික"** නම් වෙති.

**දිට්ඨ මංගලිකයෝ** වනාහි උදෑසන නිදා නැගි කල්හි හෝ ගමනක් යන කල්හි හෝ යම්කිසි කටයුත්තක් ආරම්භ කිරීමෙහි හෝ යහපත් යයි සම්මත ඇතැම් ස්ත්‍රී පුරුෂයන් දැකීම ද, කන්‍යා ස්ත්‍රීන්, ගර්භනීන්, සැරසී සිටින ළදරුවන් දැකීම ද, ඇතුන්-අසුන්-කිරිදෙනුන්-කිරිකළ-පිරුණුකළ ආදි මංගල සම්මත වස්තුවක් දැකීම ද මඟුලක් ය, හෙවත් යහපත සිදුවීමට හේතුවකැයි සලකති.

එසේ ම ඔවුහු දැකීමට අයහපත්යයි සම්මත මිනිසුන්ය, අංග විකලවූවන් ය, ආවුධ ගත්තවුන්ය, යොත් ගත්තවුන්ය, සර්පාදි ඇතැම් සතුන්ය, හිස් කළය යනාදිය දැකීම නපුරට කරුණකැයි සලකති. එබැවින් ඔවුහු ඇතැම් විට ලාභයක් වූ කල උදෑසන දුටු තැනැත්තාට පසසති. අලාභ දුක් කරදර ඇති වූ කල උදෑසන දුටු අයට නිකරුනේ ගර්හා කරති. ගමනක් ගොස් බලාපොරොත්තු ඉටු වූ දිනවලදැ මඟදී දුටු අය පසසති. ඉටු නොවූ කලැ ගර්හා කරති.

**සුත මංගලිකයෝ** වනාහි අලුයම් වේලෙහි හෝ කටයුත්තක් පටන් ගැනීමෙහි හෝ "සෙත්වේවා" "ජය වේවා" "සැපවේවා" "පිරේවා" "මඟුල්වේවා" "ආයුබෝ වේවා" යනාදි ආශිර්වාද ශබ්දයෝ ය - "ජයවිය" "මඟුල්විය" යනාදී ශබ්දයෝය, "පූර්ණා" "සුමන"

Non-commercial distribution

ආදි මංගල සම්මත ඇතැම් ස්ත්‍රී පුරුෂයන්ගේ නාමයෝය, ඇතුන්ගේ අසුන්ගේ මොනරුන්ගේ හා තවත් මෙවැනි මංගල සම්මත සත්ත්වයන්ගේ ශබ්දයෝය යන මේ ආදි ශබ්ද ඇසීම යහපතට හේතු වශයෙන් සලකති. එසේම ඔවුහු "හැඬීම්, විලාප කීම්, හෙන වදීවා, ගසින් වැටේවා, දියේ ගිලේවා, නයා කාවා, කොටියා කාවා" - යනාදි නපුරු වචනයන්ය, බල්ලන් බළලුන් සූනන් නරින් බස්සන් ආදි ඇතැම් සතුන්ගේ ශබ්දයන්ය යන මේ ආදි ශබ්ද ඇසීම ඇවැඩට හේතු යයි සලකති.

**මුත මංගලිකයෝ** වනාහි උදෑසන නෙළුම් මල් මහනෙල් සඳුන් ආදීන්ගේ සුවඳ ආඝ්‍රාණය කිරීම ද, කිරි ගිතෙල් මී කිරිබත් මිහිරි පලවැල කැවුම් ආදිය අනුභව කිරීම ද, පොළොව අලුත් ගොම ගොයම් තල් සහල් නාමල් මිහිරි පලතුරු කිරිදෙනුන් යනාදිය ඇල්ලීම ද, අලුත් ඇඳුම් පැළඳුම් ඇඳීම ද යන මේ ආදිය දියුණුවට වැඩට හේතුහු යයි සලකති. එසේ ම ඔවුහු අපවිත්‍ර ගන්ධයාගේ ආඝ්‍රාණය, ඉඳුල්බත් ආදිය අනුභව කිරීම, අනිෂ්ට දැවල ස්පර්ශය අවමංගලයට හොත් අවැඩට - නපුරට - අයහපතට හේතු යයි සලකති.

මංගල ප්‍රශ්නය පහළ වූ කලැ **දිට්ඨ මංගලිකයෝ** ස්වමතය පරිදි ඇසින් යහපත් දේ දැකීම මංගල යයි කීහ. **සුත මංගලිකයෝ** එයට පටහැනිව "ඇසට නම් යහපතත් පෙනෙයි. අයහපත් පෙනෙයි. මෙසේ ඇසට නො පෙනෙන දෙයක් නැත. ඇසට පෙනෙන පෙනෙන සියල්ලම මගුල් වී නම්, ලොවැ මගුල් නොවන දෙයක් නැත. එබැවින් ඇසින් යමක් දැකීමෙන් වන මගුලක් (යහපතක්) නැත" යයි දිට්ඨ මංගලිකයන්ගේ වාදය ප්‍රතික්ෂේප කොට කනින් යහපත් හඬක් ඇසීම ම මගුලැ යි කියන්නට වූහ.

**මුත මංගලිකයෝ** ස්වමතය පරිදි කනට නම් යහපත් ශබ්දත් අයහපත් ශබ්දත් ඇසෙයි. ඉදින් ඇසූ දෙය මගුල් නම් ඇසෙන සියල්ලම මගුල්විය යුතුය. එවිට ලොවැ මගුල් නො වන ශබ්දයක් නැත යයි යට කී දෙකම ප්‍රතික්ෂේප කොට යම්කිසි සුවඳක් දැනීම හෝ මිහිරි අහරක් අනුභව කිරීම හෝ අභිනව වස්ත්‍රාදි යමක් කයින් ස්පර්ශ කිරීම හෝ මගුලැයි කීහ.

*Non-commercial distribution*

මෙසේ මනුෂ්‍යයෝ දිට්ඨ **මංගලිකය**, **සුත මංගලිකය**, **මුත මංගලිකය**-කියා තුන් කොටසක්ව ඔවුනොවුන් හා වාද කරන්නට වූවාහු නුමුත්, අනිත් පක්ෂවලින් කියන කරුණු බිඳ පියා ස්වමතයෙහි අන්‍යයන් පිහිට වීමෙහි සියල්ලෝම අපොහොසත් වූහ. මෙලෙසින් මේ මංගල කථාව මුළු මහත් දඹදිව මුළුල්ලෙහි ම ප්‍රසිද්ධ විය.

**මිනිසුන්ගේ මේ වාදය** ඇසූ ඔවුන්ගේ ආරක්ෂක දේවතාවෝ ද මගුල් නම් කුමක් දැ යි සිතන්නට වූහ. ඔවුන් ගෙන් දැන උන් හා මිත්‍ර වූ වෘක්ෂ පර්වතස්ථ දෙවියෝ ද මගුල් සිතන්නට වූහ. ඔවුන්ගෙන් දැන උන් හා මිත්‍ර වූ ආකාශස්ථ දේවතාවෝ ද මගුල් ගැන සිතන්නට වූහ. මෙසේ ක්‍රමයෙන් මේ මංගල කථාව අකනිට්ඨා බඹලොව දක්වා පැතිරී ගොස් සියලු දෙවියෝ මගුල් නම් කිමදැයි සිතන්නට වූහ. මේ ක්‍රමයෙන් මේ සක්වළ පමණක් නොව දස දහසක් සක්වළැ සැම තන්හි මේ මංගල කථාව පැතිර ගොස් ඒ සියල්ලෝම මගුල් ගැන සිතන්නට වූහ. එහෙත් මගුල් සිතුවිලි පමණක් මුත් මේ දේ මගුල් යයි කියා දෙළොස් වසක් යන තුරුම නිශ්චයකට නො පැමිණියෙන් **ආර්‍ය්‍ය ශ්‍රාවකයන්** හැර සියලු දෙවියෝ ද බ්‍රහ්මයෝ ද මනුෂ්‍යයෝ ද **දිට්ඨ**, **සුත**, **මුත** වශයෙන් තෙ කොටසකට බෙදුණාහ. මගුල් නම් මේ යයි තත් වූ පරිදි දැනගත් කිසිවෙක් ඔවුනතර නො වූහ. මේ පරිදි මේ මංගල කෝලාහලය ලොවැ පහළව දෙළොස් වසක් පැවැත්තේය.

**දෙළොස් වසකින් පසු** එක් දවසක් තව්තිසා දෙව් ලොවැ වැසි දෙවියෝ එක්ව, "පින්වත්නි! යම් සේ ගෙහිමියෙක් ගෙයි මිනිසුන්ට, ගම් දෙටුවෙක් ගම් වැසියනට, රජ කෙනෙක් රටවැසියනට නායක ද එසේම දෙදෙව්ලොවට අධිපති මේ ශක්‍ර දේවේන්ද්‍රයෝ අප සැමට ම නායකයහ. අපේ සියලුම නඩු උන්වහන්සේ ලවා ම විනිශ්චය කරවා ගනුම්හ. දැනට පැනනැඟී තිබෙන මේ මංගල වාදය ද උන්වහන්සේට විනිශ්චය කළ හැකි විය යුතුය. අපි සැම දෙන ම ගොස් මෙය උන්වහන්සේට සැල කොට විනිශ්චය කරවා ගන්නෙමු නම් ඉතා යෙහෙකැ"යි මන්ත්‍රණය කොට, සැමදෙන ම එක්ව ශක්‍ර දේවේන්ද්‍රයා කරා ගොස්, ඒ වෙලාවට සුදුසු දිව සළු හැඳ අබරණ ලා සැරසී අඩු තුන්

*Non-commercial distribution*

කෙළක් දෙවගනන් පිරිවරා පරසතු රුක්මුල පඬු ඇඹුල් සලස්නෙහි හුන් සක් දෙවිඳු වැඳ, එකත්පස්ව සිට "හිමියනි! දැන් මංගල ප්‍රශ්නයක් ලොවැ පහළවී මහා කෝලාහලය, කවර දෙයක් මගුල්දැයි තීරණයකට නොගියාහු තෙ කොටසක් වී වාද කෙරෙති. ඉන් කෙනෙක් ඇසින් දුටු දේ මගුලැයි කියති. තව කෙනෙක් කනින් ඇසූ දේ මගුලැයි කියති. අනිකෙක් ගන්ධ රස ස්ප්‍රෂ්ටව්‍යන් මගුලැයි කියති. එබැවින් මෙහි අපිදු තව ම මෙනම් දේ මගුලැයි නිෂ්ටාවකට නො ගියෙමු. ඉන් කිනම් දෙයක් මගුල්දැයි අපට පවසනු මැනව" යි ශක්‍ර දේවේන්ද්‍රයාණන් ගෙන් මංගල ප්‍රශ්නය විචාළෝය.

**ශක්‍ර දේවේන්ද්‍ර තෙමේ** ප්‍රකෘතියෙන් මහ නුවණැත්තෙක් බැවින් පැනය විසඳීමට යුහුසුළු නො වී ඔවුන්ගෙන් විචාරන්නේ "පින්වත්නි! මේ මංගල වාදය තොපම ඉපද වූ පැනයක් ද තොප අන් කෙනකුගෙන් දැන ගන්නා ලද්දක් දැ"යි විචාළේය. "දේවයන් වහන්ස! අපි එය සිව් මහ රජයෙහි (චාතුම්හාරාජික දිව්‍ය ලෝකයෙහි) දෙවියන්ගෙන් ඇසූවෙමු" යි කීහ. ඔවුන් ගෙන්වා විචාළ කල, ඔවුහු ද ආකාශස්ථ දෙවියන්ගෙන් දැනගත් බව කීහ. උන් ගෙන්වා විචාළ කල ඔවුහු ද බූමාටු දෙවියන්ගෙන් දත් බව කීහු. උන්ගෙන් විචාළ තැන ඔවුහු ද මිනිසුන් රක්නා දෙවියන් අතින් දත් නියාව පැවසූහ. ඔවුන් විචාළ කල ඔවුහු මිනිස් ලොව පහළ වූ නියාව කීහ.

එකල්හි ශක්‍ර දේවේන්ද්‍රතෙමේ "දැන් බුදුහු කොහි වැඩ වෙසෙන සේක්දැ"යි විචාරා, "මිනිස් ලොව වැඩ වෙසෙන සේකැ"යි කී කල්හි, මේ ප්‍රශ්නය, උන්වහන්සේගෙන් විචාළ කෙනෙක් ඇත්දැයි ඇසීය. උන්වහන්සේගෙන් නො විචාළ බව දෙවියෝ සැලකළහ. එ පවත් ඇසූ ශක්‍ර දේවේන්ද්‍ර තෙමේ කියනුයේ "පින්වත්නි! **ඒ තථාගතයන් වහන්සේ** ලොවැ නොදත් දෙයක් නම් නැත. සියල්ල ම දත් ඒ උතුමා මිනිස් ලොව මැ වැඩ සිටියදී, උන්වහන්සේ වෙතින් නො විචාරා මා විචාරීම ගිනි තිබියදී කණමැදිරියන් දැල්වීමක් වැනිය. තරාදිය තිබියදී අතින් කිරීමක් වැනිය. අඬුව තිබියදී අත පුළුස්සා ගැනීමක් වැනිය.

එවූ, **පින්වත්නි!** ඒ තථාගතයන් වහන්සේ කරා ගොස් විචාරමු. උන්වහන්සේගෙන් අපි මේ ප්‍රශ්නය මනා අන්දමින් විසඳා

Non-commercial distribution

ගන්නෙමු" යි කියා "පින්වත! තථාගතයන් වහන්සේ විචාරව" යි එක් දිව්‍යපුත්‍රයකු හට අණ කෙළේය. **ඒ දිව්‍යපුත්‍රයා ද** ශක්‍ර දේවේන්ද්‍රයාගේ නියමය පරිදි, ඒ වේලාවට යෝග්‍ය වූ අබරණින් සැරසී, දස දහසක් සක්වළ දිව්‍ය බ්‍රහ්මයන් සමඟ, මධ්‍යම රාත්‍රියෙහි දෙව්රම් මහ වෙහෙර ඒකාලෝක කෙරෙමින්, යට කී මංගල ප්‍රශ්නය විචාරනු පිණිස තථාගතයන් වහන්සේ වෙත එළඹ, වැඳ එකත් පසෙක සිට මංගල ප්‍රශ්නය විචාරන්නේ-

> **"බහූ දෙවා මනුස්සා ච - මංගලානි අචින්තයුං**
> **ආකඞ්ඛමානා සොත්ථානං - බ්‍රෑහි මංගලමුත්තමං"**

යන මංගල සූත්‍රයෙහි ප්‍රථම ගාථාව කියා, **ස්වාමීනි. භාග්‍යවතුන් වහන්ස!** තමන්ට මෙලොව පරලොව සැප කැමැත්තා වූ බොහෝ වූ දෙවියෝ ද බොහෝ වූ මනුෂ්‍යයෝ ද මංගල කාරණයන් හෙවත් අභිවෘද්ධි සිද්ධියට කාරණයන් සිතුහ. (ඒ දෙවියන්ගේ අනුමතියෙන් මනුෂ්‍යයන් හට අනුග්‍රහයෙන් මා විසින් විචාරන ලද භාග්‍යවතුන් වහන්සේ අප හැමට ඒකාන්ත හිත සැප එලවන බැවින් යමක් උතුම් මඟුල් වී ද) ඒ උතුම් මඟුල් අපට අනුකම්පා පිණිස වදාළ මැනව" යි මංගල ප්‍රශ්නය විචාළේය.

එකල්හි මුළු ලොවට මංගල වූද, මංගල කාරණයන් මොනවට දත්තා වූ ද අප භාග්‍යවතුන් වහන්සේ දෙළොස් වර්ෂයක් මුළුල්ලෙහි දෙව් මිනිසුන්ට විසඳා ගත නොහැකිව තුබූ මංගල ප්‍රශ්නය විසඳා වදරන සේක් "අසේවනා ච බාලානං" යනාදි ගාථා දසයකින් සකල ලෝකවාසීන්ගේ දෙලෝ දියුණුව පිණිස පවත්නා උතුම් මංගල කාරණා අටතිසක් වදාළ සේක.

මෙසේ දිව්‍ය බ්‍රහ්මාදි කිසිවකු හටත් විසඳිය නොහැකි වූ මේ මංගල ප්‍රශ්නය විසඳා වදරා මුලු ලෝ වැසියා විසින් බලාපොරොත්තු වූ මංගල ධර්මයන් නිශ්චය වශයෙන් පහද වදළා වූ ඒ භාග්‍යවතුන් වහන්සේට නමස්කාර වේවා!

## නිදනය පිළිබඳ දතයුතු විශේෂ කරුණු

**පින්වත්නි!** සත්ත්වයන්ට සැප දුක් ලැබීම ඔවුන් කළා වූ පින් පව්වලින් සිදුවන්නකි. අන්‍ය හේතුද ඇතිමුත් ඒවා අප්‍රධානයහ.

Non-commercial distribution

ඇසින් දුටු යම් කිසිවක ආනුභාවයෙන් හෝ ඇසූ ශබ්දයක ආනුභාවයෙන් හෝ අනුභව කළ දෙයක ආනුභාවයෙන් හෝ සත්ත්වයන්ට සැපතක් හෝ විපතක් නො වේ. එබැවින් දිට්ඨ මංගලාදිය මිථ්‍යා මංගලයෝ වෙති. ඒවායේ ආනුභාවයෙන් දියුණුවක් හෝ පිරිහීමක් හෝ වේ යයි ගැනීම කර්ම කර්මඵල ප්‍රතික්ෂේප කිරීමකි.

එබැවින් දිට්ඨ මංගලාදිය සාර වශයෙන් ගන්නහුගේ සරණ ශීලය කිලිටි වේ. එවිට උපාසක භාවය හෙවත් බුද්ධාගමිකාර බව කිලිටි වේ. ඔවුහු පිරිසිදු බෞද්ධයෝ නො වෙති. උපාසක භාවය කලිටි කරන මේ මිථ්‍යා ලබ්ධිය සත්‍ය වශයෙන් සාර වශයෙන් ගන්නා වූ පුද්ගලයන්ට සසර දුකින් මිදී ලෝකෝත්තර නිර්වාණයට පැමිණීම තබා මරණින් මතු ස්වර්ගයට යාම පවා දුෂ්කර වේ. එබැවින් සසර කතරින් එතර වනු කැමති බෞද්ධයන් විසින් තම තමන්ට ද මේ මිථ්‍යා ලබ්ධිය තිබේ නම් එය වහාම දුරුකොට පිරිසිදු සම්‍යග් දෘෂ්ටියෙහි පිහිටිය යුතුය.

තවද දුටු දේවල් දුටු පුද්ගලයන් ඇසූ ශබ්දදිය නිසා කිසිවකුට යහපතක් හෝ අයහපතක් නොවන නමුත් ඒවාද ශාස්ත්‍ර දන්න-වුන්ට මතුවන්නා වූ ශුභාශුභ දැන ගැනීමට හේතු වෙති. ගමනක් යාමෙහි දී හෝ කටයුත්තක් පටන් ගන්නා කල්හි හෝ ඇසූ දුටු සූනන් හැඩීම් ආදී නිමිතිවලින් වන්නාවූ ශුභාශුභ දැන ඒ ඒ දේවල් කිරීම හෝ නොකර හැරීම බෞඩයකුට ද වරදෙක් නොවේ. එබැවින් මේ කාරණය පිළිබඳ අති ධාවනය කොට නිමිත්ත ශාස්ත්‍රය ද ප්‍රතික්ෂේප නො කළ යුතු. වරදට පැමිණීම් සිදුවන්නේ නිමිත්තම ශුභාශුභ සිද්ධියට හේතුව යයි ගැනීමෙනි.

Non-commercial distribution

# මංගල ධර්ම විස්තරය

**නමො තස්ස භගවතො අරහතො**

**සම්මා සම්බුඩස්ස**

**අසෙවනා ච බාලානං -පණ්ඩිතානං ච සෙවනා**
**පූජා ච පූජනීයානං - එතං මංගලමුත්තමං**

**බාලානං**-මෙලොව පරලොව යහපත නො දන්නා වූ බාලයන්, **අසෙවනා ච**-ආශ්‍රය නො කිරීම ද, **පණ්ඩිතානං**-මෙලොව පරලොව අර්ථානර්ථ දෙක දන්නා වූ පණ්ඩිතයන්, **සෙවනා ච** - ආශ්‍රය කිරීමද, **පූජනීයා නං** - ශිලාදි ගුණයන් හේතුකොටගෙන පිදිය යුතු වූ බුඩාදි උත්තමයන් වහන්සේලාට, **පූජා ච** - ආමිසපූජා ප්‍රතිපත්ති පූජාවන් ගෙන් පිදීම ද යන, **එතං** - මෙය, **උත්තමං මංගලං**-උතුම් මඟුලි. මේ මංගල ධර්ම වදාළ පළමු ගාථාව හා එහි පදාර්ථයි.

බාලයන් සේවනය නො කිරීමද, පණ්ඩිතයන් සේවනය කිරීම ද, පිදිය යුත්තන් පිදීම ද, යන මෙය උතුම් මංගලයකි යනු භාවය යි.

අටතිස් මගුල් වදරන්නා වූ අප අංගීරස තථාගතයන් වහන්සේ මේ ගයෙන් මංගල කාරණා තුනක් වදාළහ.

එනම්:-

1. **බාලයන් සේවනය නො කිරීම ය**.
2. **පණ්ඩිතයන් සේවනය කිරීම ය**.
3. **පිදිය යුත්තන් පිදීම ය** - යනුයි.

*Non-commercial distribution*

## 1. බාලයන් සේවනය නො කිරීම.

මෙ හි **"බාල"** යන්නෙන් වයසින් බාල කුඩා ළමයින් නොව, ගුණ නැණ දෙකින් බාල වූ - හීන වූ පාපී පුද්ගලයෝ අදහස් කරනු ලැබෙත්. එනම්, මෙලොව යහපත පිණිස හා පරලොව යහපත පිණිස ද හැසිරීමක් නැත්තා වූ තමාගේ මෙන්ම අනුන්ගේ ද දෙලෝ වැඩ නසන්නා වූ මිනීමැරීම, මැරවීම, මිනිසුන්ට ගල් මුල් දඬු මුගුරු ආදියෙන් පහරදීම, සතුන් මරා මස් කෑම, බිත්තර කෑම, සතුන්ට හිංසා කිරීම, හිංසාවලට අනුබල දීම, ගෙවල් බිඳීම්, මංකොල්ලකෑම් ආදියෙන් අන්සතු දේ පැහැර ගැනීම, ගැන්වීම, දුබලයන් ගේ වතු පිටි ආදි දේපල බලහත්කාරකමින් අයිති කර ගැනීම, දුබලයන් බිය ගන්වා ඔවුන් සතු දේ අයිතිකර ගැනීම, බොරු නඩු කියා අන් සතු දේ ගැනීම, අල්ලස් දීම, ගැනීම, බොරුකීම, බොරු සාක්කි කීම, බොරු නඩු කීම, බොරු පොරොන්දුවීම, පොරොන්දු කඩ කිරීම, කාමයෙහි වරදවා හැසිරීම, මත් පැන් පානය කිරීම, සූදුවෙහි යෙදීම, කේලාම්කීම, එරුස වචන කීම, දෙලොවට වැඩක් නැති ප්‍රලාප දෙඩීම, අනුන්ගේ ගුණ මැකීම, අනුන්ට නින්ද අපහසා කිරීම යනාදි මෙකී නොකී දුශ්චරිතයන් පුරන්නා වූ වඩන්නා වූ පුද්ගලයෝ **"බාලයෝ"** යයි දත යුතු.

**බාලයාගේ ලක්ෂණ:**

මේ බාල පුද්ගලයා හැඳින ගැනීමට උපකාරවන ලකුණු තුනක් ඇති බව බුදුන් වහන්සේ "අංගුත්තර තික නිපාත"යෙහි මෙසේ වදළහ.

**"තීනිමානි භික්ඛවේ! බාලස්ස බාල ලක්ඛණානි බාල නිමිත්තානි බාලපදනානි. කතමානි තීනි? ඉධ භික්ඛවෙ! බාලො දුච්චින්තිත චින්තී ච හොති දුබ්භාසිතභාසි දුක්කත කම්මකාරී"**

*Non-commercial distribution*

මහණෙනි, මොහු බාලයෙකැ යි හැඳිනීමට ඉවහල් වූ බාලයා සතු ලක්ෂණයෝ, බාල බැව් හැඳිනගන්නා වූ කාරණයෝ, බාල බැව් හැඳිනීමේ චරිතයෝ තුන්දෙනෙක් වෙත්. කවර තුන්දෙනෙක් ද යත්? මහණෙනි! මේ ලෝකයෙහි බාලතෙමේ නපුරු සිතිවිල්ලක් ම සිතන්නේය. නපුරු වචනයක් ම කියන්නේ ය. නපුරු දෙයක් ම කරන්නේය යනු එහි අදහසයි.

ඒ වූ පරිදි **1. නපුරු සිතිවිලි සිතීම**, **2. නපුරු වචන කීම**, **3. නපුරු ක්‍රියා කිරීම** යන මේ කරුණු තුන බාලයා හැඳිනීමට ඇති ලකුණු බව දතයුතුය.

**බාලයා වනාහි** නපුරු සිතිවිලි සිතන්නෙකි. නපුරු වචන කියන්නෙකි. නපුරු ක්‍රියා කරන්නෙකි. එහෙයින් ඔහු ලොවට මහත් අනර්ථ රාශියක් කරන්නා වූ ලොවට සාපයක් වූ පුද්ගලයෙකි. ලෝකයෙහි සත්ත්වයන්ට පැමිණෙන සියලු දුක් විපත් භය කරදර බාලයන් නිසාම පැමිණෙති, පණ්ඩිතයකු ගෙන් කිසිවකුට කිසි කලෙක විපතක් ඇති නො වේ. ඒ බව සියල්ල දැන වදළ බුදු පියාණෝ ද මෙසේ වදළහ:-

**“යානි කානිචි භික්ඛවෙ! භයානි උප්පජ්ජන්ති සබ්බානි තානි බාලතො උප්පජ්ජන්ති**, **නො පණ්ඩිතතො**, **යෙ කෙචි උපස්සග්ගා උප්පජ්ජන්ති සබ්බෙ තෙ බාලතො උප්පජ්ජන්ති**, **නො පණ්ඩිතතො**, **යෙ කෙචි උපද්දවා උප්පජ්ජන්ති සබ්බෙ තෙ බාලතො උප්පජ්ජන්ති**, **නො පණ්ඩිතතො**.

(අංගුත්තර තිකනිපාත පාළි)

### සේවනය හා එහි බලය

**සේවනය නම්** ආශ්‍රය යි. නිතර එක්ව හැසිරීම, කථා බස් කිරීම, එකට කටයුතු කිරීම යි. **සේවනය නො කිරීම නම්** ආශ්‍රය නො කිරීම යි. බාලයන් සේවනය නො කිරීම නම්, යටකී පවිටු පුද්ගලයන් සමග නිතර එක්ව කටයුතු නො කිරීම යි. එය දෙලොවැ සැපතට හේතුවකි. එහෙයින් එය මංගල (දියුණුවට) කාරණයකි.

**ආශ්‍රය වූ කලී මිනිසාගේ දියුණුවට හෝ පිරිහීමට මූලික කාරණයකි**. මිනිසා ධනයෙන් ඥානයෙන් ගුණයෙන් දියුණු තියුණු

Non-commercial distribution

වී මහා භාග්‍ය සම්පන්නයකු වනුයේත්, ධන ඥාන ගුණයන් ගෙන් පිරිහී මහත් අවාසනාවන්තයකු වනුයේත් ආශ්‍රයේ බලයෙනි. එහෙයින් ආශ්‍රය **නානා චරිත නිර්මාණයෙහිලා ප්‍රධාන පිතෘවරයෙකි**. මිනිසා රකුසකු කිරීමට ද, උගතා නූගතකු කිරීමට ද, කාරුණිකයා වධකයකු කිරීමට ද, බලවතා දුබලයකු කිරීමට ද, සිල්වතා දුශ්ශීලයකු කිරීමට ද, ගුණවතා පව්කාරයකු කිරීමට ද, පව් කාරයා ගුණවතකු කිරීමට ද, දුශ්ශීලයා සිල්වතකු කිරීමට ද, දුබලයා බලවතකු කිරීමට ද, වධකයා කාරුණිකයකු කිරීමට ද, නූගතා උගතකු කිරීමට ද ප්‍රබල වූවකි. කලාතුරකින් වෙන්වීම හැර අන්‍ය සකල අවස්ථාවන්හි ම ආශ්‍රය කරන්නා තුළ පිහිටි ගුණ හෝ අගුණ ආශ්‍රය ලබන්නා තුළ ද ඇතිවීම ස්වභාවික හෙයිනි.

කරුණු මෙසේ හෙයින් යමෙක් පණ්ඩිතයකු ගේ ආශ්‍රය ලද හොත් යහපත් කෙනෙක් වේ. බාලයකු ගේ ආශ්‍රය ලද හොත් ඔහු ද බාලයෙක් වේ. **බාලයා වනාහි ලොවට පව්කාරයන් මවන්නෙකි**. එහෙයින් ඔහු ගේ ආශ්‍රය ලැබුවකුට පව්කාරයකු නො වී ඔහුගෙන් මිදීම අති දුෂ්කරය. ආශ්‍රය නිසා වෙනස් නො වෙතොත් බොහෝ ගුණධර්මයන් ගෙන් දියුණු වූවෙකි. ඇතැම් විට ඉතා යහපත් මව්පියන් ගේ දරුවන් පවා බාලයන් හා ආශ්‍රය කිරීමෙන් අයහපත් අය වන බව කිවයුතු ය.

**බිම්සර** රජතුමා බුදුන් හමු වූ ප්‍රථම දිනයෙහිදී ම සෝවාන් වූ ආර්‍ය්‍යශ්‍රාවකයෙකි. බුදුන් වහන්සේ ගේ අග්‍ර උපස්ථායකයෙකි. එහෙත් ඔහු පුත් සෝවාන් වීමට පවා පින් ඇති **අජාසත්** රජතුමා **දෙව්දත්** නමැති බාලයා ආශ්‍රය කිරීමෙන් මහා පව්කාරයෙක් විය. හෙතෙම සිය පියරජ මරවා **ලොහොකුඹු** නිරයෙහි අදත් පැසෙයි. ඔහු බාලයකු වූ දෙව්දතුන් ගේ ආශ්‍රයට නො පැමිණියා නම්, පණ්ඩිතයන් ආශ්‍රය කළ **විසාඛා**, **අනාථපිණ්ඩික** ආදි ආර්‍ය්‍ය-ශ්‍රාවකයන් මෙන් අදත් දෙව්ලොව දෙව්සැප විඳින්නෙකි.

දෙව්දතුන් ආශ්‍රය කිරීමෙන් විනාශ වූයේ **අජාසත්** රජ පමණක් නො වේ. ඔහු ගේ දරු මුණුබුරු පරම්පරාව ද විනාශ විය. ඔහු කළ පිතෘඝාතක කර්මය ඔහුගේ දරු මුණුබුරෝ ද කළහ. කල්යාමේ දී එම පිතෘඝාතක පරම්පරාව ලොවට සාපයකැයි සිතූ නුවර

Non-commercial distribution

වැසියෝ ඔහු ගේ මුළු පරම්පරාව ම විනාශ කළහ. **මෙසේ අසත් පුරුෂයා බාලයා** ආශ්‍රය කිරීමෙන් ආශ්‍රය කළ තැනැත්තා පමණක් නොව ඔහුගේ දරුමුණුබුරු පරම්පරාව පවා විනාශ වන බව දතයුතු.

ඒ මේ ආශ්‍රය නිසා ඇතැම්විට එක මව්කුස උපන් සොහොයුරන් පවා අහසට පොළොව මෙන් වෙනස්වන බැව් ප්‍රකටය. මේ එය විදහාපාන පැරණි පුවතකි.

## ආශ්‍රයෙන් වෙනස් වූ සොහොයුරන් දෙදෙන

**පෙර දඹදිවැ** එක් පර්වතයෙක්හි ගිරවුන් වසන ඉඹුල් වනයෙකි. එහි එක් රුකෙක ගිරා පැටවුන් දෙදෙනකු සහිත කුඩුවෙකි. පර්වතයෙහි එක් දිශාවෙක මිටියාවතෙහි සොරුන් වසන ගමක් ද එක් දිශාවෙක තාපසයන් වසන ආශ්‍රමයක් ද විය. ගිරා පැටවුනට පියාඹා යා නො හැකි කාලයෙහි දිනක් තද සුළඟකට අසු වී ගොස් එකෙක් සොරුන් වසන ගම මැද ද අනිකා ආශ්‍රමයෙහි ද වැටුනාහ. සොරුන්ට අසු වූ ගිරා පැටවා සොරුන් සමීපයෙහි ද අනිකා ආශ්‍රමයෙහි ද වැඩුනාහ. එකල දිනක් **"උත්තර පංචාල"** නුවර රජ්ජුරුවෝ සපිරිවරින් මුව දඩයමට එම වනයට ගොස් මුවන් වැටලූහ. රජු සිටි තැනින් ම මුවා පලා ගියේය. මහත් වේගයෙන් මුවා ලුහු බැඳ ගිය රජතුමා බොහෝ දුර ගොස් වනමැදට පැමිණ ද මුවා නො දැක නැවතී, සොරු වසන ගම අසළ එක් සිත්කලු දෙලක් දැක, නහා පැන් බී ගිම් නිවා රුක් සෙවනක ඇල විය. ඒ වනාහි සොරමුල වල්වන් වේලාවය. ගමැ වූයේ සොරුනට බත පිසන්නා හා ගිරවා පමණ ය.

රුක් සෙවනෙහි හොත් රජු දුටු **ගිරවා** සිය මිතුරු සොරු අමතා මෙසේ කීය. "මිතුර, අරූ අල්ලා මරා බඩු ගනිමු", යනුයි. ඒ ඇසූ රජ බිය පත්වී ඉන් නැගිට වහා පලා ගියේ තවුසන් වසන ආශ්‍රමය දැක එහි ළං විය.

එය තාපසවරුන් පලවැල පිණිස වල් වන් කල ය. එහෙයින් එහි වූයේ ද තාපසවරුන් ඇති දැඩි කරන ගිරවා පමණෙකි. ඔහු රජු දැක "පින්වත් මහරජ, ඔබ ගේ මෙහි පැමිණීම ඉතා යහපත, මෙහි වාඩිවී ගමන් විඩා හැර මේ පලවැල වළඳන්න. අප ගේ

Non-commercial distribution

තාපසවරු පලවැල පිණිස ළඟකට ගියහ. දැන් දැන් එති" යි යනාදීන් මිහිරි හඬින් පිය තෙපුල් පැවසීය.

**රජතුමා** ඔහු ගේ කථාවෙහි පැහැද මේ තෙම පරම සත්පුරුෂයෙක, මට පළමු හමු වූ ගිරවා මා දුටු කෙණෙහි මා මරා පැලඳි ආභරණ ගැන්මට සූදනම් විය. එ හෙයින් ඔහු පරම දුෂ්ටයෙක. තොප ඉතා යහපත් එකෙකැ යි ආශ්‍රමයෙහි වූ ගිරවාට මුව නො පොහොනා තරම් ස්තුති කෙළේය.

එ තෙපුල් **ඇසූ ගිරවා** කියනුයේ පින්වත් මහරජ, මම ඔහු හා එක මවුකුසැ උපන්මි. ඔහු බාලයන් ගේ සමීපයෙහි වැඩුණු බැවින් බාලයෙක් විය. මම සත්පුරුෂයන්ගේ සමීයෙහි වැඩුණු බැවින් සත්පුරුෂයෙක් වීමි. මෙසේ අපි දෙදෙනා ආශ්‍රයෙන් වෙනස් වීමු යි කියා මතු එන ගාථාවන් ගෙන් රජ හට දම් දෙසී. රජ ද ඒ වූ පරිදි පිළිපැද ස්වර්ග පරායණ විය.

**යං යං හි රාජ භජති - සතං වා යදි වා සතං,**
**සීලවන්තං විසීලං වා - වසං තස්සෙව ගච්ඡති.**

පින්වත් රජ්ජුරුවන් වහන්ස! යමෙක් සත්පුරුෂ වූ හෝ අසත්පුරුෂ වූ හෝ සිල්වත් වූ හෝ දුශ්ශීල වූ හෝ යම් යම් කෙනකු ආශ්‍රය කෙරේ ද, ඔහු ද ඔවුන් ගේ වසහයට යයි.

**යාදිසං කුරුතේ මිත්තං - යාදිසං චූපසේවති.**
**සෝපි තාදිසකෝ හෝති - සහවාසාපි තාදිසෝ.**

යමෙක් යම්බඳු පුද්ගලයකු මිත්‍ර කරගනීද, යම් බඳු කෙනකු ආශ්‍රය කෙරේ ද, ඔහු ද එබඳු වෙයි. ආශ්‍රය එබඳු ස්වභාව ඇති හෙයිනි.

**පූතිමච්ඡං කුසග්ගෙන - යො නරො උප නය්හති.**
**කුසාපි පූති වායන්ති - එවං බාලූපසේවනා.**

යම් කිසි මිනිසෙක් කුසතණ අගින් කුණු මසක් වෙලා (ඔතා) තබා ද, ඒ හේතුකොට ගෙන කුසතණ ද දුගඳ හමන්නේ ය. එසේම බාලයා ආශ්‍රය කිරීමෙන් අපකීර්ති දුර්ගන්ධය ම හමන්නේ ය.

**තගරඤ්ච පලාසේන - යෝ නරෝ උපනය්හති.**
**පත්තා පි සුරභි වායන්ති - එවං ධීරූපසේවනා.**

Non-commercial distribution

යම් මිනිසෙක් පත්‍රයකින් (කොළයකින්) සුවඳ ද්‍රව්‍යයක් ඔතා තබා ද, ඒ හේතුකොට ගෙන ඒ පත්‍රයෙන් ද සුවඳ හමන්නේය. එසේම පණ්ඩිතයන් ආශ්‍රය කිරීමෙන් ද කීර්ති ප්‍රශංසා ආදි සුවඳ ම හමන්නේය.

(සත්ති කුම්භ ජාතක)

**ආශ්‍රයට කෙනකු තෝරා ගැනීම**.

කරුණු මෙසේ හෙයින් හැමට පළමු ආශ්‍රය කළ යුත්තා හා නො කළ යුත්තා කවරකුදැයි දැන හැඳින ගත යුතුය. ඒ පිණිස ආශ්‍රයට පෙර ආශ්‍රය කරන්නාගේ නියම ගති ගුණ හොඳින් විමසිය යුතුය. යමකු බලවතකු වූ පමණට වත්, ධනවතකු වූ පමණට වත්, කුලවතකු වූ පමණට වත්, උගතකු වූ පමණට වත්, ප්‍රසිද්ධ වූ තරමට වත් ආශ්‍රයට සුදුසු යයි නිශ්චය නො කළ යුතුය. කොතෙක් දුරට ඔවුන් තුළ හොඳ ගති ගුණ තිබේ දැයි විමසා බලා ම නිගමනයට පැමිණිය යුතුය. ධනවත් වුවත්, බලවත් වුවත්, කුලවත් වුවත්, හොඳ ගති ගුණ නැති නම් ඔහු **ආශ්‍රයට නුසුදුස්සෙකි**. එසේ ම කුලයෙන් පහත් වුවත්, දුප්පත් වුවත්, ගති ගුණවලින් උසස් නම් ඔහු **ආශ්‍රයට සුදුස්සෙකි**.

## ආශ්‍රයට නුසුදුසු මිත්‍රයෝ

1. **ගිහි පාප මිත්‍රයෝය 2. පැවිදි පාප මිත්‍රයෝ යයි** ආශ්‍රයට නුසුදුසු පාප මිත්‍රයෝ දෙකොටසකි.

## ගිහි පාප මිත්‍රයෝ

**“අඤ්ඤදත්ථු හරෝ මිත්තෝ**
**යෝ ච මිත්තෝ වචීපරෝ,**
**අනුප්පියං ච යෝ ආහ**
**අපායේසු ච යෝ සඛා”** යි

**සිගාලෝවාද සූත්‍රයෙහි** වදාළ පරිදි **1. අඤ්ඤදත්ථු හරය 2. වචීපරමය 3. අනුප්පියභාණිය 4. අපාය සහාය** යයි ගිහි පාප මිත්‍රයෝ සිව් දෙනෙක් වෙති.

Non-commercial distribution

### 1. අඤ්ඤදත්ථුහර පාප මිත්‍රයා

මිතුරාට තමාගෙන් කිසිවක් නො දී කිසි වැඩකුදු නො කොට කෙසේ නමුත් මිතුරාගෙන් යම් කිසිවක් පැහැර ගැනීමටත්, මිතුරාගෙන් වැඩ ගැනීමටත් පමණක් මිතුරුවන්නා වූ ස්වභාව ඇති මිත්‍රයකු වැනි සතුරා **අඤ්ඤදත්ථුහර** පාපමිත්‍රයා නම්.

1. හිස් අතින් අවුත් කිසිවක් ගෙන යෑම 2. ස්වල්ප දෙයක් දී වටිනා දෙයක්, වටිනා වැඩක් ගැනීම 3. තමාට යම් කිසි භයක් පැමිණි කල ඉන් මිදෙන තුරු පමණක් දසයකු මෙන් මිතුරා ගේ වැඩ කිරීම. 4. නියම මිත්‍ර ධර්මයකින් නොව, තම ලාභය තකා ගෙන ම මිත්‍රයන් ආශ්‍රය කිරීම යන මේ සතර ඔහු ගේ ලක්ෂණයෝ වෙති.

### 2. වචීපරම පාප මිත්‍රයා.

ක්‍රියාවෙන් නොව වචනයෙන් පමණක් මිතුරාට සංග්‍රහ කරන, මිත්‍රයකු වැනි සතුරා **"වචීපරම"** පාප මිත්‍රයා නම්.

1. යමක් ඉල්වා ගැනීමට මිත්‍රයකු පැමිණි කල, මිතුර! තමුසේ පසුගිය දිනවල නාවේ මන්ද? අපට ඒ දිනවල බොහොම සාරව තිබුණා, අපි තමුසේව ඒ දිනවල මතක් කර කර සිටියෙමු. දැන් නම් ඒ කිසි ජයක් නැත. ඒ දිනවල පැමිණියා නම් ඕනෑම උපකාරයක් කරන්නට තිබුණා - යනාදීන් අතීතයෙන් සංග්‍රහ කිරීම, 2. මිතුර! අපට ළඟදී ලොකු වාසියක් ලැබේවි, එවිට පසුගිය ඒවාටත් සමග උපකාර කළ හැකි වෙනවා ඇත - යනාදීන් අනාගතයෙන් සංග්‍රහ කිරීම, 3. තමා රථ වාහනාදියක යන විට මිත්‍රයාට ඒ ගමනින් වැඩක් නැති වෙලාවල මිත්‍රයා දැක මිත්‍රය! මෙහෙ එන්න, මෙහි වාඩි වෙන්න යනාදීන් ද, තමා හොඳ වස්ත්‍රයක් හැඳ සිටී නම් එය පෙන්වා මේ වස්ත්‍රය මගේ මිත්‍රයාටත් හොඳයි. නමුත් තිබෙන්නේ මෙ පමණක් බැවින් දිය නොහැක - යනාදීන් නිරර්ථක දෙයින් සංග්‍රහ කිරීම, 4. ගමනක් යෑමට රථයක් ඉල්ලා මිත්‍රයා ආ කල මිතුර! අද කරත්තයට නැතහොත් කාර් එකට ගමනක් යෑමට තිබේ. නැතහොත් කැඩිලාය, රිය පදවන්නා නැත, ගොනා නැත, යනාදීන් නැති බැරිකම් කීම යන මේ සතර ඔහුගේ ලක්ෂණයෝය.

Non-commercial distribution

### 3. අනුප්පිය භාණී පාප මිත්‍රයා

මිත්‍රයාට වන දියුණුව ගැන හෝ පිරිහීම ගැන හෝ නො සලකා මිත්‍රයා ඒ ඒ වේලාවට සතුටු කිරීම පිණිස මිත්‍රයාගේ අදහසට අනුකූලව කථා කරන, මිත්‍රයකු වැනි සතුරා "**අනුප්පිය භාණී**" පාප මිත්‍රයා නම්.

1. අපරාධයක් කිරීමට අදහස් වී මිතුර! මෙය කිරීම හොඳ දැයි විචාළ කල, එයින් මිතුරාට කොතරම් නපුරක් වෙතත්: පිරිහීමක් වෙතත් මිතුරා සතුටු කිරීම පිණිස එය කිරීම හොඳ යයි අනුමත කිරීම, 2. හොඳ දෙයක් පිනක් කිරීමට කථා කළ ද ඒ ගැන තමා වැඩි කැමැත්තක් නැතත්, ඒ ගැණ ගුණ කීම් ආදියක් නැතත්, මිත්‍රයා සතුටු කිරීම පිණිස හොඳ යයි අනුමත කිරීම, 3. මිත්‍රයා හමුවෙහි මිත්‍රයා සතුටු කිරීම පිණිස ඇති හෝ නැති ගුණ උසස් ලෙස වර්ණනා කිරීම, 4. මිත්‍රයා නැති තැන ඇති ගුණවත් නො කියා ඔහු තුළ ඇතත් නැතත් ඔහුගේ අගුණ කීම-යන මේ සතර ඔහුගේ ලක්ෂණයෝය.

### 4. අපාය සහාය පාප මිත්‍රයා

මිත්‍රයාගේ පිරිහීමට මාර්ග යොදන මිත්‍රයකු වැනි සතුරා "**අපාය සහාය**" පාප මිත්‍රයා නම්.

1. මිත්‍රය! රා බොන්නට යමු. අරක්කු බොන්නට යමු- යනාදීන් කියා මත්පැන් ඇති තැන්වලට කැඳවාගෙන ගොස් සුරා පානයෙහි යෙදවීම, 2. අවේලාවෙහි ඇවිදීමට එකතුවීම, 3. මිතුර! අද හොඳ නාට්‍යයක් තිබෙනවා බලන්නට යමු - යනාදීන් කියා මිත්‍රයා නාට්‍ය බැලීමෙහි යෙදවීම, 4. මිත්‍රය! අද අතන සූදුවක් තිබෙනවා යමු සූදුවට, නැතහොත් අද රේස්, යමු රේස් එකට - යනාදීන් කියා මිත්‍රයා සූදුවෙහි යෙදවීම - යන සතර ඔහුගේ ලක්ෂණයෝ වෙති.

## පැවිදි පාප මිත්‍රයෝ

"**පංචහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො භික්ඛු මිත්තො න සෙවිතබ්බො**" යනාදීන් "**අංගුත්තර පංචක නිපාත**"යෙහි වදළ

Non-commercial distribution

පරිදි, 1. භික්ෂූන් වහන්සේට නුසුදුසු ගිහි කටයුතුවල යෙදීම, 2. සංඝයා අතර කලහ ඇති කිරීම 3. ධර්ම විනයධාරී මහාස්ථවිරයන් වහන්සේලාට විරුඬව ක්‍රියා කිරීම, 4. පොට්ටනිකාරයන් මෙන් නියමයක් නැති දිග ගමන්වල යෙදීම, 5. තමා වෙත එන ගිහි පැවිදි පිරිසට දම් දෙසා පහදවන්නට අපොහොසත්වීම යන කරුණු පසින් යුක්ත වූ භික්ෂූන් ද, මහණකම නැති කරගත් දුශ්ශීල භික්ෂූන් ද, ගින්නට නොබා ඉදිරිපත්වන පළහැටියා මෙන් ලාභයක් ලැබෙතොත් එක් විසි අනේසනාදි භික්ෂූන් විසින් නො කටයුතු වූ කවර දෙයක් වුවද කිරීමට ඉදිරිපත්වන, විලිබිය නැති, ලාමක අදහස් ඇති, ලාමක භික්ෂූන් ද පැවිදි පාප මිත්‍රයෝ යයි දත යුතු.

**බාල සේනයෙහි ආදීනවයෝ**

මෙවැනි පාප මිත්‍රයන් වූ බාලයන් ආශ්‍රය කිරීමෙන් වන කිසියම් විපතක් මිස සැපතක් නැත. අද ජන සමාජයෙහි හැසිරෙන යහපත් චරිත ඇති අය පවා බොහෝ විට මෙලොවැ ලෝකයාගේ නින්ද අපහාසයනට ද, භෝග ව්‍යසන ඥාති ව්‍යසන ජීවිත ව්‍යසන ආදි නානා විපත්වලට ද පරලොවැ මහත් දුකට ද භාජන වන්නේ බාලයන්ගේ ආශ්‍රයෙනි. බාලයන්ගෙන් වෙන් වූ තැනැත්තන්ට ඒ හැම විපත්වලින් මිදී දෙලොවැම සුවපත් ද විය හැකි වේ. එහෙයින් ම එය **උතුම් මංගලය**කැයි ද වදරන ලදී.

**මව් පියන් සතු යුතු කමක්**

බාලයන්ගේ ආශ්‍රය ඉමහත් පරිහානිකර කරුණක් බැවින් කුඩා කල සිට ම සිය දූ දරුවන් බාලයන්ගේ නැතහොත් පාප මිත්‍රයන්ගේ ආශ්‍රයෙන් වෙන් කොට, **ළමා වියත්**, **තරුණ වියත්**, හොඳ ආශ්‍රයෙහි වැඩීමට සැලැස්වීම මාපියන් සතු යුතුකමෙකි. ළමා වියෙහිත් තරුණ වියෙහිත් සිතට කා වැදුණු හොඳ හෝ නරක ගති ජීවිතාවසානය දක්වා ම බලපවත්වන බැවින් අද තරුණ වියෙහි වූ බොහෝ කුල පුත්‍රයෝ බාලයන්ගේ ආශ්‍රයට පැමිණ සතුන් මැරීම, මැරවීම, සොරකම් කිරීම, කරවීම, කාමයෙහි වරදවා හැසිරීම, බොරුකීම, මත්පැන් පානය, ගංජා බීම, කංසා බීම, සූදුව ආදි නොයෙකුත් දුසිරිත්වලට පුරුදු වී දෙලොවැම මහත් විනාශයට පත්වෙති.

Non-commercial distribution

එමෙන් ම **අද ජාතික සිරිත් විරිත්** කෙරෙහි කිසිදු ඇල්මක් නොමැතිව පර සිරිත් ගරු කරන - **සිය ආගම** කෙරෙහි හොඳ විශ්වාසයක් නො මැතිව, ආගමික සිරිත් විරිත්වලට නිගා කරන, පුහු මානයෙන් **මත්ව සිය මව්පියනටවත්** ගරු බුහුමන් නො කරන, පරලොවක් ඇතැයි ද නො සලකන, **මෙලොව පමණක් පස්කම්** සුව විඳිමින් වාසය කිරීම ම මනුෂ්‍ය ජීවිතයෙහි නියම ඵලයෙකැයි සිතා නො මඟ ගොස් කටයුතු කරන **වැදගත් යයි සම්මත බෞධයන්ගේ දරුවෝම කොතෙක් වෙත් ද? අහෝ! ඛේදයකි**.

මෙයට ප්‍රධාන හේතුව ගුණ නුවණින් වැඩිය යුතු අවස්ථාවන්හි යහපත් ආශ්‍රයක් නො ලැබ, අයහපත් ආශ්‍රය ලැබීමය. එසේ වීමට හේතුව ද බොහෝ සෙයින් නුවණ මඳ දෙමාපියන්ගේ නො සැලකීම ම බැව් කීම අතිශයෝක්තියක් නො වේ. නිදසුනක් වශයෙන් කියතොත් **අද අපේ උසස් සමාජයෙහි බොහෝ දෙනකුන්ගේ අදහස** මොනයම් දුර්මත දරන මිථ්‍යා ලබ්ධි ගත් පාපී පුද්ගලයකු හෝ ඇසුරු කරවමින් තම දරුවන්ගේ උගෙනීම පමණක් කළහොත් සෑහේය යන්නයි. එහෙයින් ම ඔවුහු **සිය දරුවනට උසස් අධ්‍යාපනයක් ලබා දෙමි'යි කියමින් මිසදිටු පාසල්වලට සිය දරුවන් යවා** වැඩි ගුණ දහමක් තබා ආගමක්වත් නැති පිරිසක් තැනීමෙහි යෙදී සිටිති.

තමන් කොපමණ යහපත් කෙනකු වුවත් තමන්ගේ දරුවන්ට බාලයන් සේවනයට ඉඩ හැර සිටියහොත් වනුයේ මහත්ම විපතකි. එය දරුවනට කරන විපතක් මෙන්ම තමාට ද කර ගන්නා විපතෙකි. එසේ ම එය සිය පවුලට ද, සිය ගමට ද, පළාතට ද, රටට ද, ජාතියට ද, ආගමට ද කරන විපතෙකි. එබැවින් තම දරුවන් බාල සේවනයෙන් මුදවා ගැනීමට හැම මව්පියෝම තරයේ සිතත්වා.

දෙලොව වැඩ කැමති සියල්ලන් විසින්ම "**බාලයා**" හළාහල විෂයක් මෙන් ද, උග්‍ර විෂ ඇති සර්පයකු මෙන් ද, දිලිසෙන කඩු ගත් සතුරකු මෙන් ද, මිනිසුන් මරා කන රකුසකු මෙන් ද, කිඹුල් දැතිමෝරු ආදී චණ්ඩ සතුන් ගෙන් ගහණ වූ බිය එළවන ගංගාවක් මෙන් ද, සිංහ ව්‍යාඝ්‍රාදීන් ගෙන් පිරුණු වනයක් මෙන් ද සලකා සියලු කල්හි ම ඔවුන්ගෙන් ඈත්ව විසිය යුතු ය.

*Non-commercial distribution*

## ආශ්‍රය ගැන උතුමන්ගේ අදහස්

ලොවැ කවදත් පණ්ඩිතයෝ බාලයන් හා එක්ව වාසය පිළිකුල් කරති. අප මහ බෝසතාණන් වහන්සේ "**අකීර්ති**" පණ්ඩිත වූ කාලයෙහි බාලයන් නොදැක සිටීමට ශක්‍ර දේවේන්ද්‍රයාණන් ගෙන් වරයකුදු ඉල්ලූහ. ඒ මෙසේය:-

**බාලං න පස්සෙ න සුණෙ - න ච බාලෙන සංවසෙ.**
**බාලෙන අල්ලාප සල්ලාපං - න කරෙ න ච රොචයෙ**

නුවණයෙන් විරහිත වූ දෙලෝ වැඩ නසන්නා වූ බාලයා මාගේ නෙත් දෙකින් කිසි කලෙක නොම දකීවා! ඒ බාලයා අසවල් තැන වෙසේය යන බසකුදු මාගේ කනට කිසි කලෙක නොම ඇසේවා! බාලයා හා සමග එක්ව වාසය කිසි කලෙක නො වේවා! බාලයා සමග කථා කිරීමකුදු කිසි කලෙක නො ලැබේවා, ඔහු හා සතුටු වීමකුදු නො වේවා! යනු එහි අදහසයි.

එක් කලෙක **බෝසතාණන් වහන්සේ** පැවිදිව වනයෙහි වසනසේක් තමන් වෙතැ සිට මනුෂ්‍ය පථයට යෑමට සූදනම් වූ ස්වකීය පුත්‍රයා හට දුන් අවවාද ගාථා දෙකක් **ආරණ්‍ය ජාතක** යෙහි දක්නට ලැබේ.

ඒ මෙසේය:

**යස්ස කායෙන වාචාය - මනසා නත්ථි දුක්කටං**
**උරසීව පතිට්ඨාය - තං භජෙහි ඉතො ගතො.**

දරුව! තොප මේ වනයෙන් ගිය කල්හි යමෙක් කය වචන සිත යන තුනෙන් පව් නොකෙරේ ද ඔහු ඔබගේ මව මෙන් සලකා සේවනය කරව.

**හලිද්දිරාගං කපි චිත්තං -පුරිසං රාග විරාගිනං**
**තාදිසං තාත මා සෙවි - නිම්මනුස්සම්පි චෙ සියා.**

දරුව! ස්ථිර නොවූ සිත් ඇති බැවින් වහා යන්නා වූ කහ සායම වැනි වූ චංචල සිත් ඇත්තා වූ වහා වෙනස් වන සුළු වූ පුද්ගලයා, දඹදිව ආශ්‍රයට මිනිසුන් නැත ද ආශ්‍රය නො කරව.

Non-commercial distribution

ආශ්‍රය ගැන **ධම්මපද** යෙහි මෙසේ වදළහ.

**චරං චෙ නාධිගච්ඡෙය්‍ය - සෙය්‍යං සදිසමත්තනො.**
**එක චරියං දළ්හං කයිරා - නත්ථි බාලෙ සහායතා.**

ගුණැතියන් විසින් ආශ්‍රය කළ යුත්තේ තමාට වඩා උසස් ගුණැති කලණ මිතුරෙකි. ඉදින් එබඳු උතුමකු ආශ්‍රයට නො ලද හොත් තමා හා සමාන වූ ගුණැති උතුමකු ඇසුරු කළ යුතුය. එවැන්නකු ඇසුරට නො ලද හොත් එකලාව විසීම වඩා මැනව. බාලයන් සමග නම් ආශ්‍රය නො කට යුතුමය යනු අදහසයි.

**නිහීයති පුරිසො නිහීන සෙවී,**
**න ච හායෙථ කදා චි තුල්‍යසෙවී.**
**සෙට්ඨ මුපනමං උදෙති ඛිප්පං,**
**තස්මා අත්තනො උත්තරිං භජෙථ**

තමාට වඩා පහත් වූ ගති පැවතුම් ඇති තැනැත්තකු ආශ්‍රය කරන්නා ද එවැනි නිහීනයකු විය හැක. සමාන ගති ගුණ ඇතියකු ඇසුරු කරන්නා කිසිකලෙක නො පිරිහෙයි. තමාට වඩා උසස් ගුණැතියකු ඇසුරු කිරීමෙන් ම තමාගේ දෙලෝ දියුණුව සැලසෙයි. එහෙයින් තමාට වඩා ගුණැති කෙනකු ම ආශ්‍රය කරන්න.

(අංගුත්තර නිකාය)

**තවද** නපුරු ආශ්‍රයෙන් ලද හැකි ඉමහත් නපුරු විපාක සලකා බුදුන් වහන්සේ මෙසේ වදළ මුත්, දුදනන් ඇසුරෙන් වෙනසකට පත් නොවන සේ මුහුකුරා ගිය නැණයෙන් හා ගුණයෙන් යුතු උතුමන් විසින් දුදනන්ට බාලයන්ට යහපත සලසන අටියෙන් ඔවුන් කෙරෙහි අනුකම්පාවෙන් ඇසුරු කිරීම එවැනි උතුමන් සතු යුතුකමක් බව ද මෙහිලා සිහිපත් කළ යුතු.

Non-commercial distribution

## 2. පණ්ඩිතයන් සේවනය කිරීම

මෙහි **පණ්ඩිතයෝ** නම් තමාගේ හා තමන් ආශ්‍රය කරන්නවුන්ගේ මෙලෝ යහපත පිණිස ද පරලෝ යහපත පිණිස ද පිළිපදින්නා වූ, පින් පව් දන්නා වූ සත්පුරුෂයෝය. එනම් බුදුවරයෝය, පසේ බුදුවරයෝ ය, ආර්‍ය්‍ය ශ්‍රාවකයෝය, සිල්වත් ගුණවත් භික්ෂූන් වහන්සේය, සිල්වත් ගුණවත් උපාසක උපාසිකාවෝය, ගුණවත් ආචාර්‍ය්‍ය වරයෝය, ගුණවත් වැඩිහිටියෝය යනාදි උත්තමයෝ වෙති.

නොයෙක් ශිල්ප ශාස්ත්‍ර දැන උගත් නමුදු කළ යුත්ත නො කළ යුත්ත නො දන්නා වූ ද, පින් පව් නො දන්නා වූ ද, තමාගේ හා අනුන්ගේ දෙලෝ පරිහානිය පිණිස පිළිපදින්නා වූ ද පාපී පුද්ගලයෝ පණ්ඩිත සංඛ්‍යාවට නො ගැණෙති.

එහෙයින් මෙකල බාහිර ශිල්ප ශාස්ත්‍ර පිළිබඳව මඳ දැනුමක් ඇති පමණින් මහ පඩිවරයෝ යයි ප්‍රතිඥා කරන වැඩි ප්‍රතිපත්තියක් තබා රත්නත්‍රය කෙරෙහි නියම විශ්වාසයකුදු නැති, තම වාසියට බුඬ ධර්‍මය සිතූ සිතූ ලෙස නො පිටට පෙරළමින් පරලොවක් නැත, අපායක් නැත, දෙව්ලොවක් නැත යනාදීන් ලොව මුළා කරන **ඇතැම් ගෘහස්ථ ප්‍රව්‍රජිතයෝ ආශ්‍රයට සුදුසු පණ්ඩිතයෝ නො වෙති**.

එබැවින් බාහිර ශිල්ප ශාස්ත්‍ර අතින් උගෙණුමක් ලැබීම පිණිස සුළු දිනයකටවත් මිථ්‍යා ලබ්ධි ගත් එවැන්නන් ආශ්‍රය කිරීමට සිදු වුවොත් ශිල්ප ශාස්ත්‍ර අතින් ගතයුතු දේ විනා ඔවුන්ගෙන් ලැබෙන සෙසු අවවාද අනුශාසනා ගැන සුපරික්ෂාවෙන් ක්‍රියා කළ යුතුය. නැතහොත් වන්නේ මහත්ම විපතෙකි.

ලොවැ වාසය කරන බොහෝ දෙනාට එවැනි අසත්පුරුෂයන්ගේ අවවාද අනුශාසනාවන්ට වුවද කන් දීමට සිදුවන වාර බොහෝය.

*Non-commercial distribution*

එවැනි අවස්ථාවන්හි කළ යුත්තේ අසත් පුරුෂයා විරුද්ධ කර නො ගැනීම පිණිස ඔහුගේ අවවාදයට කන්දීම පමණෙකි. සිතට ගතයුතු නො වේ. පිළිපැදීම ගැන කියනු කිම? **මේ වනාහි** විවිධ වූ විෂම වූ ලෝකයෙහි වාසය කරන සියල්ලන් සමග සමගිව විසීම පිණිස විශේෂයෙන් දැන සිටිය යුතු වූ මහඟු උපදේශයකි. එහෙයින් වදාළහ. **"ධම්මපාල"** ජාතකයෙහි -

**"සුණෝම ධම්මං අසතං සතං ච**
**නචාපි ධම්මං අසතං රොචයාම**
**හිත්වා අසන්තෙන ජහාම සන්තෙ"**

අපි අසත්පුරුෂයන්ගේ අවවාදත් සත්පුරුෂයන්ගේ අවවාදත් අසන්නෝ වෙමු. එහෙත් කිසි විටෙකත් අපි අසත්පුරුෂයන්ගේ අනුශාසනයට කැමති වන්නෝ නො වෙමු. එබැවින් අසත් පුරුෂයන්ගේ අවවාදය අත්හැර සත්පුරුෂයන්ගේ අනුශාසනය ම මුදුනින් පිළිගන්නෙමු යනු අදහසයි.

**පණ්ඩිතයාගේ ලක්ෂණ**

**"තීනිමානි භික්ඛවේ පණ්ඩිතස්ස පණ්ඩිත ලක්ඛණානි පණ්ඩිත නිමිත්තානි පණ්ඩිතාපදනානි. කතමානි තීනි? ඉධ භික්ඛවෙ පණ්ඩිතො සුචින්තිත චින්තිච හොති. සුභාසිත භාසී. සුක්කත කම්මකාරී"**

මහණෙනි! මොහු පණ්ඩිතයෙකැයි හැඳිනීමට ඉවහල් වූ පණ්ඩිතයා සතු ලක්ෂණයෝ, පණ්ඩිතයා හැඳින ගන්නා වූ කාරණයෝ, පණ්ඩිත බැව් හැඳිනීමේ චරිතයෝ තුන් දෙනෙක් වෙත්. කවර තුන් දෙනෙක් ද යත්? මහණෙනි! මේ ලෝකයෙහි පණ්ඩිත තෙමේ යහපත් සිතිවිල්ලක් ම සිතන්නේ ය. යහපත් වචනයක්ම කියන්නේ ය. යහපත් වැඩක් ම කරන්නේය-යනු එහි අදහසයි.

ඒ වූ පරිදි **1. යහපත් සිතිවිලි සිතීම. 2. යහපත් වචන කීම. 3. යහපත් වැඩ කිරීම** යන මේ කරුණු තුන පණ්ඩිතයා හැඳිනීමට ඇති ලකුණු බව දත යුතු.

**පණ්ඩිත සේවනයෙහි වටිනාකම**

**බාලයෝ වනාහි** වැරදි අදහස් නිසා තමා ද විනාශ වී, ඒ අදහස් පිළිගැන්වීමෙන් ආශ්‍රය කරන්නා වූ අන්‍යයන්ද විනාශයට

Non-commercial distribution

පමුණුවති. **පණ්ඩිතයෝ වූ කලී** යහපත් අදහස් නිසා තමා ද දියුණුවට පැමිණෙති. ආශ්‍රය ලබන්නා වූ අන්‍යයන් ද යහපත් මගට පමුණුවා සැපතට පත් කරවති.

අප **බුදුරජාණන් වහන්සේ** තමන් වහන්සේ ගේ යහපත් අදහස් නිසා පස් මරුන් පරදවා බුඬත්වයට පැමිණ, තමන් වහන්සේ ආශ්‍රය කළා වූ අප්‍රමාණ දිව්‍ය මනුෂ්‍ය බ්‍රහ්මයන් නිවනට පැමිණ වූ සේක. බොහෝ සත්ත්වයන් දිව්‍ය ලෝක බ්‍රහ්ම ලෝකවලට පමුණුවා වදාල සේක. උන්වහන්සේගේ අග්‍ර ශ්‍රාවක වූ **සැරියුත් මහ රහතන් වහන්සේ** තමන් වහන්සේ ආශ්‍රය කළ තමන්ට උපස්ථාන කළ අසූ දහසක් පවුල් දෙව්ලොවට පැමිණ වූ සේක. එසේ ම සෙසු මහා ශ්‍රාවකයන් වහන්සේ ද තම තමන්ගේ සේවනය ලද අසූ දහස බැගින් කුල දෙව්ලොවට පැමිණ වූහ. උන්වහන්සේගෙන් අන්‍ය වූ බොහෝ පණ්ඩිත සත්පුරුෂ ජනයෝද තම තමන් සේවනය කරන්නා වූ බොහෝ ජනයන් යහ මගට අතීතයෙහි ද පැමිණ වූහ. දැනුදු පමුණුවති.

බාලයකු වූ දෙව්දතු නිසා පියරජු මරා අපාගත වන පරිදි පව් රැස් කළ **අජාසත්** රජ තුමා ම පසු කලෙක අසහාය පණ්ඩිත වූ බුදු පියාණන් ආශ්‍රය කළ නිසා පෘථග්ජන ශ්‍රද්ධාධික පුද්ගලයන්ගෙන් අගතැන් පැමිණියේ ය.

**නො මග ගිය බෝසත්තුමා**
**පණ්ඩිතාශ්‍රය නිසා පැවිදිවීම**

කසුප් බුදුන් වහන්සේගේ කාලයෙහි **ජෝතිපාල** නම් බමුණුව උපන් අප මහ බෝසත් තුමා, තම යහළු **ඝටීකාර** නමැති සත්පුරුෂයා විසින් බුදුන් දක්නට යෑමට පළමු කොට කථා කළ විට "ඔය මුඩු මහණාගෙන් මට කම් නැතැ"යි බැණ වැදුනේය. දෙවන තුන්වන වරට ද එසේම කීවේය. එහෙත් ජෝතිපාල අකමැතිව බැණ වැදුනේය. එවිට එසේ නම් අපි ගඟට නෑමට යමු"යි ඝටීකාර තෙමේ සිය මිතුරා නෑමට පොළඹවා ගෙන ගියේය. නා අවසන් වූ පසුද විහාරයට යෑමට කථා කළමුත් එවිට ද ජෝතිපාල අකමැති විය. ඝටීකාර ජෝතිපාලගේ ඔඩොක්කුව අල්වා ඇද විහාරයට යෑමට කථා කෙළේය. එවිට ද ඔහුට පෙර සේම බැණ වැදුනේය. ඝටීකාරද

Non-commercial distribution

එ පමණකින් නො නැවතී නැවත තෙත් වූ හිසකෙසින් අල්වා ඇදගෙන යාමට සූදනම් විය.

පහත් කුලයක වූ ඝටීකාරගේ මේ ක්‍රියාව ගැන පුදුම වූ ජෝතිපාල තරුණයා, තම මිත්‍රයා මෙතරම් උනන්දුවක් මේ ගැන දක්වන්නේ මෙහි යම් කිසි යහපතක් ඇතැයි සිතා ඒ වතාවෙහි යෑමට කැමති විය. ඝටීකාර සිය මිතුරා බුදුන් වෙත කැඳවා ගෙන ගොස් හඳුන්වා දී ඔහුට සෑහෙන ධර්මයක් දේශනා කරන ලෙස අයැද සිටියේය. ජෝතිපාල දහම් කෙළවර පැහැද පැවිදිව, අන්තිම විවරණය පවා ලබා ගත්තේය.

මෙසේ යහපත් ආශ්‍රයෙන් පවට බිය හා ලජ්ජාව ද උපදියි. එහෙයින්ම ඔහුගේ සිත යහපතට නැමෙයි. එවිට ඔහු ලෝකයාගේ මහත් ගෞරවාදරයට ද භාජන වෙයි. ධනයෙන් වැඩෙයි. බලයෙන් වැඩෙයි. ගුණයෙන් වැඩෙයි. නුවණයෙන් වැඩෙයි. සතුටින් කල් යවයි. ඔහුගේ යහපත් ගුණ කීර්තිය ද ලොව පුරා රැව් පිළිරැව් දෙමින් පැතිරෙයි. පරලොව ද දිව්‍ය මනුෂ්‍යාදි සියලු සම්පත් ලබා දෙයි. මෙසේ උතුම් පණ්ඩිත සේවනය දෙලෝ දියුණුවට අසහාය හේතුවක් වන බැවින් **උතුම් මංගල ධර්මයකැ** යි වදරන ලදී.

තවද දිනක් **ආනන්ද** ස්ථවිරයන් වහන්සේ බුදුන් වෙතැ පැමිණ "ස්වාමීනි! 'බුදු සසුනෙහි අඩක් ම කල්‍යාණ මිත්‍රයා නිසා පවත්නේය' යනු මා තුළ ඇති වූ අදහසකැ" යි පැවසූහ. එවේලෙහි බුදුන් වහන්සේ **"මාහෙවං ආනන්ද! මාහෙවං ආනන්ද! සකල මෙවහිදං ආනන්ද! බ්‍රහ්මචරියං යදිදං කල්‍යාණ මිත්තතා"** යනාදීන් "ආනන්දය, එසේ නො කියව, ආනන්දය එසේ නො කියව, බුදු සසුනෙන් අඩක් නොව මුළු බුදු සසුන ම කලණ මිතුරා නිසා පවත්නේය" යි වදාළ සේක. පණ්ඩිත සේවනයෙහි වටිනා කම මෙයින් මොනවට පැහැදිලි වේ.

**පණ්ඩිත සත්පුරුෂයාගෙන් ලොවට යහපතක් මිස විපතක් නොවන බව.**

**තවද පණ්ඩිත සත්පුරුෂයෝ** වනාහි තමා මැරීමට එන සතුරාට පවා සෙත ම සලස්වති. අප බුදුපියාණන් වහන්සේ තමන්

Non-commercial distribution

වහන්සේ ගේ පරම සතුරා වූ දෙව්දත් තෙරුන්ට ද, ඔහු විසින් මෙහෙයන ලදුව තමන් විද මැරීමට ආ **දුනුවායාට** ද, රා පොවා තමන් වෙත එවූ පර්වතයක් වැනි වූ **නාලාගිරි හස්තිරාජයාට** ද, **අංගුලිමාල** නම් තමන් මැරීමට ආ මිනීමරුවාට ද, සෙතක් ම සැලසූහ. එහෙයින් පුරාතනයෝ මෙසේ කීහ.

> "**සුජනො න යාති වෛරං**
> **පරහිත බුද්ධිර් විනාශ කාලෙපි.**
> **ජෙදෙෂ්වපි චන්දන තරුස්සු**
> **රභයති මුඛං කුඨාරස්‍ය.**"

පරහට වැඩ කැමති සත්පුරුෂ තෙමේ තමන්ගේ විනාශ කාලයෙහි පවා පරහට නපුරක් නො කෙරේ. සඳුන් ගස තමන් කපන කල්හි ද කෙටේරියෙහි මුවහත සුවඳ වූවක් ම කරන්නාක් මෙනි.

**උතුමන් තමන් විද මැරීමට ආ**
**දුනුවායාට සෙත සැලසූ සැටි.**

**අජාසත් කුමරා** දෙව්දත් තෙරුන්ගේ මෙහෙයීමෙන් සිය පියාණන් වූ බිම්බිසාර රජු මරවා රජ විය. දිනක් **දෙව්දත්** තෙරණුවෝ අජාසත් රජු වෙතැ ගොස් "මහරජ! දැන් තොප ගේ අදහස නම් මුදුන් පත් විය. එහෙත් මාගේ අදහස නම් තවම මුදුන් පත් නොවීය" යි කීහ. එකල අජාසත් රජතෙමේ "හිමියනි! තොප ගේ මුදුන්පත් නුවූ අදහස කිමදැ" යි විචාළේය. "මහරජ! තොප රජ වූවාක් මෙන් මම ද බුදුන් මරා බුද්ධරාජ්‍යයට පැමිණිය යුතු නොවෙම් දැ" යි දෙව්දත් කීයේ ය. **අජාසත් රජ** "ස්වාමීනි! ඒ පිණිස මා විසින් කුමක් කළ යුතුදැ"යි විචාළේය. දෙව්දත් තෙර "මහරජ! ශ්‍රමණ ගෞතමයන් මැරීමට දුනුවායන් ලැබිය යුතු යයි" කීය. ඉක්බිති රජතෙමේ අක්ෂණවේධී ධනුර්ධරයන් ගෙන් පන්සියයක් ගෙන්වා ඉතා දක්ෂයන් එක්තිස් දෙනකු තෝරා "තෙපි දෙව්දත් තෙරුන් වහන්සේ වෙතැ ගොස් උන්වහන්සේ කියන්නක් කරවයි" කියා දෙව්දත් තෙරුන් වෙත පිටත් කෙළේය.

**දෙව්දත් තෙර** ඔවුන්ගේ ප්‍රධාන දුනුවායා සමීපයට කැඳවා "පින්වත! ශ්‍රමණ ගෞතමයන් වහන්සේ **ගිජ්ඣකූට** පර්වතයෙහි වැඩ

Non-commercial distribution

සිටිති. තෝ එහි ගොස් විෂ පෙවූ හීයකින් විද උන්වහන්සේ මරා අසවල් මගින් එව"යි කියා යැව්වේය. ඉක්බිති **දුනුවායන් දෙදෙනකු** කැඳවා "තෙපි ගොස් අසවල් තැන සැඟවී සිට ඒ මගින් එන්නා වූ තොපගේ ප්‍රධාන දුනුවායා විද මරා අසවල් මගින් එව"යි පිටත් කෙළේය. ඔවුන් දෙදෙනා එන කල මැරීමට **තවත් සතරදෙනකු** යෙදවූයේය. ඔවුන් සතරදෙන එන කල මැරීමට තවත් **දුනුවායන් අටදෙනකු** යෙදවූයේය. ඔවුන් අටදෙනා මැරීමට ඉතිරි **සොළොස්දෙනා** යෙදවීය. දෙව්දත් තෙර මෙසේ කරන ලද්දේ කළ අපරාධය සැඟවීම පිණිස ය.

**බුදුන් විදිනට යැවූ දුනුවායා** වම් උරෙහි කඩුව එල්ලාගෙන හියවුර පිටෙහි එල්ලාගෙන බුදුන් වහන්සේ සමීපයට ගොස් දුනුදිය නභා ඊය හිඳුවා ඇද බුදුනට විදිනට සූදානම් විය. එහෙත් ඔහුට තමාගේ අත දුන්නෙන් ඉවතට ගන්නට නො හැකි විය. විදිනා ආකාරයෙන් අඹන ලද රූපයක් මෙන් ඔහුට දුන්න ඇදගෙන නිශ්චලව ම සිටින්නට සිදු විය. මහත් වූ වීර්‍ය්‍යයෙන් ඉතා තද වූ දුන්න ඇදගෙන සිටින්නාවූ ඒ පුරුෂයාගේ ඉල ඇට කැඩී බිඳී යන්නාක් මෙන් විය. ඔහු බලවත් වේදනාවෙන් හා මහත් භයින් තැති ගෙන මුඛයෙන් කෙළ උතුරුවමින් නිශ්චලව සිටිනු දුටු **බුදුරජාණන් වහන්සේ**, දරුවකු අමතන්නා වූ මවක් මෙන් මහත් වූ කරුණාවෙන් "එම්බා පුරුෂය! තෝ බිය නො වෙව, මෙහි එව"යි වදාළ සේක.

**කරුණාවෙන් හරිතවූ සර්වඥයන් වහන්සේගේ** මධුර වූ ශබ්දය ගල්ගැසී හුන් දුනුවායාගේ කනට වැටෙනවාත් සමඟම දිව බෙහෙතක් වැළඳුවාක් මෙන් ඔහුගේ ශරීරය ක්‍රියා කරවිය හැකි විය. ඔහු ආවුධ බිම හෙළා බුදුන් වෙත ගොස් පාමුල වැටී, "ස්වාමීනි! හොඳ නරක සලකා ගත නො හැකි වූ මෝඩ වූ මම නුඹ වහන්සේගේ ගුණ නො දැන දෙව්දත් තෙරුන්ගේ වචනය ගෙන මේ වරදට පෙළඹුනෙමි. සාපරාධී වූ මාගේ අපරාධය නො සලකා මාහට ක්ෂමාවුව මැනව"යි කියා බුදුන් ක්ෂමා කරවාගෙන එකත් පසෙක හුන්නේය.

එකල්හි **තථාගතයන් වහන්සේ** ඔහුට **දුඃඛ**, **සමුදය**, **නිරෝධ**, **මාර්ග** යන චතුරාර්‍ය්‍ය සත්‍යයන් දක්වා දහම් දෙසූ සේක. දහම් කෙළවර ඔහු දහසක් නයින් ප්‍රතිමණ්ඩිත වූ උතුම් සෝවාන් ඵලයෙහි

Non-commercial distribution

පිහිටියේය. මෙසේ තමන් වහන්සේ විද මැරීමට ආ, ඒ දුනුවායා හට අමාමහ නිවන් සුවය ලබා දී, "උපාසකය! තෝ දෙව්දත් කී මගින් නො ගොස් අන් මගකින් කැමති දිසාවකට ගොස් තොපගේ ජීවිතය ගලවා ගනුව"යි වදරා, ඕහට ජීවිත දනය ද කොට පිටත් කළ සේක.

ඒ දුනුවායා මැරීමට අතර මග රැක සිටි දුනුවායෝ දෙදෙන, බොහෝ කල්ගත වූ නමුත් මාර්ගයෙහි කිසිවෙක් නො ආ බැවින් කරුණු විමසීම පිණිස පෙර මගට යන්නාහු, බුදුන් දැක වැඳ එකත් පසෙක සිටියෝය. මහා කාරුණික වූ තථාගතයන් වහන්සේ ඔවුන් දෙදෙනාට ද දහම් දෙසා සෝවාන් පෙලෙහි පිහිටුවා, "දෙව්දත් තෙරුන් කී මගින් නො ගොස් අන් මඟෙකින් යව" යි පිටත් කළ සේක. මෙසේ ම සෙසු දුනුවායෝ සතර දෙන ද අටදෙන ද සොළොස් දෙන ද කෙමෙන් බුදුන් වහන්සේ සමීපයට පැමිණියෝ ය. උන්වහන්සේ ඔවුන් සියලු දෙනාට ම දහම් දෙසා සෝවාන් මගින් අමාමහ නිවන් දක්වා අන් මගින් යවා ජීවිත දනය ද කළ සේක.

පෙර අප **බෝසත්තුමා** මහා වඳුරෙක්ව උපන් එක් අත් බවෙක වනයෙහි ගිය පුරුෂයකු නරාවළක වැටී ගොඩ ඒමට නො හැකිව සිටිනු දැක කරුණාවෙන් ගොඩ ගත් පසු, ඒ දුෂ්ට පුරුෂයා සිය දිවි ගලවා දුන් ඒ උතුම් වඳුරා මරා මස් කෑමේ අදහසින් ගලකින් උගේ හිසට පහරක් දුන් බව ද, එයින් හිස පැලී ලේ හැලි හැලී ගසකට නැඟ දිවි රැක ගත් වඳුරා ඉන්පසු ද තමන් මැරීමට තැත් කළ ඒ දුෂ්ට පුරුෂයාට අනුකම්පා කොට කඳුළු පිරුණු දෙනෙතින් යුක්තව, හිසින් ගලන ලේ පිස දමමින්, ගසින් ගසට පැන මනුෂ්‍ය පථයට යැමට මඟ පෙන්වූ බවද සඳහන් වන **කපි ජාතකයෙහි** වූ පුවත ද මෙහිලා හොඳ නිදසුනකි. මෙසේ පණ්ඩිත උත්තමයෝ තමන් නැසීමට පැමිණි සතුරන්ට පවා යහපත සලසන බැවින් පණ්ඩිතයන් සේවනය කිරීම උතුම් වූ මංගලයක් ම වන්නේ ය.

## ආශ්‍රයට සුදුසු මිත්‍රයෝ

1. ගිහි කල්‍යාණ මිත්‍රයෝ ය. 2. පැවිදි කල්‍යාණ මිත්‍රයෝයයි ආශ්‍රයට සුදුසු මිත්‍රයෝ දෙකොටසකි.

*Non-commercial distribution*

**ගිහි කල්‍යාණ මිත්‍රයෝ**

**"උපකාරො ච යො මිත්තො-**
**යො ච මිත්තො සුඛෙ දුඛෙ.**
**අත්ථක්ඛායී ච යො මිත්තො-**
**යො ච මිත්තානුකම්පකො"** යි

**සිගාලෝවාද** සූත්‍රයෙහි වදාළ පරිදි 1. උපකාරකය 2 සමාන සුඛ දුඃඛය 3 අර්ථඛ්‍යායීය 4 අනුකම්පකය යි ගිහි කල්‍යාණ මිත්‍රයෝ සිව්දෙනෙක් වෙති.

### 1. උපකාරක මිත්‍රයා

ස්වකීය මිත්‍රයාට වුවමනා තැනදී ඉතසිතින් හැම උපකාරයක් ම කරන්නා වූ යහපත් තැනැත්තා **උපකාරක** මිත්‍රයා නම් වේ.

1. ප්‍රමාද වූවහු රැකීම, එනම් මත්පැන් පානයෙන් මත්ව කිසි ආරක්ෂාවක් නැතිව වැටී සිටීම ආදි යම් කිසි ක්‍රමයකින් ප්‍රමාද වී සිටිනු දුටහොත් එකෙණෙහි තමා ඉදිරිපත් වී මිත්‍රයාට විපතක් නො වන ලෙස ආරක්ෂා කිරීම, 2. යට කී පරිදි ප්‍රමාද වී සිටින මිතුරාගේ වස්තුව සොර සතුරු ආදීන්ගෙන් ආරක්ෂා කර දීම, 3. මිත්‍රයාට යම්කිසි භයක් පැමිණි කල ජීවිතය වුවද පරිත්‍යාග කොට ඉදිරිපත් වී සිය මිතුරා එම භයින් මුදවා ගැන්මට කටයුතු කිරීම. 4. මිතුරාට ඇතිවූ කටයුතුවලට ධනය නොමැති නම් වුවමනා පමණටත් වඩා ධනය දී ඒවා යහපත් අන්දමට ඉටුවන ලෙසට ආධාර කිරීම යන සතර ඔහුගේ ලක්ෂණයෝ වෙති.

### 2. සමාන සුඛ දුඃඛ මිත්‍රයා

සිය මිතුරාට ලැබෙන සැප දුක් තමාට ලැබෙන සැප දුක් ලෙස සලකා කටයුතු කරන යහපත් මිත්‍රයා **සමානසුඛ දුඃඛ** හෙවත් සමාන සුව දුක් ඇති මිත්‍රයා නමි.

1. සැඟවිය යුතු රහස් නො සඟවා මිත්‍රයාට කීම. 2. මිත්‍රයාගේ රහස් කිසිවකුට නො කියා සැඟවීම, 3. විපතක් පැමිණි කල අත් නො හැරීම, 4. මිතුරා උදෙසා තමාගේ දිවි පිදීම- මිත්‍රයාට

Non-commercial distribution

වැඩ පිණිස වේ නම් දිවි වුවද පිදීමට සූදනම් වීම-යන සතර ඔහුගේ ලක්ෂණයෝ වෙති.

## 3. අර්ථඛ්‍යායි මිත්‍රයා

තමාගේ දෙලොව දියුණුවට මඟ පෙන්වන යහපත් තැනැත්තා **අර්ථඛ්‍යායි** හෙවත් **වැඩක්ම කියන මිත්‍රයා** නම් වෙයි.

1. "මිත්‍රය, මෙසේ අපරාධ කිරීම සුදුසු නැත. ඔබ වැනියකුට එය නොසෑහෙයි" යනාදීන් කරුණු කියා මිතුරා අපරාධවලින් වැළැක්වීම. 2. හොඳ වැඩවල යෙදවීම, 3. නොදත් බණ දහම් ආදිය දැනගැන්මට සැලැස්වීම, 4. ස්වර්ගයට යෑමට මේ මේ දේ කටයුතුය යනාදීන් ස්වර්ගයට මඟ පෙන්වීම යන මේ සතර දෙන ඔහුගේ ලක්ණයෝ යි.

## 4. අනුකම්පක මිත්‍රයා

සිය මිතුරාට ප්‍රිය මවක සේ අනුකම්පා කරන යහපත් මිත්‍රයා **අනුකම්පක** නම් වේ.

1. මිත්‍රයාට හෝ ඔහුගේ හිතවතකුට හෝ යම්කිසි විපතක් පැමිණි කල එය තමාට වූවක් මෙන් කණගාටු වීම, තමාගේ මුළු ශක්තිය යොද ඒ ගැන කළයුතු දේ කිරීම, 2. දියුණුවක් ඇති වූ කල තමාට ලද දෙයක් මෙන් සතුටු වීම, 3. මිත්‍රයාගේ අගුණ කියන්නන් දුටු කල ඒ අගුණ මකා ඇති ගුණ ඔවුන්ට කියාදී මිතුරාගේ කීර්තිය ආරක්ෂා කිරීම, 4. මිතුරාගේ ගුණ කියන්නන් හමුවූ කල ඉතා මැනවැයි ඔවුන්ට ප්‍රශංසා කිරීම-යන මේ සතර ඔහුගේ ලක්ෂණයෝ වෙති.

### පැවිදි කල්‍යාණ මිත්‍රයෝ

පාප මිත්‍රයන් විස්තර කිරීමේදී දැක්වූ පැවිදි පාප මිත්‍රයනට ප්‍රතිපක්ෂ වූ සිල්වත් ගුණවත් භික්ෂූන් වහන්සේලායි. තමාත් ධර්මයෙහි පිහිටා ගුණයෙහි පිහිටා අනුන්වත් ධර්මයෙහි ගුණයෙහි පිහිටු වීමට වෑයම් කරන උත්තමයෝ‍යි. ගිහි කලණ මිතුරන් හා

Non-commercial distribution

පැවිදි කලණ මිතුරන් වූ පණ්ඩිත ජනයන් ආශ්‍රය කිරීමෙන් දෙලෝ දියුණුව ළං කර ගැන්මට උත්සාහ කළයුතු.

**නිධීනං ව පවත්තාරං - යං පස්සෙ වජ්ජ දස්සිනං**
**නිග්ගය්හවාදිං මෙධාවිං - තාදිසං පණ්ඩිතං භජෙ**
**තාදිසං භජමානස්ස-සෙය්‍යො හොති න පාපියො**

(ධම්ම පදය)

නින්ද කරන අදහසින් නොව අනුග්‍රහ බුද්ධියෙන් අනුන්ගේ වරද දක්නා සුලු වූ ද, වරදේ පමණට නිග්‍රහ කොට අවාදනුශාසනා කරන්නා වූ ද දුගියන්ට රන් රුවන් පිරූ නිධානයක් දක්වා දෙන කුළුණැතියකු වැනි කරුණාවන්ත පණ්ඩිතයකු සේවනය කළ යුතුයි. එබඳු කෙනකු සේවනය කරන්නා හට දෙලොවම වැඩක් වන්නේය. නපුරක් නො වන්නේය.

Non-commercial distribution

# 3. පිදිය යුත්තන් පිදීම

මෙහි පිදිය යුත්තෝ නම් බුදුවරයෝ ය, පසේ බුදුවරයෝ ය, සපර්යාප්තික නව ලෝකෝත්තර ධර්මය ය, සවිඥ පුත්‍ර වූ කල්‍යාණ පෘථග්ජනයා සහිත වූ අෂ්ටායර්‍ය පුද්ගල සංඝයා ය, ගුරුවරයෝ ය, මාපියෝ ය, අන්‍ය වූ ශීලාදි ගුණයන්ගෙන් හා වයසින් ද වැඩිහිටියෝය යන මොවුහු වෙති.

බුද්ධ ප්‍රතිමා චෛත්‍ය බෝධි වෘක්ෂ ආදි පූජනීය වස්තූන් පිදීම බුදුන් පිදීමට ඇතුළත් වේ. මේ පිදිය යුත්තන් අතුරෙනුදු බුද්ධාදි රත්නත්‍රය, පූජාව මහත් ඵල කිරීමෙහි අතිසමර්ථ භාවයෙන් අතිශයින් පූජාර්හ වේ. එයිනුදු බුද්ධ රත්නය ප්‍රධානය. යමෙක් ඉතා සුළු දෙයක් නමුත් සිත පහදවා ආදර ගෞරවයෙන් බුදුනට පුද නම් ඒ තැනැත්තාට එයින් ලැබෙන්නාවූ ඵලය ඉතා මහති. ඒ බව මතු දක්වන "**උත්තර** මහ රහතන් වහන්සේගේ චරිතයෙන් දත හැකිය.

## බුදුන් පිදූ උත්තර මහ රහතන් වහන්සේ

මෙයට කල්ප තිස්දහසකට පෙර ලෝකයෙහි **සුමේධ** නම් බුදු කෙනෙක් පහළ වූ සේක. දිනක් උන්වහන්සේ හිමාල වනයට වැඩ පර්වත මුදුනක ඇවිලෙන ගිනි කඳක් මෙන් වනය බුදුරැසින් ආලෝකවත් කරමින් වැඩ හුන් සේක. එකල්හි ත්‍රිශූලයක් ගෙන අහසින් යන එක් **විද්‍යාධරයෙක්** බුදුන් දැක එතැනට පැමිණ පැහැදී වනයේ ගසකින් කිණිහිරි මල් තුනක් නෙලා බුදුනට පිදීය. බුදුන්වහන්සේගේ ආනුභාවයෙන් එම මල් තුන බිම නො වැටී තමන් වහන්සේගේ හිස මතුයෙහි අහස්හි මල් වියනක් මෙන් සිටියේය.

ඒ විද්‍යාධරයා ඒ ප්‍රාතිහාර්යය දැක බලවත් ප්‍රසාදයට මෙන් ම සතුටට ද පත් විය. එම පිනෙන් ආයු කෙළවර මිනිස් ලොවින් චුතව තව්තිසා දෙව් ලොව උපන. ඔහුගේ විමානය උසින් සැටයොදුනක් හා දිගු පුළුලින් තිස් යොදුනක් විය. විසිතුරු දදපෙළින් හා සියගණන් කූටාගාරයන්ගෙන් ද එය යුක්ත විය. තැනින් තැන තැබූ රුවන් පුවරුවලින් හා විසිතුරු යහන්වලින් සමලංකෘත විය. කිණිහිරිමල් පූජාවේ කුශලයෙන් ලද හෙයින් එයට **කණිකාර** විමානය යි නම් විය.

*Non-commercial distribution*

ඒ දිව්‍ය පුත්‍ර තෙමේ විමනින් නික්ම දෙව් පිරිස් පිරිවරා යම් යම් තැනකට යේද ඒ සියලු තන්හි ම බිම කිණිහිරිමල් ඇති කරන්නේය. අහසෙහි කිණිහිරි මල් වියනක් මැවෙන්නේය. අවටින් සියක් යොදුනක් තැන කිණිහිරි මලින් ගැවසී සිටින්නේය. ඔහුට සැට දහසක් දිව්‍ය නාට්‍යකරුවෝ දිව්‍යමය වූ නොයෙක් තූර්යයන් වාදනය කරති, නෘත්‍ය ගීතයෙහි දක්ෂ දිව්‍ය නාට්‍යාංගනාවෝ නෘත්‍ය ගීතයෙන් ඔහු සතුටු කරවති. මෙසේ ඔහු කිණිහිරි මල් තුනක් පිදීමෙන් මහත් වූ දිව්‍ය සම්පත්තියක් ලද්දේය. එම පිනින් ම ඉන් පසු සසර ලැබූ සම්පත් ද ඉතා බොහෝ ය. ඒ බව **උත්තර** මහරහතන් වහන්සේ විසින් ම **අපදාන පාළියෙහි** මෙසේ වදාරා තිබේ.

> සතානං පඤ්චක්ඛත්තුංච දෙවරජ්ජ මකාරයිං
> සතානං තීණික්ඛත්තුංච චක්කවත්ති අහොසහං
> පදෙස රජ්ජං විපුලං ගණනාථො අසංඛ්‍යං
> භවාභවෙ සංසරන්තො මහාභොගං ලභාමහං
> භොගෙ මෙ ඌනතා නත්ථි බුද්ධ පූජායිදං ඵලං

මම මල් තුනක් පූජා කළා වූ පිනෙන් පන්සිය වරෙක දිව්‍යලෝකයෙහි දිව්‍යරාජ්‍යය කෙළෙමි. තුන්සිය වරෙක මුළු පොළොවට ම අධිපති වූ චක්‍රවර්ති රජ වීමි. මහත් වූ ප්‍රදේශ රාජ්‍යයන් ලද වාරයන්ගේ ගණනක් නැත. මම සසර භවයෙන් භවයට හැසිරෙන්නේ මහත් වූ සම්පත් ලබමි. මා හට සම්පත්තීන්ගේ අඩු බවක් කිසි කලෙක නැත්තේය. මේ බුදුන් පිදීමේ ඵලයය යනු එහි අදහසයි.

තව ද ඔහු **සුමේධ** බුදුන් වහන්සේගේ කාලයෙහි පටන් අප බුදුන් වහන්සේ ගේ කාලය දක්වා කල්ප තිස් දහසක් මුළුල්ලෙහි දිව්‍යලෝක මනුෂ්‍යලෝක දෙක්හි සැප විඳිමින් සැරිසැරුවේ ය. එකවරෙකුදු අපායකට නො පැමිණියේ ය. මිනිස්ලොව උපදනා කල ද රජ කුලයේ හෝ බමුණු කුලයේ උපන්නා මිස ඉන් පහත් කුලයක නූපන්නේ ය. උපනුපන් සෑම තන්හි ම අනර්ඝ යානවාහනයන් ද, වැඩපලෙහි දක්ෂ සුවච දස දසියන් ද, නන් අබරණින් සැරසුනා වූ රූපත් ස්ත්‍රීන් ද, අග්‍ර වස්ත්‍රාභරණ හා ගෘහයන් ද ලැබීය. සියලු තන්හි ම අන්‍යයන් විසින් ගරු

Non-commercial distribution

බුහුමන් කරනු ලබන්නෙක් ද වූයේ ය. ස්වකීය ඥාති ජනයාට ප්‍රධානයෙක් ම විය. තමාට පක්ෂ වූ විශාල ජන සමූයක් ද වූයේය.

ශරීරයට ශීතලින් හෝ උෂ්ණයෙන් පීඩාවක් නොවීය. ශරීරයෙහි දහයක් හෝ සිත් තැවිල්ලක් හෝ නුවූයේයඃ සියලු කල්හි ම රන්වන් වූ කයක් ඇතුව ම උපන්නේ ය. විරූපව උපන් කලක් නම් නැත. මෙසේ ඉතා දීර්ඝ කාලයක් අපා දුක් සිහිනෙකිනුදු නො දැක, අග්‍ර වූ දිව්‍ය මනුෂ්‍ය සම්පත් අනුභව කරමින් සිටියා වූ ඔහු, අප බුදුන් වහන්සේගේ කාලයෙහි **සැවැත්නුවර** මහත් සම්පත් ඇත්තා වූ කුලයෙක **උත්තර** නම් කුමාරව ඉපිද බුදුසස්නෙහි පැවිදිව සව් කෙලෙසුන් නසා සිව්පිළිසිඹියාවත් සමගම රහත් විය. **උපසම්පදාව** වූ කලී විසිවයස් සම්පූර්ණ වූවකු විසින් ලැබිය යුතු වුව ද, වයසින් බාල වුව ද ගුණයෙන් වැඩි - මහලු වූ උත්තර සාමණේරයන් වහන්සේට බුදුන් වහන්සේ එය දෙවා වදාළ සේක.

මෙසේ උත්තර මහ තෙරුන් වහන්සේ තුන් කිණිහිරි මලකින් බුදුන් පුද සීනෙකිනුදු අපා දුකට නො පැමිණ තිස් දහසක් කප් මුළුල්ලෙහි පමණ නැති දෙව්මිනිස් සැපත් ලබා ඒ හැමට ම උතුම් වූ ලෝකෝත්තර නිර්වාණ සම්පත්තිය ද ලද සේක. එබැවින් පිදිය යුත්තන් පිදීම **උතුම් මංගලයක්** වන්නේ ය. මේ උත්තර තෙරුන් වහන්සේ මෙන් ම බුදුවරයන් වහන්සේලාට අල්ප වූ පූජාවන් කොට දෙව්මිනිස් සැප හා නිවන් සැප ලැබූවන්ගේ සංඛ්‍යාවක් නැත්තේ ය. එසේ ම චෛත්‍ය ප්‍රතිමා මහබෝ ආදිය පිදීමෙන් ද, පසේ බුදුනට පිදිමෙන් ද ධර්මයට හා සංඝයාට පිදීමෙන් ද, මව්පියන් ගුරුවරුන් වැඩි මහල්ලන් පිදීමෙන් ද අප්‍රමාණ සත්ත්වයෝ බොහෝ සැප සම්පත් ලැබූහ.

**වැඳීම පිදීම මෝඩකමකැයි කියන ශාසන නාශකයෝ**

පිදි යුත්තන් පිදීම යටකී පරිදි මහත්ඵල මහානිසංස දයක උතුම් පිංකමකි. එහෙත් අද මහා බෞද්ධයන් ලෙස, බෞද්ධනායකයන් ලෙස, මහා පණ්ඩිතයන් ලෙස පෙනීසිටිමින්, තමන් පන්සිල්වත් සමාදන් නොවෙමින්, භික්ෂූන් වහන්සේලාටත් බණ උගැන්වීමට කථා කරන **මිථ්‍යාමතධාරී ඇතැම්හු**. වැඳුම් පිදුම් කිරීම වැඩකට

Non-commercial distribution

නැති හිස් වැඩකැයි ලොවට කියාපාති. මිසදිටුවන්ගේ ඇම ගිලීම නිසා ලක්සසුන සම්පූර්ණයෙන් වනසා, කුඩායුරෝපයක් නැතහොත් පුංචි එංගලන්තයක් කිරීමට මිසදිටුවනට රුකුල්දීමට කැසකවාගත් **විනය වරද්දන තවත් පිරිසක්** විහාර චෛත්‍යාදිය වැඳුම් පිදුම් කිරීම තබා, වෙහෙර විහාර තැනීම පවා මෝඩ බෞද්ධයන්ගේ වැඩකැයිද, ඒවා ආගම් විරෝධී වැඩයයි ද ලොවට උස්හඬින් පවසමින් නුගත් බෞද්ධයන් නොමඟ යවති. එබැවින් මතු දක්වනු ලබන දේශනාවන් දැන උගෙන ඔවුන්ගේ ඒ කීම්වල සත්‍යයක් නැති බව වටහා ගැනීමෙන් සැක දුරු කර ගනිත්වා!

**වැඳුම් පිදුම් කිරීමෙහි අනුසස්.**

**"යෙහි කෙචි ආනන්ද චේතිය චාරිකං ආහිණ්ඩන්තා පසන්නචිත්තා කාලං කරිස්සන්ති. සබ්බේ තෙ කායස්ස භෙද පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජිස්සන්තීති"**

(දීඝනිකාය මහා පරිනිබ්බාන සුත්ත)

ආනන්දය! යම්කිසි සැදැහැවතෙක් සැදැහැ සිතින් චෛත්‍යචාරිකාවෙහි හැසිරෙත් ද, ඒ යන අතරමග කලුරිය කෙරෙත් ද ඔවුහු මරණින් මතු සුගතිය නම් වූ ස්වර්ගයෙහි උපදිත්, යනු අදහසයි. එම පාඨය වර්ණනා කරන අර්ථකථාචාර්‍ය්‍යයන් වහන්සේලා මෙසේ දැක්වූහ:-

"**තත්ථ චෙතිය චාරිකං ආහිණ්ඩන්තාති** - යෙ තත්ථ චෙතියංගණං සම්මජ්ජන්තා ආසනානි ධොවන්තා, බොධිම්හි උදකං ආසිඤ්චන්තා ආහිණ්ඩන්ති විචරන්ති, තෙසු වත්තබ්බමෙව නත්ථි-අසුකවිහාරෙ චෙතියං වන්දිස්සාමාති නික්ඛමිත්වා පසන්නචිත්තා අන්තරා කාලං කරොන්තාපි අන්තරායෙව සග්ගෙ පතිට්ඨහිස්සන්ති යෙවා ති දස්සෙති"

යම් කෙනෙක් චෛත්‍යචාරිකාවෙහි හැසිරෙමින් සැදැහැසිතින් චෛත්‍ය මළු අමදමින් මලසුන් සෝදමින් මහබෝ සමීපයෙහි දිය ඉසිමින් හැසිරෙද්ද, ඇවිදිද්ද, ඔවුනට දිව්‍යසම්පත් ලැබීම ගැන කියයුතු නැත. ඒකාන්තයෙන් ලැබෙන හෙයිනි. අසවල් විහාරයෙහි චෛත්‍යය වඳින්නෙමුයි ප්‍රසන්න සිතින් පිටත්ව යන්නාහු ද, එසේ

Non-commercial distribution

යන අතරමග චෛත්‍යස්ථානයට ළං වීමට පළමු කලුරිය කෙරෙත් ද ඒ පහන් සිතින් කලුරිය කළ ඔවුහු පවා මරණින් මතු දෙව්ලොව උපදින්නාහුය යනු අදහසයි.

**පදවීතිහාරානිශංසය.**

**සතං හත්ථී සතං අස්සා - සතං අස්සතරීරථා**
**සතං කඤ්ඤා සහස්සානි - ආමුත්තමණි කුණ්ඩලා**
**එකස්ස පදවීතිහාරස්ස - කලං නාග්ඝන්ති සොළසිං**

(සංයුත්ත නිකාය)

පහන් සිතින් බුදුන් වඳින්නට යම්හ, මලක් පහනක් පුදන්නට යම්හ, දහම් අසන්නට යම්හ, සඟුන් වඳින්නට යම්හයි තැබූ එක් පියවරක්, දහසයකින් දහසය වාරයක් බෙදූ කල ලැබෙන සොළොස්වැනි කලාව වූ **කෙසගක් පමණ තැන පිළිබඳව පැවැති කුසල් සිත පවා**, සර්වාභරණයෙන් සැරසූ ලක්ෂයක් හස්තීහු ද ලක්ෂයක් අශ්වයෝ ද, ලක්ෂයක් රථ ද, ලක්ෂයක් කන්‍යාවෝ ද යන සාරලක්ෂයක් වස්තූනට ද වඩා නැතහොත් එම වස්තූන් දන් දීමට ද වඩා වටිනා බව එයින් පවසන ලදී.

**අංගුත්තර චතුක්ක නිපාතයෙහි ද** මෙසේ වදළ සේක.

**අග්ගතො වෙ පසන්නානං අග්ගං ධම්මං විජානතං.**
**අග්ගෙ බුද්ධෙ පසන්නානං දක්ඛිණෙය්‍යෙ අනුත්තරෙ**
**අග්ගෙ ධම්මෙ පසන්නානං විරාගූපසමෙ සුඛෙ**
**අග්ගෙ සංඝෙ පසන්නානං පුඤ්ඤක්ඛෙත්තෙ අනුත්තරේ.**
**අග්ගස්මිං දානං දදතං අග්ගං පුඤ්ඤං පවඩ්ඪති**
**අග්ගං ආයුං ච වණ්ණෝච යසො කිත්ති සුඛං බලං.**

අග්‍ර වූ බුදුන් කෙරෙහි, වෙහෙර විහාර කෙරෙහි, ධර්මය කෙරෙහි, සංඝයා කෙරෙහි සිත පැහැද වූ සත්ත්වයෝ අග්‍රවූ ආයුෂ ඇතිව, අග්‍රවූ වර්ණය ඇතිව, අග්‍රවූ යශස් ඇතිව, අග්‍රවූ කීර්තිය ඇතිව, අග්‍රවූ සැප ඇතිව අග්‍රවූ කායබල ඥානබලාදිය ඇතිව දෙව්ව උපන් කල දෙවියන් කෙරෙහි අග්‍රවද, මිනිස්ව උපන් කල මිනිසුන් කෙරෙහි අග්‍රවද අග්‍රවූම සම්පත් අනුභව කරති. - යනු අදහසයි.

Non-commercial distribution

**එවං අචින්තියා බුධා - බුධ ගුණා අචින්තියා**
**අචින්තියෙසු පසන්නානං - විපාකො හොති අචින්තියො.**

මෙසේ කීමට තබා සිතීමට වත් නොහැකි අනන්ත ගුණැති බුදුන් කෙරෙහි පැහැදුනාවූ සත්ත්වයනට නොසිතිය හැකි, නො කිව හැකි, අනන්ත අප්‍රමාණ සැප විපාක ලැබෙන බව නියතමය.

**ස්වර්ණමාලි චෛත්‍යය කෙරෙහි සිත පැහැදවීමෙන් නිවන් දුටුවන්ගේ සංඛ්‍යාවම අති විශාල බව**

ලක්දිව පිහිටි සියලු ම චෛත්‍යස්ථානයන්හි විහාරස්ථානයන්හි නොව, අනුරපුර පිහිටි එක ම ස්වර්ණමාලී මහා චෛත්‍යස්ථානයේදී පමණක් වැදීමෙන් පිදීමෙන් නොව, දර්ශනමාත්‍රයෙන් බුද්ධාලම්බණ ප්‍රීතිය ලැබ දෙව්ලොව මනුලොව ඉපදීම නොව, සකල ක්ලේශයන් ප්‍රහාණය කිරීමෙන් පරම පරිශුද්ධත්වයට පැමිණ නිවන්පුරයට පැමිණියවුන්ගේ සංඛ්‍යාව ම මෙතෙකැයි ප්‍රමාණ කළ නොහැකි බව සංයුත්ත නිකාය අර්ථකථා වෙහි මෙසේ දැක්විණ:-

**මහා විහාරස්මිංහි දක්ඛිණද්වාරෙ ඨත්වා මහාචෙතියං ඔලොකෙන්තා තිංසසහස්සා භික්ඛු අරහත්තං පාපුණිංසු. තථා පච්ඡිම ද්වාරෙ උත්තර ද්වාරෙ පාචිනද්වාරෙ ච - මහාචෙතියස්ස සමන්තා කුච්ඡිවෙදිකාය හෙට්ඨිම භාගතො පට්ඨාය පකද්කදායතනට්ඨානෙ යත්ථ යත්ථ ද්වෙ පාද සක්කා හොන්ති සමං පතිට්ඨපෙතුං තත්ථ තත්ථ එක පදුද්ධාරෙ තිංස තිංස භික්ඛුසහස්සානි අරහත්තං පාපුණිංසූති මහා චෙතියතලෙ ආකිණ්ණවාලුකාය බහුතරා භික්ඛු අරහත්තං පත්තානි"**

දර්ශන මාත්‍රයෙන් බුද්ධාලම්බන ප්‍රීතිය ලබා මහා චෛත්‍ය ස්ථානයෙහි මළුවෙහි අතුළ, වැලිවල ප්‍රමාණය ද ඉක්මවා රහත්වූ බවත්, එක පියවරක් තැබිය හැකි භූමි ප්‍රමාණයක දහස්ගණන් රහත්වූ බවත් එයින් පැවසේ. එය එසේනම් එවැනි පූජනීය ස්ථානයන් වැඳීම පිදීම වතාවත් කිරීම දියුණු කිරීම තැනීම ආදි ක්‍රියාවන්ගෙන් අත්වන කුශලය මෙතෙකැයි කාට කිවහැකි ද? නො හැකිමය.

Non-commercial distribution

## බුදුන් වැඩ සිටින කල මෙන් සමාන විපාක පිරිනිවියත් ලැබෙන බැව්.

**තිට්ඨන්තෙ නිබ්බුතෙ වා පි සමෙ චිත්තෙ සමං ඵලං**
**චෙතොපසාද හෙතුම්හි සත්තා ගච්ඡන්ති සුග්ගතිං**

බුදුන් වහන්සේ කෙරෙහි පහන් සිතින් වදින පුදන බෞද්ධයාට ලැබෙන කුශලය, උන්වහන්සේ ජීවමානව වැඩ විසූවත් පිරිනිවියත් එක හා සමානව ලැබෙන බව ද, එයට ලැබෙන විපාක සමානව ම ලැබෙන බව ද එයින් ප්‍රකාශිතය.

කරුණු මෙසේ හෙයින් සැදැහැ සිතින් ගුණ සිහි කර උන්වහන්සේගේ ශාරීරික ධාතූන් තැන්පත් කළ (ශාරීරික චෛත්‍යයවූ) වෙහෙරකට හෝ මහබෝ ආදී (පාරිභෝගික චෛත්‍යයවූ) පරිභෝග කළ වස්තුවකට හෝ, (උද්දේශික චෛත්‍යයවූ) උදෙසා කළ පෙති පිළිම ආදියකට හෝ උන්වහන්සේට කරන ගෞරවයක් පූජාවක් ලෙස සලකා වැඳුම් පිදුම් කිරීමෙන් සමාන කුසල් සමාන විපාක ලැබෙන බව සැලකිය යුතු.

## අති පණ්ඩිතයන් අපාය ගාමී වන බැව්

වැඳුම් පිදුම් කිරීම හිස් වැඩ යයි කියන අති පණ්ඩිතයන් ගැන දීඝනිකාය මහා සතිපට්ඨාන සූත්‍ර වර්ණනාවෙහි මෙසේ දැක්විණ:-

**"බලවපසද්ධා මන්දසද්ධො කෙරාටික පක්ඛං භජති. භෙසජ්ජ සමුට්ඨිතො විය රොගො අතෙකිච්ඡො හොති. චිත්තුප්පාද මත්තෙනෙව කුසලං හොතීති අතිධාවිත්වා දනාදීනි අකරොන්තො නිරයෙ උප්පජ්ජති"**

බෙහෙතින් හටගත් රෝගයට ප්‍රතිකාර කිරීමෙන් සුව කිරීම දුෂ්කර වූවාක් මෙන්, නුවණ වැඩි මඳ සැදැහැති තැනැත්තා, අනුන් විසින් අනුශාසනා කොට හොඳ අදහස් ඇතියකු නො කළ හැකි සේ කෛරාටිකයෙක් වෙයි. ඔහු "පින්කම් නම් සිතේ පහළවන හොඳ අදහස්ය, සිතු පමණින් සියල්ල සම්පූර්ණය" යි අතිධාවනය කොට, වැඳුම් පිදුම් දන්දීම් ආදි පුණ්‍ය කර්මයන් එකකුදු නො කොට මරණින් මතු නරකයෙහි උපදින්නේය.

*Non-commercial distribution*

**බුද්ධපූජාව නො කළ යුතුයයි කියන**
**මිථ්‍යාවාදීනට තිසි පිළිතුරු**

මෙතෙක් දැක්වූයේ ඒ ඒ කරුණු පිළිබඳ දතමනා නිදර්ශනාත්මක දේශනා පාඨ කීපයක් හා එහි අදහස් පමණකි. එපමණකින් ඒ මිථ්‍යාවාදීන්ගේ දුර්මත පිළිගෙන සිටින නුවණ නැති ඇතැම් බෞද්ධයනට කරුණු හරිහැටි අවබෝධ නොවන නිසා, මෙතැන් සිට ඔවුන් පවසන කරුණු අළලා විවේචනාත්මක වූ ද අදහස් ටිකක් දක්වනු ලැබේ.

# බුද්ධ පූජාව

**බුද්ධොති කිත්තයන්තස්ස - යස්ස කායෙ හවති යා පීති**
**වරමෙවහි සා පීති - කසිණේනාපි ජම්බුදීපස්ස**

"**බුද්ධ**" යන වචනය කියන්නා වූ යමෙකුගේ කයෙහි ප්‍රීතියක් උපදී ද ඒ ප්‍රීතිය මුළු දඹදිව රජවීමට ද වඩා උතුම් වන්නේය. කුමක් හෙයින් ද යත්? බුදුන් අරභයා පහළ වන්නා වූ ප්‍රීතිය ම මිනිස් ලොව රජ සැපතට වඩා සිය වාරයෙන් ප්‍රණීත වූ දිව්‍ය සම්පත්තිය ද ගෙන දීමෙහි පොහොසත් හෙයිනි. සිත පහදවා ගැනීම් මාත්‍රය ම මෙපමණ උතුම් වූ කල ඒ භාග්‍යවතුන් වහන්සේට මල් පහන් ආහාර පානාදිය පිදීමෙහි උත්තමතාවය කියනු ම කවරේ ද? රාග, ද්වේෂ, මෝහ, මද මානාදි ක්ලේශ මලාපගමනයෙන් සුවිශුද්ධ වූ ශීලසමාධ්‍යාදි අපරිමිත ගුණ සමූහයෙන් සමලංකෘත වූ පුණ්‍ය පිණ්ඩායමාන වූ තථාගතයන් වහන්සේ පිදිය යුත්තන් අතුරෙන් අග්‍ර වූ සේක. ඒ අග්‍ර පූජනීය වූ තථාගතයන් වහන්සේ පුදනුවන්ට අග්‍ර වූ විපාකයෝ ද වන්නාහ.

**පිත්වත්ති.**

අද ලෝකයෙහි පවත්නාවූ සෑම ආගමක් ම අදහන්නා වූ තැනැත්තන්ට ඒ ඒ ආගම්වල සැටියට පිහිට කර ගැනීමට හා වැඳුම් පිදුම් කිරීමට ද පුද්ගලයෝ සිටිති. **බුදුරුවනය**. **දම්රුවනය**. **සඟරුවනය** යන තෙරුවන බුඩාගම් කාරයන්ට පිහිට කර ගැනීමට හා වැඳුම් පිදුම් කිරීමට ද තිබෙන උත්තම වස්තු තුනය. බුඩාගම ලොව පවත්නා තෙක් බෞද්ධයන්ට මේ තුනුරුවන පිහිට

Non-commercial distribution

කරගත හැකිය. තුනුරුවනට වැඳීම ද මල් පහන් ආහාරපාන වස්ත්‍රාදි කැමති දෙයකින් පිදීමද කළ හැකිය.

**පූජාවක් කිරීමෙහි පිළිවෙළ නොදැනීමත් බුදු පිළිම සාදගෙන තිබීමෙහි තේරුම නො දැනීමත් පින්කම් මොනවා ද කෙසේ ලැබෙන දෙයක් ද යන බව නොදැනීමත් නිසා ඇතැම්හු. දැන් බුදුන් නැත. එබැවින් බුදුන්ට පහන් නො පිදිය හැක. ආහාර නොපිදිය හැක. වත් පිළිවෙත් නොකළ හැක. මැටි පිළිමවලට පහන් පත්තු කිරීම ආහාර පිදීම නිෂ්ඵලය යනාදි මිථ්‍යාමත රැසක් ලොව පතුරුවමින් තමන් වැටී සිටින ප්‍රපාතයේ අන්‍ය සැදැහැවතුන් ද හෙළන්නට තැත් කරති.** පිරිනිවන්පා වදළා වූ ඒ බුදුනට මල් පිදීම වැඳීම කළ හැකි බවකුත් මොව්හුම කියති. වඳින්නවුන්ගේ වන්දනාව හා මල් පූජාව පිරිනිවියාවූ ඒ බුදුනට පැමිණේ නම් අනිකුත් පූජාවෝද පැමිණෙත්මය. බුදුන් පිරිනිවීම නිසා සමහරක් පූජා කළ හැකිය, සමහරක් නො කළ හැකිය යන මේ කීම කිසි ම ලෝක නීතියකට හෝ ධර්ම නීතියකට නො ගැලපෙන පූර්වාපර සම්බන්ධ නැත්තාවූ පිස්සු කතාවක් වුවත් තරයේ ම කරන්නාවූ මොවුන්ගේ ප්‍රකාශයෝ ආගම ධර්මය නූගත් සැදැහැවතුන් ගේ සිත් චංචල වීමට හේතුවක් වී තිබෙන බැවින් බුඩ පූජාව පිළිබඳ විස්තරයක් කරනු ලැබේ. මෙය මනා කොට කියවා තම තමන්ගේ සැක දුරු කර ගත යුතු.

### පූජාව නම් කුමක්ද?

පූජාව නම් පින්කිරියවත් අතුරෙන් දනයෙහි සංග්‍රහ වන්නා වූ පුණ්‍යකර්මයකි. **දනය නම්** තමා අයත් වස්තුවක් පින් පිණිස අනිකෙක්හට අයිති කිරීමය. යමක් අනිකෙක්හට අයිති කිරීමේ සම්පූර්ණ බලය වස්තු හිමියා කෙරෙහි ම පවතී. ලබන තැනැත්තාගේ ශරීරයෙන් ඊට උවමනා කිසිවක් නැත. එබැවින් ලබන තැනැත්තා කොතැන සිටියත් අයිති කරන තැනැත්තාට තමාගේ කටයුත්ත කළ හැකිය. මතු උපදින්නට සිටින කෙනකුට වුවත් යම් කිසිදෙයක් අයිති කළ හැකිය. යම් කිසි වස්තුවක් අනිකෙක් හට දීම ලබන තැනැත්තාගේ ශරීරය හා සම්බන්ධ වන පරිද්දෙන් අතට දීමෙන් ම සිදු කළ යුත්තකැයි කියතහොත් අතින් අතට දිය නොහෙන වතු කුඹුරු ගෙවල් ආදිය අන්‍යයකුට අයිති කළ නොහැකි විය යුතුය. අතින් අතට නො දිය හැකි දේවල් ද අනුන්ට

Non-commercial distribution

අයිති කර දිය හැකි බව කවුරුත් දන්නා කාරණයකි. එබැවින් ලබන්නා වූ තැනැත්තා ළඟ ඇතත් නැතත් අයිති කිරීම වූ දීම කළ හැකි බව දතයුතු.

මේ අයිති කිරීම යයි කියන ලද දීම ම ගරු කළ යුත්තන්හට ගරුබුහුමන් පෙරටුව කරන කල්හි **පූජාකිරීම** යයි කියනු ලැබේ. පූජාකිරීම යන්නෙහි අදහසත් අයිති කිරීම ම බව මතක තබා ගතයුතුයි. වස්තු හිමියා විසින් තමාගේ අයිතිය අත්හැරීමය, වස්තුව අනිකෙක් කෙරෙහි පිරිනැමීමය යන අංග දෙකින් අයිති කිරීම සිඩ වේ. භාණ්ඩය තැබීමට ලබන තැනැත්තාගේ අත හෝ කර හෝ වුවමනාය යන තුන්වන අංගයක් මීට නැත.

**බුදුන් පුදන්නේ කෙසේ ද?**

**බුදුරජාණන් වහන්සේට** පුදන්නා වූ වස්තූන් ජීවමාන කාලයේ උන්වහන්සේගේ අත්හි හෝ පාත්‍රයෙහි හෝ සමීපයෙහි හෝ තැබීමෙන් පූජා කළෝය. විහාරාරාමාදි වස්තූන් දෙමිය යන වචනය කියා පිදූහ. මේ සතර ආකාරයෙන් ම ඒ වස්තූන් වෙනසක් නැතිව බුදුනට අයිති වේ. **පිරිනිවී මෙන් පසු ශාරීරික, පාරිභෝගික, උද්දේශික යන ත්‍රිවිධ චෛත්‍යයන් සමීපයෙහි තැබීමෙන් පූජා කළහ**. ජීවමාන කාලයේ පිදූ වස්තූන් බුදුනට අයිතිවූවාක් මෙන් ම පිරිනිවීමෙන් පසු චෛත්‍ය ස්ථානයන්හි තබා පුදන්නාවූ වස්තූන් ද බුදුන්ට අයිති වේ. මෙහි අයිතිවීම පිළිබඳ වෙනසක් නොමැතිය.

**පිළිමය උද්දේසික චෛත්‍ය** යයි මලක් හෝ පහනක් හෝ ආහාර පාන වර්ගයක් හෝ කොඩියක් කුඩයක් වස්ත්‍රයක් හෝ මේ වස්තුව භාග්‍යවත් වූ බුදුරජාණන් වහන්සේට පුදමියි කියා බුදුන් කෙරෙහි පිරිනමා තමාගේ අයිතිකම අත්හැර දමා ප්‍රතිමාව ඉදිරියේ තැබූවාම ඒ වස්තුව බුදුනට අයිති වේ. තමාගේ අයිතිය අත්හැරීමෙන් පසු පූජා කළ තැනැත්තාට එහි අයිතියක් නැත. **පිළිම ඉදිරියෙහි තබා බුදුන්ට කරන්නාවූ පූජාව මැටි රූපවලට කැම දීමකැයි සිතීම අලුත් බණකාරයන්ගේ ලොකු අනුවණකමකි**. බුදුන්ට පිදිය හැක්කේ අයිති කළ හැක්කේ මල් පමණක්ය, ආහාරාදිය නොපිදිය හැකියයි කියතහොත් එය මොළයේ

Non-commercial distribution

දෝෂයකින් විය යුතුය. බුදුන් අජීවමාන බැවින් උන්වහන්සේට නොපිදිය හැකිය යන්න සත්‍යයක් නො වෙතොත් දළදා මාලිගාදියට පුදා තිබෙන ඉඩකඩම් රන් රිදී මුතු මැණික් ආදිය අස්වාමික වස්තු විය යුතුය. අස්වාමික බැවින් ඒ වස්තූන් කවුරු ගත්තත් එයින් ගන්නා තැනැත්තන්ට පාපයකුත් සිදු නොවිය යුතුය. විහාර දාගැබ් බිඳ ගත්තාට ද එයින් පාපයක් නො විය යුතුය. පින්වත්නි! මේ අලුත් බණවලට රැවටී පූජා නොවී යයි සිතා බුදුනට පුදා තිබෙන දේවලින් කිසිවක් ගැනීමට නොසිතිය යුතුයි. පිරිනිවි බැවින් බුදුනට නො පිදිය හැකියයි කීම බුද්ධාගමේ පදනම වූ තුනුරුවනින් එක් රුවනක් නැති කිරීමය. එය බුද්ධාගමේ පදනමට බෝම්බ හෙළීමකි. දැන් බෞද්ධයෝ තෙරුවන් පිහිට කරගෙන වෙසෙති. ඉදින් බුදුරුවනට පූජාවක් පවා අයිති කළ නොහේ නම් ඒ බුදුන් පිහිට කරගන්නේ කෙසේද? බුදුන් පිහිට කරගත හැකි නොවේයයි කියතහොත් තිසරණයත් දෙසරණය වී බුඩාගමයේ පදනම ම බිඳ වැටෙන්නේය. **අහෝ නුසුදුස්සන් ලොවට අනුශාසනයට බැස්සාම වන විපතක මහත**.

## කුශලය නම් කුමක් ද?

ජීවමාන වූ ද පිරිනිවියා වූ ද බුදුනට ආහාරපානාදි දේවල් වෙනසක් නැතිව ම අයිති කළ හැකිවන බැවින් එසේ අයිති කරන්නා වූ හෙවත් පුදන්නා වූ තැනැත්තාට නොවෙනස්ව ම කුශලය ද අත්පත් වේ. දැන් පූජා කරන්නා වූ ආහාර පානාදියෙන් බුදුන්ට හෝ බුදු පිළිමවලට හෝ ප්‍රයෝජනයක් නොවන බව නම් සත්‍යයකි. ප්‍රයෝජනවීම හෝ නොවීම පූජාකරන්නාට පින් ලැබීමට හෝ නො ලැබීමට හෝ ලැබෙන පින අඩු වැඩි වීමට හෝ කාරණයක් නොවේ. ප්‍රයෝජන නොවීම පින් නැති වීමට කාරණයක් කොට දක්වන්නේ පින නම් කුමක්දැයි නො දැනීමෙනි. පින වනාහි මිලක් දී බඩුවක් ගන්නාක් මෙන් පූජාව දී බුදුන්ගෙන් ගන්නා දෙයක් නොවේ. පූජා කළ වස්තුවෙන් බුදුන්ට වූ ප්‍රයෝජනයේ සැටියට අඩු වැඩිව පසුව ලැබෙන්නා වූ දෙයක් ද නොවේ. ඉදින් පින බුදුන්ගෙන් ගන්නා දෙයක් වී නම් බුදුන් හමු නො වී එය ලබාගත හැකි නොවේ. පූජා කළ දෙය බුදුන් ප්‍රයෝජන ගත්තාට පසු පින එන දෙයක් වී නම් බුදුනට ප්‍රයෝජන නො වී මෙන් පින් නො ලැබේ.

Non-commercial distribution

මේ දෙක ම මෙසේ නො වන කල, පූජා කරන දේවලින් බුදුනට ප්‍රයෝජනයක් නොවන බව පින් නො ලැබීමට හේතුවක් කොට ගෙන හැර පෑම විහිලුවකි.

ආහාර පානාදි යම් කිසිවකින් බුදුන් පිදීම වනාහි සිතින් කරන්නා වූ කටයුත්තකි. සිතින් වෙන්ව එය කිසිසේත් සිඩ කළ නොහේ.

**සොමනස්ස සහගත ඤාණසම්පයුත්ත අසංඛාරික සිතය**

**සොමනස්ස සහගත ඤාණසම්පයුත්ත සසංඛාරික සිතය**

යනාදීන් කුසල් සිත් අටක් අභිධර්මයෙහි වදරා තිබේ. බුදුන්ට යමක් පූජා කරන්නේ ඒ සිත් අට අතුරෙන් යම්කිසි සිතකිනි. බුඩ පූජා කිරීමෙන් ලැබෙන කුසලය නම් පූජාකරන තැනැත්තා තුළ වස්තුව පූජා කිරීම් වශයෙන් පහළ වූ සිතමය. සම්ප්‍රයුක්ත ධර්ම සහිත වූ කුසල් සිත ම හැර කුශලය කියා අන්කිසි දෙයක් නො මැත්තේය. පූජා කළ වස්තුව බුදුනට පසුව ප්‍රයෝජන වුවත් නුවත් අප්‍රයෝජන ම වූවත් පූජා කිරීමෙහි දී පූජා කරන්නා වූ තැනැත්තා තුළ ම පහළ වන්නා වූ කුශලයට එයින් වන කිසිවක් නො මැත්තේය.

## පුදන දෙයින් වැඩක් නැතිවීම පිනට බාධාවක් නොවන බව

**බුදුරජාණන් වහන්සේ** දුප්පතෙක් නොවේ. ඉපදීම සමග ම සතරමහ නිධානයකුත් පහළ වූ ඒ භාග්‍යවතුන් වහන්සේට කාගෙන්වත් ආහාර ටිකක් ලබාගෙන සම්පූර්ණ කරගතයුතු අඩු-පාඩුවක් නැත්තේය. එබැවින් උන්වහන්සේ ගේ අමාරුකම් සම්පූර්ණ කිරීම පිණිස නොව තම තමාට පින් සිදුකර ගැනීම පිණිස පින් කැමැත්තෝ තමා හට තිබෙන දෙයකින් බුදුන් පිදුවෝය. උන්වහන්සේ ද සත්ත්වානුග්‍රහය පිණිස ඒ ඒ පූජා පිළිගත් සේක. බත්-මාළු ඇත්තෙකුට කෑමට කොස් ඇට තම්බා දුනහොත් එය ඔහුට කරදරයකි. බුදුරජාණන් වහන්සේට දුගීන්ගේ දන් පිළිගැනීම ද එසේමය. උන් වහන්සේ සත්ත්වානුකම්පාවෙන් ප්‍රණීත භෝජන හැර

Non-commercial distribution

දුප්පතුන් කරා වැඩ ඔවුන්ගේ කටුක ආහාරයන් පිළිගත් සේක. (පෘථග්ජන දැක්ම අනුව) එය උන්වහන්සේට පාඩුවකි. කරදරයකි.

ඉදින් දුන් තැනැත්තාට ලැබෙන විපාකය ප්‍රතිග්‍රාහකයාට වන ප්‍රයෝජනයේ සැටියටමයයි කියතහොත් දුප්පතුන්ගේ දන් දීමෙන් ලැබිය හැකිව තිබෙන ප්‍රණීත භෝජනය අත්හරින්නට වීමෙන් බුදුන්ට වන්නේ අලාභයක් බැවින් දන් දුන් දුප්පතුන්ට එයින් සිදුවිය යුත්තේ පාපයකි. බුදුනට දන්දීමෙන් අපායට ගිය කෙනෙක් නම් නැත. **පූර්ණා** නම් දසිය කිසි ම රසයක් නැති ගිනි අඟුරු මත තබා පිසගත් කුඩු රොටියක් බුදුන්ට පූජා කළාය. ඕතොමෝ එද ම සෝවාන් වීමෙන් නිවන් දැකීම ද කළාය. බුදුන්ට වූ ප්‍රයෝජනයේ සැටියට විපාක කියතහොත් පූර්ණාවට විය යුත්තේ අපායට යාමය. කරුණු මෙසේ හෙයින් පූජාවක් කිරීමෙන් ලැබෙන්නා වූ කුශලය දායකයාගේ සිතේ සැටියට මිස, ලබන තැනැත්තාට වන ප්‍රයෝජනයේ සැටියට නො වන බව තේරුම් ගත යුතු.

## දීමට විරුඬ කදරිය කාරයෝ

**චතුරසඞ්ඛ්‍ය කල්ප ලක්ෂයක්** මුළුල්ලෙහි රැස් කරන ලද පාරමිතා කුශලකර්මයාගේ නිස්සන්ද විපාක වශයෙන් පිරිනිවියාට පසුත් ඒ භාග්‍යවතුන් වහන්සේට ලැබෙන පූජාවෝ අප්‍රමාණයහ. අප තථාගතයන් වහන්සේ පමණ පූජා ලබන දිව්‍ය බ්‍රහ්මාදි කිසිවෙක් නැත්තේය. තමා අයත් දෙය පරහට දීමෙහි අකමැත්ත **"මසුරු බව"** නම් වූ පාපධර්මයයි. ඒ මසුරුකම අතිශයින් වැඩුණු කල තමා නො දෙනවා පමණක් නොව අන්‍යයන්ගේ දීමට ද විරුද්ධ වන ස්වභාවයට පැමිණේ. මෙසේ වැඩුණා වූ ඒ අධික මසුරුකම **"කදරිය"** නම් වේ. කදරියෙන් යුක්ත වූ ඇතැම්හු බුදුනට ලැබෙන්නා වූ දහස් ගණනින් ලක්ෂ ගණනින් ප්‍රමාණ කළයුතු වූ පහන් පූජා-කරත්ත ගණනින් මිණිය යුතු විශාල ආහාර පූජා දුටුවිට ඇසූවිට බුදුන්ගේ පුණ්‍ය මහිමය නො සලකා මෙතෙක් තෙල් මෙතක් ආහාරපාන කිසිවකුට ප්‍රයෝජන නොවී වියදම් වීම රටට මහත් පාඩුවකැයි සලකා සිත දූෂ්‍යකර ගනිති. එය ඔවුන්ට වන මහත් වූ පාපයකි. එබඳු පූජා දුටු විට ඇසූ විට තමාගේ සිත පහදවාගෙන අනුමෝදන් විය යුතුයි.

Non-commercial distribution

**නවෙ කදරියා දෙවලොකං වජන්ති**
**බාලා හවෙ නප්පසංසන්ති දනං**
**ධීරොච දනං අනුමොදමානො**
**තෙනෙව සො හොති සුඛී පරත්ථ.**

කදරිය කාරයෝ දෙව්ලොවට නො යන්නාහ. මෝඩයෝ දනය ගැන ප්‍රශංසා නො කරන්නාහ. නුවණැත්තේම දනය අනුමෝදන් වන්නේ එයින් ම පරලෙව්හි සැප ඇත්තෙක් වන්නේය යනු මෙහි තේරුමයි.

**සාවද්‍ය බණක්**

දැන් බුදුන් නැති බැවින් බුඩ පූජා කරතහොත් උන්වහන්සේ වෙනුවෙන් කුසගින්නේ සිටින කෙනකුට ආහාර දීම, අන්ධකාරයේ සිටින කෙනකුට පහන් දල්වා දීම, ඉගෙන ගන්නා කෙනකුට පොත් සපයා දීම යනාදිය බුද්ධ පූජාවෙකැයි කියන කීම ද බුදු බණක් නොව සාවද්‍ය බණකි. දෙවියන් වහන්සේ වෙනුවෙන් දුගීන්ට ආහාර වස්ත්‍රාදිය දියයුතු බව බයිබලයේ කියා තිබේ. **බුදුරජාණන් වහන්සේ** දන් දියයුතු පුද්ගලයන් කොටස් තුදුසකට බෙද වදරා තිබේ. එයින් ප්‍රධාන පංක්තියෙහි සිටින්නේ තථාගතයන් වහන්සේය. අසරණයන් වූ දුශ්ශීලයෝ දහතුන්වෙනි පංක්තියට ඇතුළත් වෙති. බලු කපුටු ආදීහු දහතරවෙනි පංක්තියට ඇතුළත් වෙති. බලු කපුටු දනයට වඩා අසරණ දුශ්ශීල යාචකාදීන්ට දෙන දනය අනුසස් ඇත්තේය. තථාගතයන් වහන්සේට දෙන දනය ඊට වඩා ලක්ෂවාරයෙන් කෝටිවාරයෙන් අනුසස් ඇත්තේය. එබැවින් තථාගතයන් වහන්සේ කොතැනකදීවත් උන්වහන්සේට පුදන්නට යන දෙයක් අසරණයන්ට දෙන්න යයි නො වදළ සේක.

බුදුරජාණන් වහන්සේ ජීවමාන කාලයේ රාජ රාජ මහාමාත්‍යාදීහු ඔවුනොවුන් පරදවා ගංගාවක් ගලන්නාක් මෙන් සිව්පසය තථාගතයන් වහන්සේට පිදූවෝය. ඉතාම දුගී බමුණෙක් වූ **"ඒකසාටක"** බ්‍රාහ්මණ තෙමේ එක් රාත්‍රියකදී ම ඒ තථාගතයන් වහන්සේට වස්ත්‍ර එකසිය විසිතුනක් පිදූවේය. සෙස්සන් කළ පූජා ගැන කියනුම කිම? තථාගතයන් වහන්සේ අසරණයන් කෙරෙහි ඔවුන්ගේ මව්පියන්ටත් වැඩියෙන් කරුණාව ඇති සේක. මහාකාරුණික

Non-commercial distribution

වූ තථාගතයන් වහන්සේ කිසිවක් ගැන ආසාවකුත් නො මැතිව ම අසරණයන්ට නො දෙවා මෙතෙක් පූජා පිළිගත්තේ අසරණ සංග්‍රහයෙන් බුඩ පූජාවෙන් ලැබෙන ආනිසංසයෙන් ලක්ෂයෙන් ඍංගුවකුදු ලැබිය නො හෙන හෙයිනි. **අසරණයන්ට සංග්‍රහ කිරීමත් බෞඩයන් විසින් කළ යුතු මෙහෙයකි**. එහෙත් එය බුඩ පූජාවට සමකොට කල්පනා කිරීම අනුවණ කමකි. ආගම නූගත් අනුශාසකයෝ සාවද්‍ය බණ කියා සැදැහැවතුන්ට කල්ප ලක්ෂ කෝටි ගණනකට වරක් වත් ලබාගැනීමට අමාරු වූ බුඩපූජා කිරීමේ කුශලය ලබා ගන්නට නොදී නැති කරති. බෞඩයන් මේ නූගත් අනුශාසකයන්ට නො රැවටී ලැබිය හැකිව තිබෙන දුර්ලභ කුශලයක් වූ බුඩ පූජා කිරීමේ කුශලය තම තමාට හැකි දෙයකින් බුදුන් පුද ලබා ගැනීමෙන් සගමොක් සැප ලබාගත යුතු.

**ආහාරය නො වටනා දෙයක් ද?**

ආහාරය බුඩපූජාවට නුසුදුසු නො වටනා දෙයක් යයි කියන මිථ්‍යාවාදීන්ගේ කීම ද පිස්සු කතාවකි. ආහාරය නිසා ජීවත් වන්නා වූ සත්ත්වයන්ට ආහාරයට වඩා උතුම් වටිනා අන් වස්තුවක් නැත. ඒ ඒ තැනැත්තාගේ ජීවිතයේ වටිනාකම වැඩි පමණට ඔහුට ආහාරය ද වටිනාකම ඇත්තා වූ දෙයකි. නොයෙක් සම්පත් ඇති දෙවියෝ පවා ආහාරය ම සියල්ලටම උතුම් කොට සලකති.

**අන්නමෙවාභිනන්දන්ති උභයෙ දෙව මානුසා**
**අථ කො නාම සො යක්ඛො යං අන්නං නාභිනන්දති.**

මෙය තථාගතයන් වහන්සේ සමීපයේ එක් දෙවියෙක් කළ ප්‍රකාශයකි. මනුෂ්‍යයෝ ද දෙවියෝ ද යන සියල්ලෝ ම ආහාරයට සතුටු වන්නාහ. කිනම් යකෙක් මේ ආහාරයට සතුටු නොවේ ද යනු එහි තේරුමයි.

**ගජතුරග සහස්‍රං ගොකුලං භූමිදානං**
**කනක රජත වස්ත්‍රං මෙදිනිං සාගරාන්තම්**
**උභයකුල පවිත්‍රං කොටිකන්‍යා ප්‍රධානං**
**නව භවති සමානං හ්‍යන්නදානෙන සර්වම්.**

යනු පණ්ඩිත මතයයි.

Non-commercial distribution

ඇත් අස් ආදීන් දහසක් බැගින් ද එසේ ම ගව මහිසාදීන් ද භූමිදනයන් හා රන් රිදී වස්තූන් ද එසේ ම වස්ත්‍රාභරණයන් ද මහා සමුද්‍රජලය පරදවා දුන්නේ ද එසේ ම උභයකුල පවිත්‍ර කන්‍යාවන් කෙළක් පරිත්‍යාග කෙළේ ද ආහාර දනය හා මේ සියලු පරිත්‍යාග දනයන් සමාන නො වන්නේය යනු භාවයි.

## වැඩිහිටියන් පිදීම

පිදිය යුත්තන් විස්තර කිරීමේදී වැඩිහිටියන් ද එයට ම ඇතුළත් බව යට දක්වන ලදී. **වැඩිහිටියෝ නම්** තමන්ට වඩා ගුණයෙන් හෝ වයසින් හෝ ගුණ වයස දෙකින් ම හෝ වැඩි, ගුරුවර මව්පිය සහෝදර සහෝදරී නෑ මිතුරන් ආදීහුයි.

ඔවුනට වැඳීම ගරු කිරීම දැක හුනස්නෙන් නැගිටීම අසුන් දීම සත්කාර කිරීම ඔවුන්ගේ වචනයට ගරු කිරීම අවනතව පැවතීම ආදිය **වැඩිහිටියන් පිදීම** නම් වේ.

මෙහි ගුණ වයස දෙකින් ගුණය ප්‍රධාන බැවින් වයෝවෘඩයා විසිනුදු ගුණවෘඩයාට පිදිය යුතුය. වැඳිය යුතුය. ඉතා මහලු ගිහියන් විසිනුදු මාපියන් විසිනුදු එදවස්හි ම පැවිදි වූ ළදරු සාමණේරයන් වහන්සේට පවා වැඳිය යුත්තේ පිදිය යුත්තේ එහෙයිනි. ගුණයෙන් සම වූ කල සගමහලු (වැඩිමහලු) පිළිවෙළින් පිදිය යුතුයි.

වැඩිහිටියන් පිදීම දෙලොව දියුණුවට මගෙකි. එහෙයින් මෙලොව පරලොව දියුණුව කැමති හැම දෙනා විසින් ම ඇතිකර ගත යුතු උසස් ගුණධර්ම අතුරෙන් එකකි, වැඩිහිටියන් පිදීම. ඒ බව අප භාග්‍යවතුන් වහන්සේ ද මෙසේ වදළ සේක.

**යෙ වුඩ්ඪ මපචායන්ති - නරා ධම්මස්ස කොවිදා.**
**දිට්ඨෙව ධම්මෙ පාසංසා - සම්පරායෙච සුග්ගති.**

(ජාතකපාළි)

වැඩිහිටියන් පුදන දහමෙහි දක්ෂ වූ යම් මනුෂ්‍ය කෙනෙක් වැඩිහිටියන් පුදත් ද ඔවුහු මෙලොවැ නුවණැතියන්ගේ ප්‍රශංසාවට ද පරලොවැ සුගතියට ද භාජන වෙති.

Non-commercial distribution

වැඩිහිටියන් පිදීම බුඩාදි උත්තමයන් විසින් මෙසේ පසස්නා ලද්දකි. එසේ ම මිනිසුන්ගේ පමණක් නොව දෙවියන්ගේ ද ප්‍රශංසාවට පාත්‍ර වූවකි. ආයර්‍ය සිරිතක් වශයෙන් ලෝකයා අතර පැවැත්විය යුතු උතුම් ගුණධර්ම අතුරෙන් ප්‍රධාන පංක්තියෙහිලා ගිණිය යුත්තකි. එහෙයින්ම නුවණැති සත්පුරුෂයන් අතුරෙහි මේ තාක් නො පිරිහෙලා පවතින්නකි. **පෙර දඹදිවාසීහු** මෙය ඉතා උසස් ගුණ ධර්මයක් ලෙස සැලකූහ. බ්‍රාහ්මණයෝ වැඩියත් උසස් කොට සැලකූහ. ඔවුහු එය කෙතරම් ගරු කළාහු ද යත්? අප බුදුන් වහන්සේ කරා වයසින් වැඩි යම්කිසි බ්‍රාහ්මණාදි කෙනකුන් පැමිණි කල උන් වහන්සේ ඔවුනට අසුන්දීම ගරුකිරීම වැඳීම පිදීම නො කරතියි කරුණු නොදත් කමින් දෙස් පැවරූහ. ඔවුනතර මාපියන් නො පුදන්නන් මැරිය යුතුය යි නියමයෙක් ද විය. එසේ ම අප ලංකා වාසීන් අතරද බුඩාගම හොඳින් පැවති කාලවල ඉතා සැලකිලිමත්ව මේ ගුණධර්මය පැවැත් වූ බැව් පොළොන්නරුවේ විසූ **අග්බෝ** රජතුමා ආදි උත්තමයන්ගේ චරිතවලින් මනාව ස්ඵුට වේ.

**අද සිංහලයන්**

එහෙත් අද සිංහලයන් අතර මේ උතුම් ගුණධර්මය නැත්තටම නැතිවූවාක් මෙන් විරලව පැවතීම සංවේගයට කරුණෙකි. මෙකල බොහෝ අය සාමාන්‍ය වැඩිහිටියනට පිදීම තබා බොහෝ වෙහෙස මහන්සි වී තමන් ඇතිදැඩි කළ අනන්ත ගුණැති මාපියන්ට ගුරුවරුනට පවා නො සලකති. නො සැලකීම පමණක් නොව ඔවුනට අගරු ද කරති. තමන්ගේ දෙලෝ යහපත පිණිස මග පෙන්වන්නා වූ සිල්වත් ගුණවත් ශ්‍රමණයන් වහන්සේලාට පවා අගෞරව කරති. ඇතැමෙක් මේ පරණ මහල්ලෝ කුමක් දනිත්දැයි වැඩි මහල්ලන් තණපත් ගණනටවත් නො සලකා තමන් සියල්ල දත් මහ දැනමුත්තන් මෙන් ඔවුන්ගෙන් ගරු බුහුමන් ලබන්නට ද තැත් කරති. ඇතමෙක් වැඩිහිටියනට ගුණවතුනට කීකරුවීම නින්දවක් මදිකමක් ලෙස සිතති. මෙසේ ඇතැම් අඥයෝ වැඩිහිටියනට අගරුකොට බොහෝ අකුසල් ද රැස් කරති. ඔවුහු ඒ හේතුවෙන් දෙලොවින් ම පිරිහෙති.

**බොහෝ විට අද** මෙවැනි තත්වයකට වැටී සිටින්නෝ යම්තම් ස්වල්පයක් දැනගත් පමණින් මමත් එක්තරා ප්‍රමාණයක

Non-commercial distribution

උගතෙක පණ්ඩිතයෙක යන පුහුමාන්නය ඇති කරවන ඉංග්‍රීසි අධ්‍යාපනය යම්තම් ලැබුවෝ ය. **ඉංග්‍රීසිය කරටගත් බොහෝ දෙනා තුළ, හොඳ සිංහල සිරිත් ගති පැවතුම් දීනකමේ ලකුණු හැටියට සලකන තරක ගතියක් ඇබ්බැහිවී තිබේ**. ඔවුනට එසේ වී තිබෙන්නේ අනිකක් නිසා නොව. එම අධ්‍යාපනය තමන්ගේ හෙවත් පෙරදිග හැම දෙයක් ම පහත් ලෙසටත් බටහිර හැමදෙයක් ම නැතහොත් සුදු මිනිසුන් කී හැම දෙයක් ම උසස් ලෙසටත් උගන්වන පිළිගන්වන එකක් වූ බැවිනි.

මේ හේතුවෙන් **අද විශ්ව විද්‍යාලය** වැනි උසස් ම විද්‍යාපීඨයන්හි පවා උගෙනීම ලබන අපේ තරුණ තරුණියන් අතර පවා ගුරුවරුනට සැලකීම වැඩිහිටියනට සැලකීම මව්පියනට සැලකීම විහිළුවක් බවට පත්ව තිබේ. එහෙත් පෙරදිග ආර්‍ය්‍යධර්මයෙහිත් බුද්ධ ධර්මයෙහිත් එවැනි ගුණයෙන් යුතු ගුරුවර ආදීන්ගේ නම කීම පවා අගෞරවයක් නො සැලකීමක් මදිකමක් ලෙස උගන්වනු ලැබේ.

**මිනිසකු යම් යම් පමණට උගතී ද ඒ ඒ පමණට ඔහු තුළ හොඳ ගති පැවතුම් ඇති විය යුතුය**. පිරුණු කළයෙහි දිය නොසැලෙන්නාක් මෙන් උගෙනීම වැඩි වූ පමණට තමන් නිහතමානී විය යුතුය. ගෙඩි හටගන්නා ගසක එල හටගැන්මෙන් අතු පහතට බරවී බිමට නැමෙන්නාක් මෙන් තමන් තුළ දැනීම වැඩි වන්නට වන්නට නිරහන්කාරකම, විනීතකම ආදි උසස් ගතිගුණ ඇතිවිය යුතුය. යම්තම් ඉංග්‍රීසි ටිකක් කටගාගත් පමණින් තමන්ට වඩා කෙනකු නැති හැටියටත් තමන් සියල්ල දත්තකු හැටියටත් කෙනකු සිතතොත් එය ලොකු ම මුළාවෙකි.

**වැඩිහිටියන් පිදීමෙහි අනුසස්**.

වැඩිහිටියන් පුදන්නා ඔවුන්ගේ අනුකම්පාව ලබයි. සාරවත් උවදෙස් ලබයි. එය ම ඔහුට මෙලොව ධනවත් වීමටත් නැණවත් වීමටත් ගුණවත් වීමටත් හේතු වෙයි. පෙර එක් දුප්පත් මිනිහෙක් වැඩිහිටියකුගේ උවදෙස් ලැබ මී කුණකින් මහා ධන සිටුවරයකු වීමේ පුවතක් **ජාතක පොතෙහි** දැක්වේ. එබඳු සම්පත් වැඩිහිටියන්ගේ උවදෙස් නිසා ලැබූ අය ගැන තොරතුරු පොතපතෙහි කොතෙකුත්

Non-commercial distribution

ඇත. රටතොටින් එමට සපයා ගත හැක. වැඩිහිටියන් ගේ ඇසුරෙන් සම්පත් ලැබීම පමණක් නොව නොයෙකුත් විපත්තීන්ගෙන් මිදුණු අය ගැන ද මෙහිදී සිහිපත් කළ යුතුය.

තව ද වැඩිහිටියන් පුදන්නෝ කිසි ම වියදමක් නො මැතිව ඉතා උසස් පුණ්‍යස්කන්ධයක් ද රැස්කර ගනිති. ඒ ද ඔහුගේ ජීවිතයෙන් ගත යුතුවූ එක්තරා ප්‍රයෝජනයකි. මනුෂ්‍ය ජීවිතය නානා රෝගයනට ආකර වූවකි. අබල දුබල හෙයින් සුළු කාලයක් ම පවත්නා එකකි. එසේ අස්ථිර වූ ජීවිතයෙන් වැඩිහිටියන් පිදීමාදි පින් කමක්වත් කෙරේ නම් එය ඥානවන්ත වූ ක්‍රියාවෙකි. අප බෝසතාණන් වහන්සේ **කෘෂ්ණ** කුමාරව උපන් අත්බැව්හිදී **"බහුරොග සාධාරණ භාවෙන අසාරස්ස කායස්ස සීලවන්තෙසු අභිවාදනාදිකම්මං සාරො"** යනුවෙන් රෝගයනට සාධාරණ වූ හෙයින් අසාර වූ (හරයක් නැති) කයින් ශීලවන්තයන් කෙරෙහි වැඳීම් පිදීම් ආදිය කිරීම කයින් ගත යුතු වූ සාර (හර) යයි මෙනෙහි කළේ එහෙයිනි. වැඩිහිටියන් පිදීමේ පිනින් මෙලොව ම ලැබෙන ආනිසංස ද මෙසේ දැක්විණ:-

**අභිවාදන සීලිස්ස - නිච්චං වුඩාපචායිනො,**
**චත්තාරො ධම්මා වඩ්ඪන්ති - ආයු වණ්ණො සුඛං බලං**

වැඩිහිටියනට වඳින ස්වභාව ම ඇත්තා වූ, නිතර වැඩිහිටියන් පුදන්නාවූ තැනැත්තාහට ආයුසය ශරීරවර්ණය සැපය බලය යන ධර්මයෝ සතරදෙන මෙලොව ම වැඩෙත්, මෙලොව මෙසේ මහත් අනුසස් ලබාදී පරලොව උසස් උත්පත්තියක් ලබාදෙයි. ස්වර්ගමෝක්ෂ සම්පත් සලසා දෙයි. පෙර තිරශ්චීන සත්ත්වයන් පවා වැඩිහිටියන් පුද ස්වර්ගපරායණ වූ බැව් පොතපතෙහි සඳහන් වේ. මේ එය විදහාපාන පැරණි පුවතකි.

(තිත්තිර ජාතකය)

**වැඩිහිටියන් පුද ස්වර්ග පරායණ වූ තිරිසනුන්**

පෙර මහ නුගරුකක් ඇසුරු කොට වටුවෙකුත් වඳුරෙකුත් ඇතෙකුත් මිත්‍රව විසූහ. මෙසේ කලක් මිත්‍ර ධර්මය පවත්වන අතර ඔවුනට මෙබඳු අදහසෙක් විය. එනම්, අපි එකිනෙකා ගැන නො

Non-commercial distribution

සැලකීමෙන් මෙතෙක් කල් විසුවෙමු. අප අතරින් වැඩි මහල්ලා කවරෙක් දැයි දැන ඕහට සලකන්නෙමු නම් ඔහුගේ අවවාදයන්හි පිහිටන්නෙමු නම් එය ඉතා මැනවැ''යි යනුයි.

මෙසේ සිතා දිනක් තිදෙනා එක් ව සාකච්ඡා කොට වටුවාත් වඳුරාත් "මිතුර! නුඹ පැරණි වූ කුමක් දන්නෙහි දැ" යි ඇතාගෙන් ඇසූහ. **ඇතා** කියනුයේ "මිත්‍රවරුනි! මම ළදරු කලැ මේ නුග රුක යටකරගෙන ගියෙමි. එකල මෙහි මුදුන මගේ බඩේ හැපුනේ ය''යි කීය. ඉක්බිති වඳුරා ගෙන් කරුණු විචාළහ. **වඳුරා** "මිතුරෙනි! මම ළදරු වියෙහි බිම හිඳ මේ රුකෙහි මුදුන් දළුව කෑවෙමි''යි කීය. වටුවාගෙන් කරුණු විචාළ කල, **වටුවා**, මිත්‍රයිනි! මේ නුගය රෝපණය කළේ මා ය, මේ ළඟ මහ නුගෙක් විය. මම එහි ගෙඩි කා මෙතැන මල පහ කෙළෙමි. මේ ඉන් ඇති වූ **නුග රුක** යයි කීය.

මේ පුවතින් වටුවා කයින් හැමටම කුඩා වුව ද මහල්ලා බව හෙළි විය. ඉන්පසු වඳුරා සහ ඇතා ද වටුවා ගරු ස්ථානයෙහි තබා පිදූහ. වටුවාගේ අවවාදයෙහි පිහිටියහ. වටුවා ද තෙමේ පන්සිල්හි පිහිටා තම අත වැසියන් ද පන්සිල්හි පිහිට විය. මේ තිදෙනා මෙසේ වැඩිහිටියන් පුද මරණින් මතු ස්වර්ග පරායණ වූහ. මෙසේ මහත් අනුසස් ඇති වැඩිහිටියන් පිදීමෙහි යෙදී දෙලෝ දියුණුව සලසා ගැන්මෙහි උත්සාහ කෙරෙත්වා.

## ආමිස පූජාව හා ප්‍රතිපත්ති පූජාව

පූජාව වනාහි ආමිස පූජාව ය, ප්‍රතිපත්ති පූජාව යයි ද්විවිධ වේ. මල් පහන් ආහාර පානාදි ආමිසයෙන් පිදීම **ආමිස පූජා** නමි. ශීලාදි ගුණ ධර්මයන් පිරීම **ප්‍රතිපත්ති පූජා** නමි. මේ දෙකින් ප්‍රතිපත්ති පූජාව ම බුදුන් වහන්සේ උසස් කොට ද වර්ණනා කොට ද වදාළ සේක. එය ම උන්වහන්සේ ශ්‍රාවක භික්ෂු භික්ෂුණී උපාසක උපාසිකා යන සියල්ලන්ගෙන් ම බලාපොරොත්තු ද වූ සේක. ඒ එසේ මැයිඃ-

**අප බුදුරජාණන් වහන්සේ** පිරිනිවන් පානා රාත්‍රියෙහි කුසිනාරා නුවර මල්ල රජ දරුවන්ගේ උපවත්තන නම් සල්

Non-commercial distribution

උයනෙහි යමක සාල වෘක්ෂයන් අතර පරිනිර්වාණ මඤ්චක-යෙහි සැතපී වදාළ කල්හි, දස දහසක් සක්වළින් දෙවි බඹුන් මේ සක්වළට රැස්ව පොළොවෙහි පටන් බඹලොව දක්වා අතුරු සිදුරු නැතිව සිට, දිව්‍යමය සඳුන් සුණු මල් ආදියෙන් හා කොඩි සේසත්, ආදියෙන්ද නොයෙක් තූර්‍ය්‍ය වාදනයෙන් ද පුදන්නට වූහ. එසේ මහෝත්සාහයෙන් පවත්වන්නා වූ එකී මහත් වූ පූජාව සඳහා තථාගතයන් වහන්සේ ආනන්ද ස්ථවිරයන් වහන්සේට මෙසේ වදාළ සේක.

**"න ඛො ආනන්ද එත්තාවතා තථාගතො සක්කතො වා හොති ගරුකතො වා මානිතො වා පූජිතො වා අපචිතො වා යො ඛො ආනන්ද භික්ඛු වා භික්ඛුනී වා උපාසකො වා උපාසිකා වා ධම්මානු ධම්මං පටිපන්නො විහරති සාමීචි පටිපන්නො අනුධම්මචාරී. සො තථාගතං සක්කරොති ගරු කරොති මානෙති පූජෙති පරමාය පූජාය"**

ආනන්දය! මේ මහත් වූ පූජාවෙන් තථාගත තෙමේ සත්කාර කරන ලද්දේත් නො වන්නේ ය. ගරු කරන ලද්දේත් නො වන්නේය. බුහුමන් කරන ලද්දේත් නො වන්නේය. පූජාකරන ලද්දේත් නො වන්නේය. උපස්ථාන කරන ලද්දේත් නො වන්නේය. ආනන්දය! යම් භික්ෂුවක් හෝ භික්ෂුණියක් හෝ උපාසකයෙක් හෝ උපාසිකාවක් හෝ නවවිධ ලෝකෝත්තර ධර්මයට අනුධර්ම වූ පූර්වභාග ප්‍රතිපත්තියයි කියන ලද ශීල ධූතංග පූරණයට හා භාවනා කිරීමට පැමිණ සිටී ද හෙතෙමේ ම තථාගතයන් වහන්සේට උතුම් වූ පූජාවෙන් පුදන්නේය.

එබැවින් පොහෝ දිනයන්හි බොහෝ වියදම් දරා වෙහෙස මහන්සි ද වී දුර බැහැර වන්දනාවේ ඇවිදින තැනැත්තාට වඩා උතුම් වූ පූජාවක්, එක් ස්ථානයකට වී සිල් සමාදන්ව භාවනා කරන පින්වතා කරන බව නුවණින් සලකා එසේ කිරීමට උත්සාහ කළයුතු.

**ආමිස පූජාව ද කළ යුතුය.**

තව ද මෙම දේශනයෙන් බුදුන් වහන්සේ ආමිස පූජාව ප්‍රතික්ෂේප කළ සේකැයි වරදවා හෝ අතිධාවනය කොට හෝ නො ගත යුතුය. උන්වහන්සේ එයින් පැහැදිලි කර වදාළේ, ආමිස පූජාවට

Non-commercial distribution

වඩා ප්‍රතිපත්ති පූජාව උසස් බවය. එහෙත් ගිහි පැවිදි ඇතැම් අතිපණ්ඩිතයෝ මෙය අතිධාවනය කිරීමෙන් ඇතැම්විට ආමිස පූජාව හෙලා දකිති. බුදුනට ලැබෙන පුද සත්කාර වැළැක්වීම බරපතල වරදක් බව එවැන්නන් විසින් සිහි කටයුතුය.

ශ්‍රද්ධාදි ගුණධර්මයන්ගෙන් හීන වූ බොහෝ දෙන බුදුන් වහන්සේ උදෙසා කරනු ලබන අලංකාර වෙහෙර විහාර ද මහත් පුද සත්කාර (වෙහෙර විහාරයන්හි විසිතුරු ලෙස සැරසීම් පහන් දැල්වීම් විදුලි ආලෝකයෙන් ඒකාලෝක කිරීම් ආදිය) ද ආලෝකවත්ව බබලන වෙහෙර විහාර ද දැක පැහැද බුද්ධාලම්බන ප්‍රීතිය ලැබ භක්තිමත්හු වෙති. සැදැහැවතුන්ගේ ආගම භක්තිය ද දියුණු තියුණු වෙයි. මේ එය විදහා පාන හොඳ නිදසුනෙකි.

**පෙර** මෙම ලක්දිව එක් ගමෙක විසූ කවුරුත් සැදැහැත්තෝය. නිති පන්සිල් ද පොහොය පෙහෙවස් ද රකින්නෝය. එද පුණු පොහෝ දිනයකි. සිරිත් පරිදි ගමේ කවුරුත් වේලාසනින් සිල් නො ගත්තවුනට රෑ බොජුන් පිස තබා, නහා පිරිසිදු වී සුදුවතින් සැරසී, තෙල් මල් දැහැත් ගිලන්පස ආදි සෙසු දෑත් රැගෙන තෙරුවන් පුද බණ ඇසීමට පිටත්ව ගියහ. ගමේ පන්සල පිහිටියේ මඳක් ඈතින් කන්දක් මතය. මඳක් රෑ බෝ වනවිට නන් දෙසින් එහි රැස් වූ සැදැහැත්තන්ගෙන් ආරාමය පිරී ඉතිරී ගියේය. වරින් වර ඇසෙන සණ්ඨාවේ මිහිරි නාදයත් භක්තිමතුන්ගේ සාදු නාදයත් රැව් පිළිරැව් දෙන්නට විය.

**එක් නිවසක** දරුවකු ලැබීමට ළංව සිටි එක් සැදැහැති උපාසිකාවක් වූවාය. කන්ද උඩ පිහිටි සිය ආරාමයේ සණ්ඨාවේ නාදයත් සැදැහැත්තන්ගේ සාදු නාදයත් වරින් වර කන වැටුණු ඈ මෙසේ සිතන්නට විය. දැන් ගමේ හැම දෙන ම පාහේ වන්දනාවට ගිය මුත් මගේ මේ අවාසනාවන්ත තත්වය නිසා මට එහි යා ගත නො හැකි විය. මනුෂ්‍ය ජීවිතයෙහි ඇති දුබලකම කොපමණ ද? මේ සුළු මග ගෙවා අර පෙනෙන ආරාමයට යෑමට මට ශක්තියක් නැත.

එහෙත් මාරයා පැමිණි කල දරු බරින් තබා, එයට වැඩි බරෙකින් යුතුව සිටිය ද, ඒ සියල්ල හැර දමා මරු සමග යා යුතුය.

Non-commercial distribution

මෙසේ සිතන ඈ නො දැන ම ගෙන් මිදුලට බටුවාය. ගෙමිදුලෙහි සිටි ඇගේ දෙනෙත් යොමු වූයේ ඈත කන්ද මත පිහිටි ආරාමය දෙසටය. සුදු වතින් සැරසී එහි එහා මෙහා යනෙන ජනයා ද, ආලෝකවත්ව දැල්වෙන පහන් ද, සඳ රැසින් නැහැවී බබලන සුදෝ සුදු චෛත්‍යරාජයා ද දුටු ඕතොමෝ ප්‍රීතියට පැමිණියා ය. එදෙස බැලූවන ම හුන් ඕතොමෝ සාදු! සාදු! සාදු!!! කියමින් බුදු ගුණ මෙනෙහි කරත් කරත් ම, ඈ තුළ ඇති වූයේ බලවත් ම ප්‍රීතියෙකි. ගත වූයේ ස්වල්ප වේලාවකි. **පුදුමයෙකි!** නො දැනුවත් ව ම ඒ ප්‍රීතිය විසින් ඔසවනු ලැබූ ඈ මොහොතකින් අහසින් එහි සැපත් වූවාය.

**තවද** බුදුන් වහන්සේ උදෙසා තමන් තුළ ඇති වූ බලවත් පැහැදීම - භක්තිය ප්‍රකාශ කිරීමට ඇති එක් ක්‍රමයක් ද වේ, ආමිසයෙන් පිදීම. එහෙයින් එය සැදැහැවතාගේ ආගම භක්තිය මණින තුලා දණ්ඩකැ යි කිව ද වරදෙක් නැති. කරුණු මෙසේ හෙයින් ආමිස පූජාව ද හළ යුතු නොවේ. කළ යුතුය. ප්‍රතිපත්තියෙහි ද යෙදිය යුතුය.

තවද "**යොච උපාසකො යාච උපාසිකා තිසු සරණෙසු පඤ්චසු දසසු සීලෙසු පරිපූරකාරී හොති, මාසස්ස අට්ඨවාරෙ උපොසථෙ කරොති, දනං දෙති, ගන්ධපූජං මාලාපූජං කරොති, මාතරං උපට්ඨාති, පිතරං උපට්ඨාති, කුලෙජෙට්ඨාපචායී හොති, ධම්මිකෙ සමණබ්‍රාහ්මණෙ උපට්ඨාති, බුඬ ධම්ම සංඝ රතනෙසු ගාරවං කරොති, පඤ්ච අධම්ම වණිජ්ජං පහාය ධම්මෙන සමෙන ජීවිකං කප්පෙති, අයං ධම්මානුධම්ම පටිපන්නො නාම**" යනුවෙන් වදළ පරිදි පිරිය යුතු ශීලාදි ගුණධර්ම පිරීම, වැඩිය යුතු බවුන් වැඩීම ධර්මානු ධර්ම ප්‍රතිපත්තිය වන්නාක් මෙන් ම සෙසු දන් දීම් මල් පහන් පිදීම් ආදි කළයුතු යහපත් ක්‍රියා සියල්ලක් ම එයට ම ඇතුළත් බව ද සැලකිය යුතුය. කරුණු මෙසේ හෙයින් බෞඩයකු විසින් කළ යුතු වූ සියලු ම යහපත් ක්‍රියා කිරීම ප්‍රතිපත්ති පූජාව ම බැව් කිව යුතුය.

## වෙසක් සැරසිලි

බුදුන් වහන්සේ උදෙසා තමන්ගේ භක්තිය ගෞරවය පුද කිරීමට සැපයෙන විදුලි තොරන් ආදි වෙසක් සැරසිලි ගැන ද මෙහි

Non-commercial distribution

දී වචනයක් කිව යුතුය. බෞඩයකු වශයෙන් උන්වහන්සේ සිහිපත් කිරීම පිණිස උන්වහන්සේට ගරු කිරීම පිණිස හැකි පමණින් එම ක්‍රියාව හොඳින් ඉටු කිරීමෙහි වරදක් නැත. ඒ ඒ නගරවල යම්යම් සමිති සමාගම් මගින් හෝ වෙළඳ ව්‍යාපාරාදිය පවත්වනු ලබන වෙනත් ආයතන මගින් හෝ තැනින් තැන විසිතුරු ලෙස නංවනු ලබන, ආගමික කරුණු රැසක් විදහා පෙන්වන කලාත්මක වටිනාකමක් ද ඇති එවැනි විශාල තොරණින් ද උගත් නූගත් බාල මහලු ලොකු-කුඩා නොයෙක් තරාතිරමේ පොදු බෞඩ ජනයාට ආගමික හැඟීම් රැසක් මතු කර පෙන්වනු ලබන හෙයින්, එය ඔවුන් තුළ අමුතු ප්‍රබෝධයක් ඇති කිරීමෙහි ලා බණකට දහමකට නො දෙවෙනි බැව් කිව හැකිය.

**මිනිසාගේ සිත** ඇසූ දෙයට වඩා දුටු දෙය කෙරෙහි තදින් බලපෑම ස්වාභාවික හෙයිනි. පෙර මේ රටේ පැරණි විහාරයන්හි දිව්‍ය ලෝක විස්තර, අපාය විස්තර, නොයෙකුත් ජාතක කතා, චරිත කතා ආදි ආදර්ශවත් බිතුසිතුවම් වලින් භිත්ති මොනවට සරසා තිබුණේ, මෙකල මෙන් එකල මිනිසුන්ට විනෝද වීමට දේවල් නැතිකමේ පාඩුව පිරිමසාලීමට යයි නොසිතිය යුතුය. එවැනි ආගමික සිද්ධීන් නිතර දැක්මෙන් ඒවා සිත්හි ඇඳී බැඳී පැවැත්ම නිසා ඔවුන් තුළ අනායාශයෙන් ම බලවත් ආගමික හැඟීම් රැසක් බල පැවැත්වීමට එය ප්‍රබල හේතුවක් වූ බැවිනි.

ඒ ආගමික හැඟීම් අනුව ඔහුගේ එදිනෙදා ජීවිතය ද හැඩ ගැසුනේ ඔහු නො දැනුවත්වමය. එහෙයින් අපේ පැරණි බෞඩයා තුළ ඒ අනුව පවට බියත් ලජ්ජාවත් පිනට ලැදියාවත් ඇති විය. එහෙයින් ම ඔහු නමින් පමණක් නොව කමින් ද නියම බෞඩයෙක් විය. පරහිත නිරතයෙක් විය. දිවි යතත් අනුන්ට විපතක් නො කරන උපාසකයෙක් විය.

මෙකල සමාජයෙහි නිතර දක්නට ලැබෙන්නේ මිනිසුන්ගේ විළිබිය නසන අසභ්‍ය චිත්‍රපට ආදි මිනිසුන්ගේ චරිත දූෂණයට හේතු වූ දේය. මිනිසා නො මඟ යවන දේය. පාප ධර්මයන් අවුස්සන කුප්පන දැය. එහෙයින් එවැනි සමාජයකට යටකී පරිදි හිතකර යම් යම් දර්ශන ද ඉඳ හිටලාවත් දැක්මට සැලැස්වීම හැදෙන වැඩෙන

Non-commercial distribution

පරපුර යහ මගට හැරවීමට ප්‍රබල හේතුවක් වනු නො අනුමානය. කරුණු මෙසේ හෙයින් අපේ ඇතැම් අති පණ්ඩිතයන් කොතරම් මොර ගෑවත් වටිනා තොරණින් පොදු ජනයාට යහපතක් මිස අයහපතක් කිසිසේත් නො වනු ඇත.

**තොරණ ඉදිකරවන්නවුනටද වචනයක්**

තොරණ ඉදිකරවන්නවුනටද මෙහිලා කිවයුතු වැදගත් කරුණක් ඇත. එනම් මෙකල බොහෝ දෙනකුන් විසින් ඉදිකරවනු ලබන තොරණින් යට කී පරිදි ආගමික හැඟීමක් චරිතවර්ධනයට රුකුලක් ඇති විය හැකිද? යන්න සැක සහිත බවය. එයට හේතුව මෙකල බොහෝ විට තොරණ ඉදිකරවනු ලබන අය නූගත් යම්යම් අය වීමය. එවැනි අය බොහෝ විට එය කරවනු ලබන්නේ ද බුදුන් වහන්සේට කරනු ලබන ගෞරවයක් වශයෙන්වත් දිනයෙහි ඇති වටිනාකම සලකාවත් එයින් පොදු ජනයාට යහපතක් කරන අදහසින්වත් නොව, එවැනි දිනයක නගරයට වැඩි වැඩියෙන් ජනයා ඇද්දවීමෙන් තමන්ට විශාල ලාභයක් ලැබේය යන හැඟීම උඩ බැව් පෙනේ.

එහෙයින් බොහෝවිට එවැනි අය විසින් කරවනු ලබන තොරණ ද චරිතවර්ධනයට හේතුවන ආගමික හැඟීම් හොඳ සිතිවිලි උපදවන යම්කිසි වටිනා ආදර්ශයක් මූර්තිමත් වන සේ කලාත්මකවූත් ආගමිකවූත් හැඟීම්ලින් තොරව කරවන බව පෙනේ. එවැන්නන් විසින් එයට තෝරාගනු ලබන කථාවස්තු, චරිතය, මිනිසුන් තුළ යටවී සැඟවී ඇති පාපධර්ම පවා අවුස්සවන කුප්පවන අන්දමේ ඒවා බැව් සිතිය හැක. එවැනි රාගනිඃශ්‍රිත හැඟීම්වලින් පිරුණු කාමකෝපනය කරවන තොරණසාමාන්‍ය මිනිසාට වඩාත් ප්‍රියජනක වීම එසේ කිරීමට තවත් හේතුවකි.

**පුහුදුන් මිනිසාට** එවැනි දේ ප්‍රියවීම ස්වාභාවික දෙයකි. ඌරා මඩවළෙහි ලැගීමට මෙන් ම බල්ලා අළු ගොඩෙහි ලැගීමට කැමැත්තාක් මෙන් සසර පුරුදු පුහුණුවී ආ පරිදි මිනිසා ද එවැනි කාමුක දෙයට ම වඩාලාත් ඇලෙයි. මිනිසුන්ගේ රුචිය අවියක් කොට වැඩියෙන් මහජනකායක් ඇද්දවීමේ අදහසින් එවැනි නොමනා චරිත නිරූපණය කොට තොරණ නැංවීමෙන් නම්

Non-commercial distribution

කිසිම යහපතක් සිදු නොවනු ඇත. කරුණු මෙසේ හෙයින් ඉහත සඳහන් පරිදි තොරණින් පොදුජනයාට විශාල යහපතක් සිදු කළ හැක්කේ, එය හොඳ අදහසින් එයට උචිත වන ලෙසට සකස් කිරීමෙන් පමණක් බැව් ද මෙහි ලා සිහිපත් කළ යුතුය.

## විහාරස්ථාන හා සැරසිලි

මෙහිලා කිවයුතු තවත් කරුණෙක් ඇත. අපේ ඇතැම් බෞද්ධයන්-වැඩි වශයෙන් පිටිසරබද බෞද්ධයන් මේ කරුණෙහිලා මදක් නොමග යන බැව් පෙනේ. ඔවුහු තුනුරුවන් පවත්නා වඳින පුදන ආගමික මධ්‍යස්ථානය වූ අසළ පිහිටි තම විහාරස්ථානය හා විහාරස්ථානයට යන මාර්ගයක් වෙතොත් එය කිසි ම සැරසීමකින් අලංකාර නොකොට, විහාරස්ථානයෙහි දිනයට සරිලන සේ ප්‍රමාණවත් ආලෝකයක් ඇති නො කොට, විහාරස්ථාන පාළුවට හැර අඳුරේ තබා, තමන් වසන තැන තම නිවස මහ මග මොනවට සරසති. විදුලි ආලෝකයෙන් ඒකාලෝක කරති.

**බුදුන් වහන්සේ වැඩ සිටින** ගමේ මධ්‍යස්ථානය වූ විහාරස්ථානයට එවැනි දිනයක පැමිණෙන ජනයාගේ සංඛ්‍යාව ද විශාලය. එබැවින් එවැනි දිනයක **ගමේ-පන්සල** ස්වකීය ආරාමය යථාතත්වයෙන් මැනවින් තබා නොගත හොත් එයින් ලැබෙන අපවාදය ලැබෙන්නේ එම පන්සලේ දායක පිරිසටය. එය මැනවින් පැවතියත් එහි ගරුත්වය ලැබෙන්නේ ද ඒ දායක පිරිසටමය.

එහෙයින් විහාරස්ථාන පාළුවට හැර අඳුරේ තබා තමන් වසන තැන තම නිවස කොතරම් හොඳට සැරසිලි කළත්, විදුලි ආලෝකයෙන් සුරලොවින් මිහිබට දෙව්විමනක් මෙන් ආලෝකවත් කළත්, එය තම නිවස සැරසීමක් විනා බුදුන්වහන්සේ උදෙසා කරන පූජාවක් ලෙස සිතීම උගහටය. එහෙයින් පළමු කොට තම තමන්ගේ විහාරස්ථාන යථා තත්ත්වයෙන් තබා දෙවනුව තම නිවස ද එවැනි තත්වයකින් තැබීමට සිතතොත් එය නියම බෞද්ධකමෙකි. නියම බුදුන් පිදීමෙකි. එහෙත් අද තිබෙන තත්ත්වය මෙයට වඩා ඉඳුරාම වෙනස් වූවක් බව විශේෂයෙන් සිහිපත් කළ යුතුය.

Non-commercial distribution

# 2 වන ගාථාව

**පතිරූප දෙස වාසො ච - පුබ්බෙ ච කතපුඤ්ඤතා**
**අත්තසම්මා පණිධි ච - එතං මංගලමුත්තමං.**

**පතිරූපදෙස වාසො ච** - සුදුසු ප්‍රදේශයන්හි වාසය කිරීම ද, **පුබ්බෙ** - පෙර, **කතපුඤ්ඤතා ච** - කරන ලද පින් ඇති බවද, **අත්තසම්මා පණිධි ච** - ප්‍රාණඝාතාදි පාප ක්‍රියාවන්හි නොයෙදී ආත්මය (ජීවිතය) මනා කොට තබා ගැන්ම ද යන, **එතං** - මේ කරුණු තුන, **උත්තමං මංගලං** - උතුම් මගුලි.

මේ වනාහි මංගලධර්ම වදළ දෙවන ගාථාව හා එහි පදර්ථයි. මේ ගයින් ද අප බුදුන් වහන්සේ දෙලෝ දියුණුව පිණිස පවත්නා උතුම් මංගල ධර්ම තුනක් වදළහ.

ඒ මෙසේය:-

1. **සුදුසු ප්‍රදේශයන්හි වාසය කිරීම.**
2. **පෙර කරන ලද පින් ඇති බව.**
3. **තමා මනා කොට තබා ගැනීම** - යනුයි.

Non-commercial distribution

## 4. සුදුසු ප්‍රදේශයන්හි වාසය කිරීම.

මිනිසා ආශ්‍රය හේතුකොට ගෙන වෙනස් වන්නාක් මෙන්ම, වාසය කරන ප්‍රදේශය හේතුකොට ගෙන ද වෙනස් වේ. වාසය කරන පෙදෙසෙහි පවත්නා හොඳ වූ හෝ නරක වූ හෝ සිරිත් විරිත් ගති පැවතුම් ආදිය මිනිසා තුළ අනායාශයෙන්ම ඇතිවීම ස්වභාව හෙයිනි.

එබැවින් ලෝකයෙහි ඇත්තා වූ සියලු ප්‍රදේශයෝ ම වාසයට සුදුසු නොවෙති. මිථ්‍යාදෘෂ්ටීන්ගෙන් ගහණ වූ ඔවුන්ගේ බලය පවත්නා වූ ප්‍රදේශයෝ වනාහි එහි වාසය කරන්නා වූ පින් කැමති සම්‍යග්දෘෂ්ටිකයා හට පවා පින් කරගැන්මට ඉඩ ඇත්තා වූ පෙදෙස් නො වෙති. එබඳු පෙදෙස්වල වසන තැනැත්තා වනාහි දශකුශල ධර්මයෙන් පිරිහී දශ අකුශල ධර්මයන්ගෙන් වැඩෙන්නා වූ කෙනෙක් වේ. එබැවින් එබඳු පෙදෙස් වාසය නො කොට අත්හළ යුතු ප්‍රදේශයෝය.

**යම් පෙදෙසක** ශ්‍රමණ ප්‍රතිපත්තීන් පසෙක තබා නිතර නඩුහබ කියන්නා වූ, නැකැත් කියන්නා වූ, වෙදකම් කරන්නා වූ, කට්ටඩිකම් කරන්නා වූ ශ්‍රමණ වේශධාරීහු වෙසෙත් ද, තමා පහත් තන්හි තබා ගිහියන්ගේ සිත්ගැනීම පිණිස ගිහියන් උසස් කොට කථාකරන්නා වූ ද සභාමධ්‍යයෙහිදී (තැම්බූ මුංවල නො පැසුණු මුං මඳව ඇත්තාක් මෙන්) සැබෑ මඳව බොරු වැඩිකොට මුව නොපොහොනා පමණට ගිහියන්ට ස්තුති කිරීම ආදි නොමනා දේවල් කරන්නා වූ ද, ගින්නට නොබා ඉදිරිපත්වන පළහැටියා මෙන් ලාභයක් ලැබෙතොත් ඕනෑම ගුණවතකු ගේ ගුණ අකාමකා කථා කිරීම, තමන්ගේ නැති ගුණ පෙන්නා කථා කිරීම ආදි කොතරම් ලාමක දෙයක් වුව ද කිරීමට, පවට නොබා ඉදිරිපත්වන

Non-commercial distribution

විළිබිය නැති ලාමක අදහස් ඇති භික්ෂු නාමධාරීහු වෙසෙත් ද එවැනි ප්‍රදේශයෝ ද වාසයට නුසුදුසුයහ.

**යම් පෙදෙසක** සිල්වත් ගුණවත් සැබෑ භික්ෂූන් වහන්සේලා වෙසෙත්ද, රත්නත්‍රයෙහි ප්‍රසන්නවූ දන ශීලාදි පුණ්‍ය ක්‍රියාවන්හි නිතර යෙදෙන්නා වූ උපාසක උපාසිකාවෝ වෙසෙත්ද, බුද්ධ ධර්මය නිර්මලව බබලා ද ඒ ප්‍රදේශය වාසයට සුදුසු පෙදෙසෙකි. එබඳු ප්‍රදේශයන්හි වාසය කරන්නවුනට **සත්පුරුෂසේවනය, සධර්ම ශ්‍රවණාදිය** නිතර ලැබෙන බැවින් බොහෝ පින් සිදු කර ගත හැකි වේ.

එබඳු ප්‍රදේශයන්හි වාසය කරන කල්හි ඇතැම්විට සතුන් මැරීම් ආදිය කරන පාපකාරීහු පවා සත්පුරුෂ සේවනාදිය ලැබ යහපත් මිනිසුන් වී, දනාදි බොහෝ පින්කම් කොට දෙව්ලොවට පැමිණෙති. ඇතැම්විට උපතින්ම මිසදිටු ගත්තෝ පවා ඔවුන්ගේ දෘෂ්ටි හැර පින්කම් කොට දෙව්ලොවට පැමිණෙති.

තවද **කිච්ඡො මනුස්ස පටිලාභො** යනුවෙන් වදළ පරිදි ලොවැ මිනිසත් බව ලැබීම කණ කැසබුවා විය සිදුරෙන් අහස දැකීමට ද වඩා දුෂ්කර කරුණෙකි. මිනිසුන් අතර ද උපන් මිනිසකු වීම වඩාත් දුෂ්කරය, දුර්ලභය.

**උපන් මිනිසා** නම්:- නරක තිරිසන් ප්‍රේත යන අපාය තුන ද, අරූපලෝක සතර හා අසංඥතලය ද ප්‍රත්‍යයන්ත දේශය ද ඇස කන නාසය දිව කය යන පසිඳුරන්ගේ විකල බව ද, දරුණු වූ මිථ්‍යා දෘෂ්ටිය ද, අබුඩොත්පාද කාලය ද යන මේ අෂ්ට දුෂ්ටක්ෂණයෙන් මිදී **නවවන ක්ෂණ සම්පත්තිය** (පින් කිරීමට අවකාශ ඇති ආත්මය) ලැබූ නුවණැති මිනිසායි.

**මෙසේ පරම දුර්ලභ** වූ ඒ උපන් මිනිසකු වූ පින්වතා මේ මිහිපිට සිටින උසස් ම පින්වතෙකි. ඔහු ලබාගත් වටිනාකම පමණ කළ නො හැකි ඒ වටිනා මනුෂ්‍ය ජීවිතය, කවර ලෙසකින් හෝ යමක් කමක් සපයා අඹුදරුවන් රකිමින් කමින් බොමින් ප්‍රීති වෙමින් සිටීමට කැපකොට හිස් එකක් කරගැන්ම වූ කලී පරම අනුවණ කමෙකි. ඒ ටික නුවණ නැති තිරිසනා වුව

Non-commercial distribution

ද කරන බැවිනි. "**මිනිසා**" යන වචනයෙහි අදහස ම උසස් සිතක් ඇති තැනැත්තා යනුයි. එසේ දියුණු වූ මිනිසා තුළ නො දියුණු තිරිසනාට වැඩි විශේෂ දියුණුවක් ගුණදහමක් ගුණවැඩීමක් තිබිය යුතුමය. **ගුණ දහමෙන් තොර වූ ජීවිතය සුවඳ නැති කැල මල මෙන් කිසිදු වටිනා කමක් නැති එකකි. ලුණු නැති හොද්ද මෙන් නීරස එකකි.**

එබැවින් තම තමා ලත් මනුෂ්‍ය ජීවිතය සඵල වූවක් කර ගැන්මට නම් අකුශලයෙන් මිදී කුශලයෙහි යෙදිය යුතුය. දුසිරිතින් තොරව සුසිරිතෙහි යෙදිය යුතුය. අදමින් වෙන්ව දැහැමින් දිවි පැවැත්විය යුතුය. එවිට තමා දුකසේ ලද මනුෂ්‍යත්ත්වයෙන් ලැබිය යුතු උසස් ම ප්‍රතිඵලය ලබා ගත්තෙක් වන්නේය. දෙලොවට වැඩදයී කුශල් කළ හැක්කේ තමා ලබා සිටින උතුම් මනුෂ්‍ය ජීවිතය නිසා ම බව විශේෂයෙන් සිහිපත් කළ යුතුය. යට කී නරකය ආදි අෂ්ට දුෂ්ටක්ෂණයෙන් එකකුදු ලබා සිටින තැනැත්තාට නිසිලෙසට පිනක් දහමක් නො කළ හැකි බව සැලකිය යුතුය.

මනුෂ්‍යත්ත්වයෙහි ඇති වටිනාකම පිළිබඳව අවබෝධ වීමට "**සද්ධම්මෝපායන**" යෙන් ගෙන හැර දක්වන මෙම වටිනා ගාථා පංක්තිය ද උද්ග්‍රහණය කිරීම මැනවි. අදහස "**සිංහල සද්ධම්මෝපායන**" යෙනි.

**"අට්ඨක්ඛණ විනිම්මුත්තං-ඛණං පරමදුල්ලභං,**
**උපලබ්ධෙන කත්තබ්බං-පුඤ්ඤං පඤ්ඤවතා සද.**

නොකල් අටින් වෙන් වූ-එහෙයින් ම ඉතා දුර්ලභ වූ යහපත් කාලසම්පත්තිය ලැබූ නුවණැත්තහු විසින් සියලු කල්හි පින් දහම් කට යුතුයි.

**තයො අපායා ආරුප්පා සඤ්ඤං පච්චන්තිමං පි ච,**
**පඤ්චින්ද්‍රියානං වෙකල්ලං මිච්ඡාදිට්ඨි ච දරුණා**
**අපාතුභාවො බුද්ධස්ස- සද්ධම්මාමත දයිනො,**
**අට්ඨක්ඛණා අසමයා-ඉති එතෙ පකාසිතා.**

නරක තිරිසන් ප්‍රේත යන අපාය තුනය - අරූප අසංඥ ලෝකයය - ඉතා පිටිසර ප්‍රදේශයය - පසිඳුරන්ගේ විකල බවය-

Non-commercial distribution

මිසදිටු ගැන්මය - බුදුකෙනකුගේ නො පහළ වීමය යන මොහු **නොකල් අට** යි දන්නා ලදහ.

**කාරෙන්තො කම්මකරණං-නිරයෙ අතිදරුණං,**
**භයානකං භුසං ඝොරං-කථං පුඤ්ඤං කරිස්සති**

නිරයෙහි උපන් සත්ත්ව තෙම තෙමේ ම තමහට නන් වැදෑරුම් බිය උපදවන - ඝෝර කර්කෂ කම් කටොල් කරවමින් වෙසෙයි. **එබඳු නිරිසත්තෙම කෙසේ පින් කරන්නේද?**

**සද්ධම්ම සඤ්ඤා රහිතෙ-සද උබ්බිග්ග ජීවිතෙ,**
**තිරච්ඡාන භවෙ සත්තො- කථං පුඤ්ඤං කරිස්සති.**

තිරිසන් ගතියෙහි උපන් සත්ත්වතෙම ලෝකයෙහි ධර්‍මය ඇත ද, "මේ ධර්මය" යන සංඥවකුදු නැතිව නිතරම බියෙන් ඇලළී ගිය දිවි පෙවෙතක් ඇතිව වෙසෙයි. **එබඳු තිරිසන් සත්ත්වතෙම කෙසේ පින් කරන්නේද?**

**ගන්ත්වාන පෙත්ති විසයං -**
**සන්තාප පරිසොසිතො,**
**ඛුප්පිපාසා පරිස්සන්තො -**
**කථං පුඤ්ඤං කරිස්සති.**

**ප්‍රේත ලෝකයෙහි** උපන් සත්ත්වතෙමේ නොනිවෙන නො නැසෙන ගින්නෙන් හා ශෝකයෙන් වියළුණු ගතසිත ඇත්තේ සා පිපාසා දුකින් මිරිකී වෙසෙයි. එසේ වූ හෙතෙම කෙසේ පින් කරන්නේ ද?

**ආරුප්පා සඤ්ඤ ලොකෙ පි**
**සවණොපාය වජ්ජිතො,**
**සද්ධම්ම සවණා හීනො**
**කථං පුඤ්ඤං කරිස්සති.**

**අරූප අසංඥ බ්‍රහ්මලෝකවල** උපන් සත්ත්වතෙමේ තමහට කන් නැති හෙයින් ඇසීමෙහි උපායය නැත්තේ බණ ඇසීමෙන් තොරව වෙසෙයි. **අසන බණක් නැති හෙතෙම කෙසේ පින් කරන්නේ ද?**

Non-commercial distribution

**අච්චන්තා ධම්ම බහුලෙ**
**මුනින්ද සුත වජ්ජිතෙ.**
**පච්චන්ත විසයෙ ජාතො**
**කථං පුඤ්ඤං කරිස්සති.**

**ඉතා පිටිසර ප්‍රදේශයන්හි** බුදුරජාණන් වහන්සේගේ ශ්‍රාවකයෝ නො වැඩ වෙසෙත්. එසේ වූ ඒ ප්‍රදේශයෝ අධර්ම් අපරාධ බොහෝකොට ඇත්තෝ වෙත්. එ බඳු ප්‍රදේශයෙක්හි උපන් මනුෂ්‍යතෙම කෙසේ පින් කරන්නේ ද?

**ජළො මූගාදිකො වා පි**
**විපාකා වරණෙ ඨිතො.**
**ගහණොපාය රහිතො**
**කථං පුඤ්ඤං කරිස්සති.**

දන්නා කෙනකුන් කියන ද් අසා දරා ගන්නා පමණටවත් නුවණ නැතිව - ජඩව - ගොළුව - බිහිරිව - අන්ධව - කොරව පෙර කළ **අකුසල්හි විපාකයෙන් යටවී සිටින මිනිස් තෙම** කෙසේ පින් කරන්නේ ද?

**පක්ඛන්තො පාපිකං දිට්ඨිං**
**සබ්බථා අනිවත්තියං.**
**සංසාර බානුභූතො හි**
**කථං පුඤ්ඤං කරිස්සති.**

කිසි ලෙසකින් නැවැත්විය නොහැකි **පව්වූ මිසදිටු බවට පත් මිනිස්තෙම** සසර පිළිබඳ නො සැලෙන කණුවක් වූයේ කෙසේ පින් කරන්නේද?

**බුද්ධාදිච්චෙ අනුදිතේ**
**සිද්ධි මග්ගා ව භාසකෙ.**
**මොහන්ධකාරෙ වත්තන්තෙ**
**කථං පුඤ්ඤං කරිස්සති.**

නිවන්මඟ හෙළි කරන සූර්‍ය්‍යයා නම් බුදුරජාණන් වහන්සේ යි. **ඒ බුද්ධ සූර්‍ය්‍යයා නොමැති කාලය තෙම** මෝහාන්ධකාරයෙහි ගැලෙයි. එබඳු කාලයෙක්හි උපන් සත්ත්ව තෙමේ කෙසේ පින් කරන්නේ ද?

Non-commercial distribution

**යං භාවනාමයං පුඤ්ඤං**
**සච්චාහි සමයා වහං,**
**තස්ස නොකාස භාවෙන**
**එතෙ අක්ඛණ සම්මතා**

මෙකී ස්ථානයන්හි-කාලයන්හි උපන් සත්ත්වයන්ට චතුස්සත්‍ය පිළිබඳ සම්පූර්ණ අවබෝධය ගෙනදෙන සමථ විපස්සනා භාවනාදි පින්දහම් කිරීමට අවකාශ නො ලැබෙන හෙයින් මොහු නො කල් වෙත්.

**අට්ඨක්ඛණ විනිම්මුත්තො -**
**ඛණො පරම දුල්ලභො.**
**තං ලද්ධා කො පමජ්ජෙය්‍ය -**
**සබ්බ සම්පත්ති සාධකං.**

**මෙ කියන ලද නො කල් අටින් වෙන් වූ නව වැනි වූ ක්ෂණ සම්පත්තිය ඉතා දුර්ලභය. දෙලෝ වැඩ සලසන ඒ ක්ෂණ සම්පත්තිය ලැබුවා වූ කවර නම් මිනිසෙක් පින්දහම් කිරීමෙහි ප්‍රමාද වන්නේ ද?**

**මේ කුඩා රට.**

මෙසේ වර්ණනා කරන ලද ඒ දුර්ලභ ක්ෂණ සම්පත්තිය ලැබූ **මෙම ලක්දිව** වසන සැම පින්වත්හු ම, අප වාසය කරන, පුරාණයෙහි **"ධම්මද්වීපය"** කැයි ලබන ලද අර්ථාන්විත මාහැඟි නාමයකින් හා අපරදිග පඩුවන් විසින් ඉන්දීය සාගරයෙහි **"මුතු ඇටය"** යන අපර නාමයකින් ද හඳුන්වනු ලබන **"රමණීය අපේ මේ කුඩාරට"** බුදුන්වහන්සේ වදාළ පරිදි පින් දහම් කර ගැන්මට ඕනෑ කරන සියලු අංගෝපාංගයන්ගෙන් පරිපූර්ණ වූ වාසනාවන්ත ප්‍රදේශයකැයි දැන තුටුපහටු විය යුත්තාහ.

**බුදුන් වහන්සේ** දඹදිව ඉපිද එහි ම බුදුවුව ද, මෙම කුඩා මනරම් දිවයිනට තෙවරක් ම වැඩම කළහ. ද්වීපචක්‍රවර්ති ධර්මාශෝක මහරජාණන්ගේ ඖරසපුත්‍ර අනුබුඩ **මහාමහේන්ද්‍ර මහරහතන්වහන්සේ** වැඩම කොට බුදුසසුන් පිහිටුවාලූහ. බුදුන් වහන්සේ ගේ ශ්‍රී දේහය පිළිබඳ වූ කේසධාතුව, ලලාටධාතුව, ග්‍රීවාධාතුව, ඌර්ණරෝමධාතුව, දළඳ, අකුදු ආදි **සප්තමහාධාතූන්ගෙන්**

Non-commercial distribution

වැඩි කොටසක් මෙහි ම තැන්පත්වූහ. උණුවී කැටිවී ගිය **කුඩා ධාතුන් ගෙන්** වැඩි ප්‍රමාණයක් ද මෙහි ම නිදන්ගත වූහ. උන් වහන්සේ පරිභෝග කළ පටිධාතුව, පාත්‍රධාතුව, ඩබරාව, මිණිපළඟ ආදි **පාරිභෝගික** වස්තූන් රැසක් ද, ලෝකයෙහි ම පුරාණතම වෘක්ෂය හැටියට සැලකිය හැකි තවමත් ජීවමානව වැජඹෙන **ජයශ්‍රී මහාබෝධි ශාඛාව ද** මෙහි ම පිහිටියහ. උන්වහන්සේ ගේ ශ්‍රීපාදස්පර්ශයෙන් පවිත්‍ර වූ **සොළොස් මහාස්ථානයන්ගෙන්** ද පරිපූර්ණය. උන්වහන්සේ උදෙසා කළ තවත් බොහෝ අලංකාර වෙහෙර විහාරයන්ගෙන් ද ලක්බිම පොහොසත්ය. මෙසේ බලන කල ලක්දිව **එකම ධාතුමන්දිරයක් එකම බුදු ගෙයක්** ලෙස කිය යුතුය. කෙතරම් විශාල ලෙස විය පැහැදම් කළත් භක්තිය ඇතත් බුරුමය ආදි සෙසු බෞඩ රටවලට එම භාග්‍යය හිමිවී නැත.

උන්වහන්සේ ගේ **සුවාසූ දහසක් ධර්මස්කන්ධය** නො නැසෙන පරිදි සංගායනා කොට ග්‍රන්ථාරූඪ කරන ලද්දේද සිංහල ද්වීපයෙහි ම ය. එමෙන් ම සිංහල දත් සැදැහැති බෞඩයකුට වුවමනා නම් සෑහෙන ධර්මඥානයක් ලබා ගත හැකිසේ හෙළබසින් ලියැවුණු **පොතපත ද** සුලභය. ධර්මය දත්, ධර්මය උගන්වන, ධර්මදේශනා කරන, ධර්මය අනුව පිළිපදින සිල්වත් ගුණවත් භික්ෂූන් වහන්සේගෙන් ද හිඟයක් නැත. මේ ආදි කරුණු අනුව සලකන කල මේ කාලයෙහි මිනිසකු වශයෙන් ඉපදීමට මේ මිහිපිට මෙයට වඩා සුදුසු අන් තැනක් නැතැයි කිව යුතුය. ඒ බව දැන **"ඒ දුර්ලභ ප්‍රදේශ සම්පත්තිය"** අපි අනායාශයෙන් ම ලබා සිටිමු. එය සාර්ථක කරගැනීම අප අයත් එක ම පරමාර්ථය විය යුතු ය යි සිතා ඒ පිණිස උත්සාහ කළ යුතු.

Non-commercial distribution

# 5. පෙර කරන ලද පින් ඇති බව

**පින්** යනු දන ශීලාදි යහපත් ක්‍රියාවන් සිදුකිරීම් වශයෙන් ඇතිවන්නා වූ, ලෝභ ද්වේෂ මෝහාදි අකුසලයන්ගෙන් වෙන් වූ, යහපත් චේතනාවන්ට නමෙකි. එම යහපත් චේතනාවෝ සත්ත්වයන් ගේ චිත්තසන්තානය පවිත්‍ර කෙරෙත්නු යි පින් යන නාමය ලබති. සත්ත්වයන් ගේ **චිත්තසන්තානය වූ කලී** ස්වභාවයෙන් - ප්‍රකෘතියෙන් පිරිසිදුය, දීප්තිමත් ය. එහෙත් ආගන්තුක වූ ලෝභාදි ක්ලේශ ධර්මයන් නිසා අපිරිසිදු වී පවත්නේ ය. එහෙයින් වදළහ.

**"පභස්සරමිදං භික්ඛවෙ චිත්තං. තං ච ඛො**
**ආගන්තුකෙහි උපක්කිලෙසෙහි උපක්කිලිට්ඨං"**

අපිරිසිදු සිත අපිරිසිදු ජලය වැනිය. අපිරිසිදු වූ ජලයෙන් මුවදෙවීම් ආදි ප්‍රයෝජනයක් ගත නො හැකි වාක් මෙන්, අපිරිසිදු වූ සිතින් ද ප්‍රයෝජනයක් - වැඩක් ගත නොහැක. අපිරිසිදු වූ සිත යහපත් ක්‍රියාවක නො යෙදිය හැක. බොර දියෙහි වූ දූවිලි ආදිය යටට බැස්ස කල හෝ සම්පූර්ණයෙන් ම ඉවත් වූ කල ජලයෙන් ප්‍රයෝජන ගත හැකිවාක් මෙන් ම සිතෙහි වූ ලෝභාදි දූවිලි තදංග විෂ්කම්භන ප්‍රහාණයන්ගේ වශයෙන් යටපත් වූ කල හෝ සමුච්ඡේද ප්‍රහාණයෙන් සම්පූර්ණයෙන් ම ඉවත් වූ කල යහපත් ක්‍රියාවන්හි යෙදිය හැක. එහෙයින් **දනාදි පුණ්‍යචේතනාවෝ වූ කලී** යට කී පරිදි අපිරිසිදු වී පවත්නා සිතෙහි වූ ලෝභාදි දූවිලි සෝදා හැර පවිත්‍ර කරන ධර්මයෝ ය යි තේරුම් ගත යුතු. පෙර අත්බැව්හි දී රැස්කරන ලද එකී දනාදි පුණ්‍යචේතනාවන් යමකු තුළ ඇත්තේ ද එය **පෙර කරන ලද පින් ඇති බව** නම්.

*Non-commercial distribution*

**පින් කළ තැනැත්තා**
**දෙලොව මැ තුටු පහටු වන බැව්**

පින, සිත පිරිසිදු කරන ධර්මයක් බව යට කියන ලදී. පිරිසිදු වූ සිතිවිල්ලත්, පිරිසිදු වූ සිතින් කියන වචනයත්, පවිත්‍ර වූ සිතින් කරන ක්‍රියාවත් යන මේ සියල්ල ම සත්ත්වයා හට යහපත පිණිස ම දියුණුව පිණිස ම පවත්නේ ය.

එබැවින් **පින් කළ තැනැත්තා** මෙලොව මැ සතුටු වෙයි. පරලොව ද සතුටු වෙයි. දෙලොව මැ තුටු පහටු වෙයි. කිසි කලෙක පසුතැවිලි නො වෙයි. මෙලොව මැ තමා විසින් බොහෝ පින්කම් කරන ලදැ යි කළ කම් සිහි කරමින් සතුටු වෙයි. සිහි නො මුළාවැ කලුරිය කරයි. මරණින් මතු ද නිදා පිබිදියකු මෙන් සුගති ගාමීව සුව විඳිමින් වඩාත් ප්‍රීති වෙයි. එහෙයින් වදාළහ. ධම්ම පදයෙහි:

**"ඉධ නන්දති පෙච්ච නන්දති-**
**කත පුඤ්ඤො උභයත්ථ නන්දති.**
**පුඤ්ඤං මෙ කතන්ති නන්දති-**
**භීයො නන්දති සුග්ගතිං ගතො."**

එහි අදහස **දම්පියා** කවෙහි මෙසේ දැක්විණ:-

මො ලොවද යළි පරලොව ද නො මන්ද
සොද සොද පින්කළ දන වෙයි නන්ද
මම සො ද පින් කෙළෙමියි වී නන්ද
ය ළි වැ ද සුරපුර වෙයි අබි නන්ද

**පින් කළ තැනැත්තා** මෙසේ දෙලොව මැ සුවපත් වී ප්‍රීති ව දෙවියන් සහිත ලෝකයාගේ ඉමහත් ගෞරවාදරයට ද භාජන වෙයි. අනාදිමත් සසර ද සතර ආපායික දුඃඛයනට ගොදුරු නොවී **සෝන**, **රට්ඨපාල** ආදි සිටු පුත්‍රයන් මෙන් මිනිස් ලොවැ මිනිස් සම්පත් ද - ශක්‍ර, සුයාම, සන්තුෂිත ආදීන් මෙන් දෙව් ලොවැ දිව්‍ය සම්පත් ද **මහා පද්මා**දීන් මෙන් දහම් අන්තයෙහි අමාමහ නිවන් සම්පත් ද ලබයි.

කරුණු මෙසේ හෙයින් සත්ත්වයන් විසින් බලාපොරොත්තු වන්නා වූ යහපත් වූ ශරීර වර්ණය, සුමිහිරි කටහඬ, යහපත් වූ

Non-commercial distribution

ශරීර සටහන, ශරීර ශක්තිය, නිරෝගී බව, දීර්ඝායුෂ්කබව, ප්‍රඥාව, ධනය, පිරිවර, අධිපතිබව, කීර්තිය, සිටුසම්පත්, ප්‍රදේශරාජ්‍ය සම්පත්, චක්‍රවර්ති රාජ්‍යසම්පත් දිව්‍යසම්පත් ආදි සියලු සම්පත් ම පෙර කරන ලද පින් ඇති තැනැත්තාට ම ලැබේ. එහෙයින් වදළහ. **“නධිකණ්ඩ”** සූත්‍රයෙහිඃ-

**එස දෙව මනුස්සානං**
**සබ්බකාම දදෙ නිධි.**
**යං යදෙවාභි පත්ථෙන්ති**
**සබ්බ මෙතෙන ලබ්භති.**

මේ පින දෙවි මිනිසුනට සියලු සම්පත් දෙන්නා වූ උතුම් නිධානයෙකි. යමෙක් යමක් යමක් පතත් ද ඒ සියල්ල මේ පුණ්‍ය නිධානයෙන් ලැබේ.

**පින්කළ තැනැත්තා ගේ හා**
**නො කළ තැනැත්තාගේ වෙනස**

බුඬ ශාසනයෙහි ලාභීන්ගෙන් අග්‍රස්ථානය ලැබූ **සීවලී** මහරහතන් වහන්සේ කොතැනක විසුව ද වුවමනා ප්‍රමාණයටත් වඩා සිව්පසය ලැබූහ. එහෙත් **ලෝසක** තෙරුන් වහන්සේට කිසි දිනක වුවමනා ප්‍රමාණයට වත් සිව්පසය නො ලැබිණ. පිරිනිවන් පානා දිනයෙහි පවා සිත්සේ ආහාරයක් නො ලැබිණ. **ශාරීපුත්‍ර** මහ රහතන් වහන්සේ ගාථාවක දෙපදයක් ඇසීමෙන් ම ධර්මාවබෝධය කළහ. එහෙත් **චූල්ලපන්ථක** තෙරුන් වහන්සේට සාරමාසයක් උත්සාහ කොට ද එක ගාථාවක් පාඩම් කර ගැනීමට නො හැකි ය. **'ඝෝසක සිටුතුමා'** ළදරු කලැ සත් වරක් ම මරන්නට උත්සාහ කළ නමුදු, පෙර කරන ලද පින නිසා ඉන් නිදහස් ව සුවසේ වැඩී, මහත් වූ සිටු සම්පත් පවා ලබා ගත.

මේ ආදි වශයෙන් පෙර බොහෝ පින් කළ, නො කළ උතුමන් ගැන සලකා බලන කල, දෙවියකු වුවත්, මිනිසකු වුවත්, ගිහි වුවත්, පැවිදි වුවත්, රහත් වුවත් වෙනස දක්නට ලැබෙන බව සත්‍යයකි. එබැවින් ලෝකයෙහි වාසය කරන සියලු දෙනාට ම

Non-commercial distribution

එකසේ ම පින් උපකාර වන බව දත යුතු. ඒ බව මෙසේ ද වදළහ. අංගුත්තර පංචක නිපාතයෙහි:-

**"දෙව භූතස්සපි උපකාරානි පුඤ්ඤානි, මනුස්ස භූතස්සපි උපකාරානි පුඤ්ඤානි, පබ්බජිතස්සපි උපකාරානි පුඤ්ඤානීති"**

තවද **පෙර කළ පින් නැති තැනැත්තා** සැප සම්පත් ලැබීමට කොතෙක් වීයඝී කළත් එයින් යැපීමට පමණ ධනය විනා මහත් ධන සම්භාරයක් නො ලබයි. සමහර විටෙක පින් නැති තැනැත්තාගේ සම්පූර්ණ ව්‍යායාමය මහත් අනර්ථය පිණිස ද දුක පිණිස ද පවත්නේ ය. පින් කළ වුන්ගේ පරිභෝගයට සුදුසු වූ මහඟු වස්තුවක් හදිසියෙන් මුත් පින් නැත්තකු අතට පත් වූයේ වී නමුත් එය ඔහු සමීපයෙහි දීර්ඝ කාලයක් නො පවතී, අහසින් යා හැකි මාණික්‍ය රත්නයක් ලැබීම එක් සූකරයකුට මරණයට හේතු වූවාක් මෙන් පින් නැති තැනැත්තාට යම් උතුම් වස්තුවක් ලැබීම ඔහුගේ විනාශයට පවා හේතු වේ. පින් නැත්තන් විසින් උපදවන්නා වූ බොහෝ යහපත් දේවල් ඔවුන්ගේ පරිභෝගයට නො පැමිණ පින් ඇත්තවුන්ගේ පරිභෝගයට ම පැමිණෙයි. ඒ බව නුවණින් යුක්තව ලෝකය දෙස බලන්නකුට පහසුවෙන් අවබෝධ කරගත හැකි වේ.

ලෝකයෙහි **කෙනෙක්** ඩහදිය වගුරවමින් කඳුලු හෙලමින් ඉතා මහන්සියෙන් පිස නිමවා මේසය මත පිළියෙල කළ ප්‍රණීත භෝජනය අනිකෙක් මඳ පවන් පහස් විඳිමින් සුවසේ අනුභව කොට ප්‍රීතිමත් වෙයි. පිසූ තැනැත්තා ලිප ළඟම සිට වළන්වල ඉතිරි වූ දෙයක් අනුභව කරයි. **ජන සමූහයක්** අව්වෙන් වියළෙමින් වැස්සේ තෙමෙමින් ඉල කැඩෙන තරම් බර ඔසවමින් මාස ගණනක් මුළුල්ලෙහි තැනූ අලංකාර වූ මන්දිරයෙහි අනිකෙක් සුවසේ වාසය කරයි. තැනූ අයට පසු කාලයේ දී එයට අතුල්වීමට පවා ඉඩ නො ලැබේ.

**කෙනෙක්** බොහෝ වෙහෙසී සැදූ අලංකාර වූ ද සුව පහස් ඇත්තා වූ ද ඇඳ පුටුවල අනිකෙක් නිදයි. අනිකෙක් හිඳියි. තැනූ තැනැත්තා වඩු මඩුවේ ලැලි මැස්සේ දුකසේ නිදීම හිඳීම කරයි.

Non-commercial distribution

**කෙනෙක්** බොහෝ මහන්සි වී වැවූ වැවිල්ලේ අග්‍ර ඵලය අනිකෙක් භුක්ති විඳියි. **කෙනෙක්** දවස මුළුල්ලෙහි වෙහෙසී මඩ සෝද්‍ද දූවිලි පිස දමා පිළියෙල කරන ලද රථයෙන් අනිකෙක් ගමන් කරයි. මෙසේ ලෝකයෙහි පෙර කළ පින් නැත්තවුන් විසින් වෙහෙසී උපදවන්නා වූ උතුම් වස්තූන් බොහෝ සෙයින් ඔවුන්ගේ පරිභෝගයට නො ලැබී පින් ඇත්තවුන්ගේ පරිභෝගයට ම පැමිණෙන්නේ ය. පෙර පින් කළ උත්තමයෝ ඒ සියල්ල ම නො වෙහෙසී ම ලබති.

මෙසේ පෙර කරන ලද පින් ඇති තැනැත්තේ බොහෝ භවභෝග සම්පත් ලබා යම් කලක දී බුදුවරයකුගේ හෝ බුද්ධ ශ්‍රාවකයකුගේ ධර්ම දේශනාවක් ඇසුවහොත් සෝවාන් ආදි මාර්ග ඵලයන්ට පැමිණීමෙන් උතුම් ලෝකෝත්තර නිර්වාණ සම්පත්තිය ද ලබන්නේ ය. පෙර කළ පින් මඳ තැනැත්තාට වනාහි දහසක් බුදුවරයන් ධර්ම දේශනා කළත් මාර්ග ඵලාවබෝධයක් නො වන්නේ ය. මෙසේ පෙර කරන ලද පින් ඇති බව සකල ලෞකික ලෝකෝත්තර සම්පත්තීන්ට කාරණා වන බැවින් එය **උතුම් මංගලයක්** වන්නේ ය.

**පින නැවත නැවත කළ යුතු බව**

**ලොවැ** බොහෝ දෙනාගේ බලාපොරොත්තුව මෙ ලොව ජීවිතය කෙසේ නමුත් සැපවත් කරගෙන අඹුදරු කෙත්වත් ධන ධාන්‍ය ආදි උපභෝග පරිභෝග සම්පත් පිරිවරා කල් යැවීමටත්, පරලොව ද එසේ ම සැප සම්පත් ලැබීමටත් ය. මෙලෝ සැප ලැබීමට බොහෝ සෙයින් ම උපකාර වනුයේ පෙර කරන ලද පිනමය. පිනෙහි ශක්තිය පවත්නා තෙක් නොයෙකුත් සැප ගෙන දෙන්නේ ය. පින විපාක දී ගෙවී ගිය පසු සියලු සම්පත්වලින් පිරිහෙන්නේ ය.

නමුත් සම්පත් මදයෙන් මත්වූවනට “අපට මෙසේ සැප ලැබීමට හේතුව පෙර කරන ලද පින්ය. මේ සැප ස්ථිර වීම පිණිසත්, මතු මෙසේ ම සැප සම්පත් ලැබීම පිණිසත් ගොවියා නැවත නැවත අස්වැන්න ලැබීම පිණිස නැවත නැවත කුඹුරු වපුරන්නාක් මෙන් අප විසින් ද නැවත නැවත පින් කළ යුතු ය.” යන උතුම් අදහස පහළ නොවේ.

Non-commercial distribution

**මල් වෙඩිල්ලක්** අහසට නගින්නේ එහි සැර වේගය තිබෙනතුරු පමණකි. සැර වේගය අඩුවූ තැන් සිට ක්‍රමයෙන් පාත්වීගෙන අවුත් අන්තයෙහි නිවී යන්නේ ය. එමෙන් සත්ත්වයකුට ලැබෙන සැප සම්පත් දියුණු වෙමින් පවතින්නේ ඔහුගේ පින්වල ශක්තිය පවත්නා තෙක් පමණකි. පින්වල ශක්තිය හීන වෙන්නට වෙන්නට සැප සම්පත් ද ක්‍රමයෙන් හීනවී දීනවී, අන්තයෙහි ඇතැම්විට **සම්පත් තිබියදී තමා නැතිවී යාමෙන් සම්පත් කෙරෙන් තමා හෝ නැතහොත් තමා සිටියදී සම්පත් විනාශ වී යාමෙන් තමා කෙරෙන් සම්පත් හෝ විනාශ වී යෙයි**. එහෙයින් පෙර පින් බලයෙන් අත්පත් වූ මෙලෝ සැප අනුභව කිරීමෙන් පමණක් ම තෘප්තියට නො පැමිණ, මෙලෝ සැප තහවුරු වනු පිණිසත් මතු මතු ද සැප ලබනු පිණිසත් අප්‍රමාදව පින් රැස් කළ යුතු ය.

යමෙක් එලෙස නැවත නැවත පින් රැස් නොකර පැරණි පිනෙන් ලද සම්පත් කෙරෙහි පමණක්, පැණි හැලියෙහි වැටුණු ඇඹලයකු සේ ඇලී වෙසේ නම්, එවැනි අයට "මෙතෙම පැරණි දේ ම අනුභව කරන අවාසනාවන්තයෙකැ" යි නුවණැත්තෝ අපහාස කෙරෙති. මේ එයට හොඳ නිදසුනෙකිː– දිනක් **මිගාර සිටාණන්** ඉතා ම උසස් සුවපහසු යහනක අසුන් ගෙන රන් බඳුනක බහාලූ රසමසවුලෙන් පිරීතිරීගිය ප්‍රණීත භෝජනය වළඳමින් සිටින විට පිඩු පිණිස වැඩි තෙරනමක් දොරකඩ විය. එය දුටු මිගාර සිටාණන් නොදන්නකු සේ එය ගණනකට නොගෙන තමාගේ ප්‍රණීත භෝජනය ම වළඳනු දුටු පවන් සලමින් සිටි **විශාඛාව** මෙසේ තෙපලාය, "ස්වාමීනි! අපගේ මයිලණුවෝ පැරණි දෙයක් වළඳති. හිමි ඔබ අන්තැනක් බලා වඩිනු මැනවි" යනුයි.

Non-commercial distribution

## 6. තමා මනා කොට තබා ගැනීම.

ආත්මය මනා කොට තබා ගැනීම නම් දුශ්ශීලවූ තමා **සිල්වතකු වීම ද** අශ්‍රද්ධාවත් තමා **සැදැහැවතකු වීම ද**. මසුරුවූ තමා **ත්‍යාගවන්තයකු වීම ද** යන මේය. **දුශ්ශීලයා** වනාහි ශ්‍රමණ දුශ්ශීලයාය, ගිහි දුශ්ශීලයා යයි දෙවදෑරුම් වේ. එයින් ශීලය නො රැකීමෙන් මහණකම නැතිකරගත් ශ්‍රමණයා **ශ්‍රමණ දුශ්ශීලයාය**. සම්පූර්ණ පස්පව් හෝ ඉන් කීපයක් හෝ එකක් හෝ කරන්නා වූ ගිහියා **ගිහි දුශ්ශීලයා ය**. ඒ දුශ්ශීල බව වනාහි මෙලොවදී ම නින්ද ලැබීම, ගුටි බැට කෑම, බන්ධනාගාරයට යෑම, ධන හානිය, ජීවිත හානිය යන මේවාට හේතුවී මරණින් මතු අපායට පැමිණ වීමට ද හේතු වන්නේ ය. දුශ්ශීල යමෙක් තමා ඒ දුශ්ශීල භාවයෙන් මිදී ශීලයෙහි පිහිටියේ නම් ඒ සියල්ලෙන් ම ඔහු නිදහස් වෙනවා පමණක් නොව එයින් මහත් සම්පත්තියට ද පැමිණෙන්නේ ය. එබැවින් **එය මංගලයකි**. උතුම් ම මංගලයකි.

රන් රිදී මුතු මැණික් ආදි වටිනා වස්තූන් තැන තැන විසිරී පවත්නාවූ ප්‍රදේශයකට දෙ අතම නැත්තාවූ පුරුෂයකු පැමිණියේවී නමුත් ඔහුට ඒ ප්‍රදේශයේ තිබෙන වස්තූන් ගෙන් කිසිවක් ගෙන යා හැකි නොවේ. එපරිද්දෙන් ම සකල ලෞකික ලෝකෝත්තර සම්පත් ලබා ගැනීමට හේතු වන්නා වූ, බොහෝ පින් රැස්කර ගැනීමට සුදුසු වූ බුද්ධෝත්පාද කාලය මනුෂ්‍යාත්ම භාවය ලබා සිටින්නවුන් අතුරෙන් යමෙකු හට රත්නත්‍රය කෙරෙහි පැහැදීම ලක්‍ෂණ කොට ඇත්තා වූ **ශ්‍රද්ධාව** නැත්තේ වී නම් ඒ තැනැත්තාට කිසි පිනක් කරගත හැකි නොවේ. ඔහුට ලැබුණා වූ බුද්ධෝත්පාද කාලය හා මිනිසත් බව නිරර්ථක වන්නේ ය. ඔහුගේ සිත පාපයට ම නැමෙන බැවින් පාපයෙහි ම ඇලෙන බැවින් බොහෝ පව් කොට මරණින් මතු ඔහු නරකයේ ද පැසෙන්නේ ය. අශ්‍රද්ධාවත් වූ යමකු

*Non-commercial distribution*

සැදැහැවතකු වී නම් එයින් ඔහුට බොහෝ දන් පින් කරගත හැකි වීමෙන් මෙලොව ද ප්‍රශංසා ලබා මරණින් මතු ද ස්වර්ගයට පැමිණ ප්‍රීතිවිය හැකි වන්නේ ය. එබැවින් අශ්‍රද්ධාවන්තයාහට ශ්‍රද්ධාව ඇති කර ගැනීම ද **උතුම් මංගල්‍යයක්** වන්නේ ය.

**මසුරු බව** නම් තමා අයත් කිසිවක් අනිකකුට අයිති වෙනවාට හෝ අනිකකු හා සධාරණ වීමට හෝ නො කැමති බවය. තමා අයත් වස්තුව සැඟවීම ලක්‍ෂණ කොට ඇත්තා වූ ඒ මසුරු මලයෙන් යුක්ත වූවන්ගෙන් ඇතමෙක් පරහට දීම තබා තමාට සැප පිණිස ද වස්තුව වියදම් නොකරති. ඇතමෙක් පිනට කිසිවක් නොදී අඹුදරුවන් සමග තමා ම අනුභව කරති. මේ දෙවර්ගයේ ම මිනිස්සු ඔවුන් ලැබුවාවූ වස්තුවෙන් ගත යුතු සම්පූර්ණ ප්‍රයෝජනය නොලබන්නෝ ය. ඔවුහු මසුරු ගතිය නිසා ම නෑණවතුන්ගේ නින්දවට භාජන වන ලාමක ජීවිතයක් ගත කොට මසුරුකම නිසා ම නො කැමැත්තෙන් ම හඬ හඬා මරණයට පැමිණ මරණින් මතු ද ප්‍රේතව සා පිපාසාදි මහත් දුකට භාජන වෙති. **ධනය ඇත්තා වූ** යමෙක් ඒ මසුරු ගතිය තමා කෙරෙන් **බැහැර කොට**, තමා පමණක් සැප විඳින්නට බලාපොරොත්තු නොවී දුගී මගී යාචක ශ්‍රමණ බ්‍රාහ්මණාදීන් දනයෙන් සතුටු කරමින් වාසය කෙරෙත් නම් ඔවුහු මෙලොවදී ම සියල්ලන්ගේ ප්‍රශංසාවට භාජන වූ පූජ්‍ය පුද්ගලයෝව මරණින් මතුද ස්වර්ගයට පැමිණ සතුටු වන්නෝ ය. එබැවින් මසුරු බව නැති කර ගැනීම ද **උතුම් වූ** මංගලයකි.

Non-commercial distribution

## 3. වත ගාථාව

**බාහු සච්චඥ්ච සිප්පඥ්ච - විනයො ච සුසික්ඛිතො.**
**සුභාසිතා ච යා වාචා - එතං මංගලමුත්තමං.**

**බාහුසච්චඥ්ච** - බහුශ්‍රැත බව හෙවත් උගත් බවද: **සිප්පඥ්ච**, - සිල්පයද: **සුසික්ඛිතො:** - සුශික්ෂිතවූ: **විනයොච**, විනය ද හෙවත් කය වචන දෙක අකුශලයන් ගෙන් වළක්වා ගැනීම ද: **සුභාසිතා**, - මනා කොට කියන ලද: **යා වාචා**, - යම් වනයක් වේ නම් එය ද යනා: **එතං** - මෙය: **උත්තමං මංගලං:** - උතුම් වූ මංගල ධර්ම සතරකි.

මේ වූ කලී මංගල ධර්ම වදාළ නෙවන ගාථාව හා එහි පදාර්ථයි. මේ ගයින් ද අප බුදු පියාණන් වහන්සේ දෙලෝ දියුණුව පිණිස පවත්නා උතුම් මංගල ධර්ම සතරක් වදාළහ.

ඒ මෙසේ ය.:–

1. **උගත්කම**
2. **ශිල්ප දැනීම**
3. **කය වචනය දෙක හික්මවා ගතීම**
4. **යහපත් වචනය** යනුයි.

*Non-commercial distribution*

# 7. උගත්කම

මේ මහත් ලෝකය දැන ගැනීමට ඉතා දුෂ්කර වූ නොයෙක් පුදුම දේවලින් පුදුම කරුණුවලින් පිරී පවතී. ඒ සියල්ල ඇසට පෙනෙන්නා වූ ඇසින් බලා දත හැක්කා වූ දේවල් ම නො වෙති. ලෝකයෙහි ඇසින් බලා දත හැක්කා වූ ඇසට පෙනෙන්නා වූ දේවලට වඩා එසේ නො දත හැකි දේවල් ම බොහෝ වෙති. **ධම් ශාස්ත්‍ර** දෙක වනාහි ප්‍රකෘති ඇසට අවිෂයවූ ඒ දේවල් දක්වන්නා වූ උතුම් වූ ඇස් දෙකකි. මනුෂ්‍යයකු හට මෙලොව සැප ඇතිව ගරු නම්බු ඇතිව කල් ගත කිරීම හා, මරණින් මතු, සුගතියකට පැමිණීම යන දෙක, ඇසට පෙනීමෙන් වන දැනීමෙන් පමණක් කිසි කලෙකත් සිදු කර ගත හැකි නොවේ.

**ලෝකය කෙබඳු එකක් ද?** ඒ ලෝකයෙහි කුමක් කළ යුතු ද? කුමක් නො කළ යුතු ද? කුමක් සැපතට හේතු වේ ද? කුමක් දුකට හේතු වේ දැයි දැන ගැනීමෙන් ම දෙලෝ වැඩ සාද ගත හැකි වේ. යමකුට ඒ දෙලෝ වැඩ සාද ගන්නා වූ ආකාරය පෙනෙන්නාවූ ධම්ශාස්ත්‍ර ඥානය නමැති ඇස් නැත්තේ නම් ඔහු අන්ධයෙකි.

අන්ධයා වනාහි ඔහුට කිසිවක් නො පෙනෙන බැවින් කිසිවක් කරගත නොහී ඉතා දුකසේ ජීවත් වන්නෙකි. බොහෝ සෙයින් අන්ධයෝ අනුන් නිසා ජීවත් වන්නාවූ යාචකයෝ ය. ශාස්ත්‍රය නො දත් තැනැත්තා ද අන්ධයා මෙන් ම ධන සැපයීමට ක්‍රමයක් නො මැතිව ඉතා දුකසේ ජීවත් වන පහත් පුද්ගලයෙක් වේ.

අද ලෝකයෙහි උසස් තනතුරුවලට පත්වී රජුන්ගෙන් පවා පුදපඩුරු ලබමින් සිටින සියල්ලෝ ම උගත්කම නිසා ම ඒ උසස් බවට පැමිණ සිටිති. එබැවින් උගත්කම දෙලොව යහපත සිදු කර

Non-commercial distribution

**දෙන උතුම් වූ මංගලයකි.**

**බුද්ධ ධර්මය උගෙණීමෙහි වටිනාකම**

ලෝකයෙහි අවුරුදු දහසක් ජීවත් වන්නකුටත් උගෙන අවසන් කළ නොහැකි පමණ ධර්ම ශාස්ත්‍රයෝ බොහෝ වෙති. ඉන් අප බුදුරජාණන් වහන්සේ විසින් වදළ ත්‍රිපිටකධර්මය පළමුවන අංකයට පැමිණ තිබේ. සර්වඥ ධර්මයෙන් අන්‍යවූ බොහෝ ලාභ ලැබීමට ද උසස් තනතුරුවලට පැමිණීමට ද රජුන්ගෙන් පවා ගරු බුහුමන් ලැබීමට ද හේතු වන්නා වූ නොයෙක් ධර්මශාස්ත්‍රයන් ඇතත් ඒ හැම, ක්ලේශ වර්ධනයට හේතු වන්නා වූ පාප ක්‍රියාවන්ට හේතු වන්නා වූ ධර්ම ශාස්ත්‍රයෝ ම ය.

නීති ශාස්ත්‍රය ආදි ඇතැම් ශාස්ත්‍රවලින් ධන සපයන්නෝ බොහෝ සෙයින් ලෝකයට අනර්ථ කරමින් ම ධන සපයති. සර්වඥ ධර්මය වනාහි පව් නැති කිරීමට හා පින් වැඩීමට හේතු වන්නා වූ ධර්මයකි. යමෙක් ඒ ධර්මය උගෙන එයින් ලාභ ලබත හොත් ඔහු ඒ ලාභය ලබන්නේ පරහට ධර්මය කියාදීම් ආදියෙන් ලෝකයාට ද යහපතක් කරමින් ය. යමෙක් සර්වඥ ධර්මය මනා කොට උගත්තේ නම් ඔහුට එය මෙලොව ලාභ කීර්ති ආදියට හා පසුව ස්වර්ග මෝක්ෂ සම්පත් ප්‍රතිලාභය පිණිස ද වේ.

බෞද්ධ රජදරුවන් ඇති කාලවලදී වනාහි බුද්ධ ධර්මය පිළිබඳ උගත්කම රජුන්ගෙන් පවා උසස් තනතුරු ලැබීමට ද මහත් පුද පඬුරු ලැබීමට ද හේතු වූවකි. මේ වත්මන් කල අප රටේ බෞද්ධ රජදරුවන් නොමැති බැවින් එයින් වඩා ප්‍රයෝජනයක් නොපෙනෙතත් එය මෙලොව නියම මනුෂ්‍යකු වී කටයුතු කිරීමට ද පරලොව සුගතිගාමී වීමට ද අසහාය හේතුවක් වන බැවින් දෙලෝ වැඩ සාද ගැනීමට ඉමහත් උපකාරක් වන්නේ ම ය. සකල ලෞකික සම්පත්තීන්ට උතුම් වූ කිසිකලෙක නො නැසෙන සැපත වූ ලෝකෝත්තර නිර්වාණ සම්පත්තිය ප්‍රදනය කරන්නා වූ එක ම ධර්මය බුදුරජාණන් වහන්සේ ගේ ධර්මය ම ය. එබැවින් එය අති ශ්‍රේෂ්ඨ වන්නේ ම ය. ඒ ධර්මය දැනීම මහත් වූ මංගලයක් වන්නේ ය.

උගත්කම වනාහි පැවිද්දන් විසින් ඇතිකර ගතයුතු උගත්කමය, ගිහියන් විසින් ඇතිකර ගතයුතු උගත්කම යයි දෙපරිදි වේ. එයින්

Non-commercial distribution

**භික්ෂූන් විසින්** ප්‍රධාන කොට ඇතිකර ගත යුත්තේ ධර්ම විනය පිළිබඳ උගත්කමය. බාහිර ශාස්ත්‍රයන් පිළිබඳ දැනීම ඇති කර ගැනීමට උත්සාහ කළ යුත්තේ භික්ෂුවක් විසින් දතයුතු පමණට ධර්ම විනය ඉගෙණීමෙන් පසුව ය. මේ කාලයේ බොහෝ භික්ෂූහු ප්‍රාතිමෝක්ෂය පමණවත් නො දැන බාහිර ශාස්ත්‍ර උගෙනීමට ලොල්ව සිටිති. එය මහත් ශාසන පරිහානියට හේතුවකි.

**ගිහියන් විසින්** තමාගේ ජීවිකාවට ධන සපයා ගැනීමට උපකාර වන ශාස්ත්‍රයන් විශේෂයෙන් උගත මනා ය. එහෙත් ධර්මය පිළිබඳව ද සාමාන්‍ය දැනීමක් ඇති කර ගැනීම අවශ්‍ය ය. එසේ නො කොට උදර පෝෂණය ම ප්‍රධාන කොට වාසය කරන්නාට සගමොක් සැප ලැබීමට දුෂ්කර වේ. එබැවින් ගිහියන් විසින් ද හැකිතාක් ධර්මය උගත යුතු.

**ධර්මය සොයා වනගත වූ රජතුමෙක්.**

කරුණු මෙසේ හෙයින් පෙර අප බෝසත් **"දහම් සොඩ"** රජතුමා ධර්මයෙන් වෙන් වූ රාජ්‍යයෙන් කම්නැතැයි ඒසා මහත් රාජ්‍යය පවා අත්හැර ධර්මය සෙවීම පිණිස වනගත විය. ඒ බව **"දහම්සොඩ"** කවෙහි මෙසේ දැක්විණ.

වෙරල නැති සයුර මෙන
රිවිසඳ නැති අහස මෙන
පහන් තිවි ගෙය මෙන
යුවළ දළ නැති මත ගිජිඳු මෙන

කමල නැති විල මෙන
තරල මිණ නැති හර මෙන
ගහණ සුන් වත මෙන
**දහම් නැති ලොව නොවේ සසොබන**

මු නි දු න් වදහළ දහමින් අමයු ත්
ග ය කි න් වත් ඉන් අඩිනඩකින් ව ත්
ම ට දැ න් කිසිවෙකු බණකිව තුටු සි ත්
ව ඩ මි න් ඕහට දෙමි නෙක සම්ප ත්

Non-commercial distribution

ද හ ස් පටන් කෙළ සුවහස් හිමි කොට
වෙ සෙ ස් අනගි මිණි මුතු සහ රට තොට
ස තො ස් වඩන රජසිරි දී හිමි කොට
ද හ ස් බවට පැමිණෙමි මම ඕහට

මෙ ලෙ සි න් කියමින් විමසා හැමතැ න
නො ල දි න් බණ දන්නකු කලකිරෙමි න
හ රි මි න් රජසිරි වෙනිනෙක වෙසෙකි න
**තො ල සි න් නික්මිති වනයට යන මෙ න**

**පැරණි උතුමන්ගේ ආගම දැනීම**

**පෙර ලක්දිව** වුසූ ගිහි පැවිදි කවුරුත් ධර්මය උගෙනීමෙහි දැනට වඩා මහත් උනන්දුවක් දැක්වූ බැව් පෙනේ. එහෙයින් ම එකල ලක්දිව ත්‍රිපිටක ධර්මය දිවග ලෙළවා ගත් ධර්මධාරීන් ගෙන් හිස් නො වීය.

**පෙර බෞද්ධයන් එක බණක්** ඇසීමට තිස්සමහාරාමයේ සිට අනුරාධපුරයට ද, අනුරාධපුරයේ සිට තිස්සමහාරාමයට ද ගොස් තිබේ. මහත් රාජ්‍ය කාර්‍ය්‍යයන්හි නියුක්ත වූ **"සද්ධාතිස්ස"** ආදි රජවරු පවා ඒසා මහත් කටයුතු තිබියදී තුන්යම් රැය මුළුල්ලෙහි සිටගෙන ම බණ අසා තිබේ. සතුරන්ට අසුවී මිය යෑමට වඩා සියදිවි නසා ගැනීම මැනවයි සිතූ අනුරාධපුරයෙහි වුසූ **"3 වන දෙවු තිස්"** රජතුමා සිය පෙම්වතිය වෙත අන්තිම පෙම් හසුන යැවූයේ මෙසේය:–

**"මහාදේවිනි, ඔබ පැවිදි වැ ආගම ධර්මය හදරා අභිධර්මය කියා රජහට පින් දුන මැනව"** යනුවෙනි.

මෙසේ අපේ පුරුෂ පක්‍ෂය මෙන් ම ස්ත්‍රී පක්‍ෂය ද දූරාතීතයෙහි පටන් ම ධර්මය උගෙනීමෙහි මහත් ලැදි කමක් දැක්වූ බැව් නො රහසකි. අනඳ මහ තෙරුන් වහන්සේගෙන් නිතර ධර්මය උගෙන ගත් "මල්ලිකා" දේවිය ප්‍රමුඛ පන්සියක් ස්ත්‍රීන්ගේ කථා පුවත ද, තමා ඇසූ ධර්මය ඒ වූ පරිදි එක අකුරකුදු අඩු වැඩි නොකොට එසේම කියා දීමෙන් 'සාමාවතී දේවිය' ප්‍රමුඛ කොට ඇති පන්සියයක්

Non-commercial distribution

බිසෝවරුන්ට මාර්ගඵලාවබෝධය පවා ලබා දුන් "**ඛුජ්ජුත්තරාව**" ගේ පුවත ද, මෙහිලා හොඳ නිදර්ශනයෝ වෙති, බණ උගෙනීමෙන් මෙලොව මැ මහත් සම්පත් ලැබූ '**හේමා**' ගේ චරිතය ද මෙහි ලා කදිම නිදසුනකි. ඒ මෙසේ දතයුතු.

**බණ උගෙනීමෙන්**
**මහත් සම්පත් ලද උපාසිකාවක්.**

**පෙර මෙම ලක්දිව** අනුරාධපුරයට නුදුරුව බටහිර දිග් භාගයෙහි ගමක එක් පුරුෂයකුට රන් කඳක් වැනි රූපයක් ඇත්තාවූ ද, මහ නුවණැත්තාවූ ද එක ම දියණියක් වූවා ය. රන්රුවක් වැනි ශරීරයක් ඇති හෙයින් මව්පියන් ඇයට "**හේමා**" යි නම් තබන ලදී. ඕ තොමෝ එක වරක් ඇසූ ඕනෑ දෙයක් පාඩම් කර සිත්හි දරා ගැනීමට සමත් ය. දිනක් හේමාවෝ සිය පියාණන් ද කැටුව බණ අසන රිසියෙන් අසල පන්සලට ගියා ය.

**එදවස් දම් දෙසූ භික්ෂූන් වහන්සේ** බුදුරජුන් ලෝ සතුන් දුකින් මුදවා ගැනීමට පළමුවෙන් වදළ ධර්ම දේශනාව වූ "**දම්සක් පැවතුම් සූත්‍රය**" දෙසූහ. හේමාවෝ ඒක ශ්‍රැතියෙන් දරා ගැනීමට සමත් මහා නුවණැති හෙයින් අර්ථ කථා සහිත වූ සූත්‍රය එක අකුරක්වත් නොවරදවා ම මුතු වැලක් අමුණන්නියක සේ එකඟ වූ සිතින් සම්පූර්ණයෙන් සිත්හි දරාගෙන කට පාඩම් වශයෙන් තබා ගත්හ. පසු කලෙක පිට පළාතක වැසි එක් වෙළෙන්දෙක් වෙළඳම පිණිස ඇ වසන ගම් පෙදෙසට ගොස් වෙළඳම් කරන්නට පටන් ගත. මෙසේ වෙළඳම් කරමින් ගමෙහි ඇවිදින ඔහුට හේමාවන් හමුවී ඈ කෙරෙහි ආලය ඇති විය. මෙසේ ඒ දෙදෙනා ප්‍රේමයෙන් ටික දිනක් එගම වාසය කරන අතර වෙළඳ තෙමේ තමා ගේ ගමට ගොස් ආපසු එන්නෙමියි කියා ගොස් යම්කිසි කටයුත්තක යෙදෙමින් නැවත ඈ බැලීමට නො ආවේ ය.

වෙළෙන්ද කෙරෙහි බලවත් ප්‍රේමයෙන් බැඳුණු හේමාවෝ ඔහු අද එති, සෙට එති යි සිත සිතා සිටියෝ ය. අහෝ, අභාග්‍යයකි. බොහෝ කලක් ගතවිය. වෙළඳ තෙමේ තවමත් එහි නො ආවේ ය. අවංක ප්‍රේමයක් ඇති කර ගෙන සිටි හේමාට මෙය නො ඉවසිය හැකි කණගාටුවකි. ඇගේ සිත කම්මලක් මෙන් නො සන්සුන්

Non-commercial distribution

කමකින් පවතියි. කල් යත් යත් හේමාවගේ ශෝකය ද්විගුණ ත්‍රිගුණ විය. ඇට මෙලොව ජීවත් වීම දැන් කරදරයක් මෙන් වැටහෙයි. මරණයට නිතර ම සූදානම් ව සිටියි.

**දිනක්** සිය සැමියා වසන ගමට යෑමට සිතූ ඕ තොමෝ මධ්‍යම රාත්‍රියෙහි ගෙන් පිටත්වූවා මෝහයෙන් මුළා වූ ඇගේ බය ගතිය රාගයෙන් වසන ලද හෙයින් රාත්‍රිය ගැන නොබා මහ මගට බැස ගල් කණු කටු ආදිය ගැන වත්, නා පොළොං ආදි විසකුරු සපුන් ගැනවත්, මනුෂ්‍ය අමනුෂ්‍ය ආදි නොයෙකුත් සතුරන් ගැනවත්, කිසිත් නො සිතා මහ මග යන්නී ගොඩ මග දුරයි සිතා මුහුදින් පීනා යුහුව යනු කැමැත්තී මුහුදු වෙරළට පැමිණ හිසකේ ගොතා තදකොට බැඳගෙන හින හැදි වස්ත්‍රය තරයේ හැඳ මුහුදු දියට පැන පිහිනන්නට පටන් ගත්තාය.

පින්වත්නි! රාගයාගේ භයානක තත්ත්වය බලනු මැනවි. මෙතරම් දුර මාර්ගය රාගයෙන් රත්වූ ඇට අසළ ගෙයකට යන ගමනක් මෙන් වැටහිණ. මෙසේ පිහිනන්නට වූ හේමාවන් දුටු **එක් නාගරාජයෙක්** ඈ සමග කථා බස් කිරීමෙන් ලක්දිව තනැත්තියක් බව දැනගෙන ලක් වැස්සෝ බොහෝ දෙන ධර්මධරයෝ ය, තොපත් දන්නා බණක් ඇත්දැයි විචාළ විට, මම වැඩි බණක් නො දනිමි. එහෙත් අර්ථකථා සහිත වූ **'දම්සක් පැවතුම් සූත්‍රය'** නම් දනිමි යි කීවා ය. බණ අසන රිසි වූ නාරජ තෙමේ මුහුද මැද සත්රුවන් මණ්ඩපයක් මවා එහි හේමා කුමරිය වඩා හිඳුවා ඇඳිලි බැඳ වැඳගෙන ඇගේ ධර්ම දේශනාව අසා ඉමහත් සතුටට පැමිණ කැමති කැමති සියලු සම්පත්වලින් හේමාවන්ට පූජාකොට යනු කැමැති වූ වෙළෙන්දගේ ගෙයට ම තම ආනුභාවයෙන් ඇය පැවිණවිය. කරුණු මෙසේ හෙයින් උගෙනීම **උතුම් වූ මංගලයකි**.

Non-commercial distribution

# 8. ශිල්ප දැනීම

ශිල්ප දැනීම වූ කලී මෙම ගාථාවෙහි දෙවන මංගල කාරණයයි. මෙහි ශිල්ප යයි දක්වන ලද්දේ අතින් කළ යුතු කර්මාන්තයන්හි පුහුණු බවය. ශිල්පය ද පැවිද්දන් විසින් දතයුතු ශිල්පය ගිහියන් විසින් දතයුතු ශිල්පයයි දෙවැදෑරුම් වේ. ඒ ද ස්ත්‍රීන් විසින් දතයුතු ශිල්පය, පුරුෂයන් විසින් දතයුතු ශිල්පයයි නැවත ද දෙපරිදි වේ. එයින් ස්ත්‍රීන් විසින් දතයුතු ශිල්ප නම් රෙදි වියුම, ඇඳුම් මැසීම, ගෙතීම, පන් ආදිය විවීම, ආහාර පිසීම යනාදිය යි. පුරුෂයන් විසින් දතයුතු ශිල්ප නම් වෘක්ෂලතාවන් වැවීම, ගෙවල් තැනීම, ඇඳපුටු ආදි ලී බඩු තැනීම, කැති උදලු ආදි අවි ආයුධ තැනීම, රන් රිදී බඩු තැනීම, ලෝහභාණ්ඩ තැනීම, භාජන තැනීම යනාදි ය යි.

තම තමන්ට නිතර වුවමනා දේ තමාට ම සාදගත නො හැකි නම් එය මහත් පාඩුවකි. තමාට වුවමනා එක එකක් පාසා ම අනුන් ලවා කරවා ගැනීමට හෝ මිළයට ගැනීමට යෑම කරදරයක් හා ධන හානියක් ද වේ. පෞද්ගලික වශයෙන් එය කෙසේ වෙතත් ජාතියක් වශයෙන් සලකා බලතොත් **'සිංහල ජාතිය'** ශිල්පයෙන් ඉතා පිරිහී සිටින ජාතියක් වී තිබේ. සිංහලයෝ ආහාර ද්‍රව්‍යයන් ද ගෙවල් සෑදීමේ උපකරණ ද භාජන ආවුධ පහන් ආදි සියල්ලක් ම වාගේ තම තමා සාද ගැනීමට නොදත් බැවින් අනුන්ගෙන් ම ලබා ගැනීමට සූදානම්ව සිටිති. එය ධන හානියට හා අනුන්ට යටත් වීමට ද හේතුවක් වී තිබේ. පිට රටවලින් ලක්දිවට ගෙන්වන ලද ආහාරපානාදි දේවල් වුවමනා පමණ ගෙන්වීමට නො හැකි වීම නිසා අද ලක් වැසියෝ කෙතරම් දුඃඛ ජීවිතයක් ගත කෙරෙත් ද? ශිල්ප අතින් සිංහල ජාතිය පරිහානි මුඛයෙහි ගමන් කරන බවට වැඩි නිදසුන් නො කීවාට මේම ප්‍රමාණය.

*Non-commercial distribution*

අනුන් උපදවන දෙයින් ජීවත් වන අනුන්ට යටත් ජීවිතය පිළිකුල් කටයුතුයි. තමාට වුවමනා දේ තමා ම සාදා ගැනීමට දැනගත් කල්හි තමාගේ ධනය ද ඉතිරි වේ. ඒ මුදලින් ම වැඩියක් ධන උපයා ගත හැකි ද වේ. මෙනම් දෙය කරවා ගැනීමට ය, මෙනම් දෙය මිළයට ගැනීමට යයි කියා අනුන් කරා යාම ද නො වන්නේ ය. එබඳු කර්මාන්තයන් තමන් කරන්නට දත් කල්හි නොදත් අන්‍යයෝ තමාගේ පාමුලට පැමිණෙති. එබැවින් ශිල්ප දැනීම ද උතුම් මංගලයෙකි.

**ගල් විදීමෙන්**
**ගම්වර සතරක් තෑගි ලද පිළා**

කවර ශිල්පයක් නමුත් හොඳින් දැන සිටීම දියුණුවට හේතුවන කරුණකි. මේ එයට හොඳ සාධකයෙකි. පෙර බරණැස් නුවර ගල් විදීම් ශිල්පය දන්නා වූ එක්තරා පිළෙක් (දෙපා නැති කෙනෙක්) විය. ඔහු ගල් විදීම් ශිල්පයෙහි ඉතා දක්‍ෂයෙකි. දිනක් ළමයින් සමූහයක් බරණැස් නුවර දොරටුව සමීපයෙහි නුග රුකක් යටට ඒ පිළා ගෙන ගොස් ඔහුට සතය දෙක දී නුග පත්වල ඇත් රූප අශ්ව රූපාදි රූප සෑදෙන පරිදි ගල් විද්ද වූවෝ ය. එකල්හි රජ්ජුරුවෝ ද එතැනට හදිසියෙන් පැමිණියෝ ය. ළමයි බියවී ඒ මේ අත පලා ගියෝ ය. පිළා පමණක් එහි ඉතිරි වූයේ ය. **රජ්ජුරුවෝ** නුග පත්වල රූප දැක මේවා කවරකු විසින් කරන ලද දැයි විචාරා පිළා විසිනැයි කී කල්හි ඔහු කැඳවා බොල, මගේ පුරෝහිතයා මහත් වාචාළයෙකඃ ඔහු සබයට පැමිණි කල අනිකෙකුට කථා කිරීමට ඉඩ නැත. තට ඔහුගේ කථාව නැවැත්විය හැකිදැයි විචාළෝ ය. එකල්හි පිළා දේවයන් වහන්ස, එළුබෙටි නැළියක් ලද හොත් හැක්කෙමියි කීයේ ය.

රජ්ජුරුවෝ පිළා රජ ගෙදරට ගෙන්වා ඔහු තිරයකින් මුවාවෙහි හිඳුවා එළුවසුරු (එළුබෙටි) නැළියක් දී තිරයෙහි කුඩා සිදුරක් කොට එය ඉදිරියෙහි පුරෝහිතයාට අසුනක් පනවා ඔහු ආ කල්හි එම අස්නෙහි හිඳුවා ඔහු හා කථාවට පටන් ගත්හ. පුරෝහිත බමුණා වෙනද මෙන් ම කිසිවෙකුට ඉඩ නොතබා තමා ම කථා කරන්නට වූයේ ය. තිරයට මුවා වී සිටි පිළා ඔහුගේ කටට

Non-commercial distribution

එක එක එළු ලඩ බැගින් විද්දේ ය. **කථාවෙහි ලොල් බමුණා** ඒ ගැන කල්පනා නො කොට කටට එන සියල්ල ගිලිමින් කථාව නො නවත්වා ම කෙළේ ය. එළුවසුරු නැළිය අවසන් වූ කල්හි රජ්ජුරුවෝ ඔහුට කථා කොට ආචාරීනි! දැන් තොප අති මුඛර බැවින් නො දැන ම එළුවසුරු නැළියක් ගිල්ලේ ය. පුවඟු දිය බී වමනය කොට නිරෝගී වේවයි කීහ. පුරෝහිතයා ලජ්ජාවට පැමිණ එතැන් පටන් නිශ්ශබ්ද වූයේ ය. රජ්ජුරුවෝ මොහු නිසා මා හට තුබූ කන්දොස්කිරියාව නැති වූයේයයි සතුටුව ඔහුට ගම්වර සතරක් දුන්හ. මෙසේ පිළා ඔහු දත් අල්ප වූ ශිල්පය වුව ද මැනවින් දත් නිසා මහත් සැපතට පත් වූයේ ය.

**අතිසි ලෙස පාවිච්චි කළ ශිල්පයෙන්**
**නපුරු විපාක ලැබූ සැටි.**

**අන්‍ය වූ එක්තරා පුරුෂයෙක්** පිළාගෙන් එම ශිල්පය ඉගෙන ශිල්පය විමසීම පිණිස විදීමට කෙනකු සොයනුයේ පසේ බුදුවරයකු දැක මොහු වනාහි මවක් පියෙක් නෑයෙක් නැති කෙනෙකි. මොහුට විද්දාට ඒ ගැන සොයන්නට එන කෙනෙක් නැතයයි සලකා පසේ බුදුන්ගේ කනට ගලක් විද්දේ ය. එයින් **පසේ බුදුවරයන් වහන්සේ** පිරි නිවන් පා වදළ සේක. මහජනයා රැස්ව අඩා වැලපී උන් වහන්සේගේ ශරීරය ආදහන කෙළේ ය. ගල් විද්ද පුරුෂයා ද එතැනට පැමිණ තමා ශිල්පය විමසීම පිණිස පසේ බුදුන්ට විද්ද බව කීයේ ය. ඒ අසා කිපියා වූ ජනයා විසින් ඔහු තළා මරනු ලැබ මරණින් මතු අවීචි මහා නරකයෙහි උපන්නේ ය. මොහු වනාහි තමා දත් ශිල්පය නපුරු කොට පාවිච්චි කිරීමෙන් නරකයට පැමිණියේ ය. මෙසේ ශිල්ප ශාස්ත්‍රයෝ ද මනා කොට පරිහරණය කරන්නාට යහපත පිණිස ද නපුරු කොට පරිහරණය කරන්නවුන්ට විපත් පිණිස ද පවත්නාහ.

Non-commercial distribution

# 9. මනාකොට හික්මෙන ලද විනය

"**විනයෝ ච සුසික්ඛිතෝ**" යන මෙයින් දක්වා වදාරන ලද විනය වනාහි පැවිද්දන් පිළිබඳ විනය, ගිහියන් පිළිබඳ විනයයි දෙවදෑරුම් වේ. එයින් පැවිද්දන්ගේ විනය නම් බුදුරජාණන් වහන්සේ විසින් පනවා වදරන ලද සප්තාපත්ති ස්කන්ධයට නො පැමිණ ආරක්ෂා වීමය. ගිහියන් ගේ විනය නම් කය වචනය සිත යන තුනෙන් සිදුවන දස අකුශල කර්ම පථයෙන් වැළකීමය. මේ ද්විප්‍රකාර වූ ම විනය ඒ ඒ පුද්ගලයන් කිළිටි නො වීමෙන් සැප එළවන බැවින් උත්තම වූ මංගල නම් වේ. තමාගේ කායාදි ද්වාරත්‍රය ආරක්ෂා නො කොට වරදට අසුවීම ගිහි පැවිදි දෙපක්ෂයට තම තමා විසින් ලැබිය යුතු වූ ස්වර්ග මෝක්ෂ සම්පත්වලට අන්තරාය කර වේ.

අන්තරායික ධර්මයෝ වනාහි 1. **කර්මය**. 2. **ක්ලේශය**. 3. **විපාකය**. 4. **උපවාදය**. 5. **ආඥාව්‍යතික්‍රමණයයි**. පස් ආකාර වෙති.

## 1. කර්මයෝ

1. මව නැසීමය, 2. පියා නැසීමය, 3. රහතුන් නැසීමය, 4. බුදු වරයන්ගේ ලේ සෙලවීමය, 5. සමගි සංඝයා භේද කිරීමය යන මොවුහු කර්ම නම් වෙති. මේ කර්මයෝ පස් දෙන වනාහි දෙවන ආත්මයෙහි ඒකාන්තයෙන් විපාක දෙන බැවින් "ආනන්තර්‍ය්‍ය කර්ම නම් වෙති. මෙයින් එකකුදු කළ තැනැත්තාට කොපමණ කුශල් කොට ද මරණින් මතු සුගතියකට පැමිණිය නොහේ. ඉහාත්මයෙහි රහත්ව නිවන් දැකීමට පින් ඇත්තා වූ කෙනෙක් වුව ද මෙයින් එකකට අසුවී නම් ඉන් පසු ඔහුට දහසක් බුදුවරයන් දහම් දෙසුවේ වී නමුත් එය ආත්මයෙහි නිවන් දැකිය නොහේ. මෙසේ මේ ආනන්තර්‍ය්‍ය කර්මයෝ ස්වර්ග මෝක්ෂ අන්තරාය කරන්නාහු යයි දතයුතු.

Non-commercial distribution

## 2. අන්තරාය කර ක්ලේශයෝ

**1. නාස්තික දෘෂ්ටිය. 2. අහේතුක දෘෂ්ටිය 3. අක්‍රිය දෘෂ්ටිය** යන මිථ්‍යා දෘෂ්ටි තුන අන්තරාය කර ක්ලේශයෝ ය.

එහි දනාදි කර්මයන්ගේ මතු විපාකයක් නැත. මරණින් මතු සත්වයා ගේ ඉපදීමක් ද නැත යන දෘෂ්ටිය **නාස්තික දෘෂ්ටිය යි**. සත්ත්වයාගේ කෙලෙසීමට හා පිරිසිදු වීමට පව් පින් නමැති හේතුවක් නැත යයි ගැනීම **අහේතුක දෘෂ්ටිය යි**. ප්‍රාණඝාතාදිය කිරීමෙන් පවක් හෝ දනාදිය කිරීමෙන් පිනක් හෝ නොවේය යන දෘෂ්ටිය **අක්‍රිය දෘෂ්ටිය යි**.

මේ දෘෂ්ටිවලින් යුක්ත තැනැත්තේ ද මරණින් මතු ඒකාන්තයෙන් ගලක් හෙලුවාක් මෙන් නරකයෙහි වැටෙන බැවින් මේවාට **නියත මිථ්‍යාදෘෂ්ටිය යි** කියනු ලැබේ. මෙය වනාහි ආනන්තර්‍ය්‍ය කර්මයට ද වඩා අතිශයින් බර වූ පාපයකි.

**ආනන්තර්‍ය්‍ය කම් කළ තැනැත්තේ වනාහි** කල්ප විනාශයේදී නරකයෙන් මිදෙන්නේ ය. කල්ප විනාශය සෙට වේ නම් ආනන්තර්‍ය්‍ය කර්මයෙන් අද නරකයෙහි උපන් තැනැත්තා ද සෙට නරකයෙන් මිදෙන්නේ ය.

**නියත මිථ්‍යා දෘෂ්ටිකයා වනාහි** කල්ප විනාශයේදී ද නරකයෙන් මිදෙන්නේ නොවේ. ඔහු තමා සිටින ලෝක ධාතුව විනාශ වන කල්හි අනික් සක්වළක නරකයකට පැමිණෙන්නේ ය. අපායෙන් මිදීමෙහි කාල නියමයෙක් ඔහුට නැත. මෙසේ මිථ්‍යා දෘෂ්ටිය මහා සාවද්‍ය වන්නේ ය.

## 3. විපාකාන්තරායෝ

පණ්ඩක උභතෝබ්‍යඤ්ජනක තිරශ්චීනාදීන්ගේ ප්‍රතිසන්ධීහු විපාකාන්තරායයෝ නම් වෙති. අහේතුක ප්‍රතිසන්ධික වූ ඔවුහු එම ආත්මයෙහි ධ්‍යාන හෝ මාර්ග ඵල ඉපදවීමට සමර්ථයෝ නො වෙති. ඔවුන්ට එම ආත්මයෙහි නිවන් ලැබීමට ඔවුන්ගේ ප්‍රතිසන්ධිය ම මෙසේ අන්තරායකර වේ.

Non-commercial distribution

## 4. උපවාදන්තරාය

බුදුවරයෝය, පසේ බුදුවරයෝය, රහත්හු‍ය, අනාගාමීහුය, සකෘදගාමීහුය, සෝවාන් වූවෝය යන ආර්‍ය්‍ය පුද්ගලයනට චෝදනා කිරීම හෙවත් දොස් කීම උපවාදන්තරාය නම් වේ.

යමෙක් එබඳු උත්තමයකු හට නපුරු සිතින් දොස් නැගුවේ නම් ඔහුට එම ආත්මයෙහි මාර්‍ගාධිගමය එම කර්මයෙන් වළකින්නේ ය. ඒ අකුශලය වනාහි ආර්‍ය්‍යයන් වහන්සේලා ක්ෂමා කරවා ගැනීමෙන් සංසිඳවා ගත හැක්කේ ය. ආර්‍ය්‍යයන් වහන්සේ කෙනකු බව නො දැන වු වද චෝදනා කළහොත් ආර්‍ය්‍යෝපවාද කර්මය සිද්ධ වේ. ඉදින් යට මාර්‍ග ඵලයන්ට පැමිණ සිටින ආර්‍ය්‍යයකු මුත් තමා පැමිණ සිටින මාර්ගයට ඵලයට උසස් මාර්ග ඵලයකට පැමිණ සිටින ආර්‍ය්‍යයන් වහන්සේ නමක් හට චෝදනා කෙළේ වේ නම් ඒ ආර්‍ය්‍යයන් වහන්සේ ක්ෂමා කරවා ගන්නා තුරු මතු මාර්ග ඵලයන්ට පැමිණිය හැකි නොවේ.

ඉදින් තමා චෝදනා කළ ආර්‍ය්‍යයන් වහන්සේ කාලක්‍රියා කෙළේ වේ නම් උන්වහන්සේගේ සොහොන කරා හෝ ගොස් ක්ෂමා කරවා ගතයුතු බව කියා තිබේ. මේ ආර්‍ය්‍යෝපවාද කර්මය මාර්ගාධිගමයට අන්තරාය වෙනවා පමණක් නොව ඇතැම් විටෙක ඉහාත්මයෙහිම විපාක ද ගෙන දෙන්නේ ය. ඉමහත් රූප ශෝභාවෙන් යුක්ත වූ **"මහාකාත්‍යායන"** ස්ථවිරයන් වහන්සේ දැක මේ ශ්‍රමණයා මාගේ භාර්‍ය්‍යාව හෝ, මාගේ භාර්‍ය්‍යාවට මෙබඳු රූපයක් හෝ වේ නම් මැනවැයි සිතූ එක් සිටු කෙනෙක් එවේලේ ම ඒ අකුශලෙන් ස්ත්‍රියක් වූයේ ය.

**ආර්‍ය්‍යයන් වහන්සේලාට පමණක් නොව පෘථග්ජන වූ සිල්වත් ගුණවත් උත්තමයන්ට ගර්හා කිරීම ද බලවත් වූ පාපයකි. මේ කාලයේ සිල්වත් ගුණවත් භික්ෂූන් වහන්සේලාට පවා දුශ්ශීලයෝ ය, සොරුය යනාදීන් ගර්හා කිරීමට අපේ ඇතැම් බෞද්ධයන් පුරුදු වී තිබේ.** එය ඔවුන් තමාට කර ගන්නා වූ මහත් විපත්තියකි. ගුණවතුන්ට ගර්හා කිරීමේ විපාක පිළිබඳ විස්තර **'ගරු කළ යුත්තන්ට ගරු කිරීම'** යන තැන දක්වා ඇත.

Non-commercial distribution

**5. ආඥාව්‍යතික්‍රමණය.**

විනය පිටකයෙහි වදරන ලද බුදුරජාණන් වහන්සේ ගේ ආඥාපනත වූ ශික්ෂාපද බිඳ හැසිරීම ආඥාව්‍යතික්‍රමණ යයි. යම් භික්ෂුවක් ඒ ශික්ෂාපදයන්ගෙන් එකකුදු බිඳී නම් එයින් ඒ භික්ෂුවගේ ශීලය පලුදු වේ. කිලිටි වේ. එය ස්වර්ගමෝක්ෂයන්ට අන්තරායකර වේ. වත් මානත් පුරා අබ්භානකර්ම කිරීමෙන් හා ඇවැත් දෙසා ගැනුමෙන් එයින් වැළකිය හැකි වේ. පරාජිකා වූ භික්ෂුවට වනාහි එසේ ප්‍රතිකාරයක් නැත්තේ ය. එහෙත් පාරාජිකා වූ පසු තමා භික්ෂුවක් මෙන් ප්‍රතිඥා කරමින් නොසිට සාමණේර හෝ ගිහි හෝ වුවහොත් පාරාජිකා වීම ස්වර්ගමෝක්ෂාන්තරායකර නොවේ. එයට ඇත්තා වූ ප්‍රතිකාර ද ගිහිවීම හෝ සාමණේර වීමයි.

**මේ කාලයේ බොහෝ දෙනා ආගම නොදත් බැවින් පැවිදිව තැවත ගිහි වීම වරදක් කොට සලකති.** එය වැරදි හැඟීමකි. වරද නම් පාරාජිකා වී මහණකම නැතිවීමෙන් පසු සිවුරු නො හැර සිටීමයි. පාරාජිකා වූ නිසා හෝ තමාට මහණකම මනා කොට නො රැකිය හැකි නිසා හෝ සිවුරු හැර යාම යම් කිසි පාපයක් නොවේ.

මේ කාලයෙහි කිසි ප්‍රතිපත්තියක් නැතිව හිස මුඩු කරගෙන සිවුරු පොරවාගෙන, සිල්වතුන් උදෙසා පැරණි රජවරුන් විසින් පිදූ දේපල භුක්ති විඳිමින් නරකයට බර වී සිටින ඇතැම්හු සිවුරු හැර යත් නම්, එය ඔවුන්ගේ ස්වර්ග මෝක්ෂ සම්පත් ප්‍රතිලාභයට හා සර්වඥ ශාසනයට ද මහත් වූ උපකාරයකි.

මේ අන්තරායික ධර්මයන් හැර තවත් පාපයන් ඇත්තේ වී නමුත් ඒ කර්මයන්ගේ විපාක දනත්වයෙහි ඒකාන්තිකත්වයක් නැත්තේ ය. බොහෝ පව් කළ තැනැත්තාට වුව ද පින් කොට මරණින් මතු ස්වර්ගයට පැමිණීමට ඉඩ තිබේ. ඉදින් භාවනා කොට කෙලෙසුන් නසා රහත්ව නිවන් දුටුවේ නම් කරන ලද පව් කොතෙක් වුවත් ඒ සියල්ල **අහෝසිකර්ම**

Non-commercial distribution

භාවයට පැමිණේ. අන්තරායික වූ **ආනන්තර්‍යාදි කර්ම කළ තැනැත්තාට වනාහි** ඒ කර්මයන් ගේ විපාකයන් නො විඳ ස්වර්ගයට පැමිණීමට හෝ නිවනට පැමිණීමට නුපුළුන් බැවින් අන්තරායික කර්මයන් ගෙන් විශේෂයෙන් ම ආරක්‍ෂා විය යුතුය.

කය වචන සිත යන තුන හික්මවා ගන්නා තැනැත්තා වනාහි එබන්දකට නො පැමිණෙන බැවින් එය මංගල්‍යයක් කොට සලකන ලදී. දුශ්චරිතයෙන් වැලකීම් ලක්‍ෂණ වූ එය **'ශීලය'** වන බව ද **"ශීලානිශංස"** සියල්ල ද ඔහුට ලැබීමෙන් එය දෙව් මිනිස් සැප කෙළවර උතුම් නිර්වාණ සම්පත්තිය ද ලබා ගත හැකි මහඟු පුණ්‍ය කර්මයක් බැවින් ද කාය වාචා චිත්ත විනයනය (හික්මීම) **උතුම් වූ මංගලයකැයි ද** වදළ සේක.

Non-commercial distribution

# 10. යහපත් වචනය

**"සුභාසිතා ච යා වාචා එතං මංගල මුත්තමං"** යනුවෙන් දක්වන ලද සුභාසිත වචනය හෙවත් යහපත් වචනය නම් අංග පසකින් යුක්තවූ වචනයයි. දෙවියන් සහිත ලෝකයෙහි සකල සත්ත්වයන් විසින් ම තම තමාගේ මෙලොව පරලොව යහපත පිණිස කරන්නාවූ සැලකිය යුතු කටයුතු බොහෝ සෙයින් ඔවුනොවුන් කථාකර ගැනීමෙන් ම කරන්නාහු වෙති. බුදුවරයන් වහන්සේලා සත්ත්වයන්ට ස්වර්ග මෝක්ෂ සම්පත් දෙවා වදරන්නේ ද සුභාසිත වචනයාගේ මාර්ගයෙන් ම ය. වචනය මෙසේ ඉතාමත් සැලකිය යුතු වූ ද නිතර ම පාවිච්චි කරන්නා වූ ද දෙයක් බැවින් ඒ පිළිබඳව විශේෂයෙන්ම දැනගත යුතු වේ.

**"පඤ්චහි භික්ඛවෙ අඞ්ගෙහි සමන්නාගතා වාචා සුභාසිතා හොති. නො දුබ්භාසිතා අනවජ්ජා ච අනනුවජ්ජා ච විඤ්ඤූනං. කතමෙහි පඤ්චහි? කාලෙන ච භාසිතා හොති. සච්චා ච භාසිතා හොති. සණ්හා ච භාසිතා හොති, අත්ථ සංහිතා ච. මෙත්ත චිත්තෙන ච භාසිතා හොති"**

මේ වූ කලී අංගුත්තර පඤ්චක නිපාතයෙහි වදරන ලද "සුභාසිත සූත්‍රයයි" **1. සුදුසු කාලයෙහි කීමය. 2. සත්‍යයක් වීමය. 3. මොළොක් වීමය. 4. ප්‍රයෝජනවත් වීමය. 5. මෛත්‍රීසහගත සිතින් කීමය** යන අංග පසින් යුක්ත කොට කියන්නා වූ යම් වචනයක් වේ නම් එය රාගාදි දෝෂයන් ගෙන් මිදුනාවූ යහපත් වචනයක් වේය - යනු එහි සංක්ෂේප අදහසයි.

## 1. සුදුසු කාලයෙහි කීම

යම් වචනයක් සත්‍ය වූයේ වී නමුත් මොළොක් වූයේ වී නමුත් ප්‍රයෝජන වත් වූයේ වී නමුත් මෛත්‍රී සහගත සිතින් කියන ලදුයේ

Non-commercial distribution

වී නමුත් එය සෑම කල්හි ම කිය යුත්තේ නොවේ. ඊට සුදුසු කාලයක් ඇත්තේය. ඒ කාලය බලා සුදුසු කාලයෙහිම කිය යුත්තේ ය. ඉදින් නුසුදුසු කාලයෙහි කියන ලද්දේ නම් වචනය කොපමණ වටිනා වචනයක් වුව ද නිරර්ථක වචනයක් වේ. එය කීමෙන් ඇතැම් විට අසන්නා වූ තැනැත්තාට හෝ කියන්නා වූ තැනැත්තාට හෝ දෙදෙනාට ම හෝ අනර්ථ ද වන්නේ ය. මෙය එයට හොඳ නිදසුනකි.

පෙර එක් කලෙක **අප මහ බෝසතාණන් වහන්සේ** දිසාපාමොක් ආචාර්‍ය්‍යවරයෙක්ව මාණවකයන් පන්සියයකට ශිල්ප ඉගැන්වූහ. ඒ මාණවකයෝ එක්තරා කුකුළකු ගේ හඬලන ශබ්දයෙන් නැගිට දිනපතා ශිල්ප ඉගෙන ගනිති. කල්යාමෙන් වේලාව නො වරදවා හඬලන ඒ කුකුළා මළේ ය. ඉන්පසු ඔවුහු අනික් කුකුළකු සොයන්නාහු දිනක් දර සෙවීමට ගිය කල්හි සොහොනක සිටියා වූ කුකුළකු දැක ගෙනවුත් කූඩුවක දමා ඇති දැඩි කළෝ ය.

හඬලන වේලාව නොදන්නා වූ ඒ කුකුළා ඇතැම් දිනවල මහ රෑ හඬලන්නේ ය. ඇතැම් දින වල දී එළි වෙන්නට ඉතා ළංව හඬ ලන්නේ ය. බලවත් රාත්‍රියෙහි නැගිටි දිනවල තද නිදිමත නිසා මාණවකයන් හට ශිල්ප හදරන්නට නුපුළුවන් විය. එළිවෙන්නට ළංව හැඬලූ දිනවල ශිල්ප ගැනීමට කල් මදි විය. මේ ක්‍රමයෙන් කුකුළාගේ නො කල්හි හැඬලීම මාණවකයන්ගේ උගෙනීමට මහත් බාධාවෙක් විය. ඔවුහු කුකුළා නිසා ශිල්පයෙන් පිරිහුණෝ ය. එයින් කෝපයට පත් වූ මාණවකයෝ කුකුළා මරා දැම්මෝ ය. අකාලයෙහි හැඬලීම ඒ කුකුළාට හා උෟ සෑදූ මාණවකයන්ට ද යන දෙපක්ෂයට ම අනර්ථ වූවාක් මෙන් යහපත් වචනයක් වූවත් නුසුදුසු කල්හි කීමෙන් තමාට හා අන්‍යයන්ට ද ඇතැම් විට අනර්ථ ද වන්නේ ය.

## 2. සත්‍යයක් වීම

අසත්‍ය වචනය කීමට වනාහි සුදුසු කලක් නැත්තේ මය. එය කොපමණ මිහිරි වූයේ වී නමුත්, කොපමණ මෛත්‍රී සහගත සිතින් කියන ලද්දක් වූයේ වී නමුත්, යහපත් නොවේ. කියන වචනය

Non-commercial distribution

සත්‍යයක් ම විය යුතුය. සත්‍යය ප්‍රකාශ කිරීමෙන් තමාට අවාසි අමාරු කම් පැමිණිය හැකි අවස්ථා ද බොහෝ විය හැකියි. එබඳු අවස්ථාවන් හි උපායෙන් නිදහස් වීම නුවණැත්තන් ගේ සිරිතයි.

### 3. මොලොක් වීම

යම් වචනයක් සුදුසු කාලයෙහි කියන ලද්දේ වී නමුත් සත්‍යයක් ම වූයේ වී නමුත් අසන්නා වූ තැනැත්තාට අප්‍රිය වන පරිද්දෙන් රළුකොට කියන ලද්දේ වී නම්, එය වටිනා වචනයක් වූයේ වී නමුත් අසන්නා වූ තැනැත්තා නො පිළිගන්නේ ය. ඊට අවනත ද නො වන්නේ ය. එබැවින් සත්‍ය වූ ප්‍රයෝජනවත් වූ යමක් කියන කල්හි ද එය ඒ ඒ පුද්ගලයන් ගේ තරාතිරමේ හැටියට ඔවුන්ට ගරු නම්බු දීමෙන් හා ප්‍රිය උපදන්නා වූ ආකාරයෙන් මෘදුමොළොක් කොට ද කිය යුතුයි. එසේ කියන්නා වූ වචනයට කවරකු වුවත් පහසුවෙන් නමවා ගත හැකි වේ. අන්‍යයෝ එය සතුටින් පිළිගනිති. ඵරුෂ වචනය හෙවත් රළු බස මනුෂ්‍යයන් හට තබා තිරිසනුන් හට පවා පිළිකුල් උපදවන්නක් අප්‍රිය අමනාප වූවක් බව **“නන්දිවිසාල”** ජාතකයෙන් මොනවට ස්ඵුට වේ.

### තිරිසනුන් පවා
### ප්‍රිය වචනයට කැමති බව

පෙර **අප මහ බෝසතාණන් වහන්සේ** ගව යෝනියෙහි උපන් කලක දී එක් බ්‍රාහ්මණයෙක් එම ගවයාට “නන්දිවිසාල” යන නාමය තබා පුත්‍ර ස්ථානයෙහි තබා කැඳබත් ආදිය දී මහත් ප්‍රේමයෙන් ඇති කෙළේ ය. දිනක් බෝසතාණන් වහන්සේ, මේ බ්‍රාහ්මණතෙම මට බොහෝ උපකාර කරයි. මොහුට ද මාගේ බලය දක්වා ධනය ලබා දෙමි යි සිතා බ්‍රාහ්මණයාට කියනුයේ, බ්‍රාහ්මණය නුඹ යම් කිසි ධනවතකු කරා ගොස් මාගේ ගොනා එකට බැඳි බර පැට වූ ගැල් සියයක් අදින්නේ යයි කියා එසේ කරවීමට දහසක් ඔට්ටු කරවයි කීයේ ය. බ්‍රාහ්මණයා ද ගොස් එසේ කෙළේ ය. ඉක්බිති ගල් බොරළු ආදියෙන් ගැල් සියයක් පුරවා එකට බැඳ නන්දිවිසාල ගවයා යොදා බමුණා රියට නැග කෙවිට ඔසවා “අදු කූළෝ යි” රළු බසින් කීයේ ය. බෝසතාණන් වහන්සේ කූළු නො වූ මා හට

Non-commercial distribution

මොහු කුළෙකැයි කියන්නේ ය යි නොසතුටුව එක පයකුදු නො ඔසවා නිශ්චලව සිටියේ ය. බ්‍රාහ්මණයා දහසක් පැරදුනේ ය. බ්‍රාහ්මණ තෙමේ දහසක් කහවනු ගෙවා ගෙට ගොස් ශෝකයෙන් නිදා ගත්තේ ය.

බෝසතාණන් වහන්සේ ද ඇවිද අවුත් බ්‍රාහ්මණයාට කථාකොට බ්‍රාහ්මණය නිදන්නෙහි දැ යි ඇසී ය. බමුණා දරුව, දහස පැරදුනා වූ මට කවර නින්දෙක් දැයි කීයේ ය. එකල්හි බෝසතාණන් වහන්සේ බ්‍රාහ්මණය! මෙතෙක් කල් තොපගේ ගෙයි වාසය කළා වූ මා භාජනයක් බිඳීම හෝ කිසිවක් පැගීම හෝ නුසුදුසු තැනක මලමූත්‍ර කිරීම හෝ එක දවසකුදු කරනවා දුටුවේ දැයි ඇසී ය. බමුණා නැත දරුව ය යි කීයේ ය. එසේ නම් කුළු නො වූ මා හට නුඹ කුළෙකැ යි කීවේ කුමට ද? එබැවින් මම බර නො ඇද්දෙමි. වැරදීම වූයේ නුඹගේ වරදින් ය. එය මාගේ වරදක් නොවේ ය යි කියා නැවතත් දෙ දහසක් ඔට්ටු කර අදවන්නට සූදනම් කරන්නට කීයේ ය. බ්‍රාහ්මණයා ද එසේ කෙළේ ය. දෙවන වාරයෙහි බ්‍රාහ්මණයා පළමු පරිදි පරොස් බසින් නො කියා ඇදපන් හොඳ ගොනායි ආදරණීය බසින් කීවේ ය. ගවයා ගැල් සියය ඇද්දේ ය. බ්‍රාහ්මණයා දෙ දහසක් දිනා ගත්තේ ය. නන්දිවිසාල නම් වූ බෝසතාණන් වහන්සේ වනාහි තමා දරු ප්‍රේමයෙන් පෝෂ්‍ය කළ බමුණා කෙරෙහි මහත් මෛත්‍රියක් ඇත්තෙකි. එසේ වූ තැනැත්තා ගේ පවා සිත කලකිරීමට බමුණාගේ රළු වචනය හේතු විය. සම්බන්ධයක් නැත්තා වූ අන්‍යයන් ගේ සිත නො සතුටු වීම ගැන කියනු ම කිම? එබැවින් කියන සියල්ලක් ම අන්‍යයන්ට පිළිගැන්වීමට නම් මිහිරි කොට කිය යුතු.

## 4. ප්‍රයෝජනවත් වීම

යම් වචනයක් සත්‍ය වුවත් මොළොක් කොට කියන ලද්දක් වුවත් ප්‍රයෝජනයක් නැත්තා වූ වචනයක් වේ නම් එය සුභාෂිතයක් නොවේ. එබැවින් කීමෙන් ප්‍රයෝජනයක් නැත්තා වූ අනර්ථ කර වූ හිස් වචන කීමෙන් ද වැලකිය යුතුයි. දෙලොව දියුණුවට ඉවහල් වන ධර්මාන්විත ප්‍රයෝජනවත් දේ ගැන ම කථා බස් කිරීමට නිතර පුරුදු විය යුතුයි.

Non-commercial distribution

## 5. මෛත්‍රී සිතින් කීම

යම් වචනයක් සත්‍ය වූ ප්‍රයෝජනවත් වූ වචනයක් වූයේ වී නමුත් කියන්නා වූ කාලයෙහි මෛත්‍රී සහගත සිතින් ද කිය යුතු වේ. මෛත්‍රියෙන් තොරව කියන්නා වූ වචනය ද සාර්ථක දෙයක් වූයේ වී නමුත් අන්‍යයන්ට ප්‍රිය නො කරන්නා වූ වචනයක් වේ.

මෙසේ සුදුසු කාලයෙහි කියන ලද්දා වූ, සත්‍ය වූ, මොළොක් වූ, ප්‍රයෝජනවත් වූ, මෛත්‍රී සහගත සිතින් කියන ලද්ද වූ වචනය ම ඒකාන්තයෙන් සුභාෂිතයක් හෙවත් යහපත් වචනයක් වේ මය. එය දෙලොව දියුණුවට හේතුවන බැවින් උතුම් මංගල ධර්මයක් ද වන්නේ ය.

### සුභාෂිත වචනය

සුභාෂිත වචනය මෙසේ දියුණුවට හේතු වන්නක් වුව ද දුර්භාෂිතය දියුණුවට හේතු වන්නක් නො වේ ම ය. එබැවින් බොරුකීම කේලාම්කීම එරුෂ වචන කීම ප්‍රලාප බිනීම යන චතුර්විධ වූ වාග් දුශ්චරිතයෙන් වෙන්විය යුතු ය.

### අනුන් කරන දේට
### ඇඟිලි නො ගසා සිටිනු බැරි පිරිසක්

අනුන් කරන කියන දේට ඇඟිලි නො ගසා තම කායීය පමණක් කළ නො හැකි අන්දමේ පුදුම දුබලකමක් ජාතික වූත් ආගමික වූත් සේවයෙහි නියුක්ත අපේ බොහෝ දෙනා තුළ දක්නට ලැබේ. එය ජාතික පරිහානියේ ලක්‍ෂණයෙකි.

**කෙනෙක්** ජාතික ප්‍රශ්න පිළිබඳව කැක්කුමක් ඇතිව ජාත්‍යාලයෙන් මත් වී ජාතික ප්‍රශ්න විසඳීමෙහි යෙදෙති. එය උසස් ගුණයකි. එහෙත් ඒ අය තමනට අයිති කටයුත්ත ගැන පමණක් නො බලා රටේ තවත් අය කරන යම් යම් දේ බලා ඒවාට ඇනුම් පද කියනු බොහෝවිට දක්නට ලැබෙන්නකි. "භාවනාව නම් හොඳ තමයි. නමුත් දැන් අප මූණලා සිටින්නේ භාවනා කර කර සිටිය යුතු අවස්ථාවකට නොවේ" මේ එවැනි ජාති හිතෛෂී ඇතමුන් පවසන වචනය.

Non-commercial distribution

**තව කෙනෙක්** සුරාව සූදුව ආදි දුසිරිත් මර්ධනයෙහි පුරෝගාමීව දේශනා කරති. එය ද හොඳ සේවයකි. එහෙත් අපරාධ මර්ධනයෙහි නියැලුණු ඒ අයට රටේ සෙසු අය යෙදී සිටින හැම ව්‍යාපාරයක් ම නො මනා හැටියටය පෙනෙන්නේ. එහෙයින් එවැනි ඇතැම්හු "අද භික්ෂූන් වහන්සේ නොමඟ ගොස්ය, උන්වහන්සේ පන්සලේ ධර්මශාලාවටත්, දන් ශාලාවටත්, විහාරයටත්, යට වී සිටිති. ගමේ කෙතරම් අපරාධ දුශ්චරිත සිදුවුවත් උන්වහන්සේට කමක් නැත. පන්සල හද ගත්තොත් උන්වහන්සේට හොඳට ම ඇත" යනුවෙන් පවසති.

**තවත් කෙනෙක්** මෛත්‍රියත් කරුණාවත් ලොව පුරා පැතිරවීමෙහි නියැළී සිටිති. නිතර දෙසන දේශනාව ද දුප්පතාට අසරණයාට පිහිට විය යුතු බව පැවසෙන දේශනාවක් ම ය. එය ද මහඟු ගුණයෙකි. එහෙත් ඒ බෝසත් ගුණය රටට පෙන්වන මෛත්‍රීවාදියා ඇතැම්විට රටේ ලොකු ම තැනක මහා ධනවතකුගේ නිවසක ම නතරව හොඳින් සැප පහසු ලබමින් නිතර ඔවුන්ට ම අනුශාසනා කිරීමෙහි නියැලී වෙසේ. කලාතුරකින් වත් දුප්පත් කෙනකුට ධර්ම දේශනාවකට වැඩමවා ගැනීම පවා අති දුෂ්කරය. එවැනි කාරුණිකයන් ඇතැම් විට මෙසේ තෙපලනු ඇසේ. "පින්වත්නි අප හැමදෙනා ම මේ ලෝකයෙහි සිටින හැම ආගමිකයන් ම හැම ජාතිකයන් ම එක ම පවුලකට අයත් පිරිසක් සේ සහෝදර පිරිසක් සේ සිතා මතා කටයුතු කළ යුතු ය. ඒ නිසා ජාති භේද ආගම් භේද භාෂා භේද ඇතිකොට රටේ සාමයට බාධා වන ලෙස කටයුතු කිරීම නුසුදුසු ය.

**ඇතැම් කෙනෙක්** උසස් ආගමික සේවයක නියුක්තව වෙසෙති. එහෙත් එය හොඳ අදහසින් ම නො කරන බැව් ඇතැම්විට ඇසෙන වචනවලින් පෙනේ. "පින්වත්නි! තමුන්නාන්සේලා බුද්ධාගම අදහනවාය කියමින් කරන්නේ කුමක් ද? අද තිබෙන්නේ ගඩොල් බුද්ධාගමක්. කොතෙකුත් වෙහෙර විහාර හදති. පන්සල් ගොඩනගති. දන්ශාලා, ධර්මශාලා, වැසිකිළි තනති. බුද්ධාගම යි කියන්නේ ඕවාටද? පින්වත්නි, අද බොහෝ දෙනෙක් නිවන් යෑමට අදහස්, කරන්නේ ඕවා කරලයි. පන්සලේ ගේට්ටුව බන්දවාලා පහසුවෙන් නිවනට ඇතුල් වීමට සූදානම් වෙනවා. ගේට්ටුව

Non-commercial distribution

බැන්දවූ කල නිවනේ දොර ඉබේට ම විවෘතවෙයි කියා සිතනවා ද? ඕවා බුද්ධාගම නොවෙයි. පින්වත්නි බුද්ධාගම නම් භාවනා කිරීම යි" මේ එවැනි ඇතැමුන් පවසන වචනය.

**අධ්‍යාපනික කටයුතුවල යෙදුණු තවත් සමහරු** "පින්වත්නි අද බොහෝ දෙනා වෙහෙර විහාර පන්සල් තැනවීම ම උසස් පින්කම් ලෙස සිතති. නෑ පින්වත්නි මෙන්න මේ මහත්මයා වාගේ පාඨශාලාවක් තැනුවොත් එය පන්සල් හැදීමට වඩා බොහෝ අනුසස් ඇති පින්කමක් බව කිව යුතුයි" මේ අධ්‍යාපනික කටයුතුවල නිරතවූවන් විසින් ඇතැම් විට පිට කරන වචනය.

**මේ දැක්වූයේ** මෙකල සමාජ සේවක උතුමන්ගේ මුවින් නිතර පිටවන අදහස් කීපයකි.

රටට ජාතියට ආගමට මොනයම් සේවයක් නමුත් කිරීම ඉතා උසස් දෙයක් ලෙස පැවසිය යුතු ය. එය රටේ යහපත පිණිස පවත්නා බැවිනි. එහෙත් අපේ සමාජ සේවක උතුමන් තුළ යට දැක් වූ දුබලකම බොහෝ දුරට බලපානු දක්නට ලැබේ. එහෙයින් ඒ කව්රුන් විසින් වුව ද කරනු ලබන සේවයෙහි වටිනාකම බොහෝ දුරට හීන දීන වී තිබේ.

තම තමා විසින් කරනු ලබන සේවයන් - ගෙනයනු ලබන ව්‍යාපාරයන් ඉතා ම උසස් හැටියටත්, අනුන් කරන සෙසු හැම දෙයක් ම පහත් හැටියටත් සිතා රටට ලොකු ම සේවය කරන තැනැත්තා තමා ම යයි සිතතොත් එයට වඩා ලොකු මුළාවක් තවත් නැතැ යි කිව යුතුය.

කරුණු මෙසේ හෙයින් කිසිවකු හටත් පීඩාවක් ඇණුමක් නො වන ලෙසට තම තමන්ගේ වචනය පාවිච්චි කළ යුතු බැවි එවැනි සමාජ සේවක උතුමන් විසින් සැලකිය යුතුය. එවිටය තමන් කරන සේවයෙහි නියම ප්‍රතිඵලය ලැබිය හැක්කේ.

## සුභාෂිතය හා
## දුර්භාෂිතය පිළිබඳ වදාළ ධර්ම පද

මෙහිලා සුභාෂිතය හා දුර්භාෂිතය පිළිබඳ වූ මෙහි එන කරුණු ද සිහිපත් කිරීම මැනවි.

Non-commercial distribution

**යො නින්දියං පසංසති - තංවා නින්දති යො පසංසියො.**
**විචිනාති මුඛෙන සො කලිං - කලිනා තෙන සුඛං න වින්දති**

යමෙක් නින්ද කටයුත්තාට ප්‍රශංසා කෙරේද, පැසසිය යුතු වූ යමකුට නින්ද කෙරේද, හෙතෙම කටින් පව් රැස් කෙරේ. ඒ පාපය කරණකොට ගෙන හෙතෙම සැප නො ලබයි.

(අංගුත්තර නිකාය)

**පුරිසස්ස හි ජාතස්ස කුඨාරී ජායතෙ මුඛෙ**
**යාය ඡින්දති අත්තානං - බාලො දුබ්භාසිතං භණං**

ලොවැ උපන් මිනිසා ගේ කටේ (දුර්භාෂිතය නැමති) කෙටේරියක් හටගනී. අනුවණ මනුෂ්‍යයා දුර්භාෂිත වචනයන් කියා ඒ හේතුවෙන් තමාව ම කපාගෙන විපතට පැමිණේ.

(සංයුත්ත නිකාය)

**මුඛං පද්ම දලාකාරං - වාචා චන්දන ශීතලා.**
**මධූ තිෂ්ඨති ජිහ්වාග්‍රෙ - හෘදයේෂූ හලා හලං.**

මුහුණ නෙළුම් මලක් සේ ප්‍රියාකාරයෙන් සරසා ඇත. වචනය සඳුන් මෙන් සිසිල් ය. දිවග මී පැණි ඇති සේ තෙපුල මිහිරිය. හෘදයාභ්‍යන්තරයෙහි ඇත්තේ හලාහල විෂ වැනි නපුරු අදහස් ය. අනුන්ට නපුරක් විපතක් කිරීමේ සිතිවිලි ය.

(පැරණි පඬුවන්)

**සුදස්සං වජ්ජං අඤ්ඤෙසං - අත්තනො පන දුද්දසං**
**පරෙසං හි සො වජ්ජානි - ඔපුණාති යථාභුසං.**

අනුන්ගේ ඉතා සුළු වූ වරදක් වුවත් ඉතා පහසුවෙන් දැක්ක හැකි ය. තමාගේ ඉතා මහත් වරදක් වුවත් අමාරුවෙන් දත යුතු ය. (තමාගේ වරද පහසුවෙන් නොපෙනේ) නිතර ම අනුන්ගේ දොස් සොයන තැනැත්තා තමන්ගේ මහ වැරදි යටකොට සඟවා තබා, අනුන්ගේ ඉතා ම සුළු වරද පවා උස් තැනක

Non-commercial distribution

නැඟී සිට බොල් පොළ පොළා හරින්නකු මෙන් රට පුරා පතළ කර හරින්නේ ය.

(ධම්ම පදය)

**තමෙව වාචං භාසෙය්‍ය - යායත්තානං න තාපයෙ**
**පරෙ ච න විහිංසෙය්‍ය - සා වෙ වාචා සුභාසිතා.**

තමන්ගේ සිත නො තවන, අනුන්හට ද විපතක් නපුරක් නො වන යම් වචනයක් වේ නම් එබඳු වචනය සුභාෂිත නම්. එබඳු වචනයක් ම කිය යුත්තේ ය.

(සංයුත්ත නිකාය)

Non-commercial distribution

# 4. වන ගාථාව

**මාතාපිතු උපට්ඨානං - පුත්තදාරස්ස සඞ්ගහො**
**අනාකුලා ච කම්මන්තා - එතං මඞ්ගලමුත්තමං.**

**මාතාපිතු උපට්ඨානං** - ආහාර පානාදියෙන් මව්පියන්ට උපස්ථාන කිරීම දඃ **පුත්තදාරස්ස සඞ්ගහො** - දරුවන්ට හා භාර්‍ය්‍යාවන්ට සංග්‍රහ කිරීමදඃ **අනාකුලා ච කම්මන්තා** - නිරවුල් කර්මාන්තයෝ ද යනඃ **එතං** - මෙයඃ **උත්තමං මඞ්ගලං.** - උතුම් මඟුලිඃ

මේ වූ කලී මංගල ධර්ම වදළ සිව්වන ගාථාව හා එහි පදාර්ථයයි. මේ ගයින් ද අප බුදුපියාණන් වහන්සේ දෙලෝ දියුණුව පිණිස පවත්නා උතුම් මංගල ධර්ම තුනක් වදළහ. ඒ මෙසේ යඃ—

1. **මව්පිය උපස්ථානය**
2. **අඹුදරුවන්ට සංග්‍රහ කිරීම**
3. **නිරවුල් කර්මාන්ත** - යනුයි.

Non-commercial distribution

## 11. මව්පිය උපස්ථානය.

**"බ්‍රහ්මාති මාතා පිතරො - පුබ්බා චරියාති වුච්චරෙ**
**ආහුණෙය්‍යා ච පුත්තානං - පජාය අනුකම්පකා"**

මේ වනාහි අප බුදුපියාණන් වහන්සේ මව්පියන් ගුණ වැණූ මහඟු දේශනාවකි. මව්පියෝ බ්‍රහ්මයෝ යයි ද, පූර්වාචාර්‍ය්‍යයෝ යයි ද ආහුණෙය්‍යයෝ යයි ද, ප්‍රජානුකම්පකයෝ යයි ද, බුද්ධාදි සත්පුරුෂයන් විසින් කියනු ලැබෙති - යනු එහි අදහසයි.

**බ්‍රහ්ම යනු මව්පියනට නමෙකි**. යම් සේ මහා බ්‍රහ්ම තෙමේ ලෝකයා කෙරෙහි මෛත්‍රී, කරුණා, මුදිතා, උපේක්‍ෂා යන ධර්ම සතර පවත්වන්නේ ද, එමෙන් මව්පියෝ ද සිය දරුවන් කෙරෙහි එකී ධර්ම සතර පවත්වති. එබැවින් ඔවුහු දරුවන්ගේ බ්‍රහ්මයෝ ය. දරුවා මව් කුසැ වෙසෙන කල අපගේ දරුවා කවද දකිමුදැ යි ඔවුන්ට දරුවා කෙරෙහි මෛත්‍රිය උපදී. මව් කුසින් බිහිවූ තැන් සිට උඩුකුරුව හෝනා කුඩා දරුවා මැසි, මදුරු, හෝහපුටු, උකුණු, මකුණු ආදීන්ගෙන් පීඩා ලැබ හෝ සාපිපාසාදි දුකින් හෝ හඬන කල ඒ හඬ ඇසූ මවුපියන්ට මහත් වූ කරුණාව ඇතිවේ. දරුවන් වැඩී සුරතල් බස් කියමින් ක්‍රීඩා කරන කාලය පැමිණි කල්හි ඔවුන්ට ඒ ගැන මහත් සතුට වූ මුදිතාව පහළ වේ. දරුවා වැඩිවිය පැමිණ පවුල්ව වෙන්ව වෙසෙන කල දැන් අප දරුවාට ස්වශක්තියෙන් ජීවත්විය හැකියයි මවුපියන් තුළ දරුවා කෙරෙහි මධ්‍යස්ථතාවය වූ උපේක්‍ෂාව පහළ වේ. මෙසේ මහා බ්‍රහ්මයා හා සමාන පැවතුම් ඇති බැවින් මවුපියෝ දරුවනට බ්‍රහ්මයෝ වෙති.

**පූර්වාචාර්‍ය්‍ය යනු ද මවුපියනට නමෙකි**. බාල වියෙහි සිටි දරුවා යහපත් වූ හෝ අයහපත් වූ හෝ කිසිවක් නො දන්නෙකි. ඔහු

Non-commercial distribution

කෙමෙන් හොඳ නරක දත් කෙනෙක් වනුයේ මවුපියන් ගෙන් උගෙණීම ලැබීමෙනි. මවුපියෝ දරුවා කුඩා කලැ සිට ම පුත! මෙ-සේ හිදිය යුතුය, මෙසේ නිදිය යුතුය. මෙසේ යා යුතුය, මෙසේ අනුභව කළ යුතුය, මේ ඔබ පියාය, මේ මවය, මේ සොහොයුරාය, මේ සොහොයුරියය, මේ දෑ කළ යුතුය, මේ දෑ නො කළ යුතුය යනා-දීන් කුල සිරිත් ඈ සදචාර ගුණධර්ම පිළිබඳ නන් වැදෑරුම් උවදෙස් දී දරුවන් හික්මවති. එහෙයින් ඔවුහු පූර්වාචාර්‍ය්‍යයෝ ද වෙති.

**ආහුණෙය්‍ය යනු ද මවුපියනට නමෙකි**. දරුවා දස මසක් මවු කුසින් උසුලා ගෙන සිට බිහිවූ ද පටන් දිවා රෑ දෙක්හි නිදි නො ලැබ පිළිකුල්වූ සෙම් සොටු මල මූත්‍රාදිය පවා කැත නො සිතා සියතින් ම ඉවත් කිරීමෙන් ද, තම ලේ කිරි කොට පෙවීමෙන් ද අත් පා ආදිය කොර පිළු වන්නට නොදී මනාකොට ඇතිදැඩි කරති. මහත් වූ ප්‍රේමයෙන් තමන් සාගින්නෙන් පෙළෙමින් වුව ද, ලද දෙයක් දරුවනට කැවීමෙන් පෙවීමෙන් ද, ප්‍රණීත දැයක් ලද ද තමන් පරිභෝග නො කොට ඔවුනට කැවීමෙන් - පෙවීමෙන් ද, රෝග පීඩාදියෙහි දී සිය දිවි නො තකා වෙහෙසීමෙන් ද, සියයක් කටයුතු ඇත ද ඒ හැම පිරිමසා ගෙන කිරීමෙන් ද, වෙහෙස වී උපයා ගත් ධනය ඔවුන් උදෙසා ආරක්‍ෂාකර තැබීමෙන් ද, මේ ආදි වශයෙන් මවුපියෝ දරුවනට බොහෝ උපකාරීහු වෙති. ඒ බැවි **බහුකාරා භික්ඛවෙ! මාතා පිතරො පුත්තානං ආපාදකා පොසකා ඉමස්ස ලොකස්ස දස්සතාරො"**

"මහණෙනි! මවුපියෝ දරුවනට බොහෝ උපකාර ඇත්තෝ ය, ජීවිතය රකින්නෝ ය, පෝෂ්‍ය කරන්නෝ ය, මේ ලෝකය දක්වන්නෝ ය" යනුවෙන් වදළහ.

මෙසේ මහෝපකාරී වූ මවුපියෝ **"මාතාපිතු ගුණො අනන්තො"** යි වදළ පරිදි ආකාශය සේ අනන්ත වූ ගුණයෙන් යුක්ත වූවාහු වෙති. එහෙයින් ම ඔවුහු දරුවන් විසින් වෙහෙස වී පිළියෙළ කළ සියලු පූජා දුර සිට වුව ද ගෙනවුත් පිළිගැන්වීමට සුදුසු බැවින් ආහුණෙය්‍යයෝ ද වෙති.

**ප්‍රජානුකම්පක යනු ද මවුපියනට නමෙකි** මවුපියෝ ඉත සිතින් දරුවනට අනුකම්පා කරන බැවින් ප්‍රජානුකම්පකයෝ වෙති.

Non-commercial distribution

මවුපියෝ දරුවන්ගෙන් කොතෙක් ගැහැට ලද ද ඒ හැම ඉවසා ඔවුනට අනුකම්පා කරති. තමන් නැසීමට තැත් කරන දුෂ්ට දරුවනට පවා අභිවෘද්ධිය ම සලසති. මෙහිලා **බිම්සර** රජතුමාගේ චරිතය හොඳ නිදසුනකි. හේ **අජාසත්** නම් සිය පුතු මවු කුසැ සිටිය දී සිය උරයෙහි ලේ බීමට බිසවට ඇති වූ දොළ සංසිඳවීය. ඒ අසා නිමිති දතුවෝ "මහරජ! ඔබගේ කුමරු ඔබ මරා මෙනුවර රජ වෙති" යි කීහ. එහෙයින් ම (ඉපදීමට පළමුව සතුරු වූ හෙයින්) එම කුමරුට අජාසත් යයි ද නම් කළහ. රජ කෙරෙහි මහත් භක්ති ඇති බිසවු තොමෝ කුසහොත් පුතු නැසීමට තැත් කළා ය. එය ඇසූ රජ කිපී පුතු රැකීමට රැකවල් ද තැබීය. පසු කලෙක දිනක් රජතුමා ඇමති ගණයා පිරිවරා සිහසුන අරා හුන් කල අතැඟිල්ලෙහි ගෙඩියක් සෑදී මහත් වේදනාවෙන් හඬමින් සිටි පුතු ගෙන්වා නළවමින් ඇඟිල්ල කටට ගෙන උරමින් සිටි කල ගෙඩිය පිපිරී කටපුරා සිටි සැරව පවා ඉවත නො දමා ගිළීය. පුතු වැඩිවිය පැමිණ තමා නසා රජ වීමට තැත් කළ විට ද ඕහට අනුකම්පා කොට සිය රජය ද දිණ. පසුව ඔහුගෙන් ම මරණයට ද පත් විය. මෙසේ බිම්සර රජතුමා සිය පුතුගෙන් මතු නොයෙක් ගැහැට ලැබ මරණයට ද පත්වන බව දැන දැන ද ඔහුට අනුකම්පා කොට ඔහුගේ අභිවෘද්ධිය ම සැලසීය. මවුපියෝ දරුවනට කෙතරම් අනුකම්පා කෙරෙත්ද යනු මින් දත හැක. අනන්ත ගුණ ඇති මව්පියන් කෙරෙහි දරුවන් විසින් පිළිපැදිය යුතු ආකාරය දක්වනු සඳහා මෙසේ වදරණ ලදී.

## මව්පියන් කෙරෙහි පිළිපැදිය යුතු පිළිවෙළ

**"තස්මාහි නෙ නමස්සෙය්‍ය**
**සක්කරෙය්‍යාථ පණ්ඩිතො**
**අන්නෙන අථ පානේන**
**වත්ථෙන සයනේන ච**
**උච්ඡාදනේන නහාපනේන**
**පාදනං ධොවනේන ච"**

මෙසේ අනන්ත ගුණ ඇති බැවින් නුවණැත්තේ ඒ මවුපියන්ට නමස්කාර කරන්නේ ය. ආහාරයෙන් ද, පානයෙන්ද, සයනයෙන්

Non-commercial distribution

ද, ඇඟ ඉලීමෙන්ද, නැවීමෙන් ද, පා සෝදා දීමෙන් ද, සත්කාර කරන්නේ ය යනු එහි අදහසයි.

වැඩිවිය පැමිණ ධන සැපයීමාදිය කරන්නා වූ දරුවන්ට මිස, ළමයින්ට මවුපියන්ට ආහාර පානාදියෙන් සංග්‍රහ කළ නො හැකිය. වැඳීම නම් ඔවුන්ට ද කළ හැකි ය. මවුපියන්ට වැඳීම දරුවන්ට මවුපියන් විසින් ම පුරුදු කරවිය යුතු ය.

**වන්දනා ක්‍රම කිහිපයකි**. දෙ දනය දෙ වැලමිටය නළලය යන පස් තැන බිම පිහිටුවා කරන වන්දනාව අතිශයින් ගරු කළ යුත්තන්ට කරන ශ්‍රේෂ්ඨ වන්දනාවයි. මවුපියන්ට ද එසේ වැඳිය යුතුය. එසේ ම මිස අන් අයුරකින් නො වැඳිය යුතුයයි ද නො සිතිය යුතුය. සිටගෙන දෑත් එකතු කොට හිස නමා කරන වන්දනාව ද සුදුසු වන්දනා ක්‍රමයකි. සෑම තැනකදී ම කළ හැකි වූ ද නිතර කළ හැකි වූ ද වන්දනාව එයයි. එබැවින් ගෙයින් පිටත යනවිට එසේ වැඳ මවුපියන්ගෙන් අවසර ගෙන පාසල් ආදියට යන්නටත්, මවුපියන් පිටත ගොස් එනු දුටු විට එසේ වැඳ පිළිගැනීමටත්, දරුවන්ට පුරුදු කරවිය යුතු. යටකී පරිදි පසඟ පිහිටුවා වැඳීමට සුදුසු අවස්ථාවන්හි එසේ වැඳීමට ද පුරුදු කරවිය යුතුයි.

**දෙමා පියනට ණයකාරයන් වූ දරුවනට ඒ ණයින් නිදහස් වීම දුෂ්කර බැව්**.

මවුපියන් සේ දරුවනට උපකාර වූ කිසිවකු ලොවැ නැති බැවින් ජීවත්වන හැම දරුවෝ ම මවුපියනට ණය කාරයෝ වෙති. එම ණයින් නිදහස්වීම එතරම් පහසු ද නොවේ. ඒ බැවිඃ–

**"ද්වින්නාහං භික්ඛවෙ! න සුප්පතිකාරං වදාමි. මාතුච්ච පිතුච්ච"** "මහණෙනි දෙදෙනකු හට උපකාර නො කට හැකියයි, මම වදාරමි. එනම් මව්පිය දෙදෙනා යයි" වදළ බුදු වදනින් එය ස්ඵුට වේ.

**තව ද** "මහණෙනි යම් දරුවෙක් මවුපියනට ප්‍රත්‍යුපකාර කරමියි හෙවත් ණයෙන් නිදහස් වෙමියි සිතා මවුපියන් කර හිඳුවාගෙන සිය වසක් ඔවුනට සියලු උපස්ථාන කෙළේ වී නමුත්

Non-commercial distribution

ඔහුට ලැබුණු උපකාරවලට සරිලන උපකාර කරන ලද්දේ නො වේය. යමෙක් මුළු පොළොව බෙර ඇසක් සේ සමකොට ඉන පමණට සත්රුවන් පුරවා දෙදහසක් කොදෙව් පිරිවර කොටැ'ති සතර මහා ද්වීපයට අධිපති වූ සක්විති රජයෙහි මවුපියන් පිහිටුවා පූජා සත්කාර කෙරේ ද, එසේ වුව ද මවුපියනට උපකාර කළේ නො වේ"යයි ද වදාළහ.

**ණයෙන් නිදහස් වන ක්‍රමය.**

**තව ද මහණෙනි!** යම් දරුවෙක් අශ්‍රද්ධාවත් වූ මවුපියන් ශ්‍රද්ධා සම්පත්තියෙහි පිහිටුවා ද, දුශ්ශීල වූ මවුපියන් **ශීල සම්පත්තියෙහි** පිහිටුවා ද, මසුරු වූ මවුපියන් **ත්‍යාග සම්පත්තියෙහි** පිහිටුවා ද, මෝඩ වූ මවුපියන් **ප්‍රඥා සම්පත්තියෙහි** පිහිටුවා ද, මෙතෙකින් මවුපියන්ට ප්‍රත්‍යුපකාර කරන ලද්දේ වන්නේ ය" යනුවෙන් ණයෙන් නිදහස් විය හැකි ක්‍රමය ද වදාළහ.

එබැවින් මවුපිය උපස්ථානය කරන සත් පුරුෂයෝ අහාර පානාදියෙන් උපස්ථාන කිරීමෙන් පමණක් නො නැවතී, සිය මවුපියන් තුළ ශ්‍රද්ධා සිලාදි ගුණ ධර්ම නැත්තාහු නම් ඔවුන්ට තමා විසින් අනුශාසනා කොට හෝ ධර්මධරයන් ලවා අනුශාසනා කරවා හෝ ශ්‍රද්ධාදි ගුණ ධර්මයන් ද ඇති කර දිය යුතු ය. එසේ කරන්නා වූ දරුවා මවුපියන්ගෙන් ලත් උපකාරයට සෑහෙන්නට උපකාර කළ කෙනෙක් වන්නේ ය.

**පැරණි උතුමන් මාපියන් පිදූ සැටි.**

මෙසේ මහත් උසස් ලෙස වදළ මවුපිය උපස්ථානය පැරණි අපේ මුතුන් මිත්තෝ කොතරම් ගරු කළාහු ද? යනු සිය මවට චෛත්‍යයකට මෙන් පිදූ **"අටවෙනි අග්බෝ රජ"** තුමාගේ චරිතයෙන් දත හැකි වේ.

**අප මහ බෝසතාණෝ** ද මවුපිය උපස්ථානය ඉතා උසස් ලෙස පුහුණු කළහ. **ඇත්රජව** ඉප ද අඳ මව පෝෂ්‍ය කළ අයුරු "මාතු පෝෂක ජාතකයෙන් ද," **සාම කුමරු** කල අඳ මවපියන් පෝෂ්‍ය කළ අයුරු "සාම ජාතකයෙන් ද," **වඳුරුව ඉපිද** මවු වෙනුවෙන් සිය දිවි

Non-commercial distribution

පිදූ අයුරු "නන්දිය ජාතකයෙන් ද" පැහැදිලි වේ. මෙසේ මවුපියන් උදෙසා දිවි පිදූ වාර අපමණය. **සියල්ල දත් බුදු බවට පැමිණි පසු ද උන් වහන්සේ** මවුපිය උපස්ථානය වැණීමෙන් පමණක් නො නැවතී කිරීමෙන් ද ලොවට ආදර්ශ දුන්හ.

තමන් වහන්සේ ඉපිද සතියකින් මිය ගොස් දෙව් ලෝ උපන් **මව සොයා දෙව් ලෝ වැඩ** දම් දෙසා සෝවාන් පලයෙහි පිහිට වූහ. **පියා සොයා** ගොස් දම් දෙසා මිය යෑමට ප්‍රථම රහත් පලයෙහි පිහිට වූහ. තමා වැඩූ **සුළු මවු වූ** මහා ප්‍රජාපතී ගෞතමියට මහණ උපසම්පදාව දෙවා උතුම් රහත් පලයෙහි පිහිට වූ හ.

උන්වහන්සේගේ අගසව් දම් සෙනෙවි **'සැරියුත්'** මහරහතන් වහන්සේ ද පිරිනිවීමට ප්‍රථම සිය මිසදිටු මුව සොයා ගොස් දම් දෙසා පෝසාවනික මූල (හද වඩා ගැනීම වෙනුවට දෙන මුදලක්) වශයෙන් ඇය උතුම් සෝවාන් පලයෙහි පිහිට වූ හ.

**මව්පියන්ට අද සලකන හැටි.**

තමන්ට කළ අනන්ත උපකාර ඇත්තා වූ මවුපියන්ට සෑහෙන ප්‍රත්‍යුපකාර කිරීම දුෂ්කර වුව ද තමාට හැකි පමණින් මුත් උපකාර කොට යමෙක් මවුපියන් සතුටු නො කෙරේ නම් එය බරපතල වරදකි. එය කොපමණ බරපතල වරදක් කොට සලකන ලද දැයි කිවහොත් **පෙර මවුපියන් දුකසේ සිටිය දී ඔවුන් ගැන නො සලකා තමා සැප විඳී නම් එබඳු දරුවන් මරා දමන ලෙස නීතියක් ද බමුණන් අතර පැවතුණේ** ය. එයින් එහි බරපතල කම දත හැකි වේ. මේ කාලයේ එබඳු නීතියක් නැති නිසාදෝ පොහොසත් මවුපියන්ගේ දරුවෝ මවු - පියන්ගේ බූදලයෙන් තමාට ලැබෙන කොටස අඩුවේය යන බියෙන් දෝ සලකත් මුත් කිසිවක් නැති දුප්පත් මවුපියන්ට දරුවන්ගේ ගෙවලට ගිය කල පවා නො සලකති. මවුපියන්ට සැලකීම හොඳින් කෙරෙන පවුල් ඇත්තේ ස්වල්පයකි. සමහරෙක් මවුපියන්ට නො සැලකීමට හේතුව කොට ඔවුන්ගේ යම් කිසි වරදක් දක්වති.

**මවුපියන් ගේ යම්කිසි වරදක් ඇති වුවත් ඒවා ඉසීමෙන් දරුවන් විසින් මවුපියන්ට සත්කාර කළ යුතුමය**. මවුපියන් ගෙන්

Non-commercial distribution

දරුවන්ට වන වරදවලට වඩා මහත් වූ වැරදි දරුවන්ගෙන් මවුපියන්ට සිදුවෙයි. ඉදින් මවුපියෝ අකීකරුකම ආදි දරුවන්ගේ වරද ගෙන ඔවුන්ට සංග්‍රහ නොකර හරිත් නම් අද ලෝකයේ ජීවත්ව සිටින්නන් ගෙන් දසයෙන් පංගුවකුත් මේ ලෝකයෙහි නොවන්නේ ය. වැඩි දෙනෙක් මවුපියන්ගේ නො සැලකීම නිසා මිය යන්නාහු ය. මවුපියෝ වනාහි දරුවා කොපමණ මහත් වරදක් කළත් ඔහු අත නො හැර පෝෂණ කරත්මය. එසේ වූ මවුපියන්ගේ යම්කිසි වරදක් ගෙන මවුපියන්ට සංග්‍රහ නො කර හැරීම මහත් වූ වරදකි. මවුපියන් යම් වරදක් කළත් ඔවුන් කුඩා කාලයේ කළ අප්‍රමාණ ගුණස්කන්ධය කෙසේ නැති වේද, නොවේ ම ය.

### මාපියන් සතු දේපල

මේ කාලයේ සමහර කෙනෙක් 'මවුපියෝ අසවලාට දේපලවලින් වැඩි කොටසක් ලියා දුන්නාහුය. මට දුන්නේ ස්වල්පය, නැතහොත් මට කිසිවක් ලියා දුන්නේ නැත. වැඩි කොටස් ලියවා ගත්තවුන් විසින් හෝ මව්පිය උරුමය ලබා ගත්තවුන් විසින් හෝ මවුපියන්ගේ කටයුතු කළ යුතුය. මා විසින් නොකළ යුතුය' කියමින් මවුපියන්ට නො සලකති. **'මවුපියන් විසින් තමන් සතු දේපල තම දරුවන්ට සමානව බෙද දිය යුතුමය' යි ලෝක නීතියක් හෝ ධර්ම නීතියක් කිසි තැනක නොමැත්තේ ය**. තමන් අයිති දෙයක් තමන් කැමති කෙනකුට දීම අන් කිසිවකුට කරන්නා වූ වරදක් නො වේ.

බොහෝ දරුවන්ගෙන් මවුපියන්ට වඩා සලකන්නා වූ කීකරු වූ ගුණවත් දරුවෙක් වේ නම් ඔහුට වැඩිපුර සැලකීම කිසි කලෙක අධර්මයක් නො වේ. මවුපියන්ට කිසි උපකාරයක් නො කරන්නාවූ ද අකීකරු වූ ද පාපකාරී වූ ද දරුවා යහපත් දරුවාට සමාන කොට මවුපියන් විසින් සැලකීමට කාරණයක් නැත්තේ ය. තමාට ලැබෙන දේපලවල මද බව නිමිත්ත කොට මවුපියන්ගේ ගුණය මකා දැමීමට වස්තු තණ්හාවෙන් අන්ධව සිටින අන්ධයාට යුක්තියක් වශයෙන් වැටහෙතත් එය බරපතල අපරාධයකි. තමාට යමක් නුදුන්නාට මවුපියන් පෙර කළ ගුණ කෙසේ නැති වේද? නො වේ ම ය. එබැවින් මවුපියන්ගේ දේපල ආදිය තමාට දුන්නා හෝ අනිකකුට දුන්නා හෝ ඒ ගැන වෙනසකට නො

Non-commercial distribution

පැමිණ සියල්ලන් විසින් ම මවුපිය උපස්ථානය කළ යුතු ය. මවුපියන් කෙරෙහි නපුරු කොට පිළිපදින්නෝ **"මිත්තවින්දකාදීන්"** මෙන් විනාශයට පැමිණෙති.

## මාපියන් පිදීමේ අනුසස්

**යො මාතරං වා පිතරං වා - මච්චො ධම්මෙන පොසති,**
**තාය නං පාරිචරියාය - මාතාපිතුසු පණ්ඩිතා**
**ඉධෙව නං පසංසන්ති - පෙච්ච සග්ගෙ පමොදති.**

යමෙක් ස්වකීය මව හෝ පියා හෝ ධර්මයෙන් ආහාර පානාදිය සපයා දීමෙන් ද ඔවුන් විසින් කළ යුත්තක් පැමිණි කල්හි එය තමා ම කරදීමෙන් ද අසනීපයක් වූ කල්හි වෙදකම් කරවීමෙන් ද යනාදියෙන් මවුපියන් පෝෂ්‍යය කරන්නේ නම් ඔහුට මෙලොවෙහි ම 'මොහු කෙළෙහිගුණ දන්නා වූ මවුපියන් පෝෂ්‍යය කරන්නාවූ සත්පුරුෂයෙකැ' යි ප්‍රසංශා කරති. ඔවුන් මරණින් මතු ද මවුපියන් පෝෂ්‍යය කිරීමෙන් ලද පිනෙන් දෙව්ලොවට පැමිණ දිව්‍ය සම්පත්තියෙන් සතුටු වන්නේය යනු මේ ගාථාවේ අදහසයි. **මවුපියන් පුදන්නා යක්ෂයන්ගෙන් පවා නිදහස් වෙයි**. මේ එය විදහාපාන පැරණි පුවතකි.

අතීතයෙහි **බෝසතාණන් වහන්සේ** ඉතා දිළිඳු පුරුෂයෙක්ව කුලී වැඩ කරමින් මවුපියන් පෝෂ්‍ය කරමින් සිටියේ ය. එක්දවසක් **බරණැස් රජතෙමේ** ජනයා පිරිවරා මුව දඩයමට වනයට ගොස් යමෙක් සිටි තැනින් මුවකු පලා ගියහොත් ඔහු අලාබය ගෙවිය යුතු යයි අණ කොට මුව දඩයමට පටන් ගත්තේ ය. එක් මුවෙක් රජ්ජුරුවන් ඉදිරියට ම ආවේ ය. රජු තමා ඉදිරියට එන මුවා දැක විද්දේ ය. මුවා තමාට අභිමුඛව එන ඊය දැක වහා අස් වී ඊ පහරින් වැළකී ඊය වැදී මළ එකෙකු මෙන් බිම වැටී සිට රජ්ජුරුවන් මුවා මළේ යයි සිතා එන කල්හි පණ බේරාගෙන වහා පැන දිව්වේ ය. අමාත්‍යයෝ රජ්ජුරුවන්ට සිනාසුණාහු ය.

**රජ** ලජ්ජාවී තනියම මුවා පසු පස්සේ ලහුබැඳ ගොස් මුවා මරා කඩුවෙන් දෙකට කපා ලීයෙක දෙ කෙළවර එල්වා කර

Non-commercial distribution

තබා ගෙන එන්නේ ක්ලාන්ත වී එක් ගසක් යට මඳක් සැතපී සිට නැගිට එන්නට සූදානම් වූ විට එගස උන් **'මඛාදෙව' නම් යක්ෂයා** "සිටුව, තුඹ මට ආහාර වූයෙහි" යි කියා අල්වා ගත්තේ ය. රජ බිය වී "තෝ අද පමණක් කන්නෙහි ද සැමදා ම කන්නෙහි දැයි" විචාළේ ය. යක්ෂයා "ඉදින් ලදහොත් සැමදාම කන්නෙමි"යි කීයේ ය. එකල්හි රජ "අද තෝ මේ මුවා කව. සෙට පටන් බත් බඳුනක් සමග එක එක මිනිසා බැගින් එවමි"යි කීයේ ය. යක්ෂයා "එසේ නම් තෝ යව, නො එව් දිනයක් වී නම් එදා තා කමි" යි කියා රජ්ජුරුවන් යැව්වේ ය.

**රජ්ජුරුවෝ** නුවරට ගොස් දෙවන දින පටන් සිරගෙයි උන් එක් එක් මනුෂ්‍යයා බැගින් යකාට යැව්වේ ය. කල් යෑමෙන් සිර ගෙවල්වල මිනිසුන් නැති විය. රජ්ජුරුවෝ බිය වී දහසක් බැඳි පොදියක් ඇතකු පිට තබා "යකාට බත් ගෙන යා හැකි කෙනෙක් මෙය ගනුව"යි වීදියක් පාසා යැව්වේ ය. **බෝසතාණන් වහන්සේ** කහවණු දහස ගෙන මවට දී රජු ඉදිරියට ගියේ ය. රජ "තෝ බත් ගෙන යන්නෙහි දැ"යි විචාළ කල්හි "එසේ ය. දේවයන් වහන්ස!" යි පිළිතුරු දුන්නේ ය. "යාමට කුමක් උවමනා දැ"යි විචාළෙන් "තුඹ වහන්සේගේ කඩුව හා රන් මිරිවැඩි සහල හා ශ්වේතච්ඡත්‍රය ද උවමනා ය" යි කීයේ ය. රජ තෙමේ ඒ සියල්ල හා රාජ භෝජනය පිර වූ රන් තලිය ද ගෙනයාමට වැඩකාරයන් ද දුන්නේ ය.

**බෝසතාණන් වහන්සේ** යකාගේ ගස සමීපයට ගොස් රන්මිරිවැඩි සහල පයලා සේසත ඉසලා කඩුව ගෙන බත්තලිය කඩුව පිට තබා ගසේ සෙවන කෙළර සිට දිගුකර යකාට බත්තලිය දුන්නේ ය. **යක්ෂයා** "මොහු රවටා ගස සෙවනට ගෙන්වා මොහු ද කමි"යි සිතා "මාණවකය, මෙහෙ එන මැනව, අපි දෙදෙනා ම බත කමු" ය යි කීවේ ය. එගස සෙවනට ඇතුල් වූ අය අල්වා කෑමට ඔහුට බලය තිබේ. බෝධිසත්වන් වහන්සේ යක්ෂයාට කියනුයේ: යක්ෂය තෝ මා කැවෙහි නම් **'සුතන'** නම් වූ මවු පෝෂ්‍යය කරන තැනැත්තා පවා තෝ කැවෙහි යයි මෙතැන් පටන් කිසිවෙක් තට බත් නො ගෙනෙන්නේ ය. මම ද තගේ රුක්සෙවන නො පාගා මිරිවැඩි සහල පාගා සිටිමි. තගේ රුක්සෙවනේ

Non-commercial distribution

නොසිට සේසත යට සිටිමි. එබැවින් තට නො කෑ හැකි ය. අප රජ්ජුරුවන් ද දැන් දුර සිටින බැවින් තට ගත නො හැක. ඉදින් තෝ මාගේ වචනයට කීකරු නො වෙහි නම් කඩුවෙන් තා දෙකඩ කොට කපමි"යි කීයේ ය.

යක්ෂයා "මොහු කියන්නේ යුක්තියකැ" යි සලකා "තොප ගොස් සුවසේ මව දකුව" යි කීවේ ය. ඉක්බිති බෝසතාණන් වහන්සේ ඔහුට දහම් දෙසා ශීලයෙහි පිහිටුවා නුවරට කැඳවා ගෙන ගොස් දිනපතා ආහාර ලැබෙන ලෙස ද පිළියෙල කළේ ය.

මෙසේ මවුපියන් පෝෂ්‍යය කරන්නෝ යක්ෂයන් ගෙන් පවා මිදෙන බැවින් එය උතුම් මංගලයක් වන්නේ ය.

**මාපියන් නො පිදීමෙහි විපාක**.

**යො මාතරං වා පිතරං වා**
**ජිණ්ණකං ගත යොබ්බනං**
**පහුසන්තො න භරති**
**තං ජකද්කදා වසලො ඉති**

යමෙක් උපස්ථාන කිරීමට පුළුවන්කම තිබියදී යොවුන්විය ඉක්මවා මහලුවියට පැමිණි මවුපියනට උපස්ථාන නො කෙරේ නම් ඔහු වසලයෙකියි **වසල සූත්‍රයෙහි** වදාළහ.

**යො මාතරං වා පිතරං වා-**
**ජිණ්ණකං ගත යොබ්බනං**
**පහුසන්තො න භරති-**
**තං පරාභවතො මුඛං**

යමෙක් මවුපිය උපස්ථානය කිරීමට පුළුවන්කම තිබියදී මහලු වූ මවුපියනට උපස්ථාන නො කෙරේ නම් එය ඔහුගේ දෙලෝ පරිහානියට හේතුවකැයි ද **පරාභව සූත්‍රයෙහි** වදාළහ.

Non-commercial distribution

## 12-13 අඹුදරුවන්ට සංග්‍රහ කිරීම

**"පුත්තදාරස්ස සඞ්ගහො"** යනුවෙන් පුත්‍රයන්ට හා භාර්යාවන්ට සංග්‍රහ කිරීම යන කරුණු දෙක ව්‍යවහාර පහසුව පිණිස එකට පිඩු කොට දක්වන ලදී. එහෙයින් මෙහිලා අප විසින් ද ඒ දෙක **"අඹුදරුවන්ට සංග්‍රහ කිරීම"** යන මාතෘකාවෙන් එකට ම දක්වන ලදී. එහෙත් විස්තර කිරීමෙහි ලා සූත්‍රයෙහි පුත්‍රයන් මුලින් දැක්වූ හෙයින් පළමුකොට පුත්‍රයන් පිළිබඳවූ කරුණු දක්වනු ලැබේ.

## 12. දරුවන්ට සංග්‍රහ කිරීම.

**පුත්‍රයෝ වනාහි** අතිජාත පුත්‍රයාය, අනුජාත පුත්‍රයාය, අවජාත පුත්‍රයාය යි තුන්දෙනෙක් වෙත්. යම් පුත්‍රයකුගේ මවුපිය දෙදෙන බුද්ධ ධම්ම සංඝ යන රත්නත්‍රය සරණ නො ගියාහු ද, ප්‍රාණඝාත, අදත්තාදන, කාමමිථ්‍යාචාර, මෘෂාවාද, සුරාපාන යන පඤ්ච දුශ්චරිතයෙන් නො වැලකුනාහු ද, දුශ්ශීලයෝ ද, පුත්‍ර තෙමේ වනාහි රත්නත්‍රය සරණ ගියේ වේ ද, පඤ්ච දුශ්චරිතයෙන් වැලකුනේ වේ ද, සිල්වත් වේද, ඔහු මවුපියන්ට වඩා ගුණයෙන් අධික වූයෙන් **අතිජාත පුත්‍ර** නම් වේ.

රත්නත්‍රය සරණ ගියා වූ දුශ්චරිතයෙන් වෙන් වූ මවුපියන්ගේ පුත්‍රතෙමේ ද එසේ ම වේ නම්, ඔහු මවුපියන් හා ගුණයෙන් සමාන බැවින් **අනුජාත පුත්‍ර** නම් වේ.

රත්නත්‍රය සරණ ගියා වූ පඤ්ච දුශ්චරිතයෙන් වෙන් වූ සිල්වත් මවුපියන්ට දුශ්ශීල පුත්‍රයෙක් වේ ද, ඔහු ගුණයෙන් මවුපියන්ට වඩා හීන වූ හෙයින් **අවජාත පුත්‍ර** නම් වේ. එහෙයින් වදාළහ.

Non-commercial distribution

**"අතිජාතං අනුජාතං - පුත්ත මිච්ඡන්ති පණ්ඩිතා,**
**අවජාතං න ඉච්ඡන්ති - සො හොති කුල ගන්ධනො"**

පණ්ඩිතයෝ තමාට ගුණයෙන් අධික වූයෙන් අතිජාත නම් වූද, තමා හා ගුණයෙන් සමවූයෙන් අනුජාත නම් වූ ද, පුත්‍රයා කැමති වෙත්. තමහට ගුණයෙන් හීන වූ අවජාත පුත්‍රයා නො කැමති වෙත්. අවජාත පුත්‍රයා කුලය නසන්නේය - එහෙයිනි යනු භාවයයි.

## ගුණවත් දරුවා ම උතුම් බැව්.

**දරුවකු ඇතිවීම වනාහි මහත් වූ ලාභයකි.** සත්ත්වයන්ට ඇස ඉතා ප්‍රයෝජනවත් වූ ඉතා අගනා වස්තුවක් වූ නමුත් කණ වූ ඇසින් කිසිම ප්‍රයෝජනයක් නැත. හුදෙක් එය ඇස් හිමියාට බොහෝ දුක් උපදවන්නක් ම වන්නේ ය. එමෙන් ම අයහපත් දරුවා ද කිසි ම ප්‍රයෝජනයක් නැත්තා වූ ඔහුගේ මවුපියන්ට හා ඥාති මිත්‍රයන්ට දුක් ඇති කරන්නා වූ කෙනෙක් වේ. එබැවින් එබඳු දරුවකු ඇති බවට වඩා දරුවන් නැති බව ම උතුම්. එබැවින් පණ්ඩිතයෝ අතිජාත අනුජාත පුත්‍රයන් මිස අවජාත පුත්‍රයන් නො කැමති වෙති. අවජාත පුත්‍රයා වනාහි කුලය වනසන්නා වූ මවුපියන්ට නිගා උපදවන්නා වූ රාක්ෂයෙකි. එබැවින් ගුණ නුවණින් නො වැඩුණු අවජාත පුත්‍රයා නූපන් පුතකු ලෙස ද, ගුණ නුවණින් වැඩුණු අනුජාත, අතිජාත පුත්‍රයන් උපන් පුතුන් ලෙස ද සලකනු ලැබේ. ඒ බැව් බාහිර පඬුවන් විසින් ද මෙසේ දක්වන ලදී.

**"සජාතො යෙන ජාතෙන යාති වංශඃ සමුන්නතිම්"**

උපන්නා වූ යම් කිසිවකු නිසා සිය කුලය ගම පළාත රට ජාතිය ආගම උසස් බවට පැමිණේ නම් ඔහුම නියම උපන් පුතකු බව ද, නො එසේ නම් ඔහු නියම උපන් පුතකු නො වන බව ද, ඔහු සිය මවගේ තරුණකම වනසා දමන යක්ෂයකු බව ද, මවගේ තරුණකම නමැති සඳුන්වනයට පොරවක් බව ද වැඩි දුරටත් පවසන ලදී. උපන් පුතා ගැන අපේ **පැරණි කිවිඳකු ද** මෙසේ කියා තිබේ.

Non-commercial distribution

"පින් මඳ පුතුන් සියයක් ලදුවත් නිස රු
ගුණ නැණ බෙලෙන් යුතු පුතුමය ඉතා ග රු
එකපුත් සඳින් දුරුවෙයි ලොවැ ගන අඳු රු
නෙක තරු රැසින් එලෙසට නොමැ වේයැ දු රු"

තව ද නුපන් පුතාට වඩා මහ අසල වැඩුණු රුක පවා උතුම් බව බාහිර පඬුවෝ පවසති.

කරුණු මෙසේ හෙයින් නුවණැති මවුපියෝ හොඳ දරුවන් ම බලාපොරොත්තු වෙති. එහෙයින් ම දරුවන් ඇති බව ඔවුනට මහත් වූ සැපතකි. එසේ නො හික්මුණු නො මනා දරුවන් ඇති බව ඔවුන්ට දරුවන් නැතිවාටත් වඩා කරදරයකි. දුකකි.

## දරුවන් තැනීම

දරුවන් තැනීම වූ කලී මහත් පරිශ්‍රමයෙන් ද නුවණින් ද කළ යුතු වූ භාරදූර කර්තව්‍යයකි. දරුවකු තමාගේ දෙලොව වැඩ සාද ගන්නාවූ ද මවුපියනට වැඩ ඇත්තා වූ ද සිය පවුලට, ගමට, පළාතට, රටට, ජාතියට, ආගමට වැඩ ඇත්තාවූ ද යහපත් කෙනකු වන්නේ ද, මවුපියන්ටත් කරදර කාරයකුව නෑයන්ට, මිතුරන්ට, පවුලට, ගමට, රටට, ආගමට, ජාතියට කරදර කාරයකුව අනර්ථ කරන්නකුව ඔහුගේ දෙලොව වැඩ නැතිකර ගන්නා වූ කෙනකු වන්නේ, මවුපියන්ගේ තැනීමේ සැටියට ය.

එබැවින් දරුවන් තැනීමේ වගකීමේ භාරය මවුපියන් තුළ ම පවත්නා දෙයකි. දරුවන් තනා ඔවුන්ට වැඩ සලසනු කැමති වූ ඔවුන්ගෙන් ප්‍රයෝජන ලබනු කැමති වූ, දරුවන් ලැබීමේ ප්‍රීතිය ලබනු කැමති වූ මවුපියන් විසින් තම දරුවන් බාලවියෙහි පටන් ගුණධර්ම පුහුණු කරවා, ශිල්පශාස්ත්‍ර උගන්වා, ආගමාලය ජාත්‍යාලය ඇති වන පරිදි මනාකොට තැනිය යුතු ය.

## නරක දරුවන් තනන දෙමව්පියන් රටට විපතක් කරන බව

දෙමාපියන් විසින් දරුවන්ගෙන් බලාපොරොත්තුවන විශේෂ ප්‍රයෝජනය නම් මහලු කාලයේදී ඔවුන්ගෙන් සත්කාර ලැබීම ය.

Non-commercial distribution

අද **බොහෝ මහලු මව්පියවරු** දරුවන් ගෙන් ඒ ප්‍රයෝජනය ද නො ලැබ දරුවන්ට දෝෂාරෝපණය කරමින් තැවෙති. මහලු මවුපියන්ට උපස්ථාන නොකිරීම නම් දරුවන්ගේ බලවත් ම වරදකි. බොහෝ සෙයින් දරුවන් ඒ වරද කරන්නේ ඔවුන්ගේ මවුපියන් විසින් බාල කල පටන් ඔවුනට ගුණදම් පුහුණු නො කරවා ගුණදහම් හි අගය තේරුම් යන පරිදි හොඳ ඉගෙනීමක් ලබා නොදී හිස් පුහුලන් කොට තැනූ බැවිනි.

මවුපියන් විසින් මනාකොට සුවිනීත කොට ගුණ දහමින් යුක්ත වූවකු කොට තනනු ලැබූ දරුවා මවුපියන් ගේ ගුණ දන්නා බැවින්, යුතුකම් දන්නා බැවින්, පින්පව් දන්නා බැවින් කිසි කලෙක මවුපියන් අත් නො හරී. සෑම කල්හි ම මවුපියනට ශක්ති පමණින් උපස්ථාන කරන්නේය. ගුණදහම් පුහුණු නො කරවා පවුකාරයන් වන පරිදි දරුවන් තැනීම නම් දරුවනට ද කරන්නා වූ අනර්ථයකි. තමාට ද කරගන්නා වූ අනර්ථයකි. තම පවුලට ද නෑයන්ට ද මිතුරන්ට ද ගමට රටට ආගමට ද කරන්නා වූ අනර්ථයකි.

එහෙයින් නරක දරුවන් තනන මවුපියෝ දරුවාගේ සතුරෝ වෙති. ඒ බැව් **"මාතා ශත්‍රුඃ පිතා වෛරී යෙන බාලො න පාඨිතඃ"** යන ඍෂි භාෂිතයෙන් ද ස්ඵුට වේ. යම්කිසි මවක හෝ පියකු තම දරුවා නිසි පරිදි යහපත් අයකු නො කළ හොත් එම මව සැතිරියකි. පියා සතුරෙකි, යනු එහි භාවයයි. දරුවා යහපත් කෙනකු වීමට මවුපියන් විසින් දරුවා සම්බන්ධයෙන් ඉටු කළ යුතු යුතුකම් මනාකොට දැන ඒවා ඉටු කළ යුතුය.

**මවුපියන් සතු යුතුකම් පස**

මවුපියන් විසින් දරුවන් කෙරෙහි ඉටු කළ යුතු යුතුකම් පසෙකි. ඒවා තථාගතයන් වහන්සේ විසින් **"සිගාල"** නම් ගෘහපති පුත්‍රයා හට මෙසේ වදාරන ලදහ.

**"පාපා නිවාරෙන්ති, කල්‍යාණෙ නිවෙසෙන්ති, සිප්පං සික්ඛාපෙන්ති, පතිරූපෙන දාරෙන ස යොජෙන්ති, සමයෙ දායජ්ජං නියාදෙන්ති"**

*Non-commercial distribution*

**1. පාපයෙන් වැලක්වීමය. 2. යහපතෙහි යෙදවීමය. 3. ශිල්ප උගැන්වීමය. 4. සුදුසු භාර්යාවක් හා යෙදවීමය 5. සුදුසු කල්හි දයාද දීමය,** යන මේ කරුණු පස මවුපියන් විසින් තම දරුවන්ට ඉටුකළ යුතු යුතුකම්ය.

**1. පාපයෙන් වැළැක්වීම.**

මවුපියන් විසින් සිය දරුවා නිරෝගී වාසනාවන්ත දරුවකු කොට ඇති දැඩි කරන අතරම තම දරුවා පාපයෙන් වලක්වා ගැනීමට ද විශේෂයෙන් වග බලා ගත යුතුයි. ළමා කාලය දකින අසන නොයෙක් දේ සිත තුළට වැද්ද ගන්නා කාලයකි. එසේ ම නිතර තමාට දක්නට ලැබෙන දේවල් අනුගමනය කරන කාලයකි. එබැවින් ඒ කාලයෙහි විශේෂයෙන් ම මවුපියන් විසින් තම දරුවනට යහපත් ආශ්‍රය ලැබෙන්නට සැලැස්විය යුතු ය.

**මෙහිලා "යහපත් ආශ්‍රය" යන්නෙන් අදහස් කරනුයේ වත් පොහොසත් කම් ඇති, අපර දිග සිරිත් විරිත්වලට ගරු කරන, ඒවා මුදුනෙන් පිළිගත් ඉංග්‍රීසි පන්තියට හැඩ ගැසුණු, පස්කම් සුවෙන් මත් වූවන්ගේ ආශ්‍රය නොව** නිතර තුනුරුවන් පුදන, මව්පියන් වැඩිහිටියන් පුදන, සිංහල කුල සිරිත් ගරු කරන, පාපයෙන් වැළකුණු පාපයට ලජ්ජා භය ඇති, නිහතමානී විනීත පවැතුම් ඇති, ගුණ නුවණින් වැඩුණු, ආගම අනුව ජීවිතය හැඩ ගැසුණු, සදචාර සම්පන්න අයගේ ආශ්‍රයයි.

මෙහිලා "**සිරිසඟබෝ**" රජතුමාගේ චරිතය හොඳ නිදසුනෙකි. එතුමා කුඩා අවදියෙහි සිය මයිල් '**නන්ද**' තෙරුන් වහන්සේගේ ආශ්‍රය ලත් හෙයින් ආගම අනුව ජීවිතය හැඩ ගැසුණු නියම මහත්මයෙක් විය. පරහට ලැබෙන ලාභයක් උදෙසා සිය ජීවිතය පවා පරිත්‍යාග කිරීමෙහි නො පසුබට වූ පරහිත නිරතයෙක් විය.

"**දරුවා පියාගේ සෙවනැල්ල මෙනි**" යනු "ඇරිස්ටෝටල්" පඬිතුමාගේ කියමනකි. අපේ සෙවනැල්ල අප කරන සියලු දේ ම කරන්නාක් මෙන් ම මවුපියන් කරන සියලු දේම කිරීමට සූදනම් වීම දරුවන්ගේ ස්භාවයකි. එබැවින් තමන් කරන සෑම

Non-commercial distribution

ක්‍රියාවකම, කියන සෑම වචනයක ම සටහන ඇදගන්නා වූ දරුවන් නමැති දර්පණ තල ඇති බැව් නිතර මවුපියන් විසින් සිතට ගෙන, නිතර තම දරුවනට ආදර්ශවත් වන පරිදි හැසිරීමට උත්සාහ කටයුතුයි.

## 2. යහපතෙහි යෙදවීම

යහපත් ක්‍රියාවන්හි නිතර තම දරුවා යෙදවීමට මවුපියන් විසින් උත්සාහ දැරිය යුතුයි. හැමට ම පළමු තමන් ගුණධර්මයන්හි පිහිටා දරුවන් ද ගුණ ධර්මන්හි යෙදවීමට සිතට ගත යුතුය. කුඩා කල පටන් ම සිය ආගම කෙරෙහි ආලය ඇතිවන අයුරු කටයුතු කළ යුතුයි. ඒ පිණිස කුඩා කල ම ආගම ධර්මය උගෙනීමට සැලැස්විය යුතුය.

ඇතැම් **අඥාන මවුපියෝ** ධනය ඉපයීමට උපකාර වන ශිල්ප ශාස්ත්‍ර උගැන්වීම පමණක් ම දරුවාගේ දියුණුවට සෑහේය යි සිතති. එය ලොකු ම මුළාවකි. කෙතරම් ශිල්ප ශාස්ත්‍ර උගත් නමුදු **ආගම ධර්මයෙන් වෙන් වූ ජීවිතයෙහි ගතයුත්තක් නැත**. **කිසි වටිනාකමක් නැත**. **සුවඳ නැති මලක් මෙනි**. නියම මිනිසකු වශයෙන් ඔහුට ජීවත් විය නො හැකිය.

ලොවැ උපන් මිනිසකු විසින් සිය ආගම, ගම, පළාත, රට, ජාතිය ආදි නොයෙක් දේ වෙනුවෙන් ඉටු කළ යුතු යුතුකම් මහත් රැසකි. ආගම නූගත් තැනැත්තා ඒ යුතුකම් පවා නො හඳුනන්නෙකි. එය එසේ නම් ඔහුගේ යුතුකම් ඉටු කිරීම ගැන කවර කථා ද? එපමණක් නොව ඔහු බාහිර ශිල්ප ශාස්ත්‍ර උගෙනීම නිසා ද, ධනය නිසා ද, ඇතිවන **පුහුමාන්නයෙන් මත් වී** ගරු කළ යුත්තාට ගරු කිරීම, පිදිය යුත්තාට පිදීම, වැඳිය යුත්තාට වැඳීම ආදි පිරිය යුතු සුචරිතයන් නො පුරයි. **ලෝකයෙහි නො කළයුතු දේ කිරීම වරදක් මෙන් ම**, **කළ යුතු දේ නො කිරීම ද වරදක් බව මෙහිලා විශේෂයෙන් දැනගත යුත්තකි**. මෙය සියල්ලන් විසින් ම නිතර සිහියේ තබා ගතයුතු කරුණකි. ධර්ම ඥානයෙන් තොරව ඔහු දුශ්චරිතයෙහි ම ඇලී ගැලී ප්‍රමාද වී සිට මරණින් මතු අපාය දුකට ද පැමිණෙයි.

Non-commercial distribution

**අපේ පැරණි මුතුන් මිත්තන්** සිය දරුවන්ට ආගම භක්තිය ඇතිවන පරිදි ක්‍රියා කළ අයුරු "**කාවන්තිස්ස**" රජතුමාගේ හා "**විහාරමහාදේවිය**" ගේ චරිතයන් ගෙන් යස රහට ස්ඵුට වේ. එම උත්තමයෝ **ගැමුණු - තිස්ස** යන තම පුත්‍රයන් දෙදෙන කුඩා කල ම මහා සංඝයා ඉදිරියෙහි "දරුවනි! නුඹලා අපේ කුල දේවතා වූ භික්ෂූන් වහන්සේට කිසි කලෙකත් විරුද්ධ නො වන්නෙමුයි" කියා බත් පිඩු අනුභව කරවූහ. එසේ ම සංඝයාට දන් දී වළඳන ලෙස ද අවවාද කළහ. මේ ආදීන් ආගමාලය ඇතිවන අයුරු නිතර ක්‍රියා කළහ. ඒ නිසා ම ඒ වූ පරිදි ක්‍රියා කළ ඒ උතුම් පුතුන්ගෙන් සිය ජාතියට ආගමට රටට ඇති වූ යහපත කොතරම් විශාල ද?

**තව ද** අවවාද දී ගුණධර්මයෙහි පිහිටුවීමට නො හැකි වූ කල වස්තුව ද දී පොළඹවා '**කාල**' නම් වූ තම පුත්‍රයා යහපත් මාර්ගයෙහි යෙදවූ ආදර්ශමත් පියතුමකු වූ "**අනේපිඩු සිටුතුමාගේ**" චරිතය ද මෙහිලා හොඳ ම නිදසුනෙකි.

### 3. ශිල්ප ශාස්ත්‍ර උගැන්වීම.

ලෝකයෙහි ජීවත්විය යුතු අයුරු ඉගෙනීම පිණිස ද, ජීවත් වීමට ධන උපයා ගැනීම පිණිස ද, තමාගේ තත්ත්වයට සරිලන ශිල්ප ශාස්ත්‍ර උගැන්වීම ද දෙමාපියන් අයත් පරම යුතුකමකි. එහෙයින් කීහ. ලෝකෝපකාරයෙහි:-

"දෙගුරුන් විසින් තම - දරුවනට දෙන නොමඳ දන නම්
වියතුන් සබා මැද - ඉන්ට ඉදිරිව සිල්ප දෙනුමැයි"

### 4. ආවාහ විවාහ කටයුතු

සුදුසු කාලයෙහි දරුවන් පිළිබඳ වූ ආවාහ විවාහ කටයුතු ද ඔවුන්ගේ අදහස් ද විමසා සහයෝගීව ඉතා පරීක්ෂාකාරීව කරදීම මවුපියන් අයත් **සිවුවන යුතුකම ය**.

5. සුදුසු අවස්ථාවෙහි තම ධනය - උරුමය දරුවන්ට පවරා දීම ද මවුපියන් සතු යුතුකමකි.

Non-commercial distribution

### දරුවන් සතු යුතුකම් පස

යට කී යුතුකම් මවුපියන්ගෙන් ඉටු වූ කල දරුවන් ගෙන් මවුපියන්ට ඉටුකළ යුතු යුතුකම් වන **1. මවුපියන්ට සත්කාර කිරීම. 2. මවුපියන් අයත් වැඩපල කරදීම. 3. සිය පරපුර චිර කාලයක් පැවැත්වීම. 4. උරුමවූ ධනයත්, මවුපියන් නො පිරිහෙලා පැවැත් වූ දන ශීලාදි උතුම් ගුණධර්ම තැමැති දයාදයත් ඒ වූ පරිදි පැවැත්වීම. 5. පරලෝ සැපත් මවුපියන් නිතර සිහිපත් කොට දන්දීම** යන කරුණු පස දරුවාගෙන් ද ඉටුවිය යුතු වේ. එවිට හොඳ දරුවකු තැනීම දරුවාටත් මවුපියන්ටත් සෙසු ලෝකයටත් යහපත පිණිස ම පවත්නේ ය. එහෙයින් එය උතුම් මංගල කාරණයකැයි ද වදළහ.

## 13. භාර්‍ය්‍යාවන්ට සංග්‍රහ කිරීම

**1. වධක භාර්‍ය්‍යාවය. 2. චෞරී භාර්‍ය්‍යාවය. 3. ස්වාමී භාර්‍ය්‍යාවය. 4. මාතෘ භාර්‍ය්‍යාවය. 5. භගනී භාර්‍ය්‍යාවය. 6. මිත්‍ර භාර්‍ය්‍යාවය. 7. දසී භාර්‍ය්‍යාවය** යයි භාර්‍ය්‍යාවෝ සත් දෙනෙක් වෙත්.

1. යම් භාර්‍ය්‍යාවක් සැමියා කෙරෙහි දුෂ්ට වූ අදහස් ඇත්තී ද, ස්වාමියා කෙරෙහි හිතවත්කම හා අනුකම්පාව නැත්තී ද, අන්‍ය පුරුෂන් කෙරෙහි ඇලුම් කරන්නී ද, පර පුරුෂයන් උසස් කොට සිතමින් සිය සැමියා පහත් කොට සිතා ද, මිළදී ගන්නා ලද තැනැත්තියක් මෙන් වන්නී ද, ස්වාමියාහට වධ කිරීමට උත්සාහ කරන්නී ද, එසේ වූ භාර්‍ය්‍යාව **"වධක භාර්‍ය්‍යාව"** නම්.

2. භාර්‍ය්‍යාවක්, තම ස්වාමියා විසින් ශිල්පයෙන් හෝ වෙළඳමෙන් හෝ ගොවි කමින් හෝ යම් ධනයක් ලබාද, එයින් ස්වල්පය කුදු වෙන් කර ගැනීමට හෝ සොරාගන්නට හෝ නිකරුණේ පමණට වඩා වියදම් කිරීමට හෝ කැමති වන්නී ද, එබඳු වූ භාර්‍ය්‍යාව **"චෞරී භාර්‍ය්‍යාව"** නම්.

3. යම් භාර්‍ය්‍යාවක් වැඩ කිරීමට නො කැමැත්තී ද, අලස ද, බොහෝ අනුභව කරන්නී ද, කෲර වන්නී ද, කිපෙන්නී ද, නපුරු වචන කියන්නී ද, ස්වාමියා මැඩගෙන (යටත් කොට ගෙන) වාසය කරන්නී ද, එබඳු වූ භාර්‍ය්‍යාව **"ස්වාමී භාර්‍ය්‍යාව"** නම්.

Non-commercial distribution

4. යම් භාර්‍ය්‍යාවක් සැම කල්හි ම සැමියාහට හිතවත් බව හා අනුකම්පාව ඇත්තී ද, පුත්‍රයකු රක්නා මවක් මෙන් සිය සැමියා රකින්නී ද, සැමියා විසින් උපයා ගත් ධනය රැක බලා ගනී ද, එබඳු වූ භාර්‍ය්‍යාව මවක් වැනි වූ හෙයින් **"මාතෘ භාර්‍ය්‍යාව"**යයි කියනු ලැබේ.

5. යම් ස්ත්‍රියක් වැඩිමහලු සොහොයුරා කෙරෙහි නැඟනියකගේ පැවැත්ම මෙන් සිය සැමියා කෙරෙහි ගෞරව සහිත වන්නී ද, ලජ්ජා ඇත්තී ද, සැමියාට අනුව පවතින්නී ද, එබඳු වූ භාර්‍ය්‍යාව සහෝදරියක් වැනි වූ හෙයින් **"භගනි භාර්‍ය්‍යාව"** නම්.

6. යම් ස්ත්‍රියක් බොහෝ කලකින් පැමිණි යහළුවකු දැක සතුටු වන්නා වූ යෙහෙළියක මෙන් සිය සැමියා දැක සතුටු වන්නී ද, කුලසම්පන්න ද, සිල්වත් ද, පතිවත රකින්නී ද, එබඳු වූ භාර්‍ය්‍යාව **"මිත්‍ර භාර්‍ය්‍යාව"** නම්.

7. යම් ස්ත්‍රියක් සිය සැමියා විසින් තී මරමියි දණ්ඩක් ගෙන තර්ජය කරනු ලැබ ද, පහරදෙනු ලැබ ද, නො කිපී සැමියාහට ඉවසා ද, ක්‍රෝධ නො කරන්නී ද, හිමියාගේ කැමැත්ත අනුව වසන්නී ද, එබඳු වූ භාර්‍ය්‍යාව **"දසී භාර්‍ය්‍යාව"** නම්.

මෙම භාර්‍ය්‍යාවන් සත්දෙනා අතුරෙන් මුලින් දැක් වූ භාර්‍ය්‍යාවෝ තිදෙන නුසුදුසු භාර්‍ය්‍යාවෝ වෙත්. සෙසු සිව්දෙන යහපත් භාර්‍ය්‍යාවෝ වෙත්. එබැවින් විවාහ ජීවිතයට ඇතුළත් වී භාර්‍ය්‍යාවක ලෙස කටයුතු කරන්නා වූ ද, මතු එසේ කිරීමට අදහස ඇත්තා වූ ද සැම ස්ත්‍රියක විසින් ම යටකී යහපත් භාර්‍ය්‍යාවන් සිව් දෙනාගෙන් කෙනකු වීමට උත්සාහ කටයුතු. එක ම භාර්‍ය්‍යාවකට වුව ද මවක මෙන් ද සොහොයුරියක මෙන් ද යෙහෙළියක මෙන් ද දසියක මෙන් ද තම ස්වාමියා කෙරෙහි පැවැතීමට ඉඩ තිබෙන හෙයින් එබඳු යහපත් සුවිනීත භාර්‍ය්‍යාවක් වීමට උත්සාහ කිරීම වඩාත් ප්‍රශස්තය.

## ස්වාමිපුරුෂයාගේ යුතුකම්

**පවුලක සමගිය** සතුට දියුණුව ඇතිවීමට නම් ස්වාමි පුරුෂයා විසින් භාර්‍ය්‍යාවට කළයුතු සියලුම සංග්‍රහයන් නො පිරිහෙලා

Non-commercial distribution

කිරීමෙන් ඇගේ සිත දිනාගත යුතුය. එසේ ම භාර්යාව විසින් ද සැමියාට කළ යුතු සියලුම සංග්‍රහයන් නො පිරිහෙලා කොට සැමියාගේ සිත ද දිනාගත යුතුය. ඔවුනොවුන් විසින් ස්වකීය යුතුකම් ඉටු නො කරන්නා වූ ඒවා පැහැර හරින්නා වූ පවුල නිතර කරදර ඇති අවාසනාවන්ත පවුලක් වේ. සැමියා විසින් භාර්යාවට සංග්‍රහ කළ යුතු ආකාරය බුදුන් වහන්සේ විසින් "සිඟාල" ගෘහපති පුත්‍රයාහට මෙසේ වදරන ලදීඃ–

"ගෘහපති පුත්‍රය! සැමියා විසින් සිය භාර්යාවට කරුණු පසකින් සංග්‍රහ කළ යුතුය. කවර කරුණු පසකින් ද යත්?

1. **ප්‍රිය වචනයෙන් කථා කිරීමය.**
2. **දාසින්ට සේ අවමන් කොට කථා නො කිරීමය.**
3. **සිය බිරිඳ ඉක්මවා අන් ස්ත්‍රීන් කරා නො යාමය.**
4. **ප්‍රධානකම දීමය.**
5. **සුදුසු වස්ත්‍රාභරණ දීමය** - යන 'මේ කරුණු පසිනි' යනුයි.

## පවුලේ අවුලේ මුල

භාර්යාවන්ට ස්වාමිපුරුෂයාගේ පරස්ත්‍රී සේවනය ඉතාමත් නුරුස්සන දෙයකි. බොහෝ පුරුෂයෝ ඒ ගැන නො සලකා තමා කැමති පරිද්දෙන් පරඟනන් හා හැසිර භාර්යාව ලවා සිල් රක්වන්නට තැත් කරති. භාර්යාවගේ පරපුරුෂ සේවනය ස්වාමියා වූ තමාගේ සිත අතිශයින් රිදවන කරුණක් වන්නාක් මෙන් ම, ස්වාමියාගේ පරස්ත්‍රී සේවනය ද භාර්යාවගේ සිත රිදවන කරුණක් බව ඔවුහු නො සිතති. මෙය බොහෝ පවුල්වල අසමගිකම් ආදි කරදරවලට හේතු වී තිබෙන දෙයක් බැවින් මෙයින් විශේෂයෙන්ම ආරක්ෂා වෙත්වා! පරදර සේවනයෙහි ආදීනව "ධම්මපදයෙහි" මෙසේ වදළහ ඃ–

**"චත්තාරි ඨානානි නරො පමත්තො**
**ආපජ්ජති පරදරූප සෙවී**
**අපුඤ්ඤලාභං න නිකාම සෙය්‍යං**
**නින්දං තතියං නිරයං චතුත්ථං"**

Non-commercial distribution

පරඹුවන් කරා යන ප්‍රමාද වූ පුද්ගල තෙමේ අකුශල් ලැබීම, සැප නිදි නො ලැබීම, නින්ද ලැබීම, නරකයෙහි ඉපදීම යන ආදීනව සතරකට පැමිණේ ය යනු භාවයි.

**"අපුඤ්ඤ ලාභො ච ගතී ච පාපිකා**
**භීතස්ස භීතාය රතී ච ථොකිකා**
**රාජා ච දණ්ඩං ගරුකං පනෙති**
**තස්මා නරො පරදාරං න සෙවෙ"**

පරදර සේවනයෙහි යෙදෙන්නහුට අකුශල් සිදු වෙයි. අපාය හිමි වෙයි. සැමියාට අසුවේදෝ යන භයින් භය පත් වූ ඔහුට එබඳු භයපත් එකියක හා ලබන ආශ්වාදය ද ස්වල්පය. රාජ නීතියෙන් ද බරපතල දඬුවම් ලැබෙයි. එහෙයින් පරඹුවන් කරා නො යා යුතු ය යනු භාවයි.

තව ද **"භාර්‍ය්‍යාවට ප්‍රධානකම දීම"** යයි කියන ලද්දේ භාර්‍ය්‍යාවට ගෙදර ආහාර පානයන් පිළිබඳ ප්‍රධානත්වය දීමට ය. ගෙයක සියල්ල පිළිබඳව ම ප්‍රධානත්වය ස්ත්‍රියකට පැවරීම නුසුදුසු ය. ස්වාමියා විසින් ස්ත්‍රියකට අන් කිනම් සම්පත්තියක් දුන්නත් ආහාර පිළියෙල කිරීම බෙදු දීම පිළිබඳ ප්‍රධානත්වය නුදුනහොත් ඕතොමෝ සතුටු නො වන්නී ය. එබැවින් ඒ පිළිබඳ ප්‍රධානත්වය භාර්‍ය්‍යාවට ම පැවරීම ස්වාමි පුරුෂයාගේ යුතුකමකි.

කියන ලද කරුණු පසින් සැමියා විසින් භාර්‍ය්‍යාවට සංග්‍රහ කරන කල්හි එයින් සතුටට පැමිණි භාර්‍ය්‍යාව ද ස්වකීය යුතුකම් ඉටු කරීම් වශයෙන් සැමියාට කරුණු පසකින් සංග්‍රහ කරන්නී ය.

**භාර්‍ය්‍යාවගේ යුතුකම් පස**

1. කල් නොයික්ම වීම් ආදියෙන් ආහාර පිසීම ආදි කටයුතු මනාකොට කිරීම,

2. තමාගේ හා සැමියාගේ ද නෑයන්ට කළ යුතු සංග්‍රහයන් මනා කොට කිරීම.

3. සිය සැමියා ඉක්මවා පර පුරුෂයන් නො පැතීම,

Non-commercial distribution

4. සැමියා සපයන ධනය ආරක්ෂා කිරීම,

5. ආහාර පිසීම් ආදී කටයුතුවලට දක්ෂ වූ ද, අනලස වූ ද තැනැත්තියක් වීම.

යන මේ කරුණු පස පවුලක භාර්‍ය්‍යාව අතින් ඉටුවිය යුතු කරුණුය. සැමියා විසින් හා භාර්‍ය්‍යාව විසින් ඉටු කළ යුතු කරුණු ඔවුනොවුන් විසින් නො පිරිහෙලා ඉටුකරන්නා වූ පවුල සැපය ද, සතුට ද, සමගිය ද, දියුණුව ද, ඇත්තා වූ යහපත් පවුලක් වන්නේ ය. ධාර්මික වූ ඒ අඹු සැමියෝ මරණින් මතු ද දෙව්ලොව ඉපිද දිව සැපතින් ද සතුටු වන්නා හ. කරුණු මෙසේ හෙයින් “භාර්‍ය්‍යාවනට සංග්‍රහ කිරීම උතුම් මඟුලකැයි ද” වදරන ලදී.

*Non-commercial distribution*

# 14. තිරවුල් කර්මාන්ත

මෙහි **"කර්මාන්තයෝ"** නම් ගොවිතැන් කිරීම වෙළඳම් කිරීම රන්රිදී තඹ පිත්තල දැව මැටි ආදියෙන් නොයෙක් දේ තැනීම යනාදියයි. බලාපොරොත්තු වන ඵලය ලැබෙන පරිදි යහපත් නො වීම කර්මාන්තයන්ගේ ආකුල භාවය යයි දතයුතු. බලාපොරොත්තුවන ඵලය ලැබෙන පරිදි මනාකොට කරන ලද කර්මාන්තය අනාකුල කර්මාන්තයයි. ඒ අනාකුල කර්මාන්තය වනාහි සැපයට හේතුවක් බැවින් උතුම් වූ මංගලයකි.

කර්මාන්තයන්ගේ ආකුල භාවය වනාහි කළයුතු කාලය ඉක්මවා කිරීම, නො මනාකොට කිරීම, අලස භාවයෙන් කිරීම යන මේවායින් සිදුවේ. අනාකුල භාවය වනාහි සුදුසු කාලයෙහි පටන් ගෙන කිරීම, කරන කල්හි ද බලාපොරොත්තු ඵලයට යෝග්‍ය පරිදි මනාකොට කිරීම, වීර්‍ය්‍යයෙන් යුක්තව කිරීම, යන මේවායින් සිදුවේ.

ගොවිතැන් කරන්නා වූ තැනැත්තාට ඒ ඒ වර්ගයන් වැවීමට සුදුසු කාල තිබේ. ඉදින් ගොවියා කාලය ඉක්මවා යම්කිසි වෘක්ෂලතා වර්ගයක් රෝපණය කළේ වී නම්, ඔහුට එයින් ලැබිය යුතු නියම ඵලය ලැබිය නොහේ. එසේ ම වෙළඳම් කරන්නා වූ තැනැත්තාට ද ඒ ඒ වෙළඳ ද්‍රව්‍යයන් විකිණීමට සුදුසු කාල තිබේ. ඉදින් කාලය ඉක්මවා පටන් ගත්තේ වේ නම් එයින් නියම ලාභය ලැබිය නොහේ. ගොවිතැනට හා වෙළඳමට පමණක් නොව කර්මාන්ත සියල්ලට ම යෝග්‍ය කාල තිබේ. සෑම කාලයට ම යෝග්‍ය වූවක් ඇත්නම් ඒ ඉතා ස්වල්පයක් පමණකි. එබැවින් කර්මාන්තයන් කරන්නා වූ තැනැත්තා සුදුසු කාලයෙහි පටන් ගෙන ඒ ඒ කර්මාන්ත අනාකුල කොට කළයුතුය.

Non-commercial distribution

## කර්මාන්ත පිරිහීමට හේතු

කර්මාන්තයන් කරනු කැමති තැනැත්තාට කාලය ඉක්මීම වනාහි **ක්‍රීඩාවෙහි ලොල් බව, කථාවෙහි ලොල් බව, ආහාරයෙහි ලොල් බව, සුරා පානයෙහි ලොල් බව, ස්ත්‍රීන් කෙරෙහි ලොල් බව** යන මේවායින් සිදුවේ. **ක්‍රීඩාවෙහි ලොල් වූ තැනැත්තාට** තමා ක්‍රීඩා කිරීමට හෝ අන්‍යයන්ගේ ක්‍රීඩා බැලීමට හෝ පටන් ගත් කල්හි කර්මාන්තයට කාලය පැමිණි බව නො දැනේ. එයින් ඔහුට කර්මාන්තය අතපසු වේ. කර්මාන්තයට කාලය පැමිණ තිබිය දී යම්කිසි ක්‍රීඩාවක් කෙරේ යයි ඇසුවහොත් ඔහු කර්මාන්තය තබා එතැනට යන්නේ ය. එයින් ද කර්මාන්ත කළයුතු කාලය ඉක්ම යන්නේ ය.

**කථාවෙහි ලොල් වූ තැනැත්තාට** තමාගේ සපත්කම් ආදිය ප්‍රකාශ කරමින් සිටීමට පිරිස ලද හොත් කර්මාන්තයට කාලය පැමිණ තිබෙන බව නො දැනේ. ඔහු දවස මුළුල්ලේ වුවත් කථා කරමින් සිට වැඩ අතපසු කරන්නේ ය. මේ කාලයේ ගම්වල මෙබඳු පුද්ගලයෝ බොහෝ වෙසෙති. ඔවුහු තේ වතුර කඩවලට රැස්ව හිර මුදුන් වනතුරු ම සම්ඵප්ප්‍රලාප කීමට ගතකොට දවල් බතට ගෙවලට යෙති.

**සුදුවෙහි ලොල් වූ තැනැත්තා** එය පටන්ගත් කල්හි කර්මාන්තයට කාලය පැමිණි බව ඔහුට නො දැනේ. එයින් ඔහුට නියම කාලයේදී කර්මාන්තය කරන්නට නො ලැබෙන්නේ ය. **ආහාරයට ලොල් වූ තැනැත්තා** කර්මාන්තයට කාලය පැමිණ තිබෙන විට ද තමන් කැමතිවන ආහාරයන් සෙවීමට කාලය ගත කොට කර්මාන්තය අතපසු කරන්නේ ය. **සුරාවෙහි ලොල් වූ තැනැත්තා** කර්මාන්තයට කාලය එළඹ සිටියේ වී නමුත් සුරාව නො ලදහොත් එය සෙවීමට කාලය ගත කරන්නේ ය. සුරා පානයෙන් මත් වූ පසු ද ඔහුට කර්මාන්තයට කාලය පැමිණියේ වී නමුත් එය නො දැනේ. මෙසේ ඔහුට කර්මාන්තයන් අතපසු වන්නේ ය.

**ස්ත්‍රීන් කෙරෙහි ලොල් වූ තැනැත්තාට** තමා කැමති ස්ත්‍රියක් දක්නට හෝ ස්ත්‍රියක් හා කථා කරමින් සිටීමට හෝ ලදහොත් කොපමණ මහත් වැඩක් ඇති වුවත් එය සිහි නො වේ. කර්මාන්තයට කාලය බව සිහි වුව ද තව ටිකකින් යමි යයි

Non-commercial distribution

සිත සිතා කාලය කොපමණ වුවත් ඉක්මවන්නේ ය. මෙසේ ස්ත්‍රීන් කෙරෙහි ලොල් වූ තැනැත්තා කර්මාන්තයට යෝග්‍ය කාලය ඉක්ම වන්නේ ය.

මෙහි **"ලොල්"** බව යයි කියන ලද්දේ අධික ආශාවය. ක්‍රීඩා ආදියෙහි පවත්නා වූ ඒ අධික ආශාව, ලැබූ සම්පත් පිරිහීමට හා නො ලැබූ සම්පත් නො ලැබීමට හේතුවකි. එබැවින් දියුණුව අපේක්ෂා කරන්නා වූ සියල්ලන් විසින් ම කර්මාන්තයන්ගේ ආකුල භාවයට හා මරණින් මතු සතර අපායට පැමිණීමට ද හේතු වූ ඒ ලොල් බව හළ යුතුය.

## කර්මාන්ත දියුණුවට හේතු

කර්මාන්තයන් කිරීමෙන් ලැබෙන්නා වූ ඵලය ද ඒ ඒ කර්මාන්තයන්ගේ උසස් පහත්කම්වල හැටියට ද කුඩා මහත්කම්වල හැටියට ද කිරීමේ හොඳ නරක දෙකේ හැටියට ද වෙනස් වේ. කුඩා කර්මාන්තයක් ස්වල්ප කොට කිරීමෙන් මහත් වූ ධනයක් ලබාගත නො හේ. එබැවින් තමන් යම් පමණ ධනයක් ලැබීමට අදහස් කරන්නේ නම් එපමණ ධනයක් ලැබීමට සුදුසු කර්මාන්තයක් සුදුසු පරිදි ම කළ යුතු ය. රුපියල් දහසක් ලබා ගැනීමේ අදහසින් රුපියල් දහයක් ලැබිය හැකි කර්මාන්තයක් කිරීමෙන් රුපියල් දහස ලැබිය නො හේ. රුපියල් දහසක් ලැබීමට නම් දහසක් ලැබිය හැකි කර්මාන්තයක් දහසක් ලැබීමට සුදුසු පරිදි ම කළ යුතු ය. දහසක් ලැබිය හැකි කර්මාන්තයක් වුව ද දහසක් ලැබීමට සුදුසු නොවන පරිදි නො සැලකීමෙන් නො මනා කොට කෙළේ නම්, එය ආකුල කර්මාන්තයක් වීමෙන් බලාපොරොත්තු වන දහස ලැබිය හැකි නොවේ. කර්මාන්තය සුදුසු පරිදි කරන තැනැත්තා ම දහස ලබන්නේ ය. එබැවින් බුදුරජාණන් වහන්සේ ද 'ආලවක' යක්ෂයාහට මෙසේ වදාළ සේක.

**"පතිරූපකාරී ධුරවා උට්ඨාතා වින්දතෙ ධනං"**

ලෞකික වූ හෝ ලෝකෝත්තර වූ හෝ බලාපොරොත්තු වන්නා වූ ධනය ලැබීමට සුදුසු පරිද්දෙන් වැඩ කරන්නා වූ

Non-commercial distribution

ඵලය ලැබෙන තෙක් නො වැටෙන්නා වූ වීර්‍යයෙන් හා ශීතාදිය නිසා නො පසු බස්නා වීර්‍යයෙන් ද යුක්ත වූ තැනැත්තේ ලෞකික වූ ද ලෝකෝත්තර වූ ද ධනය ලබන්නේ ය, යනු එහි අදහසයි.

## අලස කමෙහි ආදීනවයෝ

සුදුසු පරිදි නො කිරීමෙන් වන කර්මාන්තයන්ගේ ආකුල භාවයට **නුවණ මඳ බව හා යට කී ලොල් භාවයෝ ද අලස බව ද** හේතු වන්නාහු ය. නුවණ මඳ අය වනාහි යම්කිසි නුවණ ඇති අයකුගෙන් උපදේශ ලබා ගෙන කර්මාන්තය මනාකොට කළ යුතු ය. අලස භාවය වනාහි කාලය ඉක්මවීම, සුදුසු පරිද්දෙන් කර්මාන්තය සිද්ධ නො වීම යන දෙකට ම හේතු වන්නේ ය. අලස තැනැත්තා වනාහි අන්‍යයන් උදෑසනින් නැගිට කර්මාන්තයට කතා කළහොත් තව ම ඉතා උදෑසනය, ඉතා සීතලය කියා කර්මාන්තයට නො යන්නේ ය. දවල් වූ කල්හි ද මේ වේලාව ඉතා උෂ්ණය: වැඩ කිරීමට අපහසු ය යි කර්මාන්ත නො කරන්නේ ය. සවස් වී උෂ්ණය නැති වූ කල්හි ද දැන් ඉතා සවස් වීය. වැඩ කිරීමට කාලයක් නැත යයි වැඩ නො කරන්නේ ය.

ආහාර අනුභව කළ කල්හි ද දැන් ආහාර ගත් ඇසිල්ලෙහි ම වැඩ කළ නො හැකිය යි කර්මාන්තය අතපසු කරන්නේ ය. ආහාර නොගත් කල ද දැන් සාගින්නේ වැඩ කළ නො හැකි යයි වැඩ අතපසු කරන්නේ ය. ගමනක් යන්නට තිබේ නම් අද ගමනක් යන්නට තිබේ යයි වැඩ නො කරන්නේ ය. ගමන ගොස් ආ කල්හි ද අද ගමන් ගිය බැවින් වැඩ නො කළ හැකි යයි කර්මාන්ත නො කරන්නේ ය. මෙසේ කර්මාන්තයන් අතපසු කරන්නා වූ තැනැත්තාගේ කර්මාන්තයෝ කාලය ඉක්මීමෙන් ද ආකුල වෙති. කර්මාන්තය මොනවට කරන්නට නො වීමෙන් ද ආකුල වෙති. එබැවින් අලස තැනැත්තා අලස භාවය නිසා ම ලැබිය හැකි සම්පත්තියෙන් පිරිහෙන්නේ ය. එබැවින් බුදුරජාණන් වහන්සේ ද මෙසේ වදාළහ:–

Non-commercial distribution

**"අති සීතං, අති උණ්හං අති සාය මිදං අහු**
**ඉති විස්සට්ඨ කම්මන්තා අත්ථා අච්චෙන්ති මාණවා"**

මේ වේලාව ඉතා ශීතය, මේ වෙලාව ඉතා උෂ්ණය, දැන් ඉතා සවස යයි කර්මාන්තයන් අතපසු කරන්නා වූ මනුෂ්‍යයෝ ලැබිය යුතු සම්පත්තිය ඉක්මවති, හෙවත් සම්පත්තියෙන් පිරිහෙතිය - යනු මෙහි අදහසයි.

මේ වේලාව ඉතා උදෑසනය, මේ වේලාව ශීතය, යනාදීන් අලසව කර්මාන්තයන් නො පිරිහෙවන්නා වූ ද, ශීතාදියෙහි කම්පා නො වන්නා වූ ද, ලැබිය යුතු ඵලය ලැබෙන තෙක් නො නවත්වන්නා වූ ද වීර්‍යයෙන් යුක්ත තැනැත්තේ මනාකොට කර්මාන්තයන් කොට ඉමහත් සැපතට නොබෝ කලකින් ම පැමිණෙන්නේ ය. ඔහු අලසව කල් යවා දිළිඳුව තැවෙන තැනැත්තන් මෙන් නො තැවෙන්නේ ය. එහෙයින් වදාළ හ:-

**යො ච සීතඤ්ච උණ්හඤ්ච තිණාභියො න මඤ්ඤති**
**කරං පුරිස කිච්චානි ස පච්ඡා නානු තප්පති**

යමෙක් ශීතල හා උෂ්ණය තණ පතකට වඩා ලොකු දෙයක් කොට නො සිතන්නේ ද, පුරුෂයන් විසින් කළයුතු කෘත්‍යයන් නො පිරිහෙලා කරන්නා වූ හෙතෙමේ පසුතැවිලි නො වන්නේ ය යනු අදහසයි.

**"අලසෝ ගිහී කාමභොගීන සාධූ"** යනුවෙන් අසාධු ගුණයන් දැක් වූ ජාතක පාළියෙහි ද "කාම භෝගී - කම් සැපෙහි ඇලුණු ගිහියා අලසයකු වූවොත් එය නො මනා බැව්" පැවසී ය.

Non-commercial distribution

# 5. වන ගාථාව

**දානඤ්ච ධම්මචරියාච - ඤාතකානඤ්ච සඞ්ගහො**
**අනවජ්ජානි කම්මානි - එතං මඞ්ගල මුත්තමං**

**දානඤ්ච** - දානය ද, **ධම්මචරියාච** - ධර්මහෙි හැසිරීම ද, **ඤාතකානං** - නෑයන්ට, **සඞ්ගහොච** - සංග්‍රහ කිරීම ද, **අනවජ්ජානි** - වරදින් තොර වූ, **කම්මානි** - ශීල සමාදනාදි කර්මයෝ ද යන, **එතං** - මෙය, **උත්තමං** - උතුම් වූ, **මඞ්ගලං** - මඟුල් සතරක් වන්නේ ය.

සනරාමර ලෝක මංගල වූ මංගල වාදී වූ භාග්‍යවත් වූ බුදුරජාණන් වහන්සේ මේ පස්වන ගාථාවෙන් ද මඟුල් සතරක් දක්වා වදරන ලදී.

එනම් :–

1. **දානය**
2. **ධම්මචර්‍යාවය**
3. **නෑයන්ට සංග්‍රහ කිරීමය**
4. **ශීල සමාදනාදි නිරවද්‍ය කර්මයෝ** ය.

යන මොව්හුය.

*Non-commercial distribution*

# 15. දනය

දනය යන ව්‍යවහාරය ආහාර පානාදි දන වස්තූන් කෙරෙහි ද පවත්නා මුත් මේ මංගල ගාථාවෙහි ලා එය අදහස් කරනු නො ලැබේ. මෙහි දනය යයි අදහස් කරන්නේ, තමා අයත් වූ ආහාරපාන මල් පහන් සුවඳ ආදි යම්කිසි වස්තුවක් හෝ මුදලක් හෝ දන් දීමෙන් මතු ලැබිය හැකි විපාකයක් ඇතය යන සම්‍යක් දෘෂ්ටිය පෙරදැරිකොට, බුද්ධාදි රත්නත්‍රයට හෝ ශ්‍රමණ බ්‍රාහ්මණ දුගීමගී ආදීනට හෝ පූජා කිරීම් වශයෙන් හෝ උපකාර කිරීමක් වශයෙන් හෝ පරිත්‍යාග කිරීමේදී තමන්ගේ සිතේ උපදින්නා වූ **පිරිසිදු චේතනාවයි**. කොටින් කියතොත් පින් සලකා තමා අයත් යම් කිසිවක් දීමයි.

**දනානිශංස**

**පීති මුදරං වින්දති දාතා,**
**ගාරවමස්මිං ගච්ඡති ලොකෙ**
**කිත්ති මනන්තං යාති ච දතා,**
**විස්සසනීයො හොති ච දතා.**

(බුද්ධවංසට්ඨකථා)

දන් දෙන තැනැත්තා උසස් ප්‍රීතියක් ලබයි. ලෝකයෙහි නුවණැත්තන්ගේ මහත් ගෞරවයට පාත්‍ර වෙයි. ඔහුගේ කීර්තිය රැව් පිළි රැව් දෙමින් ලොව පුරා පැතිරෙයි. ලෝකයාගේ විශ්වාසය දිනාගත් විශ්වාස කටයුතු කෙනෙක් වෙයි. මේ දන් දෙන තැනැත්තාට මෙලොව මැ අත්වන අනුසස් කීපයෙකි.

**ප්‍රීතිය හා එහි ප්‍රභේද**

ප්‍රීතිය නම් සිතේ හටගන්නා හොඳ චෛතසික ධර්මයෙකි. යහපත් ස්වභාවයෙකි. එය යම් සිතක යම් විටක ඇති වුවහොත්

Non-commercial distribution

ඒ සිත පිණවන - තෘප්තියට පමුණුවන ස්වභාවයක් ප්‍රීතියෙහි පවතී. නැතහොත් සිත පිණවන තෘප්තියට පමුණුවන ඒ ස්වභාවයට ප්‍රීතිය යයි කිව ද වරදෙක් නැත. '**සතුට**' යයි ව්‍යවහාර කරනුයේ ද එයට ම ය.

ඒ ප්‍රීතිය යමකුගේ චිත්තසන්තානයක පහළ වුවහොත් එම චිත්තසන්තානයත් එහි වූ සෙසු චෛතසික ධර්ම සමූහයත් යන සියලුම චිත්ත චෛතසික ධර්මයෝ පිණා යෙති. තෘප්තියට පැමිණෙති. ඔද වැඩෙති. ඒ ධර්මයන්ගේ ඔද වැඩීම පිණා යෑම නිසා ඔවුන්ගේ නිඃශ්‍රය වස්තුව වූ හෘදය වස්තු ගත ලේ පිරිසිදු බවට පැමිණේ. පවිත්‍ර වූ ලේ මුළු ශරීරයෙහි ම පැතිර යෑම නිසා මුළු මහත් සිරුර ම ඔද වැඩී පිණා ගොස් පැහැපත් වෙයි. ප්‍රීතිය වූ කලී මෙසේ සිත පමණක් නොව ගත ද පිණවන ඔද වඩ වන උසස් ධර්මයක් බව මෙහිලා කිව යුතු ය.

ඒ ප්‍රීතිය **සාමිෂ ප්‍රීතිය, නිරාමිෂ ප්‍රීතිය** යයි ද්විවිධ වේ. එයිනුදු **සාමිෂ ප්‍රීතිය**, **කාමාමිස ප්‍රීතිය**, **ලෝකාමිස ප්‍රීතිය**, **වට්ටාමිස ප්‍රීතිය** යයි නැවත ත්‍රිවිධ වේ.

### සාමිෂ ප්‍රීතිය

ඉෂ්ට වූ රූපාදි පඤ්චකාම වස්තූහුත් එම වස්තූන් නිසා ඇතිවන තෘෂ්ණාවත් යන මේ ධර්මයෝ **කාමාමිස** නම් වෙති. භවයෙන් භවයට යන, නැති නොවී විනාශ නොවී පවත්නා ආත්මයක් සත්ත්වයකු පුද්ගලයකු ඇතැයි වරදවා ගැන්ම වූ ශාස්වත දෘෂ්ටියත්, මේ සත්ත්වයා මේ ආත්මයෙන් පසු නැත, මේ ජීවිතය අවසන් වීමෙන් සියල්ල අවසන් වෙතැයි වරදවා ගැන්ම වූ උච්ඡේද දෘෂ්ටියත් යන ද්විවිධ වූ දෘෂ්ටීන් සමග යෙදුණු තෘෂ්ණාවත් ඒ තෘෂ්ණාවට අරමුණුවන වස්තූහුත් අෂ්ටලෝක ධර්මයත් **ලෝකාමිස** නමි. භව තෘෂ්ණාවත් එයට අරමුණුවන භව සම්පත් ආදියත් **වට්ටාමිස** නම් වේ. - මේ **ත්‍රිවිධ වූ ආමිෂයන්** හා ගැටුණු බැඳුණු ප්‍රීතිය **සාමිෂ ප්‍රීති** යයි. එය අකුශලයෙකි. එය අකුශලයක් වුව ද එය ද සත්ත්වයාගේ ගත සිත පිණවීමෙහි සමර්ථ වූවකි. ලෝකයෙහි සුඛිත මුදිතව ජීවත් වන කෙනකුගේ වත දැකීමෙන්

Non-commercial distribution

ඔහු නිතර සතුටින් කල් යවන කෙනකැයි කිව හැකි වන්නේ එම කාරණය නිසාය. එහෙත් එම ප්‍රීතිය තාවකාලික වූවකි.

ක්‍රෝධය ද්වේෂය කෝපය තරහ යන නම්වලින් හඳුන්වනු ලබන පාප ධර්මය ප්‍රීතියට විරුද්ධ ධර්මය බව දත යුතුයි. ශෝකය ද ප්‍රීතියට විරුද්ධ ස්වභාවයකි. ධර්ම වශයෙන් ශෝකය ද අනිකක් නොව ද්වේෂය ම බව කිව යුතුය. එය සන්තානය පිණවන ධර්මයක් නොව දවන තවන ධර්මයකි. එහෙයින් ක්‍රෝධ සහගත පුද්ගලයාගේ සන්තානය නිතර එයින් තවන දවන ලබන හෙයින් ඔහුගේ මුහුණ ද නිතර මැලවී ගිය ස්වභාවයක් දක්වයි. ගත ද එසේ ම ය. බලවත් කෝපයෙන් යුක්ත වූ කල භයානක ස්වභාවයක් දක්වන්නේ ද මේ නිසා ම ය. එය ද යට කී පරිදි ක්‍රෝධ සහිත සිත ඇසුරු කරන ලෙය තරක් වීමෙන් සිදු වන බව වටහා ගත යුතු.

**"තරහ වීමෙන් ඉක්මනට නාකි වේ"** යන කියමන මේ නිසා ඇති වූවකි. එබැවින් නිතර ප්‍රීති සහගතව ජීවත් වීම මෙලොව අනුන්ට ප්‍රිය වීමට පවා හොඳ කරුණක් බව දතයුතු.

**නිරාමිෂ ප්‍රීතිය හා එහි ප්‍රභේද**

පූර්වෝක්ත ත්‍රිවිධ ආමිෂයන් හා නො ගැටුණු නො බැඳුණු ප්‍රීතිය **නිරාමිෂ ප්‍රීති** නම් වේ. එය කුශලයෙකි. දන ශීලාදි පුණ්‍ය ක්‍රියා කිරීමේ දී ඒ පිළිබඳ පුහුදුන් තුළ කාමාවචර සිත් හි ඇති වන්නා වූ ප්‍රීතිය ලෞකික වශයෙන් ද, මාර්ගඵලාදි සිත්වල යෙදෙන කල ලෝකෝත්තර වශයෙන් ද පහළ වේ. ඒ නිරාමිෂ ප්‍රීතිය සත්ත්වසන්තානය වඩාත් පවිත්‍ර කිරීමෙහි ලා සමර්ථ වූවක් බැවින් එය උසස් ධර්මයෙකි.

**ඛුද්දිකා පීති, ඛණිකා පීති, ඔක්කන්තිකා පීති, උබ්බේගා පීති, ඵරණා පීති** - යයි නිරාමිෂ ප්‍රීතිය පඤ්ච ප්‍රකාර වේ. සකල ශරීරයෙහි ලොමු ඩැහැගැනීම් වශයෙන් ඇති වන්නා වූ ප්‍රීතිය **ඛුද්දිකා ප්‍රීති** නම්. ක්ෂණයක් ක්ෂණයක් පසා විදුලියක් මෙන් ඇතිවන්නා වූ ප්‍රීතිය **ඛණිකා ප්‍රීති** නම්. මුහුදු වෙරළේ රළ කැඩී කැඩී යන්නාක් මෙන් ඇති ව නැතිව යන්නා වූ ප්‍රීතිය **ඔක්කන්තිකා ප්‍රීති** නම්. වාතයෙන් පිරීගිය සම් පසුම්බියක් මෙන් සකල ශරීරගතව

*Non-commercial distribution*

පැතිර ඇති වන්නා වූ ප්‍රීතිය **එරණා ප්‍රීති** නම්. ශරීරය උඩට ඔසොවා අහසින් යවන්නට හැකි වන සේ ඉතා ම බලවත් ලෙස පහළ වන ප්‍රීතිය **උද්වේග ප්‍රීති** නම් වේ.

ඒ බලවත් උද්වේග ප්‍රීතිය නිසා අහසින් ද, ගොඩ මෙන් දියෙහි ද යන්නට පිලිවන. සිය නිවසෙහි සිට විහාරයට **අහසින් ගිය උපාසිකාවගේ** (පිදිය යුත්තන් පිදීම විස්තර කළ තැන දක්වා ඇත) පුවත ද, ගොඩ මෙන් දියෙහි ගොස් ගඟින් එතර වූ **"මහා කප්පින"** රජතුමාගේ පුවත ද මෙහිලා හොඳ නිදසුන් වශයෙන් සිහිපත් කළ යුතු ය.

තව ද බලවත් ප්‍රීතිය නිසා යටකී පරිදි පැහැපත් වන ශරීරයෙන් ඇතැම් විට ආලෝකය පවා නික්මෙන බැව් කිව යුතුය. බෞද්ධ ලෝකයෙහි උසස් තැනක් හිමි සැවැත් නුවර විසූ **'සුදත්ත'** (පසුව අනේපිඩු) සිටු තුමා ප්‍රථම වරට බුදුන් ලෝ පහළ වූ බව ඇසූයේ රජගහනුවර තම මස්සිනා ගේ නිවසෙහිදී රාත්‍රී කාලයෙහිදී ය. එයැසූ එතුමාට **'බුද්ධ'** යන වචනය ඇසූ වේලේ සිට උන්වහන්සේ දක්නට යෑමට බලවත් ඕනෑකමක් ඇති විය. එහෙත් උන්වහන්සේ වැඩ විසූ **'ශීත'** වනය ඈතක වූ හෙයින් එවේලෙහි යා ගත නො හැකිව පහන් වූ පසු උදෑසන ම යමි යි සිතා සයනය කෙළේ ය. එහෙත් රෑ තෙවරක් අවදි විය. තුන්වනවර පහන් වූයේ යයි සිතා අවදි වූ එතුමා පහන් වනතෙක් ඉවසා සිටිය නො හැකිව, එකලාව අඳුරෙහි ම ගමන ඇරඹිණ. **'සීවක'** නම් වූ මහ වනයත් පසුකොට යා යුතුව තිබුණු එම දීඝ මාර්ගයට එසේ පිළිපන් එතුමාගේ ශරීරයෙන් නික්මුණු ආලෝකය එතුමාට මඟ සොයා ගැන්මට උපකාර වූ බැව් සඳහන් වේ.

**අප බුදුන් වහන්සේගේ** ශ්‍රී දේහයෙන් කොතෙකුත් ෂඩ්වණී බුදු රැස් නික්මුණු බැව් ප්‍රකටය. එය සිදුවූයේ ද අමුතු හාස්කමකින් නොව උන්වහන්සේගේ චිත්ත පාරිශුද්ධිය නිසාම ය. බෝමැඩ දී සව් කෙලෙසුන් නසා උතුම් බුදු බවට පත් වුව දඃ උන්වහන්සේගේ ශ්‍රී දේහයෙන් බුදු රැස් නො නික්මිණ.

රතනඝරයෙහි වැඩහිඳ තමන් අවබෝධ කළ ධර්මය එකිනෙක වෙන් වෙන්ව මෙනෙහි කරන බුදුන් වහන්සේ පරමගම්භීර වූ

Non-commercial distribution

අනන්ත නය සමන්වාගත මහා පට්ඨාන ප්‍රකරණය මෙනෙහි කිරීමට ආරම්භ කළ සේක. එය මෙනෙහි කිරීමේ දී උන්වහන්සේගේ විශාල ඥානයට එය ම ප්‍රමාණවූයෙන් එය මෙනෙහි කරත් කරත්ම උන්වහන්සේට ඒ පිළබඳව බලවත් ප්‍රීතියක් උපණ. ඒ නිසා ඒ බලවත් ප්‍රීතියෙන් සකල ශරීරය ම පිණා ගොස් ඔද වැඩී ආලෝකවත් වී ෂට් වණී බුදු රැස් විහිදෙන්නට විය. ඉන්පසු සදහට ම ඒ නික්මීම එසේ ම සිදු විය. විශේෂ අවස්ථාවන්හි ඉටීමෙන් එය ඉතා විශාල ලෙස ද සිදුකිරීමට හැකි විය. මෙසේ නිරාමිෂ ප්‍රීතිය ඉතා ම වටිනා එකක් බැව් කිව යුතු ය.

**දන්දෙන තැනැත්තාට ඇතිවන නිරාමිෂ ප්‍රීතිය**

දන්දෙන තැනැත්තාට ද යටකී නිරාමිෂ ප්‍රීතිය තම තමන් තුළ ශ්‍රද්ධාව බලවත් වූ පමණට බලවත්ව ඇතිවන බව කිව යුතු ය. නව කෝටියක් ධනය යොදා ආරාමයක් කිරීමට භූමිභාගයක් ලබා, එපමණම මුදලක් විසඳ ආරාමයකට අවශ්‍ය සියලු විහාරාංගයන් නිම වූ **විශාබාවෝ** එතරම් ම මිළක් යටකොට **පූර්වාරාම මහා විහාරය** බුදුපාමොක් මහ සඟනට පූජා කළෝ ය. මෙසේ තම අදහස සිතූ පැතූ පරිදි ඉටු වූ පසු ඇතිවූ බලවත් ප්‍රීතියෙන් ඔදවැඩී ප්‍රීතියෙන් මත් වූ විශාබාවන් දූ දරුවන් සහ මුනුබුරු මිනිබිරියන් ද සෙසු අනුගාමික උවැසියන් ද පිරිවරා "කවද මම පුණ්‍ය පිරියම් කළ මැනවින් වැඩ නිම වූ රම්‍ය වූ මන්දිරයක් තනා නිමවා බුදුපාමොක් මහසඟනට පුදන්නෙම් දැයි මා තුළ පැවති අදහස අද මුදුන් පැමිණියේ ය" යනාදි අදහස් ඇතුළත් වූ,

**කදාහං පාසාදං රම්මං**
**සුධා මත්තික ලෙපනං.**
**විහාරදනං දස්සාමි**
**සංකප්පො මය්හ පූරිතො.**

යනාදි උදනගාථා (ප්‍රීති ගීතිකා) පසක් මධුර මනෝහර ලෙස ගී ගයන්නියක මෙන් මිහිරි හඬින් ගායනා කරමින් බුදුන් වහන්සේ පිණිසත් මහසඟන පිණිසත් තැනූ ඒ මහා ප්‍රාසාදය වටා යමින්, මෙකල ඇතැම් සැදැහැතියන් බුදුගුණ ගයමින් ප්‍රදීප දල්වා ගෙන

Non-commercial distribution

වෙහෙර විහාර ප්‍රදක්ෂිණා කරන්නාක් මෙන්, නට නටා ප්‍රීතිමත්වූ බැව් සඳහන් වේ.

අටළොස් කෙළ (දහඅට කෝටිය) ක් ධනය යොදා බිම ගෙන, එතරම් ම විසදා ගොඩනැගිලි තනා, එපමණ ම වැයකොට **ජේතවන මහාවිහාරය** බුදුපාමොක් මහ සඟනට පිදූ **අනේපිඬු සිටුතුමා** ද සූපනස්කෙළක් ධනය විසද තමන් කළ ඒ උතුම් ක්‍රියාවෙන් දෙව්ලොව මහත් සම්පත් ලැබ බලවත් ලෙස ප්‍රීතිව "මා විසින් කරන ලද ජේතවනාරාමයෙහි ඍෂිගණයා භික්ෂුසමූහයා පිරිවරන ලද ධර්ම රාජයාණන් වූ බුදුන් වහන්සේ, අහසෙහි තරු පිරිවැරූ පූර්ණචන්ද්‍රයා මෙන් දීප්තිමත් ව බබලමින් වැඩ සිටිති. එය මට මහත් ප්‍රීතියට කරුණෙකි." - යන අදහස ගැබ්වූ,

**ඉදං හිතං ජේතවනං - ඉසි සංඝ නිසෙවිතං**
**ආවුත්ථං ධම්මරාජේන - පීති සඤ්ජනනං මම**

යන (සංයුත්ත නිකාය) උදනයෙන් උදන් ඇනූ ප්‍රීති ගීතිකාවෙන් ප්‍රීති වූ බැව් පැවසේ.

අප බෝසත් **'අකීර්ති'** තාපස තුමා වනයෙහි තපස් රකින කාලයෙහි දිනක් එතුමාගේ ශීලය පිරික්සනු පිණිස දෙව්ලොවින් බට **සක්දෙව්රජ** මහලු බමුණු වෙසක් ගෙන එතුමා දිවා භෝජනය ගැන්වීමට සූදනම් වන වේලෙහි අසපුව (ආශ්‍රමය) ඉදිරිපිට අහරක් ලබා ගැන්මට පැමිණියකු සේ සිටගත. ඒ දුටු බෝසත්තුමා අනුභව කිරීමට පිළියෙල කරගත් කර කොළ ටික දෙදෙනකුට නො සෑහෙන හෙයින් කලකින් දනක් දීමට ප්‍රතිග්‍රාහකයකු හමුවී යි බලවත් ප්‍රීතියට පැමිණ මහලු බමුණාට දිණ. දෙවන තෙවනද ද එසේ ම දිණ. මේ දින කීපය තුළ ම බෝසත්තුමා එය කිසි ම හැකිළීමක් පැකිළීමක් පසුබට වීමක් නො මැතිව ප්‍රීතියෙන් කරනු දුටු සක්රජ බෝසතාණන් වහන්සේට ඒ තෙදිනෙහි ම අමුතුවෙන් ආහාරයක් පිළියෙල කර ගැන්මට කාලයක් නො ලත් හෙයින් නිරාහාරව නිරාමිෂ ප්‍රීතිය අනුභව කරමින් හුන් බව ද දන්නා බැවින් තුන්වනද 'ඔබ තුමාට මෙසේ දන්දීම දුෂ්කර කරුණකැ' යි සිතමි යි බෝසතාණන් වහන්සේට බමුණු වෙසින් සිට ම පැවසීය. එයැසූ **බෝසත්තුමා** මෙසේ පැවසී යː–

Non-commercial distribution

**යදි මාසම්පි ද්වේමාසං - දක්ඛිණෙය්‍යං වරං ලභෙ.**
**අකම්පිතො අනොලීනො - දදෙය්‍යං දනමුත්තමං**

"ඉදින් මාසයක් දෙකක් නමුත් මෙසේ දන් දීමට සුදුසු ප්‍රතිග්‍රාහකයකු ලැබේ නම්, කිසි ම කම්පාවක් හැකිළීමක් පැකිළීමක් පසුබටවීමක් නො මැතිව ඒ දීමනාව කරන්නෙමි" යනු එහි අදහසයි. දන් දීම මෙසේ මහත් ප්‍රීතියක් ගෙන දෙන්නක් බව මෙයින් ප්‍රකට වේ මැයි.

**දනයයි කී කල සියලු දීමනාවන් ම එහි ඇතුලත් වන බැවින් දන් දෙන තැනැත්තාට දන් දීමෙන් ලැබෙන සතුට අන් කිසිවක් කිරීමෙන් ලද නො හැකිය**. තමන් කෙතරම් හොඳට කෑවත් බීවත් හැඳ පැළඳ සිටියත් තවත් නොයෙකුත් විනෝදාත්මක දේ කළත්, ඒ පඤ්චකාම නිඃශ්‍රිත දේවල් කිරීමෙන් සතුටක් තාවකාලිකව ඇති වුවත් එය ඒ වේලාවට පමණෙකි. ඊයේ කොපමණ හොඳින් ඒ සියල්ල කළත් අද ඒවායින් සතුටක් නැත. අද ඒ සියල්ල නැවතත් අමුතුවෙන් සැපයිය යුතුව තිබේ. අද නොකා සිටියොත් ඊයේ ගත් ආහාරය නිසා ප්‍රීතිමත්ව සිටිය නො හැකිය. එක් එක් මනුෂ්‍යකු කෙතරම් විශාල ආහාරපාන රැසක් එක එක ශරීරයකට ඇතුල්කර ඇද්ද? එයින් අද කිසි ම සතුටක් නැත. අද ලදොත් පමණි ඒ වේලාවට පමණක් වත් යම්තම් සතටුවිය හැක්කේ. හැඳීම පැළඳීම ආදිය ගැන සලකා බැලුවත් මෙසේ ම ය. එක් එක්කෙනකු හැඳි වස්ත්‍ර සංඛ්‍යාව කෙතරම් විශාල ද? එහෙත් එයින් අද වැඩක් නැත. අද හොඳට අඳින්නට පළඳින්නට නැත්නම් දුකෙකි. කලින් ඇඳි පැළඳි ඒවා සිහිකර ඒ ගැන ප්‍රීති විය නො හැකිය.

විශේෂයෙන් බුද්ධශාසනයේ දියුණුවට හේතුවන විහාරස්ථාන දියුණු කිරීම, භික්ෂූන් වහන්සේගේ දියුණුවට අවශ්‍ය සියලු කටයුතු කිරීම, සමාජයේ දියුණුවට කටයුතු කිරීම, මෙසේ තමා උපන් ගමේ, සිය ආගමේ සිය ජාතියේ, සිය රටේ දියුණුව උදෙසා කළයුතු කුදුමහත් සියලු යුතුකම් ඉටු කිරීම ආදි වශයෙන් දන්දීම නමැති මේ උතුම් ක්‍රියාව යමෙක් කළා නම් ඔහු ඒ තමන් කළ යහපත සිත සිතා නැවත නැවතත් ප්‍රීති වෙයි. මෙසේ මෙලොව සතුටු වී පරලොව ද ඔහු සතුටු වෙයි.

Non-commercial distribution

**දීමෙන් මෙලොව ලැබෙන සෙසු අනුසස්**

දන් දෙන තැනැත්තා අනුන්ට යහපතක් සලසන බැවින් ඔහු ලෝකයාගේ **ගෞරයට ද** පාත්‍රවන බව කිය යුතු ය. අනුන්ට හිත පිණිස වැඩ පිණිස තමාගේ ධනය යෙදීමට හිත යෙදූ කෙනකු අනුන්ට විපතක් වීමට කැමති නැත. එහෙයින් ඔහු අනුන්ගේ දේ පැහැරගැනීම අනුන්ට හිරිහැර කිරීම පීඩා කිරීම අනුන් නැසීම වැනි වැරදි ක්‍රියාවලින් වලකින කෙනෙක් වේ. එවැනි පරහිත නිරත වූවන් ගැන මහජනයාගේ ගෞරවය අත්වනු නියත ම ය. එහෙයින් එවැනි උතුමන් ගැන මිනිසුන් තුළ පමණක් නොව දෙවියන් තුළ ද ගෞරවය ඇති වේ. දිනක් **සක් දෙව් රජ** මාතලී නමැති ස්වකීය රථාචාර්‍ය්‍යයා සමග රථයෙන් ගමනක් යනවිට රථයෙහි දී හදිසියේ ම සක්දෙව් රජ සිය ඔටුන්න පසෙක තබා හිස නමා නමස්කාර කෙළේ ය. ඒ දුටු **මාතලී දිව්‍යපුත්‍රයා** මෙසේ විචාළේ ය.

**සෙට්ඨකඳ්කුූ දෙවලොකස්මිං - ත්වම්පි දෙවො මහිද්ධිකො**
**අධො සීසං කරිත්වාන - කිං සක්කස්ස නමස්සසි.**

දේවයන් වහන්ස! මහානුභාව සම්පන්න වූ නුඹ වහන්සේ දෙදෙව් ලොවට අධිපති වූහ. එසේ වූ ඔබ හිස නමා අන් කිනම් ශක්‍රයකු හට නමස්කාර කළ සේක් ද?

**සක්දෙව්රජ:-**

**යෙ ගහට්ඨා පුඤ්ඤකරා - සීලවන්තො උපාසකා.**
**ධම්මෙන භරියං පොසෙන්ති - තෙ නමස්සාමි මාතලී.**

මාතලී රථාචාර්‍ය්‍යය! මනුලොව යම් කෙනෙක් සිල්වත්ව දන මානාදි පින්කම් කරමින් දැහැමින් අඹුදරුවන් රකිත් ද මම ඔවුනට නමස්කාර කරමි.

(සංයුක්තනිකාය)

දන් දෙන තැනැත්තාගේ **ගුණ කීර්තිය ද** ලොවැ පතිරී ඉතිරී යෑම ස්වභාවික සිද්ධියකි. බෞද්ධ ඉතිහාසයෙහි ලෝකය පවත්නා තාක් නො මැකෙන සේ ස්වර්ණාක්ෂරයෙන් ලියැවී

Non-commercial distribution

ඇති **අනාථ පිණ්ඩික**, **විශාඛා** ආදි නාමයෝ ද, **ධර්මාශෝක**, **දෙවන පෑතිස්ස**, **දුටුගැමුණු** ආදි නාමයෝ ද ලෝසසුන් දෙකට හිතවත්ව තම ධනය විසඳ ක්‍රියා කිරීම නිසා ලියැවුණු නාමයෝ ය. මෙකල වුවද ලෝකයෙහි සිය ධනය අනුන්ගේ යහපත උදෙසා යොදවන උතුමන්ගේ නාමයන් අමරණීය වන ලෙස සඳහන් වනු ඇත.

නිතර දන්දෙන තැනැත්තා විශ්වාස කටයුතු හොඳ කෙනකු හැටියට ලෝකයා තුළ පිළිගැන්ම ද ඇති වන බව කිව යුතු ය. මෙකී අනුසස් උසස් ලෙස හොඳ හැටියට ලැබෙන්නේ හොඳ අදහසින් අනුන්ට යහපත සලසන පිංවතුන්ට බව ද මෙහිදී සිහිපත් කළ යුතු ය. අංගුත්තර නිකායෙහි ද මෙසේ වදළහ.

**දදං පියො හොති භජන්ති නං බහූං,**
**කිත්තිඤ්ච පප්පොති යසොහි වඩ්ඪති**
**අමංකු භූතො පරිසං විගාහති,**
**විසාරදො හොති නරො අමච්ඡරී.**

දෙන තැනැත්තා ලෝකයාට ප්‍රිය මනාප වූවෙක් වෙයි. එහෙයින් ම බොහෝදෙන ඔහු ඇසුරට පැමිණෙති. කීර්තියට ද හිමිකාරයෙක් වෙයි. යසස් ද ඔහුට වැඩෙයි. ගිය ගිය තැන භයක් චකිතයක් නොමැති ව විශාරද ව සිටිය හැකිය. මෙය ද දෙන තැනැත්තාට මෙලොව ම ලැබෙන අනුසස් කිහිපයෙකි.

**දනයාගේ උත්තමතාව**

**දනං තාතං මනුස්සානං - දනං බන්ධු පරායනං**
**දනං දුක්ඛාධිපත්තා නං - සත්තානං පරමා ගති**

දනය මනුෂ්‍යයනට සා පිපාසාදි දුක් නසන්නා වූ ආරක්‍ෂාවකි. සියලු තන්හි උපකාරක වන දනය මනුෂ්‍යයනට නෑයෙකි. නොයෙක් දුක් නමැති සතුරනට ළංවිය නොහෙන බළ කොටුවකි. දුකින් පීඩිත වූ සත්ත්වයනට උතුම් වූ පිහිටකි.

Non-commercial distribution

**දුක්ඛ නිත්ථරණට්ඨෙන - දනං නාවාති දීපිතං**
**භයා රක්ඛණතො දනං - නගරන්ති ච වණ්ණිතං**

දනය දුකින් එතර කොට ස්වර්ගයට හා නිවනට සත්ත්වයන් පමුණුවන බැවින් නැවකැ යි කියන ලදී. නා නා ප්‍රකාර භයවලින් රක්නා බැවින් නගරය කැ යි වර්ණනා කරන ලදී.

**දනං දුරාසදට්ඨෙන - උත්තමාසීවිසොති ච**
**දනං ලොභමලාදීහි - පදුමං අනුපලිත්තිතො**

දානය වනාහි මසුරුමලයෙන් කිලිටි වූ සිත් ඇත්තන්ට ළංවිය නො හැකි බැවින් ඝෝර විෂ ඇති සර්පයකු මෙනැයි ද කියන ලදී. දනය ලෝභාදි මල නො තැවරීමෙන් පිරිසිදු බැවින් නෙළුම් මලක් බඳුය.

**දනං නාම සුඛාදීනං - නිදනං පරමං මතං**
**දිබ්බානං පන සොපානං - පතිට්ඨාති පවුච්චති.**

දානය වනාහි ආයු වර්ණ සැප බල ප්‍රඥාවන් ගේ උතුම් නිදානයකැ (මූලික හේතුවකැ) යි පවසන ලදී. දෙව්ලොවට නැඟීමට උතුම් හිණකැයි ද සත්ත්වයනට උතුම් පිහිටකැයි ද කියනු ලැබේ.

**නත්ථි දන සමො ලොකෙ - පුරිසස්ස අවස්සයො**
**පටිපජ්ජථ තස්මා තං - කිරියාජ්ඣාසයෙන ච**

ලෝකයෙහි පුරුෂයාහට දනය හා සමාන වූ අන්‍ය සැනසීමට කාරණයක් නැත්තේ ය. එබැවින් කළ යුතු වැඩක් යයි සලකා දන් දීමෙහි යෙදෙව්!

**සග්ගලොක නිදනානි - දනානි මතිමා ඉධ**
**කොහි නාම නරො ලොකෙ - න දදෙය්‍ය හිතෙ රතො.**

දනයෝ ස්වර්ග ලෝකයට පැමිණීමට හේතුහු ය. මේ ලෝකයහි තමා ගේ අභිවෘද්ධියෙහි ඇළුණු කවර නම් නුවණැත්තෙක් ඒ දනය නො දේ ද, දේ ම ය.

(බුද්ධවංසට්ඨ කථා)

Non-commercial distribution

මේ එද **'දීපංකර'** බුදුරජාණන් වහන්සේ **'රම්ම'** නගරවාසී උපාසක උපාසිකාවනට භුක්තානුමෝදනා වශයෙන් දේශිත වටිනා ගාථා කීපයෙකි. දනයාගේ උත්තමභාවය එයින් මොනවට පැහැදිලි වනු ඇත. මෙසේ නොයෙක් අයුරින් වර්ණනා කරන ලද දනය දෙලෝ දියුණුවට හේතුවන බැවින් **උතුම් වූ මංගලයෙකි.**

**දන් දිය යුත්තේ කෙසේද?**

යට දැක් වූ පස්වන ගාථාවෙහි අග දෙපදය වන **"පටිපජ්ජථ තස්මා තං කිරියාජ්ඣාසයෙන ච"** යන්නෙන් දන් දිය යුතු ක්‍රමය මැනවින් දැක්වූහ. **කිනම් දෙයක් හෝ දිය යුත්තේ "මෙය බෞද්ධයෙක් වූ මා විසින් කළයුතු වැඩක් හැටියටත් බෞද්ධයකු අයත් ක්‍රියාවක් හැටියටත් සැලකීමෙන් බව එයින් උගත්වයි.**

දීමෙන් මොන මොන ආනිශංස ලදත්, දීමනාව පුරුදු පුහුණු කළයුත්තේ ඒ අනුසස් ලැබීමේ අපේක්ෂාවෙන් නොව, මනුෂ්‍යත්වය ලැබූවකුට එය අයිති යුතුකමක් හැටියට සැලකීමෙනි. බෞද්ධයකුට අයිති එක් වැඩක් ලෙස සැලකීමෙනි. - **එහෙත් අද රටේ බොහෝ බෞද්ධයන් දන් දෙන්නේ,** මෙම උතුම් අදහසින් නො වන බව බොහෝ විට ප්‍රකට වන කරුණකි. ඇතැම් විට ආරාමයකට දන් දෙන බෞද්ධයා ඒ ආරාමයෙහි භික්ෂූන් වහන්සේගෙන් යම්කිසි සුළු ප්‍රමාද දෝෂයක් සිදු වුණිනම්, කටයුතු නවයක් කරදී දහවැනි කටයුත්ත කරදීමට ඒ භික්ෂූන් වහන්සේට නො හැකි වුණි නම්, ඇතැම්විට එවැනි වරදකුදු නැතිව ම ඇතැම් බෞද්ධයන් ගත්කටට ම කියන්නේ **"අපි මෙතෙක් කල් ඔය පන්සලට නැත්තම් පිරිවෙණට මේ මේ අන්දමට කටයුතු කළා"** **නමුත් අපට මෙහෙම කළා, "අපි මින් පසු ඔය පන්සලට - පිරිවෙණට දන් දෙන්නේ නැත"** යනාදි වචනය. වරදක් නැතිව ම යයි මා සඳහන් කළේ අත්දුටු සියගණනක් කරුණු උඩය. නිදසුන් වශයෙන් මෙහිලා එකක් දෙකක් සඳහන් කරමු.

**ලෙඩෙකුට පිරිතක් කියවා ගැන්මට** එක් නිවසකින් භික්ෂූන් වහන්සේලාට ආරාධනයක් ලැබුණි. ආරාධනයට ආවේ අයිතිකරු නොව අනිකෙකි. හේ ආරාධනය කළේ ය. භික්ෂූන් වහන්සේ ඉවසා

Non-commercial distribution

වදළහ. එම ආරාමයෙහි එක භික්ෂුවක් සිටියදී දෙතුන් නමක් ස්වර්ණමාලි චෛත්‍ය රාජයාගේ කොත් පැළඳවීමේ උළෙලට සහායවීම පිණිස යෑමට සූදනම්ව සිටියදීය, එම ආරාධනය පිළිගත්තේ. දින කීපයක් අනුරපුරයෙහි නතරව වැඳපුද ඒමේ අදහසින් සිටිය ද පසුව පැමිණි එම වේල්පිරිත වැනි සුළු කරුණක් නිසා භික්ෂූන් වහන්සේට එම අදහස වෙනස් කොට, සූදනම් වූ නිසා ම යම්තම් උත්සවයට පමණක් සහායවී ඒමේ අදහසින් යෑමට සිදුවිය. උදය වරුවේ ශුද්ධ භූමියට පා තැබූ ඒ පිරිස දවල් කාලයේ පැවති ඒ උත්සවය නිම වූ විගස ම පෙරළා ආහ. පුරා රාත්‍රි දෙකක් නිදි නැතිව නිසි ලෙසට නෑම කෑම බීම ආදි කිසි ම සැප පහසුවක් නො මැතිව, විශාල වෙහෙසක් දරා විශාල වියදමක් දරා ඒ ගිය ගමනෙහි නියම ප්‍රයෝජනයක් නො ලබා ආපසු ආවේ අර දායක මහතාගේ වේල්පිරිත කීමටය. එහෙත් ආපසු ආරාමයට පා තබන්නටත් පළමු ඒ පිරිසට දැන ගන්නට ලැබුණේ කුමක්ද? පිරිත් ටිකක් කියවා ගැන්මට දින නියමයක් ද නැතිව තමන් ද නො ගොස් අතවැසියකු අත ඇරයුම යැවූ දයක මහත්මා පිරිත් හත් වේලක් කියවා ගැන්මේ අදහසින් ආරාමයට ගොස් අසනීපව වැඩහුන් ආරාමාධිපතීන් වහන්සේට දැන් වූ කල, දැනට සංඝයා නැති බවත් සංඝයා පැමිණි පසු එය ඉටු කර ගත හැකි බවත් විහාරාධිපතීන් වහන්සේගෙන් අවසර ලැබුණු කල, දයකයා කිපී එතැන් සිට බැණ වදිමින් ගිය බවත් ය.” ඉන් පසු ද වෂී ගණනාවක් ගතවනතෙක් ඒ කරුණ මුල් කොට ඒ දයකවරුන්ගෙන් ඒ භික්ෂූන් වහන්සේලාට නොයෙක් වර යම් යම් සිත් දූෂ්‍යවන කථා අසන්නට සිදු වූ බවත් මම හොඳින් දනිමි.

**කුඩා දරුවකුගේ මරණයක්** පිළිබඳව මතක වස්ත්‍ර පිදීමට වැඩිය යුතු බවට දිනක් ආරාමයකට ආරාධනයක් ලැබිණ. එම ආරාමයෙහි වැඩහුන් හත් නමක් පමණ වූ භික්ෂූන් වහන්සේලාගෙන් තුන් නමක් එදින කලින් යොද ගෙන තිබුණු ඉතා ම වැදගත් ජාතික ආගමික කටයුත්තක් වෙනුවෙන් පිට පළාතකට ගිය හෙයින් ආරාමයෙහි වූ සතර නමක් ඒ කටයුත්තට සහායවීමට වැඩිය බව දනිමි. කලින් මෙතෙක් භික්ෂූන් වහන්සේ අවශ්‍ය යයි ප්‍රමාණයක් ද නො කියා එක නමක් වැඩියත් හොඳට ම ප්‍රමාණ වූ එම

Non-commercial distribution

කටයුත්තට සතර නම ද ප්‍රමාණ නොවී කිපුණු ඇතැම් අය භික්ෂූන් වහන්සේට නො මනා ලෙස නැති තැන නිග්‍රහ කළ බව ඇසීමි. ඇතැම් බෞද්ධයන්ගේ තත්ත්වය මැන ගැන්මට මේ නිදසුන් දෙක හොඳට ම ප්‍රමාණය.

**නිතර තමන්ට උපස්ථාන කරන** බෞද්ධයන්ගේ එවැනි ආගමික කටයුතු ඉටු කරදීම භික්ෂූන් වහන්සේට අයිති යුතුකමකි. එහෙත් ඒ සියල්ල සිදුවිය යුත්තේ ඒ ඒ අවස්ථා අනුව භික්ෂූන් වහන්සේට පැමිණ ඇති යම් යම් අපහසු කම් ඇතොත් ඒ අනුව ඉටු කළ හැකි තත්ත්වය අනුවය. **ලෝකයෙහි ශිෂ්ට මිනිසුන්** විසින් ඒ ඒ තම තමන් අදහන ආගම අනුව ජීවිතය පිළිබඳව මංගල අවමංගලාදි සියලු කටයුතු ආගම මුල් කොට සිදු කරනු ලැබේ. එහෙත් ඒ සියල්ල සිදුවන්නේ ඒ ඒ ආගමික පූජකවරයන්ගේ අදහස් දැන එයට අනුකූලවන ලෙසට ය. එසේ නොව තම තමන්ට වුවමනා ලෙසට හිතෙන හිතෙන ලෙසට ඒ ඒ පූජ්‍යවරුන් ලවා ඒ කිසිම ආගමික ක්‍රියාවක් සිදු කර ගත නො හැකිය.

**බුදුන් වහන්සේ වූ කලී** සාමය සමගිය ඉවසීම ආදි විශිෂ්ට වූ අනන්ත ගුණයන්ට ආකරයක් වූ ලොවැ ශ්‍රේෂ්ඨ තම ශාස්තෘවරයාණන් වහන්සේය. එවැනි ශාස්තෘවරයකු අදහන බුද්ධ ධර්මය අනුව පිළිපදින, '**සිංහල බෞද්ධයා**' පමණක් ආගමික ක්‍රියාවල දී ආගමික ක්‍රියා පිළිබඳ මාර්ග දේශකයාණන් වූ භික්ෂූන් වහන්සේගේ අනුශාසනාව කිසිම ගණනකට නොගන්නා බව කිව යුතු. එයට ප්‍රධාන හේතුව බොහෝ බෞද්ධයන් නමින් පමණක් බෞද්ධයන් වී සිටීම ය.

**අද බොහෝ විට මුදල් ඇති කෙනකු මිය ගිය කල**, පළාතේ සිටින සියලු ම භික්ෂූන් එහි කැඳවා භික්ෂු ප්‍රදර්ශනයක් පැවැත්වීම වූ නොමනා සිරිත වැනි බොහෝ සිරිත් පුරුදු පුහුණු වී තිබෙන්නේ ද දැනුමෙන් තොර ඇදහීම නිසා ය. **පරලොව ගිය කෙනකුට යමක් පුද පිං දීමට සතර නමක් සිටියත් හොඳට ම ප්‍රමාණය**. එය එසේ නම් දසදොළොස්නමක් වැඩම කර ගැන්මෙන් ඒ කටයුත්ත ලක්ෂණටත් හොඳටත් ඒ වැඩමවන භික්ෂූන් වහන්සේට ප්‍රයෝජන වන ලෙසට යමක් පිදීමටත් හැකි වන සේ

Non-commercial distribution

එය කළ හැකිව තිබියදී, ප්‍රදර්ශනයට භික්ෂූන් කැඳවීම අනවශ්‍ය දෙයක් බව කිව යුතු ය.

**පළාතට රටට ජාතියට ආගමට විශාල සේවයක් කළ,** විශේෂ පුද්ගලයකු වෙනුවෙන් කරන කටයුත්තකට නම් භික්ෂූන් වහන්සේ සිය ගණනින් වැඩම කර වුව ද වරදෙක් නැත. එවැනි අවස්ථාවක නම් ආරාධනයක් නැතත් ඒ පුද්ගලයාට ගරු කිරීමක් වශයෙන් භික්ෂූන් වහන්සේ වැඩිය ද එය අනවශ්‍ය කරුණක් නො වනු ඇත. ගරු කළ යුත්තාට නියම ගෞරවය දැක්වීම යුතුකමක් මෙන් ම එවැනි අවස්ථාවලදී ඒ දක්වනු ලබන ගෞරවය දකින පිරිසට ද ඒ විශාල ගෞරවයට ඔහු හිමිවූයේ ඔහු කළ යහපත් ක්‍රියාවන් නිසා බව දැන, ඒ අනුව තම ජීවිතය සකස් කර ගැන්මට ද උපකාර වන බැවිනි.

සැම බෞද්ධයකු ම භික්ෂූන් වහන්සේ ගුරු තන්හි තබා තමන් ශිෂ්‍යයකු ලෙස සිතා කටයුතු කරතොත් යටකී අයුරු නො මනා වාද භේදත් නො මනා ගති සිරිතුත් බෞද්ධ ලෝකයෙන් තුරන්වනු ඇත. **ඇතැම් භික්ෂූන් වහන්සේලා ද මේ කරුණු ගැන වග කවයුත්තෝ වෙති**. අද ඇතැම් භික්ෂූන් වහන්සේලා ධර්ම ශාස්ත්‍රීය කටයුතු වලින් බොහෝ දුරට ඈත්ව වෙසෙති. මහණකම නම් දයක මහතුන්ගේ දන, පිරිත, මතකය පිළිබඳ කටයුතු ටික කිරීම පමණක් යයි සිතා සිටින්නෝ ද වෙති. එවැනි ඇතැම් භික්ෂූන් වහන්සේට ආගමික ජාතික හැඟීම් කිසිවක් නැත. එය එසේ නම් එවැන්නන්ගෙන් ජාතික ආගමික සේවයක් කෙසේ ඇතිවිය හැකි ද?

නිදර්ශනයක් වශයෙන් කියතොත් රට ජාතිය ආගම මිෂනාරි බලවේගයෙන් මුදවා ගැන්ම පිණිස සමස්ත ලංකා එක්සත් භික්ෂු සංගමය මගින් සංවිධානය කරන ලදුව **1956 පෙබරවාරි මස 25 වෙනිද පැවැත්වූ මහා උපවාසයට** සහාය **වූ** ඇතැම් භික්ෂූන් කලින් යොදගත් බොහෝ වැඩ, සමහරක් **කල්** දමා සමහරක් නතරකොට එයට සහාය වූ අතර, ඇතමෙක් **උපවා**සයට සහාය වූ භික්ෂූන් වහන්සේලා අතැර දැමූ ආරා**ධනා** පිළිගෙන ඉතා ඕනෑකමින් ඉටුකර දුන් බව ප්‍රකට කරුණකි.

Non-commercial distribution

**රටත් ජාතියත් ආගමත්** මිථ්‍යාදෘෂ්ටිය නැමැති යක්ෂයා ගිලගනිද්දී ආගමට ම කැපවී සිටින ආගම නිසා ම ජීවත් වන භික්ෂුවට ඒ වෙනුවෙන් එක වේලක් නිරාහාරව සිටීමට තරම් ආත්ම ශක්තියක් ආගමාලයක් නො මැති වීම ලජ්ජාවිය යුතු කරුණකි. එහෙත් යම් යම් කාරණා නිසා එයට සහායවීමට නො හැකි වුණි නම්, ඒ ගැන විරුද්ධකම් නොපා නිහඬ වූ සේක් නම් මැනවි. එහෙත් සිදුවූයේ අනිකකි. ඇතැම් කෙනෙක් වැරදී එන ඇරයුම් ඉටුකිරීමට පුලපුලා සිටියහ. තවත් කෙනෙක් තමන්ගේ විළිබිය නැතිකම වසා ගැන්මට සිතාදෝ උපවාසයෙහි යෙදුණු භික්ෂූන් වහන්සේට අපහාසයෙහි යෙදුණහ.

මෙවැනි ලාමක අදහස් ඇති, වැඩක් නො මැතිව කල් යවන, ලාභයක් ලැබෙතොත් ඕනෑ ම විළිබිය නැති වැඩක් වුව ද කිරීමට පෙළඹෙන ඇතැම් භික්ෂූන් වහන්සේලා යටකී පරිදි දනක් හෝ පිරිතක් හෝ මතකයක් හෝ එනතෙක් බලා සිටිති. එවැන්නක් ආ කල තමන් විශාල කෙරුම්කාරයන් ලෙස රටට දැක්වීමට නැතහොත් දයකයා ව සතුටු කොට මතු ලොකු වාසි ලබා ගැන්මේ අදහසින් දයකයාගේ ඉල්ලීමටත් වඩා විශාල ලෙසට එවැනි කටයුතු යොද ගැන්මට අනුශාසනා කරති. එවැනි භික්ෂූන් වහන්සේලා මෙම කරුණු ගැන විශේෂයෙන් සලකා බලා තම තමන් තුළ පවත්නා දුර්වලකම් නැති කර ගැන්මට සිතත්වා!

**දීමේ පරමාර්ථය.**

යමෙකුට යමක් දිය යුත්තේ ඔහුගෙන් වැඩක් පලක් කරවා ගැන්මේ අදහසින් නොව, ඔහුට උපකාරයක් ආධාරයක් වශයෙනි. වැඩක් පලක් කරවා ගැනීමේ අදහසින් දෙන දීමනාව නියම දීමනාවක් නොව කුලිය දීමකි. එබැවින් අපේ බෞද්ධ පිංවතුන් විසින් භික්ෂූන් වහන්සේට - ආරාමයට දෙන දනය පිළිබඳ ව මෙහිලා විශේෂයෙන් සැලකිය යුතුය. භික්ෂූන් වහන්සේට දෙන දනය පමණක් නොව සර්වඥ ශාසනයේ දියුණුව පිණිස සිදු කරනු ලබන විහාරස්ථාන දියුණු කිරීම, භික්ෂූන් වහන්සේ ගේ දියුණුව පිණිස කරන ලොකු කුඩා කටයුතු කිරීම ආදි සියලු ම

Non-commercial distribution

ජාතික ආගමික කටයුතුවල දී පිළිපැදිය යුත්තේ ද ඒ උතුම් ප්‍රතිපත්තිය ම ය.

භික්ෂූන් වහන්සේට දන් දෙන, සලකන, ස්ථානයේ දියුණුවට කටයුතු කරන බෞද්ධයා එම භික්ෂූන් වහන්සේ ගෙන් තමන්ගේ වැඩ ටික පිරිමසා ගැන්මේ අදහසින් හෝ දේශපාලන ප්‍රශ්න වැනි ප්‍රශ්නවල දී තමන්ගේ පැත්තට වැඩ කරවා ගැන්මේ අභිලාෂයෙන් හෝ වෙනත් එවැනි සුළු කරුණු නිසා හෝ භික්ෂූන් වහන්සේට දන් දෙතොත් සලකතොත් ස්ථානයේ දියුණුවට කටයුතු කරතොත් එය පරම අනුවණ කමෙකි.

දුගියකුට හෝ මගියකුට හෝ වේවා දෙන දීමනාව වුව ද ඔහු කෙරෙහි අනුකම්පා උපදවා ඔහුට යහපතක් සලසන අදහසින් දිය යුතුය. එවිටය, නියම දීමනාවක් වන්නේ. භික්ෂූන් වහන්සේ පිළිබඳ ව ද පැවැත්විය යුත්තේ පූජාවක් කිරීමේ අදහස සමග යහපත සැලසීමේ අදහසින් ම ය. උන්වහන්සේ අපට වඩා උසස් ගුණ ධර්ම පූරණයෙහි, ධර්මය උගෙනීමෙහි, ධර්මය දේශනා කිරීමෙහි, ධර්මය ආරක්ෂා කිරීමෙහි, ධර්මය ව්‍යාප්ත කිරීමෙහි නියැලුණු උත්තමයෙකි. ශබ්ද ශාස්ත්‍රය උගෙනීමෙහිත් උගැන්වීමෙහිත් එහි දියුණුව පිණිසත් කටයුතු කරන උත්තමයෙකි. වෙනත් කොතෙකුත් ලොකු කුඩා සමාජ සේවක කටයුතුවල ද නිරත වූ උත්තමයෙකි.

මෙසේ කුදු මහත් ලෝක ශාසනික උතුම් සේවයක යෙදී, සිටින අපට වඩා බොහෝ ගුණ ධර්මයෙන් ද වැඩි, සීලයෙන් ද වැඩි ඒ උත්තමයාට සැලකීම සත්කාර සම්මාන කිරීම බෞද්ධයකු වශයෙන් මා අයත් යුතුකමකි. ශිෂ්ට මනුෂ්‍යයකු වශයෙන් කළ යුතු උතුම් ක්‍රියාවකි. අප එසේ උන් වහන්සේට උපස්ථාන නො කළහොත් උන් වහන්සේට ඒ උතුම් සේවය කළ නොහැකි වනු ඇත. අපගේ උපස්ථානය උන් වහන්සේ ගේ ඒ සේවය යහතින් ඉටුවීමට රුකුලක් වේවා! අපගේ දනය උන් වහන්සේට සුවසේ කටයුතු කිරීමට ආධාර වේවා! අපගේ දන් වළඳ උන්වහන්සේ සුවපත් වේවා! චිරාත් කාලයක් ශාසනික කටයුතු කිරීමට උන් වහන්සේගේ ජීවිතය පවත්වා ගැන්මට අපගේ දනය මහෝපකාරී වේවා! මේ ආදි යහපත් අදහස් පෙරටු කොටය, භික්ෂූන් වහන්සේට දන් දිය යුත්තේත්, සැලකිය

Non-commercial distribution

යුත්තේත්, සෙසු ස්ථානයේ දියුණුව පිණිස කරන සෑම කටයුත්තක් ම කළ යුත්තේත්. එවිටය, දීමෙන් ලැබෙන උසස් අනුසස් ද නොඅඩුව තමන්ට ලබාගත හැක්කේ. එබැවින් දන් දීමේ දී මෛත්‍රී කරුණා ගුණයන් පෙරදැරි කොට අනුන්ට යහපතක් උපකාරයක් සලසන අටියෙන් ම දීමට පුරුදු පුහුණු වෙත්වා! **අප මහ බෝසත් සිවි රජතුමා**, දන්දෙන අදහස මෙසේ දැක්විණ:–

**න චාහමෙතං යසසා දදාමි**
**න පුත්තමිච්ඡෙ න ධනං න රට්ඨං**
**සතංච ධම්මො චරිතො පුරාණො**
**ඉච්චෙවදනෙ රමතෙ මනො මමං**

**මම දිව්‍ය මනුෂ්‍ය සැප පතා ඇස් දන් නොදෙමි. ඇස් දන් දුන් පිනින් අඹුදරු ධන ධාන්‍යාදි කිසිවක් හෝ රටක් හෝ නො පතමි. දිම බුද්ධාදි උත්තමයන් වහන්සේලා විසින් වඩන ලද පුරුදු කරන ලද උතුම් ගුණධර්මයෙකි. නිවන් යෑම පිණිස සොයා ගත් පැරණි මාර්ගයෙකි. මේ කරුණු නිසා මාගේ සිත දනයෙහි ඇළුනේ වෙයි.** (දනය පිළිබඳව දතමනා තවත් බොහෝ කරුණු ඇතත් ඒ සියල්ල මෙහිලා විස්තර නො කළ හැකිය. සම්බුද්ධ ජයන්ති ධර්ම පුස්තක අංක 3 දරණ **බෞද්ධයාගේ අත්පොතෙහි** ඒ සියල්ල ඇතුලත්ව ඇත.)

Non-commercial distribution

# 16. ධර්ම චර්යාව

"ධර්ම චර්යාව" නම් දශකුල කර්මපථයෙහි හැසිරීමය. "ධර්ම" යන වචනයෙන් ප්‍රකාශවන නොයෙක් අර්ථ ඇත ද මෙහිලා දශකුසල කර්මපථය ප්‍රකාශ වේ. සමචර්යා යනු ද මේ ධර්ම-චර්යාවට ම නමෙකි. ඒ ධර්ම චර්යාව තථාගතයන් වහන්සේ විසින් "**සාලෙය්‍ය**" සූත්‍රයෙහි වදාළ පරිදි මෙහිලා විස්තර කරනු ලැබේ.

බුදුපියාණන් වහන්සේ කොසොල් රට "සාල" නම් බමුණු ගම්හි ධර්මදේශනා කරන සේක්:– ධර්මචර්යා සංඛ්‍යාත සමචරියාව මෙසේ වදාළ සේක. ගෘහපතියෙනි! ධර්මචර්යා සංඛ්‍යාත සමචර්යා හේතුවෙන් මේ ලෝකයෙහි සමහර සත්ත්ව කෙනෙක් මරණින් මතු සුකෘත කර්මකාරීන්ගේ උත්පත්ති ස්ථානය වූ ස්වර්ග ලෝකයෙහි උපදනාහු ය.

ගෘහපතියෙනි, තුන් අයුරකින් කයින් ධර්මචර්යා සංඛ්‍යාත සමචර්යාව වන්නේ ය. සතර ආකාරයකින් වචනයෙන් ධර්මචර්යා සංඛ්‍යාත සමචර්යාව වන්නේ ය. තුන් අයුරකින් සිතින් ධර්මචර්යා සංඛ්‍යාත සමචර්යාව වන්නේ ය.

ගෘහපතියෙනි, තුන් ආකාර වූ කයින් ධර්මචර්යාව කෙසේද යත්? ගෘහපතියෙනි! මේ ලෝකයෙහි ඇතමෙක් ප්‍රාණඝාතය හැර ප්‍රාණඝාතයෙන් වැළකුනේ, බහා තැබූ දඬුවම් ඇත්තේ, බහා තැබූ ආයුධ ඇත්තේ, ලජ්ජා ඇත්තේ, කරුණාවත් බවට පැමිණියේ, සියලු සත්ත්වයන් කෙරෙහි අනුකම්පාව ඇත්තේ වෙසෙයි. අදින්නාදනය හැර අදින්නාදනයෙන් වැළකුනේ වෙයි. ගම්හි හෝ වනයෙහි හෝ අනුන්ගේ වස්තුවක් වේද හිමියන් විසින් නුදුන් ඒ වස්තුව සොර සිතින් නො ගන්නේ ය. කාමමිථ්‍යාචාරය හැර එයින් වැළකුනේ වෙයි. මව විසින් රක්නා වූ ද, පියා විසින්, මව්පිය දෙදෙනා **විසින්**,

*Non-commercial distribution*

සොහොයුරා විසින්, සොහොයුරිය විසින්, නෑයන් විසින් රක්නා වූ ද, ගෝත්‍රයෙන් රක්නා ලද්දා වූ ද, ධර්මයෙන් රක්නා ලද්දා වූ ද සැමියකු ඇත්තා වූ ද, දඬුවම් ඇත්තා වූ ද මේ ආදි කවරකු විසින් හෝ රක්නා ලද යම් ඒ ස්ත්‍රීහු වෙත් ද, එබඳු ස්ත්‍රීන් කෙරෙහි හැසිරීමට නො යයි. ගෘහපතියෙනි! මෙසේ තුන් අයුරකින් කයින් ධර්මචර්‍යාව වන්නේ ය.

ගෘහපතියෙනි! සතරාකාරයකින් වචනයෙන් ධර්මචර්‍යා කෙසේ වේද යත්? ගෘහපතිය! ලෝකයෙහි ඇතමෙක් මුසාවාදය හැර මුසාවාදයෙන් වැළකුනේය. සභාවකට ගියත්, පිරිසකට ගියත්, නෑයන් මැදට ගියත්, රජගෙදරට ගියත්, ජන සමූහයක් මැදට ගියත්, පින්වත් පුරුෂය! මෙහි එවයි ඉදිරියට කැඳවන ලදුව "එම්බා පුරුෂය! තෝ යමක් දන්නෙහි නම් කිව" යි සාක්ෂි විචාරන ලද්දේ දන්නේ දනිමියි කියයි. නො දන්නේ නො දනිමියි කියයි. නුදුටු දේ නුදුටිමියි කියයි. දුටු දේ දුටිමියි කියයි. තමා නිසා හෝ අනුන් නිසා හෝ යම්කිසි ලාභයක් නිසා හෝ බොරු නො කියයි. කේලාම් කීම හැර එයින් වළකියි. තැනකින් යමක් අසා භේද කිරීම පිණිස තවත් තැනක එය නො කියයි. භේද වී සිටින්නවුන් සමගි කරයි. එක් වූවන්ට සමගියෙහි අනුසස් කියයි. සමගියෙහි ඇළුනේ වෙයි. සමගියෙහි සතුටු වන්නේ වෙයි. ඵරුෂ වචනය හැර ඵරුෂ වචනයෙන් වැළකුනේ වෙයි. යම් වචනයක් කනට නිර්දෝෂ ද සැපවේ ද ප්‍රේම කටයුතු ද සිතට ප්‍රිය ද ගුණයෙන් පිරුනේ ද බොහෝ දෙනාට යහපත් වේද ප්‍රියමනාප වේ ද, එබඳු වචන ම කියන්නේ ය. සම්ඵප්‍රලාපය හැර සම්ඵප්‍රලාපයෙන් වැලකුනේ වෙයි. සුදුසු කාලයෙහි කියන්නේ ය. වූ දෙයක් කියන්නේ ය. කාරණයක් කියන්නේ ය. ධර්මයක් කියන්නේ ය. සිතට ගතයුතු දැයක් කියන්නේ ය. වැඩදායක වූ වචනයක් කියන්නේ ය. ගෘහපති යෙනි! මෙසේ සතරාකාරයකින් වචනයෙන් ධර්මචර්‍යා සංඛ්‍යාත සමචර්‍යාව වන්නේ ය.

ගෘහපතියෙනි, කෙසේ නම් තුන් අයුරකින් සිතින් ධර්මචර්‍යාව වේද යත්? මේ ලෝකයෙහි ඇතමෙක් අධික ලෝභය නැත්තේ වේ. අනුන් අයත් යම් වස්තුවක් වේ නම් "එය මට වේ නම් ඉතා යෙහෙකැයි" අන්සතු වස්තුව තමා කෙරෙහි නංවා ලෝභ නො කරන්නේ ය. ක්‍රෝධ සිත් නැත්තේ වෙයි. මෙසේ මේ සත්ත්වයෝ

Non-commercial distribution

වෛර නැත්තාහු දුක් නැත්තාහු සුවසේ තම ආත්මය පරිහරණය කෙරෙත්වායි දූෂ්‍ය නො වූ කල්පනා ඇත්තේ වෙයි. සම්‍යක් දෘෂ්ටි ඇත්තේ වෙයි. දුන් දනයාගේ විපාක ඇත. කළ පූජාවට විපාක ඇත. යැව් පඬුරට විපාක ඇත. කුශලාකුශල කර්මයන්ගේ විපාකය ඇත. පරලොව සිටියහුට මෙලොවක් ඇත. මෙලොව සිටියහුට පරලොවක් ඇත. මව කෙරෙහි පියා කෙරෙහි සත්කාර කරන්නාට විපාක ඇත. ඕපපාතික සත්ත්වයන් ඇත. මෙලෝ පරලෝ දෙක ප්‍රඥාවෙන් ප්‍රත්‍යක්ෂ කොට දැන ප්‍රකාශ කරන්නා වූ යහපත් මාර්ගයෙහි ගියා වූ යහපත් පිළිපැදීම ඇත්තා වූ ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඇත යයි නිවැරදි දැකුම් ඇත්තේ වෙයි. ගෘහපතියෙනි! මෙසේ සිතින් ධර්මචර්‍ය්‍යාව සමචර්‍ය්‍යාව වෙයි.

ගෘහපතියෙනි! මේ ධර්මචර්‍ය්‍යා සංඛ්‍යාත සමචර්‍ය්‍යා ඇති තැනැත්තේ මරණින් මතු ක්ෂත්‍රිය මහාසාර කුලයෙහි උපදිනු කැමති වේ නම් එහි උපදනේ ය. බ්‍රාහ්මණ මහාසාර කුලයෙහි හෝ ගෘහපති මහාසාර කුලයෙහි හෝ චාතුර්මහාරාජික, තාවතිංස, යාම, තුසිත, නිර්මාණරති, පරනිර්මිත වසර්ති යන දෙවියන් කෙරෙහි හෝ උපදිනු කැමති නම් ඒ ඒ ස්ථානයෙහි උපදනේ ය. ප්‍රථම ධ්‍යාන තලය, ද්විතීය ධ්‍යාන තලය, තෘතීය ධ්‍යාන තලය, චතුර්ථ ධ්‍යාන තලය යන සොළොස් බඹතලයෙහි උපදිනු කැමැත්තේ නම් එහි උපදනේ ය.

ආකාසානඤ්චායතන, විඤ්ඤාණඤ්චායතන, ආකිඤ්චඤ්ඤායතන, නේවසංඤ්ඤා නාසඤ්ඤායතන යන අරූපී දෙවියන් කෙරෙහි උපදිනු කැමැත්තේ නම් එහි ද උපදනේ ය.

ගෘහපතියෙනි! ධර්මචර්‍ය්‍යා සමචර්‍ය්‍යා ඇති තැනැත්තේ ආශ්‍රවයන් ක්ෂයකිරීමෙන් අනාශ්‍රව වූ අර්හත්වයට ඉහාත්මයෙහි ම පැමිණෙනු කැමැත්තේ නම් ඔහු ඒ අර්හත්වයට ද පැමිණෙන්නේ ය. මේ සර්වඥයන් වහන්සේ විසින් **සාලා** නම් ගම් හි දී ධර්මචර්‍ය්‍යාව වදාළ ආකාරයයි.

මෙසේ අප තිලෝගුරු බුදුරජාණන් වහන්සේ විසින් වදාළ පරිදි සුචරිත ධර්මයෙහි හැසිරෙන්නා වූ පුද්ගලයන්ට මනුෂ්‍ය ලෝකයෙහි සියලු සම්පත් ද, චාතුර්මහාරාජිකාදි සදිව්‍යලෝකයෙහි

Non-commercial distribution

දිව්‍ය සම්පත් ද රූපාරූප බ්‍රහ්මලෝකයන්හි බ්‍රහ්ම සම්පත් ද සතර මාර්ග සතර ඵල නිර්වාණ සංඛ්‍යාත ලෝකෝත්තර සම්පත්තීන් ද ලැබිය හැකි බැවින් ධර්මචර්‍යාව උතුම් මංගලයක් වන්නීය.

තව ද ධර්මයෙහි හැසිරෙන තැනැත්තේ නරකාදි සතර අපායට නො පැමිණෙන්නේ ය. ඔහුට ප්‍රාණඝාතාදි දුශ්චරිතයන් හේතුකොට සත්ත්වයන්ට මෙලොව පැමිණෙන ධන හානි ඥාති හානි මිත්‍ර හානීහු ද නො වන්නාහු ය. ඔහු බන්ධනාගාරයෙහි වැටීම් ආදියෙන් ද මිදෙන්නේ ය. පණ්ඩිත ලෝකයාගේ ගර්හාවෙන් ද මිදෙන්නේ ය. මෙසේ ධර්මයෙහි හැසිරෙන තැනැත්තේ ධර්මය විසින් ම රක්ෂා කරනු ලැබ මෙලොව මහත් යස ඉසුරට ද පැමිණෙන්නේ ය. **ධම්මපාල ජාතකය** මෙයට නිදසුනෙකි. එබැවින් තම තමාගේ යහපත කැමති සියල්ලෝ ම ප්‍රාණඝාතාදි දුශ්චරිතයන්ගෙන් වැළකී දශකුශල කර්මපථ සංඛ්‍යාත ධර්මයෙහි හැසිරීමෙන් තමාගේ මෙලෝ පරලෝ යහපත සිද්ධ කර ගනිත්වා!

**ධම්චර්‍යාව නිසා මහලු නොවී**
**නො මියන ධර්මපාල පරපුර**

පෙර දඹදිව කසී රට ධම්පාල නම් බමුණු ගමෙක් විය. එහි මූලික පවුල (දශකුශල) ධර්මය පාලනය කරන (රකින) හෙයින් **'ධම්පාල'** යන නාමය එම පවුලට ව්‍යවහාර විය. ගමේ ප්‍රධාන පවුල එනමින් ප්‍රසිද්ධ වූ හෙයින් එම ග්‍රාමය ද එනමින් ම ප්‍රකට විය. පසු කලෙක ධර්මපාල පවුලෙහි උපන් අප බෝසතාණන් වහන්සේ ද එනමින් ම ප්‍රකට විය. ඔහු වැඩිවියට පැමිණි කලැ ශිල්පශාස්ත්‍රෝද්ග්‍රහණය පිණිස **තක්සලා නුවර** දිසාපාමොක් ආචාර්‍යයන් වෙතැ යැවීය. උගෙනීමෙහි යෙදුණු ධර්මපාල කුමාරයා ගුරුන් හට සුවචව කීකරුව මැනවින් සිප්සතර උගනියි. එහෙයින් ඔහුට සිය පිරිසෙහි දෙටු පදවිය - මූලිකකම හිමි විය.

මේ අතර දිනක් හදිසි ලෙඩකින් ඇදුරුතුමාගේ වැඩිමහලු පුත්‍රයා මිය ගියේ ය. එවිට ධර්මපාල කුමාරයා හැර සෙසු එහි සිටි හැමදෙනා ම හඬමින් විලාප කියමින් බොහෝ ශෝකයට පත්වූහ. එහෙත් ධර්මපාල කුමරු නොවේ ශෝක වූයේ. ඔහු කිසි

Non-commercial distribution

ම වෙනසකට පත් නොවීය. තරුණ කලැ කිසිවෙක් නො මැරෙතැ යි යන හැඟීම ඔහු තුළ බලපැවැත් වූ හෙයිනි. එයට හේතුව තම පරපුරේ කිසිවකු මහලු වියෙහි මිස තරුණ වියෙහි දී නොමැරෙන බැවිනි.

මරණය ගැන වෙනසකට පත් නොවූ දම්පල් කුමරු ගැන පුදුම වූ **ආචාර්‍ය්‍යවරයා** ඔහුගෙන් එයට කරුණු විචාළේ ය. සිය පරපුරේ කිසිවකු බාල කාලයෙහි නො මියන බව එයට හේතුව වශයෙන් ඔහු පැවසී ය. එයැසූ තුවණැති ඇදුරුතුමා මහත් විශ්මයට පත්ව, එසේ යම් පරපුරක කුලයක ළමා කලැ හා තරුණ කලැ නො මැරී මහලු කල ම මිය යේ නම්, එයට ද යම්කිසි වටනා ගුප්ත හේතුවක් තිබිය යුතුය යි සිතීය. එසේ සිතූ හෙතෙම ඒ ගැන විමසා දැන ගැන්මට පසුව ධර්මපාල කුලය වෙතැ යන්නට ද ඉටා ගත්තේ ය. පුත්‍රයාගේ මරණය පිළිබඳ ව කළමනා සියලු කටයුතු නිම වූ පසු දිනක් ආචාර්‍ය්‍යවරයා යටකී කාරණය ගැන විමසීම්වස් සූදනම්වූයේ මළ එළුවකු ගේ ඇට ටිකක් ද සෝද්‍ද පසුම්බියක දම්මා ගෙන සේවකයකු ද කැටුව ධර්මපාල ග්‍රාමයෙහි වූ ධර්මපාල කුලය වෙතැ ගියේ ය.

ධර්මපාල කුමරාගේ පියාණන් වූ **මහාධම්මපාල බ්‍රාහ්මණයා** ඔහු පිළිගෙන හොඳින් ආගන්තුක සත්කාර කොට නිමවා පිළිසඳරෙහි යෙදුණේ යඃ– **ආචාර්‍ය්‍යවරයා** පිළිසඳර කතාකරමින් සිට කියනුයේ පින්වත් ධම්පාලයිනි! ඔබගේ ආදරණීය පුතණුවෝ හොඳින් ශිල්ප ශාස්ත්‍ර උගත්තේ ය. එහෙත් හදිසියේ හටගත් ලෙඩකින් මේ නොබෝද්‍ද මිය ගියේය. "**සියලු දේ ඇතිව නැතිව යෑම සොබා දහමකි.**" එහෙයින් ඒ ගැන ශෝක නො කරව යි කීයේ ය. ඒ ඇසූ ධර්මපාල බ්‍රාහ්මණයා අත්පොළසන් දෙමින් මහත්සේ සිනා සෙන්නට විය. එය දැක පුදුමයට පත් ආචාර්‍ය්‍යවරයා ඔබ සිනාසෙන්නේ කුමක් නිසාද? මා කීවේ බොරුවක් යයි සිතා දැයි ඇසී ය. "අපගේ කුලයෙහි බාල දරුවෝ නො මියෙති. පරම්පරා හතකින් ම බාල කාලයෙහි කිසිවෙක් නො මළහ. ඔබ කියන දෙය නො සිදුවිය හැකිය. තොප පවසන්නේ මුසාවක්මය" යි පිළිතුරු වශයෙන් **ධම්පාල බ්‍රාහ්මණයා** පැවසීය.

*Non-commercial distribution*

එවිට **ආචාර්‍ය්‍යවරයා** ධර්මපාලයිනි! තොප මා කියන්නක් නොම අදහත් නම් මේ තොපගේ ධර්මපාල කුමාරයාගේ ඇට බලාවත් සැක දුරු කර ගත මැනවැයි කියා පසුම්බියෙහි වූ එළු ඇට ගෙන දැක්විය. ඒ දුටු බ්‍රාහ්මණයා මෙය බල්ලකුගේ හෝ එළුවකුගේ ඇට විය හැකිය. ධර්මපාල කුමාරයාගේ ඇට නම් නො විය හැක. තොප මුසාවක් ම තෙපලතැයි කියා නැවතද අත්පොළසන් දෙමින් සිනාසෙන්නට විය. ඒ ඇට දුටු එහි සිටි සෙසු හැම දෙන ද එසේ ම අත්පොළසන් දෙමින් උඩ පැන පැන සිනා සෙන්නට වූහ.

ඉක්බිති **ආචාර්‍ය්‍යවරයා** පින්වත් ධර්මපාලයිනි! තොපගේ කුලයෙහි කිසිවකු බාල කාලයෙහි නො මියතොත් එසේ වීමට හේතුව කුමක් ද? තොපගේ පරපුරෙහි අය කිනම් ව්‍රතයක් ශීලයක් පුරන්නහු ද? කවර නම් ශ්‍රෙෂ්ඨ චර්‍ය්‍යාවක හැසිරෙත් දැයි පිළිවිසීය.

එකල්හි **මහා ධර්මපාල බ්‍රාහ්මණ තුමා** තම කුලයෙහි අය එසේ බාල කලැ නො මියන හේතු විතර පාතුයේ මතු එන ගාථා එකොළොසකින් වටිනා කරුණු රැසක් විදහා දැක්වීය.

**ධම්මං චරාම න මුසා භණාම,**
**පාපානි කම්මානි විවජ්ජයාම.**
**අනරියං පරිවජ්ජෙමු සබ්බං,**
**තස්මා හි අම්හං දහරා න මීයරෙ.**

අපි දශ කුශල සංඛ්‍යාත ධර්මයෙහි යෙදෙන්නෙමු. ත්‍රිවිධ සුචරිතයෙහි යෙදෙන්නෙමු. මොන ම කරුණක් නිසාත් බොරු නො කියන්නෙමු. සියලු පව් කම් අත්හැර වසන්නෙමු. අනාර්‍ය්‍ය ධර්මය යි නම් ලද සියලු දුසිරිත් අත්හැර වසන්නෙමු. මේ කරුණු නිසා අපගේ දරුවෝ නො මැරෙති.

**සුණොම ධම්මං අසතං සතං ච,**
**නචාපි ධම්මං අසතං රොචයාම**
**හිත්වා අසන්තේ න ජහාම සන්තේ,**
**තස්මා හි අම්හං දහරා න මීයරෙ.**

Non-commercial distribution

අපි අසත්පුරුෂයන්ගේ අවවාදත් සත්පුරුෂයන්ගේ අවවාදත් අසන්නෝ වෙමු. එහෙත් කිසි විටෙක වත් අපි අසත් පුරුෂයන්ගේ අවවාදයට කැමැති වන්නෝ නො වෙමු. (අසත්පුරුෂාවවාදය ඇසීම කරන්නේ ඔවුන් විරුද්ධ වන බැවිනි) එබැවින් අසත්පුරුෂයන්ගේ අවවාදය අත් හැර සත් පුරුෂයන්ගේ අවවාදය ම මුදුනින් පිළි ගන්නෙමු. ඒ අනුව ම පිළිපදින්නෙමු. මෙසේ හෙයින් අප දරුවෝ බාල කාලයෙහි නො මියෙති.

**පුබ්බෙ ද්‍යා සුමනා භවාම**
**දදම්පි වෙ අත්තමනා භවාම.**
**දත්වා පි වෙ නානුතප්පාම පච්ඡා**
**තස්මා හි අම්හං දහරා න මීයරෙ.**

දන් දීමට පළමුව ද අපි එය ඉතා සතුටින් පිළියෙල කරන්නෙමු. දෙන අවස්ථාවෙහි ද අපි ඉතා ප්‍රීතියෙන් එය දෙන්නෙමු. දුන් පසුත් අපි ඒ ගැන ඇතැම් අය මෙන් පසුතැවිලි නොවී, ඉතා උතුම් ක්‍රියාවක් කෙළෙමු යි සතුටු වන්නෙමු. මේ කරුණු නිසා අපගේ දරුවෝ අකාලයෙහි නො මියෙති.

**සමණෙ මයං බ්‍රාහ්මණෙ අද්ධිකෙ ච.**
**වණිබ්බකෙ යාචනකෙ දළිද්දෙ.**
**අන්නේන පානෙන අභිතප්පයාම.**
**තස්මා හි අම්හං දහරා න මීයරෙ.**

අපි සිල්වත් ගුණවත් ශ්‍රමණ බ්‍රාහ්මණාදීනට දන් දෙන කලැ ඒ උතුමන් කෙරෙහි ගෞරව පූර්වකව ම ඉතා සැලකිලිමත් ලෙස ඒ සත්කාර සම්මාන කරන්නෙමු. දුගී මගී යාචකාදීනට යමක් දෙන කල ද, ගෙදොරට ආ නිසාවත් කිනම් දෙයක් හෝ දී පළවා හැරිය යුතු නිසාවත් නරක්වූ දෙයක් ඉවත ලන්නාක් මෙන් ඔහේ කුමක් හෝ නොදී අපි ඔවුන්ගේ දුඃඛිත තත්ත්වය සලකා ඔවුන්ට යහපතක් සලසන අදහසින් ඕනෑකමින් ම එය දෙන්නෙමු. මේ ගුණධර්ම නිසා අප දරුවෝ බාල කලැ නො මියෙති.

Non-commercial distribution

**මයං ච භරියං නාතික්කමාම.**
**අම්හෙච භරියා නාතික්කමන්ති.**
**අඤ්ඤත්‍ර තාහි බ්‍රහ්මචරියං චරාම.**
**තස්මා හි අම්හං දහරා න මීයරෙ.**

අපි පරස්ත්‍රීනට ආලය නො කොට, සිය බිරිඳගෙන් සතුටුවීම නමැති **"ස්වදාරා සන්තුෂ්ටිය"** යි කියන ලද ශ්‍රෙෂ්ඨ චර්‍ය්‍යාවෙන් උසස් පැවැත්මෙන් යුක්ත වන්නෙමු. අප භාර්‍ය්‍යාවෝත් එසේ ම අන්‍ය පුරුෂයනට ආලය නො කොට, සිය සැමියාගෙන් සතුටුවීම නම් වූ **"ස්වපුරුෂ සන්තුෂ්ටිය"** යි කියන ලද (පතිව්‍රතා) ගුණයෙන් යුත්තයහ. මේ වටනා කුල ධර්‍ම නිසා අප කුලයෙහි දරුවෝ බාල කාලයෙහි නො මැරෙති.

**පාණාතිපාතා විරමාම සබ්බෙ.**
**ලොකෙ අදින්නං පරිවජ්ජයාම.**
**අමජ්ජපානො ච මුසා භණාම.**
**තස්මා හි අම්හං දහරා න මීයරෙ.**

අපි හැම සතුන් මැරීමෙන් මැරවීමෙන් හිංසා පීඩා කිරීමෙන් වැළකී සිටින්නෙමු. අන්සතු නුදුන් දෙයක් ගැන්මෙන් වැළකී සිටින්නෙමු. කිසිකලෙක බොරු ද නො කියන්නෙමු. ප්‍රමාදයට හේතු වූ මත්පැන් පානයෙන් ද වෙන්වූවෝ වෙමු. සමාජයෙහි ශිෂ්ට මිනිසකු තුළ පිහිටිය යුතු වූ මේ උතුම් ගුණධර්ම නිසා අපගේ පරපුරේ කිසිවෙක් බාල කාලයෙහි නො මියෙති.

**මාතා පිතා ච භගිනී භාතරො ච,**
**පුත්තා ච දරා ච මයං ච සබ්බෙ.**
**ධම්මං චරාම පරලොක හේතු,**
**තස්මා හි අම්හං දහරා න මීයරෙ.**

අපගේ කුලයෙහි දෙමාපියෝ ද, සොහොයුරු සොහොයුරියෝ ද අපගේ දරුවෝ ද, ඔවුන්ගේ භාර්‍ය්‍යාවෝ ද, මෙකී නොකී අප හැම පරලොවට හිත පිණිස පවත්නාවූ ත්‍රිවිධ සුචරිත ධර්මයෙහි - තුන්

Non-commercial distribution

සුසිරිතෙහි යෙදෙන්නෙමු. ඒ උතුම් හැසිරීම නිසා අපගේ දරුවෝ බාල කල නො මියෙති.

**දසා ච දස්සො අනුජීවිනො ච.**
**පරිවාරකා කම්මකරා ච සබ්බෙ**
**ධම්මං චරන්ති පරලොක හේතු.**
**තස්මා හි අම්හං දහරා න මීයරෙ**

අපග් කුලයෙහි ගෙවලැ වැඩපලවල යෙදුණු දස දසියෝ ද වෙනත් නොයෙකුත් කටයුතුවල නියුක්ත කම්කරුවෝ ද, අපෙන් ජීවත්වන තවත් දිළිඳු අය ද අප අනුව ජීවත් වන අපව ඇසුරු කරන අනුගාමිකයෝ ද යන සියලුදෙනා ම පරලොවට වැඩ ඇති දශකුශල ධර්ම සංඛ්‍යාත උතුම් හැසිරීමෙහි යෙදෙන්නෙමු. එබැවින් අප දරුවෝ තරුණ කල නො මැරෙති.

**එතාසු වෙ ජායරෙ සුත්තමාසු.**
**මෙධාවිනො හොන්ති පහූත පඤ්ඤා.**
**බහුස්සුතා වෙදගුණොච හොන්ති.**
**තස්මා හි අම්හං දහරා න මීයරෙ.**

යටකී පරිදි අපගේ පරපුරේ ස්ත්‍රී පුරුෂ දෙපක්‍ෂය ම දුසිරිත් හැර, උතුම් සුසිරිතෙහි යෙදී වසන්නෙමු. එවැනි ගුණවත් දෙමාපියන්ගේ දරුවෝ නිරෝගීව, යහපත් කාය ශක්තියෙන් හා රූප සම්පත්තියෙන් ද යුක්තවූවෝ ම වෙති. නුවණ ඇත්තා වූ තියුණු බුද්ධිය ඇත්තා වූ ධාරණ ශක්තිය ඇත්තා වූ වාසනාවන්ත වූවෝ ම වෙති.

**ධම්මො හවෙ රක්ඛති ධම්මචාරිං.**
**ධම්මො සුචිණ්ණො, සුඛමාවහාති.**
**එසානිසංසො ධම්මෙ සුචිණ්ණෙ.**
**න දුග්ගතිං ගච්ජති ධම්මචාරී.**

ධර්මය තෙමේ ධර්මචාරී පුද්ගලයාව ඒකාන්තයෙන් රක්නේ ය. මනා කොට පුරුදු කරන ලද, ධර්මය දෙලෝ සැප

Non-commercial distribution

ගෙනදෙයි. ධර්මයෙහි හැසිරීමෙහි මෙවැනි උසස් අනුසස් ඇත්තේ ය. ධර්මචාරී පුද්ගලයා දුගතියකට ද නො යන්නේ ය. සුගතිගාමියෙක් ම වන්නේ ය.

**ධම්මො හවෙ රක්ඛති ධම්මචාරිං,**
**ජත්තං මහන්තං විය වස්සකාලෙ.**
**ධම්මෙන ගුත්තො මම ධම්මපාලො,**
**අඤ්ඤස්ස අට්ඨීනි සුඛී කුමාරො.**

ධර්මය රක්නා තැනැත්තාව ඒ තමා විසින් රක්නා ධර්මය විසින් ම රකිනු ලබයි - තමා යහපත් සේ පුරුදු කළ ධර්මය විසින් තමාව දෙලොවින් ම රැක ගන්නේ ය. තමා විසින් ඔසොවා ගෙන යනු ලබන කුඩය විසින් වැස්සෙන් තෙමෙන්නට නොදී තමාව රකින්නාක් මෙනි. මෙසේ ධර්මය විසින් රක්නාලද **"ධම්පාල"** නම් වූ මපුතණුවෝ නිදුක් නිරෝගීව සුවසේ ඇත. මේ අනිකකුගේ ඇට ම යයි අවසාන වශයෙන් ද පැවසී ය.

මේ දේශනයට සවන් දුන් **ආචාර්‍ය්‍යවරයා** මවිතයට පත්විය. මා ආ ගමනින් මහත් ලාභයක් ම මට අත්වී යයි බලවත් ප්‍රීතියට ද පත්විය. පසුව ඔහු **මහා ධර්මපාලයිනි** ! යි ධර්මපාල කුමාරයාගේ පියාණන් අමතා, ඔබගේ පුතු නිරෝගීව සුවපත්ව වෙසේ, මේ ඔබ විමසීමට ගෙනා එළු ඇට ටිකකැයි පවසා, මා ඔබ වෙහෙසීම ගැන මට කමන්නැයි ක්ෂමා කරවා ගත්තේය. ඉන් පසුව ද දින කීපයක් එහි වුසූ ආචාර්‍ය්‍යවරයා ධර්මපාල පවුලට අයත් එකී ගුණධර්ම දහම්පතෙක ලියවාගෙන සමුගෙන තක්සලා නුවර සිය නිවසට ම පෙරලා ගියේ ය. **ධර්මපාල කුමාරයා** ද ශිල්පශාස්ත්‍රයෙහි නිමාවට ගොස් සිය ධර්මපාල ග්‍රාමයට ම ආපසු පැමිණ තමා දැන උගත් දෙයින් ලෝකයාට ඉමහත් සේවයක් ඉටු කෙළේ ය. **දිසාපාමොක් ආචාර්‍ය්‍යවරයා ද** තමන් ගෙනගිය ඒ වටිනා ධර්මයෙහි තමන් ද පිහිටා සෙසු බොහෝ අය ද එහි පිහිටුවීමෙන්, ශිල්පශාස්ත්‍රයත් සමග ම ධර්මය ද ලෝකයාට බෙදා දෙමින් විශාලතම සේවයක් සිදු කෙළේ ය.

Non-commercial distribution

# 17. නෑයන්ට සංග්‍රහ කිරීම

**"ඤාතකානඤ්ච සංගහො"** යන මෙහි තම පරම්පරාවෙහි සත්වන කුලය දක්වා මව්පිය දෙපාර්ශ්වයෙන් සම්බන්ධ වූවෝ ද, සත්වන මුණුබුරා දක්වා තමා ගෙන් පැවත එන්නෝ ද ඔවුන් හා සම්බන්ධ වන්නෝ ද ඤාතීහු නම් වෙති. ඔවුන්ගෙන් කෙනකු හට විපතක් වූ විට තමාට හැකි පමණින් උපකාර කිරීම හා ඔවුන්ගේ දියුණුව පිණිස ඔවුන්ට උපකාරවීම ද ඤාතීන්ට සංග්‍රහ කිරීම නම් වේ.

ලෝකයෙහි වාසය කරන්නා වූ මනුෂ්‍යයන්ට අන්‍යයන්ගේ ආධාරය උපකාරය නො ලබා තමන්ගේ කාය බලයෙන් ම හෝ ධන බලයෙන් ම හෝ ඥාණ බලයෙන් ම හෝ අන්‍ය බල විශේෂයකින් හෝ සිද්ධ කළ නොහෙන දේවල් බොහෝ වෙති. එබැවින් දුප්පත් පොහොසත් උගත් නූගත් හැමදෙනාට ම අන්‍යයන්ගේ උපකාර සෙවිය යුතු අවස්ථාවල් බොහෝ පැමිණෙති. එබඳු අවස්ථාවලදී බොහෝ සෙයින් තමාට උපකාර ලැබිය හැකි වන්නේ ඤාතීන්ගෙනි. මිත්‍රයන්ගෙන් ද උපකාර ලැබිය හැකි වන නමුත් එය සිදුවන්නේ ස්වල්ප වශයෙනි. ඤාති ධර්මයෙහි නොපිහිටියා වූ තැනැත්තාට ඤාතීන්ගෙන් උපකාර ලැබීම ද දුෂ්කර වේ.

යමෙක් විපතට පැමිණියා වූ ඤාතියකු තමාගේ උපකාර සොයා ආ විට තමා උපකාර කළ හැකි තත්ත්වයෙහි සිට ගෙන ද ඤාතියා එලවා දැමීම හෝ මගහැරීම හෝ කෙරේ නම් ඔහු ඤාති ධර්මයෙහි පිහිටියේ නොවේ. ඤාති ධර්මයෙහි නොපිහිටි තැනැත්තා නෑයන් විසින් දුරුකරනු ලැබ නෑයන් නැති කෙනකු මෙන් අනාථ වේ. ඔහුට විපතක් වුවත් නෑයෝ ඔහු නො බලති.

Non-commercial distribution

යමෙක් අමාරුවේදී පිහිට වීමෙන් ද දියුණුවට උපකාර වීමෙන් ද මංගලාවමංගලාදියෙහිදී සහභාගි වීමෙන් ද නෑයන්ට සංග්‍රහ කෙරේ නම්, සංග්‍රහ ලැබුවා වූ ද නො ලැබුවා වූ ද නෑයෝ ඔහුට සංග්‍රහ කරති. ඔහු සත්පුරුෂයන්ගේ ප්‍රශංසාවට ද භාජන වන්නේ ය. පරෝපකාරය පුණ්‍යකර්මයක් බැවින් ඔහු මරණින් මතු සුගතියට ද පැමිණෙන්නේ ය. මෙසේ ඥාති සංග්‍රහය මෙලෝ පරලෝ දෙකෙහි ම යහපතට හේතු වන බැවින් **උතුම් මංගලයක් ද** වන්නේ ය. එහෙයින් වදළහ:-

**ධීරොච භොගෙ අධිගම්ම,**
**සංගණ්හාති ච ඤාතකෙ.**
**තෙන සො කිත්තිං පප්පොති,**
**පෙච්ච සග්ගෙ ච මොදති.**

නුවණැත්තේ සම්පත් ලැබ තම නෑයන්ට සංග්‍රහ කරයි. ඔහු ඒ යහපත් ක්‍රියාවෙන් නෑයන් අතර පමණක් නොව ලෝකයෙහි ද ඥාති ධර්මයෙහි පිහිටි සත්පුරුෂයෙකැ යි ප්‍රශංසාවට ද කීර්තියට ද හිමිකාරයෙක් වී මරණින් මතු ස්වර්ගයට පැමිණ ප්‍රීති වෙයි.

ස්වකීය නෑයන්ට මිතුරන්ට පමණක් නොව දුකට පැමිණ සිටින කවරකුට වුවත් හැකි පමණින් උපකාර කිරීම සත්පුරුෂයන්ගේ ධර්මයෙකි. එසේ සියල්ලන්ට ම සංග්‍රහ කළ හැකි වූ සියල්ලන් කෙරෙහි ම කරුණාව මෛත්‍රිය පැවැත්විය හැකි වූ උත්තම පුද්ගලයෝ ලෝකයෙහි ඇත්තේ ස්වල්ප දෙනෙකි. එබඳු උත්තමයකු විය නොහැකි වුවත් සිය නෑ පිරිසටවත් සංග්‍රහ කරන්නා වූ ඔවුනටවත් කරුණාව මෛත්‍රිය පවත්වන්නා වූ කෙනෙකු වීමට සියල්ලන් විසින් ම උත්සාහ කළ යුතු යි.

**නෑයන් සමග සුළු දෙයකින්**
**අමනාප නොවිය යුතු බැව්.**

අන්‍යෝන්‍ය සම්බන්ධකම් පවත්වන්නා වූ පිරිසක් අතරේ සමහර කෙනකු අතින් තවත් කෙනකුට යම් යම් ප්‍රමාද දෝෂ වැරදි

Non-commercial distribution

සිද්ධවිය හැකිවේ. ඒවායින් අසමගිකම් ඇතිවීමෙන් ඔවුනොවුන් කෙරෙහි කරුණා මෛත්‍රී දෙක ද නැති වී යා හැකි ය. එවැන්නක් සිදු වූ කල නැවත වහා ම සමගියට පැමිණීමට වෑයම් කළ යුතුයි. ස්වකීය ඥාති පිරිසෙහි එබඳු භේදයක් හටගත් කල, එය සමාදන කරවීම ද ලොකු ඥාති සංග්‍රහයෙකි.

සමහර කෙනෙක් තම තමන් අතර යම් කිසි ස්වල්ප වූ නමුත් වියවුලක් ඇති වූ කල සමගියට නො පැමිණ වෛර බැඳ ඔවුනොවුනට විපත් පැමිණවීමට මාන බලති. එය ඉතා ම තිහීන ක්‍රියාවෙකි. අමනෝඥ ක්‍රියාවෙකි. එය නුවණැති පණ්ඩිතයන්ගේ ක්‍රියාවක් නොවේ. ලෝකයෙහි නො වරදින කෙනෙක් නැත. කළයුතු දේ අමතක නො වන කෙනෙක් ද නැත. වැරදි නැති කෙනෙක් ද නැත. එහෙයිනි, **"නිදොස් කෙනෙක් මෙදියත උපදනේ නැත"** යි එක් කවියෙකු පැවසුයේ. බුදුන් වහන්සේ ද ඒ බව මෙසේ වදළහ - සංයුත්ත නිකායෙහිː–

**කස්සච්චයා න විජ්ජන්ති - කස්ස නත්ථි අපාගතං**
**කො න සම්මොහ මාපාදි - කොධධීරො සද සතො.**

මේ ලෝකයෙහි කවරකුගේ වරද නැත්තාහු ද, කවරකුගේ අපරාධ නැත්තේ ද, කවරෙක් අමතක වීමට නො පැමිණේ ද, කිනම් කෙනෙක් සියලු කල්හි පණ්ඩිත වේද, සිහියෙන් යුක්ත වේ ද? නොවේ මය-යනු අදහසයි.

**නුවණැත්තා අසමගි වුවත්**
**වහා ම සමගි වන බැවි.**

වැරදීම මනුෂ්‍ය ගතියෙක. වූ වරද පිළිගැන්ම - තමා වැරදි කාරයෙකැ යි තමා අතින් වූ වරද පිළිගැන්ම හා එසේ වරද පිළිගත් පසු ඕහට සමාව දීම ද උතුම් දිව්‍ය ගතියෙකැයි සැලකිය යුතුය. එසේ සලකා සිදුවූ දේ අමතක කොට ඔවුනොවුන් වහා සමගිවීම දෙලොව දියුණුවට ම හේතු වන්නකි. එය පණ්ඩිතයන් ගේ ස්වභාවයෙකි. එසේම සත්පුරුෂ ධර්මයෙකි. එහෙයින් වදළහː–

Non-commercial distribution

**සබ්බෙපි සත්තො විවදන්ති - ඛිප්පං සන්ධියරෙ පුන.**
**බාලා පත්තාව භිජ්ජන්ති - න තෙ සමථ මජ්ඣගූ.**

ඉදින් සත්පුරුෂයෝ කෝළාහල කොට භේදයට පැමිණෙන්නාහු මුත් වහ වහාම නැවත සමගියට පැමිණෙති. මෝඩයෝ බිඳෙන කළ නැවත නොපෑස්විය හැකි සේ මැටි බඳුන් බිඳෙන්නාක් මෙන් බිඳෙතිය - යනු මෙහි අදහසයි.

## අනුන්ගෙන් උපකාර නුවමනා කෙනෙක් නැති බැව්.

ලෝකයෙහි සියල්ල ම සිද්ධ කිරීමට සමත් වූ එක් කෙනෙක් නො මැත්තේ ය. සිටුවරයකු විසින් හෝ රජකු විසින් සිද්ධ කළ නොහෙන යම්කිසි කටයුත්තක් සමහර විට දුගියකු විසින් සිද්ධ කළ හැකි වේ. එවැන්නක් පැමිණි කල්හි රජු විසින් ද සිටුවරයා විසින් ද එය දුගියා ලවා ම සිද්ධ කර ගත යුතු වේ. මහා පඬිවරයකුට සිද්ධ කළ නොහැකි සමහර කටයුතු නූගතෙක් සිදු කිරීමට සමත් වේ. එවැනි අවස්ථාවල පඬිවරයා විසින් එය නූගතා ලවා ම සිදු කරවා ගත යුතු ය. එබැවින් පොහොසතාට දුප්පතා ද, උගතාට නූගතා ද, බලවතාට දුබලයා ද වුවමනා කරන අවස්ථා එමට ඇති වන්නේ ය. එහෙයින් තමා පොහොසත් ය කියා දුප්පත් නෑයා නො සලකා සිටිය යුතු නොවේ. තමා බලවතෙක් කියා දුබල නෑයා නොතකා හැරිය යුතු නොවේ.

සමහරෙක් තමා පොහොසත් වූ විට දුප්පත් නෑයන් හැර දමති. දිළිඳු නෑයන් හා ආශ්‍රයට ලජ්ජා වෙති. නෑකම් කීමට පවා මැලි වෙති. පොහොසතුන් සමග ම නෑකම් පැවැත්වීමට සූදනම් වෙති. සුළු නෑ කමක් මුත් ඇති පොහොසතුන් ලොකු නෑයන් කර ගනිති. සමහර විට කිසි ම නෑකමක් නැති පොහොසතුන් සමග ලොකු හිතවත් කම් ඇති කොට නිතර ආශ්‍රයට ගනිති. එය ඉතා අමනෝඥ ක්‍රියාවෙකි. සියල්ල ම වෙනස් වන ස්වභාවය ඇති මේ ලෝකයෙහි පොහොසතකු දුප්පත්වීම එපමණ පුදුම දෙයක් නොවේ. රජකු වුවත් ඇතැම් විට දුප්පතකු විය හැකිය. යම්

Non-commercial distribution

හෙයකින් පොහොසත් වූ කල තම දුප්පත් නෑයන් අත්හළ තැනැත්තා නැවත දුප්පත් වී නම් ඔහුට දුප්පත් නෑයන් ද නැති වීමෙන් අනාථ ව අසරණ ව මහත් වූ අමාරු අවස්ථාවකට පැමිණෙන්නට සිදුවනු නියත ය.

## මිත්‍රයන්ට සංග්‍රහ කිරීම

ලොවැ වාසය කරන්නා වූ සත්ත්වයන්ට ඤාතීන් මෙන් ම මිත්‍රයෝ ද වුවමනා වෙති. ඤාතීන් නැත්තා වූ තැනැත්තන්ට මිත්‍රයෝ ම ඤාතීහු ය. එබැවින් නුවණැත්තන් විසින් නෑයන්ට මෙන් ම මිත්‍රයන්ට ද සංග්‍රහ කළ යුතුය. මිත්‍ර ලක්‍ෂණ මෙසේ දත යුතු ය.

**මිත්තො හවෙ සත්ත පදෙන හොති.**
**සහයො පන ද්වාදසකෙන හොති.**
**මාසද්ධ මාසෙන ච ඤාති හොති.**
**තදුත්තරිං අත්ත සමොපි හොති.**

යමෙකු හා සත් පියවරක් එක් ව ගමන් කෙළේ නම් ඔහු තමාගේ **මිත්‍රයෙක්** වන්නේ ය. යමකු හා දොළොස් දිනක් එක්ව විසීමෙන් ඔහු **යහළුවෙක්** වන්නේ ය. මසක් හෝ අඩ මසක් එක්ව වාසය කිරීමෙන් ඔහු **ඤාතියකු හා සමාන වූවෙක්** වන්නේ ය. එයට ද වැඩි කාලයක් එක්ව විසීමෙන් **තමා හා (ප්‍රාණය හා) සමාන වූවෙක්** වන්නේ ය යනු එහි අදහසයි.

## ගුණයෙන් යහපත් නම් හැම තරාතිරමක කෙනකු ම ආශ්‍රය කළ යුතු බැව්.

දුප්පත් පොහොසත් උගත් නූගත් කුඩා මහත් සියල්ලන් සමග ඥාති ධර්මය පැවැත්විය යුතුවාක් මෙන් ම ඒ සියල්ලන් හා සමග ම මිත්‍ර ධර්මය ද පැවැත්විය යුතු වේ. මොහු මට වඩා කුලයෙන් පහළ ය, මොහු මට වඩා ධනයෙන් පහළ ය, මොහු උගත්කමින් පහළ ය, මොහු මගේ ප්‍රමාණයට නුසුදුසු ය, මොහුගෙන් මට පලක් නැත යයි කියා ම මිත්‍රයකු අත්හළ යුතු නොවේ. තමාට

Non-commercial distribution

අහිතකර දුසිරිත් පිරීම ආදි පාප ධර්මයන්ගෙන් හෙබි පාපී වූ අසත් පුරුෂයන් ගෙන් වෙන්වීම විය යුතු ම ය. ගුණ යහපත්කම් ඇති කෙනකු යට කී දුප්පත්කම ආදි කරුණු නිසා අත් නො හළ යුතු බව ය යට දැක්වූයේ. එවැනි හොඳ ගති පැවතුම් ඇති සියලු ම තරාතිරම්වල මිත්‍රයෝ සුදුසු කාලයේදී ඒ තමා විසින් ඉසිලිය යුතු වූ බර උසුලා මිත්‍ර ධර්මය රක්නාහු ම ය. **‘අනේපිඬු’** සිටුතුමාගේ මාලිගාවෙහි විසූ **‘කාලකණ්ණි’** නම් මිත්‍රයාගේ චරිතය මෙහිලා හොඳ නිදසුනෙකි.

පෙර අනේපිඬු මහ සිටාණන්හට **‘කාලකණ්ණි’** නම් වූ මිත්‍රයෙක් විය. ඔහු පසු කලෙක දිළිඳුව අසරණව තම මිත්‍ර අනේපිඬු සිටුතුමාගේ පිහිට සොයා ආවේ ය. සිටාණෝ ඔහුට අනුකම්පා කොට ඔහු සිටු මාළිගයෙහි ම නතර කර ගත්තේ ය. “කාලකණ්ණියා” යන නම නිතර ඇසෙන විට සෙසු අය සිටාණන්ට කියනුයේ සිටාණෙනි! මොහුගේ නම අමිහිරි ය. අප්‍රිය ය. එවැනි අභාග්‍ය සම්පන්න නමක් නිතර නිතර කීම මේ සිටු නිවසට අවමඟුලෙකි. එය කොතෙකුත් කියන කල සිරිකත තබා යකෙක් වුවත් මේ නිවස හැර යනු ඇත. එහෙයින් මොහු මෙහි නතර කර ගැන්ම සුදුසු නැත. මොහු වහාම මේ නිවසින් පිට කරනු මැනැව යි කීහ.

### මිතුරුකම

සිටාණෝ වනාහි **මිත්‍ර සන්ථවය** - (මිතුරුකම) නම් වූ තමාට හීන වුවත් ද උසස් වුවත් ද සමග පැවැත්විය යුතු ධර්මයෙකැ යි සිතා ඔවුන්ගේ බස් නො පිළිගත්හ. දිනක් සිටුතුමා යම්කිසි කටයුත්තක් නිසා සිය නිවසින් පිටත්ව අන් ගමකට යන්නේ කාලකණ්ණියා ගෘහාරක්‍ෂාවට තබා ගියේ ය. එදා ම රෑ සිටාණන් මාලිගාවෙහි නැති බව දැන ගත් සොර මුලක් සිටු මාලිගාව කොල්ලකෑමට පැමිණියේ ය. කාලකණ්ණියා ඒ බව දැන නිදා සිටිය කීපදෙනකු අවදි කරවා නොයෙකුත් තූර්ය භාණ්ඩ ඔවුනට දී තූර්ය වාදනයට පටන් ගත්තේ ය. සොරු ඒ ශබ්දය අසා සිටු ගෙදර උත්සවයෙකැ යි සිතා දඬු මුගුරු ආදිය ද දමා පලා ගියෝ

Non-commercial distribution

ය. එදින කාලකණ්ණියා නිසා සිටාණන්ගේ ධනය ආරක්‍ෂා විය. සිටාණන් පැමිණි පසු එ පුවත අසා මහත් සතුටට පැමිණ, “හිත ඇත්නම් පත කුඩා දැයි කීවාක් මෙන් නම කාලකණ්ණි වුවත් මොහුගෙන් සිදු වූ සේවය අති විශාල ය” යි අන්‍යයන්ට පහද දුන්හ. මෙසේ උසස් පහත් හැම දෙනා ම ප්‍රයෝජන වන බැවින් සියල්ලන් සමග ම මිත්‍ර ධර්මය පවැත්විය යුතු ය. ඒ සියලු ම මිත්‍රයන්ට සංග්‍රහය ද කළ යුතු බව මෙසේ වදරන ලදී.

**කරෙ සරික්ඛො අථවාපි සෙට්ඨො**
**නිහීනකො වා පි කරෙය්‍ය එකො.**

ජාත්‍යාදියෙන් සමාන වූ ද, උසස් වූ ද, හීන වූ ද යන සියල්ලන් සමග ම මිත්‍ර සන්ථවය කළ යුතු බව එයින් පැවසේ.

Non-commercial distribution

# 18. නිරවද්‍ය කර්මයෝ

**"අනවජ්ජානි කම්මානි එතං මංගලමුත්තමං"** යන මෙහි නිරවද්‍ය කර්මයෝ නම් පොහෝ දිනයන්හි සිල් සමාදන්වීම, දන්දීම, ධර්මදේශනා කරවීම, ධර්මය උගන්වන ධර්මය දේශනා කරන ධර්මධරයන් වහන්සේලාට ද ධර්මය ව්‍යාප්ත කිරීම පිණිස ධර්ම පුස්තකයන් ධර්ම ලේඛන සපයන ධර්මධරයන් වහන්සේලාට ද ධර්මය උගෙන ගන්නා අයට ද සංග්‍රහ කිරීම, ධර්මය අනුව පිළිපදින්නවුනට උපස්ථාන කිරීම, ධර්ම පත්‍රිකා ධර්ම පුස්තකාදිය පින් සලකා බෙදා දීම, ධර්ම පුස්තකාල තැනීම, වෙහෙර විහාර බෝධි ප්‍රාකාරාදිය තැනීම, බෝධි රෝපණය කිරීම, **සංඝාවාස ධර්මශාලා** දනශාලා ආදිය තැනීම, ආරෝග්‍යශාලා තැනීම, විශ්‍රාම ශාලා අම්බලම් පිංපොකුණු තැනීම, පාඨශාලා තැනීම, මාර්ග පාලම්, හේදඬු තැනීම, පැන්තාලි පිහිටුවීම, අනුන්ගේ ප්‍රයෝජනය පිණිස මල් සහ ගෙඩි හටගන්නා ගස් වැල් වැවීම, ඖෂධ වර්ග වැවීම, වෙහෙර විහාර සංඝාරාම පිළි දැගුම් කිරීම, ආරාම හැමදීම, කසළ ඉවත් කිරීම, මව්පිය ගුරුවර වැඩි මහලු ගුණවතුන් ආදි උතුමන්ගේ වත් පිළිවෙත් කිරීම, ලෙඩුන්ට උපස්ථාන කිරීම, අසරණයන්ට උපකාර කිරීම මේ ආදි කුදු මහත් යහපත් ක්‍රියාවෝ වෙති.

මෙබඳු කර්මයන් කිරීමෙන් මෙලොව ප්‍රශංසාදිය හා පරලොව ස්වර්ගමෝක්ෂ සම්පත්තීන් ද ලැබිය හැකි බැවින් එය දෙලොව දියුණුවට හේතුවන උතුම් මංගලයකි. නිරවද්‍ය කර්මයන් කිරීමෙන් සැපතට පැමිණෙන සැටි මෙසේ දතයුතු.

**නිරවද්‍ය කර්මයන් කිරීමෙන්**
**සැපතට පත් මඝ මාණවක ප්‍රමුඛ පිරිස**

පෙර **"මගධරට"** මචල නම් ගමෙහි **මඝ** නම් මාණවකයෙක් - (තරුණයෙක්) විසුවේ ය. ඔහු ගමෙහි කර්මාන්තස්ථානයට

*Non-commercial distribution*

ගොස් බිම පිස දමා එක් තැනක් පිරිසිදු කොට එහි සිටියේ ය. අනෙකෙක් එහි පැමිණ මඝ මාණවකයා තල්ලු කර දමා එහි සිට ගත්තේ ය. මඝ ඊට නො කිපී අන් තැනක් පිරිසිදු කොට එහි සිටියේ ය. තවෙකෙක් අවුත් එතැන ද අයිතිකර ගත්තේ ය. මේ ක්‍රමයෙන් මඝ මාණවකයා ශුද්ධ කළ කළ තැන් අන්‍යයෝ අයිති කර ගත්හ. මඝ මෙසේ සිතීය. මා විසින් ශුද්ධ කළ තැන් හිමි කරගත් මොවුහු සුවපත් වූහ. මෙය මා හට සැප ලබා දෙන උතුම් පුණ්‍ය කර්මයක් වන්නේය යනුයි.

මෙසේ සිතූ මඝ මාණවක තෙමේ දෙවන දිනයෙහි උදැල්ලක් ගෙනවුත් කමතක් පමණ තැන් ශුද්ධ කෙළේ ය. සියල්ලෝ ම අවුත් එහි සිටියෝ ය. ශීත කාලයෙහි ඔවුනට ගිනි අවුළුවා දුන්නේ ය. ඉක්බිති මඝ මාණවක තෙමේ ශුද්ධ වූ තැන්වලට සියල්ලෝ ම කැමැතියහ. එබැවින් මා විසින් මංමාවත් හෙළි කරමින් විසිය යුතුය යි සිතා, හැමදා ම උදෑසන අවදිවී කැති උදලු ගෙන ගල්මුගුරු උදුරා මාර්ගය සකස් කරමින්ද, ඉවත්කළ යුතු අතු ආදිය කපා මගින් ඉවත් කරමින් ද හැසිරෙයි. අනෙකෙක් ඔහුගේ මේ ක්‍රියාව දැක, මිත්‍රය! තුඹ කුමක් කරන්නෙහි දැයි විචාරා, යහළුව මම ස්වර්ගයට මාර්ගය තනමියි කී කල්හි, එසේ නම් මම ද තුඹට එක් ව සහාය වන්නෙමි යි කීය. මඝ තෙමේ යහළුව! ස්වර්ගය නම් කාටත් හොඳය යි කියා ඔහු ද එයට සහාය කර ගත්තේ ය. ඉන්පසු දෙදෙනෙක් වූහ. ඔහුගේ මේ ක්‍රියාවන් දැක ද අසා ද තවත් එවැනි හොඳ අදහස් ඇති බොහෝ දෙනෙක් එයට එක්වූහ. අන්තිමේ දී සියල්ලෝ ම තෙතිස් දෙනෙක් වූහ. ඔවුහු දිනපතා ම දුර බැහැර ගොස් මාර්ගයන් සකස් කළෝය. ඒ දඬු දැම්මෝය. මගීන්ගේ පහසුව පිණිස පැන්තාළි තැබුවෝ ය.

පසුව ඔවුහු **"සුධර්මා"** නම් විශ්‍රාම ශාලාවක් කරවූවෝය. එහි පොහොසත් මගීන්ගේ නැවතීමට කොටසක් ද දුප්පත් මගීන්ගේ නැවතීමට තවත් කොටසක් ද ලෙඩුන්ට නැවතීමට වෙන ම කොටසක් ද විය. තිස්තුන්දෙනා විසින් තබන ලද අසුන් තෙතිසක් ද විය. ආරක්ෂාවට ඇතෙක් ද විය. ආගන්තුකයකු අවුත් යමකුගේ අස්නෙහි නවාතැන් ගත්තේ වේ නම් ඇතා ඔහු අසුන හිමියාගේ

Non-commercial distribution

ගෙදරට ගෙන යන්නේ ය. අස්න හිමියා ඔහුට කළයුතු ආහාරපාන සැපයීමාදි සියල්ල ම මැනවින් කරන්නේ ය. මඝ මාණවක තෙමේ ශාලාව අසළ සෙවන පිණිස එක් කොබෝලීල ගසක් ද වැව්වේ ය. නන්ද, චිත්‍රා, සුධර්මා, සුජාතා යි භාර්‍ය්‍යාවරු සතර දෙනෙක් ම මඝ මාණවකයාට සිටියෝ ය. ඔවුනතුරෙන් සුධර්මාව ශාලාව තැනීමට කර්ණිකාවක් දුන්නාය. නන්ද ශාලාව අසළ පොකුණක් කරවූවා ය. චිත්‍රා ශාලාව සමීපයේ මල් සහ පලතුරු ඇති වත්තත් වැව්වාය.

මෙසේ පින්කම් කොට මඝමාණවක තෙමේ මරණින් මතු තව්තිසා දෙව්ලොව **"ශක්‍රදේවේන්ද්‍රව"** උපන්නේ ය. ඔහුගේ මිත්‍රයෝ දෙතිස් දෙනාත් එහි ම උපන්නාහු ය. ශාලාව තැනූ වඩුතෙම සකල කර්‍මයන් ම සිද්ධකිරීමෙහි සමර්ථ වූ **"විශ්වකර්ම"** නම් දිව්‍යපුත්‍රව උපන්නේ ය. එකල්හි ශක්‍රපුරයෙහි අසුරයෝ විසූහ. දිනක් මත්පැන් බී මත්ව සිටි අසුරයන් හැමදෙන ම ශක්‍රදේවේන්ද්‍ර තෙමේ තම පිරිස ලවා සමුද්‍රයට දැම්ම වූයේ ය. අසුරයන් ගේ පුණ්‍යානුභාවයෙන් ඔවුනට එහි අසුර භවන පහළ විය. පසුව දෙවින් හා අසුරයන් අතර පැවති යුද්ධයෙන් දෙවියන් දිනූ කල ශක්‍රදේවේන්ද්‍රයාණන්ට දස දහසක් යොදුන් දිග පලළැති තාවතිංස නම් වූ දිව්‍ය නගරය පහළ විය.

එම දිව්‍ය නගරයෙහි දොරටු දහසක් විය. එය රමණීය වූ උයන්වලින් හා පොකුණුවලින් ද යොදුන් ගණන් උස්වූ රත්නමය ප්‍රාසාදයන්ගෙන් ද යුක්ත විය. ශාලාව කරවීමේ කුශලයෙන් නගර මධ්‍යයෙහි තුන්සියයක් යොදුන් උස් වූ ද්වජයෙන් යුක්ත වූ, උසින් පන්සියයක් යොදුන් ඇත්තා වූ **'වෛජයන්ත'** නම් වූ ප්‍රාසාදය පහළ විය. එහි රන් රිටිවල මැණික් කොඩි ලෙල දෙයි. මැණික් රිටිවල රන්කොඩි ලෙල දෙයි. පබළු රිටිවල මුතු කොඩි බබලයි. මුතු රිටිවල පබළු කොඩි බබලයි. සත්රුවන් රිටිවල සත්රුවන් කොඩි දිලෙයි. ප්‍රාසාදය මුළුමනින් ම සත්රුවනින් ම බබලන්නේ ය..

කොබෝලීල ගස වැවීමේ කුශලයෙන් සියයක් යොදුන් පිරිමඬුලු ඇති **'පරසතුරුක'** පහළ විය. කොබෝලීල ගසමුල

*Non-commercial distribution*

මගීන්ට වාඩිවීමට ගල් ආසනයක් පිහිටු වූ කුශලයෙන් පනස් යොදුන් **"පාණ්ඩුකම්බල ශෛලාසනය"** පහළ විය. එය ඉතා ම මෘදු ආසනයකි. හිඳගත් කල්හි ශරීරයෙන් අඩක් එහි එරී යන්නේ ය. ඇතා **'ඓරාවණ'** නම් දිව්‍ය පුත්‍රයෙක් විය. ඔහු ශක්‍රදේවේන්ද්‍රයා උයන් කෙළියට යනු කැමති කල එක්සිය පනස් යොදුන් මහා හස්ති වේශයක් මවා ගන්නේ ය. දිව්‍යලෝකයන්හි වනාහි තිරිසනුන් ගේ ඉපදීමක් නැත්තේ ය. එබැවින් තිරිසන් ඇතුන් නැත්තේ ය.

**ඓරාවණ දිව්‍යපුත්‍රයා** තෙතිස් දෙනාහට තුන් ගව් පමණ වූ හෝ යොදුන් පමණ වූ කුඹු තෙතිසක් මවන්නේ ය.ශක්‍රදේවේන්ද්‍රයාහට හැමට මැද තිස් යොදුන් **'සුදර්ශන'** නම් කුම්භය මවන්නේ ය. ඒ මතුයෙහිදොළොස් යොදුන් රත්න මණ්ඩපයකි. එහි තැනින් තැන යොදුන් පමණ උස් වූ සත්රුවන් කොඩි එල්බෙයි. කෙළවර කිංකිණිදැල් එල්බෙයි. ඒවා මඳ සුළඟින් සෙලවෙන කල පඤ්චාංගික දිව්‍ය තූර්‍ය ශබ්දයකට බඳු වූ ශබ්දය නික්මෙන්නේ ය. මණ්ඩප මධ්‍යයෙහි එක්යොදුන් මිණි පළඟක් පනවන ලද්දේ ය. ශක්‍රදේවේන්ද්‍ර තෙමේ එහි හිඳී.

තෙතිසක් කුම්භයන්ගෙන් එක් එක් කුම්භයෙක්හි දළ සත බැගින් මවනු ලැබේ. එක එක දළයෙක සතක් බැගින් පොකුණු ඇත්තේ ය. එක එක පොකුණක සතක් බැගින් නෙළුම් පඳුරු ඇත්තේ ය. එක එක නෙළුම් පඳුරක මල් සත බැගින් වෙයි. එක එක මලෙක පෙති සතකි. එක් එක් මල් පෙත්තක **දිව්‍යාංගනාවෝ** සත්දෙන බැගින් නටති. මෙසේ හාත්පස පනස් යොදුනක් තන්හි ඇත්දළවල රඟුම් දැක්වීම කරනු ලැබේ.

**සුධර්මා ද** කලුරිය කොට එහි ම උපන්නාය. ඇට **"සුධර්මා"** නම් වූ නවසීයක් යොදුන් ඇත්තා වූ දිව්‍යසභා ශාලාව පහළ විය. ඊට වඩා සිත්කලු වූ අනික් තැනක් නම් නැත. මසකට අටවරක් එහි රැස්ව දේවතාවෝ දහම් අසති. අද වුව ද අලංකාර තැන් වර්ණනා කරන පණ්ඩිතයෝ මෙය සුධර්මා නම් දිව්‍යසභාව මෙනැයි පවසති.

**නන්ද ද** මියගොස් එහි ම උපන්නාය. ඇට පන්සියයක් යොදුන් ඇත්තා වූ **'නන්ද'** නම් පොකුණ පහළ විය. **චිත්‍රා** ද මරණින්

Non-commercial distribution

පසු එහි ම උපන්නා ය. මල්වත්ත වැවීමේ හේතුවෙන් ඇයට පන්සියයක් යොදුන් ඇත්තා වූ **'චිත්‍රලතා වන'** නම් වූ උයන පහළ විය. එයට වැඩි රම්‍ය උයනක් නම් නැත. එහි උයන් සිරි දක්නා තැනැත්තාට කෙතරම් බලවත් සිත්තැවුලක් තුබුණේවී නමුත් එය පහ වන්නේ ය.

**දෙවියන්ට වූ කලී මරණය** ළංවූ කල, සිය ශරීරයෙහි පැළඳි මල් පරවීම, හැඳි වස්ත්‍ර කිලිටිවීම, ශරීරය මැලවීම,ශරීරයෙන් ඩහදිය ගැලීම, තම දිව්‍ය විමානයට සිත නො ඇලීම යන පූර්ව නිමිති පසක් පහළ වන්නේ ය. එයින් දේවතාවෝ තම තමාගේ මරණය ළං වූ බව දැන ගනිති. විඳින්නා වූ කිවයුතු කිසි ම සැපයක් නැත්තා වූ දුඃඛිත සත්ත්වයන්ට පවා මරණය වේ යයි දතහොත් මහත් වූ ම ශෝකයක් වේ නම්, මහත් වූ යස ඉසුරෙන් කල් යවන්නා වූ දෙවියන්ට ඒ මහත් සම්පත්තිය නැති වන කල ඇති වන්නා වූ ශෝකයාගේ විශාලත්වය කිව නො හැකිය. එසේ මරණයට පෙර නිමිති පහළ වී ශෝකාතුරව වසන දෙවියන් මේ චිත්‍රලතාවනයට පමුණුවති. එහි උද්‍යානශ්‍රීය දුටු කල මරණ බියෙන් බියපත්ව මහත් වූ ශෝකයෙන් තැවෙන දේවතාවෝ පවා ඉමහත් ප්‍රීතියට ම පැමිණෙති. එවැනි ප්‍රීති සහගත අවස්ථාවක මිය යන දේවතාවෝ ඒ හේතුවෙන් බොහෝ විට නැවත සුගතියට ම පත්වෙති **මනුෂ්‍ය ලෝකයෙහි** වූ කලී එවැනි ශෝකය තුනී කරවිය හැකි කිසි ම ක්‍රමයක් නැත්තේ ය. එහෙත් නුවණැති හිතවත්හු එවැනි අවස්ථාවල නුවණින් ක්‍රියා කොට මිය යාමට ළංවී සිටින තැනැත්තාට භික්ෂු දර්ශන, ධර්මශ්‍රවණාදිය ලැබෙන සේ සැලසුවොත් එය මිය යන අයට සුගතිගාමී වීමට ආධාරයක් බැව් කිව යුතුය.

මඝ මානවකයාගේ භාර්‍යාවක් වූ **සුජාතාව** මම වනාහි මඝ මානවකයාගේ මාමාගේ දුව ද වෙමි. භාර්‍යාව ද වෙමි. එබැවින් ඔහු යම් පිනක් කෙරේ නම් මට ද එය අයිති වන්නේ යයි සලකා කිසි ම පුණ්‍ය කර්මයක් නො කොට අලංකාර වස්ත්‍රාභරණාදිය ඇඳ පැළඳ ශරීරය අලංකාර කරමින් විසුවා ය. පිනක් නො කළ ඇය මිය ගොස් එක් දොලක් සමීපයෙහි කෙකණ්ඩියක්

Non-commercial distribution

වූවා ය. **අනුන් කරන පින්කම්වලින් සැප සම්පත් ලැබීමට සිතා සිටින නුවණ මඳ අයට මෙය හොඳ පාඩමකි.** මඝ මානවකයා ඇතුළු පින් කළ හැමදෙන ම ඒ කළ කම් ලෙස ම මහත් සැපතට පැමිණියෝ ය.

මෙසේ යහපත් කර්ම කිරීම මහත් වූ ලෞකික සම්පත් හා අත්‍යුත්තම ලෝකෝත්තර නිර්වාණ සම්පත්තිය ද තම තමාගේ මෙලොව දියුණුව ද යන සියල්ල ම සිද්ධ කර දෙන බැවින් **උතුම් මංගලයක්** වන්නේ ය. බුදුරජාණන් වහන්සේ ද එහෙයින් වදාළහ ධම්ම පදයෙහි:–

**අප්පමාදෙන මඝවා - දෙවානං සෙට්ඨතං ගතො.**
**අප්පමාදං පසංසන්ති - පමාදො ගරහිතො සදා.**

යහපත් කුශල කරණයෙහි නො පමාවීම නිසා මඝ නම් තරුණයා දෙවියන් අතර සක්දෙව් පදවිය ලැබුවේ ය. එබැවින් නුවණැත්තෝ ඒ නො පමා ගුණයට පසසති. ප්‍රමාදයට හැම කල්හි ම ගරහති.

**කළ කළ හැටියට හොඳ නරක විපාක දෙන බැව්.**

ලොවැ යමෙක් හොඳ ක්‍රියාවල නිරත වූවොත් ඔවුනට හොඳ විපාකත්, යමෙක් හොඳ ක්‍රියාවල නොයෙදී සිටිය හොත් නරක විපාකත් ලැබීම ස්වභාවික දෙයක් බව මඝ මානවක ඇතුළු පිරිස මහත් සම්පත්තියට හිමි වීමෙනුත්, පින් නො කර සිටි මඝ මානවකයාගේ ම භාර්‍ය්‍යාවක වූ සුජාතාව කෙකණියක වීමෙනුත් මැනවින් පළවේ. එහෙයින් වදාළහ:–

**යාති කරොති පුරිසො - තානි අත්තානි පස්සති.**
**යාදිසං වපතෙ බීජං - තාදිසං හරතෙ ඵලං.**

මිනිසා හොඳ වූ හෝ නරක වූ යමක් යමක් කරයි ද, ඒ කළ කළ දෙය අනුව තමාට හොඳ නරක විපාක ලැබේ. යම් බීජයක් වපුළොත් එබඳු ම ඵලයක් ලැබෙන්නාක් මෙනි. (වී වපුළ තැනැත්තාට වී මිස කුරක්කන් නො ලැබේ. කුරක්කන් වපුළහොත් කුරක්කන් මිස වී නො ලැබේ. එසේ ම හොඳකම් කළ අයට හොඳ

Non-commercial distribution

විපාකත් නරක ක්‍රියා කළ අයට නරක විපාකත් ලැබීම ස්වභාවික සිද්ධියකි) යනු එහි අදහසයි.

කොතෙක් හොඳ ආහාර පාන කමින් බොමින් සිටියත්, කොපමණ සුවඳ ගල්වාගෙන සිටියත්, කෙතෙක් වටනා වස්ත්‍රාභරණ හැඳ පැළඳ සිටියත්, කොතරම් විශාල ගෙවල විසුවත් මේ ශරීරය අන්තිමේ දී ඉදිමී කුණු වී පණුවන්ට කැපවන බවත්, නැතහොත් පොළොවට පස් වන බවත්, තමා මෙලොවින් වෙන් ව කොතැනක හෝ යන බවත් දැන, ඒ ටික සිද්ධවීමට පෙර ලාමක ශරීරයෙනුත්, අත්හැර දමා යන ධනයෙනුත් යම් යහපත් කර්මයක් කර ගතහොත් එය ම සාරය වශයෙන් සලකා එසේ කිරීමට සියල්ලෝ ම සිතත්වා!

Non-commercial distribution

# 6. වන ගාථාව

**ආරති විරති පාපා - මජ්ජපානා ච සඤ්ඤමො**
**අප්පමාදො ච ධම්මෙසු - එතං මංගලමුත්තමං**

**පාපා**, ප්‍රාණඝාතාදි පාපයෙන්ː **ආරති ච**, ආදීනව දර්ශනයෙන් නො ඇලීම් වශයෙන් වැළැකීම දː **විරති ච**, කය වචන දෙකින් පව් කිරීමෙන් වළකීම ද, **මජ්ජපානා**, මද්‍යපානයෙන්ː **සංයමො ච**, වැළකීම ද, **ධම්මෙසු**, කුශල ධර්මයන්හිː **අප්පමාදො ච**, අමතක නො කිරීම ද යනː **එතං**, මෙයː **උත්තමං මංගලං**, උතුම් මඟුලි. මේ මංගල ධර්ම වදාළ සවන ගාථාව හා එහි පදාර්ථයි.

**1. පාප ක්‍රියාවන් පිළිකුල් කොට සලකා එහි නො ඇලීම හා තමාගේ කය වචන දෙකින් පව් කිරීමෙන් වැළකීම**

**2. මත්පැන් පානයෙන් දුරුවීම**

**3. කුශල් කිරීමෙහි අප්‍රමාදයයි කියන ලද අමතක නො කිරීම**

යන මේ තුන උතුම් මංගල තුනක් වන්නේ ය. යනු මේ ගාථාවෙහි අදහසයි.

*Non-commercial distribution*

# 19. පාපයෙන් වැලකීම යයි කියන ලද විරතිය

විරතිය **සම්පත්ත විරතිය**, **සමාදාන විරතිය**, **සමුච්ඡේද විරතිය** යි තුන් වැදෑරුම් වේ.

එයින් තමාගේ කුලය, වයස, උගත්කම, ආගම ආදිය සලකා, මා වැන්නකු විසින් මෙය නො කළ යුතු යයි සලකා, ප්‍රාණඝාතාදි පාප කර්මයක් කළයුතු අවස්ථාව පැමිණිවිට එය නො කර එයින් වැළකීම **සම්පත්ත විරති** නම් වේ.

එය **"චක්කන"** ගේ සාවා මුදා හැරි අවස්ථාව වැනි අවස්ථාවන්හි ලැබේ. චක්කන පෙර ලක්දිව වුසූ හොඳ තරුණයෙකි. ඔහුගේ මව අසනීප විය. ලෙඩේ සුව වීමට හාමස් දියයුතු බව වෙද මහතා කීය. එවිට චක්කනගේ වැඩිමහලු සොහොයුරා කෙතට ගොස් හාවකු මරා මස් ගෙන එන ලෙසට චක්කනට කීය. චක්කන ප්‍රකෘතියෙන්ම ප්‍රාණඝාතය නො කැමති වුව ද මව කෙරෙහි ඇති කරුණාව නිසා ද වැඩිමහලු සොහොයුරාගේ අණට කීකරු විය යුතු නිසා ද අකමැත්තෙන් ම කෙතට ගියේ ය.

කෙතට ගිය චක්කනට හදිසියේ ම හාවකු හමු විය. ඔහු දැකීමෙන් බිය වූ හාවා වේගයෙන් දුවනාතර තොණ්ඩුවකට අසුවී "කිරි කිරි" යන හඩින් කෑගැසුවේ ය. වහා ම චක්කන එහි ගොස් මවට බෙහෙත් කරමියි හාවා අල්වා ගෙන මෙසේ සිතීය. මා විසින් මාගේ මවගේ ජීවිතය රැකගැනීම පිණිස අනිකකුගේ ජීවිතයක් නැති කිරීම යුතු නො වේය යනුවෙනි. මෙසේ සිතූ හෙතෙම තෝ ගොස් වනයෙහි අතිත් හාවුන් හා කා බී සුවසේ ජීවත් වෙවයි කියා සාවා මුදා හැර හිස් අතින් ගෙදර ගියේ ය.

Non-commercial distribution

"චක්කන! කෝ හාමස්" යි අය්යා ඇසීය. හෙතෙම සිදු වූ කරුණු නො සඟවා කීය. උඹේ උපාසකකම අම්මාටත් වඩා ලොකු වුණා නොවේදැයි අය්යා චක්කනට බැණ වැදුනේ ය. චක්කන වහා මව ළඟට ගොස් මම උපන් තැන් සිට මේ වනතුරා මා දැන දැන සතකුගේ දිවි තොර නො කෙළෙමි. මේ සත්‍ය වචනයාගේ ආනුභාවයෙන් මාගේ මෑණියන්ගේ රෝගය සුව වේවා යි පැතීය. එකෙණෙහි ම මවගේ රෝගය ද සුව විය. මෙය චක්කනගේ පුවතය.

**"පාණාති පාතා වෙරමණී සික්ඛාපදං සමාදියාමි"** යනාදීන් මම අද පටන් දිවි හිමියෙන් ප්‍රාණඝාතාදියෙන් වෙන් වෙමි යි ශික්ෂාපද සමාදන් වන තැනැත්තාට ශික්ෂා පද සමාදානයෙහි හා සමාදනයෙන් පසු ජීවිතය පවා පරිත්‍යාග කොට ප්‍රාණඝාතාදියෙන් වෙන් වන්නා වූ තැනැත්තාට උපදින්නා වූ විරතිය **සමාදන විරති** නම් වේ.

මේ සමාදන විරතිය මෙම ලක්දිව **උතුරු වඩුන්නාවෙහි** වුසූ උපාසකතුමාට මෙන් සමාදන් වූ ශීලය රැකීමෙහිදී ලැබේ.

අඹරලි වෙහෙර විසූ පිංගල බුද්ධරක්ඛිත තෙරුන් වහන්සේගෙන් පන්සිල් ලබාගත්තා වූ උතුරු වඩුන්නා වැසි පුරුෂයෙක් වල්වැදුණු ගවයන් බානක් සෙවීමට උතුරු වඩුන්නා ගලට ගියේ ය. එකල්හි එහි සිටි පිඹුරෙක් ඔහුව අල්වා ගත්තේ ය. එවිට තමා අත තිබූ තියුණු මුවහත් ඇති කැත්තෙන් පිඹුරාගේ හිස සිඳ දිවි රැකගනිමි සිතූ ඔහු පසුව ඉදින් මේ පිඹුරාගේ හිස සින්දෙම් නම් පිංගල බුද්ධරක්ඛිත තෙරුන් වහන්සේගෙන් සමාදන් වූ ශීලය බිඳෙයි. එසේ ශීලය බිඳීම මා වැනියකුට නුසුදුසු යයි සිතීය.

පිඹුරාගේ වෙළීමෙන් වේදනා වැඩිවෙන්නට වෙන්නට උපාසක තැනට ජීවිත ආශාව නිසා නැවත නැවත ද පිඹුරා මරන්නට ම සිත් විය. එවිට ඔහු මට මේ දරුණු සිත නැවත නැවත ද පහළ වනුයේ කැත්ත අතේ තිබෙන නිසා ය. මෙය නැති නම් මෙවැනි සිතක් නූපදින්නේ ය. එබැවින් මෙය ඈතට විසිකරමියි පිඹුරා නො මරන සිත පහළ වූ වහා ම කැත්ත ඈතට වීසි කෙළේ ය. ඔහුගේ ඒ ශීල ගුණානුභාවයෙන් පිඹුරා ද එකෙණෙහි ම ඔහු හැර ගියේ ය.

Non-commercial distribution

පින්වත්නි! මේ කථා දෙක ම පෙර අප ලක්දිව ම සිදු වූ ප්‍රවෘත්ති දෙකක් බව නුවණින් සලකා අපේ මුතුන් මිත්තන් වූ **පෙර සිංහලයන්ගේ** මේ ගුණ දහම් රැකීම ආදර්ශයට ගෙන යුෂ්මතුන්ලා ද මෙතැන් පටන් පව්න් වැලකී සිටීමට හා පිළිකුල් කොට සැලකීමට ද පුරුදු විය යුතු.

සෝවාන්, සකෘදගාමි, අනාගාමි, අර්හත් යන සතර මාර්ග සතර ඵලයන්ට පැමිණියා වූ ආර්‍යයී පුද්ගලයෝ ඒ ඒ පාපකර්මයන් කිරීමට හේතු වන්නා වූ ලෝභාදි ක්ලේශ ධර්මයන් මතු නූපදනා පරිදි මාර්ගය ලැබීමේ දී ස්වකීය සන්තානවලින් දුරු කරති. ක්ලේශයන් දුරු කිරීම් වශයෙන් ඒ ඒ ක්ලේශයන් නිසා කරන්නා වූ ප්‍රාණඝාතාදි දුශ්චරිතයෝ ද දුරු කරන ලද්දාහු වෙති. ඉන්පසු ඒ දුශ්චරිතයන් කිරීමට සිතකුදු ආර්‍යයීයන්ට නූපදි. මතු කිසි ම කාලයක නො කරන්නා වූ ආකාරයෙන් ආර්‍යයීයන් විසින් කරන ලද ඒ මේ දුශ්චරිත ප්‍රහාණය **සමුච්ඡෙද විරති** නම් වේ. මේ සමුච්ඡෙද ප්‍රහාණය පෘථග්ජනයන්ට නො ලැබේ. මේ ත්‍රිවිධ වූ ම විරතිය මෙලෝ පරලෝ සියලු සැපතට හා ලෝකෝත්තර නිර්වාණ සම්පත්තියට ද හේතු වන බැවින් උතුම් මංගලයක් වන්නේ ය.

Non-commercial distribution

## 20. මත්පැන් පානයෙන් වැළකීම

මෙලොවැ සකලානර්ථයන්ට හා මරණින් මතු අපායෝත්පත්තියට හේතු වන්නා වූ සුරාව නමැති විෂ පානය කිරීමෙන් වැළකීම උතුම් වූ මංගලකි. ලජ්ජාව ය, බිය ය, කරුණාව ය, මෛත්‍රිය ය, සිහිය ය, නුවණ ය යන මේ ධර්මයෝ නියම මනුෂ්‍යයකු තුළ සහජයෙන් ම පිහිටන්නා වූ ගුණයෝ ය. මේ ගුණයන් නැත්තහුගේ මනුෂ්‍යත්වය නාමයෙන් පමණකි. සුරාව වනාහි මනුෂ්‍යයා යට කී ගුණයන්ගෙන් තුරන් කොට තිරිසන් ස්වභාවයට හෝ රාක්‍ෂස ස්වභාවයට හෝ උම්මත්තක ස්වභාවයට හෝ පමුණුවන්නා වූ විෂකි.

ඒ විෂ පානය කොට මත් වූ කල මනුෂ්‍යයාට කොපමණ නින්දිත නීච ක්‍රියාවක් කිරීමට වුවත් ලජ්ජාවක් නැත. පෝරකයට යන තරමේ භයානක ක්‍රියාවක් කිරීමට වුවත් බියක් ද නැත. එබැවින් මනුෂ්‍ය ධර්මයෙහි පිහිටිය කෙනකු විසින් නො කළ හැකි වූ නීච නින්දිත ක්‍රියාවක් කරනු රිසි වූ කල ද සුරාපානය කොට කරති.

### සුරාපානයෙහි ආදීනවයෝ

සුරාවෙන් මත් වූවහුට සිය මව් පිය සහෝදර සහෝදරියන් අඹු දරුවන් කෙරෙහි ද කරුණාවක් මෛත්‍රියක් නැත. සෙස්සන් ගැන කියනු කිම? කළ දේවල් හා කරන්නට තිබෙන දේවල් ගැන ද ඔහුට සිහියක් නැත. යමක් කිරීමෙන් තමාට හා තමාගේ අඹුදරුවන් ආදි අන්‍යයන්ට වන්නා වූ විපත්ති දැනෙන නුවණ ද ඔහුට නැත. කියයුත්ත කුමක් ද කළයුත්ත කුමක් ද, නො කියයුත්ත කුමක් ද නොකළ යුත්ත කුමක් ද කියා දැනෙන නුවණ ද ඔහුට නැත.

Non-commercial distribution

එබැවින් මත් වූ විට ඒ තැනැත්තා කොයි තරාතිරමේ කෙනෙක් වුවත් තමාගේ තරාතිරම පවා තමාට දැනගත නොහී කිසි ම ලජ්ජාවක් නැතිව නින්දිත වචන මහත් සේ හඬනගා කියන්නට පටන් ගනී. මහා මාර්ගයෙහිදී පවා කවි සින්දු ආදිය කීමට පටන් ගනී. ඇතැම්විට නැටීම ද කරයි. තමාට වඩා හපනෙක් නැත යයි සලකා දුටු දුටුවන් හා කළහයට එළඹෙයි. ක්ලාන්ත වී තැන තැන වැටෙයි. කෑ ආහාර වමනය කරයි. ගෙදර සිටින අහිංසක අඹුවට තළයි. දරුවනට තළයි. ඇතැම්විට දුකසේ උපයා සපයා තිබුණු සැළිවලින් පිඟන් කෝප්ප ඇඳ පුටු ආදිය ද විනාශ කරයි. **පෙර එක් රජෙක්** සුරා මදයෙන් මත්ව සිය සුරතල් පුත් කුමරා මරා මස් කෑවේ ය. මත්වූවහුගේ සිහිය කොපමණ වෙනස් වේ ද යන බව ඉන් දත හැකිය.

මත්වූ තැනැත්තාට ඇත්තාවූ වස්තුව ආරක්ෂාකර ගැනීමට හා නොලැබූ වස්තුව ලබාගැනීමට ද ඥාන ශක්තිය නැත. එබැවින් ඔහු මෙලොව වස්තු භංගත්වයට පැමිණ දිළිඳු වෙයි. අනාථව මැරෙයි. මේ ඊට හොඳ නිදසුනෙකි. **අනේපිඬු මහ සිටුහු ගේ බෑණනු කෙනෙක්** සතලිස් කෝටියක් ධනයට හිමිව සිට සුරාපානය නිසා ක්‍රමයෙන් දුප්පත් වී අන්තිමේදී වාසය කිරීමට ගෙයකුදු නැතිව අනාථව සිඟාකමින් සිට අනුන්ගේ ගෙයක බිත්තියක් අද්දර මළහ. ගෙහිමියෝ බලු කුණක් සේ මළ සිරුර වනයට ඇද දැමූහ.

සුරාව අධික කොට පානය කිරීමෙන් ඇතැමෙක් නොයෙක් රෝගයනට ද භාජනය වී අකාලයෙහි මිය යති. සුරාමදයෙන් මත් වූ තැනැත්තාගේ සිත දුශ්චරිතයට ම නැමෙයි. එහෙයින් මත් වූ විට ඔහුට නො කළ හැකි අපරාධයක් නැත. එබැවින් සුරාවට ලොල් වූවෝ නොයෙක් පව්කම් කොට බොහෝ සතුරන් ඇති කර ගැනීම, නින්දවට භාජනයවීම, ගුටිබැට කෑම, සිරගෙවල වැටී දුක් විඳීම ආදි මෙලොවමැ තවත් අපමණ පිරිහීම්වලට භාජනය වෙති. මේ එයට නිදර්ශන කිහිපයකි.

පෙර මුලු දඹදිව ම යටත් කරගෙන ද්වාරවතී නුවර විසූ වාසුදේවාදි දසබෑ රජදරුවෝ මත්ව ඔවුනොවුන් මරාගෙන විනාශ වූහ. පෙර තව්තිසා දෙව්ලොව වුසූ දෙවියෝ සුරාපානය නිසා ම

Non-commercial distribution

දිව්‍යලෝකයට ද අභිමි වූහ. සුරාව සාමාන්‍ය මනුෂ්‍යයකුගේ පිරිහීමට හේතුවීම ගැන කියනු කිම? සුරාපානයෙන් මතු භවයෙහි වන්නා වූ විපාකයෝ ද මෙසේ වදළහ:-

**"සුරාමෙරයපානං භික්ඛවෙ, ආසෙවිතං භාවිතං බහුලීකතං නිරය සංවත්තනිකං හොති, තිරච්ඡාන යොනි සංවත්තනිකං හොති. පෙත්ති විසය සංවත්තනිකං හොති, යො සබ්බලහුසො සුරාමෙරය පානස්ස විපාකො මනුස්ස භූතස්ස උම්මත්තක සංවත්තනිකො හොති"**

සුරා පානය කළෝ මරණින් මතු ද නරකයෙහි උපදිති. ප්‍රේත ලෝකයෙහි උපදිති. තිරිසන්ව උපදිති. අනේක වර්ෂ කෝටි සහශ්‍රයෙහි නරකයෙහි දුක් විඳ මිනිස් ලොවැ නැවත උපන් කල්හි ද ඔවුහු කිසි ද මිනිස් සුවයක් නොලබා උමතු ව හැසිරෙති යනු එහි අදහසයි.

**"උම්මත්තකා විගත ලජ්ජ ගුණා භවන්ති**
**දීනා සද ව්‍යසන සොක පරායනා ච**
**ජාතා භවෙසු විවිධෙසු විරූපදෙහා**
**පීත්වා හලාහල විසංව සුරා විපක්කඳා"**

මේ ද සුරා පානයෙහි ආදීනව දැක්වෙන ගයෙකි. එහි අදහස නම්, නුවණ නැත්තෝ හලාහල විෂක් බඳු වූ සුරා පානය කොට (බොහෝ කල් නරකයෙහි පැසී ශේෂ වූ පාප කර්ම ශක්තියෙන්) නොයෙක් ජාතිවල උපන්නෝ උම්මත්තකයෝ වන්නාහ. ලජ්ජා නැත්තෝ වන්නාහ. දිළිඳු වන්නාහ. ශෝක කරන්නාහ. විරූප ශරීර ඇති වන්නාහ යනුයි.

**සුරාවෙන් හා සුරා පානය**
**කරන්නන්ගෙන් ද වෙන් විය යුතුය.**

සුරා පානයෙන් වන්නා වූ අනර්ථයන් දැක දැකත් එය අත් නො හැර ම පානය කරන්නේ සුරාව ගැන පවත්නා වූ අධික ආශාව නිසා ය. ආශාව දුරු කර ගතහොත් කවරකුට වුවත් සුරාවෙන් වෙන් විය හැකිය. සුරා ආශාවට වාල්ව සිටින්නන් විසින් කවර ලෙසකින් වුවත් ඒ ලාමක ගතිය තමා කෙරෙන් පහකර ගෙන සුරාව නැමති විෂ පානය කිරීමෙන් වැළකිය යුතුයි.

Non-commercial distribution

පින්වත්නි! අපට සසර දුකින් මිදී නිවන් සුවය ලැබිය හැක්කේ සියල්ල ම කෙරෙහි පවත්නා සියලු ම ආශාවන් දුරු කර ගැනීමෙන් ය. විෂක් බඳු වූ සුරාව කෙරෙහි පවත්නා ලෝභය පමණ වත් අත්හැරිය නො හැකි නම් ඒ නිවන අපි කෙසේ ලබන්නෙමු ද? සුරා පානය කරන තැනැත්තේ ඒ විෂ පානය කරන්නට නිවන් සුවයෙන් වඩ වඩා ඈත් වේ. නිවන් සුවය ලබනු කැමැත්තන් විසින් නිවන් ළං කර ගනු කැමැත්තන් විසින් සුරා පානයෙන් සම්පූර්ණයෙන් වැළකිය යුතුයි.

දෙව් මිනිස් සැප ලබනු කැමැත්තන් විසින් සුරා පානයෙන් සම්පූර්ණයෙන් වැළකිය යුතුයි.

තිබෙන ධනය ආරක්‍ෂා කරගනු කැමැත්තන් විසින් සුරා පානයෙන් වැළකිය යුතුයි. නො ලැබූ ධනය ලබනු කැමැත්තන් විසින් ද සුරා පානයෙන් වැළකිය යුතුයි. නිරෝගීව කලක් ජීවත්වනු කැමැත්තන් විසින් ද සුරා පානයෙන් වැළකිය යුතුයි. අඹු දරුවන් රක්‍ෂා කරනු කැමැත්තන් විසින් ද සුරා පානයෙන් වැළකිය යුතුයි. අඹු දරුවන්ට නෑයන්ට මිතුරන්ට අසල්වාසීන්ට කරදර නොකරනු කැමැත්තන් විසින් ද සුරා පානයෙන් වැළකිය යුතුයි. සත් පුරුෂ සමාගමයට ඇතුළත්වනු කැමැත්තන් විසින් ද සුරා පානයෙන් වැළකිය යුතුයි.

**සුරාපානයෙන් පමණක් නොව සුරා පානය කරන්නවුන් ආශ්‍රයෙන් ද වැළකිය යුතුයි**. මත් වී සිටින විට ඔහු අතින් ආශ්‍රය කරන්නාට ද අන්තරාය පැමිණිය හැකි හෙයිනි. සුරා පානය කරන්නවුන් ආශ්‍රය කරන්නවුන්ට ද සුරා පානය පුරුදු විය හැකිය. සුරාව නමැති මේ විෂ වර්ගය මනුෂ්‍යයාගේ සිත තදින් බැඳගන්නා වර්ගයකි. එබැවින් පුරුදුවී රස තණ්හාවෙන් බැඳුණ තැනැත්තාට ඒ ලෝභය සිඳ දමා සුරාවෙන් වැළකීමට ද ඉතා දුෂ්කර වේ. එබැවින් ඒ විෂෙන් සම්පූර්ණයෙන් ම වැළකිය යුතු ය.

දරුවාගේ යහපත පතන මව් පියවරුන් විසින් ස්වකීය දරුවන් මත් පැන් පානයට පුරුදු වන්නට ඉඩ නොදී ආරක්‍ෂා කරගත යුතු ය. ඔවුන්ට බේබද්දන්ගේ ආශ්‍රයට යන්නට ඉඩ නොදී ආරක්‍ෂා කරගත යුතු ය. සුරා යක්ෂයාට අසුවී සිටින ස්වකීය

Non-commercial distribution

නැයන් මිතුරන් එයින් මුදවා ගැනීම පිණිස ද සියල්ලන් විසින් ම උත්සාහ කළ යුතු ය.

**"මද හි පාපානි කරොන්ති බාලා**
**කරොන්ති චඤ්ඤෙපි ජනෙ පමත්තෙ**
**එතං අපුඤ්ඤායතනං විවජ්ජයෙ**
**උම්මාදනං මොහනං බාලකන්තං"**

බාලයෝ (අඥානයෝ) මදය හේතුකොට නොයෙක් පව් කෙරෙත්. ඔවුහු අන්‍ය ජනයන් ද ප්‍රමාද වූවන් කරති. මනුෂ්‍යන් උමතු කරවන්නා වූ මුළා කරවන්නා වූ අඥයන් විසින් කැමති වන ලද්දා වූ සුරාව නමැති මේ පව් ආකරය දුරු කළ යුතු ය. - යනු මෙහි තේරුමයි.

**"නරින්ද සම්පත්ති නරින්ද ලෝකේ**
**සුරින්ද සම්පත්ති සුරංග මජ්ඣෙ**
**මුනින්ද සම්පත්ති මහාරහන්තෙ**
**න දුල්ලභෙ කන්ත සුරා විරත්තෙ"**

මනුෂ්‍ය ලෝකයෙහි චක්‍රවර්ති රාජ්‍ය සම්පත්තිය ද, දෙව්ලොව දිව්‍යාංගනාවන් මධ්‍යයෙහි සක්දෙව් රජ සැපත ද, මහරහතන් වහන්සේලා අතර මුනීන්ද්‍ර සම්පත්තිය ද හෙවත් ලොව්තුරා බුදුබව ද යන මේ උත්තම සම්පත්තීන් ඒකාන්තයෙන් සුරාවෙන් වැළකුණු පුද්ගලයාට දුර්ලභ නොවේය - යනු අදහසයි.

මෙසේ නොයෙක් දුක් කරදරවලින් නිදහස් වීමට හා නොයෙක් සැප සම්පත් ලැබීමට ද හේතුවන බැවින් සුරා පානයෙන් වෙන්වීම උතුම් මංගලයක් බව තුන් ලොවට මංගල වූ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ වදාළ සේක.

Non-commercial distribution

## 21. කුශල් කිරීමෙහි අප්‍රමාදය

'අප්පමාදො ච ධම්මේසු' යනුවෙන් වදළ මංගල ධර්මයෙහි **"අප්පමාදය"** නම් ප්‍රමාදයට ප්‍රතිපක්ෂ දන ශීලාදි කුශලයන් කිරීමෙහි පවත්නා වූ යහපත් සිහියයි. මෙය ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ගයෙහි දී සම්මා සති යන නාමයෙන් වදරා තිබේ. සෑම තන්හි ම තබා ගත යුතු වූ මෙම සිහිය නැතිවීම ප්‍රමාදයයි. ආර්‍ය්‍ය සමාධිය හා ආර්‍ය්‍ය ප්‍රඥාව වැඩීමෙන් සිත දමනය නොකළා වූ පෘථග්ජන පුද්ගලයාගේ සිත කායාදි ත්‍රිවිධ දුශ්චරිතයන් කෙරෙහි හා පස් කම් සුව විඳීමෙහි ද නැමී බර වී පැවැත්ම ස්වභාවයකි.

ඔහුගේ සිත සුචරිතයෙහි පිහිටුවීමට සම්මා සතිය (නිවැරදි සිහිය) නමැති යොතින් සුචරිතය නමැති කණුවෙහි බැඳ තැබිය යුතුය. සිහිය නමැති යොතින් බැඳ රක්‍ෂා නො කරන ලද සිත් ඇති පුද්ගලයා වනාහි බන්ධනයෙන් මුදා හරින ලද කුළු ගොනකු වැනිය. බන්ධනයෙන් මිදුන කුළු ගොනා වනාහි දුටු දුටුවන්ට ඇනීමෙන් ද, නො යා යුතු මගැ යෑමෙන් ද, නො කෑ යුතු දෑ කෑමෙන් ද, විනාශයට පැමිණෙන්නේ ය. එමෙන් සිහියෙන් තොර වූ පුද්ගලයා ද ත්‍රිවිධ දුශ්චරිතයෙහි හැසිරීමෙන් ද, පස් කම් රසයෙහි ඇලී ගැලී සිටීමෙන් ද දෙලොව ම මහත් දුකට පත්වේ. එබැවින් ප්‍රමාදය දෙලොව මැ මහත් පරිහානියට පමුණුවන පාප ධර්මයකි. අප්‍රමාදය දෙලෝ අභිවෘද්ධිය සලසාලන ආර්‍ය්‍ය ධර්මයකි. ඒ එසේ මැ යි. ඒ බව මෙසේ දත යුතු.

### දෙලෝ දියුණුව
### ලබාදෙන එක ම ධර්මය

දියුණුවෙහි අගතැන් පැමිණ වදළා වූ, දියුණුවෙහි නො වරදින මග තත් වූ පරිදි දැන වදළා වූ සකල සත්ත්වයන්ගේ ම මෙලොව පරලොව දියුණුවට ලෞකික ලෝකෝත්තර දියුණුවට

Non-commercial distribution

මග හෙළි පෙහෙළි කර වදළා වූ අප බුදුරජාණන් වහන්සේ **'සැවැත්නුවර'** ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි, එක් දවසක් **පසේනදි කොසොල් රජතුමා** බුදුරජාණන් වහන්සේ වෙත එළඹ පිළිසඳර කථා කොට එකත් පසෙක හිඳ මෙලොව දියුණුව ය පරලොව දියුණුව ය යන මේ දෙක ම සිදු කරන්නා වූ යම්කිසි එක් ධර්මයක් එක් කරුණක් ඇත්තේ ද'' යන මේ ප්‍රශ්නය ඇසී ය.

එකල්හි බුදුරජාණන් වහන්සේ, මහරජ මෙලොව දියුණුව ය පරලොව දියුණුව ය යන දෙක ම සිදු කරන්නා වූ එක් ධර්මයක් ඇතය යි වදළ සේක. එකල්හි රජතුමා ස්වාමීනි! ඒ කරුණ කුමක් දැයි විචාලේ ය. බුදුරජාණන් වහන්සේ මහරජ! "අප්‍රමාදය නමැති මේ එක ම ධර්මය මෙලොව දියුණුව ය, පරලොව දියුණුව ය යන දෙක ම සිදු කරන්නේ ය. මහරජ! යම් සේ සියලු ම සතුන්ගේ පිය සටහන්වලට වඩා මහත් වූ ඇත් පිය සටහනෙහි, ඇවිදින්නා වූ සියලු ම සතුන්ගේ පිය සටහන් ඇතුළත් කර ගනීද, එපරිද්දෙන් අප්‍රමාදය නමැති මේ එකක් වූ ධර්මය තෙමේ මෙලොව පරලොව දෙකෙහි ම දියුණුව සිදු කරන්නේ යයි වදරා, මෙසේ ද වදළ සේක.

**ආයුං ආරෝගියං වණ්ණං සග්ගං උච්චා කුලීනතං**
**රතියො පත්ථයන්තෙන උළාරා අපරාපරෙ**
**අප්පමාදං පසංසන්ති පුඤ්ඤ කිරියාසු පණ්ඩිතා**
**අප්පමත්තො උභො අත්ථෙ අධි ගණ්හාති පණ්ඩිතො**
**දිට්ඨෙව ධම්මෙ යොචත්ථො යොචත්ථො සම්පරායිකො**
**අත්ථාභිසමයා ධීරො පණ්ඩිතොති පවුච්චති**

(සංයුක්ත නිකාය)

ආයුෂය ද නිරෝගී බවද ශරීරයේ යහපත් පැහැය හා සටහන ද ස්වර්ගයද උසස් කුලවත් බව ද ආහාර පාන වස්ත්‍රාභරණ යාන වාහනාදි තවත් නොයෙක් පඤ්චකාම වස්තූන් ද ප්‍රාර්ථනා කරන්නහු විසින් ඒවා ලබා ගැනීම සඳහා පුණ්‍ය ක්‍රියාවන්හි පමා නොවීම යහපත්තැයි පණ්ඩිතයෝ පසසන්නාහ. පමා නොවන්නා වූ පණ්ඩිතයා මෙලොව පරලොව දෙක්හිම දියුණුව ලබාගන්නේය. ඉහාත්මයෙහි ලැබිය යුතු වූ යම් දියුණුවක් වේ නම් එයද, පරලෙව්හි ලැබිය යුතුවූ යම් දියුණුවක් වේනම් එයද ලබාගන්නා වූ නුවණැත්තාට පණ්ඩිතයා යයි කියනු ලැබේය- යනු එහි අදහසය.

Non-commercial distribution

**දෙලොව දියුණුව නම් කුමක්ද?**

ආහාර පාන, වස්ත්‍රාභරණ, යාන වාහන. මිළ මුදල්, කෙත්වතු ගෙවල් ඇතිව, සිහි නුවණ ඇතිව, නොයෙක් සිප්සතර දැනගෙන, යහපත් අඹුදරුවන් ඇතිව, බොහෝ නෑයන් මිතුරන් ඇතිව, සත්පුරුෂ ගුණධර්ම ඇතිව, ගරු බුහුමන් ඇතිව, මෙලොව වාසය කරන්නට ලැබීම **මෙලොව දියුණුවය**. මරණින් මතු අපායට නොවැටී ස්වර්ගයෙහි ඉපිද ස්වර්ග සම්පත්තියෙන් සතුටු වන්නට ලැබීම **පරලොව දියුණුව ය**.

නුවණැත්තෝ මේ දෙයාකාරවූ දියුණුව ලබා ගන්නාහුය. දෙයාකාරවූ දියුණුවට ම පැමිණෙන්නාහුය. අඥයෝ වනාහි මෙලොව ද ආහාර පාන වස්ත්‍රාභරණ නැතිව වාසස්ථාන නැතිව ණය ගැතිව දුකින් කල්යවා මරණින් මතු ද අපායට පැමිණ දෙලොවින්ම පිරිහෙති. මේ කාලයෙහි ගිහි පැවිදි දෙපක්ෂයෙහි ම බොහෝ සෙයින් ඇත්තේ ප්‍රමාදයෙන් කල් යවන්නාවූ පුද්ගලයෝ ම ය. කළයුත්ත අමතක කොට හැසිරෙන්නාවූ ඔවුන්ගෙන් ඇතමෙක් පරලොව ගැන නොබලා කිනම් පාපයක් අපරාධයක් මුත් කොට මෙලොව සැප විඳීමට පමණක් බලාපොරොත්තු වෙති. ඔවුහු මෙලොව සැප සඳහා ඌරන් කුකුළන් එළුවන් ගවයන් ආදි සතුන් මරති. මරවති. අන්සතු ධනය සොරකම් කරති. කරවති. අල්ලස් ගෙන අපරාධ කරති. හොර ඔප්පු ලියාගැනීම් ආදි වශයෙන් අන්සතු වස්තුව අයිති කර ගනිති. බොරු අයිතිවාසිකම් දක්වා නඩු කියා අන්සතු දේ අයිති කර ගනිති. නොයෙක් ආකාරයෙන් අනුන් රවටා අනුන්ගේ වස්තුව පැහැර ගනිති. පරස්ත්‍රීන් දූෂණය කරති. බොරු පොරොන්දුවීම් බොරු සාක්ෂි කීම් මත්පැන් පානය කිරීම් ආදි වශයෙන් දුශ්චරිතයෙහි ඇලී ගැලී සිටිති.

මෙසේ කරන්නවුන්ට ඒවායින් මෙලොව යම්කිසි දියුණුවක් වුවත්, පරලොව පිරිහීම නම් නියතමය. අපරාධයන් නිසා ලබන මෙලොව දියුණුවත්, අවදනම් දෙයකි. එක් එක් අපරාධයක් ආපසු පෙරළෙන කල්හි මුළු කාලය තුළ ඇතිකරගත් ධනය විනාශ වන්නේය. සමහරවිට ජීවිතය පවා නැති වන්නේය. මෙලොව සැප සඳහා කරන එක් එක් පාප ක්‍රියාවක්ම පව් කළ තැනැත්තා

Non-commercial distribution

නරකයට හෙලා වර්ෂ දහස් ගණනක් ලක්ෂ ගණනක් මුළුල්ලෙහි නරකයෙහි දුක් විඳින්නට ද, සිය ගණන් ජාති වල ප්‍රේත බවට තිරිසන් බවට පමුණුවා දුක් විඳින්නට ද, සමර්ථය. එබැවින් පව් කොට ලබන්නා වූ එක් එක් සැපයක්ම අනාගතයෙහි වර්ෂ ලක්ෂ ගණනක් මුළුල්ලෙහි කෝටි ගණනක් මුළුල්ලෙහි විඳිය යුතු වූ අපාය දුකත් සමග ම ලබන දෙයකි.

**මනුෂ්‍යයා ජීවත්විය යුත්තේ කෙසේද?**

මනුෂ්‍යයකුහට මෙලොව ජීවත් වන්නට තිබෙන කාලය ඉතා කෙටි කාලයෙකි. ඔහු පිළිබඳ පරලොවට අයත්වූ කාලය වර්ෂ ගණනින් තබා කල්ප ගණනිනුදු දැක්විය නොහැකි දීර්ඝ කාලයකි. එබැවින් අනාගත කාලයෙහි අපායට යන්නට නොවන පරිදි කටයුතු කරගතහොත් මෙලොව ජීවත්වන කෙටි කාලය දුකින් ගතකළාට ද කම් නැත. කෙටි කාලයක් පවත්නා සැපයක් නිසා දීර්ඝ කාලයක් විඳිය යුතු දුකක් අත් පත් කර ගතහොත් එය ලොකුම මෝඩ කමකි. එහෙයින් කවදත් නුවණැතියෝ සුළු සැපයක් නිසා ලොකු සැපයකට හානියක් කර නො ගනිති. නුවණැතියන්ගේ ස්වභාවය නිතරම ම ලොකු සැපය නිසා සුළු සැපය අත්හැරීම යඃ ඒ බව මෙසේ ද වදාරණ ලදී.

(ධම්ම පදයෙනි)

**මත්තාසුඛ පරිච්චාගා- පස්සෙ වෙ විපුලං සුඛං**
**චජෙ මත්තා සුඛං ධීරො- සම්පස්සං විපුලං සුඛං**

සුළුසැපයක් අත්හැරීමෙන් උදාර වූ සැපයක් යම් සේ පැබිය හැකැයි දක්නේ ද, එහෙයින් උදාර වූ සැපයක් දන්නා කැමැත්තා වූ නුවණැති පුද්ගලතෙම මතු ලැබිය හැකි ඒ උසස් සැපය නිසා ඒ ඒ වේලාවට ලැබිය හැකි සුළු සැපය අත් හරනේ ය - යනු එහි අදහසයි.

පරලොවැ පිළිබඳ කාලය ඉතා දීර්ඝ බැවින් නුවණැත්තන් විසින් මෙලොව සැපයට ද මෙලොව දියුණුවට ද වඩා පරලොව යහපත පරලොව දියුණුව ගැන බැලිය යුතුය. පරලොව පිළිබඳව වන මහා පරිහානිය නො බලා මෙලොව ස්වල්ප වේලාවකට

Non-commercial distribution

ලැබෙන සැපය සඳහා පව්කම් කිරීම වනාහි ශීත කාලයෙහිදී වාසය කරන ගෙට ගිනි තබා ගිනි තැපීම වැනි මී පැණි තැවරුණු කඩු මුවහත ලෙවීම වැනි අනුවණ කමකි. එබැවින් මෙලොව කොපමණ මහත් දෙයක් සඳහාවත් මරණින් මතු අපාගත වන්නට සිදුවන දෙයක් නො කළ යුතුය. මෙලොව ඉපිද සිටින්නා වූ සත්ත්වයන් හට මෙලොව සැපය ද මෙලොව දියුණුව ද අවශ්‍යය. ඒ සැප හා දියුණුව පරලොව පිරිහීමට හේතු නො වන පරිදි නුවණින් සිදුකර ගත යුතුය.

**කා බී ප්‍රීතිවීම තිරිසනුන් ද කරන වැඩකි**.

ලොවැ ඇතැමෙක් පස්කම් රස විඳීම ම ජීවිතයෙන් ලැබිය යුතු පරම ප්‍රයෝජනය යයි සිතා කුශල පක්ෂය අමතක කොට මුදල් සැපයීමට ද, වතු කුඹුරු ගෙවල් යාන වාහන සැපයීමට ද, අඹුදරුවන් පෝෂණය කිරීමට ද, ජීවිතයේ මුළු කාලය ම ගෙවා ලැබූ මිනිසත් බවින් කිසිම ඵලයක් නො ලබා මිය යති. ඔවුන්ගේ ඒ ක්‍රියාව ද අමනෝඥ ක්‍රියාවකි.

කෙලෙසකින් වුවත් යමක් කමක් උපයා, ආහාර පානාදිය සපයා, ගත සිත පුරා කා, බී, දරුවන් ද පෝෂණය කරමින් සමහර අවස්ථාවල දී ප්‍රීතිය ද භුක්ති විඳිමින් අවුරුදු සැටක් සැත්තෑවක් හෝ සියයක් පමණ හෝ ජීවත්වීම,උසස් යයි සම්මත මිනිසා විසින් පමණක් නොව ඇතැම් තිරිසන් සතුන් විසින් ද කරන දෙයකි. එබැවින් මෙලොව ධර්මයෙන් හෝ අධර්මයෙන් කා බී කලක් ජීවත් වන්නට ලැබීම පුදුමයට කරුණක් නොවේ.

මෙලොව දියුණුව මෙන්ම පරලොව දියුණුව ද ඇතිකර ගත යුතු ම ය. දෙලෝ දියුණුව ම ලබා ගන්නා වූ තැනැත්තාම ශ්‍රේෂ්ඨ පුද්ගලයාය. නියම මනුෂ්‍යයාය.ඔහුගේ ජීවිතය ම සඵල වූ හිස් නොවූ ජීවිතයක් වන්නේය. නුවණැත්තන්ගේ ප්‍රශංසාවට භාජන වූ ජීවිතයක් වන්නේය. බුඩාදි උත්තමයන්ගේ වර්ණනාවට පාත්‍ර වූ උතුම් වූ ජීවිතයක් වන්නේය.

තව ද දෙලොව දියුණුවට කැමති වුවත් දියුණුවේ නියම මාර්ගය දියුණුවේ රහස තත් වූ පරිදි නොදැන, නොමග ගමන්

Non-commercial distribution

කළහොත් ඒ දියුණුවට පැමිණිය හැකි නො වන්නේය. එබැවින් දෙලොව දියුණුව පතන්නවුන් විසින් **දියුණුවේ නියම මාර්ගය** සොයාගත යුතුය. **දියුණුවේ එක ම මාර්ගය** අප්‍රමාදව හෙවත් කුසල් කිරීමේ නොපමා බව යයි දත යුතු.

**පිරිහීමේ මග**

මෙලොව දියුණුව පිණිස කළයුතු වූ ශිල්ප ශාස්ත්‍ර උගෙනීම ධාර්මික රැකී රක්ෂාවල යෙදීම ආදිය හා පරලොව සැප පිණිස කළයුතු වූ දනාදි පින්කම්වල යෙදීම ද හැර දමා, පස්කම් සුව විඳීමෙහි හා ප්‍රාණඝාතාදි දුශ්චරිතයන් කිරීමෙහි ද යෙදෙන්නා වූ ස්වභාවය **ප්‍රමාද** නම් වේ. තව ද මෙලොව දියුණුව පිණිසත් පරලොව දියුණුව පිණිසත් කරන උගෙනීම් ආදිය ද කුසල් කිරීම ද යන දෙක ම නොසැලකිලි ලෙස ඕනෑකමක් නැතිව ඉඳ හිටලා : ඇන හිටවමින්, එපාකමින්, අනුන් කියන නිසා හෝ බේරීමට පිළිවෙලත් නැතිකම නිසා හෝ යම්තම් ගාවා කිරීමද ප්‍රමාදය ම බව දත යුතු.

ඒ ප්‍රමාදය මෙලොව නො ලැබූ සම්පත් නොලැබීමටත් ලැබූ සම්පත් විනාශයටත් හේතු වන්නේය. ප්‍රමාද පාක්ෂික දුශ්චරිතන්ගෙන් පරදර සේවනය, සුරාපානය, දූකෙළිය යනාදිය විශේෂයෙන් මෙලොව පරිහානිය පිණිස පවත්නේය. පරලොව පරිහානියට සියල්ලම හේතු වන්නේය. එබැවින් :–"**පමත්තස්ස හි නාම චත්තාරො අපායා සක ගෙහ සදිසා** "යනුවෙන් ප්‍රමාද වන තැනැත්තාට සතර අපාය සිය නිවස වැනි වේයයි දක්වන ලදී. එක ජාතියක වූ ප්‍රමාදය ජාති දහස් ගණනක් වුවත් ලක්‍ෂ ගණනක් වුවත් අපායෙහි දුක් විඳීමට ප්‍රමාණ වන්නේය. එහෙයින් එය අවමංගලයකි.

**දියුණුවේ මග**.

මෙලොවැ යහපත පිණිස දියුණුව පිණිස කළයුතු වූ ශිල්ප ශාස්ත්‍ර උගෙනීම් දැහැමි රැකී රක්ෂාවල යෙදීම් ආදිය හා පරලොව යහපත පිණිස කළයුතු වූ දන්දීම්, නිති පන්සිල් රැකීම්, පොහොය අට සිල් රැකීම්, විවේක ඇති පරිදි කලින් කල දසසිල් රැකීම්, බණ

Non-commercial distribution

ඇසීම්, වතාවත් කිරීම් ආදි ගෘහස්ථයන් විසින් කළ හැකි සියලු පුණ්‍ය ක්‍රියා වල යෙදීම ද දෙලෝ දියුණුව පිණිස පවත්නා සියලු යහපත් වැඩ අමතක නොකොට කළයුතු. සුදුසු හැම වේලෙහි ම, හැම දිනයෙහිම, හැම සතියෙහිම, හැම මාසයෙහි ම, හැම වර්ෂයෙහිම, ප්‍රථම මධ්‍යම පශ්චිම යන තුන් වයසෙහි ම කලින් කල අතහැර නොදමා නිතර කිරීම ද එපා කමින් මග හරිමින් යම්තමට නොකොට කළයුතු වැඩ යයි සලකා ඉතා ඕනෑ කමින් හොඳ හැටියටම කිරීම ද, අප්‍රමාදය නම් වේ.

ඒ උතුම් අප්‍රමාදයෙන් මෙලෝ දියුණුව ය පරලොව දියුණුවය යන දෙකම මනා කොට සිදු වන්නේ ය. අප්‍රමාද වූ පුද්ගලයා හට සියලු ලෞකික සම්පත් ද, සතර මාර්ග සතර ඵල නිර්වාණ සංඛ්‍යාත ලෝකෝත්තර සම්පත් ද ලැබෙන්නේය. එබැවින් මංගල වාදී වූ භාග්‍යවතුන් වහන්සේ එය දෙලෝ දියුණුව පිණිස පවත්නා උතුම් මංගල කරුණකැ යි වදාළ සේක.

තව ද අප බුදු පියාණන් වහන්සේ බුද්ධත්වයට පැමිණ ලොවට වැඩ වඩමින් වැඩ සිටි පන්සාලිස් අවුරුද්ද මුළුල්ලෙහි දිව්‍ය මනුෂ්‍ය බ්‍රහ්ම යන තුන් ලෙව්හි සැරිසරා වඩිමින් දිව්‍ය මනුෂ්‍ය බ්‍රහ්මාදි අනන්තාපරිමාණ සත්ත්ව සමූහයකට නොයෙක් අයුරින් ධර්ම දේශනා කර වදාළ සේක. අන්තිම අවස්ථාවෙහි පරිනිර්වාණ මඤ්චකයෙහි අනුට්ඨාන ශෛය්‍යාවෙන් සැතපී වැඩ හිඳ, යම් සේ දයා බර පිය කෙනෙකු මරණ මඤ්චකයෙහි සැතපී තම දූ දරුවන් කැඳවා ඕනෑකමින් හා මතු මහත් බලාපොරොත්තුවෙන් අවසාන අවවාදය දෙත් ද? එමෙන් '' **අප්පමාදෙන භික්ඛවෙ සම්පාදෙථ** '' යනුවෙන් භික්ෂූන් අමතා ''මහණෙනි! නොපමාව මහණ කම රැකගනිව්! හෙවත් මහණකම පිළිබඳ සියලු කටයුතු නොපමාව සම්පූර්ණ කර ගනිව්'' යි වදාළ අන්තිම බුද්ධ වචනයෙනුදු මේ බව දත යුතු.

එසේ ම උන්වහන්සේ පන්සාළිස් වසක් මුළුල්ලෙහි වදාළ සුවාසූ දහසක් ධර්මස්කන්ධයන් ගෙන් හෙබි මුළු ත්‍රිපිටක ධර්මයෙහි ඇතුළත් අවවාද සමූහය සම්පිණ්ඩනය කොට හෙවත් හකුළුවා මේ එක ම අප්‍රමාද පදයෙහි ඇතුලත් කොට මේ උතුම් අවසාන අවවාදය වදාළ බවද මෙහි ලා විශේෂයෙන් දැන, ඒ වූ පරිදි අප්‍රමාදයෙහි යෙදී දෙලොවැ සුවපත් වීමට උත්සාහ කටයුතු.

Non-commercial distribution

## 7. ගාථාව

**ගාරවොච නිවාතොච - සන්තුට්ඨීච කතඤ්ඤුතා**
**කාලෙන ධම්මසවණං - ඒතං මංගල මුත්තමං**

**ගාරවෝච**, ගරු කළ යුත්තන් කෙරෙහි ගෞරවදය දඃ **නිවාතොච**, යටහත් පැවැත්ම දඃ **සන්තුට්ඨීච**, ලද පමණින් සතුටු වීමදඃ **කතඤ්ඤුතා**, කෙළෙහි ගුණ සැලකීම දඃ **කාලෙන ධම්මසවනං**, සුදුසු කාලයෙහි බණ ඇසීමද යනඃ**එතං**, මේ කරුණු පසඃ **උත්තමං මංගලං**, උතුම් මගුල් වන්නේ ය.

1. **ගරු කල යුත්තන්ට ගරු කිරීමය.**
2. **යටහත් පැවැත්ම හෙවත් උඩගු නොවීමය**
3. **ලද සෙයින් සතුටු වීමය.**
4. **කෙළෙහි ගුණ සැලකීමය.**
5. **සුදුසු කාලයෙහි ධම් ශ්‍රවණය කිරීමය.**

යන මේ කරුණු පස දෙලෝ අභිවෘද්ධිය පිණිස පවත්නා උතුම් මංගල පසක් බව මංගලවාදී වූ භාග්‍යවතුන් වහන්සේ පූර්වෝක්ත ගාථා ධර්මයෙන් වදළ සේක.

*Non-commercial distribution*

## 22 ගරු කළ යුත්තන්ට ගරු කිරීම

මෙහි ගරු කළ යුත්තෝ නම් තමාට වඩා ගුණයෙන් හෝ වයසින් හෝ ඒ දෙකින් ම හෝ වැඩි වූවෝ ය. එනම්:– බුදුවරයෝය. පසේ බුදුවරයෝය. සෝවාන් ආදි උත්තමයෝය. උපසම්පදශීල සාමණේරශීල දශ ශීලාදියෙන් යුක්ත බුද්ධ ශ්‍රාවකයෝය යන මොවුහුයි. උන් වහන්සේලා ගුණයෙන් වැඩි බැවින් ගරු කළ යුත්තෝය. මව් පියෝය, වැඩිමහලු සහෝදර සහෝදරියෝය යන මොවුහු ගුණ වයස දෙකින් ම වැඩි බැවින් ගරු කළ යුත්තෝය. තමාට වඩා වයසින් වැඩිහිටි අන්‍ය වූ පුද්ගලයෝ ද වයසින් වැඩි බැවින් ගරු කළ යුත්තෝය. ගුණ වයස දෙකින් ගුණය ම ප්‍රධාන බැවින් මහලු ගිහියන් විසිනුදු ළදරු සාමණේර නමට ද ගරු බුහුමන් කළ යුතුය. ගුණයෙන් සමානයන් කෙරෙහි වැඩි මහලු පිළිවෙළින් ගෞරව පැවැත්විය යුතුය.

බුද්ධ රත්නය, ධර්ම රත්නය සංඝරත්නය යන රත්නත්‍රය වනාහි අනන්ත ගුණයෙන් යුක්ත වේ. එබැවින් ඒ රත්නත්‍රයට සියල්ල ට ම වඩා ගරු කළ යුතුය. ගරු කළයුත්තන්ට ගරු නොකිරීම හෙවත් අගෞරව කිරීම පාපයකි. ඒ පාපය රත්නත්‍රය සම්බන්ධයෙන් සිදුවන කල ඉතා මහත් වේ. රත්නත්‍රය කෙරෙහි පිළිපැදිය යුතු ක්‍රමය නො දත්තා වූ බොහෝ දෙන මේ පාපය සිදුකර ගනිති. රත්නත්‍රය කෙරෙහි පැවතිය යුතු අන්දම මෙසේ දත යුතු.

ජීවමාන බුදුවරයන් වහන්සේ නැත්තා වූ මේ කාලයෙහි උන් වහන්සේලාට කළයුතු වූ ගෞරවය :– දගැබ් මහබෝ විහාර සමීපයට පැමිණි කල නොවැදීම, මළුවලට සෙරෙප්පු සපත්තු පයලා ඇතුල්වීම, කෙළ ගැසීම, නුසුදුසු කථා කරමින් හැසිරීම, ඒ පූජනීය වස්තූන් පෙනෙන තැන් වල මලමූත්‍ර කිරීම යනාදිය **බුදුනට අගෞරව කිරීම නම්**. මේවායින් වැළකී රජකු ඉදිරියෙහි

Non-commercial distribution

මෙන් යටහත් පැවතුම් ඇතිව සිද්ධස්ථානයන්හි හැසිරීම බුද්ධ ගෞරවය යි.

බණ කියන කල බණ ඇසිය හැකි පරිදි සමීපයෙහි සිට ද බණ නොඇසීම, බණ පිළිබඳව විහිළු බස් බිණීම, බණ කියන තැන අන්‍යයන් හා කථාවෙහි යෙදීම, උස් තැන්වල සිටීම, බණ අසන තැනට පැමිණ සිටින ස්ත්‍රී පුරුෂයන් ගැන හෝ බණින් පිටත් වෙනයම් කරුණක් ගැන හෝ සිතමින් නො සැලකිල්ලෙන් බණ ඇසීම ආදිය **ධර්මයට කරන්නාවූ අගෞරවය යි**. මේවායින් වැළකී එකත් පසෙක සංසුන්ව ධර්ම කථිකයා දෙසට පිටු නොපා පය දිගු නො කොට යහපත් පරිද්දෙන් හිඳ බණ ඇසීම ධර්මයට කරන්නා වූ ගෞරවය යි.

මේ කාලයේ බොහෝ දෙන පින්කම් වලට පැමිණෙන ස්ත්‍රී පුරුෂයන් දැකීමේ ආශාවෙන්ද, නැටුම් සෙල්ලම් වෙඩි ආදිය බලා ප්‍රීතිවීමේ ආශාවෙන්ද, පන්සල් වලට පැමිණ ධර්මශාලා අවට රැස් වී කථා කරමින් සිට ධර්මයට අගෞරව කොට බොහෝ පව් සිදු කර ගනිති. ඒවායින් වැළකීමට මතක තබා ගනිත්වා.!

භික්ෂු සාමණේරයන් වහන්සේලාට නො වැඳීම, දුටු විට හුනස්නෙන් නො නැගිටීම,මාර්ගයෙන් අයින් නොවීම, ගිහියන්ට මෙන් ගරු සරු නැතිව කථා කිරීම යනාදිය **සංඝ රත්නයට අගෞරව කිරීම ය**. එ දවස් පැවිදි වූ සත් හැවිරිදි සාමණේර නමකට වුවත් අගෞරව කිරීම පාපයකි.

ගුණවතුන්ට කය වචනය දෙකින් තබා සිතින් පමණවත් අගෞරව නො කළ යුතුය. එහි විපාක සමහර විට මෙලොවදීමත් ලැබෙන්නේය. බුදුන් කල ''**සෝරෙය්‍ය**'' නම් සිටු පුත්‍රයෙක් **මහා කාත්‍යායන** ස්ථවිරයන් වහන්සේගේ රූප ශ්‍රීය දැක '' මේ ශ්‍රමණයා මගේ භාර්‍ය්‍යාව හෝ මාගේ භාර්‍ය්‍යාවට මෙබඳු රූපයක් හෝ වී නම් යහපතැ යි'' සිතුවේය. ඒ පවින් ඔහු එවේලේම ස්ත්‍රියක් වූයේය. මෙසේ උත්තමයනට අගෞරව කිරීමෙන් මෙලොව මැ නපුරු විපාක ලබාදුන් වාර බොහෝය.

Non-commercial distribution

## ගරු කළ යුත්තන්ට අගරු කිරීමෙන් ලැබෙන දරුණු විපාක

එසේ ම වෛර නොකළ යුත්තන් කෙරෙහි වෛර කිරීමෙන් ද,හිංසා පීඩා නොකළ යුත්තන් කෙරෙහි හිංසා පිඩා කිරීමෙන්ද, අපහාස නොකළ යුත්තන්ට අස්ථානයේ අපහාස කිරීමෙන් ද, විපතට පත් නිහීනයන් ගැන නොයෙක් ප්‍රවෘත්ති ලෝක ඉතිහාසයෙහි එමට තිබේ. පෙර අප මහබෝසතාණන් වහන්සේ **ක්ෂාන්තිවාදී තාපස වැ** උපන් කල උන්වහන්සේ කෙරෙහි අස්ථානයෙහි කිපී උන්වහන්සේටඅපරාධ කළා වූ දුෂ්ට අපරාධ කළා **වූ දුෂ්ට කලාබු රජ** එවේලෙහි ම මහපොළව පැළී පැන නැගි මහත් ගිනි ජාලාවක් විසින් අවීචිමහා නරකයට ඇදගෙන යනු ලැබූ බව පැවසෙන පුවත මෙහිලා හොඳ නිදසුනකි. පෙර **කැලණි පුරෙහි** වුසූ කැලණිතිස් තෙරුන් වහන්සේට අස්ථානයෙහි කිපී අපරාධ කළා වූ කැලණිතිස්ස නම් රජකු හට ද ඒ නිසා නොයෙක් ව්‍යශනයන්ට භාජනවීමට සිදු විය යනු අප ඉතිහාසයෙහි සඳහන් පුවතකි.

අප බුදුපියාණන් වහන්සේ ලොවැ පහළ වූ තැන් පටන් නිගණ්ඨයනට ලැබුණු ලාභ සත්කාර ක්‍රමයෙන් පිරිහෙන්නට විය. එයින් කිපුණු **නිගණ්ඨයෝ** සුන්දරී පරිව්‍රාජිකාව ලවා අප බුදුන් වහන්සේටත් භික්ෂූන්ටත් මහත් නින්දවක් අපහාසයක් උපදවා ලූහ. එහෙත් එය ආපසු පෙරළී නිගණ්ඨයන් කරා ම පැමිණියේ ය.

අප මහබෝසත් **මහෞෂධ පඬිතුමාගේ** නැවණත් බවට මෙන් ම උතුම් ගුණවත් බවට ද ඊර්ෂ්‍යා කළ වෛදේහ රජතුමාගේ පණ්ඩිත සභාවෙහි වුසූ කාවින්ද, දේවින්ද, පුක්කුස, සේනකාදීන්ට ලැබුණු විපත් අපමණ ය. නින්ද අපහාස නිම් හිම් නැත. ඔවුන්ගේ ගුණමකුකම ද පසුවැ ලෝකයෙහි රැව් පළිරැව් දෙමින් පතළ විය. ඒ බව පවසන කිවිදෙක් ද මෙසේ කියයිඃ–

"නායක ගුණැති මහතුන් හට දොස් කියත
නෑ සැක එයින් තම ගති එළි වෙයි දියත
සේනක විසින් මහ ඔසු පඬිහට වියත
කී නෙක දොසින් තම ගති එළි විය දියත"

Non-commercial distribution

**මාගන්ධි, චිඤ්චමානවිකාව, දෙව්දත්, සුප්‍රබුද්ධ** ආදි ලොව පතළ ගුණමකුවනට සිදුවූ විපත් ද මෙහිලා අමතක නො වේ.

කරුණු මෙසේ හෙයින් හිංසා පීඩා වධ බන්ධන නින්ද අපහාස නො කටයුතු අහිංසකයන් කෙරෙහි උත්තමයන් කෙරෙහි ගුණවතුන් කෙරෙහි අස්ථානයෙහි කිපී නින්දා අපහාස හිංසා පීඩා කරන්නා වූ අඥානයනට, එසේ කොට එයින් ම ප්‍රීතිය අනුභව කිරීමෙන් කාලය ගත කිරීමට හැකි වෙතැයි මොහොතකට වත් නො සිතිය යුතුයි. ඒ එසේමැයි. ඒ බව බුදුපියාණන් වහන්සේ ද මෙසේ වදළහ. ධම්මපදයෙහි:–

**1 යො දණ්ඩෙන අදණ්ඩෙසු - අප්ප දුට්ඨෙසු දූසති.**
**දසන්න මඤ්ඤතරං ඨානං - ඛිප්පමෙව නිගච්ඡති.**

**2 වෙදනං ඵරුසං, ජානිං - සරීරස්සච භේදනං,**
**ගරුකංවාපි ආබාධං - චිත්තක්ඛෙපංච පාපුනෙ .**

**3 රාජතොවා උපස්සග්ගං - අබ්භක්ඛානංච දරුණං,**
**පරික්ඛයංච ඤාතීනං - භොගානංච පභංගුරං,**

**4 අථ වස්ස අගාරානි - අග්ගි ඩහති පාවකො,**
**කායස්සභෙද දූප්පඤ්ඤො - නිරයං සොපපජ්ජති.**

කිසිවකු හට හිංසා නොකරන සත්පුරුෂයන් කෙරෙහි අපරාධ කරන්නා මේ විපත් දසයෙන් එකකට හෝ වැඩි ගණනකට වහාම පැමිණෙයි. එනම්:– දරුණු වේදනාවකට හෝ ධනහානියනට, ශරීර භේදයට හෝ දරුණු රෝගයකට, උමතු බවකට හෝ රාජ භයකට, අස්ථාන දෝෂාරෝපණයකට හෝ ඥාති විනාශයකට, භෝග විනාශයකට හෝ ගිනි භයකට පැමිණෙන්නේය. එපමණක් ද? නැත. ඒ අපරාධකාරී පුද්ගලයා මරණින් මතු නිරයෙහි ද උපදී යනු භාවයයි.

කරුණු මෙසේ වුව ද ඇතැම්හු භික්ෂූන් වහන්සේලා හා අධික මිත්‍රත්වයට පැමිණ ගිහියන් සමග මෙන් අගරු පරිද්දෙන් හැසිරෙති. එය ඔවුහු තමන්ට කර ගන්නා වූ විපත්තියකි. භික්ෂූන් ආශ්‍රය කිරීම ද නුවණින් පරෙස්සමින් කළ යුත්තකි.ඒ බව මෙසේ පැවසිණ :–

Non-commercial distribution

**භුජංගමං පාවකං ච - ඛත්තියඤ්ච යසස්සිනං**
**භික්ඛුඤ්ච සීල සම්පන්නං - සම්මදේව සමාචරෙ**

සර්පයා කෙරෙහි ද, ගින්න කෙරෙහි ද, රාජ කුමාරයා කෙරෙහි ද, සිල්වත් භික්ෂුව කෙරෙහි ද මනාකොට ම හැසිරෙන්නේය- යනු මෙහි අදහසයි. නුසුදුසු පරිද්දෙන් සර්පයා ආශ්‍රය කළ තැනැත්තේ සර්පයාගෙන් නස්නේය. ගින්න නො මනා කොට පරිහරණය කළ තැනැත්තේ ගින්නෙන් නස්නේය. රාජ කුමාරයා කෙරෙහි නුසුදුසු පරිදි පිළිපැද්ද තැනැත්තේ ඔහුගෙන් නස්නේය. එමෙන්ම සිල්වත් භික්ෂූන් වහන්සේ කෙරෙහි නො මනා පරිදි හැසුරුණ තැනැත්තේ මෙලොව පිරිහීමට පැමිණ මරණින් මතු අපායට ද පැමිණෙන්නේය. මව් පියන් කෙරෙහි නුසුදුසු පරිද්දෙන් පිළිපැදීමද ද මෙසේ ම බරපතල කාරණයකි. ගරු කළ යුත්තන් හට ගරු නො කිරීම මෙසේ අවැඩට හේතුවන්නාක් මෙන් ම, ගරු කළ යුත්තන්ට ගරු කිරීම ද සියලු සම්පත්වලට හේතු වන්නේය. එ බැවින් එය උතුම් මංගලයකි.

**යො අප්පදුට්ඨස්ස නරස්ස දුස්සති**
**සුද්ධස්ස පොසස්ස අනංගණස්ස,**
**තමේව බාලං පච්චෙති පාපං**
**සුඛුමො රජො පටිවාතංව ඛිත්තො .**

යමෙක් තමාට හෝ අනුනට වරදක් නොමැතිව කල් යවන නිදොස් පුද්ගලයකුට අවැඩක් - නපුරක් කෙරේ නම්, ඒ පව උඩු සුළගට දැමූ සියුම් වූ දූවිලි සේ ඒ අනුවණයා කරා ම පෙරළා පැමිණෙන්නේය. යනු අදහසයි.

නිදෙස් හිමිනමකට හිංසා පීඩා කිරීම නිසා එවේලේ ම මහත් දුක් විඳ මරුමුවට පත් **'කෝක වැද්දගේ'** පුවත මෙහිලා හොඳ ම නිදසුනෙකි. එය ධම්මපදට්ඨ කථාවෙන් හෝ සද්ධර්ම රත්නාවලියෙන් බලා දතයුතු.

Non-commercial distribution

## 23 යටහත් පැවැත්ම හෙවත් නිවාත ගුණය

අං සිඳුණු ගවයකු මෙන් ද, දළ සිඳුන සර්පයකු මෙන් ද ගර්වයෙන් තොරව අන්‍යයන් හෙළා නො දැක සියල්ලන් හා සමගියෙන් වාසය කරන්නා වූ ස්වභාවය නිවාත ගුණයයි. එය මෙලොවැ පරලොවැ යහපතට හේතු වන බැවින් මංගලයකි.

නිවාත ගුණයෙහි නො පිහිටියා වූ පුද්ගලයන් තුළ තමා කොයි තරාතිරමේ කෙනකුව සිටියත් තමාට ඒකාන්තයෙන් ඇත්තා වූ හෝ සත්‍ය වූ හෝ අසත්‍ය වූ හෝ කුලවත්කම් උගත්කම් වත් පොහොසත්කම් තරුණකම් මහලුකම් සිල්වත්කම් ආදීන් කරණකොට තමාගේ සිතින් තමාගේ ආත්මය කොඩියක් සේ ඔසවා ගෙන අන්‍යයන් ලඝුකොට පහත්කොට සලකන්නා වූ ස්වභාවයක් ඇත්තේ ය. **උඩඟුකමය-අහංකාරකමය** යන නම් වලින් ඒ ස්වභාවය ම හඳුන්වනු ලැබේ.

මේ මානය අනුන්ගේ සිත් රිදවන ස්වභාවයක් වූයෙන් පව් ලැයිස්තුවට ඇතුළත් වේ. ප්‍රාණඝාතාදි ඇතැම් පව්, මතුවට අනිෂ්ට විපාක ඇතත්, කරන්නා වූ තැනැත්තාට ඒ වේලාවට ලැබෙන ප්‍රයෝජන තිබේ. මේ මානයෙන් ඒ වේලාවට වන ප්‍රයෝජනයක් ද නැත. අපගේ ශාස්තෘ වූ බුදු පියාණන් වහන්සේ මානය නැසුවා වූ ද මානය නැසීම පිණිස ශ්‍රාවකයනට ධර්මදේශනා කළා වූ ද උත්තමයෙකි. එබැවින් ඒ බුදුන් වහන්සේ සරණ යන්නා වූ බෞද්ධ වූ අපි අන්‍ය දෘෂ්ටිකයනට වඩා මානය තුනී කරගෙන සිටින පිරිසක් විය යුතුය. එසේ නො වුවහොත් එය බෞද්ධ නාමයට ද කැළලකි. එහෙත් සිංහල බෞද්ධයෝ ඇතැම් මිථ්‍යා දෘෂ්ටිකයනට ද නැති කුලභේදයකුත් සාදගෙන වැඩියෙන් මානය ඇත්තෝ වී සිටිති.

Non-commercial distribution

සිංහල බෞද්ධයන්ගෙන් **ඇතැමෙක්** තමන් උසස් කුලයේය යි කියමින් අන්‍යයන් හෙලා දකිති. පහත්ය යි සම්මත කුලවල උපනුන් හා සමගියෙන් ක්‍රියා කිරීමට නො කැමති වෙති. **ඇතැමෙක්** ඉංග්‍රීසි කථාකරමින් කලිසම් අඳිමින් එයින් තමා උසස් කොට ගෙන සිංහල කථා කරන සිංහල ක්‍රමයට අඳින නියම සිංහලයන් හෙලා දකිති. ඔවුන් හා එක්ව ක්‍රියාකිරීමට නො කැමැති වෙති. වර්තමාන කාලයේ මේ ඉංග්‍රීසි මානය කුල මානයට ද වඩා දරුණු අතට හැරී තිබේ. කුලමානය ඇත්තා හෙලාදක්නේ අන් කුලයක කෙනෙකි. එහෙත් ඉංග්‍රීසි මානයෙන් මත් වූ ඇතැම්හු සිංහල ක්‍රමයෙන් කල් යවන ස්වකීය මව්පියන් පවා හෙලා දකිති.

**ඇතැමෙක්** තමාගේ පොහොසත්කම නිසා දුප්පතුන් හෙලා දකිති. දුප්පත් වැඩිමහල්ලන්ට අවමන් කරති. දුප්පතුන් හා එක්ව වැඩ කිරීමට නො කැමති වෙති. තම තමන් පිළිබඳ පෞද්ගලික කටයුතු වලදී තබා ඇතමෙක් ආගමික කටයුතු වලදී ද මේ භේදයන් සලකති. පහත් යයි සම්මත කුලවල අය විසින් කළ පන්සල්වලට නො යති. පහත් කුල වල අය හා ඉඳගන්නට වේය යන බියෙන් දහම් ඇසීමට නො යති. ඇතැම් පොහොසතෙක් දුප්පත් අය හා සමව හිඳීමට නො කැමති බැවින් ධර්මශ්‍රවණාදිය පිණිස නො යති. ඇතැම් පොහාසතෙක් දුප්පත් පන්සල්වලට ද නො යති.

මෙසේ පවත්නා වූ මේ මානය මෙලොව පරලොව දෙකින් ම පිරිහීමට හේතුවක් බැවින් අවමංගලයකි. මානය කළ තැනැත්තේ මරණින් මතු බලුව හෝ උපදී. මිනිස් ලොව උපදනා කල ද අනුන් විසින් අවමන් කරනු ලබන්නාවූ අනුන්ට යටත්ව ම විසිය යුතු කුලවල ම උපදී. තවද මේ මානය, නොයෙක් පව් ඇතිවීමට ද ලැබිය හැකි පින් නොලැබ යෑමට ද සතුරන් බෝවීමට ද වස්තු විනාශයට ද ජීවිත විනාශයට ද නෑයන්ට මිතුරන්ට අප්‍රිය කෙනෙක් වීමට ද හේතු වේ.

මානය නිසා මව්පියන්ට ගුරුවරුන්ට සිල්වත් භික්ෂූන්ට වැඩිහිටියන්ට අනාදර කිරීම් ආදියෙන් දඃ ප්‍රාණඝාතාදි දුශ්චරිත කිරීමෙන් ද, බොහෝ පව් ඇති වේ. ගරු කිරීම් වැඳීම් පිදීම් ආදිය කිරීමෙන් ලැබිය හැකි කුශලයන් ලබා ගත නොහැකි වේ. අවමන් කරනු ලැබූ අන්‍යයෝ මානය ඇත්තහුට සතුරු වීමෙන් සතුරෝ

Non-commercial distribution

වෙති. මිතුරෝ හිඟවෙති. තමාට ප්‍රමාණ නො වෙතැයි සලකා තමා විසින් කළයුතු දේවල් අනුන් ලවා කරවන්නට යෑම, පමණ ඉක්මවා වියදම් කිරීම යනාදියෙන් ලැබූ ධනයෙන් පිරිහේ. උඩඟු තැනැත්තාට රක්ෂාව දීමට හෝ ඔහු යටතේ රක්ෂාවට බැඳීමට හෝ එක්ව රක්ෂාවක් කිරීමට හෝ අන්‍යයන් නො කැමති වන හෙයින් ධන ලාභයට ද බාධා වේ. සතුරන් ගෙන් උවදුරු පැමිණීම නො කළ යුතු දෑ කිරීම යනාදියෙන් ජීවිත හානිය ද වේ. මෙසේ මේ මානය නොයෙක් අනර්ථයන්ට හේතු වන බැවින් එය තුනී කර ගැනීමට අඩුකර ගැනීමට නැතිකර ගැනීමට සියල්ලන් විසින් ම වෑයම් කළ යුතුයි.

මේ මානය වනාහි **අවිද්‍යාව** යයි කියන ලද අනුවණ කමෙහි එල්බ අනුවණකම නිසා ම පවත්නා පාපයකි. එබැවින් අනුවණකම අඩු වැඩි පමණට මෙය ද අඩු වැඩි වේ හොඳටම නුවණ අඩු තැනැත්තේ ලෝකයේ ම තමාට වඩා වැඩි කෙනෙක් නැති සේ සිතයි. නුවණ දියුණු වන්නට දියුණු වන්නට ටිකින් ටික මානය ද තුනී වේ. **අර්හත් මාර්ගඥානය** ලැබීමෙන් සම්පූර්ණයෙන් ම මානය මතු නූපදින පරිදි දුරු වේ. එයින්ම සියලු දුක් ද කෙළවර වේ.

මෙසේ මානය අනුවණකම අනුව පවත්නා බැවින් මානය තුනී කළ හැක්කේ, නැති කළ හැක්කේ සත්‍යය සොයා ගැනීමෙනි. මතු දක්වන පරිද්දෙන් සලකා සත්‍යය සොයා ගතයුතු. තමා කොයි තත්ත්වයේ සිටියත් තමා **මහෝත්තමයකු සේ ද** තමා කරන සියල්ල ම කළයුතු වැඩ සේ ද ඒ ඒ පුද්ගලයාට වැටහීම ස්වභාව ධර්මයෙකි. එබැවින් තමාගේ තත්ත්වය සත්‍ය වශයෙන් සොයා ගැනීම අමාරු වැඩකි. එය සොයන්නට යන තැනැත්තා නිතර ම මුළාවන සුලුය. අනුන්ගේ සැටි අනුන් කරන දේවල් ගුණා ගුණ දැනීමෙහි බොහෝ දෙන සමර්ථ වෙති. එය පහසුවෙන් පෙනෙන හෙයිනි. එබැවින් උසස් පහත්කම්වල සත්‍යාසත්‍යතාවය සෙවීමෙහිදී ප්‍රථමයෙන් අසවලාට වඩා මම උසස් ද පහත් ද සමදැයි සොයන්නට නො ගොස් තමන් මධ්‍යස්ථව සිට තමන්ගෙන් අන්‍ය පුද්ගලයන්ගේ තත්ත්වය ගැන බැලිය යුතු යි. එසේ බැලීමෙහිදී ඔවුන් කොහි උපන්නාහුදැයි උප්පත්ති ස්ථානය බැලිය යුතුයි. ඔවුන්ගේ ශරීර සෑදී තිබෙන්නේ කුමන ද්‍රව්‍යවලින්දැයි බැලිය යුතුය. ඒ ශරීරයන් තුළ කුමක් තිබේ.

Non-commercial distribution

ද ඒවායින් කුමක් නික්මේ ද ශරීරවලට වන්නේ කුමක් ද යන බව බැලිය යුතුයි. සංසාරයේ පෙරළෙන ස්වභාවය බැලිය යුතුයි. රාජකුමාරයකු හා රොඩී කොල්ලකු ගැන පරීක්ෂා කරනු. මේ දෙදෙන කොහි උපන්නෝද? රජ කුමරා රජ මව් කුස උපන්නේය. රොඩී කොල්ලා රොඩී මව් කුස උපන්නේය. රොඩී මවගේ කුස පමණක් මල මුත්‍රාදි අපවිත්‍රයෙන් පිරුණක් වී රජ මවගේ කුසය සුගන්ධයෙන් පිරුණු තැනක් වී නම් රජ කුමරා ශුද්ධස්ථානයක උපන් කෙනෙකි. මව්වරු දෙදෙනාගේ ම කුසවල් වෙනසක් නැතිව අපවිත්‍රස්ථාන වී තිබෙද්දී උප්පත්තියෙන් රජ කුමරා රොඩී කොල්ලාට වඩා උතුම් යයි කියතොත් ඒ අසත්‍යයකි. දෙදෙනා ම උප්පත්තිස්ථාන වශයෙන් සමාන උප්පත්ති ඇත්තෝය.

දෙදෙනාගේ ම ශරීර අපවිත්‍ර වූ දුර්ගන්ධ වූ දුටුවිට පවා බිය එලවන **ඇට මස් සම් නහර** ආදි අපවිත්‍ර වස්තූන්ගෙන් සෑදී තිබෙයි. දෙදෙනාගේ ම ශරීර තුළ ඇත්තේ **මලමූත්‍රාදී අපවිත්‍ර** ද්‍රව්‍යයෝමය. දෙදෙනාගේ ම ශරීරවලින් නිකුත් වන්නේ **කබ, කඳුළු, සොටු, කෙළ, මල, මූත්‍ර. ඩහදිය** යන අපවිත්‍ර ද්‍රව්‍යයෝම ය. දෙදෙනාගේ ම ශරීර පණුවන්ට වාසස්ථානයෝය. දෙදෙනාගේ ම ශරීර ජරාවට පැමිණෙන්නාහුය. මරණින් මතු **ඉදිමී කුණුවී පරම දුර්ගන්ධ භාවයට** ගෙවල ගම්වල තබා ගත හැකි නොවන ස්වභාවයට පැමිණෙන්නාහුය. රොඩී කොල්ලා සැමදම රොඩියෙක්ම නොවේ. රජ කුමරා ද සැමදු ම රජකුමරෙක් නොවේ. පෙරලෙන්නා වූ සංසාරයෙහි රොඩී කොල්ලා රජ කුමරෙක් ද, රජ කුමරා රොඩී කොල්ලෙක් ද වේ. මෙසේ නුවණින් බලන කල්හි මේ දෙදෙනාගෙන් කෙනකුට වඩා කෙනෙක් උසස් ද නැතහොත් දෙදෙනා ම සම ද යන බව සත්‍යවශයෙන් සොයාගත හැකි වේ. මේ අතර සෙසු කුලවල සිටින්නන් ගැන ද මෙසේම බලා සත්‍ය සොයා ගැනීමෙන් මානය තුනී ව යන්නේය. මේ සත්‍යය සොයන්නා වූ ක්‍රමයයි.

**සැරියුත් හිමියන් සත් හැවිරිදි සාමණේර නමගෙන් ලත් අවවාදය .**

තව ද නිවාත ගුණයෙන් අගතැන් පත් අගසව් සැරියුත් හිමිපාණන් වහන්සේගේ චරිතය මෙහිලා ආදර්ශයට ගත යුතු වටිනා එකකි.

Non-commercial distribution

දිනක් උන්වහන්සේගේ සිවුරු කොනක් තමන් වහන්සේ නො දැන ම බිම ගෑවෙනු දුටු එක් සත්හැවිරිදි සාමණේර නමක්, "ස්වාමීනි! හිමිතුමන්ගේ සිවුර බිම ඇදේ" යයි සැල කෙළේ ය. එයැසූ සැරියුත් හිමියෝ සිවුරේ කොනක් බිම ගෑවෙනු දැක පසෙකට ගොස් සිවුර මනා කොට පොරවා අවුත් ඒ සත්හැවිරිදි කුඩා සාමණේරයන් වෙතට ගොස් ඇඳිලි බැඳ,

**''තදහු පබ්බජිතො සන්තො**
**ජාතියා සත්ත වස්සිකො**
**සො පි මං අනුසාසෙය්‍ය**
**සම්පටිච්ඡාමි මත්ථකෙ''**

යනුවෙන්- එදින පැවිදි වූ නමුදු, වයසින් සත්හැවිරිදි වුවද එවැනි යමෙක් මට අනුශාසනා කරන්නේ නම් එය ද මම හිස මුදුනෙහි දෙ අත් තබා වැඳ පිළිගනිමියි වදාළ සේක.

**සැරියුත් හිමියන් තමන් වහන්සේගේ නිහතමානී බව උපමා නවයකින් පැවසූ සැටි.**

එක් දිනක් අස්ථානයෙහි කුපිත වූ එක් **දුෂ්ට භික්ෂුවක්** බුදුන් වහන්සේ වෙත එළඹ සැරියුත් තෙරණුවන් තමාගේ කන්සය කැඩෙන තරමට තද පහරක් ගසා මගෙන් සමාවවත් නොගෙන ගියහයි නඩුවක් පැවැසීය.

**බුදුන් වහන්සේ** ද සැරියුත් හිමියන් එවැන්නක් නො කරන බව දැන දැනත් එයින් විශාල යහපතක් සිදුවන බැව් සලකා සැරියුත් හිමියන් කැඳවා නඩුව විභාග කළසේක . සැරියුත් හිමියන්ට විරුඩව නඩුවක් ගිය බැව් ඇසූ මෞද්ගල්‍යායන ආනන්දදි සැරියුත් හිමියන්ගේ නිර්දෝෂත්වය මැනවින් දන්නා මහරහතන් වහන්සේලා ද එය බැලීමට එහි රැස්වූහ.

ඒ මහ පිරිස් මැද වරදකරුවකු ලෙස පෙනී සිටි සැරියුත් හිමියෝ මෙසේ සිතූහ. සියල්ල දත් බුදු පියාණන් වහන්සේ මේ කාරණය හොඳින් දත් සේක. එසේ දැන දැනත් මෙය මා ගෙන්වා විචාළ සේක් :- මා ලවා මගේ ස්වභාවය මේ පිරිස්

Non-commercial distribution

මැද ප්‍රකාශ කරවීමේ අදහසිනි. එසේ සිතූ සැරියුත් හිමියෝ මෙසේ පැවසූහ.

ස්වාමීනි! භාග්‍යවතුන් වහන්ස! මේ අප වාසය කරන **පොළොවෙහි** ස්වභාවය, පොළවට යමක් දැමුවොත් දරා සිටීම ය, උසුලා සිටීම ය, -මහ පොළොව මත කෙතරම් හොඳ වටිනා රන් රිදී මුතු මැණික් ආදී දේ දැමුවත්, සඳුන් ආදි සුවඳ හමන දෑ දැමුවත් දුගඳ හමන ඉතා ම පිළිකුල් දේ දැමුවත් ඒ සියල්ල එකසේ දරා සිටීම උසුලා සිටීම පොළොවෙහි ස්වභාවය ය. මට මෙතරම් වටිනා හොඳ දේ ලැබේ යයි හොඳ දේ නිසා අමුතු අහන්කාර කමක්වත්, මට මෙපමණ නරක දේ ලැබේ යයි නරක දේ නිසා අමුතු අමනාපයක් වත් පොළවට නැත. මෙසේ පොළව හොඳ නරක දෙකට ම සමාන පැවැත්මකින් යුතුව පවත්නාත් මෙන් තමන් වහන්සේ ද ලාභ පිරිවර කීර්ති ප්‍රශංසා සැප යන මේ කරුණු නිසා අමුතු අහන්කාර කමකටවත්, අලාභ අයස නින්දා දුක් යන මේ කරුණු නිසා අමුතු අමනාපයකටවත් පත් නොවී - ඒ කිසිවකින් අමුතු වෙනසකට පත් නොවී ඒ සියල්ල සමානව ඉවසන බව ඒ සියල්ලෙහි සමාන පැවතුම් ඇති බව වදාළහ.

තව ද ස්වාමීනි! **ජලයට** පිරිසිදු දේ බහාලූවත් අපිරිසිදු දේ බහාලූවත් යට කී ලෙස වෙනසකට පත් නො වේද, එසේ පත්නොවී ජලයෙහි ස්වභාවය වූ ගසාගෙන යෑම දෙක්හිම සමව කෙරේ ද, හොඳ දේ ලදත් නරක දේ ලදත් එක සේ පහළට ගසාගෙන යාම කෙරේ ද,

ස්වාමීනි! **ගින්න** දැවීම ස්වභාව කොට ඇත්තකි. ඒ ගින්න යටකී පරිදි සුවඳ ද්‍රව්‍ය ලදත් **දුගඳ** ද්‍රව්‍ය ලදත් යටකී ලෙස වෙනසකට පත් නො වී ඒ සියල්ල දැවීම නමැති ස්වකීය කෘත්‍යය ම යම් සේ මැනවින් කෙරේ ද,

ස්වාමීනි! **සුළඟ** තමන ට අසු වූ සියල්ල ගෙන යෑම ස්වභාව කොට ඇත්තකි. ඒ සුළඟට යටකී පරිදි සඳුන් සීනිද්ද බෝලිද්ද දෑසමන් කපුරු තුවරලා ආදි සුවඳැති දේ ලදත් **දුගඳ** හමන බලුකුණු ගැරඬි කුණු ගෙරි කුණු ආදි මොනයම් පිළිකුල් කටයුතු දෙයක් ලදත් යටකී පරිදි වෙනසකට පත් නොවී ඒ සියලු දේවල් ගඳ

*Non-commercial distribution*

සුවඳ දසත ගෙන යෑම නමැති ස්වකීය කෘත්‍යය යම් සේ මැනවින් ඉටු කෙරේ ද,

ස්වාමීනි! **පා පිස්නා බිස්ස**, පිසීම ස්වභාවකොට ඇත්තකි. එහි රාජ කුමාරයකු පය පිස දැමුවත් සැඩොල් කොලුවකු පය පිස දැමුවත් එයින් යට කී ලෙස මට රාජ කුමාරයකු ගේ පයක් පිසීමට ලදැයි කියා අහංකාර වීමක් වත්, සැඩොල් කොලුවකු ගේ පය පිසදැමීමට සිදු වීයයි එයින් අමුතු අමනාපයක් නොසතුටක් වත් ඒ පා පිස්නා බිස්සට නැත. ඒ උසස් පහත් හැමදෙනාගේ ම පයවල් එකසේ ම හොඳින් පිළිගෙන පිසදැමීම නමැති සිය කටයුත්ත යම් සේ මැනවින් කෙරේ ද,

ස්වාමීනි! **සැඩොල් කොලුවකු** යමක් ලබා ගැන්ම පිණිස ගෙදරින් පිට වී නිවසට ගමින් ගමට සිඟමනේ යයි ද, එසේ යන ඔහු විශාල ධනයක් ඇති ගෙයකට ගිය ද දුප්පත් ගෙයකට ගිය ද ඔහු පහත් කුලයෙහි උපන් අනුන්ගෙන් යැපෙන නීච සැඩොලකු බව අමතක නොකරයි ද,ඔහු තමන් පහත් කෙනෙකුය යන ඒ හැඟීම ඇතිව ම කොතැනටත් එකසේ ම යයි ද, ඔහු තුළ අමුතු අහන්කාර කමක් කොතැනකදී වත් නො පවත්වයි ද,

ස්වාමීනි! ප්‍රකෘතියෙන් ම හික්මුණු **අං සිඳුණු ගවයකු** කොතැනක විසුවත් කොතැනකට ගියත් කෙනකු හිසින් කතින් ඇල්ලුවත් ඔහුට කිසි පීඩාවක් නො කොට හිංසාවක් නො කොට අහිංසක විලාශයෙන් හැසිරේ ද, හික්මුණු ගවයන් අතරට මෙන් ම නො හික්මුණු ගවයන් අතරට ගියත් ඒ හැමටම එක සේ ම හිස නමා අහිංසකයකු සේ හැසිරේ ද එමෙන් ම තමන් වහන්සේ ද ලාභ සත්කාර පිරිවර කීර්ති ප්‍රශංසා සැප යන මේ කරුණු නිසා අමුතු අහංකාර කමකට හෝ, අලාභ අයස නින්ද අප්‍රශංසා දුක් යන මේ කරුණු නිසා අමුතු අමනාපයකට හෝ නොපැමිණ ඒ සියල්ල සමාන පැවතුම් ඇතිව ඉවසන බව වදළහ.

තවද ස්වාමීනි! පවිත්‍රකම උසස්කොට සලකන යම් කිසිවකු හොඳින් නහා පිරිසිදු වී හැඳ පැළඳ සැරසී සිටින අවස්ථාවක යම් සේ **ගැරඬි කුණක්** ඔහුගේ හිසමත හෝ උරයෙහි හෝ වැටේ ද එසේ වුවහොත් ඒ තැනැත්තා ඒ ගැරඬිකුණ කෙතරම් පිළිකුල් කෙරේ ද

Non-commercial distribution

මම ද ගැරඬි කුණක් මෙන් පිළිකුල් වූ මගේ මේ කුණු ශරීරය කෙරෙහි කිසිම ඇල්මක් නො මැතිව වාසය කරමි. එසේ වූ මා තුළත් අහංකාරකමක් හෝ අමනාපයක් හෝ කෙසේ ඇති වන්නේ ද?

ස්වාමීනි! **මස් පුරවන ලද සිදුරු ඇති බටපොතු පෙට්ටියක්** යමකු හිසින් ඔසවාගෙන යේ නම් ඔහුගේ මුළු ශරීරය ම ඒ සිදුරු වලින් වෑස්සුණ මස් ඕජාව නිසා මෙසේ පිළිකුල් බවට පැමිණේ ද එමෙන්ම මම ද මහ සිදුරු නවයකින් හා අප්‍රමාණ කුඩා සිදුරු වලින් නිරන්තරයෙන්ම කබ කලාඳුරු කෙළ සෙම් සොටු මල මුත්‍ර ඩහදිය ගලන මේ කුණු ශරීරය පිළිකුල් කොට සිතමි. හැසිරෙමි. එවැනි මා තුළ අහංකාර කමක් හෝ අමනාපයක් හෝ ඇති විය හැකිද? ස්වාමීනි-යි උපමා නවයකින් මෙසේ තමන් වහන්සේ ගේ නිහතමානි බව පළ කළ සේක.

සැරියුත් හිමියන් ගේ මේ ව්‍යක්ත සුමධුර දේශනයට සවන් දුන් බොහෝ පෘථග්ජන භික්ෂූන් වහන්සේ ගේ නෙත්වලින් කඳුළු වැටුණේය. රහත් උතුමන්ට ධර්ම සංවේගය පහල විය. නඩු පැවරූ දුෂ්ට භික්ෂුව ද ඩහදියෙන් තෙත්ව තමන් කළේ විශාල වරදක් බැව් පිළිගෙන සැරියුත් හිමියන් වැඳ ක්ෂමාව ඉල්ලීය. සැරියුත් හිමියෝ ද ඔහුට ක්ෂමාව දුන්සේක.

(අංගුත්තර නවක නිපාත)

Non-commercial distribution

## 24. ලද දෙයින් සතුටු වීම

අත්‍රිච්ඡතා මහිච්ඡතාදි පාප ධර්‍මයන්ගෙන් තොරව තමාට ඇත්තා වූ දෙයින් සතුටුවීම ද, ලාභාලාභාදියෙහි සමව පැවතුම් වශයෙන් සතුටුවීම ද වූ ''**සන්තුට්ඨිතා**'' නම් වූ උත්තම ගුණය, ලද දෙයින් සතුටු වීම නමින් මෙහි දක්වන ලදී. එය සියලු සැපයට හේතුවන බැවින් උතුම් වූ මංගලයකි.

තමාට ඇත්තා වූ දෙය තමාට උරුම වූ දෙය නොමනා කොට සලකා අනුන් අයත් දේ ගැන ලෝභ කිරීම **අත්‍රිච්ඡතා** නම් වේ. එය ලැබූ දෙයින් පිරිහීමට ද නොලැබූ දෙය නො ලැබීමට ද නොයෙක් විපත්වලට ද මරණින් මතු අපායට යෑමට ද හේතුවකි. අත්‍රිච්ඡතාව ඇත්තා වූ තැනැත්තාට තමා අයත් දෙය කොපමණ හොඳ දෙයක් වුවත් එය හොඳ හැටියට නො වැටහෙයි. එක සැලියේ පිසූ බතෙහි වුවත් තමාට බෙදා තිබෙන කොටසට වඩා අනෙක් අයට බෙදා තිබෙන බත් කොටස යහපත් හැටියට පෙනේ. මේ හේතුවෙන් ඔහු ඇතැම් විට අනුන් අයත් දේ ලබන්නට ගොස් තමන්ට තිබූ දෙයත් නැති කර ගන්නේ ය.

**පෙර එක් කලෙක** බරණැස් රජ්ජුරුවන්ගේ පුත්‍රයෙක් පිය රජුහු විසින් නෙරපන ලදුව අසිතාභූ නම් වූ ස්වකීය භාර්‍යාව ද ගෙන වනයට වැද, මස් හා පල වැල බුදිමින් කුඩා අතු ගෙයක වාසය කෙළේය. ඔහු එක දවසක් වනයෙහි හැසිරෙන්නා වූ කිඳුරියක් දැක ඇය කෙරෙහි ලෝභ උපදවා පසු පස්සෙන් ගියේය. ඒ දුටු දේවිය මෙතෙම මා නො සලකා කිඳුරියක පසු පස්සේ යන්නේ යයි ඔහු ගැන කලකිරී, එක් තාපස කෙනකු කරා ගොස් කසිණ භාවනා උගෙන භාවනා කොට ධ්‍යාන උපදවා අවුත් තමන් විසූ ගේ දෙර හුන්නාය. එවේලෙහි කිඳුරිය නො ලැබූ රාජ කුමාරයා ද සිය නිවස බලා ආවේය. ඔහු එනු දුටු රාජ දේවිය

Non-commercial distribution

ධ්‍යාන බලයෙන් අහසට නැඟ ඔහුට පෙනි පෙනී අන් පෙදෙසකට ගියාය. ඉන්පසු ඒ කුමාරයාට භයානක වූ වනයෙහි එකලාව දුක සේ වාසය කරන්නට සිදුවිය. අලුත් භාර්‍යාවක් ගැන ආලය උපදවා ඒ පසු පස යෑමෙන් සිටි භාර්‍යාව ද අහිමි වී ඉමහත් දුකකට ඔහු පත්වූයේ මේ අත්‍රිච්ඡතාවය නම් වූ පාපධර්මය නිසාය. මෙසේ පරස්ත්‍රීන්ට ආශාකොට පරිහානියට ද විනාශයටද පත්වූවෝ අපමණයහ. ඇතැම් ස්ත්‍රීහුද මෙසේ පරපුරුෂයන්ට ආශාකොට දුකට පත් වන බව ප්‍රකට කරුණකි.

**තමන් අයත් දේ පහත් කොට**
**සැලකීමෙන් පිරිහුණු සිංහලයා**

සාමාන්‍යයෙන් මනුෂ්‍යයන්ට අයත් වූ ආහාර පාන ඇඳුම් පැළඳුම් සිරිත් විරිත් ආදිය සර්වසාධාරණ නොවේ. එයින් සමහරක් සමහර රටකට ද, සමහරක් සමහර ජාතියකටද, සමහරක් බාලයන්ට ද, සමහරක් තරුණයන්ට ද, සමහරක් මහලු අයට ද, සමහරක් ස්ත්‍රීන්ට ද,සමහරක් පුරුෂයන්ට ද අයිති වෙති. එයින් තමාට උරුම වූ දෙය පහත් කොට සලකා අනුන් අයත් දෙයට ආශා කිරීම යට කී අත්‍රිච්ඡතාව යයි දත යුතු. යමෙක් තමාට උරුම දේවල් පහත් කොට සලකා අනුන් අයත් දේවලට ආශාකොට ඒවා සොයන්නට ගියේ නම් එයින් ඔහු යටකී කුමාරයා මෙන් පිරිහීමට ම පැමිණෙන්නේ ය. එක් පුද්ගලයකු තබා රටක් ජාතියක් වුවත් ඒ තමාට උරුම නොවූ දේවලට ආශා කෙළේ නම් එයින් ඒ රට ජාතිය ද පිරිහීමට පැමිණෙන්නේ ය. අපේ රට අපේ සිංහල ජාතිය ම මෙයට නිදර්ශනයෙකි.

සිංහලයෝ ස්වකීය රටේ උපදින්නා වූ තමාට උරුම වූ ආහාර පානයන් පහත්කොට සලකා විදේශවලින් එන ආහාර පානයන්ට ආශා කළහ. ස්වකීය රටේ සාදගත හැකි වස්ත්‍ර පහත් කොට සලකා විදේශිකයන්ගේ වස්ත්‍ර උතුම් කොට සැලකූහ. විදේශික බඩු විදේශිකයන්ගේ සිරිත් විරිත් උතුම්කොට සලකා ඒවාට ආශා කළහ. විශේෂයෙන් සිංහලයෝ සුදු මිනිසුන්ගේ කෑමට බීමට පමණක් නොව ගති පැවතුම්වලට ද ආශා කළහ. එයින් සිංහලයාගේ

Non-commercial distribution

පරම්පරාවෙන් උරුමව ආවා වූ ගොවිතැනට හානි විය. හස්ත කර්මාන්තවලට හානි විය. සිරිත් විරිත් පිරිහී ගියේය. මේ හේතුවෙන් සිංහල ජාතිය ම නිරාහාර වූ නිර්වස්ත්‍ර වූ ජාතියක් බවට පත්විය.

විදේශවලින් ආහාර ද්‍රව්‍ය මෙරටට නාවොත් සිංහලයන්ට සිදුවන්නේ නිරාහාරව මිය යන්නටය. වස්ත්‍ර නාවොත් සිංහලයන්ට සිදුවන්නේ නිර්වස්ත්‍රව සිටීමටය. මෙසේ තමාට උරුම වූ දෙය පහත්කොට සලකා අනුන් අයත් දේවලට ආශා කිරීම නිසා මෙලොවින් පමණක් නොව පරලොවින් ද පිරිහෙන්නේ ය. අද සිංහලයන් තුළ පැරණි සිංහලයන් උසස් කොට සැලකූ වැඩිහිටියන් පිදීම, කුලදෙටුවන් පිදීම, දෙමාපියන් පිදීම, ගුරුවරුනට සැලකීම, ගුණවතුනට සැලකීම, සිල්වතුනට සැලකීම, සුවච බව, විනීතකම, සත්‍යවාදීකම, අවිහිංසාව, දයාව, කරුණාව, මෛත්‍රිය, ඉවසීම ආදි උසස් ගුණධර්ම බොහොමයක් දක්නට නැත. එහෙයින් ම අද සිංහලයා මෙලොව අතින් පමණක් නොව පරලොවින් ද පිරිහී සිටින ජාතියක් බව කිව යුතුය. එයට ප්‍රධාන හේතුව ද අපේ උසස් ගති පැවතුම් පහත් ලෙසටත් විදේශිකයන්ගේ නොමනා ගති පැවතුම් උසස් හැටියටත් සැලකීම බව පැවසිය යුතු ය.

**මහිච්ඡතාව ද පිරිහීමට හේතුවකි.**

ලෝකයෙහි ඇතමකුට කොපමණ වස්තුව තිබුණත්, තව තව ලදත් ඇති නොවන්නා වූ ස්වභාවයක් තිබේ. එයට මහිච්ඡතාව යයි කියනු ලැබේ. මහිච්ඡතා නමැති අධික ලෝභයෙන් යුක්ත වූ තැනැත්තාට කොපමණ වස්තුව ලදත් මෙලොව සැපයක් නැත. ඔහු ලද ලද සියල්ල සඟවමින් තව තවත් වස්තුවම සොයන්නේය. තමා ද ඉන් ප්‍රයෝජනයක් නො ලබන්නේය. පරලොව සැප පිණිස පිනකුදු නො කරන්නේය. නිරතුරුවම නො ලැබූ සම්පත් ලැබීමේ ආශාවෙන් ම තිබෙන දේ මඳ බව ගැන ශෝකයෙන් ම තැවෙන්නේය. මෙසේ මෙලොව ද තැවී මරණින් මතු ද අපායට පැමිණෙන්නේය. එබැවින් ඔහු ලද ධනය යක්ෂාධිගෘහිත පොකුණක් මෙන් කිසිවකු හටත් වැඩක් නො වන්නේය. එහෙයින් වදළහ, සංයුක්තනිකායෙහි :–

Non-commercial distribution

**අමනුස්සට්ඨානෙ උදකංච සීතං**
**තදපෙය්‍යමානං පරිසොසමෙති**
**එවං ධනං කාපුරිසො ලභිත්වා**
**නෙවත්තනා භුඤ්ජති නො දදාති.**

අමනුෂ්‍යයන්ගේ වාසස්ථානයක වූ සිතල වූ ද , ජලය මනුෂ්‍යයින් විසින් බීමට හෝ නෑමට ගනු නොලැබ වියළී යන්නාක් මෙන් නින්දිත මනුෂ්‍යයාහට ලැබුණු ධනය ද ප්‍රයෝජනයට නොගනියි. අන්‍යයන්ට ද නො දෙයි.

**ධීරා ච විඤ්ඤූ අධිගම්ම භොගෙ**
**යො භුඤ්ජති කිච්ච කරොච හොති**
**සො ඤාති සංඝං නිසභො භරිත්වා**
**අනින්දිතෝ සග්ගමුපෙති ඨානං.**

නුවණැත්තා ලබන ධනය තමාත් ප්‍රයෝජනයට ගෙන වැඩි වැඩිය ලබනු පිණිස කර්මාන්තයන්හි ද යොදන්නේය. පරලොවට වැඩ පිණිස කළමනා දන් පින් පිණිස මැනවින් යොදන්නේය. ස්වකීය ඥාති සමූහයාගේ ප්‍රයෝජනයට ද වියදම් කරන්නේය. එසේ ධනයෙන් ගතමනා ප්‍රයෝජන ගෙන ලෙව්හි නුවණැත්තන්ගේ ප්‍රශංසාවට ද භාජන වී මරණින් මතු සුගතියට ද පැමිණෙන්නේය.

**ධනය රැස්කර තබා නො යා යුතු බැව්.**

මේ දේශනාවන් අනුව නුවණින් විමසා බැලුවහොත් ලෝකයෙහි මිනිසුන්ට ධනය උවමනා කරන්නේ තමන්ගේ කෑම් බීම් ආදි කටයුතුවලටත්, අනුන් පිළිබඳව ඉටුකළ යුතු වූ යුතුකම් රැස ඉටු කිරීමටත් බව හොඳින් වැටහිය යුතුය. එය එසේ නම් විශාල ධනයක් රැස්කරගෙන ඒ ධනය තමන්ගේ සැප පහසුව පිණිසත්, තම දරුවන්ගේ දියුණුව පිණිසත්, තම නෑයන්ගේ මිත්‍රයන්ගේ ප්‍රයෝජනය පිණිසත්, තමා උපන් ගමේ පළාතේ කටයුතු වූ ආගමික වූත් ජාතික වූත් කුඩු මහත් කටයුතු පිණිසත් නො යොදා යක්ෂාධිගෘහිත පොකුණක් මෙන් ධනය රැක රැක එයට ආශා කරමින් සිට යමෙක් මිය යතොත් ඔහුගේ ජීවිතයෙහි වටිනාකමක් නැති බැව් කිව යුතුය.

Non-commercial distribution

එසේ ''තමනුත් ප්‍රයෝජනයක් නො ගෙන අනුන්ගේ යහපත පිණිස ද යමක් නො කොට ධනය රැස්කර තබා හිස් අතින් යන අනුවණයන්ගේ ධනය සමග තමන්ගේ අභාවයෙන් පසු සෙසු අය ක්‍රීඩා කරති'' යි පැරණි පඬුවන් විසින් පැවසූයේ එහෙයිනි :–

**යද්දදති යදශ්නාති - තදෙව ධනිනො ධනම්.**
**අන්‍යෙ මෘතස්‍ය ක්‍රීඩන්ති. - දාරෛරපි ධනෛරපි.**

**වස්තුව සපයා තෘප්තියකට**
**පත්විය නො හැකි බව.**

යමෙක් ධනය නැත්තා වූ ද යට දැක් වූ අත්‍රිච්ඡතා මහිච්ඡතාවන්ගෙන් තොරව ලද පමණින් සතුටු වී සන්තුෂ්ටි ගුණයෙහි පිහිටා සිටින්නේ නම් ඔහු සැප ඇත්තෙකි. ඔහු සියලු සම්පත් ඇත්තෙකැයි කිව යුතුය. ලෝකයෙහි ධනය ඇතිවීමෙන් තෘප්තියට පත්වෙන එක ම ධනවතකුවත් සොයාගැන්ම දුෂ්කර වූ කරුණක් හෙයින් ධනය උපයා සපයා එයින් ධනවතකු වී සැප ලැබීම දුෂ්කර දෙයක් වේ. එහෙයින් වදාළහ. :–

**අග්ගික්ඛන්ධො සමුද්දෙ ච**
**මහිච්ඡො චා පි පුග්ගලො.**
**සකටෙන පච්චයං දෙන්ති.**
**තයොපෙතෙ අතප්පයා.**

මහ ගිනි කඳක් මහ සයුරත් මහ ලෝභියාත් යන වස්තු තුන ම තෘප්තියට පත්කළ නො හැකි ස්වභාවයෙන් එක හා සමානය. මෙකී වස්තුත්‍රයට ගැල්වලින් ප්‍රත්‍යය (වුවමනා දේ) ) සැපයුවත් සෑහීමක් නම් නැත.

මනුෂ්‍යයකුට ස්වභාවයෙන් වුවමනා කරන්නේ වැසි සුළං ආදියෙන් වන පීඩා නැතිව වාසයට පොහෝනා ගෙයක්ද, ලජ්ජා උපදවන තැන් වසා ගැන්මට හා මැසි මදුරු ආදීන්ගෙන් වන පීඩා වළකා ගැන්මට පොහෝනා ඇඳුමක්ද, ජීවිතය පවත්වා ගැන්මට ප්‍රමාණ වූ ආහාරයක් ද පමණකි. අධික ලෝභය ඇති තැනැත්තා මෙපමණකින් නොනවතී. ඔහු විශාල වූ ද විසිතුරු වූ ද ගෙවලට

Non-commercial distribution

ආශා කරයි. විසිතුරු වූ ද බොහෝ වූ ද ඇඳුම් වලට ආශා කරයි. ප්‍රමාණයක් නැති කෑම් බීම් යාන වාහනවලට ද නොයෙක් විසිතුරු බඩුවලටද ආශා කරයි. අන්‍යයනට ඇත්තා වූ හොඳ හොඳ මන්දිර හොඳහොඳ ඇඳුම් පැළඳුම් බලා එවැනි දේ තමන්ට නැතිකම නිසා හට ගන්නා වූ තැවිල්ල ඔහුගේ සිත්හි ඇවිළෙන්නා වූ එක ගිනිකඳකි. ඒවා ලබා ගැන්මෙහි ආශාව එක ගිනි කඳකි. බලාපොරොත්තු දෙය ලැබෙන තෙක් ම මේ ගිනි කඳු දෙක ඔහු තුළ ඇවිළෙයි. ඒ ගිනි නිවී යන්නේ බලාපොරොත්තු වූ දෙය ලැබුණු කලකය.

සන්තුට්ඨිතා ගුණයෙහි පිහිටා තමාට තිබෙන පමණින් යැපිය හැකි පමණින් තෘප්තියට පැමිණ සිටින තැනැත්තා ගේ සිත් තුළ, තේ වතු රබර් වතු පොල් වතු කුඹුරු මොටෝරිය ආදි දේ ගැන ඇවිලෙන්නා වූ සිය ගණන් ගිනිකඳු නැත්තේ ය. සත්ත්වයන් තුළ දැල්වෙන්නා වූ මේ ආශාව නමැති ගින්න ආශා කරන ලද දේවල් සපයා සම්පූර්ණ කොට ද කිසි කලෙක නිවාලිය නොහේ. ආශා කළ එක් දෙයක් ලැබූ කල තව තුන හතරක් අලුත් ආශාවල් ඇතිවන බැවිනි. මහ ගිනි කඳත් මහ සයුරත් මහ ලෝභියාත් සමානය යි වදළේ එහෙයිනි. මහ ගිනි කඳකට කොතෙක් දර ආදි ඇවිළෙන ද්‍රව්‍ය දැමුවත්, කරත්තවලින් ගෙනත් ගෙනත් ළං කළත් ඒ සියල්ල ම දවා හළු කිරීම ගින්නේ ස්වභාවය හෙයින් ඇතිවීමක් නැත. මහසයුරට, කරත්තවලින් තබා ලොරිවලින් දුම්රියවලින් ජලය ගෙනත් දැමුවත් ඇතිවීමක් වැඩිවීමක් නැත. ඇළ දොළ, ගංගා-වන්ගෙන් කෙතරම් විශාල ජලස්කන්ධයක් දිනපතා ලදත් ඇතිවීමක් වැඩිවීමක් නැත. මහාලෝභී පුද්ගලයාට ද කොතෙක් ලදත් ඇතිවීමක් තෘප්තිමත් වීමක් නම් නැත. එබැවින් ඇතිවන ආශාවන් සම්පූර්ණ කිරීමෙන් නම් මේ මිහිපිට කිසිවකු හටත් නිමාවක් ලද නොහැකිය. සැනසිල්ලක් ප්‍රීතියක් නිදහසක් ලැබිය නො හැකිය.

**ලද දෙයින් සතුටුවීම**
**සියලු සම්පත් ලැබීමකි.**

කරුණු මෙසේ හෙයින් ලද පමණින් සතුටුවන ස්වභාවය වූ අලෝභය ඇතිකර ගැන්මෙන් ම තමන් තුළ ඇති වන ආශාව නමැති

Non-commercial distribution

ගින්න නිවිය යුතුය. ඒ ගිනි ගොඩවල් නිවීමට ඇති එකම බලය ද ඒමය. සන්තුට්ඨිතා ගුණයෙහි පිහිටා ඒ ආශාවල් නැතිකර ගත් තැනැත්තා සියලු ම සම්පත් ඇති කෙනකු හා සමානය. එහෙයින් කියනලදී. භේසජ්ජ මංජුසාවෙහි :-

**අප්පෙපි තුට්ඨමානසො,**
**සන්ති සබ්බාපි සම්පදා.**
**පාදෙ උපාහනච්ඡන්නෙ,**
**නනු චම්මත්ථ තාවභූ**

ස්වල්පයෙහි දු සතුටු සිත් ඇත්තාහට සියලු සම්පත් ඇත්තාහ. ස්වකීය පාදය පාවහනින් වසා ගත් කල්හි (ස්වකීය පයෙහි වහන්ලා ගත් කල්හි ) මුළු පොළොව ම සම් අතුරන ලද්දක් වැනි නොවේද?

සම්වලින් මුළු පොළොව ම වැස්ම නොකළ හැකි වැඩකි. පය ආරක්ෂා කරගැන්මට සෙරෙප්පු දෙකක් හෝ සපත්තු දෙකක් හෝ පයලා ගත් කල්හි මුළු පොළොව ම ඔහුට සමින් වැසුවාක් මෙනි. ගිය ගිය හැම තැනක ම සමපිට ම සිටින බැවිනි. ආශාව උපදින වස්තූන් සපයා කිසිකලෙක කිසිවකුට සම්පූර්ණ කළ නො හැකි ම ය. තිබෙන සැටියට ලද සැටියට සතුටු වූ කල සියල්ල ම ලැබුවා වැනි වේ. පැරණි පඬුවන් විසින් පැවසූ මතු එන කියමන ද මෙහිලා සිහිපත් කළ යුතු ය..

**දරිද්‍රස්‍ය පරාමූර්තිර් - යාඥාතද්‍ර විනාල්පතා**
**ජරද්ගව ධනඃශම්භුස් - තථාපි පරමේශ්වරඃ**

වස්තුව ස්වල්පයක් තිබීම දුප්පත්කමේ මූර්තියක් නොවේ. දිළිඳුකම හැඟවීමේ ලක්ෂණය නම් අනුන්ගෙන් ඉල්ලීමය. එයට හොඳ නිදර්ශනයක් නම් ඊශ්වර දිව්‍යරාජයා මහලු ගොනකු ධනයකොට ඇත්තෙකි. එහෙත් හෙතෙම දෙව් මිනිසුන්ගෙන් පවා පුද සත්කාර ලබන උතුම් අධිපතියෙකි.

**ලද දෙයින් සතුටු නො වීම**
**විපත්වලට හේතුවකි.**

මෙසේ වර්ණනා කරන ලද, ලද දෙයින් සතුටු වීම නමැති උසස් ගුණධර්මය නැත්තා ව තැනැත්තාට ඇති වන්නා වූ අධික

Non-commercial distribution

ලෝභය ඔහුට නොයෙක් විපත් පිණිස ද බොහෝ පාප කර්මයන් ඇති වීම පිණිසද තමාට තිබෙන ධනය ද ලැබෙන ධනය ද නැති වී විනාශ වී යෑම පිණිසද හේතුවන්නේය. සන්තුට්ඨිතාවෙහි පිහිටි කල්හි අත්‍රිච්ඡතා මහිච්ඡතාවන් නිසා වන අනර්ථ නැති බැවින් ද සැප ඇති බැවින්ද, අතීතානාගතයන් පිළිබඳ තැවීමක් නැති බැවින් ද පින් කිරීමට අවස්ථාව ලැබෙන බැවින් ද එය උතුම් වූ මංගල ධර්මයෙකැයි වදරන ලදී.

මහිච්ඡතාව නමැති පාපධර්මය නිසා ලද සම්පත්තියෙන් පවා පිරිහෙන බවට හොඳ නිදර්ශනයක් ජාතක පොතෙහි **ස්වර්ණහංස ජාතකයෙහි** සඳහන් වේ.

එක් කලෙක බමුණු කුලයක උපන් අප බෝසත් තුමා දූවරුන් තිදෙනෙක් ද ලබා ඔවුන්ගේ විවාහ කටයුතු නිමවීමට මත්තෙන් මිය ගොස් ස්වර්ණ හංස රාජයෙක්ව උපන්නේය. හංසයන් ස්වභාවයෙන් ම ශ්වේත වර්ණයෙන් යුක්තය. ස්වර්ණ වර්ණයෙන් යුක්ත වූ කල ස්වර්ණහංසයයි භාවිතා කරනු ලැබේ. ස්වර්ණහංසව උපන් බෝධිසත්ත්වයෝ ජාතිස්මරණ ඥානයෙන් පෙර විසූ තම ආත්මය හා සිය නිවස ද බැලූ කල තම දූවරුන් කිසි පිහිටක් නොමැතිව බැලමෙහෙ කොට දවසරින බව දුටහ. දිනක් ඔවුන්ට උපකාර පිණිස ස්වර්ණවර්ණ වූ තම පියාපත් හෙලා එන්ට අදහස් කළ හංසරාජයා එහි ගොස් රන්වන් පත් හෙලා ආවේය. ඔවුහු ඒවා ගෙන යම් යම් විසිතුරු භාණ්ඩ තනා ඒවා විකිණීමෙන් මුදල් උපයා ගත්හ. මෙසේ කලක් ගත විය.

දූවරුන්ගේ මව බලවත් ලෝභී තැනැත්තියකි. එහෙයින් ඕ මෙසේ සිතුවාය. හංසරාජයා යම්හෙයකින් මෙහි නාවොත් අපට පියාපත් නො ලැබී යන්නේය. එහෙයින් ඔහු ආ කල අල්ලා ගෙන ඔහුගේ සියලු ම පියාපත් ගලවා ගනිමුයි කියාය. මෙසේ සිතූ ඕ තොමෝ දිනක් දූවරුන් සමග කථිකා කොට හංසරාජයා පැමිණි කල ඔහු අල්ලා සියලුම පියාපත් සිඳ ගත්තාය. හංසරාජයා ද මහත් වේදනාවෙන් ඉවසා සිට යාගත නොහී එහි ම ටික දිනක් විසුවේය. නැවත පියාපත් වැඩුණු කල සිය වනයට ගොස් එහි විසූමුත් පියාපත් දීම පිණිස ඉන්පසු තම නිවසට නො පැමිණියේ ය.

*Non-commercial distribution*

ඒ තැනැත්තියගේ අධික ලෝභය නිසා ඔවුනට ලැබෙමින් තිබුණු ඒ ස්වර්ණවර්ණ පියාපත් පවා නො ලැබ ඉන් පසු පළමු පරිදි ම බැලමෙහෙකොට දුකසේ කල් යවන්නට ඔවුනට සිදුවූවේය. ඒ බව මෙසේ ද වදළහ.

> **යං ලද්ධං තෙන තුට්ඨබ්බං**
> **අතිලෝභො හි පාපකො.**
> **හංසරාජං ගහෙත්වාන.**
> **සුවණ්ණා පරිහායථාති.**

ලද දෙයින් සතුටු විය යුතුය. අධික ලෝභය ලාමකය. හංසරාජයා අල්ලාගෙන ඔහුට හිංසා කිරීමෙන් ලබමින් තිබුණු රන්වන් පියාපත් ටික ද නො ලැබ පිරිහුණේය.

## ලද දෙයින් සතුටුවීම චිත්තාරෝග්‍යයට ද ප්‍රබල හේතුවකි.

ලෝකය නම් නානා ධාතුන්ගේ සමූහයකි. නානාධාතු ලෝකයෙහි ප්‍රධානතම ධාතුව නම් විඥාන ධාතුව හෙවත් චිත්තයයි. එය මහානුභාව සම්පන්න වූ ඍධිමත් ධාතුවයි. එබැවින් අන්‍ය සකල නාමරූප ධාතුහු ම එක ම විඥාන ධාතුව විසින් යටත් කරනු ලැබෙත්. ඒ විඥාන ධාතුව වනාහි ප්‍රකෘති විඥානය වර්ධිත විඥානයයි දෙවැදෑරුම් වේ. ඉන් ප්‍රකෘති විඥානධාතුවේ පෘථිවි පර්වතාදි විශාල වස්තූන් ආණ්ඩු කළහැකි මහත් වූ ඍද්ධියක් නැත්තේය. එහෙත් සකල සත්ත්වයන්ට ම සාධාරණව පවත්නා වූ ප්‍රකෘති විඥාන ධාතුවෙහි ද ස්වල්ප වූ ඍද්ධියක් තිබේ.

සතර මහාභූත ධාතුන්ගේ සමූහයන් වූ සත්ත්ව ශරීරයෝ දරකඩවල් බඳු වූ අචේතනික වස්තූහුය. ඒවා පොළොවෙහි ඇද නොවැටී නැඟී සිටින්නේත් ඉදිරියට පස්සට සරසට ගමන් කරන්නේත් ඒ ඒ ශරීරාවයවයන්ගේ හැකිළීම දිගු කිරීම සිදුවන්නේත් විඥාන ධාතුවේ ඍද්ධි බලයෙනි. විඥාන ධාතුවේ ඍද්ධියෙන් අන්‍ය වූ ඒ ඒ ක්‍රියා සිදුකිරීමෙහි බලයක් රූපකයෙහි නැත්තේය. ධාතුන්ගේ තත්ත්වය නො දන්නා වූ පුද්ගලයෝ ස්ථාන ගමනාදි කායික ක්‍රියා

Non-commercial distribution

විඥාන ධාතුවේ ඍද්ධි බලයෙන් සිදුවන බව නො දැන, මම සිටිමිය, මම යමිය යනාදීන් වරදවා තේරුම් ගනිති.

මෙසේ නො වඩන ලද ප්‍රකෘති විඥාන ධාතුවට ඇත්තේ තමා හා සම්බන්ධව පවත්නා වූ ශරීරය පමණක් සෙලවීමට සමර්ථ වූ අල්ප ඍද්ධි බලයක් නමුත්, කාමච්ඡන්දදි නීවරණ ධර්මයන් කෙරෙන් මුදවා නැවත නැවත එකම අරමුණක තැබීමෙන් දියුණු කරන ලද විඥාන ධාතුවට චින්තාවිෂයාතික්‍රාන්ත ආනුභාවයක් ඍද්ධි බලයක් ඇත්තේය. ඒ මෙසේ මැයි. ධ්‍යානලාභී යෝගාවචරයාගේ අභිඥාචිත්තයේ ආනුභාවය, බලය විශ්මය ජනකය. ඔහුට මහ පොළොව මෙරගල සක්වළ ගල මහ සමුදුර හිර සඳ නැකැත් තරු ආදි විශාල වස්තූහු පවා කෙළි බඩු වෙති.

මෙකී විශාල වස්තුන් සෙලවීමට පෙරළීමට ඔහුගේ අභිඥා චිත්තය සමර්ථය. අවීචියෙහි පටන් භවාග්‍රය දක්වා පැතිර පවත්නා වූ එක් තිස් තලයකින් යුක්ත වූ මේ විශාල ලෝක ධාතුව පවා ඔහුට එක මන්දිරයකි. එක කෙළිමඬලකි. ඔහු හකුළා තුබූ අත දිගු කරන්නා සේ දිගුකර තිබුණු අත හකුළවන්නා සේ මේ මිනිස් ලොව සිට දෙව්ලොවට ද බඹ ලොවට ද යන්නේ ය . ලෝකයේ කොතැනක පවත්නා ශබ්දයක් වුවත් ඔහු එක තැනක සිට අසන්නේය. පර්වතයකින් වසා තිබෙන දෙයක් වුව ද අල්ල පිට තිබෙන දෙයක් සේ දක්නේය. අනුන්ගේ සිත් දක්නේය. පෙර විසූ කඳ පිළිවෙල දක්නේ ය. මේ අභිඥා චිත්තයෙහි ඇති ඍද්ධි බලයයි.

මෙසේ විඥාන ධාතුව මහානුභාව සම්පන්න බැවින් ඊට ලෝකයෙහි ප්‍රධාන ම ධාතුව යයි කියනු ලැබේ. ප්‍රධාන ධාතුව වූ මෙම විඤ්ඤාණය නිරෝග කොට ආනුභාවය වර්ධනය වන පරිදි පිළිවෙල කර ගත් තැනැත්තාට ඉන් කළ නො හැකි දෙයක් නැත. එබැවින් විඥාන ධාතුව සර්වාර්ත්ථ සාධනයෙහි යොදා ගත හැකි ආනුභාව සම්පන්න ධාතුවක් බව දත යුතු.

**චිත්තයට වැළඳෙන රෝග.**

රූප කයෙහි හටගෙන එය දුර්වල කරන්නා වූ වමන විරේචන උණ ආදි කොතෙකුත් රෝගයන් ඇතුවාක් මෙන් මේ විඥාන

Non-commercial distribution

ධාතුවෙහි හටගෙන එය දුබල කරන්නා වූ එහි ඇති ආනුභාවය බලය නැති කරන්නා වූ රෝගයෝ ද වෙති. චිත්තයෙහි ඒ රෝගයන් කෙරෙන් මිදී නොගිලන් ව පැවැත්මට **චිත්තාරෝග්‍යය** යයි කියනු ලැබේ.

චිත්තයට රෝගයෝ නම් එක් දහස් පන්සීයක් වූ ක්ලේශයෝ ය. කෙලෙස් රෝගයෙන් පීඩා කරන ලද චිත්තය කිලිටි වූ අල්පානුභාව ධාතුවක් වේ. එයින් මිදුණු කල්හි චිත්තය දීප්තිමත් වූ ආනුභාව සම්පන්න වූ සෘද්ධිමත් ධාතුවකි. පෘථග්ජන චිත්ත සන්තානයෙහි එක් දහස් පන්සියයක් වූ කෙලෙස් රෝගයෝ නිදන්ගත ව නිරන්තරයෙන් ම පවතිත්. එහෙත් ඒවා පරියුට්ඨානයට නොපැමිණ තිබෙන තෙක් චිත්තයාගේ සෘද්ධි බලය නො නසති. ශරීරයෙහි නිධාන ගත ව පවත්නා වූ යම් යම් රෝග රෝගීන්ගේ දියුණුවට බාධක නො වන්නාක් මෙනි.

නිදන්ගත රෝගය නැගී ආ කල්හි ම රෝගියා දුර්වල කර මහත් දුඃඛයට පමුණුවන්නාක් මෙන් නිධානගත ව අනුශය වශයෙන් පවත්නා වූ ක්ලේශයෝ නැගී සිටි කල්හි චිත්තසන්තානය දුර්වල කරති. සකල ක්ලේශයන් කෙරෙන් මිදී සිත සර්වකාරයෙන් නිරෝගී බවට පැමිණෙන්නේ අර්හත් මාර්ග ඥානය පහළ වීමෙනි. නිධාන ගත කෙලෙස් රෝගයන්ගෙන් - අමුක්ත වූ - නො මිදුණු නමුත්, පරියුට්ඨාන වශයෙන් ක්ලේශයන් ගෙන් මුක්ත වූ - මිදුණු පෘථග්ජන චිත්තය ද එක් ක්‍රමයකින් නිරෝගී චිත්තයකි. එයද එක්තරා ප්‍රමාණයක විශේෂ සෘද්ධි බලයකින් යුක්ත බැවිනි.

**සිතට වැළඳෙන දරුණු ලෙඩ.**

ක්ලේශයන් අතුරෙනුදු චිත්තසෘඩිය අතිශයින් නසන්නා වූ ක්ලේශරෝග කොටසක් වෙයි. ඒවා නම් යම් යම් දේ ගැන පවත්නා වූ **අධික ප්‍රාර්ථනාව, අධික කෝපය, ශෝකය, පසුතැවිල්ල, අලස බව** යනාදියයි. යමකුගේ සිත මෙකී රෝගයන්ගෙන් පීඩිත වී නම් ඔහුගේ ශරීරය පවා ඒ හේතුවෙන් විවර්ණත්වයට දුර්වලත්වයට පැමිණේ.

යමකුගේ චිත්තසන්තානය කියන ලද රෝගයන් ගෙන් මිදී අනතුරුව නිරෝගීව පවතී නම් ඒ නිරෝග චිත්තය, ප්‍රණීත වූ

Non-commercial distribution

සෘතුභෝජන ඖෂධාදියෙන් කයට ගෙන දෙන ශාරීරික සුඛයන් ලබාදෙන්නේය. ඒ එසේම ය. කාමයන්ගෙන් වෙන්ව වනයට වැද මහණ දම් පුරන තාපසවරුන්හට ගම්වාසීන්ට මෙන් ධාතු බල වර්ධනය කරන ඕජාවත් වූ ආහාරපාන නැත. ඔවුහු වනයෙහි හටගන්නා වූ කොළ ගෙඩි අල වර්ග ලුණුත් නැතිව අනුභව කර යැපෙති. ඔවුන්ට සැතපීමට ද සුවපහස් ඇති ආසන නැත්තේය. ඔවුහු ගල්පුවරුවල හෝ බිම ම හෝ තද වූ වේවැල් ඇඳක හෝ මැස්සක හෝ සයනය කරති.

ශීතෝෂ්ණ සහ අව් සුළං නිවාරණය ක රන්නා වූ යහපත් මන්දිරයන් ද ඔවුනට නැත. ඔවුහු කොළ සෙවිලි කළ කුඩා පැලක හෝ රුක්මුලක හෝ ස්වභාවයෙන් හටගෙන තිබෙන දෙර යතුරු ආදිය නැත්තා වූ ගල්ගුහාවල හෝ වෙසෙති. අධික ශීතලය හටගත් නමුත් එය වළක්වා ගැන්ම සඳහා පෙරවීමට වැඩිපුර වස්ත්‍ර ද ඔවුනට නැත්තේය. ඔවුනට තමා අයත් කටයුතු කරවා ගැන්මට සේවකයෝ ද නැත්තාහ. ඥාති මිත්‍රයෝ ද නැත්තේය. උපස්ථාන කරන අන්‍ය උපස්ථායකයෝ ද නැත. ඔවුහු සියල්ල ගැන ම ලද පමණින් ම සතුටුව වෙසෙති.

මෙසේ ඔවුහු ඕජාවත් ආහාරපානාදියෙන් වෙන්ව වාසය කරතත් ඔවුන්ගේ ශරීරයන්හි දුර්වලත්වයක් අප්‍රසන්න ඉන්ද්‍රියත්වයක් නැත්තේය. ඔවුහු නිරෝගී වූ ස්ථූල වූ වර්ණවත් වූ ප්‍රසන්න ඉන්ද්‍රියන් ඇත්තා වූ ශරීර ඇත්තෝය. එයට හේතුව නම් ඔවුන් තුළ පවත්නා වූ නිරෝගී චිත්තය ම ය. නිරෝගී වූ ප්‍රසන්න චිත්තය, රාජභෝජනය අනුභව කිරීමෙන් ලැබෙන්නාවූ කාය සෞඛ්‍යයට ද වඩා වැඩි හොඳ සුවයක්ම ලබා දෙන්නේය. මේ එයට හොඳ නිදසුනකි..

**නිරෝගී චිත්තය නිසා**
**වර්ණවත් වූ තේමිය කුමාරයෝ.**

අප බෝසත් **තේමිය කුමාරයාණෝ** වනයෙහි පැවිදිව වසන සමයෙහි එක් දිනක ඔහුගේ පිය රජ්ජුරුවෝ තම පුත්‍රයා දක්නට වනයට ගියහ. එවේලෙහි තේමිය කුමාරයාණෝ තමා උදෙසා වනයෙන් ගෙනා ලුණුත් නොමැතිව පිස තුබූ පලාවර්ගයක්

Non-commercial distribution

ආගන්තුක සත්කාරය වශයෙන් පියරජුට දුන්හ. එකල්හි රජතෙමේ "මම වනාහි මස් සහිත වූ සුවඳ ඇල් සහලේ බත බුදින්නෙක්මි. මේවා මගේ භෝජනය නොවේය කුමාරයිනි" එය ප්‍රතික්ෂේප කොට පුත්‍ර තේමිය කුමාරයාණෙනි! මෙබඳු ඕජා විරහිත භෝජනයක් අනුභව කරමින් කිසිවෙක් නැත්තා වූ මේ මහ වනයෙහි එකලාව හැසිරෙන්නා වූ තොප ගේ ශරීරය රන් රුවක් මෙන් බබලන්නේ ය. තොපගේ ශරීර වර්ණය ඉතා පිරිසිදුය,ඉන්ද්‍රියයෝ ප්‍රශන්නයහ, එය මට ඉතා ආශ්චර්යයක් හැටියට වැටහෙන්නේය. පුත තේමිය කුමාරයාණනි! මේ ආශ්චර්‍ය්‍ය සිඩියට කරුණු කිමදැයි විචාළේය. එකල්හි තේමිය කුමාරයාණෝ තමා වර්ණවත් වීමට කාරණය මෙසේ දැක්වූහ.

**අතීතං නානු සොචාමි,**
**නප්පජප්පාමි නාගතං**
**පච්චුප්පන්නෙන යාපෙමි,**
**තෙන වණ්ණො පසීදති.**

**අනාගතප්පජප්පාය,**
**අතීතස්සානු සොචනා,**
**එතෙන බාලා සුස්සන්ති,**
**නළොව හරිතොලුතො.**

**මහරජාණෙනි** මම වනාහි මට මෙබඳු නපුරක් සිදුවීයයි කියා හෝ මෙබඳු දෙයක් නො ලදිමියි කියා හෝ ඉකුත් වූ දේ පිළිබඳව ශෝක නො කරමි. අනාගතයෙහි මෙබඳු සම්පත්තියක් ලබමියි අනාගත වස්තූන් ගැන ප්‍රාර්ථනාවක් ද නොකරමි. වර්තමානයෙහි යමක් ලද්දේ නම් එයින් ම මම යැපෙමි. ඒ කාරණයෙන් මගේ ශරීර වර්ණය ප්‍රසන්නය.

**මහරජාණනි!** අනාගත වස්තූන් ප්‍රාර්ථනා කිරීමෙනුත් ඉකුත් වූ අලාභාදිය ගැන ශෝක කිරීමෙනුත් අඥයෝ ලා කාලයෙහි කපන ලද බට ගස් මෙන් වියළෙන්නාහ.

මෙයින් තැවීමය, ශෝක කිරීමය, බලවත් ප්‍රාර්ථනාවය යන රෝගයන් ගෙන් මුක්තව පවත්නා වූ ස්වකීය නිරෝගචිත්ත බලයෙන්

Non-commercial distribution

තමාගේ ශරීරය වර්ණවත්ව තිබෙන බව තේමිය කුමාරයන් විසින් දක්වන ලදී.

**නිරෝගී වූ චිත්තයෙහි වටිනාකම**.

මෙසේ ප්‍රසන්න වූ නිරෝගී චිත්ත බලයෙන් ප්‍රණීත ආහාරපානාදියෙන් ලැබිය හැකි වූ ශරීර සුඛයට වඩා මහත් වූ සැපයක් ලැබිය හැකි බව දක්වා තිබෙන දේශනා බොහෝ වෙති. එසේම නිරෝගී වූ චිත්තය ඇතැම් කායික රෝගයන් පවා නසා නිරෝග කවරන බව ද දේශනාවෙහි දක්වා තිබේ.

කරුණු මෙසේ හෙයින් නිරෝග වූ චිත්තය සකලාර්ථයන් සිද්ධ කරදෙන චින්තාමාණික්‍යයෙකි. රෝග නසන්නා වූ දිව්‍යමය ඖෂධයෙකි. සප්තධාතූන් වර්ධනය කොට ඉන්ද්‍රියයන් බලවත් කරන්නා වූ රසායනයකි. කායික ශක්තිය ගෙන දෙන ඉන්ද්‍රියයන් පිණවන දිව්‍යමය භෝජනයකි. නිරෝගී වූ සිතින් යුක්තව වසන තැනැත්තේ නිරෝගීව දීර්ඝ කාලයක් ජීවත් වන්නෙකි. එබැවින් තම තමන්ගේ සිත් තුළ යටකී අභිධ්‍යා, මහිච්ඡතා ආදි පාපධර්මයනට වාසයට ඉඩ නොදී ලද දෙයින් සතුටුවීම නමැති උසස් ගුණධර්මය වඩා, තම තමන්ගේ චිත්ත සන්තානය නිරෝගීව තබා ගැනීමෙන් මෙලොව නිරෝගීව, දීඝ කාලයක් ජීවත් වීමේ භාග්‍යය උදාකර ගැන්මෙන් මෙලොව දියුණුවත් පරලොව දියුණුවත් සලසා ගැනීමෙහි උත්සාහ කෙරෙත්වා!

Non-commercial distribution

## 25. කෙළෙහි ගුණ සැලකීම

**"කෙවලා හෙසා භික්ඛවෙ! සප්පුරිසභූමි.**
**යදිදං කතඤ්ඤුතා කතවෙදිතා"**

**මහණෙනි, යම් කෙළෙහි ගුණ දන්නා බවක් විශේෂයෙන් දන්නා බවක් වේ නම් මේ අම්ශ්‍රවූ සත්පුරුෂ භූමියයි.**

මෙය වූ කලී ලෝක ස්වාමි වූ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ ලෝක සම්මානනීය වූ සත්පුරුෂ බවෙහි පිහිටිසේක් එය අතිශයින් ම උතුම් කොට වර්ණනා කරන ලද මහඟු දේශනාවෙකි.

තමහට අන්‍යයකු කළ ස්වල්ප වූ ද උපකාරය අමතක නො කොට, ඔහු මට කෙළේ කුමක්දැයි කියා කළ උපකාරය නො මකා, එය සැම කල්හි සිත්හි තබා, සුදුසු අවස්ථාවක් පැමිණි කල තමා ද ඒ වෙනුවෙන් ප්‍රත්‍යුපකාර කිරීම, හෙවත් තමාට උපකාර කළවුනට පසුවඋපකාර කිරීම, **කෙළෙහි ගුණ සැලකීම** නම් වේ.

ඒ කෙළෙහි ගුණ සලකන්නා වූ ස්වභාවය තමාගේ දෙලෝ දියුණුවට හේතු වන බැවින් උතුම් මංගල ධර්මයෙකැ යි වදාරන ලදී.

මෙය බුදු පසේ බුදු මහ රහතන් වහන්සේලා විසින් පුරන ලද්දා වූ ද, බොහෝ පසස්නා ලද්දා වූද, උතුම් ගුණයෙකි. ලෝකයෙහි පහළ වූ අන්‍ය ශාස්තෘවරයන් විසින් ද සෘෂිවරයන් විසින්ද ගිහි පඬිවරයන් විසින් ද එක සේ ම පිළිගන්නා ලද පසස්නා ලද ගුණ ධර්මයෙකි. එසේම ලෝකයෙහි අතිශය දුර්ලභ වූ එහෙයින් ම අත්‍යුත්තම වූ ගුණ ධර්මයෙකි. ඒ බව :–

Non-commercial distribution

**''කතඤ්ඤූ කතවෙදී පුග්ගලො**
**දුල්ලභො ලෝකස්මිං''**

යන ශ්‍රී මුඛ පාළියෙන් ද මනාව ස්ඵුට වේ.

**බුදුන් වහන්සේ සියල්ලට පළමු**
**ලොවට දුන් ආදර්ශය.**

තව ද මේ උතුම් ගුණ ධර්මය බෞද්ධ වූ අපට අද ඊයේ අයිති වූවක් නොව, මෙයට වර්ෂ 2580කට පමණ පෙර බුදු වී වදළ අප බුදු පියාණන්ගෙන් ම අයිති වූවකි. උරුම වූවකි. උන් වහන්සේ තමන් වහන්සේට බුදුවීමට උපකාර වූ අචේතනික බෝධි වෘක්ෂයට පවා සත් දිනක් ඇසි පිය නො හෙළා බලා සිටීමෙන් නේත්‍රපූජාවක් කළ සේක. එසේ කිරීමෙන් අපට ආදර්ශයක් ම දුන් සේක.

**පින්වත්නි**! සතියක් ඇසිපිය නො හෙළා එක දෙයක් දෙස බලා සිටීම මනුෂ්‍යයකුට කළ නො හැකි තරම් වූ දුෂ්කර ක්‍රියාවකි. එහෙත් බුදුන් වහන්සේ ඒ දුෂ්කර ක්‍රියාව කිරීමෙන් පුරා සතියක් තුළ බෝධියට උතුම් නේත්‍ර පූජාවක් කළ සේක, උන්වහන්සේට බෝධිය බුදුවීමට එතරම් විශාල උපකාරයක් කිරීම නිසා නොව ඉතාම සුළු උපකාරයක් ලැබීම නිසාය.

බෝධිය බුදුන් වහන්සේට කළ උපකාරය කුමක්ද? උන්වහන්සේ බුද්ධත්වයට පැමිණ වදළේ බෝධියේ උපකාරයෙන්ද? නැත. අව්වෙන් වැස්සෙන් පින්නෙන් මඳක් ආරක්ෂාවීමට එයින් සුළු ආවරණයක් උන්වහන්සේට ලැබිණි. එය උන්වහන්සේට බෝධියෙන් ලද උපකාරයය. ඒ සුළු උපකාරය ද ඒ බෝධිය ''පින්වත! මගේ මේ සෙවනට එන්න. ඇවිත් මේ මාගේ ආරක්ෂාව ලබමින් බුදුවන්න'' යනාදීන් සිතාමතා කළ උපකාරයක් ද නොවේ.

මධ්‍යාහ්න වේලෙහි මග යන කෙනකු විඩා සංසිඳුවා ගැන්මට ගසක් යට මඳක් නතරව, ගිමන් හැර විඩා සංසිඳුවා ගෙන යතොත්, **වර්තමාන ලෝකයෙහි නම් ඒ** අයට ඒ ගස උපකාරයක් කළැයි කියන කෙනකු .තබා සිතන කෙනකු පවා සොයා ගැන්ම එතරම් පහසු නොවනු ඇත. එවැනි ලෝකයක බුදුන් වහන්සේ ඒ තමන් ලද

Non-commercial distribution

උපකාරයක් ලෙස කිව නො හැකි තරම් වූ ඉතා ම සුළු උපකාරය පවා, තමන් ලද වටිනා ආධාරයක් ලෙස සලකා දුෂ්කර පූජාවකින් පිදූ සේක්., අනාගත ලෝකයට නැතහොත් අපට එය ආදර්ශයක් කොට ගැන්ම පිණිසය. මේ කාරණය ගැන පමණක් වුවද නුවණින් සලකතොත් බෞද්ධයකු තුළ ඒ උසස් කෙළෙහි ගුණ සැලකීම නමැති ගුණය අනායාශයෙන් පිහිටිය යුතුය.

කරුණු මෙසේ හෙයින් ශූෂ්මතාට සුළු උපකාරයක් මුත් යමෙක් කෙළේ නම් එය කිසිකලෙක අමතක නොකළ යුතුය. ඊට ප්‍රත්‍යුපකාර කිරීමට සෑම කල්හිම බලාපොරොත්තු විය යුතු. අවස්ථාවක් පැමිණි කල අමාරුකම් නොබලා ඊට උපකාර ද කළ යුතු. කෙළෙහි ගුණ අමතක කිරීම, මැකීම අසත්පුරුෂයන්ගේ පවිකාරයන්ගේ ස්වභාවයකි. තමහට කළ ස්වල්පවූ ද ගුණය අමතක නො කොට ඊට කෙළෙහි ගුණ සැලකීම උත්තමයන්ගේ ස්වභාවයකි. මෙහිලා අගසව් සැරියුත් හිමියන්ගේ චරිතය හොඳ නිදසුනකි.

**සැරියුත් හිමියන්ගේ**
**කෙළෙහි ගුණ සැලකීම**

රජගහ නුවර **'රාධ'** නම් වූ මහලු බමුණෙක් අඹුදරුවන් කරන අවමන් ඉවසිය නො හැකිව, පැවිදිවනු කැමතිව වේළුවනාරාමයට ගොස් භික්ෂූන් වහන්සේට එපවත් සැලකෙළේය. බමුණා හොඳටම මහලු බැවින් කිසිවෙක් ඔහු මහණ කිරීමට කැමති නොවූහ. බමුණා ලත වෙමින් සිටින කල **බුදුන් වහන්සේ** ඒ බැව් දැන භික්ෂූන් අමතා මේ බමුණාගෙන් ලද යම් කිසි සංග්‍රහයක් මතක ඇත්තා වූ කෙනෙක් ඇත්දැයි විචාළ සේක.

එකල්හි **ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ**, ස්වාමීනි! භාග්‍යවතුන් වහන්ස! දිනක් මා රජගහ නුවර පිඬු සිඟා යද්දී මේ බමුණා විසින් බත් සැන්දක් පූජා කර වූ බව මට මතක ඇතැයි සැලකළහ. එකල්හි **භාග්‍යවතුන් වහන්සේ** සාධු සාධු ශාරිපුත්‍රයිනි! සත්පුරුෂයෝ කෙළෙහි ගුණ සලකන්නෝය., ශාරිපුත්‍රය! එසේ නම් තෙපි මේ බ්‍රාහ්මණයා මහණකොට උපසම්පදා කරවයි වදාළ සේක.

Non-commercial distribution

**සැරියුත් හිමියෝ** මහලු බමුණා පැවිදි කරවා ඔහු සමග එක් ගමකට වැඩියහ. අලුත මහණ වූ කිසිවක් නො දන්නා වූ ඒ මහලු පැවිද්දාට සලකන කෙනෙක් නැත. සැරියුත් හිමියෝ තමන් වහන්සේට ලද වාසස්ථානය ඒ මහලු රාධ තෙරුන්ට දුන් සේක. තමන් ලද දනය ද එසේම ඒ තෙරුන්ට දී තමන් වහන්සේ පිඬුසිගා වැළඳූ සේක. **රාධ තෙරණුවෝ ද** තමන් ද යහපත් සේනාසන හා භෝජනයන් ලැබ නොබෝ දිනකින් සුවපත් වූවෝ, ඇදුරු සැරියුත් හිමිපාණන් වෙතින් ම කමටහන් උගෙන නොබෝ කලකින් සව් කෙලෙසුන් නසා රහත් වූවෝ ය.

## අසත් පුරුෂයාට කළ උපකාරය ගින්නෙහි ලූ බීජයක් වැන්න

මෙසේ උත්තමයෝ තමන්ට කළ ස්වල්ප වූ ද උපකාරය සලකා උපකාර කළ අයට මහෝපකාර කරති. එහෙයින් සත්පුරුෂයනට කළ උපකාරය වපුළ බීජයක් මෙන් තමන්ට වැඩ පිණිස ම පවත්නේ ය. අසත්පුරුෂයන් කෙරෙහි කළ උපකාරය ගින්නෙහි ලූ බීජයක් මෙන් නස්නේය. එහෙයින් වදළහ:-

**කතඤ්ඤුම්හි ච පොසම්හි**
**සීලවන්තෙ අරිය වුත්තිනෙ.**
**සුඛෙත්තෙ විය බීජානි**
**කතං තම්හි න නස්සති.**

කෙළෙහි ගුණ දන්නා වූ සිල්වත් වූ පිරිසුදු පැවතුම් ඇත්තා වූ සත්පුරුෂයා කෙරෙහි කළ ගුණය, යහපත් කුඹුරක වපුළ බිජුවටක් මෙන් නො නස්නේය. ඵලදායක වන්නේය.

**යථාපි බීජ මග්ගිම්හි - ඩය්හති න විරූහති**
**එවං කතං අසප්පුරිසෙ - නස්සති න විරූහති.**

යම් සේ ගින්නෙහි ලූ බීජයක් නස්නේ ද නො වැඩෙන්නේ ද, එමෙන් අසත්පුරුෂයන් කෙරෙහි කළ ගුණය නස්නේය. නො වැඩෙන්නේ ය.

Non-commercial distribution

**ප්‍රථමෝපකාරය ස්වල්ප**
**එකක් වුව ද ඉතා අගනා බැව්**

තවද තමාට කිසි කලෙක කිසිම උපකාරයක් නොකළ කෙනකුට යමෙක් පළමු කොට ඉතා සුළු උපකාරයක් මුත් කෙරේ නම් ඔහු කරනුයේ ඉතා දුෂ්කර දෙයකි. එබැවින් එය කළ උපකාරයක් සලකා පසුව කරන උපකාරයකට වඩා සිය වාරයෙන් දහස් වාරයෙන් අගනේය. එබැවින් පළමු උපකාරය කළ තැනැත්තා උපකාර ලැබූ අයගෙන් තමා ලත් උපකාරයට වඩා සිය වාරයෙන් දහස් වාරයෙන් අධික කොට උපකාර ලැබිය යුත්තෙකි. ඒ බව 'මහා අස්සාරෝහ' ජාතකයෙන් දත හැකිය. ඒ මෙසේ දත යුතු.

**මහා අස්සාරෝහ ජාතකය.**

එක් කලෙක **අප මහ බෝසතාණන් වහන්සේ** බරණැස් නුවර රජ වී දන් දෙමින් සිල් රකිමින් දැහැමින් රාජ්‍යය කළ සේක. එකල එම රාජ්‍යයෙහි එක් පිටිසර පෙදෙසකට සොරු පැමිණ වැසියන් පෙළා ධනය පැහැර ගන්නට වූහ. එපවත් ඇසූ රජ්ජුරුවෝ සේනාව ගෙන ඔවුන් හා සටනට ගියහ. රජුගේ සේනාව සටනින් පරාජයට පත්වූවාය. එකල රජු අසකු පිට නැඟී එකලාව පලායනුයේ රාජපුරුෂයන් තිස් දෙනෙක් වාසය කරන්නා වූ එක් පිටිසර ගමකට පැමිණියේ ය.

එ දවස් උදෑසන **රාජ පුරුෂයෝ තිස්දෙනා** යම් කිසි කටයුත්තක් පිණිස ගම මැදරැස්ව උන්හ. අලංකාර ඇඳුම් පැළඳුම්වලින් සැරසී අසෙකු පිට නැඟී එන අමුත්තා දැක මේ කවරෙක්දැයි බියපත් වූ ඔවුන්ගෙන් එකෙක් හැර සෙස්සෝ පැන ගොස් තම තමන්ගේ ගෙවලට වූහ. නතර වූ තැනැත්තේ නිර්භීතව ඉදිරියට ගොස් එන්නා වූ අමුත්තා පිළිගත්තේය. පිළිගෙන ''අප රජ්ජුරුවෝ පසල් දනව්වට - පිටිසර ට ගියහයි ඇසීමු. තෙපි කවරෙක් ද? රාජපුරුෂයෙක් ද? නැතහොත් සොරෙක් ද? රාජද්‍රෝහි සතුරෙක් දැ''යි විචාළේය. එකල්හි රජ්ජුරුවෝ බිය නොවන්න. මම රාජපුරුෂයෙක්මි යි කීය.

එ කල **ඒ පුරුෂයා** එසේ නම් මෙහි එනු මැනවයි තමාගේ නිවසට කැඳවා ගෙන ගොස් භාය්‍යාව ලවා පා සෝදවා පිළිගෙන,

Non-commercial distribution

තමාට හැකි පමණින් ආහාර පානයෙන් ද සංග්‍රහ කොට, සැතපී විඩා සංසිඳුවා ගත මැනවැ යි යහනක් ද සරසා දුන්නේය. බෝසතාණන් වහන්සේ එහි සයනය කළහ. ඉක්බිති රාජපුරුෂයා අශ්වයාට ද පැන් පොවා තණ කවා පිටෙහි තෙල් ගා සාත්තු කෙළේය.

**රජ්ජුරුවෝ ද** තුන් සතර දිනක් එහි වැස, විඩා සංසිඳවා ගෙන එම පුරුෂයාට කථා කොට, යහළුව ! මා ප්‍රමාද වූවා වැඩියි. දැන් යා යුතු යයි කීහ. රාජ පුරුෂයා ගමන පිළිබඳව කළ යුතු දෑ සියල්ලක් ද ඉතා ආදරයෙන් කළේය. රජතුමා ද යෑමට පිටත්ව ඔහු අමතා යහළුව! මම "**මහා අශ්වාරෝහක**"නම් වෙමි. අපගේ නිවස බරණැස් නුවර මැදය. ඉදින් යම්කිසි කටයුත්තක් පිණිස බරණැසට පැමිණියේ නම් නුවර දකුණු දොරටුවේ දොරටුපාලයාගෙන් මහා අශ්වාරෝහක තෙමේ කවර ගෙයක වෙසේ දැ යි විචාරා ඔහු සමග අප නිවසට එවයි කියා සමුගෙන යන්නට ගියේය.

රජ්ජුරුවන්ගේ **බල සෙනඟ** රජු සොයා නො දැක බරණැස් නුවර සමීපයට පැමිණ රජු නුදුටු බැවින් නුවරට ඇතුල් නොවී පිටතම කඳවුරු බැඳ උන්හ. එහි එන රජතුමන් දුරදීම දැක රාජ පුරුෂයෝ පෙර ගමන් කොට රජු පිරි වරා ගත්හ. **බෝසතාණන් වහන්සේ** නුවරට ඇතුල් වනුයේ පිරිවර ජනයා ඈතට යවා දොරටුපාලයා පමණක් ළගට කැඳවා කියනුයේ බොල දොරටු පාලය, ගම් වැසියෙක් අවුත් මහා අශ්වාරෝහක නමැත්තාගේ ගෙය කොහිදැ යි විචාළේ නම් ඔහු අතින් අල්ලාගෙන වුත් මා දක්වව, එවිට නුඹට ද දහසක් තෑගි දෙමියි කියා නුවරට ඇතුල් වූහ.

කලක් ගත විය. **ගම්වැසියා** තවම නො පැමිණියේය. එකල රජතුමා ඔහු ඉක්මනින් ගෙන්වාගැන්ම පිණිස ඒ ගමට බදු වැඩි කරවීය. එසේ ද නො එන කල නැවතත් බදු වැඩි කරවීය. එයින් නොආ කල තුන්වන වරද බදු වැඩි කර වූයේය. එ ගම් වැසියෝ බදු ගෙවා ගත නො හැකිව මහත් කරදරයකට පත් වූවාහු, එකතුව රජුට උපස්ථාන කළ පුරුෂයා කරා ගොස් කියන්නාහු "යහළුව, නුඹේ යහළුවා වූ **මහා අශ්වාරෝහක** නමැත්තා මේ ගමට පැමිණීමට පෙර මෙබඳු පීඩාවක් අපට නැත. දැන් දිනෙන්

Non-commercial distribution

දිනම අපට බදු වැඩි වන්නේය. තුඹ නුවරට ගොස් ඒ යහළුවා සොයා අපගේ දුක් ගැනවිලි ඔහුට කියා ඔහුගේ මාර්ගයෙන් අපට නිදහස ලබා දෙවයි කීහ.

එකල්හි ඒ **පුරුෂයා** කියනුයේ පින්වත්නි! මාගේ යහළුවා සමීපයට හිස් අතින් නො යා හැකි ය. ඔහුට දරුවන් දෙදෙනෙක් හා භාර්‍යාවක් ද ඇත. ඔවුන්ට ගෙන යෑමට ඇඳුම් පැළඳුම් ආදිය සූදානම් කර දෙන්නහු නම් ගිය හැකි යි කීය. ගම්වැසියෝ ඒ දේ සපයා දුන්හ. **ඒ පුරුෂයා** මිනිසුන් සපයා දුන් නැගිද සිය නිවසෙහි පිසූ කැවුම් ආදියද ගෙන බරණැස බලා පිටත්ව ගියේය. බරණැසට පැමිණි හෙතෙම දොරටුපාලයාගෙන් **මහා අශ්වාරෝහක** නමැති රාජපුරුෂයා කොහි වෙසේ දැ යි විචාළේය. දොරටුපාලයා ඔහු අතින් ගෙන රජමාලිගාව වෙත ගොස් රජහට දැක්වී ය.

රජ්ජුරුවෝ මහත් ප්‍රීතියට පැමිණ හුනස්නෙන් නැගිට ඔහු පිළිගෙන, උඩුමහලට කැඳවා ගොස් රාජාසනයෙහි හිඳුවා දේවිය අමතා සොඳුර, මාගේ යහළුවාගේ පා සේදුව මැනවයි කියා තමාම රන් කෙණ්ඩිය ගෙන පැන් වත්කළහ. **දේවිය** සියතින්ම ඔහුගේ පා සේදුවා ය. ඉක්බිති **රජතුමා** ඔහුට සංග්‍රහ කරනු පිණිස යහළුව, කිමෙක් ද අපට ගෙනා දෙයක් ඇත්දැයි විචාරා ඔහු ගෙනා කැවුම් රන් තැටියකින් සියතින් ම පිළිගෙන දේවියට ද කවා තෙමේ ද අනුභව කෙළේය. ඉක්බිති දුගී පුරුෂයා ගෙනා ඇඳුම් පැළඳුම් ද, ගෙන තමන් ඇඳ සිටි ලක්ෂයක් අගනා කසීසළු ඉවත ලා ඇඳ පැළඳ ගත්තේය. දේවිය ලවාද ඇන්දවීය. පසුව යහළුවාට රාජ භෝජනය වළඳවා ඇමතියකු කැඳවා මොහු කැඳවාගෙන ගොස් රැවුල කප්වා සුවඳ පැණින් නහවා ලක්ෂයක් වටිනා සළු හන්දවා රාජාභරණ පළඳවා මා මෙන්ම සරසවා මෙහි කැඳවා ගෙන එවයි අණ කෙළේය. අමාත්‍යයා ද එසේ ම කෙළේය.

ඉක්බිති **රජතුමා** නුවර බෙර ලවා අමාත්‍ය මණ්ඩලය රැස්කරවා, ශ්වේතච්ඡත්‍රය මැද ඉරක් ඇඳ යහළුවාට රාජ්‍යයෙන් අඩක් දුන්නේය. එතැන් සිට දෙදෙනාම එකට කමින් බොමින් ප්‍රීතිවෙමින් විසූහ. අන්‍යොන්‍ය විශ්වාසය ද නො බිඳෙන පරිදි ස්ථිර

Non-commercial distribution

විය. පසුව ඔහුගේ මුළු පවුලම ගෙන්වා මාලිගාවක් කරවා ඔහු එහි වාසය කරවීය.

රජතුමාගේ මේ ක්‍රියාවට **අමාත්‍යයෝ** කෝප වී එය වලක්වනු පිණිස රජතුමාගේ කුමාරයා වෙත ගොස් කියන්නාහුඃ කුමාරයෙනි, රජතුමා පිටිසර වැසියකුට රජයෙන් අඩක් දී එකට කමින් බොමින් හැසිරෙයි. මේ කුමක්ද මෙය අපට මහ නින්දාවෙක, එබැවින් රජ්ජුරුවන්ට කියා මෙය නතර කළ මැනව යි කීහ. කුමාරයා ද ගොස් රජහට එ පවත් සැල කෙළේය.

එ කල **රජතුමා** දරුව, මා යුධයෙන් පැරදී අතරමං වී කොහි සිටියේ දැයි නුඹ දන්නෙහි ද? පැරද පලා ගිය මා විසුවේ මොහුගේ නිවසෙහිය. එ කල මට දිවි රැක ගැන්මට උපකාර වූයේ මොහුය. දැන් මා මෙහි රජකම් කරන්නේ මේ මිත්‍රයාගේ උපකාරය නිසාය. මා සතුරන් අතට අසුවිණි නම් මට රජය තබා මගේ ජීවිතය වත් නැත. එසේ මට උපකාර වූ මේ තැනැත්තාට උපකාර නො කරන්නෙහි නම් උපකාර කළ යුත්තේ කවරකු හට දැයි පවසා කෙළෙහි ගුණ සැලකීමේ අගය වැඩි දුරටත් මෙසේ දක්වන ලදී.

**අදෙය්‍යෙසු දදං දතං**
**දෙය්‍යෙසු නප්පවෙච්ඡති,**
**ආපාසු ව්‍යසනං පත්තො**
**සහායං නාධිගච්ඡති.**

පෙර උපකාර නො කළවුන්ට සම්පත් දෙන්නාවූ ද, උපකාර කළවුන්ට නො දෙන්නා වූ ද තැනැත්තාට, විපත්තියෙහි දී දුකට පත්ව සිටින කල, උපකාර කරන්නා වූ යහළුවෙක් නො ලැබේ.

**නාදෙය්‍යෙසු දදං දතං**
**දෙය්‍යෙසු යො පවෙච්ඡති,**
**ආපාසු ව්‍යසනං පත්තො**
**සහාය මධිගච්ඡති.**

යමෙක් පෙර කරන ලද උපකාර නැත්තවුනට නො දේද, උපකාර කළවුනට උපකාර කෙරේද, ඔහු විපත්තියෙහි දී දුකට පැමිණි කල උපකාර කරන්නා වූ යහළුවන් ලබන්නේය.

Non-commercial distribution

**සන්දේසදාග සම්භොග විසේසදස්සනං**
**අතරිය ධම්මෙසු සයෙසු තස්සති.**
**කතඤ්ච අරියෙසු ච අඥ්ජසෙසු ච**
**මහප්ඵලො හොති අණුම්පිතාදිසු**

පෙර එක්ව විසීමෙහි හා එක්ව සම්පත් විඳීමෙහි ගුණය, මෙලෙස අපි එක්ව විසීමු, එක්ව කමින් බොමින් සිටියෙමු යි යන හැඟීම නිසා ඇති වන **කෙලෙහි ගුණය,** අනාර්‍ය්‍ය වූ කෙරාටිකයන් කෙරෙහි නස්නේය: නොපවත්නේය. සෘජු ගුණ ඇත්තා වූ ආර්‍ය්‍යයන්ට, කළ ගුණ දත් සත්පුරුෂයන්ට කරන ලද ස්වල්ප වූ ද උපකාරය මහත්ඵල වන්නේය.

**යො පුබ්බෙ කත කල්‍යාණො**
**අකා ලොකෙ සුදුක්කරං,**
**පච්ඡා කයිරා නවා කයිරා**
**අච්චනං පූජනාරහොති.**

යමක් පෙර කිසි උපකාරයක් නො කළා වූ අමුත්තෙකුට ස්වල්ප වූ නමුත් යම් උපකාරයක් කෙළේ ද, ඔහු ලෝකයෙහි ඉතා දුෂ්කර වූවක් කෙළේය. ඔහු පසුව යම් උපකාරයක් කෙළේ හෝ වේවා නො කෙළේ හෝ වේවා, පළමු උපකාරය නිසා ඒකාන්තයෙන් පිදිය යුත්තෙක් වන්නේය. මෙසේ ධර්ම දේශනා කළ කල්හි කුමාරයා හා ඇමතියෝ ද කිසිවක් නො කීහ.

**සෙවන දුන් ගසට පවා**
**නපුරක් නොකළ යුතු බැව්**

තව ද තමාට සුළු උපකාරයක් මුත් කළ අයට කිසි දිනක අනුපකාරයක් නොකළ යුතුය. කරනු තබා සිතින්වත් නොසිතිය යුතුය. යමෙක් එසේ කෙරේ නම් හෙතෙම මිත්‍ර ද්‍රෝහියෙකි. පරම අසත්පුරුෂයෙකි. ඒ බව මෙසේ දත යුතුය.

**යස්ස රුක්ඛස්ස ඡායාය**
**නිසීදෙය්‍ය සයෙය්‍ය වා,**
**න තස්ස සාඛං භඤ්ජෙය්‍ය**
**මිත්ත දුබ්භො හි පාපකො.**

Non-commercial distribution

යම් ගසෙක සෙවන යට යමෙක් හිඳ ගත්තේ හෝ ශයනය කෙළේ හෝ වේද, ඔහු විසින් ඒ ගසේ අතු නො කැඩිය යුතුය. අතු කැඩුවහොත් ඔහු මිත්‍ර ද්‍රෝහියෙක් වේ ම ය.

**යස්සරුක්ඛස්ස ඡායාය**
**නිසීදෙය්‍ය සයෙය්‍ය වා**
**න තස්ස පත්තං භින්දෙය්‍ය**
**මිත්ත දූබ්භොහි පාපකො.**

යම් ගසෙක සෙවන යට යමෙක් හිඳ ගත්තේ හෝ සයනය කෙළේ හෝ වේ ද, ඔහු විසින් එම ගසේ කොළයක් පමණවත් නො කැඩිය යුතුය. කොළ කැඩුව හොත් ඔහු මිත්‍ර ද්‍රෝහියෙක් වේ ම ය යනු භාවයයි.

සෙවන දුන් ගසට පවා මෙසේ නපුරක් නො සිතිය යුතු නම් උපකාර කළ අයට නපුරක් සිතීම ගැන කුමට කියමුද? කරුණු මෙසේ හෙයින් යමෙක් උපකාර කළ අයට අනුපකාර කෙළේ නම් හෙතෙම බරපතල අපරාධකාරයෙකි. ඔහු තමාගේ එම අපරාධය නිසාම දෙලොව මැ විනාශයට ද පැමිණේ. ඒ බව මෙසේ දැක්විණ.

**උපකාර ඇතියනට කල ද්‍රෝහිකම**
**තමත් කරා එන බැව්**

**යස්සේක රත්තිම්පි ඝරෙ වසෙය්‍ය**
**යත්ථන්නපානං පුරිසො ලභෙය්‍ය**
**න තස්ස පාපං මනසා පි චින්තයෙ**
**අදුබ්භ පාණී දහතෙ මිත්ත දුබ්භිං.**

යමෙක් යමකුගේ ගෙහි එක් රැයක් මුත් විසී ද යම් තැනෙක් හි දී ආහාර පාන ලැබී ද, ඔහුට - ඒ ගෙහිමියාට නපුරක් සිතින්වත් නො සිතිය යුතුය. එසේ සිතුවේ නම් අපරාධ නො කරන අත් ඇති තැනැත්තේ උපකාර කළ තැනැත්තේ මිත්‍ර ද්‍රෝහියා ද වන්නේය යනු අදහසයි.

අනුන්ට උපකාර කරන්නා වූ සත්පුරුෂයෝ පරහට විපත් නොකරති. කරන ලද උපකාර ඇත්තා වූ හිතාධ්‍යාශය ඇත්තා වූ

Non-commercial distribution

තැනැත්තන්ට කළා වූ අපරාධය, ආ පසු එන **පිල්ලියක් - හූනියමක්** මෙන් අපරාධ කළ තැනැත්තා කරා ම පැමිණ ඔහු දුකට පමුණුවන්නේය. එය සත්පුරුෂයන් විසින් අසත්පුරුෂයා හට කරන ලද්දක් මෙන් සිදුවන **බැවින් හිංසා නො කරන අත් ඇති සත්පුරුෂයා මිත්‍ර ද්‍රෝහියා දවන්නේ යයි**''කියන ලදී.

### ගුණ කළවුනට ද්‍රෝහිකම් කිරීමෙන් මෙලොව ම දරුණු දුඃඛයනට භාජන වූ දුර්ජනයෙක්.

අසත් පුරුෂයා කළ ද්‍රෝහිකම, සත්පුරුෂයා විසින් ආපසු හරවා එවන ලද්දක් මෙන්, සත් පුරුෂයන්ට ද්‍රෝහිකම් කොට එම ආත්මයේ දී ම විනාශයට පත්වූවෝ බොහෝ වෙති. තිංසති නිපාතයෙහි '**මහාකපි ජාතක** 'යෙහි වඳුරුව උපන් බෝසතාණන් වහන්සේ මහා වළක පතිතව සිටි එක් මිනිසකු ඉතා දුක සේ එම වළෙන් ගොඩට ගෙන ඔහුගේ ජීවිතය රැක දුන්හ. ඒ අකෘතඥ මනුෂ්‍යයා තමාගේ ජීවිතය රැක දුන් බෝසතාණන් මරා මස් කෑමේ අදහසින් ගලකින් හිසට පහර දිණ. බෝසතාණන් වහන්සේ පැන දුව ගොස් දිවි රැක ගත්හ. ඒ අකෘතඥ පුරුෂයා කළ උපක්‍රමයෙන් උන්වහන්සේ ගේ ජීවිතයට හානියක් සිදු නුවුවත් හිස තුවාල විය. මැරීමට කළ උත්සාහය නිසා එම ද්‍රෝහී ක්‍රියාවේ ප්‍රතිඵලයක් වශයෙන් ඒ පුරුෂයා පසු කලෙක දරුණු ශ්වේත කුෂ්ඨ රෝගය වැළඳී පිපාසයෙන් පීඩිතව එම ආත්මයෙහි ම මනුෂ්‍ය ප්‍රේතයෙක් විය. ශරීරයෙහි හටගත් ගෙඩි ආදිය නිසා කය දුබල ව ඒ ඒ තැන ඇට පෑදී නහර ඉල්පී ගියේය. දුටු දුටු සැමටම පිළිකුල් වූවෙක් විය. මව් පියනට පවා අප්‍රිය වූවෙක් විය. මෙසේ දීර්ඝ කාලයක් බොහෝ දුක් විඳ, පසුව පොළොව පළා නැගි ගිනි දැලින් වෙළී නරකයෙහි උපන්නේය. වඳුරුව උපන් බෝසතාණන් වහන්සේට කළ එම සුළු ද්‍රෝහි කර්මයට ඔහුට මෙතරම් විශාල ලෙස දරුණු විපාක ලැබුණේ තිරිසනකු වුව ද බොසතාණන් වහන්සේ තුළ ඔහු කෙරෙහි පැවති කරුණා ගුණය හොඳින් පැවති හෙයිනි. ඔහු එසේ මැරීමට තැත් කිරීමෙන් පසු ද, හිසින් ගලන ලේ අතින් පිස දමමින්, ඒ මිත්‍ර ද්‍රෝහි පුරුෂයාට අනුකම්පා කොට ඔහුට මනුෂ්‍ය පථයට යෑමට ගසින් ගසට යමින් මඟ පෙන්වීය. උන් වහන්සේ තුළ පැවති

Non-commercial distribution

කරුණාවේ ප්‍රමාණය එයින් මැන ගත හැකිය. මෙවැනි කරුණා ගුණයෙන් හෙබි දෙමාපිය ගුරුවරාදීනට ද්‍රෝහිකම් කරන්නවුනටද මෙලොවදී ම වුව ද දරුණු විපාක ලැබෙන බැව් ලෝක ප්‍රවෘත්ති සොයා බැලුවහොත් මැනවින් ස්ඵුට වේ. එවැන්නන්ට මුණපාන්නට සිදු වූ දරුණු විපාක ගැන කලින් කල කොතෙකුත් අසන්නට ලැබේ.

මෙසේ වර්තමාන ආත්මයේදී ම යම් කිසි ක්‍රමයකින් තමාගේ කර්ම ශක්තිය බලවත් වීම ආදි හේතුන් නිසා දරුණු විපාකයක් නො ලදත් මරණින් මතු එහි විපාකය ඒකාන්තයෙන්ම ලැබෙන්නේ ම ය. ගුණ කළවුනට අපරාධ කිරීමෙන් යටකී පුරුෂයාට මෙන් මෙලොව දද වණ සුදු කබර පරංගි ලාදුරු ආදියද, දෙඹගෙඩි, දෙහිගෙඩි, දෙඩම්ගෙඩි පමණ නගින දිය බුබුලු ඇති 'කිලාස' නම් දරුණු රෝගයන් හට ගන්නා බවද, මරණින් මතු නරකයෙහි උපදනා බවද, එම මහාකපි ජාතකයෙහිම මෙසේ වදාළහ :–

**කුට්ඨී කිලාසී භවති**
**යො මිත්තානිධ දූබ්භති**
**කායස්ස භෙද මිත්තදූබ්භි**
**නිරයං සො උපපජ්ජති.**

මිතු ද්‍රෝහියා නරකයෙන් මිදී නැවත මිනිසත් බවක් ලැබූ කල ද යට කී රෝගයන් හට ගැන්මට ඒ මිත්‍රද්‍රෝහී කර්මය හේතුවේ. කරුණු මෙසේ හෙයින් උපකාර කළවුන්ට නපුරක් කිරීම මෙලොව ම විපාක දෙන්නා වූ බරපතල පාපයක් බව දත යුතු. තමහට කරන ලද බොහෝ උපකාර ඇත්තා වූ මව් පිය ගුරුවරාදීන් ගෙන් තමහට යම් වරදක් වුවද එය ඉවසිය යුතුය. එබඳු ගුණ කළ තැනැත්තන්ට කිසි කලෙක සිතින් වත් නපුරක් නොසිතිය යුතුය. කිරීම ගැන කියනුම කිම? ඉදින් එබන්දක් කෙළේ නම් ඒ තමා විසින් ම තමා නසා ගැන්මකි. ගුණ කළ වුන්ගේ සිත පවා කිසි කලෙක නො රිදවිය යුතුය.

**මෙ කල ගුණ දන්නන් දුලබ බැව්**

මෙසේ නොයෙක් අයුරින් වර්ණනා කරන ලද මේ මහඟු ගුණ ධර්මය ඇතියවුන් මෙකල දුර්ලභ බැව් අකමැත්තෙන් වුව ද කිව

Non-commercial distribution

යුතුය. ලෝකයෙහි ස්වල්ප උපකාරයක් කළවුනට තබා අපමණ උපකාර කළ මව්පියන් ගැන පවා කෙළෙහි ගුණ සලකන දරුවෝ අල්ප වෙති. මවුපියන් ගෙන් ගතයුතු සම්පූර්ණ ප්‍රයෝජන ලබා නො ගත්තා වූ මතු බලාපොරොත්තු ඇත්තා වූ දරුවෝ පමණක් කෙළෙහිගුණ සැලකීමක් වශයෙන් නොව, මව්පියන් නැති වුවහොත් තමාට වන්නා වූ පාඩුව සලකා මව්පියන් රෝගාතුර වුවහොත් සුවකර ගැන්මට උත්සාහ කරති. ඒ වෙනුවට සිය ධනය ද කාලය ද යොදවති. ගත යුතු දෙයක් නැත්තා වූ ද ජීවත් වුවත් වස්තුව සපයා ගත නොහැකි වූ ද දුප්පත් මව්පියන්ගේ දරුවෝ බොහෝ විට ඔවුනට සංග්‍රහ නො කරති. ඇතැම් විට අසනීපයක් වූ විට කරදරයෙන් නිදහස් වීම පිණිස ඉක්මනින් ම මැරෙත්වා යි ද සිතති. පතති. මව්පියන්ගෙන් කරවා ගත යුතු දෑ කරවා ගත්තා වූ ද දේපල ලියා ගත්තා වූද ඇතැම් අකෘතඥ දරුවෝ මව්පියන් ඉක්මනින් මිය යනවාට පවා මෙසේ කැමති වෙති. ''**කට්ඨං විප්ලාවිතං සෙය්‍යො, න ත්වෙවෙකච්චියො නරෝ**'' යනුවෙන් ඇතැම් අකෘතඥ මිනිසුන්ට වඩා පා වී ආ දැව කොටය උතුම් යයි **රුරුමිග**''ජාතකයෙහි වදළේ එවැනි අකෘතඥයන් සඳහාය.

**ලෝකයෙහි කළ ගුණ දත් ඉතාම ස්වල්ප දෙනෙක්** පමණක් ගුණ සලකා මව් පියනට සංග්‍රහ කරති. ඔවුහු දෙවියන් සහිත ලෝකයාගේ ප්‍රශංසාවට භාජනව මරණින් මතු ස්වර්ගයට ද යෙති. එසේ කෙළෙහි ගුණ දැන මව්පියන් සලකන දරුවනට ලෝකයාගෙන් වුවද උපකාර ලබා ගතහැකිය. කළ ගුණ නොදත් අකෘතඥයන්ට විපතක් පැමිණි යත් ලෝකයාගෙන් උපකාරයක් ලබා ගැන්ම පවා දුෂ්කරය. අනන්ත ගුණ කළ දෙමාපියනට උපකාරයක් නොකරන දුර්ජනයා කෙරෙහි විශ්වාසය තබන මෝඩයා කවරෙක්ද? එහෙයින් අකෘතඥයා දෙලොවින්ම පිරිහෙන්නේ ය

තමා විසින් කරන ලද උපකාරයක් නැත්තා වූ කෙනකු විසින් කළ ප්‍රථමෝකාරය ස්වල්ප වුවද යට දැක්වූ පරිදි ඉතාම උතුම් කොට අගේ කොට සැලකිය යුතුය. උපකාර කළ කෙනකුට ප්‍රත්‍යුපකාර කිරීම අල්ප වූ ලෝකයෙහි යමෙක් ප්‍රථමෝපකාරය කෙරේ නම් එය ආශ්චර්යයෙකි. එසේ කරන

Non-commercial distribution

තැනැත්තා සත්පුරුෂයෙකි. එය කිසි කලෙක අමතක නො කළ යුත්තකි. එහෙයින් එයට කෙළෙහි ගුණ සැලකීමට බලාපොරොත්තු විය යුතුය.

"**නොකළ යුතු දෑ කිරීමත්, කළ යුතු දෑ නොකිරීමත්**" යන දෙකම පව් වෙති. තමාට ගුණ කළාවූ මව් පිය ආදීනට නො සලකා සිටීම කළ යුත්ත නොකිරීම වූ **පාපයයි**. ඔවුනට ද්‍රෝහිකම් කරතොත් එය නොකළ යුත්ත කිරීම වූ **පාපයයි**. යමෙක් ද්‍රෝහිකම් නො කළත් තමා විසින් කළ යුතු දේ නොකොට මහහැර සිටියොත් එයද අපායෝත්පත්තියට හේතුවක් බව සලකා, ගුණ කළවුනට ගුණ කිරීමෙහි යෙදී සත්පුරුෂ සංඛ්‍යාවට ඇතුළත්ව දෙලෝ වැඩ සලසා ගැනීමට උත්සාහ කෙරෙත්වා.!

Non-commercial distribution

## 26. සුදුසු කාලයෙහි ධර්ම ශ්‍රවණය කිරීම

**මහාගදෙ මච්චු ජරා පහාතො**
**සබ්බීති නාසාය විසේස මන්තො**
**සබ්බත්ථ දතෙත ච කප්පරුක්ඛෝ**
**චින්තාමණී භද්දඝටොව ධම්මෝ.**

ධර්‍මස්වාමී වූ තථාගතයන් වහන්සේ විසින් දේශිත ශ්‍රී සද්ධර්‍මය වනාහි ජාති ජරා මරණාදි සකල දුඃඛයන් දුරු කරන්නා වූ ප්‍රබල මහෞෂධයකි. රාගාදි සියලු විෂ නසන්නාවූ දිව්‍යමය වූ විශේෂ මන්ත්‍රයකින් සකල ලෞකික ලෝකෝත්තර අර්ථයන් සලසා දීමෙහි සමර්ථ වූ කල්ප වෘක්ෂයෙකි. චින්තාමාණික්‍යයෙකි. භද්‍රඝටයෙකි.

මෙසේ වර්ණිත සකලාර්ථ සාධක ශ්‍රී සද්ධර්‍මය වනාහි ඇසීමට නුසුදුසු වූ කාලයක් නම් නැත. ඇසිය හැකි නම් සෑම කල්හි ම ඇසිය යුත්තක් වුවත් මේ සත්ත්වයන්ට ධර්මය අවශ්‍යයෙන් ම ඇසිය යුතු කාලවල් ද වෙති. එබඳු කාලයන්හි ධර්මය නො ඇසීම ද අනර්ථය පිණිස පවත්නේය.

**වෙජ්ජූපමො ජිනවරෝ**
**ගෙලඤ්ඤාව පුථුජ්ජනා**
**රොගූපමා කිලෙසා ච**
**සද්ධම්මෝ ඔසධූපමො.**

යනුවෙන් - පස්මරුන් දිනූ හෙයින් "**ජිනවර**" නම් වූ බුදුන් වහන්සේ ලෝකයෙහි පහළ වූ ශ්‍රේෂ්ඨතම වෛද්‍යාචාර්‍ය්‍ය තුමකු වැනියහ යි ද, කාම රූප අරූප සංඛ්‍යාත භවත්‍රයෙහි වාසය කරන පෘථග්ජන සත්ත්ව සමූහයා ගිලනුන් වැනියහ යි ද, ඒ සත්ත්වයන් තුළ නිදන් ගතව පවත්නා එක් දහස් පන්සියයක් වූ ක්ලේශ ධර්‍මයෝ බලවත් රෝගයන් වැනියහයි ද, ශ්‍රී සම්බුද්ධ ධර්මය ඒ ක්ලේශ රෝගයන් දුරීභූත කිරීමෙහි සමර්ථ වූ දිව්‍යමය වූ ඖෂධයක් වැනියයි ද ප්‍රකාශ කරන ලදී.

Non-commercial distribution

**ධර්මය** සත්ත්වයන්ගේ සිත්වල හටගන්නා වූ පව් නමැති රෝගයන් නැසීමෙහි සමර්ථ වූ දිව්‍ය ඖෂධයක් බව එම දේශනාවෙන් මොනවට පැහැදිලිය. මතු නූපදනා පරිද්දෙන් මාර්ග ඥානය කරණකොට ගෙන ක්ලේශන් ප්‍රහාණය නො කළා වූ මේ සත්ත්වයන්ගේ සිත් සතන් තුළ දක්නට අසන්නට ලැබෙන්නා වූ ද දැන ගන්නට ලැබෙන්නා වූ ද රූප ශබ්දදිය හේතුකොට නොයෙක් අවස්ථාවල කාම විතර්ක, ව්‍යාපාද විතර්ක, විහිංසා විතර්ක යන ත්‍රිවිධ විතර්කයෝ පහළ වෙති.

## ත්‍රිවිධ වූ පාප විතර්කයන්

ලෝකයෙහි රූප සම්පන්න ස්ත්‍රියක කෙරෙහි හෝ පුරුෂයකු කෙරෙහි හෝ රන් රිදී මුතු මැණික් මුදල් ඇඳුම් පැළඳුම් ආහාරපාන ගේ දෙර වතු පිටි යාන වාහන ආදි යම්කිසි වස්තුවක් කෙරෙහි හෝ හටගත් ආශාව මුල්කොට පහළ වන්නා වූ "මේ ස්ත්‍රිය මේ පුරුෂයා මේ වස්තුව කෙසේ ලබම් ද? මෙසේ මෙසේ කොට ලබා ගනිමියි"යනාදීන් කාමයන් සඳහා උපදනා කල්පනා **කාම විතර්ක** නම් වෙති.

අප්‍රිය වූ අමනාප වූ පුද්ගලයකු හෝ වස්තුවක් හෝ විනාශ කිරීම පිණිස එකී වස්තුව බැලීමෙහි පටන් විනාශය සිදු කරන තෙක් "මෙසේ ද මෙසේද කරමි" යි පවත්නා වූ නපුරු කල්පනා **ව්‍යාපාද විතර්ක** නම් වෙති.

අප්‍රිය වූ අමනාප වූ යම්කිසි ස්ත්‍රියකට හෝ පුරුෂයකුට හෝ හිංසා කිරිම පිණිස දුක් ඇති කිරීම පිණිස පහළ වන්නා වූ නපුරු කල්පනා **විහිංසා විතර්ක** නම් වෙති.

ගිහියකු හට හෝ වේවා පැවිද්දකු හට හෝ වේවා යම් කිසිවකුට මේ අකුශල විතර්කයන් අතුරෙන් යම් කිසි විතර්කයක් පහළ වී නම් එය ඒ තැනැත්තාට ඒකාන්තයෙන් අහිත පිණිස අනර්ථය පිණිස පවත්නේය. මේ තුන අතුරෙන් ද සත්ත්වයන්ට අනර්ථය පිණිස හේතු වූ කාම විතර්කයෝ බොහෝ කොට පහළ වෙති. තම තමාට අනුරූප පරිද්දෙන් පහළ වූ කාම විතර්කයන්ගේ වසභයට පැමිණ විනාශ වූ ගිහියෝද පැවිද්දෝ ද බොහෝ වූහ. ඒ එසේ මැයි.

Non-commercial distribution

**පාප විතර්කයන් නිසා පිරිහෙන බැව්.**

**ඇතැම් මහණ කෙනෙක්** ධ්‍යාන වඩා ආකාශ ගමනාදි නා නා ඍද්ධි ප්‍රාතිහාර්‍ය්‍ය කරණයෙහි පවා සමර්ථව සිට කාම විතර්කයන්ට වසඟව ධ්‍යානයෙන් පිරිහුණෝය. මෙයට හොඳම නිදර්ශනයක් දුක නිපාතයෙහි **සංකප්ප ජාතකයෙහි** සඳහන් වේ. විස්තර කිරීමට ඉඩ නැති බැවින් විස්තර දනු කැමතියන් විසින් ජාතක පොතින් බලා දත යුතුය. **ඇතැමෙක්** මහණ කමින් පහවූහ. අභිඥාලාභීව නොයෙක් විශ්මය ජනක දේ කිරීමෙහි සමර්ථව සිටි **සාමණේර නමක්** කාම විතර්කයන් නිසා සියල්ලෙන් පිරිහී ගිහිව අන්ධ වූ ස්ත්‍රියක සමග විසූ බව පැවසෙන හොඳම නිදර්ශනාත්මක කථාවක් **බෝධිපාක්ෂික ධර්ම විස්තරය** ග්‍රන්ථයෙහි එයි. **චක්ඛුපාල** හිමියන්ගේ අතවැසි සාමණේර නමගේ පුවත ද සිහිපත් කළ යුතුය.

මෙ කල ද මේ නෛර්‍ය්‍යාණික සර්වඥ ශාසනයෙහි පැවිදිවන්නන් ගෙන් ඇතැම් කෙනෙක් කාම විතර්කයන්ට වසඟවීමෙන් මහණ කමින් පහ වෙති. **ගිහියන්ගෙන්** කාමවිතර්කයන්ට වසඟ වීමෙන් ඇතැමෙක් මහත් නින්දවට ද ඇතැමෙක් රෝගාතුර බවට ද ඇතැමෙක් ධන හානියට ද ඇතැමෙක් උමතකු බවට ද ඇතැමෙක් බන්ධන යට ද ඇතැමෙක් ජීවිතක්ෂයට ද පැමිණෙති. මෙකල **'වස විස'** පාවිච්චි කිරීමෙන් බොහෝ විට තමන් පමණක් නොව අහිංසක වනිතාවන් ද තමා වැටෙන වළෙහි ම සතප්පා ගැන්මට පොළඹවන අඥාන තරුණයන් වැඩි දෙනෙක් මේ කාම විතර්කයන්ට වසඟවීම නිසා එසේ කරන බැව් ප්‍රකටය. කාමාතුරවූවෝ මෙසේ මෙලොව මැ නා නා ව්‍යසනයනට භාජනව මරණින් මතු අපායට ද පැමිණෙති.

මෙසේ සිදුවන්නා වූ විපත්වලින් මිදිය හැක්කේ උපන්නා වූ කාම විතර්කයන් නැති කර ගැනීමෙනි. එය දුරු කර ගැන්මට ඇත්තා වූ එකම ඖෂධය ද ධර්මය මැ යි. එබැවින් අකුශල විතර්කයන් පහළ වූ අවස්ථාව ධර්ම ශ්‍රවණයට අත්‍යවශ්‍ය අවස්ථාවකි. එබඳු අවස්ථාවලදී ධර්මධරයන් කරා එළඹ ඒ ඒ විතර්කයන් නැති කර ගත හැකි ධර්මයන් ඇසීම සුදුසු කල්හි ධර්ම ශ්‍රවණය වේ. එය මෙලොව පරලොව යහපතට හේතුවන බැවින් උතුම් මංගලයකි. කාම විතර්කයන් පහළවීමෙන් දුකට පත් වන ආකාරය

Non-commercial distribution

හා ධර්ම ශ්‍රවණයෙන් ඉන් මිදෙන සැටි ද මතු දක්වන කථාවෙන් ස්ඵුට වේ.

## ලෝභයේ පීඩනයෙන් රෝගාතුරව මරණාසන්න වූ රජෙක්.

පෙර බරණැස් නුවර අධික ලෝභය ඇති **රජෙක්** විසුවේය. අධික ලෝභය නිසා ඔහුට බරණැස් නුවර රාජ්‍ය මදි විය. තවත් රාජ්‍යයන් යටත් කර ගැනීම ඔහුගේ කල්පනාව විය. දිනක් **සක් දෙව් රජ** මිනිස් ලොව බලනුයේ මේ රජ්ජුරුවන් දැක මොහුට හොඳ පාඩමක් උගන්වමියි සිතා මිනිස් ලොවට පැමිණ තරුණ මනුෂ්‍යයකුගේ වේශයෙන් රජ ගෙදර දොරටුව සමීපයෙහි පෙනී සිට, උපායෙහි දක්ෂ තරුණයෙක් රජු දැකීමට පැමිණ සිටින්නේය යි රජ හට කියා යැවීය. රජතුමා ඔහු කැඳවිය. තරුණයා රජු හමුවී ශුභාශිංසනය කොට දේවයන් වහන්ස! නුඹ වහන්සේට රහසක් කියනු පිණිස ආමියි කීය. ශක්‍රානුභාවයෙන් ම රජු වෙත හුන් මිනිස්සු එතැනින් ඉවත් වූහ.

තරුණයා රජු හට පවසනුයේ දේවයන් වහන්ස! මම බොහෝ මිනිසුන් ඇත්තා වූ ඉතාම සමෘධිමත් නුවරවල් තුනක් ගැන දනිමි. ඒ නුවරවල් තුනම නුඹ වහන්සේට වුවමනා නම් යටත් කර දිය හැකිය, කල් නොයවා වහ වහාම ඊට සූදානම් වුව මැනවයි කියා දෙව් ලොවට ගියේය. **රජ තෙමේ** ප්‍රීතියට පැමිණ ඇමතියන් රැස් කරවා කියනුයේ 'පින්වත්නි'එක් තරුණයෙක් පැමිණ අපට රාජ්‍ය තුනක් යටත් කර දෙන බව කීයේය. ඒ මාණවකයා නතර කර ගැන්මට අමතක විය. දැන් ඔහු සොයව්! සිටින තැනකින් කැඳවව්! නුවර බෙර ලවා යුදයට යෑමට සේනාව රැස් කරවව්! යයි''කීයේය.

**ඇමතියෝ** ඒ මාණවකයා (තරුණයා) නො දැක රජ හට කියන්නාහු දේවයන් වහන්ස! නුඹ වහන්සේ ඒ මාණවකයාට සත්කාර කළාහුද? ඔහු වාසය කරන තැන විචාළාහුදැ යි විචාළහ. රජතුමා එසේ නොකළ බව ද එසේ කිරීමට අමතක වූ බවද කීය. ඇමතියෝ ඔහු සොයා මුළු නුවර කොතැනකවත් එබඳු තරුණයකු

Non-commercial distribution

නැති බව පැවසූහ. ඒ ඇසූ රජතුමා තමා ඔහුට නො සැලකූ නිසා ඔහු කෝපව අමනාප වී යන්නට ඇතැයි සිතා තමා අතින් සිදු වූ ඒ වරද ගැන දෙම්නසට පැමිණ,මගේ වරදින් ම මට වූයේ මහත් හානියෙකි, ඔහු නො ගියේ නම් මට තවත් විශාල රාජ්‍ය තුනක් අත්කර ගන්නට ලැබෙන්නේය යනාදීන් නැවත නැවත ඒ ගැනම කල්පනා කරමින් ශෝක කරන්නට විය.

නුවරවල් තුන ගැන හට ගත්තා වූ ලෝභාග්නියෙන් ද නො ලැබීම නිසා හටගත්තා වූ ශෝකාග්නියෙන්ද රජුගේ සිතත් කයත් තැවෙන්නට විය. අධික තැවීම නිසා රජුගේ ශරීරයෙහි ලේ උණු වී ලේ අතීසාර රෝගය හට ගත්තේය. නොයෙක් ප්‍රතිකාර කළ මුත් රෝගය දිනෙන් දිනම උත්සන්න විය. වෙදුන්ට පිළියම් කරන්නට නො හැකි විය. රජ අතිශයින් වෙහෙසට පත් විය. වැඩි කලක් ජීවත් නොවන පමණට රජ අබල දුබල විය. රජ්ජුරුවන්ගේ අසනීපය සකල නගරයෙහිම පතල විය.

මේ කාලයෙහි **බෝධිසත්ත්වයන් වහන්සේ** බරණැස් නුවර කුල ගෙයක ඉපද වැඩි විය පැමිණ තක්සලා නුවරට ගොස් ශිල්ප උගෙන ආවේ, මේ පුවත අසා රජතුමාට ප්‍රතිකාර කරමියි ගොස් රජුට ඒ බව දන්වා යැවූහ. රජ මෙපමණ උසස් රාජ වෛද්‍යවරයන් හට ද නො පුළුවන් වූ රෝගය මේ තරුණ නවක වෛද්‍යවරයකු කෙසේ සුව කෙරේදැයි කියා ඔහුව පිටත් කර හැරීමට නියම කෙළේය. එකල්හි බෝසතාණන් වහන්සේ මාගේ වෙදකමට වැටුප් නැත. මම නොමිළයේ ම ප්‍රතිකාර කරමි. බෙහෙත් මිළ පමණක් දුනහොත් ප්‍රමාණය යි කියා යැවූහ.

රජතුමා එ පවත් අසා ඔහු කැඳවීය. **බෝසතාණන් වහන්සේ** රජු වැඳ සමුගෙන මහරජාණෙනි, නුඹ වහන්සේ බිය නූන මැනව, මම නුඹ වහන්සේ සුවපත් කරමි. මට රෝගයේ නිදනය පමණක් කියනු මැනවයි කීහ. රජතුමා රෝග නිදනය කීමට ලැජ්ජාවෙන් නුඹට නිදනයෙන් කම් නැත. හැකි නම් බෙහෙත් කරව යි කීය. බෝධිසත්ත්වයෝ මහරජ! වෙදවරු රෝග නිදනය දැනම එයට සුදුසු ප්‍රතිකාර කරති. නිදනය නොදැන ප්‍රතිකාර කිරීම දුෂ්කරය යි කීහ. රජතුමා යහපතැයි කියා රෝගනිධානය හෙළි කෙළේය.

Non-commercial distribution

**බෝසතාණෝ** රජ්ජුරුවන්ගේ රෝගය ලෝභය මුල්ව හටගත් බැව් දැන ඊට ධර්ම නමැති දිව්‍යඖෂධය හැර අන් බෙහෙතක් නොමැති බැවින් ධර්මානුශාසනයෙන් ඔහුගේ රෝගය සුව කරනු පිණිස අනුශාසනා කරනුයේ, මහරජ, කිමෙක්ද? ශෝකකිරීමෙන් රාජ්‍යතුන ලැබේදැයි ඇසූහ. දරුව, නො ලැබේයයි රජතුමා කීය. බෝසතාණෝ මහරජ, එසේ නම් අහසෙහි පෙනෙන ඉර හඳ ඉල්වා හඬන ළමයකු මෙන් නුවණැති ඔබ නොලැබෙන නො දන්නා නො පෙනෙන රාජ්‍ය තුනක් ගැන ශෝක කරන්නේ කුමටද?

**මේ ලෝකයෙහි** සියල්ලන් විසින් ම අවිඤ්ඤාණක සවිඤ්ඤාණක (පණ ඇති නැති) සියලුම වස්තූන් තමාගේ ශරීරයත් සමගම අත්හැර පරලොව යා යුතුය. මහරජ, නුවරවල් සතරකම රාජ්‍යය ගෙන ඔබ තුමන් එකවරට බත්තලි සතරක් වළඳන්නහු ද? යහන් සතරක නිදන්නහු ද? සතර දෙනකුගේ ඇඳුම් පැළඳුම් ඇඳ පැළඳ ගන්නහුද? මහරජ , ලෝභයට වසඟ නොවිය යුතුය. මේ ලෝභය වැඩෙන කල්හි සත්ත්වයාට සතර අපායෙන් මිදෙන්නට නො දෙන්නේය යනාදින් අවවාද කොට ගාථා නවයකින් රජහට ධර්මදේශනා කළහ. (මෙය විස්තර වශයෙන් **චිත්තෝපක්ලේශ දීපනියෙහි** සඳහන් වේ.) බෝසතාණන් වහන්සේගේ ධර්ම දේශනාව අසා රජතුමාගේ ශෝකයත් ලෝභයත් පහවීමෙන් නිරෝගී වූහ.

මේ රජතුමාට මෙපමණ දරුණු රෝගයක් හටගත්තේ තමන් තුළ හටගත් කාමවිතර්කයන් දුරුකර ගත නොහැකි වීමෙන්ය. ඉදින් බෝසතාණන් වහන්සේ ගෙන් බණ නො ඇසුවා නම් රජතුමා මිය යන්නේය. ලෝභයෙන් මිය යන ඔහු අපායෙහි උපදින්නේය. මෙලොව ජීවිතයත් ආරක්ෂා වී පරලොව අපාදුකින් ද නිදහස් වූයේ බණ ඇසීම නිසාය. එම අවස්ථාවෙහි ඔහුට එසේ අසන්නට ලැබීම මහත් වූ ලාභයක් විය. උතුම් වූ මංගලයක් ද විය. ඒ සුදුසු අවස්ථාවෙහි බණ ඇසීම ඒ රජුට දෙලෝ දියුණුවට හේතු වූවාක් මෙන්ම කාම විතර්කාදිය පහළ වූ කල ධර්ම ශ්‍රවණය කිරීම ලෝකයෙහි සියල්ලන්ටම දෙලෝ වැඩ පිණිස පවත්නා බැව් දත යුතුය.

Non-commercial distribution

# 8 වන ගාථාව

**ඛන්ති ච සොවචස්සතා - සමණානං ච දස්සනං**
**කාලෙන ධම්ම සාකච්ජා - එතං මංගලමුත්තමං**

**ඛන්ති ච** - ඉවසීම ද, **සොවචස්සතා** - අවවාද කිරීමට පහසු බව ද, **සමණානං** - ශ්‍රමණයන්ගේ, **දස්සනං ච** - දැකීම ද, **කාලෙන** - සුදුසු කාලයෙහි, **ධම්ම සාකච්ජා**- ධර්මය පිළිබඳ කථා පැවැත්වීම ද යන මේ කරුණු සතර, **උත්තමං මංගලං** - උතුම් මඟුල් සතරකි.

1. **ඉවසීම**
2. **උත්තමයන්ගෙන් ලැබෙන අවවාද පිළිගැනීමය.**
3. **ශ්‍රමණයන් වහන්සේලා දැකීමය.**
4. **සුදුසු කල්හි ධර්ම සාකච්ජා කිරීමය.**

යන මේ සතර උතුම් මංගල ධර්ම සතරක්ය - යනු අදහසයි.

*Non-commercial distribution*

## 27. ඉවසීම

ඉවසීම වනාහි අන්‍යයන් ආක්‍රෝශ කරන කල්හි වධ බන්ධනාදියෙන් දුක් දෙන කල්හි, ඔවුන් කෙරෙහි වෛරසකට නො පැමිණෙන, නො කිපෙන, විරුඬව ක්‍රියා නො කරන ස්වභාවයයි.

දෙලෝ දියුණුව කැමති හැම දෙනා විසින් ම ඇති කර ගත යුතු උසස් ගුණ ධර්මවලින් එකකි, ඒ ඉවසීම. සියල්ල දැන ගන්නා වූ උතුම් බුඬත්වය පවා ලබා දීමෙහි සමර්ථ වූ ධර්මයක් බැවින් එය උතුම් ස්වභාවයෙහි සවන පාරමිතාව වශයෙන්ද එයි. ඒ උතුම් ස්වභාවයෙහි පිහිටි සත් පුරුෂයා තමාගේ හා තමාට හිංසා පීඩා කරන්නහුගේ ද යන දෙදෙනාගේ ම අර්ථය - දියුණුව පිණිස පිළිපදින්නෙක් ද වේ. එහෙයින් වදාළහ, සංයුක්ත නිකායෙහි :-

**උභින්න මත්ථං චරති**
**අත්තනො ච පරස්ස ච**
**පරං සංකුපිතං ඤත්වා**
**යො සතො උපසම්මති.**

යම් කෙනෙක් අන්‍යයන් කිපුණු බව දැන, සිහියෙන් යුක්තව සංසිඳේ නම් - නො කිපේ නම් ඒ අය තමාගේ ද අන්‍යයාගේ ද යන දෙදෙනාගේ ම අර්ථය පිණිස හැසිරේ යනු අදහසයි.

**ඉවසීමෙන් සැනසීම ලැබෙන බැව්.**

ඉවසීමට ප්‍රතිපක්ෂ - විරුද්ධ ධර්මය නම් **ක්‍රෝධය** යි. සමාජයෙහි ගැටෙන මනුෂ්‍යයාට උගත් නූගත් උත්තම අධම ලොකු කුඩා ආදි නොයෙක් තරාතිරමේ පිරිසකට මූණපාන්ට සිදුවන නිසා, ඒ ආශ්‍රය කරනු ලබන නොයෙකුත් අවස්ථාවල නොයෙක් දෙනාගෙන් සත්‍ය වූ හෝ අසත්‍ය වූ හෝ නොයෙක් කරුණු පිළිබඳව

Non-commercial distribution

තමාගේ සිතට පීඩා ගෙන දෙන වචන ද ක්‍රියා ද එමට ඇති විය හැකිය. ලෝකයෙහි කිසිම කෙනකුට තමා නිතර ගැටෙන ලෝකයෙන් හොඳක් ම දැකීමටත් ඇසීමටත් නො ලැබේ. වැඩි දෙයක් තබා ගමනක් යෑමට බස්රථයකට ගොඩ වුවහොත් ඇතැම් විට එහිදී ඒ ගමන අවසන් වීමට මත්තෙන් තමා අකමැති තමාගේ සිතට නොරුස්සන කර්ණකටුක වචන අනුන්ගේ නොමනා හැසිරීම් ආදි කොතෙකුත් දේ සිදුවිය හැකිය. ලෝකයෙන් එන එවැනි දුබලකම් නිසා තමාගේ සිතට ක්‍රෝධය නංවා - නැතහොත් චිත්තසන්තානයෙහි යටපත් වී ඇති ක්‍රෝධය මතුකොට ඒ අනුන්ගේ දුබල කම් අනුව තමා ද වෙනස් වන කෙනකු වුවහොත්, එය මහත් අරගලයකට මූණපෑමට හේතු වන්නකි.

එහෙයින් කෙනෙක් තමාට එරුෂ වචන පාවිච්චි කිරීමෙන් හෝ මොනයම් තමාගේ චිත්ත දූෂණයට හේතුවන වචන නිසා හෝ නොමනා හැසිරීම ආදිය නිසා හෝ තමා කිපී ඒවාට එකට එක කියා ගැන්මටත් පහර දීමටත් පෙළඹුණොත්, එයින් දෙපක්ෂයට ම විපතක් මිස සැපතක් දියුණුවක් නම් කිසි කලෙකත් නො සැලසේම ය. යමෙක් එවැනි අවස්ථාවන්හි දී,

**යො සා යස්ස ඩසෙ පාදං**  
**තස්ස පාදං න සො ඩසෙ**  
**එවමෙවහි දුව්ඨස්ස**  
**අදෙසොව පසංසිතො**

(රසවාහිනී)

යනුවෙන් දැක් වූ පරිදි 'යමෙක් තමාගේ පය බල්ලකු සැපූ කල, තමා ඒ බල්ලාගේ පය නො සපන්නාක් මෙන්, තමාට ආක්‍රෝශ පරිභව කිරීම් ආදි වශයෙන් හෝ පහරදීම් වශයෙන් හෝ කිපුණු තැනැත්තාට නො කිපීම ම පලි නොගැනීම ම බුද්ධාදි උත්තමයන් විසින් ප්‍රශංසා කරන ලදැයි - සලකා ඉවසීම පුරුදු පුහුණු කරතොත් ලෝකයෙහි කළහයක් අසමගියක් භේදයක් කොතැනකවත් ඇති නො වනු ඇත. මුළු ලෝකය ම සාමයෙන් සමගියෙන් යුක්ත වනු නො අනුමානය. ''**ඉවසීමෙන් සැනසීම ලැබේ**'' යන ආප්තෝපදේශය මෙහිලා සිහිපත් කළ යුතුය.

Non-commercial distribution

**ඉවසීම නිරෝගීවීමට ද හේතුවකි.**

යමෙක් එවැනි අවස්ථාවලදී ක්‍රෝධය තමන් තුළ ඇති කරගතහොත් ඔහු තුළ ඉවසීම ඇති නොවනු ඇත. අඳුරෙහි ආලෝකක් නැත්තාක් මෙනි. ක්‍රෝධයෙන් පිරුණු චිත්තසන්තානය අන්ධකාරයෙන් පිරුණු මන්දිරයක් වැන්න. අන්ධකාරයෙන් පිරුණු මන්දිරය ආලෝකවත් වීමට නම් ආලෝකය දැල්විය යුතුමය. එමෙන් ක්‍රෝධය නමැති අන්ධකාරයෙන් පිරුණු චිත්තසන්තානයෙහි මේ ඉවසීම නමැති ප්‍රදීපය දල්වා ආලෝකවත් කළහොත් ක්‍රෝධය නමැති අන්ධකාරය පහ වී චිත්තසන්තානය දීප්තිමත් වන්නේය.

එසේ නොවුව හොත් ක්‍රෝධය නමැති අන්ධකාරය නිසා මිනිසාගේ චිත්තසන්තානය - සිත පමණක් නොව, ඒ චිත්තයට නිඃශ්‍රය වස්තුව වූ හෘදය වස්තුගත ලෙය ද කාලවර්ණ වී, අන්ධකාර ස්වභාවයක් ම ඇති කෙරේ. හෘදය වස්තු ගත ලෙය නිරන්තරයෙන් ම සකල ශරීරයෙහි ම පැතිර යන නිසා ඒ හේතු කොට සකල ශරීරය දුර්වර්ණ වී, සිතෙහි මෙන්ම ගතෙහි ද අන්ධකාර ස්වභාවයක් ම ඇති කරයි. මෙසේ ක්‍රෝධය ගත සිත දෙකම විරූප කරන ධර්මයක් බැවින් නිතර ඒ ක්‍රෝධය තමන් තුළ මොන මොන හේතුන් නිසා හෝ ඇති වන්නට සැලසුවහොත්, ඒ අය ඒ හේතුකොට ගෙන වැඩි කලක් නො ගොස් ශරීර ගත ලේ විෂ වීම නිසා නොයෙකුත් රෝග පීඩා වලට ද භාජනය වනු නිසැකය. එහෙයින් නිරෝගව යහපත් ශරීර වර්ණය ද ඇතිව යහතින් ජීවත් වීමට පවා ඉවසීම මහෝපකාරී වන බැව් පැවසිය යුතුය.

**ඉවසීම ගුණධර්මයනට මූල ධර්මයකි.**

මනුෂ්‍යයාගේ උත්තමාංගය වූ හිස නැති කල, කවන්ධ රූපයෙන් (හිස සුන් සිරුරින්) කිසිම ක්‍රියාවක් කළ නො හැකිවාක් මෙන් ඉවසීම නමැති මේ උතුම් ගුණ ධර්මය යමකු තුළ නො මැති නම් ඔහු තුළ ශීල සමාධි ප්‍රඥාදි සෙසු උසස් ගුණධර්ම ඇති නො වන්නේය. ඉවසීමෙන් තොර වූ පුද්ගලයා තුළ ක්‍රෝධය බල පවත්වන බැවිනි.

Non-commercial distribution

**න පස්සති දිවා ලූකො**
**කාකො රත්තිං න පස්සති**
**ලුද්ධො දුට්ඨො ච මූළ්හො ච**
**අහො රත්තං න පස්සති**

බකමූණාට දවල් කාලයෙහි නො පෙනේ. කාකයාට රාත්‍රි කාලයෙහි නො පෙනේ. ලෝභය, කෝපය, මෝහය යන පාප ධර්මයන්ගෙන් යුක්ත වූවහුට රෑ දවල් දෙක්හි ම නො පෙනේ.

**'කුද්ධො අත්ථං න ජානාති' -'කුද්ධො ධම්මං න පස්සති'** ක්‍රෝධයෙන් යුක්ත වූ තැනැත්තේ අර්ථානර්ථයන් නො දනියි. කිපුණු තැනැත්තේ ධර්මාධර්මයන් නො දනියි. - යනාදි දේශනාවන් අනුව සලකා බලන කල, ක්‍රෝධය වූ කලී මනුෂ්‍යයාගේ ප්‍රකෘති සිහිය විකෘතියට පත් කර මිනිසා උම්මත්තකයකු බවට පමුණුවන පාප ධර්මයෙකි. එහෙයින් ද්වේෂයෙන් දූෂිත වූ ඔහු, ඇත්ත යුත්ත, කළ යුත්ත නො කළ යුත්ත, හොඳ නරක, ධර්මය අධර්මය ආදි කිසිවක් නො හඳුනන්නෙකි. එවැන්නකු තුළ දුශ්චරිතයෙන් වෙන්වීමටත් ගුණධර්මයෙන් යුක්තවීමටත් මහෝපකාරී වන හිරිඔතප් (විළිබිය) ශ්‍රද්ධා ස්මෘති ප්‍රඥාදි යහපත් ධර්මයන් සිතෙහි හට නොගන්නා බැවින් කෙසේ නම් දුසිරිතින් වැළකී උතුම් සුසිරිතෙහි යෙදෙත් ද? නො යෙදේමය. එහෙයින් වදාළහ:-

**සීලං සමාධි පඤ්ඤානං**
**ඛන්ති පධාන කාරණා**
**සබ්බේපි කුසලා ධම්මා**
**ඛන්ත්‍යායත්තතා ච වඩ්ඪරෙ**

සීල සමාධි ප්‍රඥාදි ගුණධර්මයනට ඉවසීම ප්‍රධාන කාරණයකි. මූල හේතුවකි. සියලු කුසල ධර්මයෝ ඉවසීම මුල්කොට වැඩෙත්.

**ඉවසන්නා සතුරන් දිනුවෙකි.**

අනාගාමි මාර්ගයෙන් ක්ලේශප්‍රහාණය නො කළ සියල්ලන් තුළ ම ක්‍රෝධය පවතී. එහෙයින් පුහුදුන් ලෝකයෙහි ක්‍රෝධයෙන් යුක්තව අනුන්ගේ අයහපතට හේතුවන සේ වරදක් නැතුව ද, අනුන්ට

Non-commercial distribution

හිංසා පීඩා කරන දුෂ්ටයන් ගෙන් පාපියන්ගෙන් එතරම් අඩුවක් නැත.

එවැනි ලෝකයක නිදහස්ව කලකෝලාහල වලින් තොරව ජීවත් වීමට ඇති එක ම උපාය ද අස්ථානයෙහි වුව ද එසේ තමන්ට හිංසා පීඩා කරන්නාගේ නො මනා ක්‍රියා හැකිතාක් ඉවසීමය. දුෂ්ටයකු කරන එවැනි ක්‍රියා යමෙක් නො ඉවසතොත් ඔහු ද එයටත් වැඩි දුෂ්ටයෙක් පාපියෙක් වනු නො අනුමානය.

නො ඉවසන තැනැත්තාට සමාජයෙහි මූණ පාන්නට වන ගැහැට අපමණය. අනුන්ගේ ඇණුම් බැණුම් රැවුම් ගෙරවුම් නො ඉවසා, ඇණුමට ඇණුමත්, බැණුමට බැණුමත්, රැවුමට රැවුමත්, ගෙරවුමට ගෙරවුමත්, කිරීමට තමා ද පෙළඹුනොත් ඔහුට ඒ නිසා අතින් පයින් පමණක් නොව, දඬු මුගුරු අවි ආයුධවලින් පවා පහර ලැබ මාරණාන්තික දුක්ඛයට හෝ මරණයට හෝ පැමිණීමට සිදුවන වාර බොහෝය. අනුන්ට පහර දීම් ආදිය නිසා බන්ධනාගාර ගතව අවුරුදු බොහෝ ගණනක් දුක් විඳීමට ද, එල්ලුම් ගසින් ජීවිතය අවසන් කිරීමට ද සිදුවන වාර ද බොහෝය. නො ඉවසන්නා මෙවැනි දරුණු විපාක රැසකට මෙලොව ම ලක්වී මෙලොවත් පිරිහී පරලොවත් පිරිහී අපා ගත වෙයි. යමෙක් ඒ සියල්ල,

**ඉවසන දනා රුදු යුදයට ජය කොඩි ය**
**මහමෙර උසුලනා මිහිකතටත් වැඩි ය**

යන පැරණි උතුමන් ගේ උපදේශයන් සිහිපත් කරමින් ඉවසතොත් හෙතෙම ඇවිළෙන ගින්නට පිදුරු නො දමා ගින්නට ජලය වත්කොට නිවන්නාක් මෙන් ඉවසීම නමැති උතුම් ගුණයෙහි පිහිටා සියලු කලහයන් සංසිඳවා ගෙන මෙලොව සතුරන් ගෙන් ගැහැටක් නො ලබා නිතර සුවසේ කල් යවයි. කල කෝලාහලාදිය නිසා නඩුහබ කීමට වියදම් කළ යුතු විශාල ධනය ද ඔහුට ඉතිරි වේ. එහෙයින් ඔහු සතුරන් දිනූවෙකි. මෙලොව ජයගත්තෙකි. එහෙයින් වදළහ. සංයුත්ත නිකායෙහි:–

Non-commercial distribution

**තස්සේව තෙන පාපියො**
**යො කුඩං පටිකුජ්ඣති**
**කුඩං අප්පටි කුජ්ඣති**
**සංගාමං ජෙති දුජ්ජයං**

යමෙක් ක්‍රෝධ කරන පුද්ගලයාට පෙරළා ක්‍රෝධ කෙරේ නම්, ඔහු පළමු කිපුණු පාපී පුද්ගලයාට ද වඩා පාපියෙක් වේ. කිපුණු තැනැත්තාට පෙරළා නො කිපෙන තැනැත්තා දිනීමට දුෂ්කර වූ ක්‍රෝධ සංග්‍රාමයෙන් දිනන්නෙක් ද වන්නේය.

''**පඤ්චිමෙ භික්ඛවෙ ආනිසංසා ඛන්තියා**'' යනාදීන් වදළ පරිදි 1 ඉවසන තැනැත්තා බොහෝ ජනයාට ප්‍රිය මනාප වීමය., 2 මිතුරන් බහුල බවය, 3 අපරාධ බහුල කොට නැත්තෙක් වීමය. 4 සිහියෙන් යුක්තව කලුරිය කිරීමය, 5 මරණින් පසු සුගතියක ඉපදීමය- යන ආනිශංස පසක්ම ඉවසන්නාට ලභා වේ. එබැවින් ඉවසන තැනැත්තා මෙලොව පමණක් නොව පරලොව ද දිනන්නෙකි.

**කකචූපමාවවාදය**

ඉවසීම මෙසේ මහත් අනුසස් ඇති උසස් ගුණධර්මයක් හෙයින් ම අප බුදු පියාණන් වහන්සේ මෙසේ ද වදළහ.

**කකචූපම ඔවාද ආදීනං අනුසාරතො**
**පටිසඞ්ඛ පහානාය සට්තබ්බං පුනප්පුනං**

හරස් කියත උපමා කොට ඇති අවවාදදීන් ගේ අනුසාරයෙන් ක්‍රෝධය නැති කිරීම පිණිස නැවත නැවත වෑයම් කළ යුතුය - යනු අදහසයි.

බුදුන් වහන්සේ විසින් වදළ හරස් කියත් උපමාව නම් මහණෙනි! සොරුන් විසින් අල්වා ධනය ඉල්ලමින් හරස් කියතින් අත්පා ආදිය කපන කල්හි ද, යමෙක් තමාගේ ශරීරය හරස් කියතින් කපන ඒ සොරුන් නැසේවා යි කියා හෝ සිතා ද්වේෂ කෙරේ නම් හෙතෙම මාගේ අවවාදය පිළිගන්නා වූ කෙනෙක් නො වේ යයි වදළ දේශනාවයි.

Non-commercial distribution

හරස් කියතෙන් තමාගේ ශරීරය කපන කල්හිද කෝපවන පුද්ගලයා උන්වහන්සේ ගේ අවවාදයට කීකරු නො වන්නෙක් යයි මෙසේ වදළ බැවින්, ඊට සිය දහස් වාරයෙන් කුඩා වූ යම් පාඩුවක් කිරීම නිසා හෝ නින්ද කිරීම නිසා හෝ පහරදීම වස්තුව පැහැර ගැනීම යනාදිය නිසා හෝ අනෙකකුට කිපෙන අය කෙසේ නම් බුඩාවවාදය පිළිපදින්නෝ වෙත්ද? නො වෙත් මැයි. පින්වත්නි! යමෙක් ඔබට වරදක් කළ කල්හි ද, කළ වරදක් සිහි වූ කල්හි ද මෙසේ සිහි කළ යුතු.

**වධකෙ දෙවදත්තම්හි - චොරෙ අංගුලිමාලකෙ**
**ධනපාලෙ රාහුලෙ චා පි - සබ්බත්ථ සම මානසො**

යනුවෙන් දැක්වූ පරිදි, මම වනාහි, තමන් වහන්සේ ගේ එකම ඖරසපුත්‍ර වූ රාහුල කුමාරයා කෙරෙහි ද, තමන් වහන්සේගේ පරම සතුරා වූ දේවදත්තයා කෙරෙහි ද, තමන් මැරීමට කඩුව ගෙන තමන් පසු පස ලුහුබැඳ ආ අංගුලිමාල නම් වූ මිනීමරු සොරා කෙරෙහි ද, තමන් නැසීමට ආ ධනපාල නම් වූ හස්තිරාජයා කෙරෙහි ද සමාන පැවතුම් ඇති - නො වෙනස් මෛත්‍රී කරුණා ඇති ශාන්තිනායක වූ බුදුන් වහන්සේ ගේ ශ්‍රාවකයෙක් වෙමි. ඒ උතුමාණන් ගේ අවවාදය නම් තමාගේ ශරීරය හරස් කියතින් කපන කල ද, ඒ පරම දුෂ්ටයන් කෙරෙහි පවා ක්‍රෝධ නො කොට ඉවසිය යුතු බවය. මෛත්‍රී කළ යුතු බවය. එබැවින් උන් වහන්සේගේ ශ්‍රාවකයෙක් වූ මට සුළු දෙයක් ගැන අනෙකකුට ක්‍රෝධ කිරීම නුසුදුසුය යි කල්පනා කළ යුතුය. එසේ කල්පනා කිරීමෙන් තමන් තුළ ඉවසීම ඇති කර ගැනීමට උත්සාහ කළ යුතුය.

**උතුම් ඉවසීම**.

**යො හවෙ බලවා සන්තො**
**දුබ්බලස්ස තිතික්ඛති**
**තමාහු පරමං ඛන්තිං**
**නිච්චං ඛමති දුබ්බලො**

යමෙක් බලවත් වූයේ නමුදු දුර්වලයා ගේ වැරදිවලට ශාන්තව ඉවසන්නේ නම්, එයම ශ්‍රේෂ්ඨ වූ ඉවසීමකි. බලයක් නැති දුබලයා

Non-commercial distribution

කරගත හැකි දෙයක් නැති කමින් කාහටත් හිස නමයි. (යටත් වෙයි) නිතර ඉවසයි.

තමා බලයෙන් හෝ ධනයෙන් පරිවාරාදි අන්‍ය කරුණු නිසා හෝ බලවතකුව සිටියදී දුබලයාගෙන් ලැබෙන ගැහැට ඉවසතොත් එය ම නියම ඉවසීම බව මෙයින් පැහැදිලි කරයි.

එබැවින් ලෝකයෙහි උගත්කම් ධනවත්කම් ආදි නොයෙක් කරුණු නිසා බලයට පැමිණ සිටින හැම දෙනම ඒ තම තමා ඇසුරු කරන දුබලයන් ගේ සුළු වරදක් ඇතත් එයට කිපී නො මනා ලෙස තළා පෙළා අනුන්ට තමන්ගේ බලය පෙන්වීමට උත්සාහ නො කොට, දුබලයන් අතින් සිදුවන විශාල වරදක් වුවද ඉවසිලිමත්ව ක්‍රියා කිරීම නුවණැත්තන්ට අයත් යුතුකමෙකැයි සිහි කළ යුතු.

**බොහෝ දෙන** ඉවසීමට කරුණක් නැති කල ඉවසීමට අති සමත්පීයහ. අනුන් අතින් සිදුවන සුළු වරදක් වුවද ඇතිවුවහොත් යක්ෂයකු මෙන් කොටියකු මෙන් පිස්සු වැටුණු බල්ලකු මෙන් අනුන්ට හිංසා පීඩා කිරීමට පෙළඹෙති. එය ඉතාම නිහීන ක්‍රියාවකි. වැදගත්කමත් පණ්ඩිතකමත් හැදුණු කමත් එසේ පලිගැන්ම, නො ඉවසීම නොවේ. ඉවසීම ම උතුම් පණ්ඩිත කමකි. වැදගත් කමකි. හැදුණු කමකි.

යම් මනුෂ්‍යයකු තුළ ඉවසීම නැත්නම් හෙතෙම නියම මනුෂ්‍ය-යෙක් නොවේ. යම් වැදගතකු තුළ ඉවසීම නැත්නම් ඔහු නියම වැදගතෙක් නොවේ. යම් පණ්ඩිතයකු තුළ ඉවසීම නැත්නම් ඔහු නියම පණ්ඩිතයෙක් නොවේ. යම් ගුණවතකු තුළ ඉවසීම නැත්නම් ඔහු නියම ගුණවතෙක් නොවේ. යම් ශ්‍රමණයකු තුළ ඉවසීම නැත්නම් හෙතෙමේ ද නියම ශ්‍රමණයෙක් නො වන්නේය. එහෙයින් වදළහ.

**''යො කොධනො පණ්ඩිතො සො න සාධු''**
**න හි පබ්බජ්තො පරූපඝාතී**
**සමණො හොති පරං විහෙඨයන්තො''**

**සැරියුත් හිමියන්ගේ ඉවසීම**

මෙහි ලා දම් සෙනෙවි **සැරියුත් හිමියන්ගේ චරිතය** හොඳ නිදසුනෙකි. උන්වහන්සේ ඉවසීම පුරුදු කළ **මහෝත්තමයෙකැයි**

Non-commercial distribution

රට පුරා පතළ විය. දිනක් උන්වහන්සේ සැවැත් නුවර වඩිනා වේලෙහි, එම කීමෙහි සත්‍යාසත්‍ය විමසනු කැමති වූ **එක් අශිෂ්ට බ්‍රාහ්මණයෙක්** හිමිහිට පිටුපසින් අවුත් ළං වී තද අතුල් පහරක් දුන්නේය. ඒ මහත් ප්‍රහාරය ලද, ඉවසන සුළු සැරියුත් හිමියෝ කිසිවක් නො දන්නාක් මෙන් එම පහර ඉවසා, මේ සිදුවූයේ කුමක් ද කියාවත් ආපසු හැරී නොබලාම විහාරයට වැඩියෝය. ඒ මෝඩ බමුණාගේ සිත සැලෙන්නට විය. ගත වෙව්ලන්නට විය. සකල ශරීරය ඩහදියෙන් තෙත් විය. ශෝකයට පත් ඔහු වහ වහා දුව ගොස් උන් වහන්සේගේ පා මුල වැද වැටී, ස්වාමීනි! මට කමා වී වදළ මැනවයි අයැද සිටියේය. සැරියුත් හිමියන් පින්වත! ඔබ මට කුමක් කෙළෙහි දැයි ඇසූ කල හිමියනි ! ඔබ හිමිගේ ඉවසීම විමසීම පිණිස අතුල් පහරක් දුනිමි. ඒ ගැන අනුකම්පා කර මට කමා වී වදළ මැනවයි බමුණා නැවතත් සැල කෙළේය.

එවිට **සැරියුත් හිමියෝ** යුෂ්මතා ඒ ගැන අමුත්තක් නො සිතන්න. මම යුෂ්මතාට ක්ෂමාව දෙමැයි වදළහ. එකල්හි බ්‍රාහ්මණයා මෙසේ පැවසීය. ස්වාමීනි! මට කමාවන සේක් නම්, හිමි, ඔබ මගේ නිවසට වැඩම කර මා විසින් පිළියෙල කරන මගේ දනය පිළිගත මැනවයි දනට ආරාධනා කෙළේය. සැරියුත් හිමියෝ ද එය ඉත සිතින් පිළිගෙන වදරා ඔහුගේ නිවසට වැඩම කර දන් වැලඳූහ. අළසව් සැරියුත් හිමියනට නිකරුණේ මෙවැනි අපරාධයක් කළැයි ඇසූ සැදැහැවත් බොහෝ දෙනෙක් කිපී බමුණාට තළා පෙළා මරන්නට දඬු මුගුරු ආදිය ගෙන ඒ අසල රැක සිටියහ. එපවත් ඇසූ සැරියුත් හිමියෝ ඔවුනට ද අවවාද කොට ඔවුන් සිය නිවෙස් කරා යැවූහ. මෙසේ සැරියුත් හිමියෝ තමන් වහන්සේට පහර දුන් සතුරාට පවා කමාව දී, ඔහුගේ නිවසට වැඩ දනුත් වළඳා ඔහුට සතුරුකමට ආ පිරිස පලවා හැර ඔහුගේ ජීවිතය ද රැක දීමෙන් ඔහුට සෙතක් ම සැලසූහ.

මෙසේ ම **සැරියුත් හිමියෝ** හිසකෙස් බෑ තවත් දිනක, සඳපහනෙහි වැඩ සිටියෝ, අහසින් යන එක් **මිථ්‍යාදෘෂ්ටික යක්ෂයෙක්** පහතට බැස උන්වහන්සේගේ හිසට බලවත් ටොකු පහරක් දුන්නේය. උන්වහන්සේ එය ද ඉවසා වදළ සේක. මෙසේ ඉවසීම පුරුදු කළ උත්තමයන් අතර **පුණ්ණ ස්ථවිරයන් වහන්සේ ගේ**

Non-commercial distribution

චරිතය ද ආදර්ශවත් වටිනා එකකි. එය ''**පාරමිතා ප්‍රකරණ** ''යෙහි ක්ෂාන්ති පාරමිතාව විස්තර කළ තැතින් දත හැකිය.

අප **බුදුපියාණන් වහන්සේ** පමණ ඉවසූ උතුමෙක් මේ මිහිපිට නැත. **චිඤ්චමානවිකාව** ගේ අභූත චෝදනාව, **සුන්දරී පරිව්‍රාජිකාව** මරා ගඳකිළිය පිටිපස මල්ගොඩ යට සඟවා තැබූ තිගණ්ඨයන්ගේ අස්ථාන චෝදනාව, **මාගන්ඩිය** ගේ බේබද්දන් ලවා කළ මහා පරිභවය ආදි ඉවසීමට ඉතාම දුෂ්කර කරුණුවලදී පවා ඒ සියල්ල මැනවින් ඉවසූ සේක. සියල්ල දත් උන්වහන්සේගේ ඉවසීම පුදුමයට කරුණක් නොවේ. බෝධිසම්භාර ධර්මයන් පූරන නුවණ නො මේරූ තිරශ්චීන යෝනියෙහි උපන් බොහෝ ආත්ම වලදී පවා උන්වහන්සේ ඉවසූ සැටි නොයෙක් අයුරින් ජාතක කථාවන්හි විස්තර වන හෙයිනි. වඳුරුව උපන් බෝසතාණන් වහන්සේ තමන් වහන්සේගේ හිස පොඩි කළ දුෂ්ටයාට පවා ක්‍රෝධ නො කොට ඉවසීමෙන් ඔහු කෙරෙහි අනුකම්පා කර, හිසින් ලේ ගලද්දීත් ගසින් ගසට යමින් ඒ දුෂ්ටයාට මග පෙන්වූ සැටි ''මහා කපි ජාතකය''පැහැදිලි කරයි. **ක්ෂාන්තිවාදී තාපසව** උපන් බෝසතාණන් වහන්සේට දෙ දහසක් කස පහර දෙවා අත් පා කන් නාසා කප්වා උන්වහන්සේට අපරාධ කළා වූ දුෂ්ට කලාබු රජු කෙරෙහි පිළිපන් අයුරු දැන ගැනීම සඳහා උන්වහන්සේගේ එම චරිතය මෙහිලා විස්තර කරනු ලැබේ.

**බෝසතාණන් වහන්සේගේ ඉවසීම**.

පෙර බරණැස් නුවර කලාබු නම් රජ කෙනකුන් රාජ්‍යය කරන කල්හි, අප මහබෝසතාණෝ අසූ කෙළක් ධනය ඇති බමුණු කුලයක උපන්නාහ. වැඩි විය පැමිණි එතුමා කුණ්ඩල කුමාරයෝ යයි පතළ විය. දෙමාපියන්ගේ ඇවෑමෙන් තමාට උරුම වූ විශාල ධනස්කන්ධය බලා "මගේ මාපිය මුතුන් මිත්තෝ මේ ධනස්කන්ධය මගේය මගේය යි කියමින් ලෝභයෙන් රැස්කර තබා ප්‍රවේසම් කරමින් සිට, ඒ සියල්ල දමා හිස් අතින් මිය ගියෝය. මා විසින් එසේ හිස් අතින් නො යා යුතුය. මේ ධනස්කන්ධය රැගෙනම යා යුතුය''යි මෙසේ සිතූ එතුමා ඒ සා විශාල ධනස්කන්ධය දුගී මගී යාචකාදීන්ට දන් දී සියල්ල නිම වූ පසු හිමවතට ගොස් පැවිදි විය.

Non-commercial distribution

හිමාල වනයෙහි ලුණුවලින් තොර වූ පලවැලින් තමාගේ ජීවිකාව පවත්වන උන්වහන්සේ කලක් ගතවූවාට පසු, ලුණු ඇඹුල් සේවනය පිණිස හිමවතින් නික්ම බරණැසට පැමිණියහ. එදින රජතුමා ගේ උයනෙහි විසූ උන්වහන්ස් පසුදා පිඩු පිණිස වැඩියෝ සේනාපතියාගේ නිවසටද වැඩියහ. සේනාපති තෙම උන්වහන්සේ කෙරෙහි පැහැද ගෙට වැඩමවා වඩා හිඳුවා තමන්ට පිළියෙළ කළ භෝජනයෙන් පුද ඉන් පසු ද සෑම දිනකම එහි වැඩම වන ලෙස ආරාධනය කෙළේය. උන්වහන්සේට නතර වීමට ද රජතුමාගේ උයනෙහි ම තැනක් පිළියෙළ කර දුන්නේය.

**කලාබු නම් වූ බරණැස් රජතුමා** සැඩ එරුෂ වූවෙකි. ගුණයෙන් හීන වූවෙකි. සම්පත්තියෙන් මත් වූ හෙතෙම ශීලාදි ගුණධර්මවලින් වැඩිහිටි ශ්‍රමණ බ්‍රාහ්මණාදීන්ගේ ගුණ නොදනිති. දිනක් හෙතෙම දෙ ඇස් රතු වන තෙක් සුරාපානය කොට මත්ව රකුසකු සේ නළඟනන් පිරිවරා ගෙන උයනට ගොස් මඟුල් ගල් පෝරුවෙහි වැතිර, තමාට ප්‍රිය කරන එක්තරා නළඟනකගේ උකුලේ හිස තබා නිදන්නට පටන් ගත්තේය. නළඟනෝ රජුගේ සිත් ගනු පිණිස නොයෙක් රැඟුම් දැක්වූහ. මඳ වේලාවකින් රජතුමා නිද්‍රෝපගත විය.

**නළඟනෝ** අප දැන් වෙහෙසීමෙන් කම් නැතැයි නැටීම නවතා තූර්‍යභාණ්ඩ ඒ ඒ තැන දමා මල් පල නෙලමින් උයන් සිරි විඳිමින් ඔබ මොබ ඇවිදින්නට වූහ. එකල්හි අප බෝසතාණන් වහන්සේ පැවිදි සුව විඳිමින් උයනෙහි ගසක් යට රන් පිළිමයක් සේ වැඩ උන්හ. ඒ දුටු නළඟනෝ බලවත් සොම්නසට පැමිණ, අපට වූයේ මහත් ලාභයෙක, රජතුමා නින්දෙන් අවදි වනතෙක් අපට බණක් ඇසිය හැකැයි උන්වහන්සේ පිරිවරා හිඳ ධර්මයක් දේශනා කරන ලෙස වැඳ ආරාධනය කළහ. බෝසතාණන් වහන්සේ ද ඔවුනට සුදුසු ධර්මයක් දේශනා කිරීමට ආරම්භ කළහ.

එකල්හි රජු හිස තබා හුන් ඒ දුෂ්ට ස්ත්‍රිය තමන්ගේ උකුල සොලවා රජ පිබිද වූවාය. **රජතුමා** පිබිද නළඟනන් නො දැක කිපී මෙහි හුන් වසලියෝ කොහි ගියෝ දැයි විචාළේය. තාපසයන් වෙත ගොස් බණ අසන බැව් රජහට සැලවිය. එයැසූ රජතුමා වඩාත් කෝප වී කෝපයෙන් දිලිසෙමින්, මගේ ස්ත්‍රීන් පිරිවරා සිටින ඒ කුට

Non-commercial distribution

තවුසාට හොඳ පාඩමක් උගන්වමියි කියමින් කඩුව දකුණින් ගෙන වේගයෙන් තාපසයන් හමුවට ගියේය. එකල්හි රජු කෝපයෙන් එන බැව් දුටු නළඟනෝ වහ වහා රජු ඉදිරියට ගියහ. රජුගේ ඉතා සිත් ගත් නළඟනෝ ඉදිරියට පැන රජු අතින් කඩුව පැහැර ගත්හ.

**කලාබු රජතුමා** බෝසතාණන් වෙත ගොස් මහණ! තෝ කිනම් වාදියෙක් දැයි විචාළේය. **බෝසතාණන් වහන්සේ** 'මහරජ! මම ක්ෂාන්තිවාදි වෙමියි කී සේක. රජතුමා ක්ෂාන්තිය යනු කුමක්දැයි විචාළේය. මහරජ! අනුන් විසින් ජාති ආදියෙන් ගටා බණින කල්හි ද, දඬු මුගුරු ආදියෙන් පහර දෙන කල්හි ද නො කිපෙන ස්වභාවය ක්ෂාන්තිය නමැයි බෝසතාණෝ පැවසූහ. **රජතුමා** මහණ! දැන් ඒ තා කියන ක්ෂාන්තිය තට ඇති දැයි බලන්නෙමැයි කියා වධකයා කැඳවීය.

**වධකයා ද** තමන්ට පුරුදු පරිදි තියුණු පොරවක් හා කටු සහිත කසය ද ගෙන, කහ වතක් හැඳ රත්මල් පැළඳ අවුත් රජු වැඳ, දේවයන් වහන්ස! කවරෙකුට කිනම් වධයක් දෙම් දැයි විචාළේය. මේ සොර තවුසා බිම පෙරළා කසයෙන් එක පැත්තකට පහර පන්සියය බැගින් පහර දෙදහසක් දෙවයි අණ කෙළේය. වධකයා ද එසේම කෙළේය. බෝසතාණන් වහන්සේගේ සම් මස් සිඳී ලේ ගලන්නට විය. රජතෙම නැවතත් මහණ! තෝ කිනම් වාදියෙක් දැයි ඇසීය. **මහරජ! මම ක්ෂාන්තිවාදී වෙමි**. මගේ සම ඇතුළත ක්ෂාන්තිය ඇතැයි සිතුයෙහි ද? එය සම ඇතුළත පිහිටා නැත. **මහරජ!** ක්ෂාන්තිය මගේ හෘදයාබ්‍යන්තරයෙහි පිහිටා ඇත. එය ඔබට දැකිය හැකි නොවේ යයි බෝසතාණෝ පිළිතුරු දුන්හ.

**වධකයා** නැවතත් දේවයන් වහන්ස! දැන් කුමක් කරම් දැයි රජුගෙන් ඇසීය. මේ සොර තවුසාගේ අත්දෙක සිඳ දමවයි රජ අණ කෙළේය. වධකයා බෝසතාණන්ගේ අත් දෙක පොරවෙන් ගසා කෙසෙල් බඩයක් සේ ඉවතට දැම්මේය. පා දෙක සිඳවයි අණ කළ කල්හි පා දෙක ද සිඳ දැම්මේය. බෝසතාණන් වහන්සේගේ ශරීරයෙහි අත්පා තිබුණු තැන්වලින් පයිප්ප වලින් වතුර ගලන්නාක් මෙන් ලේ ගලන්නට විය. දුෂ්ට රජු මෙපමණකින් නො නැවතී නැවතත් මහණ! තෝ තිනම් වාදියෙක් දැයි ඇසීය. මහරජ! **මම ක්ෂාන්තිවාදී** වෙමි. මහරජ! මගේ ශරීරයෙහි අත් පා පිහිටි තැන්වල

Non-commercial distribution

ක්ෂාන්තිය ඇතැයි සිතුවෙහිද? ඒ තැන්වල ක්ෂාන්තිය නැත. නො දැකිය හැකි ගැඹුරු ස්ථානයක එය පිහිටා ඇතැයි බෝසතාණන් වහන්සේ පිළිතුරු දුන්හ.

ඉක්බිති **රජ තෙමේ** මොහුගේ කන් දෙක සහ නාසය ද සිඳවයි අණ කෙළේය. වධකයා ද ඒ සියල්ල එලෙස ම කෙළේය. රන් කඳක් සේ බබලන බෝසතාණන් වහන්සේ ගේ ශරීරය ලේ තැවරුණ ලී කොටයක් මෙන් විය. දුටුවන්ගේ නෙත් සිත් කම්පා කරවන සුලු විය. නළඟනෝ තමන්ට ද කිනම් විපතක් වේ දැයි හයින් වෙව්ල වෙව්ලා උන්හ. රජතෙම නැවතත් බෝසතාණන් වහන්සේ ගෙන් මහණ! තෝ කිනම් වාදියෙක් දැයි විචාළේය. **මහරජ මම ක්ෂාන්ති වාදියෙක්මි**. මාගේ කන් නාසා පිහිටි තැන්වල ක්ෂාන්තිය ඇතැයි නො සිතව, ක්ෂාන්තිය වනාහි ඔබට දැකිය නොහැකි හෘදයාභ්‍යන්තරයෙහි ම පිහිටා ඇතැයි බෝසතාණෝ නැවතත් පිළිතුරු දුන්හ. රජ කුට තාපසය! තගේ ක්ෂාන්තිය තා ම තබා ගනුවයි කියා පපුවට ද පයින් පහරක් ගසා යන්නට ගියේය.

දුෂ්ට වූ රජු ගිය පසු සේනාපති ආදීහු පැමිණ දැහැමි තාපසයන් වහන්සේට කළ අපරාධය ගැන මහත් ශෝකයට පැමිණ හඬ හඬා කඳුළු සලමින් ශරීරයෙහි තැවරී තිබුණු ලේ පිසදමා තුවාල රෙදි කඩවලින් වසා එක් තැනක වඩා හිඳුවා, ස්වාමීනි! නුඹ වහන්සේගේ අත් පා කන් නාසා සින්ද වූ ඒ දුෂ්ට කලාබු රජු කෙරෙහි මිස අපකෙරෙහි නො කිපෙන සේක්වා. අපරාධ නො කළ අප කෙරෙහි කිපී මේ රට විනාශ නො කරන සේක්වා යි වැඳ යාඥා කළහ. එකල්හි බෝසතාණන් වහන්සේ මෙසේ වදාළ සේක:-

**යො මෙ හත්ථෙ ච පාදෙ ච**
**කණ්ණ නාසඤ්ච ඡෙදයි**
**චිරං ජීවතු සො රාජා**
**නහි කුජ්ඣන්ති මාදිසා**

යම් කලාබු නම් වූ රජ කෙනෙක් මාගේ දෙඅත් දෙපා කන් නාසයන් සින්ද වූයේ ද, ඒ රජ තෙම බොහෝ කාලයක් ජීවත් වේවා ! මා වැනි ක්ෂාන්තිය ඉවසීම බලය කොට ඇති නුවණැත්තෝ කිසිවකු කෙරෙහි නො කිපෙත් - යනු අදහසයි.

Non-commercial distribution

කලාබු රජතෙම බෝසතාණන් නො පෙනෙන තෙක් ගොස් උයන් දෙරටුව ළඟා වූ වහාම යොදුන් දෙලක්ෂ සතළිස් දහසක් ඝන වූ මේ මහා පොළොව, මෙවැනි දුෂ්ට අසත් පුරුෂයකු උසුලාගෙන සිටීම, තමා වැන්නකුට නුසුදුසු යයි කියන්නාක් මෙන් දෙබෑ විය. එකෙණෙහි ම අවීචි මහා නරකයෙන් මහා ගිනිජාලා නික්ම අවුත් රජුගේ ශරීරය වෙලා ගත්තේය. රජ උයන් දෙරටුවේහිදී ම පොළවට ප්‍රවිෂ්ඨව අවීචිමහා නරකයෙහි කල්ප ගණනක් දුක් විඳින සේ වැද හොත්තේය. බෝසතාණන් වහන්සේ ද එදිනම මිය ගොස් සුගතිගාමී වූහ. උන්වහන්සේගේ ගුණ දත් රජ පිරිස හා නුවර වැස්සෝ ද එක් රැස්වී හඬා වැළප මහත් උත්සවශ්‍රීයෙන් ශරීරය ආදාහනය කළාහුය.

## දුක් ඉවසීම ද උතුම් ඉවසීමකි.

තවද දෙලෝ වැඩ සාදගනු කැමැත්තන් විසින් සතුරන් ගෙන් පැමිණෙන පීඩා ඉවසීමට පුරුදු විය යුතුවාක් මෙන් ම ශීතෝෂ්ණ දෙකින් වන පීඩා ද සාගින්නෙන් පිපාසයෙන් වන පීඩා ද, මැස්සන් මදුරුවන්ගෙන් වන පීඩා ද, තවත් නොයෙක් දෙයින් වන පීඩාද ඉවසීමට පුරුදු කරගත යුතුය. තමාගේ මෙලෝ යහපත හා පරලොව යහපත පිණිස කළ යුතු දේ කිරීමෙහිදී ඇතිවන්නා වූ පීඩා ද බොහෝ වෙති. නො ඉවසන තැනැත්තා වනාහි ශීතලට බියෙන් ද කටයුතු අත්හරියි. උෂ්ණයට බියෙන් ද වර්ෂාවට බියෙන් ද ගින්නට බියෙන් ද කටයුතු අත්හරියි. බඩගිනිය පිපාසය කියාද කටයුතු අත්හරියි. මෙසේ කටයුතු අත්හරින්නා වූ තැනැත්තා දෙලොවින් ම පිරිහෙන්නේය.

ලෝකයෙහි දෙලෝවැඩ සාදගන්නා වූ මහෝත්තමයෝ දුක් ඉවසීමෙහි අති සමර්ත්ථයෝ ය. දුක් ඉවසිය නොහැකි කෙනකුට උසස් තත්ත්වයකට කිසි කලෙක නො පැමිණිය හැකි වේ. දුක්වලට බියෙන් දුක් නො ඉවසන්නා වූ තැනැත්තාට දුක් නො ඉවසීමෙන් සැප ලැබේ ද යතහොත් එසේ නොවේ. ඔහුට වඩ වඩාත් දුක් ම පැමිණේ. දුක් ඉවසන්නා වූ තැනැත්තාට ම සැපත ළඟා කර ගත හැකි වේ. එබැවින් වැඩ කැමැත්තන් විසින් දුක් ඉවසීමටද පුරුදු විය යුතුය. එවිට දෙලෝ දියුණුව ම ඔහුට සිදුකර ගත හැකි වන්නේ ම ය. එහෙයින්ම ඉවසීම උතුම් මඟුලකැයි ද වදාරණ ලදී.

Non-commercial distribution

## 28. උත්තමයන්ගේ අවවාද පිළිගැනීම.

දෙමාපියන් ගෙන් ගුරුවරුන් ගෙන් පණ්ඩිතයන් ගෙන් වැඩිහිටියන් ගෙන් ලැබෙන්නා වූ අවවාදයන් අනුශාසනාවන් ගෞරවයෙන් පිළිගන්නා ස්වභාවය''සොවචස්සතා''නම් වූ මංගල ධර්‍මය යි.

ලෝකයෙහි තථාගතයන් වහන්සේලා හැර සියල්ලම දැනගත් කෙනෙක් නැත. සාමාන්‍ය පෘථග්ජන සත්ත්වයෝ වනාහි දත් දෙයට වඩා සිය දහස් ගුණයෙන් නො දත් දෙයම ඇත්තෝ ය. එබැවින් මේ සත්ත්වයන් අතර නො වරදින කෙනෙක් ද නැත්තේය. කළ යුතු වූ යම් යම් දේ අමතක නො වන්නා වූ කෙනෙක් ද නැත්තේය. වරද නැති කෙනෙක්ද නැත්තේය. එහෙයින් වදාළහ :-

**කස්සච්චයා න විජ්ජන්ති**
**කස්ස නත්ථි අපාගතං**
**කො න සම්මොහමාපාදි**
**කොධ ධීරො සදා සතො**

මේ ලෝකයෙහි කවරකුගේ වරද නැත්තාහු ද, කවරකුගේ අපරාධ නැත්තාහු ද, කවරෙක් සිහි මුළාවට නො පැමිණේ ද ? කවරෙක් සියලු කල්හි පණ්ඩිත වේද, සිහියෙන් යුක්ත වේ ද? (නොවේය) යනු අදහසයි.

**අවවාද නො ලැබිය යුත්තකු නැති බැව්.**

ලෝක ස්වභාවය වනාහි සාමාන්‍ය පුද්ගලයන්ට දැන ගැනීමට ඉතා දුෂ්කර සේ වැසී පවත්නා දෙයකි. ලෝකයෙහි සත්ත්වයන් කරන්නා වූ කටයුතු අතර කිරීමෙන් මෙලොවට හෝ

Non-commercial distribution

පරලොවට කිසිම ශුභ ඵලයක් නො ලැබ ව්‍යර්ථවන්නා වූ කටයුතු ද ඇත්තේය. ව්‍යර්ථවීමෙන් පමණක් නො නැවතී අනර්ථයන් ද ඇති කරන්නා වූ කටයුතු ද ඇත්තේය. ආදියෙහි ශුභ ඵලයන් ඇතිකොට කෙළවර මහත් දුක් ගෙන දෙන කටයුතු ද ඇත්තේය. මෙලොව සැප ඇති කරදී මරණින් මතු අපාදුකට පමුණුවන කටයුතු ද ඇත්තේය. මෙලොව දුක් ඇති කර දී පරලොව මහත් සැපතට හේතුවන්නා වූ කටයුතු ද ඇත්තේය. මෙලොව පරලොව දෙක්හි ම සැප පිණිස පවත්නා කටයුතු ද ඇත්තේය. මෙලෝ පරලෝ දෙක්හිම දුක් ගෙන දෙන්නා වූ කටයුතු ද ඇත්තේය. තමන්ට පමණක් සැප පිණිස වී අනුන්ට දුක් පිණිස වන කටයුතු ද ඇත්තේය. අනුන්ගේ සැපයට හේතු වී තමාට දුක් පිණිස පවත්නා වූ කටයුතු ද ඇත්තේය. තමාට හා අනුන්ට යන දෙපක්ෂයට ම දුක් පිණිස හා සැප පිණිස පවත්නා වූ කටයුතු ද ඇත්තේය.

සත්ත්වයන් විසින් කරන්නා වූ කටයුතු මෙන් ම නො කර හරින්නා වූ ක්‍රියා ද බොහෝ ය. ඒ ක්‍රියා ද නො කිරීමෙන් වන්නා වූ අර්ථානර්ථයන් ගේ වශයෙන් යටකී පරිද්දෙන් ම ප්‍රභේද වන්නාහ. මෙසේ නානා ප්‍රභේද ක්‍රියාවන්ගෙන් ලැබෙන්නා වූ ඵලය සැම දෙනාට ම දැනගත නො හැකි වේ. එබැවින් කළ යුත්ත කිරීමට හා නොකළ යුත්ත දුරු කිරීමට **අනුශාසකයෙක්** හැමට ම වුවමනා වේ. තමාට වඩා දැනීම ඇත්තා වූ වැඩි හිටියන්ගේ අවවාදනුශාසනයන් නො පිළිගෙන තමාට හොඳ යයි වැටහෙන දෙයක් ම කරන්නා වූ නුවණ මඳ පුද්ගලයා දෙලොවින්ම පිරිහෙන්නේය. එබැවින් දෙලෝ වැඩ සිදු කරගනු කැමති සත්පුරුෂයන් විසින් උතුමන්ගේ අවවාදනුශාසනා ගෞරවයෙන් පිළිගත යුතුය. ඒ ස්වභාවය දෙලොව සැපතට හේතුවන බැවින් උතුම් මංගලයෙකි.

**සියල්ල දත් බුදුන් වහන්සේ පවා ගුරුවරයකු සෙවූ බැව්.**

ලෝකයෙහි ඇතමෙක් උතුමන් ගේ අවවාදනුශාසනයන් නො සලකා තමාට වැටහෙන පරිද්දෙන්ම ක්‍රියාකොට මෙලොවින් ද පිරිහී මරණින් මතු අපායට ද යෙති. ඇතමෙක් තමා අන්‍යයන් ගෙන් ගුරුපදේශ ලැබීමට නුසුදුස්සම්හ යි සිතා අවවාදනුශාසනා ඇසීමට

Non-commercial distribution

නොකැමති වෙති. යමකු අනුශාසනා කිරීමට සූදනම් වුවද එයට තදින් ම විරුද්ධ ද වෙති. එය ඒ පුද්ගලයන් තුළ පිහිටි මහත්ම අනුවණ කමෙකි. ලොකු ම මුළාවෙකි.

සියල්ල දත්තා වූ කිසි තැනක සිහි මුළාවීමක් නැත්තා වූ තථාගතයන් වහන්සේ පවා **"සම්‍යක් සම්බුද්ධත්වයට ගුරුවරයකු නො මැතිව විසීම දුකෙක. මා විසිත් ද යම් කිසිවකු ගුරු තනතුරෙහි තබා ගරු බුහුමන් කරමින් විසිය යුතුය"**යි සිතා තමන් වහන්සේ ගේ ආචාර්‍යත්වයට සුදුස්සකු සෙවීම පිණිස තුන්ලොව ම බලා වදාළ සේක.

එකල්හි තථාගතයන්වහන්සේ තමන් වහන්සේ විසින් ගරු බුහුමන් කළ යුත්තකු තබා තමන් වහන්සේ හා සම වූවකු වත් තුන්ලෙව්හි ම නො දැක "මා විසින් සාරාසංඛ්‍ය කල්ප ලක්ෂයක් මුළුල්ලෙහි පැරුම් දම් පුරා යම් ධර්‍මයක් අවබෝධ කර ගන්නා ලද්දේ ද ඒ ධර්‍මය ම ගුරුකොට ඒ ධර්මයට ම සත්කාර සම්මාන කරමින් ගරු කරමින් වෙසෙමි" යි ඉටා ගත් සේක. ඒ බව බ්‍රහ්ම සංයුත්තයෙහි ගාරව සූත්‍රයෙහි මෙසේ එයි.:–

"එවං මෙ සුතං එකං සමයං භගවා උරුවෙලායං විහරති නජ්ජා නෙරඤ්ජරාය තීරෙ අජපාල නිග්‍රොධෙ පඨමාභිසම්බුද්ධො. අථ බො භගවතො රහොගතස්ස පටිසල්ලීනස්ස එවං චෙතසො පරිවිතක්කො උදපාදි, දුක්ඛං ඛො අගාරවො විහරති අප්පතිස්සො. කන්නුඛ්වාහං සමණං වා බ්‍රාහ්මණං වා සක්කත්වා ගරුකත්වා උපනිස්සාය විහරෙය්‍යන්ති, - පෙ- නඛො පනාහං පස්සාමි සදෙවකෙ ලොකෙ සමාරකෙ සබ්‍රහ්මකෙ සස්සමණබ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය අත්තනා විමුත්තිඤාණ දස්සන සම්පන්නතරං අඤ්ඤං සමණං වා බ්‍රාහ්මණං වා යමහං සක්කත්වා ගරුකත්වා උපනිස්සාය විහරෙය්‍යං, **යන්නූනාහං ය්වායං ධම්මො මයා අභිසම්බුද්ධො තමෙව ධම්මං සක්කත්වා ගරුකත්වා උපනිස්සාය විහරෙය්‍යන්ති.**"

මෙසේ සියල්ල දත් බුදුන් වහන්සේ පවා අවවාද දයකයකු සෙවූ කල, දත් දෙයට වඩා සිය ගුණයෙන් දහස් ගුණයෙන් දස දහස් ගුණයෙන් නොදත් දැය ඇත්තා වූ සාමාන්‍ය පුද්ගලයෝ කෙසේ නම් අවවාද ලැබීමට නුසුදුස්සෝ වෙත්ද? සුදුස්සෝ වෙත්මය.

Non-commercial distribution

**කෙබඳු කෙනකු ගේ වුව ද**
**හොඳ අවවාද පිළිගත යුතු බව.**

ලැබිය යුතු ගුරූපදේශ ඇත්තේ තමාට වඩා උසස් අයගෙන් පමණක් ම නොවේ. තමාට වඩා පහත් පංතියේ අයවලුන් ගෙන් ද ලැබිය යුතු බොහෝ උපදේශ ඇත්තේය. තමාගේ ඇසට තමාගේ ඇස නො පෙනෙන්නාක් මෙන් උගතුන්ටද තමාගේ වරද නො පෙනෙන අවස්ථා බොහෝ ය. නමුත් උගතුන්ගේ ඒ වරදවල් සමහරවිට නූගතුන්ට පෙනේ. එබැවින් තමාට වඩා පහත් කෙනකු විසින් මුත් යම් අවවාදයක් අනුශාසනයක් කෙළේ නම් නූගතාගේ වචන යයි සලකා ඒ ගැන පරිභව කොට එය ඉවත දැමීමට යුහුසුළු නො විය යුතුය. සමහර විට නූගතුන් ගෙන් උගතුන්ට ද, දරුවන්ගෙන් මව්පියන්ට ද, ශිෂ්‍යයන්ගෙන් ගුරුනට ද, ළදරුවන්ගෙන මහල්ලන්ට ද වටිනා උපදේශයෝ ලැබෙත්.

එබැවින් කවරකු වුවත් තමහට අවවාදයක් අනුශාසනයක් කළහොත් ඒ ගැන සලකා බැලිය යුතුය. සූර්‍ය්‍යයාගේ මහත් වූ ආලෝකයක් ඇතත්, සූර්‍ය්‍යයාට ආලෝක නො කළ හැකිව පහන්වලින් ආලෝක කරන්නා වූ තැන් ද ඇත්තේය. එමෙන්ම මහ පඬිවරයනට නො පෙනී තිබී නූගතුනට පෙනෙන කරුණු ද වෙති. සමහරු තමාට පහත් යයි සම්මත කෙනකු අවවාදයක් අනුශාසනයක් කළහොත් "මෙයත් මට ගුරුකම් දෙන්නට ආවේ නොවේ දැ" යි කිපෙති. කලහයට යෙති. එය පරම අනුවණ කමෙකි.

කවුරුන් හෝ තමාට උපදේශයක් දුනහොත් ඒ ගැන කෘතඥ විය යුතුය. නො කිපිය යුතුය. කාගෙන් වුව ද සදුපදේශයක් ලදහොත් එය ගෞරවයෙන් පිළිගැන්ම, නුවණැත්තවුන් ගේ ධර්‍මයකි. එබැවින් සත් හැවිරිදි සාමණේර නමකගේ අවවාදය මුදුනින් පිළිගත්, මේ ශාසනයෙහි බුද්ධශ්‍රාවකයන් ගෙන් නුවණැත්තවුන් අතරෙන් අග තනතුරු ලත්, අගසව් තනතුරු ලත්, ධර්‍ම සේනාපති යන අර්ථාන්විත විශේෂ ගරු නාමයකින්ද සම්මාන ලත්, **ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ** ගේ චරිතය මෙහිලා හොඳම නිදසුනකි. ( එය යට 'නිවාත ගුණය' විස්තර කළ තැන සවිස්තරව ඇත. ) **කුඩා රාහුල ස්වාමීන් වහන්සේ ද** මෙහිදී සිහිපත් කළ යුතුය. තමන්ගේ

Non-commercial distribution

පියාණන් බුද්ධරාජ්‍ය කරද්දී, තමන් වැනි මහේශාක්‍ය රාජකුමාරයකු පැවිදි වී, මේ එක් එක් කෙනා කියන කරන හැම දෙයක් ම මට කළ හැකි දැයි මොහොතකටවත් උන්වහන්සේ නො සිතූහ. තමන්ට කවරකුගෙන් හෝ අවවාදයක් අනුශාසනයක් ලද හොත්, එය දුගියකුට නිධානයක් පෙන්නූ කලෙක මෙන් බලවත් ප්‍රීතියකට පැමිණ දෙහොත් මුදුන් දී පිළිගත් සේක. උන්වහන්සේ අවවාද පිළිගැන්මට කෙතරම් කැමතිව සිටි සේක් ද යන්න, දිනපතා විහාර භූමියෙහි දී දෑත පුරා වැලි ගෙන මට අද මේ වැලිවල ප්‍රමාණයට අවවාද ලැබේවා යි වැලි උඩ වීසි කරන බව සඳහන් වී තිබීමෙන් දත හැකිය.

**අවවාද ලැබීමට නොව භික්ෂූන්ට**
**අවවාද දීමට සූදානම් වන ඇතැම් පිංවතුන්.**

කරුණු මෙසේ වුවද මෙකල ඇතමෙක් යහපත් වූ අවවාද අනුශාසනයන් දෙන්නා වූ කල්‍යාණ මිත්‍රයන් සේවනයට නො කැමති වෙති. එබඳු හිතකාරී පුද්ගලයන් ගෙන් ඈත්වන්නට ම උත්සාහ කරති. එය මහත් වූ පිරිහීමකි. තමාගේ ඇති වරද නො සඟවා පෙන්වා දී අවවාද කරන සත්පුරුෂයන් අමාරුවෙන් වුව ද සොයා සේවනය කළ යුතුය. ලොවට අනුශාසනා කරන ඇතැම් අනුශාසකයන් වහන්සේලා ද දයකයන්ගේ සිත් නරක් වුවහොත් තමාට වන ලාභය නැතිවේය, නැතහොත් තමාට පාඩු කෙරේය යන බියෙන් ඇතැම් දයකයන් කරන පව්කම් ගැන නො තකති. ඇතැම් විට අනුමත ද කරති. එය ඒ අයට කරන්නා වූ මහත් අනර්ථයකි. යමෙක් යම් වරදක් කෙරේ නම් එය යටපත් නො කොට එය ම නැවත නැවත දක්වමින් අනුශාසනා කිරීම අනුශාසක උතුමන්ගේ යුතුකමකි. එබඳු උතුමනට අනුවණයෝ කලකිරෙත් මුත් සත්පුරුෂයෝ වඩ වඩා පහදිති.

**මේ කාලයේ බොහෝ ගිහි මහත්වරු ද** භික්ෂූන් වහන්සේලා ගෙන් අවවාද අනුශාසනා ලැබීමට නොව, භික්ෂූන් වහන්සේලාට අනුශාසනා කිරීමට සූදානම්ව සිටිති. ඇතැම් විට ඔවුහු ලෝකයෙහි ඇතිතාක් දුශ්චරිතයන්හි ඇලී ගැලී වෙසෙමින්, භික්ෂූන් වහන්සේ-ලාගේ වරදක්ය යි නො කිවයුතු තරම් ස්වල්ප වරදක් දැක ද භික්ෂූන්

Non-commercial distribution

වහන්සේලාට දෙස් පැවරීමට ගැරහීමට පෙළඹෙති. ඔවුන්ගේ අදහස ''භික්ෂූන් වහන්සේ සුවඳ දුම් අල්ලමින් මල් පුදනු ලබන ධාතු කරඬුවක් මෙන් එක තැනකට වී නිසොල්මන්ව ඔවුනට වැඳීමටත් පිදීමටත් හොඳම හැටියට ශීලයම සම්පූර්ණ කරමින් විසිය යුතු බවත්, තමන් ඕනෑම දුශ්චරිතයක් කොට ඒ ශීලවන්ත භික්ෂූන් වහන්සේට දන් ටිකක් දී ඒ අනුහසින් ඒ භික්ෂූන් වහන්සේගේ මුවාවෙන් නැතහොත් උන්වහන්සේගේ සිවුරේ එල්ලී දිව්‍ය ලෝකයටත් දුකින් මිදී නිවන් පුරයට යෑමටත්ය.'' එය නම් ලොකු ම මුළාවක් බව එවැනි අය විසින් තරයේ ම සිහිපත් කළ යුතුය.

දුසිරිතින් වෙන් නොවී ඉඳහිට දන් ටිකක් දීමෙන් සුගතියක් නම් ලැබීම සිදු නොවන්නක් බැවිනි. දුසිරිත් පුරමින් ශීලවන්තයන්ට දන්දෙන එවැනි අයට හිමි වන්නේ මරණින් මතු බල්ලෙක්ව, ගොනෙක්ව, අශ්වයෙක්ව, ඇතෙක්ව, හොඳින් කන්නට බොන්නට ඉන්නට හිටින්නට ලැබීමය. දිව්‍යලෝකවල හෝ මනුෂ්‍ය ලෝකයක හෝ හොඳ උප්පත්තියක් ලබන්නට නම් පළමුකොට ''**සීලෙ පතිට්ඨාය නරො සපඤ්ඤො**''යනාදීන් වදළ පරිදි උතුම් ශීලයෙහි පිහිටිය යුතුමය.

'**සීලයෙහි පිහිටා සියල්ල කිරීමේ චාරිත්‍ර ධර්මය**' ඇති වී තිබෙන්නේ ද මේ කාරණය මුල් කර ගෙනය. එහෙත් එයින් උගන්වනු ලබන්නේ ඇතිතාක් දුසිරිත් පුරමින් නිතර කල් යවා ඒ වේලාවෙහිත් ඇතැම් විට කට ගණනක් බීගෙන ඇස් දෙක ද රතු කරගෙන සිටින අතරම නමට පන් සිල් සමාදන් වීම නොව, ජීවිතය ඒ දුසිරිත් වලින් මුදවා, ඒවායින් ඈත්ව සිල්වතකු ලෙස ජීවත් විය යුතු බවය. එසේ සිල්වතකු ලෙස දවසරින බෞද්ධයාට එතරම්ම උසස් ගුණැති උසස් ම සිල් ඇති භික්ෂූන් වහන්සේලාම තමන්ගේ දන්ටික දීමට වුවමනා නැත. ශීලයෙහි පිහිටි ඔහු විසින් කරන ඉතාම ස්වල්ප වූ ද පින්කම පවා දිව්‍ය ලෝකයෙහි මනුෂ්‍ය ලෝකයෙහි බොහෝ සැප සම්පත් ලැබීමට පවා සමර්ථවන බැවිනි. එසේ සිල්වත් වූ තැනැත්තා විසින් දුශ්ශීලයාට කිසිම ශීලයක් නැති ගුණයක් නැති දුගියකුට මගියකුට දෙන දනය ද මහත්ඵල මහානිශංස වේ මය. එහෙයින් වදළහ:–

Non-commercial distribution

**යො සීලවා දුස්සීලෙසු දදාති දානං**
**ධම්මේන ලද්ධං සුපසන්න චිත්තෝ**
**අභිසද්දහං කම්ම ඵලං උළාරං**
**සා දක්ඛිණා දායකතො විසුජ්ඣති.**

සිල්වත් දායකයා විසින් දුශ්ශීල ප්‍රතිග්‍රාහකයකුට දෙන දානය **දායකයා**ගේ යහපත් බව නිසා මහත්ඵල මහානිශංස දායක වේ. යනු එහි අදහසයි.

**වෙසතුරු රජතුමා** හට නිර්ගුණ වූ ජූජකයාට දන් දී පොළොව පවා කම්පා කළ හැකි වූයේ ද, ලොව්තුරු බුදු බව පවා ලැබිය හැකි වූයේ ද දායකයාගේ ගුණය නිසා දානය මහත්ඵල වන බැවිනි. කරුණු මෙසේ හෙයින් දුසිරිත් පුරමින් දන් දීමට ශීලවන්තයන් සොයන්නවුන් විසින් මේ කාරණය මැනවින් සිතට ගත යුතුය.

'තමන් ශීලවන්තයකු වී තමාගේ ගැලවීම - දුකින් මිදීම තමා විසින් ම කරගැන්මය' නුවණැති තැනැත්තා විසින් බලාපොරොත්තු විය යුත්තේ. අනුන්ගේ අනුහසින් තමන්ගේ ගැලවීම බලාපොරොත්තු වීම පරම අනුවණකමෙකි. අනුන් රකින ශීලයෙහි නියම තත්ත්වය ඒ රකින අයට විනා අන් කිසිම කෙනකුට දැන ගැන්ම නො කළ හැකි බැවිනි. එහෙයින් තමන් පරම ශීලවන්තයෙකැයි සිතා දන් දෙන ප්‍රතිග්‍රාහකයා ඇතැම් විට පරම දුශ්ශීලයකු විය හැකිය. එබැවින් දන් දීමට ශීලවන්තයන් සොයා රට පුරාම යෑමට වඩා නුවණට හුරු දෙය නම්, තමා ශීලවන්තයකු වී ලද කෙනකුට දන් දීමය.

Non-commercial distribution

## 29.ශ්‍රමණයන් වහන්සේලා දැකීම

**ශ්‍රමණයන් වහන්සේ** වනාහී තිරිසනුන්ගේ ඇස් වලට ද පෙණෙන්නාහුය. එසේ ඇසට පෙනුණු පමණකින්ම වන්නා වූ යහපතක් හෝ අයහපතක් හෝ නැත. එබැවින් මෙහි '**දැකීම** ' යන්නෙන් අදහස් කරනු ලබන්නේ එසේ වූ පෙනීම නොවන බව දත යුතුයි.

මේ ශ්‍රමණයන් වහන්සේලා මෙබඳු වූ ශීලාදි ගුණයන්ගෙන් යුක්තයහයි නුවණින් දැන, ඒ මහෝත්තමයන් කරා එළඹ දන්දීම, වතාවත් කිරීම , උන්වහන්සේලා ගෙන් අවවාද අනුශාසනා ලබාගැනීම, උන්වහන්සේලා අනුව පිළිපැදීම, ගුණදම් වැඩීම, ආශ්‍රය කිරීම,උන්වහන්සේලා නිතර සිහි කිරීම යනාදිය ' ශ්‍රමණයන් දැකීම් යන්නෙන් අදහස් කරනු ලැබේ.

මේ කාලයෙහි බොහෝ බෞද්ධයෝ තිරිසනුන් දක්නා පරිද්දෙන්ම මසැසින් ශ්‍රමණ රූපය පමණක් දක්නාහු නමුත් නුවණැසින් ශ්‍රමණයන් නො දකිති. එබැවින් ඔවුහු හිස මුඩු කොට සිවුරු හැඳ පොරවා සිටින කවිරුනුත් එක සේ ම සිතති. සලකති. කාටත් වැඳුම් පිදුම් කරති. එසේම ශ්‍රමණ වේශධාරියකු යම් වරදක් කළ විට ද දුටු දුටු සියලු භික්ෂූන්ට ම දෙස් නඟති. නින්දා අපහාස කරති. වරද කරුවා ශ්‍රමණයෙක්ද? නැතහොත් හිස මුඩු කළ ශ්‍රමණ චෞරයෙක්ද? කියා මෙහොතකටවත් කල්පනා නො කරති. එහෙයින්ම ඔවුහු ඇතැම් විට නියම භික්ෂූන් වහන්සේට අස්ථානයෙහි නින්ද අපහාස කොට බොහෝ පව් රැස් කර ගනිති. එසේම ශ්‍රමණ ප්‍රතිරූපකයන්ට ද රැවටී බොහෝ ධනය හානි කර ගනිති. මෙයට මූලික හේතුව **සිංහලයා තුළ** විශේෂයෙන් බෞද්ධයා තුළ මුල් බැස ගත් එක් දුර්වල කමෙකි. එනම් **ස්වල්ප මාත්‍රයකින් පැහැදීමක්**

Non-commercial distribution

**අපැහැදීමත් ය**. ඒ දුර්වලකම මගහැර ගැන්ම පිණිස මතු දක්වන මහඟු අවවාදය දැන ගතයුතු :–

**කෙනකු පහසුවෙන් හැඳින ගත නොහැකි බැව්**

> **"න වණ්ණ රූපෙන නරො සුජානො**
> **න විස්සසෙ ඉත්තර දස්සනේන**
> **සුසඤ්ඤතානං හි ව්‍යඤ්ජනේන**
> **අසඤ්ඤතා ලෝකමිමං චරන්ති"**

(සංයුත්ත නිකාය)

පැහැයෙන් හෝ සටහනින් මිනිසා හැඳින ගැනීම පහසු නැත. මඳ කලක් දැකීම් මාත්‍රයෙන් කෙනකු විශ්වාස නො කළ යුතුය. හික්මුණු තැනැත්තන්ගේ සිල්වතුන්ගේ වේශයෙන් මේ ලෝකයෙහි නො හික්මුණු අය ද හැසිරෙති ය - යනු එහි අදහසයි.

මෙම දේශනාවෙන් අද බෞද්ධ ලෝකයාට උගත යුතු වූ දැනගත යුතු වූ වටිනා කරුණු රැසක් විදහා දක්වනු ලැබේ.

අද අපේ අවිචාරවත් බෞද්ධයා දුටු දුටු තැන භික්ෂූන් විවේචනයට සූදානම් වේ. ඒ විවේචනය දස දිගින් ඇසේ. එම විවේචනයන් කිරීමට ඔවුනට වැඩි කාලයක් වැඩි පරීක්ෂණයක්ද අවශ්‍ය නැත. ඕනෑම කෙනෙකු දුශ්ශීලයෙක, ශීලවන්තයෙක කියා නිගමනය කිරීමට ගත වන්නේ ඇතැම් විට විනාඩි ගණනකි. නැතහොත් තත්පර ගණනකි. එහෙත් අප බුදු පියාණන් වහන්සේ යට කී ගාථාවෙන් වදාළේ දුටු පමණින් ඇසූ පමණින් එවැන්නක් නො කළ හැකි බවය. කොසොල් රජතුමාට ඒ කාරණය වැඩි දුරටත් විස්තර කරනු පිණිස මෙසේ ද වදාළහ. කෝසල සංයුත්තයෙහි :–

**"සංවාසෙන ඛො මහාරාජ! සීලං වෙදිතබ්බං තඤ්ච ඛො දීඝෙන අද්ධුනා න ඉත්තරං, මනසි කරොතා නො අමනසිකරොතා, පඤ්ඤවතා නො දුප්පඤ්ඤේන"**

යම් කිසිවකුගේ තතු නිවැරදි ලෙස දත හැකි වන්නේ දීර්ඝ කාලයක් ළඟින් ආශ්‍රය කිරීමෙන් ය. එසේ ආශ්‍රය කිරීමෙන් දතහැකි

Non-commercial distribution

වන්නේ ද විමසිලිමත් ව නුවණින් ආශ්‍රය කරන නුවණැති අයට පමණකි. - යනු එහි තේරුමයි.

එහෙයින් අප බුදුන් වහන්සේ නියම ශීලවන්තයෙක් ද නියම ගුණවන්තයෙක්ද කියා දැන ගැන්මට උන්වහන්සේ ආශ්‍රය කළ වේදත්‍රය සහිත ශාස්ත්‍රාන්තරයෙහි විශාරද බුද්ධිමතකු වූ **උත්තර මානවක** නමැති මහා පඬිවරයාට පවා උන්වහන්සේගේ සෙවනැල්ල මෙන් බුදුන් පසු පසම පුරා සත්මසක් යමින් එකට එක ගඳකිළියෙහි පවා වාසය කිරීමට සිදු වූ බව **දීඝ නිකායෙහි** එන සූත්‍රයකින් ප්‍රකට වේ.

එය එසේ නම් භික්ෂු ජීවිතය පිළිබඳ කිසිම දැනුමක් නැති, අද සිටින නූගත් බෞද්ධයාට කෙසේ නම් භික්ෂුවක් දුටු පමණින් හැඳින ගත හැකි ද? නො හැකි මය.

සමහර විට දුර්වර්ණ සිවුරු පෙරවීම, අපිරිසිදු ලෙස සිටීම, පාත්‍රය අතේ තිබීම, බිම බලා ගෙන යාම, පියවි ගමනින් නො ගොස් පියවර මැනීම, මේ ආදී ලක්ෂණ කෙනකු සිල්වතෙකැයි නිගමනය කිරීමටත් , පිරිසිදු සිවුරක් පෙරවීම අතේ කුඩයක් තිබීම, පිරිසිදු ලෙස සිටීම, පාවහන් පයලා යෑම, බෑගයක් අතේ තිබීම, කඩිසර ගමන මේ ආදි ලකුණු දුශ්ශීලයෙකැයි නිගමනය කිරීමටත් අපේ බෞද්ධයන් ලකුණු වශයෙන් සලකන අවස්ථා ද නැත්තේ නොවේ.

බුදුන් වහන්සේ යට කී දේශනයන්ගෙන් වදළේ එවැනි සුළු දෙයකින් කෙනකුගේ චරිතයේ හොඳ නරක මිනිය නොහැකි බවය. ඒ එසේමය, රාත්‍රි කාලයෙහි ගෙවල් බිඳීම, මං පැහැරීම වැනි දමරික ක්‍රියා කරන අන්ත දුශ්ශීලයකුට වුව ද මිනිසුන්ට පෙණෙන සේ දවල් කාලයෙහි ගසක් යටට හෝ සොහොනකට හෝ වී හොඳ කෙනකු ලෙස කාලවර්ණ චීවරධාරීව බිම බලාගෙන අතපය නො සොල්වා මහරහතකු ලෙස බුම්මාගෙන වුව ද සිටීම එතරම් දුෂ්කර නො වනු ඇත.

**පෙර වනයෙහි** විසූ තාපස නමකට තිරිසනුන්ගෙන් ලැබුණු සත්කාර සම්මාන දුටු වැද්දෙක් සිත් සේ දඩයම් කිරීමට ඇති හොඳම උපාය නම් සිවුරක් පොරවාගෙන එක තැනක වාඩි වී සිටීමයයි සලකා එසේ කිරීමෙන් බොහෝ කාලයක් වැඩි අපහසුවක් නො

Non-commercial distribution

මැතිව සිය අදහස මුදුන් පමුණුවා ගත් අයුරු '**ජාතක**' පොතෙහි එන පුවතකින් හෙළිවේ. බලවත් වර්‍ෂාපතනය නිසා ශීතලයෙන් විඩාවට පත් **එක් වඳුරෙක්** තාපසවරුන්ගේ ආශ්‍රමයට පිවිස ගිනි තැපීමේ අදහසින් ඉවත දැමූ පැරණි කහවතක් අහුලා ගෙන පොරවා තාපසයන් රවටා ආශ්‍රමයට වැදීමට තැත්කළ අයුරු පැවසෙන පුවතක් ද '**ජාතක**' පොතෙහි ම සඳහන් වේ.

කරුණු මෙසේ හෙයින් යම්තම් ඇසූ දුටු පමණකින් යමකුගේ චරිතය පිළිබඳ හොඳ නරක තීරණය කිරීමට යුහුසුලු නොවිය යුතු.

**ලෝකයේ හැටි.**

**සමාජය විවිධය. විෂමය. භින්නරුචිකය.** එවැනි සමාජයක ජීවත්වන භික්ෂුවට ඒ සමාජයෙන් දෙස් පරොස් නො අසා සිටින ලෙස කල් යැවීම එතරම් පහසු ද නැත.

**කෙනෙක්** පිරිසිදුකම අගේ කොට උසස් කොට සලකති. ඔවුහු සමාජයෙහි වෙසෙන ගැටෙන භික්ෂුව පිරිසිදු කමින් තොරව හිස රැවුල් වවාගෙන සිටිනු දුටුවහොත් "අනේ මේ උන්නාන්සේ වැඩි දෙයක් තබා පවිත්‍රතාවය ගැනවත් හරි හැටි නො දත්තෙකැ"යි අවමන් කරති. වැඩි පිරිසිදු කමක් නැති දුර්වර්ණ සිවුරක් පොරවා සිටිනු දුටුවහොත් "වැඩිදෙයක් තබා උන්නාන්සේ හැදිවත වත් පවිත්‍රකර ගැන්මට නොදත්තෙකැ"යි අපවාද කියති.

**එකෙක්** කඩිසරකම උසස් ගුණයක් ලෙස සලකති. ඔහු වැඩි කඩිසරකමක් නැතිව හිමිහිට යන භික්ෂුවක් දුටොත් "මේ උන්නාන්සේ යන්න එන්න වත් බැරි ලෙඩෙකැ" යි අවඥා කෙරෙති.

නිතර ප්‍රීතිමත් ව කල් යවන **අනෙකෙක්** උපශාන්ත ගුණයෙන් යුත් භික්ෂුවක් වෙත පැමිණි කල, වැඩි කථාවක් බහක් නොමැතිව ඒ භික්ෂුව සිටියොත් 'අර උන්නාන්සේ ලෝක චාරිත්‍රයවත් නො දත්තෙක, කෙනකු පැමිණි කල ඉටු කළ යුතු වූ සතුටු සාමීචි කථා මාත්‍රය වත් නොදත්තෙකැ' යි හෙලා දකිති.

උපශාන්ත ගුණය අගේ කොට සලකන **තවෙකෙක්** වැඩිපුර කථා කරන භික්ෂුවක් වෙත පැමිණි කල, සුවදුක් විචාරීම ආදි සතුටු

Non-commercial distribution

සාමීචියෙහි යෙදුනොත් ''අර උන්නාන්සේ මා හැමදම පැමිණි කල තිකම් වල්බූත දෙඩවනු විනා කිසිම දිනයෙක බණ පදයක් නම් නො කියතැ''යි පවසති. එවැනි අය යම් භික්ෂුවක් කඩිසර ගමනින් යනු දුටහොත් ''අර උන්නාන්සේ කිසිම හික්මීමක් නැති අයෙකැ''යි තෙපලති.

**ඇතැමෙක්** 'පවිත්‍රකම' යනු කුමක්දැයි නො දනිති. ඔවුහු වහන් පය ලන්නේ සනීපාරක්ෂාව සලකාගෙන නොව, පයට පළඳනාවක් - සැරසීමක් වශයෙනි. ඔවුන් එහෙයින්ම පාවහන් පළඳන්නේ , පාවහන් පාවිච්චි කළ යුතු පයින් යා යුතු ගමනකට නොවේ. පාවහන් වුවමනා නැති තිවසෙහි සිටම වාහනයකින් යන ගමනකටය. එවැනි අය යම් භික්ෂුවක් සෞඛ්‍ය සංරක්ෂණය පිණිස පාවහන් පයලා යනු දුටොත්, පිරිසිදු සිවුරක් පොරවනු දුටහොත්, උපැස් යුවළක් පැළැඳ සිටිනු දුටුවහොත්. "අර උන්නාන්සේ ගේ සෙරෙප්පු කුට්ටමේ හැටි බලව්! සිවුරේ හැටි බලව්! කණ්ණාඩි කුට්ටමේ හැටි බලව්!" මේ ආදි වශයෙන් ඇනුම් පද කීමට පසුබට නොවෙති. කුලී රියකින් වත් ගමනක් යනු දුටු කල "අර උන්නාන්සේ මුදලාලි කෙනකු වාගේ යන හැටි පෙනේ ද? සැපට," යයි පවසති.

මෙවැනි විවිධ විෂම අදහස් දරන්නන්ගෙන් පිරුණු ලෝකයක භික්ෂූන් වහන්සේ අපවාද නො අසා ජීවත් වන්නේ කෙසේ ද? **"කථා කරලත් බැරි ය. නොකරත් බැරිය. බොල කනෝ. ළිඳ"** යයි කථා කිරීමේ ආදීනව දැක කථා නොකර සිටීමට අධිෂ්ඨාන කරගත් එක්තරා භික්ෂූන් වහන්සේනමක් අන්ධයකු ළිඳක වැටීමට ළංවනු දැක පැවසූ, පූර්වෝක්ත වචනය මෙහි දී ප්‍රස්තාව පිරුළක් හැටියට සිහිපත් කිරීම වටී.

**තාපස කලබලය**

ආගම ධර්මය පිළිබඳව කිසි ම දැනුමක් නැති අවිචාරවත් බෞද්ධයා යමක් දුටු මතින් පැහැදීමෙහි සමතෙකි. පසුගිය කාලයෙහි රට කැළඹූ තාපස කලබලයට හේතුව ද ඒම ය. ඔවුන්ගේ රූක්ෂ පැවැත්ම දුටු බොහෝ දෙන එකවරට ම ඔවුන් රහත් යයි සිතූහ. එසේ ම භික්ෂූන් වහන්සේට ගැරහීම පිණිස කළ කී දෑ ද

Non-commercial distribution

ඇතැම් බෞද්ධයෝ සත්‍ය ලෙස ම පිළිගත් හ. ඇසූ පමණින් හෝ දුටු පමණින් කිනම් දෙයක් ගැන වුව ද තීරණයකට නො පැමිණිය යුතු බව බුද්ධ ධර්මයෙහි යට කී පරිදි හොඳ හැටි උගන්වා තිබියදීත් රටේ බොහෝ දෙනකුන් කිසි ම වග විභාගයක් නො මැතිව තාපසයන් සරණ ගියේත්, ඔවුන් පසු පස දිව්වේත් ඔවුනට සත්කාර සම්මාන කෙළේත්, ඇතැම්විට භික්ෂූන් වහන්සේට දුන් දන්වේල පවා අතැර දැම්මේත්, එපමණකින් නො නැවතී භික්ෂූන් වහන්සේට නොමනා ලෙස පරිභව කළේත්, අවිචාරවත් කමත් නූගත් කමත් එකට අත්වැල් බැඳ ගැන්මෙන් ඇති වූ දුවන්නන් වාලේ දිවීම නිසා බැව් කිව යුතුය

**"දුරදිග නොබලා කිසි ම ඉවක් බවක් නැතිව දුවන්නන් වාලේ දිවීම ද. සිංහලයා තුළ දක්නට ලැබෙන දුබල කමෙකි**. එය පිරිහීමේ ලකුණකි. ඇතැම් විට මහත් ව්‍යසනයට පවා හේතුවන්නකි. මෙයට හොඳ නිදසුනක් අපේ ජාතක පොතෙහි සඳහන් වේ.

**පෙර වනයෙහි බියසුලු හාවෙක් විසී ය**. මේ මහ පොළව පෙරළී ආවොත් කුමක් කරම්දැයි ඔහු නිතර සිතීය. දිනක් ඉදී ගිලිහී ගසකින් පතිත වූ ගෙඩියක්, වියළී බිම වැටුණු තල් අත්තක් මත වැටිණ. එම ශබ්දය ඇසූ බියසුලු හාවා 'පොළොව පෙරළෙතැ' යි යන හැඟීමෙන් බිය පත්ව දුවන්නට විය. මෙසේ බියෙන් තැතිගෙන දුවන හාවාගෙන් කරුණු විචාළ සෙසු හාවෝ ද ලෝකය පෙරළීගෙන එතැ' යි දුවන්නට වූහ. හාවුන්ගෙන් ඒ පුවත ඇසූ මුව ගෝන ආදී සෙසු සිව්පාවෝ ද දුවන්නට වූහ. මේ කාරණය නිසා මුළු වනයෙහි ම වුසූ ලොකු කුඩා සියලු සත්ත්වයෝ ද එම භයෙන් තැතිගෙන දුවමින් මහත් කරදරයකට පැමිණියහ. තාපසයන් නිසා ඇති වූ කලබලය ද මෙයට නො දෙවෙනි බැව් නො කිවමනාය.

## තාපසවරුන්ගේ ලොව පහළවීම

ඉපදීම දිරීම මැරීම ආදි නොයෙකුත් දුක්වලින් පිරුණු එකකි ලෝකය. ඒ දුකින් මිදීමේ උපාය සොයන ලෝකයෙන් එතෙර වනු කැමති නුවණැති සත්පුරුෂයෝ ලෝකයෙහි ඇතැම් විට පහළ වෙති. ලෝකය ගැන කලකිරුණු එවැනි උත්තමයකු බුදු සසුන නැති යම්

Non-commercial distribution

අවස්ථාවක ලොව පහළ වූණි නම්, ඒ අය දුකින් මිදීම පිණිස ලෝකයෙන් එතරවීම පිණිස පිළිපන් මාර්ගයෙකි, පිළිවෙතකි, තාපස පැවිද්ද. එය අශාසනිකය, අනෛර්‍යාණිකය, එහෙයින් එය සර්ව සම්පූර්ණ ද නැත. එය කුසගින්නේ පෙළෙන්නකුට හොඳ ආහාරයක් නැතත්, නො ලදත් අල බතල කොස් දෙල් ආදි යම්තම් අහරක් ලදොත් එයින් යම්තම් කුසගින්න නිවාගන්නාක් මෙන් හොඳ මඟක් නැතිකම නිසා පිළිපන් මඟකි.

සියල්ල දැන වදළ බුදුන් වහන්සේ දුකින් මිදීමේ නියම මාර්ගය අවබෝධ කොට දුකින් නිදහස් වූ උත්තමයාණ කෙනෙකි. එහෙයින් ඒ පිණිස උන්වහන්සේ ශාසනික පැවිද්ද දෙවා වදාරා මහා සංඝ රත්නය ලොව පිහිට වූ සේක. ඒ ශාසනික පැවිදිකම ලැබිය හැක්කේ මහණ උපසම්පදව ඇති භික්ෂූන් වහන්සේ වෙතිනි. යමෙක් ඒ පැවිද්ද එසේ ලබත් ද ඒ හැම එතැන් සිට සංඝරත්නයට ද ඇතුළති. ලෝකයෙහි පරම දුර්ලභ වූ බුද්ධ ශාසනය ඇති කලක ඒ බුදු සසුනෙහි ලැබිය යුතු වූ පැවිද්ද පරම දුර්ලභ වූ හෙයින් ම උසස් වූ, තාපස පැවිද්දට වඩා සිය දහස් වාරයෙන් වටිනා වූ එකකි.

යට කී තාපස පැවිදි බව ලබන තැනැත්තා ශාසනයෙන් බැහැර වූවෙකි. නිමිල වූ බුදු සසුන පවත්නා කාලවල එවැනි තාපසවරුන් ඇතිවීමේ සිරිතක් නැත. එහෙත් යමකුට වුවමනා නම්, තාපස පිළිවෙත් අනුව එය කළාට ඇති වරදක් ද නැත. එසේ හෙයින් බුදුසසුන නිමිලව පවත්නා මෙවැනි අවදියක යමෙක් තමන්ම සිවුරු පොරවා ගෙන අපි තාපස පැවිද්දෝ වම්හ යි කියමින් උදන් අනතත්, එය කෑමට ඕනෑ තරම් හොඳ ආහාර පාන තිබියදී කොස් දෙල් අල බතල කෑම වැනි මුග්ධ ක්‍රියාවෙකි.

**තාපසයන්ට නියමිත**
**අඳුම් හා වේශය කුමක්ද?**

හොඳ හෝ වේවා නො හොඳ හෝ වේවා යමෙක් ඒ තාපස ජීවිතය ගත කිරීමට කැමති නම් ඒ අයට නියමිත වෙන් වූ තාපස පරිෂ්කාර ඇත. ඇඳිය යුතු පෙරවිය යුතු පිළිවෙළ ද ඇත. භික්ෂූන් වහන්සේට නියම වූ චීවරය ඔවුනට අයිති නැත. තුන් සිවුරෙන්

Non-commercial distribution

දෙපොට සිවුර තාපසයනට තබා ශාසනික නියම මහණකම ලද සාමණේරනමට පවා අයිතියක් නැත. තුන් සිවුර පමණක් නොව භික්ෂු වේශය ද තාපසයනට අයිති නැත. එහෙයින් යමෙක් ඒ ශාසනික චීවරය තමන් ම පොරවා ගතහොත් භික්ෂු වේශය සොරාගත් බැවින් ඔහුට **'ලිංගත්ථේනක'** වේශය පැහැරගත් තැනැත්තා, **සිවුරු හොරා** යනු බුදුන් වහන්සේ දෙවා වදළ නාමයයි. ඔහු එසේ කිරීමෙන් බරපතල වරදක් ම කරන ලදී. ඒ වරද කෙතරම් විශාල වූවක් ද යනු ඔහුට දෙවා වදළ දඬුවම අනුව සිතාගත හැකිය. එයට දුන් දඬුවම නම් එසේ හිතුවක්කාර ලෙස යමකු සිවුරු පොරවා ගතහොත් ඔහු නැවත සසුන් ගතකිරීමට ශාසනික නියම මහණකම දීමට පවා අභව්‍ය පුද්ගලයකු ලෙස අනු දැන වැදැරීමය.

**ඔවුනට භාවිත කළ යුතු නාමය කුමක්ද?**

මෙසේ නොමනා ලෙස සිවුරු පොරවා ගත් තැනැත්තාටත් ඔහු විසින් පසුව සිවුරු පෙරවූ ඔහුගේ ශ්‍රාවකයන්ටත් මහණකමක් නැත. එසේ නම් ඔවුනට ඇති ශීලය කුමක්ද? ඇතැම් විට ඔවුනට ගෘහස්ථ දශ ශීලය රැකීමට ඉඩ තිබේ. එහෙත් ඔවුනට දසසිල් උපාසකවරු යයි කීමට ද පුළුවන් කමක් නැත. සිවුරු දරා සිටින බැවිනි. ගෘහස්ථ දශසීලය රකින්නවුනට ද සිවුරු පරිභෝගය සුදුසු නැත. භික්ෂුවක් සේ පෙරවීම ද සුදුසු නැත.

ශාසනයෙහි භික්ෂු භික්ෂුණී උපාසක උපාසිකා යන සිව් පිරිසකි, ඇත්තේ. ඉන් පිටත් තාපස පිරිසක්ය කියා 'පස්වැනි කොටසක් පොතපතෙහි කොතනක වත් සඳහන් නැත. එහෙයින් ඒ තාපසයන් යයි කියන කොටස ඇතුළත් වන්නේ දසසිල් ඇතත් උපාසක පිරිසට මය. එය එසේ නම් දශසිල් රකින උපාසකවරුන්ට සිවුරු පාවිච්චිය තහනම් බව නොදන්නා කෙනෙක් නැත. මේ කාරණයෙන්ද ඔවුන් කරන්නේ අනුන්ට අයත් චීවරය ගැනීමෙන් ලොකු ම වරදක් බව නො පෙනේ ද?

එසේ නම් තාපස යන නාමය ඔවුනට සුදුසු ද? තාපසවරුන්ට නියමිත තාපස පිරිකර ඔවුනට නැති නිසාත් තාපසවරුන්ගේ වේශය ඔවුනට නැති නිසාත් එය ද භාවිත කිරීම උගහටය. කරුණු මෙසේ හෙයින් මේ ශාසනික සිවුරු පමණක් නොව ශාසනික

Non-commercial distribution

වේශය ද සොරා ගත් මොවුනට කිවයුතු නාමය කුමක්ද? ඇත්ත වශයෙන් කියතොත් බුදුන් වහන්සේ වදළ යට දැක් වූ ලිංගත්‍රෛනක, සිවුරු හොරා යන නාමය විනා වෙන කිවයුතු, කිව හැකි අර්ථාන්විත නාමයක් නැත.

## ඔවුන්ගේ ගුණධම් හා භාවනාව

කිනම් ගුණධර්මයක් පිළිවෙතක් හෝ පිරීමටත් ඒ පිළිබඳව දැනුමක් තිබිය යුතුම ය. ශාසනික සාමණේරකම් ආරක්ෂා කිරීමට පවා ඒ පිළිබඳ කලක් උගෙනීමෙනුත්, ආශ්‍රයෙන් හා දැක පළපුරුද්දෙනුත් එය කළ යුතුය. එසේ කිසිම උගෙනීමක් නොලත් කෙනකු අල්වා සිවුරක් කරේ දැමූ පමණින් ඔහු එකවරට ම යම්කිසි උසස් ප්‍රතිපත්තියක් රක්නා බැව් කිව් පමණින් එය පිළිගත හැකි කරුණක්ද?

එසේම ඔවුන් භාවනා කරනවා යයි කියතත් එයට ද හොඳ උගෙනීමක් අවශ්‍යය ය. අනෙක් සෑම වැඩකට ම වඩා සිත හික්මවා ගැන්ම වූ භාවනාවට හොඳ දැනුමක් තිබිය යුතුම ය. සිවුරක් කරට දැමූ පමණින් එයට සුදුසු යි එය නිසි ලෙස කරතැයි සිතතොත් එයත් ලොකුම මූළාවකි.

තවද නො දැනුම් කම නිසා හිතුවක්කාර ලෙස සිවුරු පොරවා ගත් මුත් ඔවුන් උසස් ලෙස ගුණ ධම් රකින පිරිසක් නම්, එවැනි ගුණධම් පූරණය හොඳින් කළ හැක්කේ වනගතව හෝ වෙනයම් විවේකස්ථානයක හෝ නතරව කලබල වලින් තොරව නිවි හැනහිල්ලේය. ඔවුන් එසේ නොව මහ පාර දිගටත්, ගමින් ගමටත්, නගරයෙන් නගරයටත් යමින් රට පුරා ඇවිදිමින් මිනිසුන් වටකරගෙන මහා කෝලාහලයක විලාශයෙන් කලබල සහිතව, භික්ෂූන් වහන්සේට ද ගරහමින් හැසුරුණු නිසා ඔවුන් රැකි ගුණධම්යක් ගැන සිතීමට දුෂ්කරය. ඔවුන් එසේ හැසිරීමෙන් සිතා ගත හැක්කේ, එය ගුණදම් රැකීමක් නොව, අනුන්ට ගැරහීමට යෙදූ උපක්‍රමයක් බවය. බුදුසසුන වැනසීමට මාන බලමින් නොයෙකුත් කුට උපක්‍රම යොදන ශාසන නාශක පිරිසකගේ සංවිධානාත්මක වැඩ පිළිවලක් බවය.

*Non-commercial distribution*

**ඔවුන්ගේ පැවැත්ම කුමක් ද?**

ඔවුන්ගේ පැවැත්ම ද ඔවුන් කරේ දමාගෙන සිටින අර්හත්ධජයයි නම් ලත් චීවරයට නො හොබනා එකකි. සිවුරු පරිහරණය කළ යුත්තේ ඒ සිවුරට අගෞරයක් නොවන ලෙසට ය. ඔවුහු අතන මෙතන දූවිලි ගොඩවලත් ඒ සිවුරු පොරවා ගෙන, හරකුන් මඩවලෙහිත් බල්ලන් අළු ගොඩෙහිත් ලගින්නා සේ ලගිති. ඇතැම් විට ඔවුනට වැසිකිලියක් නැත. දෙවීමට ජලයක් නැත. එහෙත් ඔවුන් කරේ තිබෙන්නේ සිවුරකි. අහෝ සිවුරට කරන නින්දවක මහත.

බුදුන් වහන්සේ ආභ්‍යන්තරික පාරිශුද්ධිය යම් පමණකට උසස් ලෙස සැලකු සේක්ද, එපමණට ම බාහිර පාරිශුද්ධිය වූ පිරිසුදු කමද ලොවට උගන්වා වදළ උත්තමයෙකි. හැදීම පෙරවීම හිඳීම නිදීම ගමන බිමන කෑම බීම දත්මැදීම මුව දෙවීම අත් පා සේදීම නෑම කෙළගැසීම මල මුත්‍ර කිරීම හිස රැවුල් කැපීම සිවුරු සේදීම ආදි කුඩු මහත් ක්‍රියාද, වළඳන තැන නිදන තැන ලිප ගිනි මොළවන තැන නහන තැන මල මුත්‍ර පහ කරන තැන ආදි හැම කුඩු මහත් දෙයක් ම ද සෞඛ්‍යයට අහිත කර නොවන ලෙස තැබීමටත්, සමාජයට පිළිකුල් නොවන ලෙස කිරීමටත් අනු දැන වදළ ශික්ෂාපද සංඛ්‍යාව ම අති විශාලය.

භාවනා කරන යෝගී භික්ෂුව පාරිශුද්ධිය ගැන වඩාලාත් සැලකිය යුතු බව විශේෂයෙන් වදරන ලදී. සිත එක අරමුණක පවත්වා බවුන් වඩන -භාවනා කරන තැනැත්තාට තමාගේ ශරීරයෙන් පිටවන දහඩිය ගඳ පවා බලවත් දූර්ගන්ධයක් ලෙස ප්‍රකටව දැනෙන්නාක් මෙන් ම, හැඳ පෙරවි වස්ත්‍ර වල දූර්ගන්ධයද, අවට ඇති දූර්ගන්ධය ද ප්‍රකටව දැනේ . එසේ දුගඳ හමන කල තමන්ගේ සිත ඒ දුගඳ කෙරෙහි දුවන නිසා යෝගාවචර භික්ෂුවට සිත එකහව තබා තමන් කරන භාවනාවෙහි යෙදීමට පුළුවන් කමක් නැත. එහෙයින් නියම යෝගාවචර භික්ෂුව සමාජයෙහි වෙසෙන භික්ෂුවට ද වඩා හොඳින් නිතර නහා සිවුරු පිරිසිදු කොට, තමන් සිටින තැන අවට පිරිසිදු ලෙස තබා ගත යුතු බව නො කිව මනාය. එය එසේ නම් දින ගණන් සති ගණන් නෑමක් නැතිව, කිසිම පිරිසිදු

Non-commercial distribution

කමක් නැතිව, දුහද හමන ශරීර ඇතිව, දුහද හමන වස්ත්‍ර ධාරීව, පවිත්‍ර කමක් නැතිව අතන මෙතන ලගින ඔවුන්ගේ භාවනාව කෙතරම් දුරට සාර්ථක වී ඇද්දැයි මදක් විමසිය යුතුය.

## පමණට වඩා දුක් විඳීමත් ගුණයක්ද?

තාපසවරුන් යයි කියාගන්නවුන් අව්වේ වියළෙමින්, වැස්සේ තෙමෙමින් යන නිසා ඔවුන් තුළ ඉතාම හොඳ ශීලයක් ගුණ ධර්මයක් ඇතැයි ඇතැම්හු සිතති. විශ්වාස කරති. බුද්ධ කාලයෙහි සිටිය ඇතැම් කපටි තවුසන් ජීවත් වූයේ ඇඟපුරා තබා විළි වසා ගැනීමට පවා වස්ත්‍රයක් නොමැතිව ය. ඔවුන් එයට හේතු වශයෙන් දැක්වූයේ, වස්ත්‍රයකට වත් ආශාවක් ඔවුන් තුළ නැති බවය. **ඇතැමෙක්** දෙපය බිම තැබුවේ නැත. මාරුවෙන් මාරුවට එක පයකින් සිටි ඔවුන් පැවසුවේ, ඔවුන් තුළ පවත්නා රහත් ගුණය වැඩිකම නිසා දෙපය බිම තැබුවහොත් මහ පොළවට ඔවුන්ගේ ගුණය දරන්නට ශක්තියක් නැත, එහෙයින් එක පයකින් සිටිමි ය කියා ය. **තව කෙනෙක්** මිනිසුන් අනුභව කරන ආහාර පාන අනුභව කළේ නැත. ඔවුහු ඌරන් බල්ලන් මෙන් අසූචි අනුභව කළහ. **ඇතැම් කෙනෙක්** මද්ධ්‍යාහ්න වේලාවෙහි ගිනි ගොඩවල් හතරක් හතර පැත්තෙන් ලං ලංව අවුළවා ඒ මැදට වී, අවට ගිනි ජාලා සතරකිනුත් උඩින් සූර්‍ය රශ්මියෙනුත් යන පඤ්ච තාපයෙන් ශරීරය තැවූහ. එයට පඤ්ච තාපයෙන් කෙලෙස් තැවීම යයි ඔවුහු කීහ.

## බුදුන් වහන්සේ වදාළ මධ්‍යම ප්‍රතිපදාව කුමක්ද?

යට කී ලෙස ශරීරයට කොතෙකුත් දුක් දෙමින් ගවයකු මෙන් හැසිරීම වූ ගෝව්‍රතය - ගව ශීලය, සුනඛයකු - බල්ලකු සේ හැසිරීම වූ සුනඛ ව්‍රතය, එළුවකු ලෙස හැසිරීම වූ අජව්‍රතය ආදී නා නා ව්‍රත සමාදානයෙන් ද කෙලෙස් තවා නික්ලේශී භාවය - කෙලෙස් රහිත බව- රහත් බව නො ලැබිය හැකි බව ද එය නුවණ මඳ වූවන් ගේ මෝඩ ක්‍රියාවක් බව ද, සාවුරුද්දක් පුරා දුෂ්කර ක්‍රියා කිරීමෙන් ලද අත්දැකීම් අනුවම ප්‍රත්‍යක්ෂයෙන් දැන වදාළ බුදුන් වහන්සේ ඒ හැම **‘අත්තකිලමථානුයෝගය’** නම් වූ නො පිරිය යුතු නො වැඩිය

Non-commercial distribution

යුතු එක් අන්තයක් - සීමාව ඉක්ම වූ නොමනා හැසිරීමක් බව ද වදාරා, පමණට වඩා පස්කම් සැපෙහි ගිජුව ඇලීම වූ **කාමසුඛල්ලිකානු යෝගය,** අනෙක් අන්තය බව ද වදාරා, මේ අන්ත දෙකම පිළිකුල් කොට දැක්වූ සේක. මධ්‍යම ප්‍රතිපදාවෙහි ම පිහිටා කෙලෙස් නැසිය යුතු බව ද වැඩි දුරටත් වදාළ සේක. විස්තර දනු කැමතියන් විසින් **දම්සක් පැවතුම් සූත්‍රය** බලා දැන ගත යුතු.

මෙසේ බුදු වී වදාළ ප්‍රථම මංගල ධර්මදේශනාවෙහි ම ඉර හඳ සේ ප්‍රකට ලෙස, පමණට වඩා කයට දුක් නො දිය යුතු බව ම වදාළ හෙයින් දුක් විඳීමම උතුම් ගුණයක් ලෙස රහත් බවක් ලෙස සිතතොත් එය කෙතරම් අනුවණ කමක්ද? කෙතරම් හාස්‍යජනක ක්‍රියාවක්ද?

## ආරණ්‍ය සේනාසන හා භික්ෂූන් වහන්සේලා.

මෙම ශ්‍රමණ කථාවෙහි දී කිවයුතු තවත් වැදගත් කරුණෙකි. ඇතැම් බෞද්ධයෝ සමහර විට ආරණ්‍ය වල වැඩ සිටින ඇතැම් භික්ෂූන් දැක ''අපේ මේ පන්සල් වල වසන ඇත්තන්ට අර ආරණ්‍යයෙහි සිටින ඇත්තන්ට මෙන් ඉන්නට බැරි මොකදැයි''යි කියති. එසේ කියමින් ඔවුහු අතැම් විට ගමේ පන්සලේ වැඩ සිටින භික්ෂූන්වහන්සේට නියමිත දන් වේලවත් හරි හැටි නොදී, දුර බැහැර බොහෝ වෙහෙස මහන්සි වී යාන වාහන රැගෙන ගොස් ආරණ්‍යගත සිල්වන්තයන්ට ම දන් දෙති. ඇතමෙක් එපමණකින් නොනැවතී ගමේ තමන්ගේ පන්සලේ සිටින භික්ෂූන් වහන්සේට අපහාස කරති. දෙස් පවරති.

අද ඊයේ නොව **බුද්ධ කාලයෙහි** සිටම සමාජයෙහි කටයුතු කරන භික්ෂූන් වහන්සේලා එක පිරිසක් හැටියටත්, ආරණ්‍යගත භික්ෂූන් වහන්සේලා තව පිරිසක් හැටියටත්, '**ග්‍රන්ථ ධූරය විදර්ශනා ධූරය,** යයි නම් කළ වෙන් වෙන් වූ පිළිවෙත් ඇතිව විසූ බව ඒ කියන මෝඩ බෞඩයන්ට කල්පනා නොවීම පුදුමයෙකි.

ආරණ්‍යවාසී භික්ෂුවට ඇත්තේ සිය කටයුතු ටික පමණෙකි. එහෙත් සමාජ සේවක භික්ෂුව දහසකටත් වැඩි කටයුතු වලින් නිතර වෙලී පැටලී සිටී. එසේ සමාජයෙහි කොතෙකුත් කටයුතුවල

Non-commercial distribution

නිරතව සිටින සමාජ සේවක භික්ෂුවට, වනගතව තම කටයුතු ටික පමණක් කර ගනිමින් සිටින භික්ෂුවට මෙන් ජීවත්වීමට නො හැකි බව අමුතුවෙන් කිවයුත්තක් නොවේ.

**පුදුමය නම්** යටකී ලෙස එක හැටියට ජීවත් වන්නටය කියා කියන අයම ඔහුගේ මඟුලට අවමඟුලට දනට බණට පිරිතට මේ ආදි හැම එකකටම අර ආරණ්‍යයෙහි සිටින හොඳ හාමුදුරුවන් නො කැඳවා, පන්සලේ සිටින භික්ෂූන් වහන්සේ කැඳවා ගෙන ගොස් ඒ හැම එකක්ම ඒ භික්ෂුව ලවාම කරවා ගෙන ඉන්පසු නැවතත් පළමු සේම බැණ වැදීම ය.

**ඇත්ත වශයෙන්, යුක්ති වශයෙන් කියතොත්** වනගතව සිටින භික්ෂූන් සිල්වත්ව ගුණවත්ව සිටියත් නොසිටියත්. තමන්ට වැඩි කුශලයක් ලබාගැන්මට වුවමනා නම්, හොඳ නො හොඳකම කෙසේ වෙතත්, හොඳ හැටියට සම්මත එවැනි භික්ෂූන්ට දනමානාදියෙන් සත්කාර සම්මාන කළාට ඇති වරදක් නැත. කාහට වුවද දන් දීම උසස් ක්‍රියාවක් බැවිනි. එහෙත් සමාජයෙහි වසන භික්ෂුවට නො සලකා එම භික්ෂුවට අපවාද කියමින් වනගත භික්ෂුවට ම සලකන බෞද්ධයා නම් නියම බෞද්ධයකු ලෙස නියම ගුණවතකු ලෙස සැලකිය නො හැකිය.

## සමාජ සේවක භික්ෂූන් වහන්සේ

**දෙදහස් පන්සිය වසරක්** වූ මෙතෙක් කල් මේ බුදු සසුන ලෝකයෙහි නො නැසී පැවතුනේ මේ සමාජයෙහි ජීවත් වූ සමාජ සේවක භික්ෂූන් වහන්සේලා ගේ නො පසුබට උත්සාහයෙහි ප්‍රතිඵලයක් වශයෙනි. ලක්දිව ඇති වූ ධර්ම ශාස්ත්‍රීය ආලෝකය ඇතිවූයේත්, ධර්මය මෙන්ම ශබ්ද ශාස්ත්‍රය උගන්වන උගෙණීමෙහි යෙදුන, ධර්ම දේශනා කරන, ධර්ම ශාස්ත්‍රීය පොත පත සැපයූ, ධර්මය තුගත් ලෝකයාට බෙදා දෙන එකම මධ්‍යස්ථානය වූ **ආරාමය - පන්සල නිසාය**. එහෙයින් එකී භික්ෂූන් වහන්සේලාට සකල බෞද්ධයෝ ම ඒ ගැන කෘතඥ විය යුත්තාහ. පිදිය යුත්තාහ. වැඳිය යුත්තාහ. සැලකිය යුත්තාහ.

**අතික් අතීන්** නිතර තමන්ගේ කුදු මහත් ආගමික හැම කටයුත්තකට ම සහාය කරගන්නා වූ හෙවත් තමන්ගේ ආගමික

Non-commercial distribution

හැම කටයුත්තක් ම කර දෙන්නා වූ සමාජයෙහි වසන භික්ෂුවට සැලකීමට ඒ කාරණය ම වුවත් හොඳටම ප්‍රමාණය. එසේ තමන්ගේ කිසිම කටයුත්තකට සහායක් නො ලබන, උපකාරයක් නො කරන, **වනගතව** තම කටයුතු ටික පමණක් බලාගෙන සිටින භික්ෂුවගේ ගුණ වණමින් තමන්ට නිතර උපකාරීව වෙසෙන භික්ෂුවට ගැරහීම කෙතරම් විශාල අකෘතඥ කමක්ද? යන්න විස්තර කිරීම පවා දුෂ්කරය. විස්තර කිරීමට ද අනවශ්‍යය. එය වටහා ගැන්මට විශාල දැන උගත්කමක් අවශ්‍ය ද නැත. යම්තම් මොළය ඇති ළමයෙකුට වුව ද වැටහෙන කරුණක් බැවිනි. එය ගඟෙන් පැන් බී මුහුදට ආ වැඩීම වැනි අකෘතඥ කමෙකි. යම් කෙනකු තමන්ගේ දුක සැප බලන, තමන්ගේ හැම යහපතට කටයුතු කරන තම දෙමාපියන්ට බැණ වදිමින් දෙමාපියනට නොසලකමින් රටේ අන්‍යයනට ගුණකීම අන්‍යයනට සැලකීම වැනි පරම අකෘතඥ කමෙකැයි කිව යුතුය. එවැනි අකෘතඥයන් විසින් මේ කාරණය ද සලකා බැලිය යුතුය. එනම් :–

ලෝකයෙහි යමෙක් යමෙක්, ආත්මාර්ථව තම වැඩ කටයුතු ටික පමණක් කරගනිමින් වෙසෙත් ද, ඒ අය එක අතකින් ආත්මාර්ථකාමී පිරිසකි. යමෙක් යමෙක් සිය කටයුතුත් අනුන්ගේ කටයුතුත් යන උභයාර්ථය ම සිද්ධ කරන්නේ නම් ඒ අය පරාර්ථකාමීහු ද වෙති. ලෝකයෙහි වඩා ගරු කළයුතු ආත්මාර්ථකාමී පුද්ගලයාටද නැතහොත් පරාර්ථකාමී පුද්ගලයාටද යන්න තීරණය කිරිම එතරම් දුෂ්කර දෙයක් නොවන බැවින් එය කියවන්නාට භාරය.

## ඇතැම් වනවාසී භික්ෂූන්ගේ සිල්වත්කම හා ගුණවත්කම

සිල්වත්කම හා ගුණවත්කම ගැන බලන කල ද සමාජයෙහි වෙසෙන භික්ෂූන් වහන්සේලා තුළ සිල් නැත, ගුණ නැතැ''යි කීමටවත් ආරණ්‍යක භික්ෂූන් තුළම සිල් ඇත, ගුණ ඇතැයි කීමටවත් පුළුවන් කමක් නැත. සමාජයෙහි වෙසෙන පිරිස අතර සිල් ඇති නැති ගුණ ඇති නැති දෙ පක්ෂය ම සිටිය හැකිවාක් මෙන් ම, වනගත පිරිස අතරද සිල් ඇති නැති ගුණ ඇති නැති දෙපක්ෂය ම ඇති විය හැකිය.

Non-commercial distribution

නිදර්ශනයක් වශයෙන් කියතොත් සමාජයෙහි තමාට තැනක් නැතිකමින් හෝ වඩ වඩා ලොකු තැනක් ලබා ගැන්මේ ආශාව නිසා හෝ වනගත ව වසන භික්ෂූන් වහන්සේලා ද නැත්තේ නොවේ. සමාජයෙහි වසන හොඳ භික්ෂූන් වහන්සේලා තුළවත් දක්නට නො ලැබෙන - බල නොපවත්වන, **මාන**, **ක්‍රෝධ**, **ඊර්ෂ්‍යා** ආදි ඇතැම් ඖදරික ක්ලේශ ධර්ම ( ලාමක ගති) පවා වනගත ව වසන එවැනි භික්ෂූන් තුළ බල පවත්වන බැව් දක්නට ලැබීමෙන් ඒ බව මොනවට පැහැදිලිය.

සමාජයෙහි වුව ද ගුණවත් භික්ෂූන් වහන්සේලා, වැඩක් නැති පුහු නායක කම්වලට ඇබ්බැහි වීමක් නැත. එහෙත් වනගත ව සිටින ඇතැම් භික්ෂූන්ගේ පටබැඳි නම් ලිවීමට පේළි ගණනක් යොදා තිබෙනු සමහර විට දක්නට ලැබේ. **මාන්නය** නමැති පාප ධර්මය ආරණ්‍යයෙහි රජ කරන බව එයින් ඔප්පු නො වේ ද?

සමහර විට වනගත ව සිටින එවැනි භික්ෂූන් යම් යම් අවස්ථාවල ධර්ම දේශනා කිරීම ආදි සමාජ සේවයට ද ගම්වලට නගර වලට පැමිණෙන වාර ද ඇත. එහෙත් ධර්ම දේශනා පවත්වන්නේ ඒ පිණිසම තනා ඇති පන්සලක ධර්ම ශාලාවක නොවේ. එයට හේතුව වශයෙන් ඔවුන් දක්වන්නේ විහාරස්ථානවලට පැමිණියොත් එහි වැඩ සිටින වැඩි මහලු භික්ෂූන් වහන්සේලාට වඳුම් පිදුම් කළ යුතු බැවින් එසේ නො පැමිණෙන බවය.

මෙසේ කියන වනවාසික භික්ෂුව වනවාසික විශේෂ සහ පරපුරකින් පැවිදි උපසම්පදාව ලැබූ කෙනකු නම් ඒ කීමෙහි එක්තරා ප්‍රමාණයක සත්‍යයක් තිබේ. එහෙත් මේ කියන භික්ෂුව ද සමාජයෙහි වසන භික්ෂුවගෙන්ම පැවිදි උපසම්පදා ලැබ, සමාජයෙහි ම හැදි වැඩී. සමාජයෙන් ම උගෙන, සමාජයෙහි ම වැස, පසුව වනගත වූ කෙනෙකි. එය සේ නම් ඒ භික්ෂුවගේ කීමෙහි සත්‍යයක් ඇති විය හැකිද? එසේ සමාන පැවිදි උපසම්පද ලද සෙසු වැඩි මහලු භික්ෂූන් වහන්සේලාට වැඳීමට නො හැකිවන සේ ඒ භික්ෂූන් තුළ **මාන්නය** බල පවත්වන බව ඒ කාරණයෙන් ම ප්‍රකට නොවේද? එසේ වැඩි මහලු භික්ෂූන් වහන්සේලාට හොඳ මහණ උපසම්පද නැතැයි කියතොත්, ඒ

Non-commercial distribution

භික්ෂූන් වහන්සේලාට නැති අමුතු මහණ උපසම්පදාවක් මේ කියන භික්ෂුවට පමණක් තිබිය හැකිද?

**ඇතැම් විට වන ගත වන මෙවැනි දූෂ්ට පුද්ගලයන් නිසා මෙතෙක් ආරණ්‍ය සේනාසනයට තිබුණු ගරුත්වය බොහෝ දුරට හීන වීමට දැන් දැන් කරුණු යෙදෙන බැව් මෙයින් පෙනේ.** එහෙත් වනවාසික භික්ෂූන් වහන්සේලා අතර කරුණාව මෛත්‍රිය ආදි හොඳ ගති ගුණ ඇති, නියම මනුෂ්‍ය ධර්මය මෙන්ම ශ්‍රමණ ධර්මය ද ඇති හොඳ අදහස් ඇති, ඉතාම හොඳ ගති පැවතුම් ඇති, සිල්වත් ගුණවත් භික්ෂූන් වහන්සේලාගෙන් ද අඩුවක් නැති බැව් කිව යුතුය.

''**ගිහි පාපොපි පාපො, සමණ පාපොපි පාපො යෙව**'' යනුවෙන් '**චක්ඛුපාල**' මහරහතන් වහන්සේ පැවසූවාක් මෙන් ''පන්සලේ විසුවත්, වනයෙහි විසුවත් පව්ටා පව්ටාම, '' බව ද මෙහිදී සිහිපත් කළ යුතුය.

**සිල්වත්කම හා ගුණවත්කම එකක් ද?**

ලොවැ කාගේ වුව ද ගුණ වර්ණනා කිරීමේදී ඒ අය සිල්වතෙක ගුණවතෙකැයි කියනු ඇසේ. එහෙත් මේ විශේෂණ පද දෙක භාවිත කරන්නේ එකම කාරණයක් ගැන ද නැතහොත් දෙකක් ගැන දැයි විමසා බැලිමේදී සිල්වතෙකැයි කිව හැකි සෑම තැනකදී ම ගුණවතෙකැයි යනු යෙදීමද, ගුණවතෙකැයි පවසන හැම තැනකදී ම සිල්වතෙකැයි කියා යෙදීමද එතරම් සුදුසු නො වන බව පෙනේ.

ගිහි පැවිදි කවරෙක් හෝ ඒ තම තමාට නියමිත ශීලයෙහි පිහිටා සිටිත් නම් හෙතෙම සිල්වතෙකි. ඒ අනුව පන්සිල් ඇති බෞද්ධයා සිල්වතෙකි. මහණකම ඇති පැවිද්ද සිල්වතෙකි. මේ අනුව සිල්පද කැඩුණු ගිහියාට දුශ්ශීලයෙකැයි කිව හැකිවුවත්, සිල්පද කැඩුණු පැවිද්දට දුශ්ශීලයෙකැයි කිව නොහැකිය. දුශ්ශීල යනුවෙන් පැවසෙනුයේ සිල් නැති තැනැත්තා යන අදහස බැවිනි. පස්පවෙන් එකකුදු කරන පන්සිල් නො රකින බෞද්ධයාට පන්සිල් නැත. එහෙයින් ඔහු දුශ්ශීලයෙකි. උපසම්පද ශීලය ආරක්ෂා කරන භික්ෂුවගේ සුළු ශික්ෂා පද එකක් දෙකක් සිඳී ගියද රැසක් සිඳී ගියද ඒ ශීලය එපමණකින් විනාශ වන සුලු දුර්වල ශීලයක් නොවේ.

Non-commercial distribution

එබැවින් පැවිද්දෙකුට දුශ්ශීලයෙකැයි කිව හැක්කේ සතර පාරාජිකාවන් අතරෙන් එකකට පැමිණ, මහණකම නැති වූ කල පමණය. එහෙයින් මහණකම ඇති පැවිද්දකු ගැන කථා කරන සෑම අවස්ථාවකදී ම සිල්වත් යන වචනය භාවිතා කිරීමෙහි වරදක් නැත. එහෙත් ඒ හැම කෙනෙක්ම ගුණවත් යයි කීම නම් නොයෙදේ. සිල්වත් බව එකකි. ගුණවත් බව අනෙකකි.

**ගුණ නම් කිම?**

ලෝකයෙහි තිරිසනකුට යම් කිසි සැපතක් යහපතක් සැලසෙනු දුටු කල, ඒ ගැන තමාට සතුටු විය හැකි නම් එය ගුණයෙකි. තිරිසනකුට වැඩි ගුණ ඇති මිනිසකුට බොහෝ ගුණ ඇති ගිහියකුට පැවිද්දකුට සැපතක් යහපතක් සැලසෙනු දුටු කලද, තමාගේ විරුද්ධ කාරයෙකුට වුව ද සැපතක් යහපත් සැලසෙනු දුටු කල ද සතුටු විය හැකි නම් එය ද ගුණයෙකි. උසස් ගුණයෙකි.

තිරිසනකුට විපතක් වන කල ඒ දැක තම සිත කම්පාවේ නම් එද ගුණයෙකි. සාමාන්‍ය මිනිසකුට, බොහෝ ගුණැති ගිහියකුට හෝ පැවිද්දකුට හෝ විරුද්ධ කාරයකුට හෝ විපතක් වනු දැක තම සිත කම්පා වේ නම් එය ද ගුණයෙකි. මහත්ම ගුණයෙකි.

තමන් නිසා තිරිසනකුට, මිනිසකුට, ගුණ ඇති මිනිසකුට හෝ පැවිද්දකුට හෝ තම විරුද්ධකාරයකුට සැපතක් යහපතක් සැලසෙනු දැක සතුටු විය හැකි නම් එය ද ගුණයෙකි. උසස් ම ගුණයෙකි. තමන් නිසා ඔවුනට විපතක් පීඩාවක් හිරිහැරයක් පාඩුවක් වනු දැක සිත කම්පා වේ නම් එයද ගුණයෙකි. ශ්‍රෙෂ්ඨ ගුණයෙකි.

මේ අනුව බලන කල තිරිසනකුට තමන් නිසා පීඩාවක් හිරිහැරයක් හානියක් විපතක් වීම ගැන ගුණවතා තුළ සතුටක් ඇති විය නො හැකිය. තිරිසනා හට තමන් නිසා විපතක් වනු අකමැති ගුණවතා තුළ, ලෝකයෙහි ගුණයෙන් වැඩි මිනිසකුට තමන් නිසා විපතක් වීම ගැන සතුටක් කෙසේ නම් ඇති විය හැකි ද ? නොහැකිමය. එහෙයින් වදළහ. ධම්ම පදයෙහි :–

**න තෙන අරියො හොති - යෙන පාණානි හිංසති**
**අහිංසා සබ්බපාණානං - අරියොති පවුච්චති**

Non-commercial distribution

යමෙක් මනුෂ්‍ය තිරශ්චීනාදි සත්ත්වයනට හිංසා පීඩා කෙරේද එයින් ඔහු ආර්යයෙක් - ගුණවතෙක් නො වන්නේය. යමෙක් සව්සත්නට දයාව කරුණාව දක්වයි නම් එයින් ඔහු ආයර්යයෙක් ගුණවතෙක් වන්නේය.

**වනගත වූ භික්ෂූන් වහන්සේලා** විසින් නිතර සිහි කළ යුතු වූ **'මෛත්‍රී'** සූත්‍රයෙහි එන මෙම ගාථා කීපය ද මෙහිදී සිහිපත් කළ යුතුය.

නපරො පරං නිකුබ්බේථ
නාතිමඤ්ඤේථ කත්ථචිනං කඤ්චි
බ්‍යාරොසනා පටිඝසඤ්ඤා
නාඤ්ඤමඤ්ඤස්ස දුක්ඛ මිච්ඡෙය්‍ය

**කිසි තැනෙක්හි කිසිවෙක් කිසිවකු තොරවටා වා කිසිවෙක් කිසිවකුට අවමන් නො කෙරේවා! ක්‍රෝධ සිතින් කිසිවෙක් කිසිවකුට දුකක් - පිඩාවක් නො කැමති වේවා.**

මාතා යථා නියං පුත්තං
ආයුසා එකපුත්ත මනුරක්ඛෙ
එවම්පි සබ්බ භූතේසු
මානසං භාවයෙ අපරිමානං

**යම් සේ මව්තොමෝ තමාගේ එකම පුත්‍රයා ආයුෂයෙන් රකී ද? එසේම සියලු සත්ත්වයන් කෙරෙහි අපමණ වූ මෙත් සිත් වඩන්නේය.**

මෙත්තඤ්ච සබ්බලොකස්මිං
මානසං භාවයෙ අපරිමාණං
උද්ධං අධො ච තිරියඤ්ච
අසම්බාධං අවෙරං අසපත්තං

**සම්බාධ නැති වෛර නැති සතුරු නැති මෛත්‍රී සිත. උඩ යට සරස සියලු සත්ත්ව ලෝකයෙහි වඩන්නේය.**

තිට්ඨං චරං නිසින්නෝ වා
සයානෝ වා යාවතස්ස විගතමිද්ධෝ
එතං සතිං අධිට්ඨෙය්‍ය
බ්‍රහ්මමෙතං විහාරං ඉධ මාහු

Non-commercial distribution

**සිටින්නේ ද යන්නේ ද හුන්නේ ද හෝනේ ද යම්තාක් කල් නො නිදා ද ඒ තාක් මේ මෛත්‍රී සිත පත්වන්නේය. මේ මෙත් සිතින් විසීම ශ්‍රෙෂ්ඨ විහාර යයි බුද්ධාදීහු කීහ.**

## මනුෂ්‍ය ධර්මයවත් නැති ඇතැම් වනවාසික භික්ෂූන්

කරුණු මෙසේ වුව ද වනගත ව සිටින යටකී පුද්ගලයා වැනි පවිටු ගති ඇති ඇතැම් පුද්ගලයන් තුළ සමාජයෙහි වෙසෙන භික්ෂූන් වහන්සේ කෙරෙහි දුශ්ශීල නාමය ආරූඪ කොට අනුන්ගේ ගුණ මැකීම නම් වූ **පරවම්භනයත්,** තමන්ම පරම ශීලවන්තයකු ලෙස ලොවට දැක්වීමෙන් තමා උසස් කොට දැක්වීම නම් වූ **අත්තුක්කංසනයත්**. යන පාප ධර්ම ( **ලාමක ගති - කැත ගති** ) බල පවත්වන බව නො පෙනේද? එසේ පෙන්වීමෙන් අනුන්ගේ ලාභ සත්කාරවලට තමන් නිසා විපතක් හානියක් නො කරන්නේ ද?

කවර තරාතිරමක කොතැනක වසන කවර පුද්ගලයකු හෝ වේවා අනුන්ට පහර වදින ලෙසට, අනුන්ට පීඩා වන ලෙසට, අනුන්ට හානි වන ලෙසට තමන් උසස් හැටියටත් අනුන් පහත් හැටියටත් පයඹ්ායයෙන් හෝ කියා පා නම්, ඒ පුද්ගලයා කරන්නේ අනුන්ට විපතකි. පාඩුවකි. පීඩාවකි. තිරිසනකුට තමන් නිසා විපතක් වීමට අකමැති ගුණවතා බොහෝ ගුණැති භික්ෂූන් වහන්සේලාට තමන් නිසා විපතක් වීමට සලසා තමා මහා ගුණවතකැයි කියා පාන්නේ කෙසේද? එහෙයින් ඔහු එසේ කියතත් නියම ගුණවතෙක් නම් නො වන්නේමය. ඒ බව මෙසේ ද වදළහ. ධම්මපදයෙහි :–

න වාක්කරණමත්තෙන
වණ්ණ පොක්ඛරතාය වා
සාධුරූපො නරො හොති
ඉස්සුකී මච්ඡරී සඨො

මිහිරි හඬ පැතිරවීමෙන් හෝ උස් හඬ නැඟීමෙන් හෝ වචන ගළපා වියත් ලෙස විසිතුරු ලෙස කියා පෑ පමණකින්, සිරුර

Non-commercial distribution

සටහන් හැඩ වැඩ ඇති පමණකින් අනුන්ගේ යස ඉසුරු නො ඉවසන්නා වූ කපටි පුද්ගලයා යහපත් කෙනෙක් නො වන්නේය. ගුණවතෙක් නොවන්නේ ම ය.

කෙනකු තුළ පිහිටි ගුණය හෝ අගුණය හෝ මැණිය යුත්තේ කෙනකුගේ ගමන බිමන, කන බොන දෑ, හිඳින නිදන තැන නැතහොත් පිළිවෙළ, හඳින පොරෝන සැටි පමණක් බලා නොවන බව යට කී කරුණු අනුව තේරුම් ගත යුතුය. **ගුණ නම් තමාගේ සිත් තුළ ඇති කරගන්නා කරුණාව, දයාව, මෛත්‍රිය, සමානාත්මතාව, උපේක්ෂාව, ඉවසීම, මුදිතාව . ආදී යහපත් ගති විශේෂයෝය.** මේ දැක්වූ ගුණයෝ වනගතව භාවනානුයෝගීව වසන පුද්ගලයන් තුළම පිහිටිය යුතු තරමේ උසස්ම ගුණයෝ නො වෙති. සමාජයෙහි වසන හොඳ භික්ෂූන් වහන්සේ තුළ මෙන් ම, හොඳ බෞද්ධයන් තුළ ද දක්නට ලැබෙන සාමාන්‍ය ගුණයෝය. මනුෂ්‍ය ධර්මයෙහි පිහිටියා වූ නියම මිනිසුන් තුළ පිහිටිය යුතු ගුණයෝය. වනගතව වසන භාවනානුයෝගී භික්ෂූන් තුළ මේ සාමාන්‍ය ගුණයනට වැඩි අප්පිච්ඡතා,සන්තුට්ඨිතා, පවිවේකතා, සමාධි, ප්‍රඥා ආදී විශේෂ ගුණයෝ තිබිය යුතුය.

**එහෙත් යටකී ලෙස අත්තුක්කංසන, පරවම්භනයන්ගෙන් සමාජයෙහි වෙසෙන භික්ෂූන් වහන්සේලාගේ බත් පතට වැලි දමන ඇතැම් වනවාසී කුහක පුද්ගලයන් තුළ, කඩ බක්කියේ වියළී ගිය හාල්මැස්සාටත් කුම්බලා ඉහෙට්ටටත් අනුකම්පාව ඇතත්, වැඩි ගුණ තබා පිරිසිදු මෛත්‍රී ධර්මයවත් ඇතිවිය හැකි දැයි නුවණින් විමසිය යුතුය.** මේ කරුණු අනුව බලන කල ගුණවත් බව නම් සිල්වත් කමෙන් අනෙකක් බව පැහැදිලි ය. වනගත වන්නට වන්නට ගුණ ධර්ම ( මනුෂ්‍ය ධර්මය ) ද වල් වදින බව බොහෝ විට දක්නට ලැබේ. එයට ප්‍රධානතම හේතුව ආත්මාර්ථකාමීත්වය යයි නො කිව යුතුද? එයට මතු එන පුවතද හොඳම නිදසුනකි.

**මහා යෝගී මහා ස්ථවිර**
**නමකගේ පශ්චිමාවවාදය**

**''මගේ මරණින් පසු මා සතු සිවුරු පිරිකර ගෙන අලජ්ජ දුශ්ශීලයන්ට දී විනාශ නො කොට දළදා මාළිගය සිරිමාබෝධිය**

Non-commercial distribution

**රත්නමාලී චෛත්‍යය යනාදී ස්ථානවලට පුද පිං දිය යුතුය. පොත් පත් ශිෂ්‍යයින්ට බාරයි.''**

මේ වූ කලි ලක්දිව ආරණ්‍ය සේනාසන ගණනාවක් ඇති කිරීමෙන් ද දුසිම් එකහමාරකට පමණ සීමිත වූ විශාල පැවිදි ශිෂ්‍ය පිරිසක් ඇති කිරීමෙන් ද, තවත් බොහෝ ගිහි ශිෂ්‍යයන් ඇති කිරීමෙන් ද, ආරණ්‍ය සේනාසන පිළිබඳ අනල්ප සේවයක් කිරීමෙන් ලෝක ශාසනද්වයට විශාල සේවයක් සිදු කළාවූ ද, යෝගාශ්‍රම පිළිබඳ අග්‍රතම අනුශාසකයන් වහන්සේ හැටියටත් මහා සිල්වතකු ගුණවතකු හැටියටත් ලෝකයා පිළිගත් මහා ස්ථවිරයන් වහන්සේ නමකගේ අභාවය නිමිත්තෙන් උන් වහන්සේ ගේ චරිතය අළලා ලෝක වාසීන්ට ආදර්ශයක් දීම පිණිස මෑතකදී මුද්‍රණය කළ එක් චරිත කථාවක ඇතුළත් පාඨයකි. දින පොතින් උපුටාගත් එම පාඨය එහි ඇතුළත් කර තිබෙන්නේ, එතුමාගේ උසස්කම ලොවට පල කිරීමටය. එහෙත් ඇත්ත වශයෙන් කියතොත් එම පාඨය එහි දැක්වීමෙන් සිදු වී ඇත්තේ, උන්වහන්සේ ගේ ගුණ , පළකිරීමක් නොව, අගුණ පළ කිරීමෙකි, නැතහොත් ගුණ මැකීමෙකි.

**අද ලෝකයේ සිටින බොහෝ දෙනකුන් හට ගුණදම් පිරීම තබා ගුණය නම් කුමක්ද? අගුණය නම් කුමක්දැයි වටහා ගැන්ම පවා දුෂ්කර දෙයක් වී තිබෙන බැව් එම පාඨය එහි ඇතුළත් කිරීමෙන් මොනවට ප්‍රකාශ වේ. අහෝ! ලෝකයක හැටි.**

ආරණ්‍ය සේනාසන කීපයක් ඇති කිරීමෙනුත්, විශාල ආරණ්‍යවාසික පැවිදි පිරිසක් ඇති කිරීමෙනුත් වනවාසීව ම දිගු කලක් භාවනායෝගීව ම විසීමෙනුත් කටයුතු කළහයි පවසන එම ගරු හිමියන් තමන්ගේ ජීවිතයෙන් ලෝ සඳුනට විශාල මෙහෙයක් කිරීමෙන් ''වටිනා ජීවිතයක් ගත කළ සිල්වත් හිමිනමකැයි'' යි නිර්භයව ම කිව හැකිය.

එහෙත් එතුමා නියම ගුණවතෙකැයි කීමට නම් බිය වෙමි. එයට හේතුව, එතුමාගේ අදහස් පිළිබිඹු වී දැක්වෙන පූර්වෝක්ත පාඨයයි. එතුමාගේ එම පාඨයෙන් පළවන්නේ උන්වහන්සේ මිස මේ මිහිපිට එක ම සිල් වතකුවත් අවිද්‍යමාන බවයි. එය කෙතරම් හාස්‍යජනක බොළඳ අදහසක්ද?

Non-commercial distribution

එතුමාගේ විශාල ශිෂ්‍ය පිරිසවත් ශීලවන්තයන් ලෙස එතුමා සැලකුවා ද යන්න සැක සහිතය. එසේ නැතිනම් ඒ පිරිසට ඒ පිරිකර දීමට කැමැත්තක් උන්වහන්සේ තුළ නූපන්නේ මන්ද? ශිෂ්‍ය පිරිසට ඒවායින් වැඩක් නැති නිසාද?

ශිෂ්‍යයනට පළක් නැති පිරිකර රැසක් ඒ හිමියන් මෙතෙක් කල් හිමිකර ගෙන සිටියහ යි සිතීමට ද දුෂ්කරය. තමන්ට වැඩි කුශලයක් ලබා ගැන්මට වැඩි කැදරකමක් ඇති වූණි නම්, ඒ වල් පල් නොදෙඩා, මරණින් පසු පිරිකර වෙහෙර විහාර වලට පූජා කිරීමට නියම කිරීමෙහි වරදෙක් නැත. ඒ නුවමනා **'දුශ්ශීල කථාව'** සටහන් කිරීමෙන් ප්‍රකට වන්නේ තමන්ගේ සිල්වත්කම ගැන සිතා ගෙන එයින් මත්ව සිටි බවක් නොවේ ද? සිල්වත්කම ගැන හෝ වේවා, ''තමන්ම ලොකුම සිල්වතාය, ලෝකයේ සෙස්සෝ දුශ්ශීලයෝ ය'යි යමෙක් සිතත් නම් එයද **'ශීලමදය'** නමැති පාපධර්මයෙකි. ලාමක ගතියෙකි. කැත අදහසෙකි.

ඒ හිමියෝ ලෝකවාසී සෙසු භික්ෂූන් කෙරෙහි ''මොවුහු දුශ්ශිලයෝය''යි තමන් තුළ ක්‍රෝධය වඩ වඩා, වැඩ සිටියෝ නම් ඒ හිමියන් කෙරෙහි **'ක්‍රෝධය'** ද බල පැවැත් වූ බව නො කිව යුතුද ? එයත් පාප ධර්මයෙකි. ලාමක ගතියෙකි. කැත අදහසෙකි.

එතුමන් තුළ තම ශිෂ්‍යයනට ඒ පිරිකර ලැබීමෙන් යහපතක් සැලසීම ගැන සතුටක් රුචියක් නොතිබුණි නම් එයත් **ඊර්ෂ්‍යාව** නමැති පාප ධර්මය නොවේද?

මෙතෙක් කල් කොතරම් යහපත් ලෙස ශ්‍රමණ ධර්ම ( ශීල ) ය පූරණය කළත්, ඒ වටිනා කමක් නැති සුළු දේ ගැන පවා එතරම් සැලකිලිමත් වීමෙන් පළවන්නේ, ඒවා ගැන **''තද ආශාවක්''** තිබුණු බව නොවේද? එය එසේ නම් එයත් එවැනි උතුමකු තුළ පිහිටිය යුතු උසස් ගුණයක් ද?

ආශාව අත් නොහළ හැකි වන සේ එක් රොක් වී තිබුණු විශාල පරිෂ්කාර සමූහයක් නම් වනගතව තපස් රකින

Non-commercial distribution

වයෝවෘද්ධ මහතෙරුන් වහන්සේ නමකට සුදුසු ගුණයෙක් ද?, **එසේ බහු භාණ්ඩික වීම**.

ලෝකයාට ආදර්ශවත් ලෙස පරම අල්පේච්ඡතාවෙන් තුන් සිවුරකින් පමණක් යුතුව නොවේද?, එවැනි විශේෂ පුද්ගලයන් විසින් විසිය යුත්තේ. එහෙත් එසේ නොවන බව එම පාඨයෙන් හොඳට ම ප්‍රකටය.

කරුණු මෙසේ හෙයින් පුහුදුන් ලෝකයෙහි සර්ව සම්පූර්ණ සර්ව නිර්දෝෂ කෙනකැයි කිව හැකි කෙනකු නැති බව වටහා ගත යුතුය.

**නියම ශ්‍රමණයන් වහන්සේ කෙබඳු ද?**

1. සන්තින්ද්‍රියා සන්තමනසා
සන්තං තෙසං ගතං ඨිතං
ඔක්ඛිත්ත චක්ඛු මිතභාණී
**තාදිසා සමණා මම**.

මාගේ ශ්‍රමණයන් වහන්සේ සංසුන් ඉඳුරන් ඇත්තෝ ය. ශාන්ත සිත් ඇත්තෝ ය. උන්වහන්සේගේ යාම් -ඊම්, හිඳීම් - සිටීම්, ශාන්තය. යට හෙලූ ඇස් ඇතියෝය. පමණින් යුත් තෙපුල් ඇතියෝ ය. මාගේ ශ්‍රමණයන් වහන්සේලා එබඳුය.

2. කාය කම්මං සුචී තෙසං
වාචා කම්මං අනාවිලං
මනො කම්මං සුවිසුද්ධං
**තාදිසා සමණා මම**.

උන්වහන්සේගේ කාය කර්මය පවිත්‍රය. වාග් කර්මය පිරිසිදුය. මනඃකර්මය අති විශුද්ධ ය. මාගේ ශ්‍රමණයන් වහන්සේලා එබන්දෝය.

3 විමලා සංඛ මුත්තාභා
සුද්ධා අන්තර බාහිරා,
පුණ්ණා සුද්ධෙහි ධම්මෙහි
**තාදිසා සමණා මම**.

Non-commercial distribution

උන් වහන්සේගේ ඇතුළත ද, පිටත ද නිර්මල බැවින් පිරිසිදු ය. විසුද්ධ ගුණයෙන් සක් මෙන් ද මුතු මෙන් ද ශුද්ධය. පිරිසිදු වූ ගුණදහමින් පූර්ණය. මාගේ ශ්‍රමණයන් වහන්සේලා එවැන්නෝ ය.

4. ලාභෙන උන්නතො ලොකො
අලාභෙන ච ඔනතො,
ලාභා ලාභෙන එකට්ඨා
**තාදිසා සමණා මම**.

ලෝ වැසි තෙම ලාභයෙන් උඩඟු වෙයි. අලාභයෙන් බැගෑපත් වෙයි. එහෙත් මාගේ ශ්‍රමණයන් වහන්සේලා ලාභාලාභ දෙකින් නො වෙනස්ව එකසේ සිටිත්. මාගේ ශ්‍රමණයන් වහන්සේලා එබන්දෝ ය.

5. යසේන උන්නතො ලොකො
අයසේන ච ඔනතො,
යසා යසේන එකට්ඨා
**තාදිසා සමණා මම**.

ලෝ වැසි තෙමේ යසසින් උඩඟු වෙයි. අයසසින් අවනත වවයි. මාගේ ශ්‍රමණයන් වහන්සේ වූ කලී යසායස දෙක්හි එක සේ සිටිති. මාගේ ශ්‍රමණයන් වහන්සේ ලා එබඳු වෙත්.

6. පසංසාය උන්නතො ලොකො
නින්දය ච ඔනතො
සමා නින්ද පසංසාසු
**තාදිසා සමණා මම**.

ලෝවැසි තෙමේ පැසසීමෙන් අහංකාර වෙයි. නින්දවෙන් කම්පා වෙයි. එහෙත් මාගේ ශ්‍රමණයන් වහන්සේලා නින්දා ප්‍රශංසා දෙක්හි නො වෙනස්ව එක සේ සිටිති. මාගේ ශ්‍රමණයන් වහන්සේලා එවැනියහ.

7 සුඛෙන උන්නතො ලොකො
දුක්ඛෙනෙ ච ඔනතො,
අකම්පා සුඛ දුක්ඛෙසු
**තාදිසා සමණා මම**.

Non-commercial distribution

ලෝකවාසී ජනයා සැපයෙන් උඩඟු වෙයි. දුකින් කම්පා වෙයි. එහෙත් මාගේ ශ්‍රමණයන් වහන්සේ වූ කලී සුවදුක් දෙක්හි නො වෙනස්ව එකසේ සිටිති. මාගේ ශ්‍රමණයන් වහන්සේලා එබඳුයහ.

මේ වූ කලී, අනාථ පිණ්ඩික මහ සිටාණන්ගේ දුවණියන් වූ **චූල සුභද්‍රාවන්** එකල වැඩසිටි මහරහතන් වහන්සේගේ ගුණ වැනීමක් වශයෙන් එක් අවස්ථාවක ප්‍රකාශ කළ වටිනා ගාථා කීපයකි.

(අපේ භික්ෂූන් වහන්සේ ද මේ උතුම් ගුණ තමන් වහන්සේ තුළ ඇත්දැයි සිතා බලන සේක්වා!)

## වර්තමාන භික්ෂූන් වහන්සේ

එහි එන සියලුම ගුණයන් නො අඩුව ම අද වැඩ සිටින පෘථග්ජන භික්ෂූන් වහන්සේලා තුළ අවිද්‍යමාන වුවත්, ඒ සියලු ගුණයන් ගෙන් බොහෝ දුරට සම්පූර්ණ බව මෙහිලා පැවසිය යුතුය.

අධි ශීල සංඛ්‍යාත උපසම්පද ශීලය වූ කලී අති විශාල වූවකි. එහෙයින් එහි එන එකම ශික්ෂාපදයකුදු නොබිඳ ආරක්ෂාකිරීම පෘථග්ජන භික්ෂුවකට තබා සව්කෙලෙස් නැසූ රහතන් වහන්සේ නමකට ද නො කළ හැක්කකි. එබැවින් රහතන් වහන්සේලාගෙන් ද ශික්ෂාපද බිඳෙන අවස්ථා ඇත. **මෙකල වෙසෙන පෘථග්ජන භික්ෂූන් වහන්සේ වුවද නවදහස් එක් සිය අසූ කෝටි පනස්ලක්ෂ සතිස් දහසක් සංවර ඇත්තා වූ ප්‍රාතිමෝක්ෂ සංවර ශීල සංඛ්‍යාත එකී ආර්ය මහා ශීල ස්කන්ධයකින් යුක්ත වූ බැවින් උන්වහන්සේගේ ශීලයෙහි උසස් බව කියා නිම කළ නොහැකිය**.

චින්තා විෂයාතික්‍රාන්ත වූ එවැනි මහා ශීලස්කන්ධයකින් හෙබි ඒ භික්ෂූන් වහන්සේ ගෙන් පෘථග්ජන දෝෂයන් නිසා යම් යම් විටක සුළු සුළු වැරදි සිදු වුවත් ඇවැත් දෙසීම් ආදියෙන් ඒ වරදින් පිරිසිදු විය හැකි බැවින් එයින් උන්වහන්සේගේ ශීලයෙහි අඩුවක් නො වන බව කිව යුතුය. සප්තාපත්තිස්කන්ධයන් අතුරෙන් පිරිසිදු බවක් ලබාගත නොහැක්කේ සතර පාරාජිකා සංඛ්‍යාත එකම ආපත්තිස්කන්ධයකින් පමණකි. එබැවින් උපසම්පද ශීලය සුළු වරදකට පැමිණීමෙන් විනාශ වන සුළු, අබල දුබල ශීලයක් නොවන බව විශේෂයෙන් සැලකිය යුතුය. මහා සාගරයට මොනයම්

Non-commercial distribution

රසයකින් යුක්ත වූ ජලය ස්වල්පයක් දැමීමෙන් නොව, නා නා දිසාවන්ගෙන් ඇළ දෙළ ගංගාවන්ගෙන් විශාල ජලස්කන්ධයක් ගලා ඒමෙන් ද මහා සාගරයෙහි වූ ලුනු රසය වෙනසකට පත් නො වන්නාක් මෙනි.

**භික්ෂු සමාජය ද විශාල වූවකි**. ඇතැම් විට අස්සක මුල්ලක සිටින ඇතැම් එක් පුද්ගලයකු අතින් යම් යම් වරදක් සිදුවුවත් ඒ වූ වරදට එය ආවුධය කොට ගෙන මුළු රටේම සිටින භික්ෂූන් වහන්සේට නිග්‍රහ කිරීම කිසි විටෙකත් සිදු නොවිය යුත්තකි. ගිහි සමාජයෙහි වුවද එවැනි නිහීන ලාමක නින්දිත ක්‍රියා කරන්නවුන් එමට ඇත. එහෙත් කිසි දිනක එක ගුරුවරයකු කළ වරදට මුළු ගුරු සංහතියට ම නිග්‍රහ කරන, එක වෙද මහතකු කළ වරදට මුළු වෙද සංහතියට ම නිග්‍රහ කරන, එක කලිසම් කාරයකු කළ වරදට මුළු කලිසම් අඳින සමාජයට ම නිග්‍රහ කරන, එක දෙස්තර මහතකු කළ වරදට සියල්ලන්ටම නින්ද කරන, එක මුදලාලි කෙනකු කළ වරදට මුළු මුදලාලි සමාජයට ම නිග්‍රහ කරන, එක මිනිසකු කළ වරදට මනුෂ්‍ය සංහතියට ම නිග්‍රහ කරන, සිරිතක් ලොව කවදත් නැත. එය එසේ නම් සිවුරු පොරවා ගත් කෙනකු අතින් පමණක් වරදක් සිදුවූ කල භික්ෂූන් වහන්සේ නමකට මග බැස යැමට පවා නො හැකි වන සේ දුටු දුටු තැන සෑම භික්ෂූන් වහන්සේ කෙනකුට ම නින්ද අපහාස කිරීමේ තේරුමක් ඇත්දැයි නුවණින් සැලකිය යුතුය.

කරුණු මෙසේ හෙයින් තමන්ට නියමිත පන්සිල් වත් හරි හැටියට නො රකින **වර්තමාන ඇතැම් බෞද්ධ නාමධාරීන්** විසින් මෙකල භික්ෂූන් වහන්සේට සිල් නැතැයි ‘ දුශ්ශීල’ නාමය ආරූඪ කොට නිග්‍රහ කිරීමට පෙළඹීම මහා අනුවණ කමක් බැව් පැවසිය යුතුය. එය ගිහි පැවිදි දෙපක්ෂයේ ම ඉමහත් පරිහානියට හේතු වන්නකි. සම්බුද්ධ ශාසනයෙහි පරිහානියට ද එය ම හේතු වේ. එබැවින් සකල බෞද්ධයන් විසින් ම අපගේ භික්ෂූන් වහන්සේලා තුළ කිව නොහැකි, සිතිය නො හැකි අපමණ ගුණස්කන්ධයක් ඇතැයි නුවණින් දැන, ගිහියකු තුළ පවත්නා ගුණය ශීලය අනුව සිතතොත් තමන් තුළ ඇති ගුණය ශීලය අබැටක් පමණ අත්‍යල්පයි ද, භික්ෂූන් වහන්සේ තුළ පවත්නා ගුණය ශීලය මහමෙර

Non-commercial distribution

මෙන් විශාල යයිද සලකා තමන් තුළ පවත්නා අහංකාර කම පසෙක තබා, ඒ ශ්‍රමණයන් වහන්සේ නිතර දැකීමට ආශ්‍රයට යා යුතු බව සැලකිය යුතුය. එසේ නිතර ශ්‍රමණයන් වහන්සේ දැකීම ආශ්‍රය කිරීම බෞද්ධයන්ගේ දෙලෝ දියුණුවට ම අසහාය හේතුවකි. එහෙයින් ම **උතුම් මංගල කරුණකැයි ද** වදළහ.

**ශ්‍රමණයන් වහන්සේලා නො දැකීම පරිහානියට හේතුවක් බව.**

භික්ෂූන් වහන්සේ දැකීම දෙලෝ දියුණුවට හේතු වන්නාක් මෙන්, උන්වහන්සේ නොදැකීම -ආශ්‍රය නොකිරීම ඉමහත් පරිහානියට හේතුවකි. ප්‍රබල හේතුවකි. **අද බෞද්ධයා** ප්‍රතිපත්ති අතින් මෙතරම් පහත් තත්ත්වයකට වැටී සිටීමට එකම හේතුව භික්ෂූන් වහන්සේලාගෙන් ඈත්වීමයි. එහෙයින් එය අප බුදු පියාණන් වහන්සේ ද සප්ත පරිහාණිය ධර්මයන්හි **'භික්ඛු දස්සනං හාපෙති''** යනුවෙන් **භික්ෂූන් වහන්සේලා දැකීම පිණිස ආශ්‍රය පිණිස නො පැමිණීම** බෞද්ධයාගේ පිරිහීමට මූලික හේතුව බව වදළහ.

භික්ෂූන් ආශ්‍රයට නොපැමිණ, භික්ෂූන් ගෙන් ගුරු හරුකම් නොලබා කිසි කලෙක ආගම ධර්මය හරි හැටි පිළිපැදීමට නොහැකිය. එහෙයින් අපේ පැරණි මුතුන් මිත්තන් භික්ෂූන්ගේ ආශ්‍රය කොපමණ උසස් කොට සලකන ලදද යනු **'කාවන්තිස්ස'** මහරජ තුමාගේ හා **'විහාරමහාදේවිය'** ගේ චරිතය වැනි උසස් චරිතයන්ගෙන් ස්ඵුට වේ. එම උත්තමයෝ **ගැමුණු තිස්ස** යන තම පුත් කුමරුන් දෙදෙන කුඩා කල ම මහා සංඝයා ඉදිරියෙහි **'දරුවනි!** නුඹලා අපේ කුල දේවතාවන් වූ භික්ෂූන් වහන්සේට කිසිකලෙකත් විරුඬ නොවන්නෙමු'' යි පවසා මේ බත් පිඩු අනුභව කළ යුතු යයි කියා පොරොන්දු කරවා භික්ෂූන් වහන්සේ වළඳා ඉතුරු වූ ඉඳුල් බත් පිඩු අනුභව කරවූහ.

**'සිරිසඟබෝ'** රජතුමාගේ චරිතය ද මෙහිලා හොඳ නිදසුනකි. එතුමා කුඩා අවදියෙහි '''නන්ද'' තෙරුන් වහන්සේ ගේ ආශ්‍රය ලත් හෙයින් ආගම අනුව ජීවිතය හැඩ ගැසුණ නියම මහත්මයෙක් විය. පරහට ලැබෙන සුළු ලාභයක් උදෙසා සිය ජීවිතය පවා පරිත්‍යාග කිරීමෙහි නො පසුබට වූ පරහිත නිරතයෙක් විය.

Non-commercial distribution

## භික්ෂූන් ආශ්‍රය කළ යුත්තේ කුමටද?

භික්ෂූන් වහන්සේ වනාහි බෞද්ධයා ගේ ආචාර්‍ය්‍යවරු වෙති. බෞද්ධයෝ හික්මෙන ශිෂ්‍යයෝ වෙති. ශිෂ්‍යයනට ගුරු ආශ්‍රයෙන් වෙන්ව කිසිකලෙක හික්මිය නො හැකිය. එබැවින් සියලු බෞද්ධයන් විසින් ම භික්ෂූන් ආශ්‍රය කළ යුතුය. එම ආශ්‍රය ද තමාට ආගම ධර්‍මය අතින් හෝ ශබ්ද ශාස්ත්‍රය අතින් හෝ වැඩ සැලසෙන පරිදි විය යුතුය. තමන්ගේ අඩු පාඩු - මිල මුදලින් හෝ වේවා වෙන යම් උපකරණාදියකින් හෝ වේවා - සම්පූර්ණ කර ගැන්ම පිණිස භික්ෂූන් ආශ්‍රය කිරීම බෞද්ධයකුට නුසුදුසු දෙයකි. එහෙත් මෙකල සමහරු එවැනි දේ ද කැමති වෙති. එය මුළාවකි. භික්ෂූන් වහන්සේලාගේ ආශ්‍රයෙන් ඈත්ව වසන නිසා කිසිම ආගම ධර්‍මයක් නො දන්නා ඇතැමුන්, තමන්ගේ මංගලාවමංගලාදි කටයුතු වලට සඟසතු බඩු බාහිරාදිය ලබා ගැන්මට තැත් කොට, නො ලැබුණු කල අමනාප වන වාර ද බොහෝ වෙති. එබැවින් මෙම කාරණය ද බෞද්ධයන් විසින් හොඳින් සිහියේ තබා ගත යුතු වැදගත් කරුණකි.

## බෞද්ධ ප්‍රතිපත්තිය කුමක්ද?

බෞද්ධ ප්‍රතිපත්තිය නම් ශීල, සමාධි, ප්‍රඥා යන ගුණ ධර්‍ම තුන වැඩීමයි. මෙහි **ශීලය** නම් කය වචන දෙකට හිතුවක් කරන්නට ඉඩ නොදී ස්මෘති ඥාන වීර්‍ය්‍ය යන ධර්‍මයන්ගෙන් යුක්තව මනා කොට ආරක්ෂා කිරීමයි. **සමාධිය** නම් ලෝභාදි කෙලෙස් නූපදනා පරිදි සිත යහපත් සේ හැසිර වීමයි. **ප්‍රඥාව** නම් සත්ත්ව පුද්ගල ආත්ම ජීවාදි වශයෙන් අපට පෙනෙන සාමාන්‍ය දැනීමට වඩා වෙනස් වූ ස්කන්ධ ධාතු ආයතනාදි වශයෙන් දැකීමයි. ඇතිතාක් බෞද්ධ ප්‍රතිපත්ති මේ තුනෙහි ඇතුළත් වෙයි. එහෙයින් හැම ප්‍රතිපත්තියකින් ම මේ තුනම හෝ දෙකක් සම්පූර්ණ විය යුතුය. මින් එකක් වත් සම්පූර්ණ නොවන එකම ප්‍රතිපත්තියක් වත් බුද්ධාගමෙහි නැත. නමුත් නිසි ආකාර නො පුරණ ලද ප්‍රතිපත්තියෙන් මේ එකකුදු සම්පූර්ණ නොවේ.

එබැවින් පිළිවෙත් පුරණ බෞද්ධයා විසින් ඒ ඒ ධර්මයන් අඩු පාඩු නොවී සම්පූර්ණ වන අයුරු මනා කොට දැන උගෙන ප්‍රතිපත්ති පිරිය යුතුය. එවැනි දැනුමක් තේරුමක් නො මැතිව තම

Non-commercial distribution

තමනට සිතෙන සිතෙන අන්දමින් පූරණ ප්‍රතිපත්තියෙන් නිසි ප්‍රතිඵල ලැබීම උගහටය. මෙකල ආගම නියම නයින් වැඩි පිළිවෙත් තබා වැඳුම් පිදුම් කිරීමට දන්නා අය පවා අත්‍යල්පයහ. ඊට හේතුව ආගම නො දැනුමත් නියම නයින් පිළිවෙත් පුරන්නකුගේ ආශ්‍රයෙන් පුහුණු නො වීමත්ය. ආගම පිළිබඳ වැඩි දැන උගෙනීමක් නැත්තකුට වුවද නියම අන්දමින් පිළිවෙත් පුරන්නකුගේ ආශ්‍රයෙන් දැක පලපුරුද්ද ඇති කර ගත් පසු නිවැරදි ලෙස පිළිවෙත් පුරත හැකිය.

## ප්‍රතිපත්ති පූරණය උගත යුතු බව

බෞද්ධයන් විසින් නිතර කරනු ලබන ප්‍රතිපත්ති පූරණය හෙවත් පුණ්‍ය ක්‍රියාවෝ වූ කලී මතු ඵල බලාපොරොත්තුවෙන් කරන යහපත් ක්‍රියාවෝ වෙති. එබැවින් එය මතු ඵල කැමැත්තෙන් කරන ගොවිතැන් කිරීම වැනි ක්‍රියා කොටසකි. ගොවිතැන් කිරීමෙන් වුවද, නියම ඵලය නියම අස්වැන්න ලැබිය හැක්කේ ඒ පිළිබඳ මනා දැනුමක් හා මනා පල පුරුද්දක් ඇත්තකුටය. එසේ නොවුවහොත් එයට කැප කළ අගනා කාලයත් ධනයත් වෙහෙසත් නිෂ්ඵල වනු නිසැකය. ගොවිකම් පමණක් නොව, ගුරු කම වෙදකම වෙළඳාම ආදි ලොවැති හැම ක්‍රියාවක් ම නොදැන නො පළපුරුදුව කිරීමෙන් සඵල කරගත නො හැකිමය. එහෙයින් ඒ හැම ක්‍රියාවකට ම ඒ ඒ ක්‍රියා අනුව එයට සුදුසු කාලයක් පුරුදු පුහුණු වී අවසාන වූ පසුම ඒ ඒ ක්‍රියා කිරීමට සූදනම් වන බව නො රහසකි.

මෙසේ මෙලොව ජීවිතයට අවශ්‍ය හැම ක්‍රියාවක් පිළිබඳව ම මනා දැනුමක් මනා පළපුරුද්දක් අභ්‍යාසයක් අවශ්‍ය නම් පරලොව ජීවිතයට අවශ්‍ය පින්කම් පිළිවෙත් පිළිබඳව පමණක් එවැනි දැනුමක් පල පුරුද්දක් අනවශ්‍යයි සිතතොත් එය න්‍යාය විරෝධී මෝඩ සිතිවිල්ලකි. මේ කාරණය ගැන කිසිම වැටහීමක් නැති සමහරු අනුන් කරන නිසා නැත්නම් පැරැන්නන් විසින් කළ නිසා ජාතික සිරිතක් කුල සිරිතක් වශයෙන් සලකා කටයුතු වල ඵලය ගැන නො සලකා, කටයුත්ත පමණක් කොයි ලෙසකින් නමුත් කිරීමට ප්‍රමාණයයි සිතා කරති. එසේ කිරීමෙන් ඔවුහු බෞද්ධනාමය නොමැකී ආරක්ෂා වීම හෝ මෙලොව නම්බුව හෝ ලෝකාපවාදයෙන්

Non-commercial distribution

මිදීම හෝ ඵලය වශයෙන් සලකති. ඒ අයට මෙලොව නම්බුව නම් පහසුවෙන් ලැබිය හැකි වේ. රටේ වැඩි එවැනි අය හෙයිනි. එහෙත් ඒවායින් ලැබෙන මතු ප්‍රතිඵලය නම් කිසි සේත් සරු සේ ලැබිය නොහේ.

## දන්දෙන ඇතැම් පින්වතුන්

මෙහිලා නිදර්ශනයක් වශයෙන් බෞද්ධයා නිතර කරනු ලබන දනමය පුණ්‍යක්‍රියාව ගැනම සිත යොමු කරමු. ඒ ක්‍රියාව පවා එයින් ලැබිය යුතු නියම ප්‍රතිඵල ලැබෙන සේ එය මැනවින් ඉටුකිරීමට දන්නා බෞද්ධයන් කී දෙනෙක් වෙත්ද? **ඇතමෙක්** දනට **සංඝයා** ලබා ගැන්ම පිණිස ආරාධනයට තමන් නොයති. ඒ පිණිස ඇතැම් විට කිසි දැනුමක් නැති සේවකයකු යවති. ඒ නිසාද භික්ෂූන් වහන්සේට කරදර ඇති වන අවස්ථා එමටය. **ඇතමෙක්** දන් දෙන **අවස්ථාවෙහි** සේවකයන් එහි යොදවා තමන් පසෙකට වී, සිගරැට් උරමින් - යහළුවන් පිරිවරා විහිළු තහළු කරමින් සිටිති. **ඇතැමෙක්** භික්ෂූන් වහන්සේ රටට ප්‍රදර්ශනය කළ යුතු නිසා කොතෙක් දුර බැහැර වුවත් උඩට උඩු වියන් පයට පාවඩ එළවා මහා කෝලාහලයක් ලෙස එහෙත් මෙහෙත් විශාල පිරිසක් දුව පනිමින්, කන් බිහිරි වන තරම් දරුණු ශබ්ද පූජා පවත්වමින්, වැඩමවති. **ඇතමෙක්** ඇතැම් විට දන්දීමට සූදනම් වුවොත් රටේ සිටින තරම් භික්ෂූන් වහන්සේ එයට කැඳවති. තම නිවස ද ඉඩකඩ මදවී අගු පිල්වල පවා යන්තම් වැඩසිටීමට සලසත්. **ඇතැම් විට** දනය පිළිගැන්වීමට ගියද එය නිසි ලෙස කළ හැකි වත පිළිවෙත දන්නවුන්ගේ හිඟකම නිසා වුවමනා දෙයක් ලබා ගැන්මට බොහෝ වේලා බලා සිටින්නට සිදුවේ. ඇතැම් විට විශාල පිරිසක් එහෙත් මෙහෙත් වැඩමවන නිසා එය කලට වේලාවට ඉටු නො වීමෙන් යන්තම් ඉතා අමාරුවෙන් කඩි මුඩියේ දන් පිළිගැන්වීමට සිදුවේ.

**දයකයා** ඒ උතුම් අවස්ථාවෙහි තමන්ගේ සිත් පහදවා ගෙන තුනුරුවන් ගුණ අදහාගෙන ඒ කටයුත්ත හොඳින් කළයුතුය. නමුත් ඇතැම් විට දයක මහත්මයා තමන්ගේ පොඩි පොඩි දරු කැල කැඳවා ඉදිරිපස තබා අනුශාසනා ඇසීමට සූදනම් වීමෙන් අන්තිමට සිදුවන්නේ දරුවන් සමග සුරතලයට වැටීමය. ඒ මේ කරච්චලය

Non-commercial distribution

නිසා ඔහුට ඒ අනුශාසනාව ඇසීමට නොහැකි වීම පමණක් නොව, අනුශාසනාව කරන ස්වාමීන් වහන්සේට පවා එය නිසි ලෙස නො කළ හැකිවේ.

තරමක් දැනුම් තේරුම් ඇති දරුවනට ඒ කටයුතු පුරුදු පුහුණු වීමට ඔවුන් ඉදිරිපත් කොට කටයුතු කිරීම දෙමාපියන් අයත් යුතුකමක් වුවත්, කිසිම හසරක් නොදත් කුඩා ළපටියන් ඉදිරිපසට ගැනීමෙන් සිදුවන්නේ තමන් කලාතුරකින් කරන්නට යන ඒ උතුම් කටයුත්ත පවා හරි හැටි කරුණු දැන, කරගැන්මට නොහැකි වීමයි. දරු ප්‍රේමය හොඳ එකක් වුවත්, එවැනි අවස්ථාවල දරු සුරතල් බැලීමට සූදනම් වීම අනුචණ කමකි. එසේ කිරීමෙන් ධර්මයටත් සංඝයාටත් අගෞරයක් ද වන්නේය.

**ඉංග්‍රීසි පත්තයට හැඩ ගැසුණු උසස් පංතියේ ඇතැම් කෙනෙක්.** ස්වාමීනි! අනුශාසනාව යම් තම් කොටින් කිරීම ප්‍රමාණය, කැම වෙලාවත් ළංවී ඇතැයි පවසනු අතැම් විට ඇසේ. විශාල පිරිසක් රැස්වී සිටින අවස්ථාවක නම් එය නො කීව ද අනුශාසනාව කළ යුත්තේ අවස්ථාව අනුව සංක්ෂේපයෙනි. එහෙත් ඇතැම් විට මේ කියමන එවැනි අවස්ථාවල ම නොව, ගෙදර සිටින පිරිස පමණක් ඇති අවස්ථා වල ද ඇසේ. ඔවුන් නිතර බණ දහම් අසන, නිතර භික්ෂූන් ඇසුරු කරන හොඳ සැදැහැති අය නම් ඒ කීම නැතද, එවැනි අයට වැඩි බණ දහමක් නො දෙසීම සිරිතකි. එහෙත් ඇතැම් විට ඇසෙන මෙවැනි කීම් ඇසෙන්නේ එවැනි අයගෙන් නොව, කලාතුරකින් එවැන්නක් කරන, කලාතුරකින් භික්ෂූන් ඇසුරු කරන උසස් පංතියේ අයගෙනි.

ඇතැම් විට දැන උගත්කම ඇති, එහෙත් ආගම ධර්මයෙන් ඈත්ව සිටින එවැනි අයට කලාතුරකින් හමු වූ ඒ අවස්ථාව, නියම මාර්ගය පෙන්නුම් කරදීම පිණිස ධර්මානුකූලව අවවාදයක් කිරීමට ඔවුන් කෙරෙහි හිතැති භික්ෂූන් වහන්සේලා හොඳ වෙලාවක් හැටියට සලකති.

ආහාර ගැන්ම තුන්සිය හැටපස් දවසේම කරන දෙයකි. වැඩි වශයෙන් ලොකු ලොකු උදවිය උසස් හැටියට කරන්නේ ද ඒ ටික ම ය. එහෙත් මෙවැනි කලාතුරකින් පරලොව පිණිස යමක්

Non-commercial distribution

කරනු ලබන ඒ දුර්ලභ වටිනා අවස්ථාවේ පවා එය මඳක් වෙනස් වූවොත් ඉතාම විශාල හානියක් හැටියට සලකන බවය, එයින් ප්‍රකට වන්නේ. ධර්‍මයෙන් මෙන්ම භික්ෂූන් වහන්සේගෙන් ද ඈත්ව සිටින ඔවුන් දෙලෝ වැඩ පිණිස බණ පදයක් ඇසීම ඉතාම සුළු කොට සලකන බවද එයින් පැහැදිලි වෙයි. මේ ආදි කරුණු ගැන නුවණින් සලකා බලන කල හොඳට ම පුරුදු දන්දීම පවා දෙලොවට වැඩ ඇති ලෙසට කරන අය හිඟ බව ම පෙනේ.

### වරදවා කළ පින්කම් නැවත සකස් කළ නො හැකි බව.

පින් කිරීමෙහි ලා අන්‍ය හැම කටයුත්තකට ම වඩා පිරිසිදු දැනුමක් හා පුහුණුවක් තිබිය යුතුමය. කුමක් හෙයින් ද යත්? සාමාන්‍ය කටයුතු වල වරදින තැන් නරක් වන තැන් අඩුපාඩු වන තැන් සතුරු උපද්‍රව පැමිණෙන තැන් පහසුවෙන් දැක්ක හැකි බැවින් ඒ නිසා සිදු නොවන සේ ඒවා වළක්වා ගත හැකිය, නැතහොත් පසුව සකස් කළ හැකිය.

නිතර කරන පින්කම්වල කොතැනක අඩුපාඩු වී ද, කොතැනක දුර්වල වීද, කොතැනක අලාභ වීද, කොතැනක සතුරු පීඩා ඇති වී දැයි ඇසින් දැක්ක හැකි නොවේ. පුණ්‍ය ක්‍රියා සම්බන්ධ විශේෂ වග විභාග දත් නුවණකින්ම එය දත යුතුය. එහෙයින් පින් කරන්නා තුළ කරන පින්කම් පිළිබඳ, පූරන ප්‍රතිපත්ති පිළිබඳ විශේෂ දැනුමක් නුවණක් තිබිය යුතුමය. වරදවා අඩු පාඩු ඇතිව දූෂ්‍යව කළ පසු නැවත එසේ වූ බව දැනගත ද, සෙසු ක්‍රියා මෙන් නැවත සකස් කිරීමට පුළුවන් කමක් පින් කම් වල නැත. එහෙයින් පළමු කොට ම දැන නො වරදින සේ ම පරීක්ෂාකාරීව කළ යුතුමය. පිළිවෙත් පිරිය යුතුමය.

පුණ්‍යයෝය, පින්ය, කුශල්ය, කියනුයේ දන්දෙන අවස්ථාවෙහි පෙනෙන්නට ඇති ආහාරපාන පරිෂ්කාර ආදි දන වස්තුවත්, භික්ෂූන් වහන්සේවත්, සිල්රකින විට පෙණෙන අඳින පොරෝන සුදු රෙදිවත්, නවගුණ වැලවත්, විහාර පන්සල් චෛත්‍යාදියවත් නොව, ඒ ඒ දනාදි යහපත් ක්‍රියා සිදු කරන අවස්ථාවල, තම තමන්ගේ සිත්

Non-commercial distribution

තුළ පහළවන පිරිසිදු චේතනාවෝය. එම චේතනාවෝ අපට නො පෙණෙන්නාහ. එහෙයින් ඒවා මොන මොන අඩු පාඩු ඇතිව, මොන මොන දුබලකම් ඇතිව, පහළ වන්නාහු දැයි අපට දක්නට නුපුළුවන. ඒවායේ සම්පූර්ණත්වය ශක්තිමත් භාවය පාරිශුද්ධත්වය යන සියල්ල රඳා පවත්නේ ඒ ඒ චේතනා උපදවා ගැන්ම පිණිස කරන කියන කටයුතු වල ඇති සම්පූර්ණත්වය උඩය. එහෙයින් බෞද්ධයන් විසින් කරනු ලබන සියලුම පුණ්‍ය කර්‍මයන් ගේ පරිපූර්ණත්වය හා පාරිශුද්ධත්වය හැම අතින්ම ඇතිවන පරිදි මනා සිහි නුවණින් යුක්තව ම ඒවා සිදු කළ යුතුය. එය අනායාශයෙන් සිදු නොවන්නකි. එයට අවශ්‍ය උගෙනීමත් පළපුරුද්දත් ලැබිය යුතුය.

**එහෙයින් ප්‍රතිපත්ති පුරන බෞද්ධයා විසින් පළමු කොට ආගම නය දත යුතුය. දෙවනුව පුහුණුව ද ලබා ගත යුතුය.** ඒ දෙකම ලබා ගත හැක්කේ තම ආගමේ ආචාර්යවරයන් ආශ්‍රය කිරීමෙනි. බෞද්ධයන්ගේ ආචාර්යවරයෝ නම් භික්ෂූන් වහන්සේලා බව යට කියන ලදී. උන්වහන්සේලාගේ ආශ්‍රයෙන් තොරව ආගමදැනීම හෝ ආගමික කටයුතු කිරිමේ පරිචයක් - පුරුද්දක් හෝ ලබා ගත හැකි අන් මගෙක් නැත. එහෙත් මෙකල බොහෝ බෞද්ධයෝ භික්ෂූන්ගෙන් බොහෝ ඈත්ව සිටිත්. එය සුළුපටු විපතක් නොව ශාසන පරිහානියට මූලික හේතුවක් බව තරයේ සිත්වලට ගත යුතුය.

පෙර කල රාජ රාජමහාමාත්‍යාදීන්ගේ පටන් සියලු බෞද්ධයෝ නිතර භික්ෂූන් ඇසුරු කළහ. එයින් ඔවුහු ආගම දැන උගෙන ගත්හ. ඒ හේතුවෙන් ශ්‍රද්ධාව දියුණු තියුණු විය. එයින් වැළකිය යුතු දුසිරිතින් වැළකී, දන ශීලාදි ආගමික ප්‍රතිපත්ති නිසි පරිදි පිරූහ. භික්ෂූන් වහන්සේලාගේ සියලු අඩු පාඩු ඉතා හිතවත්ව කරුණාවෙන් මෛත්‍රියෙන් ගෞරවයෙන් සම්පූර්ණ කළහ. ඒ නිසා එකල භික්ෂූන් වහන්සේ ද නිසි පරිදි සිත් සේ ප්‍රතිපත්ති පිරූහ. එහෙයින් ම ශාසනය ද නිර්මලව බැබළිණ. කරුණු මෙසේ හෙයින් ශීඝ්‍රව බැස ගෙන යන සර්‍වඥශාසනයා ගේ චිරස්ථිතියත් තම තමාගේ දෙලෝ දියුණුවත් සළකා ශ්‍රමණයන් වහන්සේලා ආශ්‍රය කිරීමට සිතට ගත යුතු. එවිට එය **උතුම් මංගලයක් ද** වන්නේය.

Non-commercial distribution

## 30. සුදුසු කල්හි ධර්ම සාකච්ජා කිරීම.

මෙය කුසලයක් ද? අකුසලයක් ද? කෙබඳු විපාක ඇති කර්මයක්ද? මේ ධර්මය කිනම් ස්කන්ධයකට ඇතුළත්ද? මෙය කවර ආයතනයකට කවර ධාතුවකට ඇතුළත්ද? මෙය කවර හේතුවකින් පහළ වීද? කවර සත්‍යයකට ඇතුළත් වේ ද? මනුෂ්‍ය යයි **සම්මත** වූ බඹයක් පමණ වූ විඥාන සහිත වූ මේ ශරීරයෙහි කුමක් ඇත්තේ ද? එය කුමකින් සෑදී තිබේද? කවර හේතුවකින් ඇති වීද? මතු ඊට කුමක් වේද? මේ සත්ත්වයා මරණින් මතු කොහි යේද? යනාදි ධර්මයන් පිළිබඳ ඔවුනොවුන් හමු වී කථාකිරීම, දන්නවුන් වෙතැ පැමිණ අසා කරුණු සාකච්ඡා කිරීම, ධර්මසාකච්ඡා කිරීම නම්. එය දෙලොව දියුණුවට හේතුවන්නක් බැවින් මංගලයකි.

ජාති ජරා මරණ ශෝක පරිදේවාදි අනේක දුක්ඛයනට ගොදුරුව සංසාරයෙහි ඇවිදින්නා වූ මේ සත්ත්වයනට සසර දුකින් මිදීමට ඇත්තා වූ එක ම ප්‍රධාන උපාය නම් චතුරාර්‍ය්‍යසත්‍ය ධර්මය මනාකොට අවබෝධ කර ගැන්මය. චතුස්සත්‍යාවබෝධය වනතෙක් දන ශීලාදි පින්කම් කොතෙක් කළත් සත්වයෝ සසර දුකින් නො මිදෙති. එබැවින්,

**''චතුන්නං භික්ඛවේ! අරිය සච්චානං අනනුබොධා අප්පටිවෙධා එවමිදං දීඝ මද්ධානං සන්ධාවිතං සංසරිතං මමඤ්චෙව තුම්හාකංච''**

යනුවෙන් ''මහණෙනි! සතරක් වූ ආර්‍ය්‍යසත්‍යයන් අවබෝධ නො කිරීමෙන් ප්‍රතිවේධ නො කිරීමෙන් මෙසේ දීර්ඝ කාලයක් මුළුල්ලෙහි සංසාරයෙහි මා විසින් ද තොප විසින් ද දුවන ලද්දේය'' යි තථාගතයන් වහන්සේ වදාළහ.

Non-commercial distribution

බුදුන් වහන්සේ විසින් දේශනා කරන ලද්ද වූ චතුරාර්‍ය්‍ය සත්‍ය ප්‍රකාශක ධර්‍මය වනාහි අතිශයින් ගැඹුරු ද සියුම් ද වේ. ඒ ධර්‍මය කිසි කලෙක අවබෝධ කරගත හැකි නොවේ. එබැවින් ධර්‍මාවබෝධය කර ගැන්ම පිණිස සියල්ලන් විසින් ම වීර්‍ය්‍ය කළ යුතුයි.

**ධර්ම සාකච්ඡාව වනාහි ධර්‍මාවබෝධයට ඉතා ම උපකාර වූ කාරණයකි.** අද ලෝකයේ සිටින මනුෂ්‍යයෝ බොහෝ බණ ඇසීම කරති. එහෙත් ඔවුහු ධර්‍මය නො දනිති. ඊට හේතුව නම් ධර්‍ම සාකච්ඡා නො කිරීමය. බණක් ඇසූ කල දින කීපයක් ගත වන විට සියල්ල ම අමතක වී යෑම බොහෝ දෙනකුට ඇත්තා වූ ස්වභාවයකි. යම් හෙයකින් බණක් ඇසූ තැනැත්තේ ඒ ඇසූ කරුණු අනුන් හා සාකච්ඡා කෙළේ නම් ඒ කරුණු ඔහුගේ සිත්හි දීර්ඝ කාලයක් පවතියි. පහසුවෙන් අමතක වී නො යයි. එපමණක් ද නොව, ධර්‍ම දේශනාවක් අසන්නකුට අසන ධර්‍මයෙහි ඇතැම් කරුණු මනාව අවබෝධ නොවේ. ඇතැම් කරුණු සර්‍වප්‍රකාරයෙන් ම අවබෝධ නොවේ.

ධර්‍මසාකච්ඡාවෙන් වනාහි මනාව අවබෝධ නුවූ කරුණු මනාව අවබෝධ වේ. සර්‍වප්‍රකාරයෙන් අවබෝධ නුවූ කරුණු ද අවබෝධ වීමට එය උපකාර වේ. එසේ ම බණ පොත් බලන්නවුනට බලා දින ගණනකින් ඒ බැලූ ධර්‍මයන් අමතක වේ. නමුත් අන්‍යයන් හා සාකච්ඡා කළහොත් ඒ කරුණු ද අමතක නොවී දීර්ඝ කාලයක් සිත්හි පවතී. එසේ ම මනාව අවබෝධ නුවූ කරුණු මනාව අවබෝධ වේ. සර්‍වප්‍රකාරයෙන් අවබෝධ නුවූ කරුණුද බොහෝ සෙයින් අවබෝධ වේ. එසේම ධර්‍මය උගෙන ගන්නවුනටද ධර්‍ම සාකච්ඡාව අතිශයෝපකාරී වේ ම ය.

**තවද** ධර්‍ම සාකච්ඡා කිරීම තමාට පමණක් නොව ලොවට ද කරන මෙහෙයකි. අද ලෝකයෙහි බොහෝ දෙනෙක් කරන පරිද්දෙන් තමන්ට සම්මුඛ වූවන් හා නූපන් රාගාදි ක්ලේශයන්ගේ වැඩීමටද හේතුවන්නා වූ කථාවන් නො කොට, ධර්‍ම සාකච්ඡාවක් කිරීමට පුරුදු වූවහොත් එයින් තමාට ද, ලෝකයට ද විශාල යහපතක් සිදුවන බව කිව යුතුය. එබැවින් ඒ පිණිස උත්සාහ කෙරෙත්වා!

Non-commercial distribution

## 9 වන ගාථාව

**තපො ච බ්‍රහ්ම චරියඤ්ච - අරිය සච්චාන දස්සනං**
**නිබ්බාන සච්ඡිකිරියා ච - එතං මංගල මුත්තමං**

**තපො ච** - තපස ද: **බ්‍රහ්මචරියඤ්ච** - මෛථුන සේවනයෙන් වැළකීම යයි කියන ලද බ්‍රහ්මචර්‍ය්‍යාව ද: **අරිච සච්චාන** - දුක්ඛ සමුදය නිරෝධ මාර්ග සංඛ්‍යාත චතුරාර්‍ය්‍ය සත්‍යයන් ගේ : **දස්සනං** - දැකීම ද, **නිබ්බානසච්ඡිකිරියා ච** - අර්හත් ඵල සංඛ්‍යාත නිර්වාණය ප්‍රත්‍යක්ෂ කිරීම ද යන: **එතං** - මෙය: **මංගලමුත්තමං** - උතුම් මඟුල් සතරකි.

1. **තපස ය.**

2. **බ්‍රහ්මචර්‍ය්‍යාව ය.**

3. **ආර්‍ය්‍ය සත්‍යයන් දැකීම ය.**

4. **අර්හත් ඵල සංඛ්‍යාත නිර්වාණය ප්‍රත්‍යක්ෂ කිරීම ය.**

යන මේ සතර උතුම් මංගල කාරණා සතරක් බව මේ ගාථාවෙන් ප්‍රකාශ වේ. .

*Non-commercial distribution*

# 31. තපස

මෙහි **"පාපකෙ ධම්මෙ තපතීති තපො"** යනු වචනාර්ථ හෙයින් යම් ධර්මයක් කරණකොට ගෙන පාපයන් තවා ද හෙවත් නැති කෙරේ ද ඒ ධර්මය තප නම් වේ. තප නාමයෙන් ශීලාදි නොයෙක් ධර්ම කියවෙන නමුත් එයින් බොහොමයක් යට කී මංගලයන්ට ඇතුළත් වූ බැවින් මෙහි තප නාමයෙන් ඉන්ද්‍රිය සංවරය හා වීර්‍ය්‍යය ගනු ලැබේ. අභිද්‍යා ව්‍යාපාදයන් ඉපදීම වළක්වන බැවින් ඉන්ද්‍රිය සංවරය තප නමි.

එක් එක් පුද්ගලයෙක් හට ඇසය කනය නාසයය දිවය ශරීරයය සිතය යි ඉන්ද්‍රිය සයක් ඇත්තේය. සත්ත්වයෝ රූපය ශබ්දය ගන්ධය රසය ස්පර්ශය ධර්මය යන මේ අරමුණු සය ඉන්ද්‍රියයන් කරණ කොට ගෙන අරමුණු කොට ගනිති. දැන ගනිති. රූපාදි ආරම්මණයන් අතුරෙහි සත්ත්වයන් කැමති වන්නා වූ ආරම්මණයෝ ද ඇත්තාහ. කැමති නො වන්නා වූ ඒ ඒ අයට විරුද්ධ වූ ආරම්මණයෝ ද ඇත්තාහ. ඉන්ද්‍රිය සංවරයක් නැත්තා වූ තැනැත්තා විසින් තමා කැමති වන්නා වූ ස්ත්‍රියක් හෝ වස්ත්‍රාභරණ යානවාහනාදීන් අතුරෙන් යම් කිසිවක් හෝ ගෙවල් වතු කුඹුරු ආදීන් අතුරෙන් යම් කිසිවක් හෝ දුටු විට ඔහුට ඒ දක්නා ලද්ද කෙරෙහි ලෝභය හට ගනී.

ඉක්බිති ඔහු මේ වස්තුව හෝ මෙවැනි අනිකක් හෝ මට ලැබේ නම් අයිති වේ නම් යහපතැයි සිතයි. ඉක්බිති එය ලබා ගැනීම සඳහා උපාය සිතයි. සිතන ලද උපාය පරිදි ක්‍රියා කරයි. ඒ තැනැත්තාට ඒ වස්තු දැකීමෙන් ඇති වූ ලෝභය ද පාපයකි. ඒ අන් සතු වස්තුව මට වී නම් යහපතිය යන කල්පනාව ද පාපයකි. ඒ සඳහා උපාය සිතීම් වශයෙන් උපන්නා වූ සිත් ද අකුශලයෝය. සිතන ලද උපාය පරිදි ක්‍රියා කිරීමෙහි ඇති වූ සිත් ද අකුශලයෝය.

Non-commercial distribution

මෙසේ එක ලෝභනීය ආරම්මණයක් ඇසින් දුටු කලැ ඇස නමැති ඉන්ද්‍රියය සංවරණය කර නොගන්නා වූ තැනැත්තාට ගඞ්ගාවක් ගලා යන්නාක් මෙන් අකුසල් සිත් පරම්පරාවක් පහළ වන්නේය.

විරුද්ධ පුද්ගලයකු හෝ විරුද්ධ පුද්ගලයකු අයත් වස්තුවක් හෝ දුටු කල්හි ද පුද්ගලයා හෝ වස්තුව හෝ විනාශ කරනු කැමති බව යයි කියන ලද ව්‍යාපාදය මුල් කොට ඇත්තා වූ අනේකප්‍රකාර අකුශල චිත්තයෝ ගලා යන්නා වූ ජලස්කන්ධයක් මෙන් පහළ වන්නාහු ය. අන්‍ය ඉන්ද්‍රියයන්ට කැමති වූද නොකැමති වූ ද ශබ්දාදි ආරම්මණයන් ගොදුරු වීමෙන් ද එසේ ම අභිධ්‍යාව මුල් කොට ඇත්තා වූ ද ව්‍යාපාදය මුල්කොට ඇත්තා වූ ද අකුශල චිත්ත පරම්පරාවෝ ජලස්කන්ධයක් ගලායන්නාක් මෙන් පහළ වන්නාහ. මෙසේ පහළ වන්නා වූ අකුශල චිත්ත පරම්පරාවන්ගෙන් එක එකක් ම සිය දහස් වාරයෙහි නරකාදි සතර අපායට යැවීමෙහි සමර්ථය.

මෙසේ රූපාදි ආරම්මණයන් ඉන්ද්‍රියයන්ට ගොදුරු වීමෙහිදී පහළ විය හැක්කා වූ අභිධ්‍යා ව්‍යාපාද මූලික අකුශල පරම්පරාවන් පහළ නොවන පරිද්දෙන් සිත ආරක්ෂා කර ගැනීම **ඉන්ද්‍රිය සංවරය** නම් වේ. ක්ලේශ ධර්මයන්ට වසඟ නොවී සම්‍යක් ස්මෘතියයි කියන ලද සිහියෙන් යුක්තව වාසය කරන්නා වූ තැනැත්තාට ඉන්ද්‍රියයන් කරණ කොට ගෙන දක්නා වූ අසන්නා වූ දැන ගන්නා වූ ආරම්මණයන් නිසා අභිධ්‍යා ව්‍යාපාදදි මූලික අකුශල ධර්මයෝ පහළ නො වෙති. එබැවින් ඒ සිහිය අකුශල ධර්මයන් ඇතුල් නොවන පරිද්දෙන් චක්ෂුරාදි ඉන්ද්‍රියයන් වසා තබන්නා වූ දොරක් වැනිය.

ඉන්ද්‍රිය සංවර කිරීමයයි දක්වන්නේ ඒ යහපත් සිහිය තම තමන් තුළ ඇති කර ගැනීමය. එසේ කළ කල්හි අභිධ්‍යා ව්‍යාපාදදි අකුශලයන්ට ඇතුල් විය නොහෙන පරිද්දෙන් චක්ෂුරාදි ද්වාරයෝ වසන ලද්දාහු වෙති. ඒ වැස්ම පව් තැවීමක් හෙවත් උපදින්නට ඉඩ නොදීම් වශයෙන් නැති කිරීමක් බැවින් **තප - තපස** නම් වේ. ඒ තපස අපායෝත්පත්තියෙන් මිදීමට හා ස්වර්ග මෝක්ෂ

Non-commercial distribution

සම්පත්තියට ද හේතුවන බැවින් උතුම් මංගලයකි. මේ ඉන්ද්‍රිය සංවරය චතුපාරිශුද්ධි ශීලයන් අතුරෙන් එක් ශීලයක් ද වේ.

පොහෝ දිනයන්හි සිල් සමාදන් වීම, භාවනාවෙහි යෙදීම, බණ කීම, බණ ඇසීම, විහාර විහාර මළු, දාගැබ් මළු, බෝ මළු හැමදීම, වතාවත් කිරීම ආදි ආගමික වූ ලෝකෝත්තර සුවයට හේතු වන දෑ කිරීමෙහි ද, වෙළඳාම් ගොවිතැන් ආදි දිවි පැවැත්ම පිණිස කළ යුතු දෑ කිරීමෙහි ද මනුෂ්‍යයෝ අලස වෙති. අලස වූ ඔවුහු නිකම්ම හිඳගෙන හෝ නිදා ගෙන හෝ තවත් එබන්දන් එකතු කරගෙන කථා කිරීමෙන් හෝ දඩාවතේ ඇවිදීමෙන් හෝ සෙල්ලම් කිරීම් සෙල්ලම් බැලීම් ආදියෙන් හෝ කාලය ගෙවා හිස් ජීවිතයක් ගත කොට මිය යති.

මනුෂ්‍යයා ඒ ලාමක ස්වභාවයට පැමිණෙන්නේ ඔහුගේ සිත් තුළ හටගන්නා වූ ලෝභ මෝහ ථීන මිඩාදි අකුශලයන් නිසාය. නිකම් සිටීම නමැති සැපතෙහි ආශාවත්, එහි ඇති ලාමක බව නො දැනීම නමැති මෝහයත්, සිත කය මලානික කරවන අබිං මත සේ නිදිමත කරවන ථීන මිඩ දෙකක් යන පාප ධර්මයන් සිත් තුළ හට ගත් විට ඒ තැනැත්තා කිසි යහපතක් කිරීමට නො කැමති වූ අලසයෙක් වේ. අලස කම නම් සිත් තුළ හටගන්නා වූ ලෝභ මෝහ ථීනමිද්ධ යන ක්ලේශයෝ ය. පාපයෝ ය.

මේ **අලස කම නමැති පාපය** ප්‍රාණඝාතාදිය සෙයින් කවුරුත් දන්නා ඖදාරික පාපයක් නොවන බැවින් බොහෝ දෙන එය පවක් බව පවා නො දනිති. එබැවින් ඇතැම් අලසයෝ නිකරුණේ කල් නො යවන වීර්‍ය්‍යවතුන්ට ලෝභකමට දහලතැයි නින්දා ද කරති. අහෝ ඔවුහු තමාගේ නිකම් සිටීමේ ආශාව ලෝභය බව නො දනිති. අලසකම නමැති ඒ මේ ලාමක ස්වභාවය වනාහි ලෞකික ලෝකෝත්තර උභය සම්පත්තියෙන් ම පිරිහීමට කාරණකි. එය දුරු කර ගැනීම ලෝකෝත්තර සම්පත්තියට ළඟාවීමට කාරණයකි. පාප ධර්මයක් වූ ඒ අලස බව සිය සන්තානයෙන් දුරුකිරීම කෙලෙස් නැති කිරීමක් බැවින් 'තප'නමුදු වෙයි.

අලස පුද්ගලයෝ බොහෝ සෙයින් තම තමාගේ අලස භාවය තුමූ නො දනිති. ඔවුහු කළයුතු දේ නොකර හැරීමට යම් කිසිවක්

Non-commercial distribution

හේතුවක් කොට සලකා ගනිති. ඒ කරුණු **කුසීත වස්තූ** යයි තථාගත ධර්මයෙහි දක්වා තිබේ. ඒ කුශීත වස්තූහු නම් ශීතෝෂ්ණාදියයි. අලසයෝ මඳක් ශීතල ඇති කල්හි එය කරණකොට ඉතා ශීතලය මේ වෙලාව කටයුතු නොකළ හැකි යයි කටයුතු අතපසු කරති. මඳක් උෂ්ණ කලක් වී නම් මේ වෙලාව ඉතා උෂ්ණයයි කටයුතු අතහැර දමති.

තව ම ඉතා උදෑසන යයි උදෑසන කටයුතු පටන් නො ගෙන නිදති. සවස් වූ කල්හි දැන් බොහෝ සවස් වී තිබේ ය, කල් නැත යයි කටයුතු හැර දමති. ප්‍රණීත ආහාරයක් ලැබ අනුභව කළ කල්හි කුස පිරී තිබෙන බැවින් කටයුතු නොකළ හැකියයි නිදති. කුස හිස් වූ කල සාගින්නෙන් වැඩ නොකළ හැකි යයි කටයුතු අතපසු කරති. අමාරු වැඩක් කරන්නට තිබෙන කල්හි පසුවට මහන්සි වෙන්නට තිබෙන බව සලකා ප්‍රථමයෙන් නිදති. බර වැඩක් කොට නිම වූ කල්හි වැඩ කොට මහන්සි වී යයි දවස් ගණන් නිදති.

ගමනක් යෑමට තිබෙන කල්හි මතු යන්නට තිබෙන ගමන සලකා කල් ඇතුව ම කටයුතු හැර දමා නිදති. ගමන ගොස් ආ කල්හි ද ගමනක් ගියා වූ මාගේ ශරීරයට වෙහෙස යයි කටයුතු නො කොට නිදති. සුළු අසනීපයක් ඇති කල්හි වැඩ කිරීමට සනීප නැතය යි නිදති. අසනීපය සුව වූ කල්හි ද දැන් සනීප වූ හැටියේ ම වැඩ කළ නොහැකියයි නිදති. මෙසේ අලස පුද්ගලයෝ තමාගේ අලසත්වය ගැන මඳකුදු නො සිතා නොයෙක් කරුණු පෙරටු කොට ගෙන කටයුතු අතපසු කරති.

අලසයන්ට නිද ගැනීමට හේතුවන්නා වූ මේ කරුණුම අලස කම සිය සිතින් දුරු කර ගෙන සිටින්නවුන්ට වඩ වඩාත් වීර්යයෙන් කටයුතුවල යෙදීමට හේතු වෙති. උෂ්ණ කාලය පැමිණි කල්හි මේ උෂ්ණය අධික වී නම් මගේ කටයුතු සිදු කර ගන්නට නො ලැබෙන්නේය කියා හෝ මෙයින් අසනීපයක් හෝ වී නම් එයින් ද මාගේ කටයුතු පසුවන්නේය කියා හෝ සලකා වඩ වඩා වීර්‍ය්‍යයෙන් කටයුතු කරති. ඉතා උදෑසන කාලයෙහි ද දැන් දැන් කටයුතු පටන් ගැනීමෙන් කලින් මාගේ වැඩ නිම වෙන්නේ යයි සලකා උදෑසන ම වැඩ පටන් ගනිති.

Non-commercial distribution

සවස් කල්හි ද වඩ වඩා සවස් වුවහොත් කටයුත්තෙන් ස්වල්පයකුදු කරන්නට නො ලැබේ යයි සලකා වහ වහා කටයුත්තෙහි යෙදෙති. ප්‍රණීත දෑ අනුභව කොට කුස පිරුණු කල්හි මෙතෙක් වටිනා දේ අනුභව කොට හිස්ව කාලය නො ගෙවිය යුතුය යි කටයුත්තෙහි යෙදෙති. මද අසනීපයක් වූ කල්හි ද ඉදින් මෙය ක්‍රමයෙන් වැඩී ශරීරය අප්‍රාණික වූ කලැ කටයුතු කළ නොහේ යයි වඩ වඩා උත්සාහයෙන් කටයුත්තෙහි යෙදෙති.

අසනීපයක් වී සුව වූ කල්හිද අසනීපය නිසා මගේ වැඩ බොහෝ පසුවී යයි සනීප වූ වහාම වැඩ පටන් ගනිති. ගමනක් යන්නට තිබෙන කල්හි ද ගමන යෑමෙන් වන පාඩුව මග හැරීමට ඒ බව සලකා වඩ වඩා වීර්‍ය්‍යයෙන් කටයුතු කරති. ගමනක් ගොස් ආ කල්හි ද ගමන යෑමෙන් පසු වූ කොටසත් සම්පූර්ණ කරගන්නා අදහසින් වඩ වඩා වීර්‍ය්‍යයෙන් කටයුතුවල යෙදෙති. මෙසේ අලසයන්ට කටයුතු පසු කිරීමට හේතු වන්නා වූ කරුණු වීර්‍ය්‍යවත්හු වඩ වඩා වීර්‍ය්‍ය කිරීමට කරුණු කර ගනිති. ශීතෝෂ්ණාදි වූ ඒ ඒ කරුණු නිසා කටයුතු පසු කිරීමට සිත් පහළ වන්නේ තමන් තුළ ම පවත්නා වූ අලස බව නිසා යයි තේරුම් ගෙන ඒ මහානර්ථකරවූ අලස බව සියල්ලෝ ම දුරු කර ගනිත්වා.

අලසයෝ වනාහි ඉබේම තමා කරා සම්පත් ළඟා වන තෙක් බලා සිටිති. නුමුත් එයින් වන්නේ සම්පත්තිය ඔවුන්ගෙන් වඩ වඩා ඈත් වීමය. වීර්‍ය්‍ය කරන්නා හට අභිමතාර්ථයෝ මොහොතින් මොහොත ම ළං වන්නාහ. නිකම්ම නිදා සිට ලැබිය හැකි ලෞකික වූ හෝ ලෝකෝත්තර වූ හෝ කිසිම සම්පත්තියක් නැත්තේය. **මේ කාලයෙහි බොහෝ දෙනෙක් ධනාදි ලෞකික සම්පත් ගැන වීර්‍ය්‍ය කෙරෙත් මුත් ලෝකෝත්තර සම්පත්තීන් සඳහා අල්ප මාත්‍ර වීර්‍ය්‍යය කුදු නො කරති.**

**ඔවුහු තමාගේ හා අඹුදරුවන්ගේ සියලුම කුදු මහත් කටයුතු සම්පූර්ණ කොට ඉතිරිවන දෙයක් ඇත්නම් එයිනුදු ස්වල්පයක් පිං පිණිස පරිත්‍යාගකිරීමෙනුත්, කිසිම වැඩක් නැති වුවහොත් කාලය නිකම් ගත කරනු වෙනුවට සිල් සමාදන් වීමෙන් හා තවත් එවැනි අල්ප දේ කිරීමෙනුත් ලෝකෝත්තර නිවන් සුවය ලැබීමට බලාපොරොත්තු වෙති.** ඒ වනාහි දිනක් වැඩ කිරීමෙන් සිටුවරයෙක්

Non-commercial distribution

වන්නට සිතීම වැනි වූද , එක පොතක් ඉගෙනීමෙන් පණ්ඩිතයෙක් වන්නට සිතීම වැනි වූ ද බොළඳ කල්පනාවකි.

මාර්ග ඵල නිර්වාණ සංඛ්‍යාත ලෝකෝත්තර සම්පත්තිය වනාහි මහත් වූ වීර්‍ය්‍යයෙන් ලබාගත යුත්තකි. එය ලෙහෙසියෙන් පහසුවෙන් ලැබිය හැක්කක් නොවේ. **තථාගතයන් වහන්සේ** විසින් එය ලබන ලද්දේ චතුරසංඛ්‍ය කල්ප ලක්ෂයක් වූ දීර්ඝ කාලයක් මුළුල්ලේ පින් රැස් කිරීමෙන් හා අන්තිම ජාතියේදී චතුරඞ්ග සමන්වාගත වීර්‍ය්‍යාධිෂ්ඨානයෙන් භාවනාවෙහි යෙදීමෙනි. **චතුරංග සමන්වාගත වීර්‍ය්‍යය** නම්, මාගේ ශරීරයෙහි සමත් නහරත් ඇටත් පමණක් ඉතිරි වෙතොත් වේවා, ලේ මස් වියළී යතොත් යේවා, කුමක් වුවත් මා විසින් පැමිණිය යුතු ලැබිය යුතු බෝධියක් හා අර්හත්වයක් ඇද්ද එයට නො පැමිණ නො ලබා වීර්‍ය්‍යයාගේ නැවැත්වීමක් නැත යයි පවත්වන ලද මහා වීර්‍ය්‍යයයි.

බොහෝ බුද්ධ ශ්‍රාවකයන් වහන්සේලා ද එසේම වීර්‍ය්‍ය කොට ඒ ලෝකෝත්තර සම්පත්තිය ලබාගත්හ. **ගඞ්ගාතීරිය තෙරුන් වහන්සේ** තුන් වසරක් මුළුල්ලෙහි ස්ත්‍රියකට කී එක වචනයක් හැර අන් කිසිවකු සමග වචනයකුදු කථා නො කොට භාවනාවෙහි යෙදී රහත් වූ සේක. ලෝකෝත්තර නිර්වාණ සම්පත්තිය මෙසේ මහත් ආයාසයෙන් ලැබිය යුත්තක් බව තේරුම් ගෙන එය ලබා ගනු කැමැත්තෝ දන ශීල භාවනා සඞ්ඛ්‍යාත ත්‍රිවිධ පුණ්‍ය ක්‍රියාවෙහි උත්සාහයෙන් යෙදෙත්වා. ලෞකික සම්පත් වනාහි කෙතරම් උත්සාහයෙන් ලබා ගත ද ඒවා නොබෝ කලකින් නැති වී සිහිනයක් මෙන් වන බව ද තේරුම් ගනිත්වා.

*Non-commercial distribution*

# 32. බ්‍රහ්මචර්‍යාව

සනරාමර ලෝක මංගල අප භාග්‍යවත් අර්හත් සම්‍යක් සම්බුඬයන් වහන්සේ විසින් වදළ පිටකත්‍රය ධර්මයෙහි **බ්‍රහ්මචර්‍ය ශබ්දය** දන මෛත්‍රී කරුණා මුදිතා උපේක්ෂාදි අර්ථ රාශියක් දක්වන්නා වූ ශබ්දයකි. මේ මංගල කථාවෙහි වනාහි එයින් දැක්වෙන අර්ථ බොහොමයක් යට දැක්වූ මංගලයන්ට ඇතුළත් වූ බැවින් මෙතැන්හි මෛථුනයෙන් වැළකීම හා මහණදම් පිරීමය යන අර්ථ දෙක ''**බ්‍රහ්මචරිය**'' යන්නෙන් ගනු ලැබේ.

මෛථුන සේවන සංඛ්‍යාත අබ්‍රහ්මචර්‍යාව රාගාදි ක්ලේශයන්ට වසඟව සිටිනා ලෝකයා විසින් උතුම් සැපතක් සේ සලකන ලද්දක් වුව ද නික්ලේශී වූ බුඬාදි ආර්‍යයන් වහන්සේලා විසින් අතිශයින් නින්ද කරන ලද්දකි. භික්ෂූන්ට විනය සික පද පැනවීමෙහිදී එය භාග්‍යවතුන් වහන්සේ විසින් පළමුවන පාරාජිකාව කොට පණවන ලදී. එබැවින් භික්ෂූන් විසින් දිවි හිමියෙන් එයින් වැළකිය යුතුය.

ගිහි වූවෝ ද දිවිහිමියෙන් බ්‍රහ්මචාරී වූවාහු නම් ඉතා යහපත්ය. එහි අනුසස් බොහෝ ඇත්තේය. බ්‍රහ්මචාරීහු බොහෝ වයස් ගතවන තුරු තරුණයන් සේ සිටිති. දීඝී කාලයක් ජීවත් වෙති. නිරෝගී වෙති. බොහෝ ශරීර ශක්තිය ඇත්තෝ වෙති. ලෝකයාට ප්‍රිය පුද්ගලයෝ වෙති. ආනුභාවය ඇත්තෝ වෙති. පිනා ගිය ඉන්ද්‍රියයන් ඇත්තෝ වෙති. මරණින් මතු ද ස්වර්ගයට යෙති.

දිවි හිමියෙන් බ්‍රහ්මචාරී නොවිය හැකි වුවද සියල්ලන් විසින් ම කෝමාර **බ්‍රහ්ම චරියාව** රක්ෂා කළ යුතුය. කෝමාර බ්‍රහ්මචරියාව නම් නියම වයසට පැමිණීමට පෙර බාල කාලයෙහි රක්ෂා කළ යුතු බ්‍රහ්මචර්‍යාවය. පෙර විසූ බ්‍රාහ්මණයන් අටසාළිස් වසක් කෝමාර බ්‍රහ්මචර්‍යාව රැකි බව **ද්‍රෝන සූත්‍රයෙහි** දක්වා තිබේ.

Non-commercial distribution

වර්තමාන කාලයෙහි බොහෝ දෙන කෝමාර **බ්‍රහ්මචර්‍ය්‍යාව** රක්ෂා නො කොට බාල කාලයේදී ම අබ්‍රහ්මචාරීත්ව ජීවිතය අවාසනාවත් කර ගනිති. බාල කාලයෙහි විෂම පැවතුම් ඇත්තා වූ ස්ත්‍රී පුරුෂයෝ අකාලයෙහි ජරාවට පැමිණෙති. මද ආයුෂයෙන් මිය යති. සිහි නුවණ මඳවෙති: අන්ධ වෙති. කොරවෙති: පරංගි රෝගය, ලාදුරු රෝගය, ක්ෂය රෝගය ආදි නපුරු රෝගයන්ට භාජන වෙති. ලෝකයාට අප්‍රිය වෙති. එබැවින් යහපත් ජීවිතයක් ගත කිරීමට කැමැත්තවුන් විසින් කෝමාර බ්‍රහ්මචරියාව රක්ෂා කළ යුතුය. පෙර මහෝත්තමයන් බ්‍රහ්මචර්‍ය්‍යාව රැකි අයුරු දැන ගැනීම පිණිස **උදය භද්ද ජාතකය** දක්වනු ලැබේ.

**උදය භද්ද ජාතකය.**

පෙර දඹදිව කසීරට සකල සම්පත්තියෙන් පරිපූර්ණ වූ සුරුන්ධන නම් වූ දර්ශනිය නගරයක් විය. එහි රාජ්‍ය කරන්නා වූ කසී රජහට **'උදය භද්'** නම් වූ එකම කුමාරයෙක් සිටියේය. ඒ කුමාරයෝ වැඩි විය පැමිණියාහු සකල ශිල්පයන්හි නිපුණ වූහ. කසී රජ, කුමාරයාණන් රාජ්‍යයෙහි අභිෂේක කරවනු කැමැත්තෝ එපවත් කුමාරයාට දැන්වීය. **උදය භද් කුමාරයෝ වූ කලී** උප්පත්තියෙන්ම බ්‍රහ්මචාරී වූවෝය. ලෝකාස්වාද රතිය සිහිනෙනුදු නොදත්තෝය. එබැවින් මට රජයෙන් කම් නැතැයි පිය රජතුමාගේ ඉල්ලීම ප්‍රතික්ෂේප කළෝය. මා පිය දෙදෙන කුමාරයන්ට නැවත නැවත ඒ සඳහා කියන්නට වූයෙන් ඔවුන්ගේ ඉල්ලීම උපායකින් ප්‍රතික්ෂේප කරමියි සිතා කුමාරයාණෝ දක්ෂ ශිල්පියකු ලවා රනින් ස්ත්‍රී රූපයක් කරවා මේ රන් රුව බඳු කුමාරිකාවක් ලදෙත් රජය කරමියි මව්පියන් වෙතැ ඒ රන් රුව යැවූහ.

**රජ්ජුරුවෝ** ඒ රන් රුව දඹදිව සෑම රාජධානියක් පාසා යවා එබඳු කුමාරිකාවක් සොයවා නො ලැබ තමන්ගේ අන් බිසවක කුස උපන් **'උදය භද්‍රා'** නම් කුමාරිකාව සර්වාභරණයෙන් සරසවා රන්රුව සමීපයෙහි තබා බැලූහ. ඒ කුමාරිකාවෝ රන්රුවට ද වඩා රූප සෞන්දර්‍ය්‍යයෙන් යුක්ත වූවෝය. එකල්හි රජ්ජුරුවෝ ඔවුන් දෙදෙනාගේ අකමැත්ත තිබියදී ම ඒ

Non-commercial distribution

කුමාරිකාවන් අගමෙහෙසුන් කොට උදය භද්‍ර කුමාරයාණන් රාජ්‍යයෙහි අභිෂේක කර වූහ.

එතැන් සිට ඔවුන් දෙදෙන කාමරාගයෙන් තොර වූ අන්‍යෝන්‍ය සහෝදර ප්‍රේමයෙන් යුක්තව එක්ව විසුවෝය. එකම ශ්‍රී යහන් ගබඩාවෙක වසන්නාහු නමුදු කිසි දිනෙක කෙනෙක් කෙනකුගේ මුහුණ පවා රාග සිතින් නො බැලූහ. මෙසේ බ්‍රහ්මචර්‍ය්‍යාව පුරමින් වෙසෙන්නා වූ මේ පින්වතුන් දෙදෙන ''යමෙක් පළමු කොට මිය ගියෝ නම් අවුත් තමා උපන් තැන අනිත් තැනැත්තාට කිය යුතු'' යයි **'කතිකාවක්''** කරගෙන සිටියෝය. ඒ කාලයේ මිනිසුන්ගේ සාමාන්‍ය වයස අවුරුදු දස දහසකි. ( එතරම් දීර්ඝායුෂයක් තිබියදී පවා නුවණැත්තන් කල් යැවූ සැටි මේ දෙදෙනාගේ චරිතයෙන් මොනවට පැහැදිලි වේ. ) උදය රජතුමා සත්සියයක් අවුරුදු රජකම් කොට මිය ගොස් තව්තිසා දෙව් ලොව සක් දෙව් රජව උපන්නේය. ඉන් පසු දේවිය රාජ්‍ය කරවීය.

**තව්තිසා දෙව්ලොව උපන් උදයභද්‍ර කුමාරයාට** ලද විශාල වූ ශක්‍ර සම්පත්තිය නිසා දේවිය හා කරගත් කතිකාවත අමතක විය. දින කීපයක් ගතවිය. අටවනදා එය සිහිපත් විය. තව්තිසා දෙව් ලොවට ගත වූයේ දින හතක් වුවද මිනිස් ලොව සිටි උදයභද්‍රාවට එය අවුරුදු හත් සියයක දීර්ඝ කාලයක් විය. එයට හේතුව මිනිස් ලොව අවුරුදු සියයක් ඒ දෙව්ලොවට එක දිනයක් වීමය. එවැනි දින සතක් සතියකි. සති සතරක් මාසයකි. මාස දොළසක් වසකි. එවැනි වර්ෂ දහසෙක් තාවතිංස දෙවියන්ගේ ආයුෂයයි. මෙය මිනිස් ගණනින් කියතොත් තුන්කෙළ සැටලක්ෂයක් අවුරුදුය

**සක් දෙව් රජ** අවුරුදු හත්සියයකට පසුව සිහි වූ උදයභද්‍රාවන් ධනයෙන් විමසා දහම් දෙසා උපන් තැන කියා ප්‍රතිඥාව ඉටුකොට එමියි සිතා මිනිස් ලොවට අවුත්, රාත්‍රියෙහි දෙරවල් වසා සිය ගණන් ආවුධ ගත් යෝධයන් මුර කරන්නා වූ රජගෙදර උඩු මහල් තලයෙහි ශ්‍රී යහන් ගබඩාවෙහි සිරියහන මත සැතපී දේවිය තමන්ගේ ශීලය මෙනෙහි කරමින් එකලාව වසන කල්හි, රන්තලියක් පුරා රන්කාසි ගෙන දේවියගේ සිරියහන් ගබඩාවට ඇතුල්ව දේවියට කථාකොට මෙසේ කීවේය.

Non-commercial distribution

එකා නිසින්නා සුචිසඤ්ඤතුරු
පාසාද මාරුය්හ අනින්දිතංගී
යාචාමි තං කින්නර නෙත්තචක්ඛු
ඉමෙක රත්තිං උභයො වසෙම

පරම ශෝභාවෙන් අග්‍රප්‍රාප්ත වූ දැකුම්කලු ශරීරයකින් යුක්තව, කිඳුරඟනන්ගේ නේත්‍ර වැනි යහපත් නෙත් සඟලකින් යුක්තව, පිරිසුදු වස්ත්‍රයෙන් සැරසී උතුම් ප්‍රාසාදයෙහි මතු මහල් තලයෙහි එකලාව වසන සුන්දරාඞ්ගනාවට යාඥා කරමි. අද එක් රැයක් මේ යහන් ගබඩාවෙහි තී සමග එක සයනයෙහි වැතිර සයනය කිරීමට මට අවසර දුන මැන.

**උදයභද්‍රාවෝ** :-

ඔකිණ්ණන්තර පරිඛං දළ්හමට්ටාල කොට්ඨකං
රක්ඛිතං ඛග්ග හත්ථෙහි දුප්පවෙසමිදං පුරං
දහරස්ස යුවිනො චා පි ආගමො ච න විජ්ජති.
අථ කෙනනු වණ්ණෙන සංගමං ඉච්ඡසි මයා

මේ දොළොස් යොදුනක් ඇති සුරුන්ධන පුරය දිය අගල් මඩ අගල් ආදී අගලින්ද, මහත් දෙරටු අටල්ලෙන් ද ගැවසී ගත්තේය. ආවුධ ගත් දස දහසක් යෝධයන් විසින් රැකවල් ගන්නා ලදී. නගරයෙහි වූ සියලුම දෙරවල් වසා ආරක්ෂාව සැලසූ මෙවේලෙහි මාගේ අන්තතඃපුරයට තබා නගරයට ද ලොකු කුඩා කිසිවකුට ඇතුල් විය නොහැකිය. එසේ වූ මේ රාත්‍රියෙහි මෙහි අවුත් මා හා එක්ව වාසයට කැමති වන තොප කවරෙක් ද?

**ශක්‍ර දේවේන්ද්‍රයෝ** :-

යක්ඛො හමස්මි කල්‍යාණි!
ආගතොස්මි තවන්තිකං
ත්වං මං නන්දය භද්දන්තෙ
පුණ්ණ කංසං දදාමි තෙ

**එම්බල සොඳුර**, තොප වෙත ආවා වූ මම එක් දේවතාවෙක්මි. අද තී මා කාමාශ්වාදයෙන් සතුටු කරව. තොපට මම මේ රන්කාසි පිර වූ රන්තලිය ඒ පිණිස තෑගි කොට දෙමි.

Non-commercial distribution

**උදය භද්‍රාවෝ:-**

දේවං ච යක්ඛං අථ වා මනුස්සං
න පත්ථයෙ උදය මතිච්ච මඤ්ඤං
ගච්ඡෙව ත්වං යක්ඛ! මහානුභාව
මාවස්සු ගන්ත්වා පුනරාවජිත්ථ

**මහානුභාව සම්පන්න වූ දිව්‍යරාජය,** දෙවියකු හෝ යක්ෂයකු හෝ මනුෂ්‍යයකු හෝ වේවා, මම මාගේ උදය රජතුමන් හැර අන් කිසිවකු නොපතමි. එබැවින් තොප මෙතැන නො රැඳී වහා පලා යව. නැවත ද මෙහි නො එව. තොපගේ පඬුරෙන් ද මට වැඩක් නැත. එකල්හි **ශක්‍ර දිව්‍යරාජයා** අතුරුදහන්ව ගියාක් මෙන් සිට දෙවන දවස්හි ද එවෙලාවට ම රන්කාසි පිරූ රිදී භාජනයක් ගෙන එහි පෙනී සිට මෙසේ කීයේය :-

යා සා රතී උත්තමා කාම භොගිනං
රතීසු සත්තා විසමං චරන්ති
මා තං රතිං ජීයි තුවං සුචිම්හිතෙ
දදමි තෙ රූපියං කංසපූරං

**සොඳුර**, කාමභෝගී සත්ත්වයනට ඇති සැප අතරෙන් මෛථුන කාමාශ්වාදය හා සමාන උතුම් සැපයක් නැත. ලෝකයෙහි බොහෝ සත්ත්වයන් නොයෙක් දුශ්චරිතයන්හි ද යෙදෙන්නේ මේ කාමශ්වාදය ලබා ගැන්මට ක්‍රියා කිරීමෙනි. එවැනි ශ්‍රෙෂ්ඨ වූ කාමාශ්වාදයෙහි නොයෙදී තොපගේ මේ වටිනා ශෝභන රූප සම්පත්තිය නිකරුණේ දිරීමට ඉඩ නො දෙව, මම ද ඔබට ඒ පිණිස රන්කාසි පිර වූ රිදී බඳුනක් තෑගි කරමි.

**උදය භද්‍රාවෝ ද** මොහු සමග කථාවට ගියොත් මොහු නැවත නැවත මෙහි එති. එහෙයින් මොහු සමග කථාවකුදු නො කරමියි සිතා, එදින වචනයකුදු කථා නො කළහ.

**ශක්‍ර දිව්‍ය රාජයා ද** එම කාරණය දැන එදින ද පෙර සේ ම එහි ම අතුරුදහන්ව සිට පසු දින රාත්‍රියෙහි ද පෙර සේම කහවනු පිරූ ලෝහතලියක් ගෙන එහි පෙනී සිට පෙර සේම කීය.

Non-commercial distribution

**උදය භද්‍රාවෝ:–**

නාරිං නරො නිජ්ඣපයං ධනෙන
උක්කංසති යත්ථ කරොති ඡන්දං
විපච්චණීකො තව දෙවධම්මො
පච්චක්ඛතො ථොකතරෙන එසි

**පින්වත!** තොප දෙවියකු වුවත් මෝඩ දෙවියෙක. මිනිසුන්, සතුටු නොවන්නා වූ ස්ත්‍රීන් සතුටු කිරීම පිණිස දිනෙන් දින වැඩි වැඩි කොට පුද පඩුරු ගෙනෙති. නුඹ වනාහි එසේ නොව, දිනෙන් දින අඩු කොට පඩුරු ගෙනෙන්නෙහිය.

**සක් රජ** :– දේවිය, මම වනාහි මෝඩයෙක් නො වෙමි. මම දක්ෂ වෙළෙන්දෙක්මි. ඉදින් තී ආයුෂයෙන් හෝ වර්ණයෙන් දිනෙන් දින වැඩෙන්නී නම් මම ද දිනෙන් දින වැඩි කොට පඩුරු ගෙනෙන්නෙමි. තී දිනෙන් දින ආයුෂයෙන් වර්ණයෙන් පිරිහෙන්නීය. ඊයේට වඩා තී අද මහළු වූවාය. එබැවින් මම තෑගිද මඳ කොට ගෙනාවෙමියි කියා මෙසේ ද අවවාද කෙළේය.

**ආයුංච වණ්ණොච මනුස්සලොකෙ**
**නිහීයති මණුජානං සුගත්තෙ**
**තෙනෙව වණ්ණෙන ධනම්පි තුය්හං**
**නිහීයති ජිණ්ණතරාසි අජ්ජ**

මනුෂ්‍ය ලෝකයෙහි මිනිසුන්ගේ ආයුෂ හා වර්ණය ද, චක්ෂුරාදි සියලු ඉන්ද්‍රියයෝද දිනෙන් දින පෙරහනෙහි වත්කළ ජලයක් මෙන් පිරිහෙන්නේය. ඒ ස්වභාව ධර්මයෙහි පිහිටියා වූ තී ද මා පළමු දුටු දිනයට වඩා ඊයේ වන විට පිරිහී මහලු වූවාය. අද එයටත් වඩා පිරිහී මහලු වී සිටින්නීය. මේ කාරණය නිසා තොපට ගෙන ආ තෑගි ද දිනෙන් දින අඩු විය.

**එවං මෙ පෙක්ඛමානස්ස - රාජපුත්ති යසස්සිනී**
**භායතෙ වත තෙ වණ්ණො - අහොරත්තානමච්චයෙ**

බොහෝ සම්පත් ඇති රාජ **කුමාරිකාවෙනි,** තිගේ රූප ශෝභාව මා බලා සිටියදී ම මෙසේ පිරිහී යන්නේය. දිවාරාත්‍රී දෙක්හි ම ඒ

*Non-commercial distribution*

පිරිහීම-මහලු වීම නො කඩවා සිදුවන බැවින් මෙසේ දින ගණන් සති ගණන් මාස ගණන් අවුරුදු ගණන් ටිකෙන් ටික ගත වීමෙන් ටික කලක් යන විට තිගේ ශරීරය සම්පූර්ණයෙන් ම අභාවයට - විනාශයට යන්නේය..

**ඉමිනාව ත්වං වයසා - රාජපුත්ති සුමෙධසෙ**
**බ්‍රහ්මචරියං චරෙය්‍යා සි - හීයො වණ්ණවතී සියා**

නුවණැත්තා වූ **කුමාරිකාවෙනි.** ඒ ජරාවට පැමිණීමට මත්තෙන් දැන් දැන්ම මේ තරුණ වියෙහිදී ම ශ්‍රමණ ධර්ම සංඛ්‍යාත බ්‍රහ්මචරියාව රක්ෂා කරව. එවිට තී වඩ වඩාත් වර්ණවත් වන්නීය.

**උදය භද්‍රාවත් දෙව්ලොව තතු විචාරීම :-**

දෙවා න ජීරන්ති යථා මනුස්සා
ගත්තේසු තෙසං වලියො න හොන්ති
පුච්ඡාමි තං යක්ඛ මහානුභාව
කථන්නු දෙවානං සරීරදෙහො

මහනුභාව සම්පන්න **දිව්‍ය රාජය,** මනුෂ්‍ය සම්පත්තිය අල්ප ස්වල්ප කොට දක්වන ඔබ අතින් මේ ප්‍රශ්නය විචාරමි. දිව්‍ය ලෝකයෙහි දෙවියෝ මනුෂ්‍ය ලෝකයෙහි මනුෂ්‍යයන් මෙන් ජරාවට නො පැමිණෙත් ද? ජරාවට පැමිණෙන මිනිසුන්ගේ ශරීර වර්ණය විනාශ වී ඇඟ රැළි වැටී කොරළ පිපී දුර්වර්ණ වන්නාක් මෙන් දෙව්ලොව දෙවියෝ දුර්වර්ණ අවලක්ෂණ නො වෙත් ද? ඒ දෙවියන්ගේ ශරීර ස්වභාවය කෙසේ ද?

**සක් දෙව් රජ දෙව් ලොව තතු පැවසීම :-**

**දෙවා න ජීරන්ති යථා මනුස්සා**
**ගත්තේසු තෙසං වලියො න හොන්ති**
**සුවෙ සුවෙ හීය්‍යතරොව තෙසං**
**දිබ්බොච වණ්ණෝ විපුලාව භොගා**

**පින්වත් රාජකුමාරිකාවෙනි.** මිනිස්සු ජරාවට ගිය කල රූපයෙන් හා ඡවි වර්ණයෙන් ද චක්ෂුරාදි ඉන්ද්‍රියයන්ගෙන් ද කායික

Non-commercial distribution

චෛතසික බලයෙන්ද සිහි නුවණින්ද උපභෝග පරිභෝග සම්පත්තීන් ගෙන්ද පිරිවරින් ද යන සියල්ලෙන්ම පිරිහෙති. ඇතැම් විට තමා හදු වැඩූ දරුවනට පවා එපා වී පිටමං කරනු ලබති. - **දෙවියෝ එසේ නො පිරිහෙති**. ඔවුන්ගේ ශරීරයේ කොරල පිපිම් ඇඟ රැලි වැටීම් ආදි පිරිහීම් නැත. ඔවුහු මටසිලුටු ගණරන් පිඩළු මෙන් මනා වූ ශරීර වර්ණ ඇත්තෝය. ඔවුන් මහත් වන්නට වන්නට ඔවුන්ගේ ඒ යහපත් ශරීර වර්ණාදිය ද පරිවාරාදි සියලු සම්පත්තීහු ද වැඩෙත්.

මනුෂ්‍ය ලෝකයෙහි රූප සම්පත්තියෙන් පිරිහීම ද වර්ණයෙන් පිරිහීම ද චක්ෂුරාදි ඉන්ද්‍රියයන්ගෙන් පිරිහීම ද පරිවාරාදි සම්පත්තියෙන් පිරිහීම ද මිනිසකුගේ පරණබව දැන ගැන්මට ඇති ලකුණු වෙති. දිව්‍ය ලෝකයෙහි අධික වූ රූප සම්පත් ඇති බව ද අධික වූ පරිවාරාදි සම්පත් ඇති බව ද පරණ දෙවියකු බව දැන ගැන්මට ඇති ලකුණු වෙති. මෙසේ දිව්‍ය ලෝකයෙහි සකල සම්පත්තීන් ගෙන් දිනෙන් දින වැඩි වන තැනකි. එබැවින් මේ දිනෙන් දින පිරිහෙන ලාමක වූ මනුෂ්‍ය ජීවිතය පිරිහී යාමට පළමු තරුණ වියෙහිදී ම පැවිදිව මහණ දම් පුරා පිරිහෙන මනුෂ්‍ය ලෝකයෙන් චුතව නො පිරිහෙන දිව්‍ය ලෝකයෙහි උප්පත්තිය ලබව.

**උදය භද්‍රාවත් දෙව්ලෝ මග විචාරීම** :-

කිංසූධ භීතා ජනතා අනෙකා
මග්ගෝ ච නෙකායතනං පවුත්තෝ
පුච්ඡාමි තං යක්ඛ මහානුභාව
කත්ථ ඨිතො පරලොකං න භායෙ

මහානුභාව සම්පන්න දිව්‍ය රාජය, දිව්‍ය ලෝකය වර්ණනා කරන ඔබගෙන් මෙය ද විචාරමි. ක්ෂත්‍රියාදි භේද භින්න වූ මේ මනුෂ්‍ය සමූහය කුමකට භයින් කා කෙරෙහි භයින් භායන ස්වභාවය ඇති මනුෂ්‍ය ලෝකයෙන් වර්ධක ස්වභාවය ඇති දිව්‍යලෝකයට නො යත්ද? දිව්‍ය ලෝක ගාමී මාර්ග ද නොයෙක් පණ්ඩිතයන් විසින් නොයෙක් අයුරින් පවසන ලදී. ඒ මාර්ගයන් අතුරෙන් කවර මාර්ගයෙක්හි පිළිපන් සත්ත්ව තෙමේ නො බා පරලොවට යන්නේ ද?

Non-commercial distribution

**සක්දෙව් රජ දෙව්ලෝ මඟ පැවසීම :-**

**වාචං මනං ච පණිධාය සම්මා**
**කායෙන පාපානි අකුබ්බමානො**
**බව්හන්නපානං ඝරමාවසන්තො**
**සද්ධො මුදූ සංවිභාගී වදඤ්ඤූ**
**සඞ්ගාහකො සඛිලො සණ්හවාචො**
**එත්ථ ඨිතො පරලෝකං න භායෙ**

කය වචන සිත යන ද්වාරත්‍රය මනාකොට පිහිටුවීම් වශයෙන් දශ අකුසල් නො කොට, දශ කුසල ධර්මයෙහි යෙදේ ද, - දීමෙහි විපාක ඇත්තේ යයි දැන සැදැහැ සිතින් අනුන්ට යහපතක් කරමියි ය යන මෘදු සිතින් බොහෝ වූ ආහාර පාන වස්ත්‍රාභරණාදි වස්තූන් දුගී මගී යාචක ශ්‍රමණ බ්‍රහ්මණාදීනට දෙන්නේ ද, ප්‍රතිග්‍රාහකයන්ගේ අදහස් දැන ඔවුනට වුවමනා දෙයින් සංග්‍රහ කරන්නේ ද, දනය ප්‍රිය වචනය අනුන්ට හිත පිණිස වැඩ කිරීම සමානාත්මතාව යන සතර සංග්‍රහ වස්තුවෙන් යුක්තව වෙසේ ද, පරුෂ වචනයෙන් වෙන්ව ප්‍රිය වාදිතා ගුණයෙන් යුක්ත වේ ද, කේලාම් කීමෙන් වෙන්ව අනුන්ට යහපත සලසන යහපත් වචන ඇත්තේ වේ ද, මෙකී ගුණධර්මයන්හි පිහිටි තැනැත්තේ පරලොව යෑමට බිය නැත.

**උදයභද්‍රාවන්ගේ ප්‍රශ්නය :-**

**අනුසාසසි මං යක්ඛ! - යථා මාතා යථා පිතා**
**උළාරවණ්ණං පුච්ඡාමි - කොනු ත්වමසි සුබ්‍රහානි**

යම් සේ මෑණි කෙනෙක් පියාණ කෙනෙක් තමාගේ දරුවනට හිත වැඩ පිණිස අවවාද කෙරෙත් ද, එමෙන් තොප මටත් වැඩ කැමතිව අවවාද කළහ. උදර වූ රූප ශ්‍රී සම්පත්තියෙන් යුක්ත වූ ඒ තොප කවරෙක් දැයි මම අසමි. එය මට නොවළහා කියනු මැන.

**සක්දෙව් රජ පිළිතුරු දීම :-**

**උදයො හමස්මි කල්‍යාණි!**
**සංගරත්ථා ඉධාගතො**
**ආමන්ත බො තං ගච්ඡාමි**
**මුත්තොස්මි තව සඞ්ගරා**

Non-commercial distribution

**සොඳුරු දැකුම් ඇති භද්‍රාව**, මම වනාහි මේ මා උපන් ජාතියට පළමු ජාතියෙහි තොපගේ ස්වාමිපුරුෂයාණන් වූ භද්‍ර රජ වෙමි. ඒ මම මිය ගොස් තව්තිසා දෙව් ලොව ශක්‍රදේවේන්ද්‍රව උපන්නෙමි. ''අප දෙදෙනාගෙන් පළමු මළ එකකු උපන් තැන අවුත් අනිකාට කිව යුතුය'' යි එද කරගත් **'කතිකාව'** ඉටු කිරීම පිණිස මෙහි ආවෙමි. ක්ලේශ වසඟ චිත්තයෙන් ආවේ නො වෙමි. දැන් මම ප්‍රතිඥාවෙන් මිදුනෙමි. එහෙයින් මම නැවත දෙව් ලොවට ම යමි.

**උදය භද්‍රාවගේ ආරාධනය:–**

සචෙ බො ත්වං උදයොසි - සංගරත්ථා ඉධාගතො
අනුසාස මං රාජපුත්ත! - යථාස්සු පුන සංගමො

**පින්වත් දිව්‍යරාජයාණනි,** ඔබ ඒ මගේ උදය රජතුමා නම් එද ඒ පොරොන්දුවෙන් මිදීමට ආයෙහි නම්, නැවත ඔබ මා හා එක්වීමට හැකිවන සේ මට තව තවත් අනුසාසනා කළ මැනවි.

**සක්දෙව් රජුගේ අනුශාසනය :–**

**අතිපතති වයො ඛණො තථෙව**
**ඨානං නත්ථි ධුවං චවන්ති සත්තා**
**පරිජීයති අද්ධුවං සරීරං**
**උදයෙ මා පමාද චරස්සු ධම්මං**

**සොඳුර උදයභද්‍රාව**, මේ මනුෂ්‍ය ලෝකයෙහි උපන්නා වූ සත්ත්වයන්ගේ වයස, ප්‍රථම වයස ගෙවීමෙන් මධ්‍යම වයසටද මධ්‍යම වයස ගෙවීමෙන් පශ්චිම වයසට ද, පශ්චිම වයස ගෙවීමෙන් අවසානයට (මරණයට ) පැමිණීමෙන් ද, උත්පාදක්ෂණය ගෙවීමෙන් ඨීතික්ෂණයට ද ඨීතික්ෂණය ගෙවීමෙන් භංගක්ෂණයට ද පැමිණ ශීඝ්‍රව ගලා බස්නා වූ ගංගාවක් මෙන් නො නැවත වහාම ගෙවී ගෙවී යන්නේය. එබැවින් උපන් සත්ත්වයාගේ නො නැසීමෙක් නම් නැත. බුදුන් වහන්සේ ආදි කොටැති ලෝකයේ සියලු ම සත්ත්වයෝ මෙසේ ඒකාන්තයෙන් මරණයට පැමිණෙත්. එබැවින් **''ධුවං මරණං,අද්ධුවං ජීවිතං යි මරණය ස්ථිරය. ජීවිතය අස්ථිරය්'** යි මරණානුස්මෘතිය වඩව, -

Non-commercial distribution

ලෝකවාසී සියල්ලන්ගේ ම ශරීර ද අස්ථිරය, එ හෙයින් ඔබගේ මේ රන්වන් වූ මටසිලුටු වූ ශෝභන ශරීරය ද මොහොතෙන් මොහොත දිනෙන් දින ජරාවට පැමිණ නස්නේය. උදය භද්‍රාව, මේ කරුණු දැන තොපත් ඒ සියල්ලට පැමිණෙති යි සිතා එයට පළමු නො පමාව ( දශ අකුශලයෙන් මිදීම වූ ) දශ කුශල ධර්මයෙහි යෙදෙව.

**කසිණා පඨවි ධනස්ස පූරා**
**එකස්සෙව සියා අනඤ්ඤධෙය්‍යා**
**තඤ්චා පි ජහාති අවීතරාගො**
**උදයෙ මා පමාදං චරස්සු ධම්මං**

මේ ලෝකයෙහි එකම කෙනකුට මේ මුළු ලෝකය හා මුළු ලෝකයෙහි ඇති සියලු සම්පත්තියත් ලැබුණ ද, දැන් මට ඇත යන තෘප්තියට - සෑහිමට නො පැමිණ තව තවත් ඕනෑ ය, යන තෘෂ්ණාවෙන්ම මිය යන්නේය. උදය භද්‍රාව මේ කාරණය දැන නො පමාව දශ කුශල ධර්මයෙහි යෙදෙව.

**මාතා ච පිතා ච භාතරො ච**
**භරියායාපි ධනෙන හොති කීතා**
**තෙ චාපි ජහන්ති අඤ්ඤ මඤ්ඤං**
**උදයෙ මා පමාදං චරස්සු ධම්මං**

මේ ලෝකයේ මෑණියෝ දරුවන් ද, දරුවෝ මෑණියන් ද, පියාණෝ දරුවන් ද, දරුවෝ පියාණන් ද, සොහොයුරා සොහොයුරිය ද, සොහොයුරිය සොහොයුරා ද, ස්වාමිපුරුෂයා භාර්‍ය්‍යාව ද, භාර්‍ය්‍යාව ස්වාමිපුරුෂයා ද, ස්වාමියා ධනය ද, ධනය ස්වාමියා ද, මෙසේ එකිනෙකා ඔවුනොවුන් අත්හැර වෙන්ව යන්නාහ.

ලෝකයෙහි සියලු සත්ත්වයෝම තමා මිය ගොස් තමා සතු සියල්ලෙන් වෙන්ව යෑම හෝ, තමා සිටියදී සෙසු අය ද ධනය ද විනාශ වී යාමෙන් තමාගෙන් ඒ සියල්ල වෙන්ව යෑම හෝ යන මේ කරුණු දෙකින් එකකට පැමිණීමෙන් ඔවුනොවුන්ගෙන් හා ධනයෙන් වෙන් වන බව මෙයින් පැවසිණ. උදය භද්‍රාව, මේ කාරණය දැන නො පමාව දශ කුශල ධර්මයෙහි යෙදෙව.

*Non-commercial distribution*

**කායො පරභොජනන්ති ඤත්වා**
**සංසාරෙ සුගති ච දුග්ගතී ච**
**ඉත්තර වාසෝති ජානියා**
**උදයෙ මා පමාදං චරස්සු ධම්මං**

දෙතිස් කුණපයෙන් පිරුණු මේ කය සොහොනකට ගෙන ගොස් දැමූ කල, කපුටු සිවල් කබර ආදි සතුන්ට ආහාරයක් වේ. මහපොළවෙහි යට කළ කල කුණු වී පණුවන්ට ගොදුරක් වේ. සසර මනුෂ්‍ය ලෝකයෙහි උපනත් තිරිසන්ව උපනත් සෙස්සන් සමඟ එකට විසුව හැක්කේ ස්වල්ප කාලයෙකි. වහා මිය යන බැවිනි. උදය භද්‍රාව මේ කාරණා දැන නො පමාව කුශල ධර්මයෙහි යෙදෙව.

**උදය භද්‍රාවෝ :–**

සාධු භාසතයං යක්ඛො - අප්පං මච්චාන ජීවිතං
කසිරං ච පරිත්තං ච - තං ච දුක්ඛෙන සංයුතං
සාහං එකා පබ්බජිස්සාමි - හිත්වා කාසිං සුරුන්ධනං

දිව්‍ය රාජයාණනි, තොප කීවේ ඉතා යහපත් දෙයකි. මනුෂ්‍ය ජීවිතය ස්වල්ප කාලයක් ම පවත්නා එකකි. එය සැපයෙන් යුක්ත නම්, එසේ සුළු කලක් පැවතියේ ද වරදෙක් නැත. ඉදින් බොහෝ කලක් පවත්තේ නම් මඳක් දුක් වුව ද කමෙක් නැත. එහෙත් මේ මනුෂ්‍ය ජීවිතය සැපයෙන් තොරය. දුකින් යුක්තය. එසේ වූ එය පවත්නේ ද සුලු කාලයෙකි. එබැවින් මම සුරුන්දන නම් වූ රාජධානියත් කසීරටත් හැර දමා එකලාව පැවිදි වෙමි.

බෝසතාණන් වහන්සේ අවවාද කොට ශක්‍රපුරයට ම ගියහ. උදයභද්‍රාවෝ ද දෙවන ද රාජ්‍යය, ඇමතියනට පවරා රමණීය වූ උයනකට ගොස් සෘෂි ප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව ධර්මයෙහි හැසිර ආයු කෙළවර මිය ගොස් තව්තිසා දෙව්ලොව එම බෝසතාණන් වහන්සේ වෙතැ ම උපන්හ. එසමයෙහි උදයභද්‍රාවෝ රාහුල මාතාවෝ ය. බෝසතාණන් වහන්සේ අප බුදු පියාණෝ ය.

Non-commercial distribution

# 33. ආර්‍ය්‍ය සත්‍යයන් දැකීම

**'අරිය සච්චාන දස්සනං'** යනුවෙන් වදළ මංගල ධර්මයෙහි ආර්ය සත්‍යයන් දැකීමය යනු ආර්‍ය්‍ය සත්‍යයන් ඥාණයෙන් ප්‍රත්‍යක්ෂ කිරීමය. පෘථග්ජනයෝ වනාහි ආර්‍ය්‍ය සත්‍යයන් ප්‍රත්‍යක්ෂ වශයෙන් නො දකිති. යමෙක් ආර්‍ය්‍ය සත්‍යයන් ප්‍රත්‍යක්ෂ වශයෙන් දුටුවේ නම් ඔවුහු එකෙණෙහිම පෘථග්ජන භාවය ඉක්මවා සෝවාන් වූ ආර්‍ය්‍ය පුද්ගලයෙක් වන්නේය. ඔහු දෙවනුව ද සත්‍යයන් ප්‍රත්‍යක්ෂ කිරීමෙන් සකෘදගාමි නම් වූ ආර්ය පුද්ගලයා වන්නේය. තුන්වෙනුව ආර්‍ය්‍ය සත්‍යයන් ප්‍රත්‍යක්ෂ කිරීමෙන් අනාගාමී නම් වූ ආර්‍ය්‍ය පුද්ගලයා වන්නේය. සතර වෙනුව ආර්‍ය්‍ය සත්‍යයන් ප්‍රත්‍යක්ෂ කිරීමෙන් රහත් වන්නේය. මෙසේ ආර්‍ය්‍ය සත්‍යයන් දැක සතර මාර්ග සතර ඵලයන්ට පැමිණි පුද්ගලයා මතු කිසිකලෙක භවයෙහි නූපදින්නේය. එයින් ම සියලු දුකින් ම මිදෙන්නේය. එබැවින් ආර්‍ය්‍ය සත්‍ය දර්ශනය නමැති මේ මංගල ධර්මය අත්‍යුත්තම මංගල ධර්මයක් වන්නේය.

ආර්‍ය්‍ය සත්‍යයන් ප්‍රත්‍යක්ෂ කොට ආර්‍ය්‍ය පුද්ගලභාවයට පැමිණ දුකින් මිදීමට ද, පළමුකොට පෘථග්ජන භාවයෙහි සිටියහු විසින් ධර්මධරයන් ගෙන් හෝ බණ පොත්වලින් හෝ ආර්‍ය්‍ය සත්‍යයන් ප්‍රකාශ කරන්නා වූ ධර්මයන් උගෙන, ස්වකීය ඥානයෙන් ඒ ධර්මයන් නැවත නැවත පරීක්ෂා කිරීමෙහි යෙදිය යුතුය. මෙසේ කිරීම ආර්‍ය්‍ය සත්‍ය භාවනාව නම් වේ.

ආර්‍ය්‍ය සත්‍ය භාවනාවෙහි යෙදෙන කල්හි කල් යත් යත් ඥානය දියුණු වීමෙන් ආර්‍ය්‍ය සත්‍යයන් වඩ වඩා වැටහෙන්නට වන්නේය. අත්ලෙහි තිබෙන දෙයක් පෙනෙන්නා සේ යම් දවසක ප්‍රත්‍යක්ෂව ම ආර්‍ය්‍ය සත්‍යයන් දුටුවේ නම් එද පෘථග්ජන භාවයෙන් මිදී ආර්‍ය්‍ය පුද්ගලයෙක් වන්නේය. ආර්‍ය්‍යභාවයට පැමිණ සත්‍යයන් ප්‍රත්‍යක්ෂ කොට දුකින් මිදෙනු කැමති සත්පුරුෂයන් විසින් මතු

Non-commercial distribution

දක්වන පරිද්දෙන් ආර්‍ය්‍ය සත්‍යයන් උගෙන නැවත නැවත පරීක්ෂණයෙහි යෙදී ඒවා ප්‍රත්‍යක්ෂ කරගත යුතු.

## චතුරාර්‍ය්‍ය සත්‍යය

**චතුන්නං භික්ඛවෙ, අරියසච්චානං අනනුබොධා අප්පටිවෙධා එවමිදං දීඝමද්ධානං සන්ධාවිතං සංසරිතං මමඤ්චේව තුම්හාකඤ්ච.**

යනුවෙන් මහණෙනි, ආර්‍ය්‍ය සත්‍ය සතර නොදැනීම නිසාම, ප්‍රත්‍යක්ෂකර නොගැනීම, නිසාම, අප - තොප විසින් දීර්ඝ කාලයක් මුළුල්ලෙහි නැවත නැවත ඉපදීම් වශයෙන් සංසාරයෙහි ඔබමොබ දිවීම ඇවිදීම කරන ලද්දේ යයි තථාගතයන් වහන්සේ විසින් වදරන ලද්දේය.

වර්ෂ ගණනකින් තබා කල්ප ගණනකින් වත් ප්‍රමාණ කළ නොහෙන තරමට දීර්ඝ වූ අතීත කාලයේ නරකයන්හි ඉපිද ප්‍රේතව ඉපද තිරිසන්ව ඉපද සසර සැරිසරන එක් එක් පුද්ගලයකු විසින් ලබා ඇති දුඃඛස්කන්ධය ප්‍රමාණ කළ හැක්කක් නොවේ. සත්‍යාවබෝධය කරන්නට නුපුළුවන් වුවහොත් අනාගත සංසාරයෙහි ලබන්නට සිදුවන දුඃඛස්කන්ධය ද එසේ ම ප්‍රමාණ කළ නො හැකි ය. ලබා විඳ අවසන් කළ දුඃඛස්කන්ධය ගැන කළ යුත්තක් නැත. අනාගතයට විඳින්නට විය හැකි දුඃඛස්කන්ධයෙන් නිදහස් වීමට මහත් සෙවීම සියල්ලන් විසින් කළ යුත්තකි. එයට ඇත්තා වූ එකම මාර්ගය චතුරාර්‍ය්‍ය සත්‍ය අවබෝධ කරගැනීමය. චතුරාර්‍ය්‍ය සත්‍ය ඉතා ගැඹුරුය. එය අවබෝධ කර ගැනුමත් එතරම් පහසු වැඩක් නොවේ. එහෙත් එය කිනම් පරිත්‍යාගයක් කොට වුවද කොතරම් දුකක් විඳ වුවද කළ යුත්තකි. ආර්‍ය්‍ය සත්‍යයන් පිළිබඳව ආරංචියකුදු අසා නැතියකුට සත්‍යයන් පිළිබඳ ප්‍රත්‍යක්ෂ ඥානය හදිසියෙන් ඇති කර ගත හැක්කේ නොවේ. දුකින් මිදීමට හේතුවන සත්‍යයන් පිළිබඳ ප්‍රත්‍යක්ෂ ඥානය, පළමුවෙන් සත්‍යයන් ගැන ආරංචිය දැනගෙන ඒවා ගැන නැවත නැවත සිතීමෙන් විමසීමෙන් ඇති කර ගත යුත්තකි.

**සත්‍ය වූ දුකය, මේ දුක ඇති වීමේ සත්‍ය හේතුවය, සත්‍ය වූ සැපය, සැපයට පැමිණීමෙ සත්‍ය වූ මාර්ගය යන මේ කරුණු සතර බුදු සමයෙහි උගන්වන ආර්‍ය්‍ය සත්‍ය සතරය.**

Non-commercial distribution

මේ කරුණු සතර ගැන සාමාන්‍ය ජනයා අතර සත්‍යය යන ව්‍යවහාරය නැත. ඒ කරුණු සතර ගැන සැලකිල්ලක් තිබේ. දුකින් මිදීමය, සැපය ඇති කර ගැනීමය යන මේ කරුණු දෙක ගැන සැම දෙනාගේ ම විශේෂ සැලකිල්ලක් තිබේ. එහෙත් සැප දුක දෙක ගැන සාමාන්‍ය ජනයාට ඇත්තේ මහත් මුළාවකි. ඔවුහු සැබෑ සැපය සම්පූර්ණයෙන් ම නොහඳුනති. ඉතා රෞද්‍ර දුක් පමණක් දුක් සැටියට සලකති. වඩා රෞද්‍ර නොවන දුක්ම සැප හැටියට සලකති. එසේ සලකා ඒවාට ඇලුම් කරති. සැප සොයමි යි ඒ දුක්ම සොයති. අවිද්‍යාවෙන් අන්ධව දුකම හොඳ දෙය ය, සැපයය කියා එයම සොයන්නෝ කිසි කලෙක දුකින් නොමිදෙති. සැප දුක් දෙක හරියට හැඳින ගැනීම තුන්වන පළමුවන ආර්ය සත්‍ය දෙක දැන ගැනීමය. එබැවින් මෙහි පළමුවෙන් සැප දුක් හැඳින්වීම කරනු ලැබේ.

**මිනිස් සැපය ය. දෙව් සැපය ය යි** සාමාන්‍ය ජනයා විසින් සැප දෙකක් ලෝකයෙහි ඇති සැටියට සලකනු ලැබේ. මනුෂ්‍ය පඤ්චස්කන්ධයක් ඇතිව අඹු සැමියන් වශයෙන් දූ දරුවන් සහෝදර සහෝදරියන් වශයෙන් නෑයන් මිතුරන් වශයෙන් ඔවුනොවුන්ට ඇලුම් කරමින් කා බී ඇඳ පැළඳ ජීවත් වන්නට ලැබීම මිනිස් සැපය හැටියට සලකනු ලැබේ. මේ මිනිස් ලොව දුප්පතුන්ටත් ධනපතියන්ටත් නිලධරයන්ටත් මැති ඇමතිවරුන්ටත් රජුන්ටත් නො කී තවත් අයටත් ඇත්තා වූ සැපය එයමය. එහි ඇති උසස් පහත් කම් අනුව රජ සැප සිටු සැප යනාදි ව්‍යවහාර පවත්නේය. දිව්‍ය ලෝකයෙහි දිව්‍යමය පඤ්චස්කන්ධයක් ලබා ජීවත් වීම දිව්‍ය සැප යයි සලකනු ලැබේ.

රජ සැප සිටු සැප යනාදීන් සලකන මිනිස් සැපය සත්‍ය සැපයක් ද කියා විමසිය යුතුය. සැප වශයෙන් සලකන යමක් සැම කල්හිම සැපයක් සැටියට ම තිබේ නම්, කලකදී දුක් බවට නො පෙරළේ නම්. කලකදී දුකක් ඇති නො කෙරේ නම්, දුකට හේතු නො වේ නම් ඒ දෙය සත්‍ය සැපයය. මනුෂ්‍ය පඤ්චස්කන්ධයක් තිබීම සැපක් හැටියට සලකතත් කලකදී එය දිරා පරිහරණය කිරීමට ඉතා දුෂ්කර තැනට පැමිණේ. තරුණ වියේදී හොඳින් තුබුණු මිනිස් කය එද තමාටත් දුක් දෙන අනුන්නටත් එපා වූ දෙයක් වන්නේය.

Non-commercial distribution

ඒ පඤ්චස්කන්ධය ස්ථිර ද නොවේ. කවද හෝ මිනිසා මැරෙන්නේය. භයානක වූ මරණ දුක ඒ පඤ්චස්කන්ධයේ අවසානයය. පඤ්චස්කන්ධය පවත්නා අතරවාරයේ ද සාගින්න, පිපාසය, හිසරදය, ඇස්රෝග, කන් රෝග, දත්රෝග, පීනස, කැස්ස, වමනය, විරේචනය, උණ. හොරි, දද, වණ, පිළිකා, ආදි බොහෝ රෝගයෝ ශරීරයෙහි ඇතිවන්නාහ. ශරීරය පැවැත්වීමට දිවිහිමියෙන් වෙහෙසිය යුතුය. මෙසේ බලන කල්හි මනුෂ්‍ය පඤ්චස්කන්ධය කලකදී නපුරට පෙරළෙන දෙයක් වන බැවින් ද නපුර ම කෙළවර කොට ඇතියක් බැවින් ද මුල මැද අග යන සැම තැනම දුකින් මිශ්‍ර වූවක් වන බැවින් ද බොහෝ දුක් ඇති කරවන්නක් බැවින් ද දුකක් ම ය. එය කිසිසේත් සැපයක් නොවේ ම ය.

මිනිසුන් විසින් සැපයයි සලකන කෑම් බීම් හිඳීම් සිටීම් යාම් ඊම් වැතිරීම් ආදිය ද ඒ ඒ දුක්වලට කරන ප්‍රතිකාර මිස සැප නොවේ. පඤ්චස්කන්ධය සම්පූර්ණයෙන් ම දුක් ගොඩක් වුවද ප්‍රතිකාරයෙන් ඒ බව වැසී තිබේ. කිසිවක් නො කොට නිශ්චලව ඉන්නා කල්හි යමක් ඇත්තේ නම් යමක් දැනේ නම් එය පඤ්චස්කන්ධයාගේ ප්‍රකෘතිය ය. එය දත හැක්කේ කිසිවක් නො කොට එක් තැනකට ම වී නිශ්චලව විසීමෙනි. එක් තැනකට වී කිසිවක් නො කොට එක් ඉරිව්වකින් පැය ගණනක් හිඳ බලනු. කාලය ගත වන්න වන්න පඤ්චස්කන්ධයේ ප්‍රකෘතිය මතු වී පෙනෙන්නට වනු ඇත. සාගින්න දැනෙනු ඇත. පිපාසය දැනෙනු ඇත. අත්පාවල හා තුනටියේ රුදාව දැනෙනු ඇත. හිසරදය හිස බර ගතිය දැනෙනු ඇත. තැන් තැන් වල තදය හිරිය දැනෙනු ඇත. කටුවලින් අනින්නාක් මෙන් දැනෙනු ඇත. කසනවා දැනෙනු ඇත. උගුර කට වියළුම දැනෙනු ඇත. ග්‍රීෂ්මය හෝ ශීතල දැනෙනු ඇත. නිකම්ම ඉන්නා කල්හි ඇත්තා වූ දැනෙන්නා වූ ඒ දේවල් පඤ්චස්කන්ධයේ ප්‍රකෘතිය ය, පඤ්චස්කන්ධයේ ස්වභාවය ය.

කෑම්බීම් ඉරියව් වෙනස් කිරීම් ආදි හැම දෙයක්ම කරන්නේ ඒ දුක්වලට ප්‍රතිකාර වශයෙනි. දුක්වලට ප්‍රතිකාර වශයෙන් කරන සැපය වශයෙන් සලකන ඒ සියල්ලත් සත්‍ය වශයෙන්ම සැප නොව දුක්මය. අසවල් දෙය බලන්නට ඕනෑය. අසවල් දෙය අසන්නට

Non-commercial distribution

ඕනෑය, අසවල් තැනට යන්නට ඕනෑය, අසවල් දෙය ලබන්නට ඕනෑය, යනාදින් තෘෂ්ණාදහයෝ ද සත්ව සන්තානයෙහි ඇතිවෙයි. ඒ දැවීම් ද දුක් ම ය. ධනය සැපයීම යාන වාහන ගෙවල් සැපයීම වස්ත්‍රාභරණ සැපයීම යනාදි සියල්ල ම කරන්නේ ඒ ඒ දෙය සම්බන්ධයෙන් ඇතිවන තෘෂ්ණාදහය සන්සිඳවීම පිණිස ය. සත්‍ය වශයෙන් ඒ සියල්ල ම දුක් මිස සැප නොවේ. දුක් වූ ද දුක් වලට උත්පත්තිස්ථාන වූ ද දුකට හේතු වන්නා වූ ද දුකින් මිශ්‍ර වූ ද දේ හැර අන් කිසිවක් ලෝකයා සැප වශයෙන් සලකන මනුෂ්‍ය දිව්‍ය බ්‍රහ්ම ආත්ම භාවයන්ට අයත් වූ ස්කන්ධයන් අතර නැත.

ආපායික සත්ත්වයන්ගේ පඤ්චස්කන්ධයන්ගේ දුක් බව ගැන අමුතුවෙන් කිය යුත්තක් නැත. ආපායික සත්ත්වයන්ගේ ද මනුෂ්‍ය දිව්‍ය බ්‍රහ්මයන්ගේ ද යන සියල්ලන්ගේ ම පඤ්චස්කන්ධය සත්‍ය වශයෙන් ම දුකකි. එබැවින් එයට සත්‍ය වූ දුක යයි බුදු සමයෙහි උගන්වනු ලැබේ. ''**දුඃඛ සත්‍ය**'' යනු සැබෑ දුකට කියන නමකි.

පඤ්චස්කන්ධයක් තිබීමේ නපුර පඤ්චස්කන්ධයේ දුඃඛත්වය පඤ්චස්කන්ධයේ ආදීනවය අවිද්‍යාව නිසා නොදක්නා වූ පුද්ගලයා ඒ පඤ්චස්කන්ධය ලෝකයේ ඇති සියල්ලට උසස් දෙය සැටියට සලකා එයට තදින් ඇලුම් කරන්නේය. පඤ්චස්කන්ධයට ඇලුම් කරන්නා වූ පුද්ගලයාට තමා ඇලුම් කරන පඤ්චස්කන්ධය නැසෙනවාය කියනවා නම් නැසෙන්නට යනවා නම් නැසීමේ ලකුණු පෙනෙනවා නම් එයට වඩා නපුරක් එයට වඩා බියක් නැත්තේය. හේ වර්තමාන පඤ්චස්කන්ධය පවත්වා ගැනීමට සෑම උත්සාහයක් ම කරන්නේය. වර්තමාන පඤ්චස්කන්ධය නැතිවුවහොත් නැවත ද අලුත් පඤ්චස්කන්ධයක් ලබා ගැනීමට සෑම උත්සාහයක්ම කරන්නේය. ලෝකයෙහි බොහෝ දෙන දන් දෙන්නේ, වන්දනා ගමන් යන්නේ, මල් පහන් පුදන්නේ, බණ පින්කම් පහන් පින්කම් කරන්නේ, විහාර චෛත්‍ය කරවන්නේ, සඞ්ඝාවාස, දහම් පාසල් ආදිය කරවන්නේ, සිල් රකින්නේ, භාවනා කරන්නේ, ක්‍රිස්තු භක්තිකයන් දෙවියන් යදින්නේ අනාගත පඤ්චස්කන්ධ ප්‍රතිලාභය සඳහාය. පඤ්චස්කන්ධයට ඇලුම් කරන තණ්හාව තරම් ශක්තිමත්

*Non-commercial distribution*

වූ අන් කිසි චෛතසික ධර්මයක් පෘථග්ජන සන්තානයෙහි නැත. එහි බලයෙන් ඔහුට මතු ද නැවත නැවත පඤ්චස්කන්ධය ලැබෙන්නේය.

සත්ත්වයා හට වර්තමාන පඤ්චස්කන්ධය පවත්වා ගැනීමේ ද අනාගත පඤ්චස්කන්ධය ලබා ගැනිමේ ද මේ බලවත් ඕනෑ කම හෙවත් තණ්හාව නැතිනම් අලුත් අලුත් පඤ්චස්කන්ධ ලැබීමට හේ උත්සාහ නො කරන්නේය. එයින් හේ පඤ්චස්කන්ධ සංඛ්‍යාත දුඃඛයෙන් මිදෙන්නේය. පඤ්චස්කන්ධය නොහරින පඤ්චස්කන්ධය පතන තැනැත්තා නැවත නැවත එය ලබනු මිස එයින් නො මිදෙන්නේය. නැවත නැවත පඤ්චස්කන්ධය ලබා ගැනීමටත් ලැබූ පඤ්චස්කන්ධය පවත්වා ගැනීමටත් සෑම උත්සාහයක් ම කිරීමට හේතුවන පඤ්චස්කන්ධය පිළිබඳ පවත්නා වූ බලවත් ඕනෑකම හෙවත් ඇල්ම- තවත් ක්‍රමයකින් කියතහොත් පඤ්චස්කන්ධය පිළිබඳ වූ තණ්හාව ම පඤ්චස්කන්ධ සංඛ්‍යාත සත්‍ය වූ දුඃඛය ඇතිවීමේ හේතුව ය. බුදු සමයෙහි " **සමුදය සත්‍ය** " යන නම ව්‍යවහාර වන්නේද ඒ තණ්හාට ම ය. මනුෂ්‍ය දිව්‍ය බ්‍රහ්ම සම්පත් නමැති පඤ්චස්කන්ධයට වඩා උසස් සැපයක් වූ නිවනක් ඇත යයි අසා එය සෙවීමට උත්සාහ කරන්නා වූ පින්වතුන්ට මේ තණ්හාවෙන් බාධා කරනු ලැබේ. නිර්වාණ මාර්ගය වසනු ලැබේ. ඒ නිසා ද මේ තණ්හාව දුක් උපදවන හේතුව වේ.

කොතෙක් වර මළත් නැවත නැවත උපදවන නැවත නැවත පඤ්චස්කන්ධය ඇති කරන, නැවත නැවත ජරාව ව්‍යාධිය මරණය ඇති කරන, නැවත නැවත පඤ්චස්කන්ධය පෝෂණය කිරීමේ කරදරය ඇති කරන, නැවත නැවත තිරිසන් බවට ප්‍රේත බවට නරකයට පමුණුවන ඉහත කී තණ්හාව උපදින උපදින ජාතියක් පාසා ම නැවත නැවත ඇති වේ. පාඩම් කරගෙන තිබෙන දෙයක් මතු කිසිකලෙක සිහි කළ නොහෙන පරිදි සර්ව ප්‍රකාරයෙන් අමතක වී යන්නාක් මෙන් ඒ සන්තානයෙහි මතු කිසි කලෙක නූපදනා පරිදි අභාවයට යන ස්වභාවයක් ද ඒ තෘෂ්ණාවෙහි ඇත්තේය. මතු නැවත ඇති නොවන පරිදි තණ්හාව නැතිවීම අනුව ඒ තණ්හාව නිසා අනාගතයෙහි ඇති වන්නට තිබෙන ස්කන්ධ පරම්පරාව අභාවප්‍රාප්ත වන්නේය. ඒ අභාවප්‍රාප්තිය අනුව ඇත්තා වූ, සලකා ගත හැක්කා වූ ශාන්ත ස්වභාවය සැබෑ සැපය ය. කිසි කලෙක

Non-commercial distribution

වෙනස් නොවන සැම කල්හිම පවත්නා සැපය ය. නිවන යයි කියනුයේ ද ඒ සැපයට ම ය.

ඒ නිවනෙහි මමය අනිකාය ස්ත්‍රියය පුරුෂයාය මිනිසාය දෙවියාය යනාදි ව්‍යවහාරයන්ට ලක්වන දිරන බිඳෙන කිසි ම සංස්කාරයක් නැත්තේය. කුඩාය මහත්ය සතරැස්ය වටය උසය මිටිය යනාදි ව්‍යවහාරයන්ට ලක්වන දෙයක් ද නැත්තේය. එය පරම ගම්භිර ශුද්ධ සුඛ ස්වභාවයකි. නිවනෙහි උතුම් බව වැටහෙන්නේ බුදු දහම අනුව නුවණ දියුණු තියුණු කරගත් සංසාරයේ සැටි දන්නා අයට ය. සෙස්සන්ට එය වැටහෙන්නේ කිසිම ප්‍රයෝජනයක් නැති කිසිම වටිනාකමක් නැති සිස් බවක් ලෙසය. පඤ්චස්කන්ධය මමය කියා ද මාගේය කියා ද තදින් ගෙන සිටින්නා වූ පුද්ගලයන්ට වැටහෙන්නේ ඉතා ම නපුරක් ලෙසය. මමය මාගේය කියා පඤ්චස්කන්ධයට ඇලුම් කරන්නා වූ අයට මමය කියා ගන්නා ඒ පඤ්චස්කන්ධය නැතිවී යාම වැටහෙන්නේ බියවිය යුත්තක් ලෙසය. එබැවින් ඔවුහු නිවනට බිය වෙති. ඔවුන්ගේ කැමැත්ත පඤ්චස්කන්ධය පවත්වා ගැනීමටය.

ධර්මඥානය නැතියවුන් උසස් කොට සලකන්නේ මමය කියා සලකන පඤ්චස්කන්ධය ඇතිව, අඹුදරුවන් ඇතිව, නෑ මිතුරන් ඇතිව, වුවමනා පමණ ඉන්ද්‍රිය පිණවන වස්තු ඇතිව, ජරාවක් ව්‍යාධියක් මරණයක් නැතිව, ප්‍රිය පුද්ගලයන්ගෙන් ප්‍රිය වස්තුන්ගෙන් වෙන්වීමක් නැතිව සැම කල්හි ම සිටිය හැකි තත්ත්වයක් තැනක් ඇත්නම් එයය. ලෝකයෙහි කිසිවකුට එබඳු තත්ත්වයක් නැත. එබඳු තැනක් ද කොහිවත් නැත. ඇත්තේ ස්කන්ධ පරම්පරාවේ පැවැත්මය, නැවැත්මය යන මේ දෙක පමණකි. කාහට වුවත් ගන්නට ඇත්තේ ඒ දෙකින් එකකි. මමය මගේය කියා ඇලුම් කරන ස්කන්ධ පරම්පරාවේ පැවැත්ම ගන්නහුට ස්කන්ධයන් හා බැඳී පවත්නා වූ ජාති දුඃඛය ද ලැබෙන්නේය. ජරා දුඃඛය ද ලැබෙන්නේය. ව්‍යාධි දුඃඛය ද ලැබෙන්නේය. අප්‍රිය සම්ප්‍රයෝග ප්‍රිය විප්‍රයෝග දුඃඛයන්ද ලැබෙන්නේය. කැමති දෑ නොලැබීමේ දුඃඛය ද ලැබෙන්නේය.

උකුණන් මකුණන් මැස්සන් මදුරුවන් වන්නට සිදුවන්නේය. ඌරන් කුකුළන් එළුවන් ගවයින් සිවලුන් බළලුන් වන්නට ද තවත්

Non-commercial distribution

නොයෙක් සතුන් වන්නට ද සිදුවන්නේය. සාදුක නිවා ගැනීමට සෑහෙන පමණට අහරක් නො ලබන, පිපාසය සන්සිඳවා ගැනීමට සෑහෙන පමණට පැනක් නො ලබන, හඳින්නට වතක් වසන්නට තැනක් නො ලබන ප්‍රේතයන් වන්නට ද, සඤ්ජීව කාලසූත්‍රාදි නරකයන්හි ඉපද ගින්නෙන් දැවෙන්නට ලොහො ගුලි ගිලින්නට ලොහො දිය බොන්නට ද සිදුවන්නේය. ස්කන්ධ පරම්පරාවේ නැවැත්ම වූ නිවන ගන්නහුට ඒ එක දුකකුත් නො වන්නේය. එහෙත් එහි මමය අනිකාය සත්ත්වයාය, පුද්ගලයා යයි නම් කරන ස්කන්ධ නැත. මේ දෙකින් ඔබට වඩා හොඳ දෙය තෝරා ගත යුතුය. බුඩාදි උත්තමයන් විසින් සැබෑ සැපය උසස් සැපය හැටියට පවසන්නේ - **දුඃඛනිරෝධාර්‍ය්‍ය සත්‍ය යයි** පවසන්නේ ස්කන්ධ පරම්පරාවේ නැවැත්මය, හෙවත් නිරෝධය ය.

දුකින් මිදීම සඳහා ද සැපයට පැමිණීම සැපය ලැබීම සඳහා ද සාමාන්‍ය ලෝකයා ගෙන සිටින මඟ අනිකකි. බුදුන් වහන්සේ පවසන මඟ අනිකකි. ධනය සැපයීම අඹුදරුවන් පෝෂණය කිරීම මරණින් මතු සුගතිගාමී වීම පිණිස පින් කිරීම යනාදිය සාමාන්‍ය ජනයා ගෙන සිටින මාර්ගයයි. එය තෘෂ්ණාවට පොහොර දැමීමක් බැවින් එයින් තවත් තණ්හාව වැඩේ. සංසාරය තවත් දික් වේ. නිවන දුර වේ. **බුදුන් වහන්සේ වදාළ මාර්ගය** නම් සසර දික්කරන ඒ තණ්හාව නසන වැඩ පිළිවෙළකි. යමක් කිරීමෙන් සංසාර දුඃඛය ඇති කරන තණ්හාව නැසේ නම් සන්තානයෙන් බැහැර වේ නම් ඒ වැඩ පිළිවෙල බුදුන් වහන්සේ පවසන සැපයට පැමිණීමේ මාර්ගය ය.

ලෝකයෙහි ඇති සෑම දෙයකට ම ඒ ඒ දෙය නසන විරුද්ධ දෙයක් ඇත්තේය. තණ්හාවට විරුද්ධ තණ්හාව නසන දෙයක් ද ලොව ඇත්තේය. තණ්හාව සත්ත්ව සන්තානයෙන් බැහැර නො කළ හැකිය. ආයුධයකින් හෝ ගින්නෙන් දියෙන් හෝ බැහැර නො නැසිය හැකිය. එය සත්ත්ව සන්තානයෙන් බැහැර කළ හැක්කේ එයට විරුද්ධව එය බැහැර කරන නසන දෙයක් සන්තානයෙහි ඇති කිරීමෙනි. ආලෝකය ඇති කළ කල්හි අඳුර දුරු වී යන්නාක් මෙන් තණ්හාවට විරුද්ධ ධර්ම සන්තානයෙහි ඇති කළ කල්හි තණ්හාව චිත්ත සන්තානයෙන් බැහැර වන්නේය. නැසෙන්නේය.

Non-commercial distribution

තණ්හාව දුරු කරන තණ්හාව නසන බෙහෙත නම් මමය මිනිසාය දෙවියාය ස්ත්‍රියය පුරුෂයාය යනාදීන් සලකන පඤ්චස්කන්ධයේ හා බාහිර ලෝකයේ තතු ඇති සැටියට දන්නා නුවණ ය. තණ්හාව ඇති වන්නේ වැරදි හැඟීම් නිසාය. ඒ ඒ හේතූන් නිසා ඉපිද ඉපිද බිඳි බිඳී යන නාම රූප ධාතූන් සත්ත්වයන් පුද්ගලයන් හැටියට වරදවා ගැනීම නිසා ද අනිත්‍ය වූ ද දුඃඛ වූ ද බොහෝ ආදීනවයන් ඇත්තා වූ ද නාම රූප ධාතූන්, නිත්‍ය දේ සැටියට, සැපවූ ද සැපයට හේතු වූ ද දේ සැටියට, හොඳ දේ සැටියට, වරදවා ගැනීම නිසා ද තණ්හාව ඇතිවේ. වීදුරු කැබැල්ලක් මාණික්‍ය රත්නයකැයි සිතා පරිස්සම් කරගෙන ඉන්නා තැනැත්තාට එය මැණිකක් නොවන බව දැනුණු පසු වීදුරු කැබැල්ල ගැන කලින් තිබූ ඇල්ම නැති වන්නාක් මෙන් සැබෑ තතු නො දැනීම නිසා පඤ්චස්කන්ධය කෙරෙහි පවත්නා තණ්හාව, පඤ්චස්කන්ධයේ සැබෑ තත්ත්වය දක්නා නුවණ ඇති වූ සැටියේ ම අභාවයට යන්නේය. අවස්ථාවක් ලද විටෙක මරා දමා වස්තුව පැහැර ගැනීම පිණිස මිත්‍ර වේශයෙන් පැමිණෙන සතුරා පිළිගන්නේ ඔහු දුටු විට සතුටක් ඇතිවන්නේ නො හැඳින සිටිනා තුරුය. සතුරා සතුරකු බව හැඳින ගත් පසු ඔහු දක්නා කල්හි බියක් හා පිළිකුලක් මිස ආදරයක් සතුටක් ඇති නොවේ. එමෙන් පඤ්චස්කන්ධය හැඳින ගත හොත් ඉන්පසු එයට බියක් මිස ඇල්මක් ඇති නොවේ.

පඤ්චස්කන්ධයේ සැබෑ තත්ත්වය දක්නට සමර්ථ වූ ද ස්කන්ධ නිරෝධයේ අගය දක්නට සමර්ථ වූ ද නුවණ ම සංසාරය ඇති කරන තණ්හාව නසන ධර්මය වන බැවින් දුක නැති කිරීමේ සැපයට පැමිණ වීමේ සත්‍ය හේතුව වේ. ඒ නුවණ ඇති කර ගැනීමට අවශ්‍යයෙන් ම තිබිය යුතු තවත් ධර්ම අටක් ද ඇත්තේය. ඒවා ද නුවණ ඇති කිරීමට උපකාර වීම් වශයෙන් දුක් නැති කරන සැපයට පමුණුවන ධර්මයෝ වෙති. තථාගතයන් වහන්සේ ඒ ධර්ම අට ද සැබෑ සැපයට පමුණුවන සත්‍ය හේතූන් වශයෙන් ගෙන,

**සම්මා දිට්ඨි, සම්මා සංකප්ප, සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව, සම්මා වායාම, සම්මා සති, සම්මා සමාධි.**

Non-commercial distribution

යන මේ ධර්ම අට සැපයට පැමිණ වීමේ සත්‍ය හේතුව හැටියට වදළ සේක. " මාර්ග සත්‍ය "යනු ද එයට නමකි.

## මාර්ග සත්‍යය පිළිබඳ විස්තර

හොඳ දෙය නරක හැටියට ද, නරක දෙය හොඳ සැටියට ද, ඇති දෙය නැති සැටියට ද, නැති දෙය ඇති සැටියට ද, සැපයට හේතු වන දෑ දුකට හේතු හැටියට ද, දුකට හේතුවන දෑ සැපයට හේතු සැටියට ද, වරදවා තේරුම් ගෙන එය එසේම යයි පිළිගැනීම මිථ්‍යා දෘෂ්ටියයි. එසේ වරදවා නො ගෙන කාරණය ඇති සැටියට ම තේරුම් ගැනීම හෙවත් දැකීම " **සම්මා දිට්ඨි** " නම් වූ මාර්ගාඞ්ගය යි. සම්‍යග් දෘෂ්ටිය යනු ද ඊට ම නමකි.

පින් පව් ඇති බව හා පින් පව් වල විපාක ඇති බව දැනීම ද මෙලොව පමණක් නොව පරලොවක් ඇති බව දැනීම ද සම්‍යක් දෘෂ්ටියකි. නුමුත් මේ සම්‍යක් දෘෂ්ටිය ආත්ම දෘෂ්ටිය නැසීමට අසමර්ථ බැවින් ඇතැම් විට තෘෂ්ණාව වැඩීමට ද හේතුවනු මිස තෘෂ්ණාව නැසීමට එය සමර්ථ නොවේ. තෘෂ්ණාව නැසීමට සමර්ථ වනුයේ ආත්ම දෘෂ්ටිය නැසීමට හේතු වන්නා වූ චතුරාර්‍ය්‍ය සත්‍යය දන්නා ඥානය නමැති සම්‍යග් දෘෂ්ටිය යි.

ඒ සම්‍යග් දෘෂ්ටිය දතහැකි වනුයේ නාම රූප ධර්ම විභාගයන් දැනගැනීමෙනි. " **අභිධර්මාර්ථ සංග්‍රහ** " නම් වූ පොත උගෙනීමෙන් නාම රූප ධර්ම විභාගය දත හැකිය. පින් පව් හා පින් පව් වල විපාකය විශ්වාස කරන්නා වූ සම්‍යග් දෘෂ්ටිය වනාහි අබුඬෝත්පාද කාලවල ද ලොව පවත්නේය.

චතුස්සත්‍ය සම්‍යග් දෘෂ්ටිය ඇත්තේ බුද්ධෝත්පාදයේ පමණෙකි. චතුස්සත්‍ය සම්‍යග් දෘෂ්ටියෙන් සම්‍යග් දෘෂ්ටිකයකු වීමෙන් ලබන ලද බුද්ධෝත්පාද කාලය සාර්ථක වූයේ වන්නේය. එබැවින් නාම රූප ධර්ම විභාගයන් උගෙන නියම සම්‍යග් දෘෂ්ටිකයකු වීමට උත්සාහ කටයුතු.

" **සම්මා සංකප්ප** " යනු නිවැරදි කල්පනාවයි. එය නෛෂ්ක්‍රම්‍ය සංකල්පය, අව්‍යාපාද සංකල්පය, අවිහිංසා සංකල්පයයි තුන් ආකාර වේ. කාමයන් කෙරෙන් හා භවයන් කෙරෙන්

Non-commercial distribution

නික්මීම පිළිබඳ වූ යහපත් කල්පනාව නෛෂ්ක්‍රම්‍ය සංකල්ප නම් වේ. අන්‍ය සත්ත්වයන් නො නසා සුවපත් කරවීම පිළිබඳ යහපත් කල්පනාව අව්‍යාපාද සංකල්ප නමි. අන්‍යයන්ට පීඩා නොකිරීම කරදර නො කිරීම දුක් නොදීම පිළිබඳ වූ යහපත් කල්පනාව අවිහිංසා සංකල්ප නමි.

'' **සම්මා වාචා** '' යනු චතුර්විධ වාග් දුශ්චරිතයෙන් වැළකීම් වශයෙන් නිවැරදි වචන කීමය. එය බොරු කීමෙන් වැළකීමය, කේළාම් කීමෙන් වැළකීමය, අනුන්ගේ සිත් රිදවන එරුෂ වචන කීමෙන් වැළකීමය. මෙලොවට හෝ පරලොවට වැඩක් නැති නිරර්ථක කථා කීමෙන් වැළකීමය යි සතරාකාර වේ.

'' **සම්මා කම්මන්ත** '' යනු කාය දුශ්චරිතයෙන් වැළකීම් වශයෙන් නිවැරදි කම් කිරීමයි. එය සතුන් මැරීමෙන් වැළකීමය, වස්තු හිමියන් නුදුන් දේ සොර සිතින් ගැනීමෙන් වැළකීමය, කාමයෙහි වරදවා හැසිරීමෙන් වැළකීමය යන මොවුන්ගේ වශයෙන් තුන් ආකාර වේ.

'' **සම්මා ආජීව** '' යනු අධර්මයෙන් දිවි පැවැත්වීමෙන් වැළකී, ධර්මයෙන් ජීවිතය රක්ෂා කිරීමය. දිවි පැවැත්වීම පිණිස ප්‍රාණඝාතාදි දුශ්චරිතයන් නො කොට දැහැමි ගොවිකම් වෙළදාම් ආදිය කොට ජීවත් වීම ගිහියන්ගේ සම්මා ආජීවයයි. තමා තුළ නැති ගුණ ඇති සේ හැඟවීම, ගිහියන්ට යම් යම් දේ දී සතුටු කරවීම, නැකත් කීම, වෙදකම් කිරීම යන ආදියෙන් සිවු පසය ලබා නොගෙන, ධර්මයෙන් ලැබෙන දෙයකින් ජීවත් වීම පැවිද්දන්ගේ සම්මා ආජීව යයි.

'' **සම්මා වායාම** ''යනු නිවැරදි වීර්‍ය්‍ය යයි. එය සතරාකාර වේ. ඒ මෙසේය, තමා අතින් සිදුනොවූ අකුසල් මතු සිදුනොවීම පිණිස වීර්‍ය්‍ය කිරීම එකකි. තමා අතින් සිදුවූ පව් දුරු කිරීමට වෑයම් කිරීම එකකි. එතෙක් කර ගන්නට නුපුළුවන් වූ කුශලයන් කරගැනීමට වීර්‍ය්‍ය කිරීම එකකි. කරගත් කුශලයන් දියුණු කර ගැනීමට වීර්‍ය්‍ය කිරීම එකකි.

Non-commercial distribution

"**සම්මා සති** " යනු නිවැරදි වූ සිහියයි. එය කායානුපස්සනා සතිපට්ඨානය, වේදනානුපස්සනා සතිපට්ඨානය, චිත්තානු-පස්සනා සතිපට්ඨානය, ධම්මානුපස්සනා සතිපට්ඨානය යයි සිවුවැදෑරුම් වේ.

"**සම්මා සමාධි** "යනු සිත එක අරමුණක තැබිය හැකි බවය. එය ප්‍රථමධ්‍යාන සමාධිය, ද්විතීයධ්‍යාන සමාධිය, තෘතීයධ්‍යාන සමාධිය, චතුර්ථධ්‍යාන සමාධිය යයි සතර වැදෑරුම් වේ. සම්මා සති, සම්මා සමාධි යන මේ දෙක වනාහි සමථ විදර්ශනා භාවනාවන් හි යෙදීමෙන් ඇති කර ගත යුතුය.

දුඃඛ නිරෝධායසී සත්‍යයයි කියන ලද පරම සුඛයට පැමිණිය හැකි වනුයේ ඒ පරම සුඛය ලැබිය හැකි වනුයේ මේ ප්‍රතිපත්ති මාර්ගයෙනි. දුකින් මිදීමට මෙයින් අන්‍ය වූ මාර්ගයක් දක්වා මේ ප්‍රතිපත්ති මාර්ගය කිසිවකුට බොරු කළ හැකි නොවේ. එබැවින් සම්මා දිට්ඨි, සම්මා සංකප්ප, සම්මා වාචා, සම්මා කම්මන්ත. සම්මා ආජීව, සම්මා වායාම, සම්මා සති, සම්මා සමාධි යන මේ අංග අටින් යුක්ත වූ ප්‍රතිපත්ති ක්‍රමය **දුඃඛ නිරෝධ ගාමිනී ප්‍රතිපදායසී සත්‍ය නම් වේ**.

Non-commercial distribution

# 34. නිර්වාණය ප්‍රත්‍යක්ෂ කිරීම

" **නිබ්බාණ සච්ඡකිරියාච** " යනුවෙන් වදාරණ ලද මංගල ධර්මයෙහි නිර්වාණයයි දැක්වෙනුයේ අර්හත් ඵලයයි. සකල දුඃඛයන්ගේ ක්ෂයය වූ ලෝකෝත්තර නිර්වාණ ධාතුව " **අරියසච්චාන දස්සනං** " යනුවෙන් ම දක්වන ලදී. චතුරාර්‍ය්‍ය සත්‍යයන් අතුරෙන් දුඃඛ නිරෝධාර්‍ය්‍ය සත්‍යය යනු ඒ නිර්වාණයයි.

එක භවයක ස්කන්ධන් නිරුඬවන කල්හි තවත් ජාතියක ඉපදවීමෙන් සංසාර දුඃඛයෙන් සත්ත්වයාට මිදෙන්නට නොදී, භවයෙන් භවය සම්බන්ධ කොට ස්කන්ධ පඤ්චක සංඛ්‍යාත දුඃඛ පරම්පරාව ඇති කරවන බැවින් තෘෂ්ණාව වාණ නම් වේ. වාණ යයි කියන ලද තෘෂ්ණාවෙන් නික්මුණු බැවින් සකල දුඃඛයන්ගේ ක්ෂයය වූ අසංඛත ධාතුව නිබ්බාණ නම් වේ. නිර්වාන යනු සකු බසින් එයට ව්‍යවහාර කරන නාමයයි. සිංහල බසින් ඊට නිවන යයි කියනු ලැබේ.

අර්හත් ඵලයට පැමිණිය හැකි වනුයේ ද තෘෂ්ණාව සම්පූර්ණයෙන් මතු නූපදනා ආකාරයෙන් නැති කිරීමෙනි. ඒ අර්හත් ඵලයට තෘෂ්ණාවට සම්පූර්ණයෙන් අවිෂය වූවකි. අර්හත් ඵලයට පැමිණියහු කෙරෙහි ද තෘෂ්ණා ලේශයකුදු නැත. සංස්කාරයන් කෙරෙහි හා භවයන් කෙරෙහි රහතුන් වහන්සේලාගේ බැඳීමක් නැත. එබැවින් අර්හත් ඵලයට ද " නිබ්බාණ " යන නාමය යෙදේ.

අර්හත් මාර්ගයෙන් නිරවශේෂයෙන් තෘෂ්ණාව ක්ෂය කරනු ලැබේ. තෘෂ්ණා ක්ෂයයෙන් දුඃඛක්ෂය වේ. අර්හත් ඵලය වනාහි අර්හත් මාර්ගයෙන් තෘෂ්ණාව ක්ෂය කළාට පසු ඇතිවන්නා වූ ධර්මයකි. එබැවින් එය අර්හත් මාර්ගය සේ මහත් වූ අර්ථයක් සිද්ධ

Non-commercial distribution

කරන්නා වූ ධර්මයක් නොවේ. එහෙත් රහතන් වහන්සේලාට වර්තමාන භවයෙහි සුව විඳීම පිණිස හේතු වේ. එබැවින් එද උතුම් මංගල ධර්මයක් වන්නේය.

අර්හත් මාර්ග ඵල දෙකින් අර්හත් මාර්ගය රජකෙනකුගේ පළමු ඔටුනු පැළඳවීම මෙන් ද, අර්හත් ඵලය ඒ ඔටුන්න නැවත නැවත පැළඳීම මෙන්ද දත යුතුය. මනුෂ්‍ය තෙමේ පළමු ඔටුනු පැළඳවීමෙන් රජවේ. පළමු ඔටුන්න පසු පසුව පැළඳවීමෙන් රජ තෙමේ අලංකාර වේ. එමෙන්ම අර්හත් මාර්ගක්ෂණයෙහි ම ක්ලේශ ප්‍රහාණයෙන් සකල දුඃඛයන් නිවා ගත්තේ වේ. පසුව නැවත නැවත ඇති වන්නා වූ අර්හත් මාර්ගය හා සදෘශ වූ අර්හත්ඵලය ඒ රහතන් වහන්සේට මේ ආත්මයෙහි සැප විහරණය පිණිස වන්නේය. අර්හත් ඵලයට පැමිණි රහතන් වහන්සේට ලැබෙන ඒ ශාන්ත සැපයෙහි තත්ත්වය යම්තම් වත් සිතා ගැන්මට හැකිවන පිණිස නිවන පිළිබඳව සුලු විස්තරයක් දක්වනු ලැබේ

## නිර්වාණය පිළිබඳ විස්තර

සකල බෞද්ධයන්ගේ ම පරමාර්ථය වූ ( උසස් බලාපොරොත්තුව වූ ) නිර්වාණය වනාහි පෘථුවි වෘක්ෂ පර්වතාදිය මෙන් සටහනක් ඇත්තා වූ හෝ කර්මාදි ප්‍රත්‍යයන්ගෙන් හටගන්නා වූ හෝ ධර්මයක් නොවේ. නිත්‍යවෑ පවත්නා හෙයින් සියලු කල්හි ම එකාකාරව පවත්නා ධර්මයකි. එහෙයින් එහි ජාති ජරා මරණාදි කිසිවක් නැත. අතීතාදි කාලභේදයක් නැත. ලෝකත්‍රය ඉක්ම පැවති හෙයින් ලෝකෝත්තර වූවකි. දිව්‍ය ලෝක බ්‍රහ්මලෝකයන් මෙන් ම කාම සැපයෙන් පිරී ගිය ස්ථානයක් ද නො වේ. මෙලොවෙහි හෝ පරලොවෙහි නො වන බැවින් යම් කිසි දිසාවක දේශයක නො පිහිටියා වූ ධර්මයකි. සකල සත්වයන්ගේ ම නිළීයනස්ථානය වූව ද තමා කෙරෙහි එකද සත්ත්වයකු නැත්තා වූ ධර්මයකි. බොහෝ සත්ත්වයන් පැමිණෙන නමුත් ඔවුන්ගේ පැමිණීමෙන් වැඩි වීමක් හෝ නො පැමිණීමෙන්, අඩුවීමක් හෝ නැත්තා වූ ධර්මයකි. එකද සත්වයෙක් තමා කෙරෙහි නැතිව සකල සත්ත්වයන්ගේ ප්‍රතිෂ්ඨාව වූ ධර්මයකි. පරම දුර්දශ ධර්මයකි.

Non-commercial distribution

මෙසේ සාමාන්‍ය ලෝකයාට අවිෂයවූ පරම සූක්ෂ්ම භාවයෙන් පවත්නා වූ නිර්වාණ ධර්මය ස්කන්ධධාත්වායතනනාදි ධර්මයන් පිළිබඳ දැනීම නැත්තා වූ අන්ධ පෘථග්ජනයන් විසින් දත හැකි නොවේ. ස්කන්ධාදි ධර්ම විභාග දන්නා වූ කල්‍යාණ පෘථග්ජනයන්ට අනුමාන වශයෙන් දත හැකි වේ. ආර්‍ය්‍ය පුද්ගලයන්ටම මාර්ගඥාන ඵලඥානයන්ගෙන් ප්‍රත්‍යක්ෂව දැකිය හැකි වේ. කරුණු මෙසේ හෙයින් ලෝකයෙහි පවත්නා දේවල් හා සසඳ බලා එවැනි ස්වභාවයක් නිර්වාණයෙහි නැති බැවින් නිර්වාණය නැති දෙයක් යයි කියත් නම් එය මාළුවාගේ කීමට දෙවැනි නොවන කීමකි.

කලක මාළුවෙක් ඉදිබුවකු ( ඉබ්බකු ) හා මිත්‍රව සිටියේය. කලකට පසු දිනක් මාළුවාට තම යහළුවා හමුවී '' මිතුර, මෙපමණ කලක් කොහි ගියේදැ'' යි ඉදිබුවාගෙන් ඇසී ය. ගොඩට ඇවිදීමට ගියෙමියි ඉදිබු තෙමේ පිළිතුරු දින. ඒ අසා පුදුමයට පත් මාළුවා මිතුර, ගොඩයයි ලෝකයකුත් තිබේද? එය ජලය මෙන් පීනිය හැකි රැළගසන එකක්ද? යනාදින් දියෙහි ඇති ලක්ෂණ දක්වා පැන කීපයක් ම විචාළේය. ඒ හැමට ම ඉදිබුවා නැත නැත යයි ම පිළිතුරු දිණ. එවිට මාළුවා මිතුර! මම ඒ ගොඩ ලෝකය දැන ගතිමි. එය කිසිවක් නැති එකකැයි කීය. එවිට ඉදිබුවා සිනාසී මිතුර, තමුසේ කෙසේ සිතුවත් මට කිසිවක් කළ නොහැකිය. එහෙත් ගොඩක් නම් එකාන්තයෙන් ඇත්තේය. මම ඒ ගොඩටම යමි'' යි කියා සමුගෙන ගමන් ගත්තේය. මේ උපමා කථාවෙහි ගොඩත් දියත් දත් ඉදිබුවා මෙන් සෝවාන් ආදි ආර්‍ය්‍ය පුද්ගලයෝ ලෝකයත් නිර්වාණයත් දනිති. මාළුවා ජලය පමණක් ම දත් බැවින් ගොඩ කුමක්දැයි තේරුම් ගත නොහැකි වූවාක් මෙන් අන්ධ පෘථග්ජනයනට ලෝකෝත්තර නිර්වාණය ලෝකයේ පවත්නා දේ හා සසඳා බැලීමෙන් දත නොහැකි බව දත යුතු.

**උතුම්ම සුවය**

'' **නිබ්බාණං පරමං සුඛං** '' යි වදාළ පරිදි නිර්වාණය උතුම්ම සුවය බව දත යුතුය. එහෙත් එහි විඳිය යුතු කිසි සුවයක් නො මැත්තේ ය. විඳිය යුතු සැපයයි කියන ලද සුඛ වේදනාව

Non-commercial distribution

එක්ෂණයෙහිම බිඳී යන නිස්සාර වූ ධර්මයක් වූ හෙයින් ඒකාන්තයෙන් ම දුඃඛයකි. එහෙයින් බුදුහු සුඛ වේදනාව දුඃඛ සත්‍යයෙහි ම ඇතුළත් කොට වදාළහ. නිර්වාණයෙහි සුඛ වේදනාවක් ඇත යයි කියතහොත් එය නිර්වාණයට නින්දා කිරීමකි. සුඛ වේදනාව දුඃඛස්කන්ධයක් හෙයිනි. නිර්වාණය වනාහි තමා ම ශාන්ති සුඛයක්ව පවත්නා ධර්මයකි. එය අවබෝධ කරගැනීමට වේදයිත සුඛය ශාන්ති සුඛය යන සුඛ දෙවර්ගයේ වෙනස දත යුතු වේ.

**සුඛය** වනාහි වේදයිත සුඛය, ශාන්ති සුඛයයි ද්විවිධ වේ, එයින් තම තමා විසින් ලබාගත් මනුෂ්‍ය දිව්‍ය බ්‍රහ්ම සම්පත් අනුභව කිරීම වේදයිත සුඛ නම්. පැමිණ පවත්නා වූද කල් නො ගොස් පැමිණෙන්නා වූ ද පැමිණේදෝ නො පැමිණේදෝයි තැවෙමින් සිටිය යුතු වූ ද අනිෂ්ට විපත්තීන්ගේ නිවීම **ශාන්ති සුඛ** නම්. මෙයින් වේදයිත සුඛයට වඩා ශාන්ති සුඛය අතිශයින් ශ්‍රේෂ්ඨ වේ. ප්‍රණීත වේ. **වේදයිත සුඛය ද** තම තමාගේ අගයේ ප්‍රමාණයෙන් සතයක් අගනා සුවය, සත දෙකක් අගනා සුවය, රුපියලක් අගනා සුවය, රුපියල් සියයක් දහසක් අගනා සුවය යනාදීන් බොහෝ වෙති. එයින් සතයක් පරිත්‍යාග කොට ලැබිය යුතු වූ නැටුම් ආදියක් බැලීම හෝ මිහිරි ශබ්දයක් ශ්‍රවණය කිරීම හෝ සුගන්ධයක් ආඝ්‍රාණය කිරීම හෝ රසවත් ආහාරයක් අනුභව කිරීම හෝ සුඛ ස්පර්ශ කිරීම හෝ සතයක් අගනා වූ වේදයිත සුවයයි. සෙස්ස ද මේ නයින් දත යුතුය.

**ශාන්ති සුඛය ද** මේ නයින් සතයක් පරිත්‍යාග කොට ලැබිය යුතු ශාන්තිය යනාදි වශයෙන් බොහෝ වෙත්. නමුත් ස්වල්ප වූ එකම ශාන්ති සුඛයත් ප්‍රණීත වූ සිය ලක්ෂ ගණන් වේදයිත සුඛයනට වඩා අගනේය. හිස රුජාවක සුවය අල්ප වූ ශාන්තියකි. යම්කිසි මනුෂ්‍යයකුට වැළඳී තිබෙන හිස රුජාව සුවකර දීමට වෛද්‍යාචාර්‍ය්‍යයන් විසින් රුපියල් ලක්ෂයක් ඉල්ලයි නම් අන් ක්‍රමයකින් ද සුව කර ගත නොහැකි නම් ලක්ෂයක් මුත් පරිත්‍යාග කොට හිස රුජාවේ සුවය ලබාගන්නේය. එසේ ලබාගත් හිස රුජාවේ සුවය ලක්ෂයක් අගනා සුවයකි. යම් කිසි රජකුට හිස රුජාව වැළඳී හිස පැළී යන තරම් දුක් උපදවමින් පවතින කල, එය සකල රාජ්‍ය ම නොදී සුවකළ නොහේ නම් බලවත් හිස රුජාවෙන් පෙළෙමින්

Non-commercial distribution

විඳිනා රාජ්‍ය සම්පත්තියට වඩා හිස රුජාවේ සුවය වූ ශාන්ති සුඛයම උතුම් හෙයින් රාජ්‍යය පරිත්‍යාග කොට හිස රුජා සුවය නමැති ශාන්තිය ලබා ගන්නේමය. එසේ ලබා ගත් ශාන්ති සුඛය රාජ්‍යයක් අගනේය. රාජ්‍යයක ඇති වේදයිත සුඛයන්ගේ ප්‍රමාණයක් නැත්තේය. මෙසේ අප්‍රමාණ වූ වේදයිත සුඛ පරිත්‍යාගයෙන් එකම ශාන්ති සුඛයක් ලැබිය යුතු හෙයින් ශාන්ති සුඛයේ ශ්‍රේෂ්ඨත්වය දත යුතු.

මෙසේ රාජ්‍යයක් පමණ අගය ඇති හිසරුජා සුවය වූ ශාන්ති සිය දහස් ගණනකට වඩා එකම මරණයක නිදහස වූ ශාන්තිය අගනේය. මේ සත්ත්වයෝ සංසාරයෙහි සැරිසරමින් සිටියොත් එක එක සත්ත්වයකුට පැමිණෙන මරණයන්ගේ සංඛ්‍යාවක් නැත්තේය. අසංඛෙය්‍ය අප්‍රමෙය්‍ය මරණ පැමිණෙත්. නිවනට පැමිණි සත්ත්වයාට පැමිණි වහාම අනන්ත මරණයන්ගෙන් නිදහස නමැති ශාන්තිය ලැබේ. එක මරණයකින් නිදහස් වීමේ අගය මෙතෙකැයි පිරිසිඳිය නොහේ නම් අනන්තාපරිමාණ මරණයන්ගෙන් නිදහස් වීමේ අගය කෙසේ පිරිසිඳිය හැක්කේ ද? නො හැක්කේමය. සංසාරයෙහි වාසය කරන්නා වූ සත්ත්වයනට පැමිණෙන්නා වූ මරණ දුඃඛයෙන් අන්‍ය වූ අපාය දුඃඛාදි අප්‍රමාණ දුඃඛයෝ වෙත්. ඒ සියල්ලන්ගේ නිවීම නමැති ශාන්ති සුඛය නිර්වාණයයි. එහෙයින් **නිර්වාණය** අවේදයිත සුඛ ස්වරූපයෙන් පවත්නා ධර්මයක් යයි දත යුතු. **අවේදයිත සුඛය** යනු ඉන්ද්‍රියයන් ගේ ආධාරයෙන් විඳිය නො හැකි සුවයකි. මනුෂ්‍ය දිව්‍ය බ්‍රහ්ම යන ත්‍රිවිධ ලෝක වාසී සකල සත්ත්වයන් විසින් විඳිනු ලබන්නා වූ සකල ලෞකික සම්පත්තියම නිවනට පැමිණි එක පුද්ගලයකු ලැබූ ශාන්තියෙන් ලක්ෂයෙන් කොටසකුදු නො වටනේමය. එහෙයින් නිර්වාණය ම පරම සුඛය බව දත යුතු. ඒ උතුම් නිර්වාණ සුඛය ලබා ගැනීමට උත්සාහ කටයුතු.

Non-commercial distribution

## 10 වන ගාථාව

**ඵුට්ඨස්ස ලොක ධම්මෙහි - චිත්තං යස්ස න කම්පති,**
**අසොකං විරජං ඛෙමං - එතං මංගල මුත්තමං**

**යස්ස**, යමකුගේ: **චිත්තං**, සිත: **ලොක ධම්මෙහි**, ලාභාලාභාදි ලෝක ධර්මයන් විසින්: **ඵුට්ඨස්ස**, පහරණ ලද්දේ: **න කම්පති**, කම්පා නොවේද හෙවත් නොසැලේද: **අසොකං**, ශෝක රහිත වේද: **විරජං**, රාගාදි රජස් රහිත වේද: **ඛෙමං**, චතුරෝසයෙන් මුක්ත වූයෙන් බිය රහිත වේද: **එතං**, මේ සතර කාරණය: **උත්තමං**, උතුම් වූ: **මංගලං**, මඟුල් සතරක් වන්නේය.

මේ ගාථාවෙන් ද මඟුල් සතරක් වදාරණ ලදි. ඒ මෙසේය :-

1. **ලාභාලාභාදි අෂ්ට ලෝක ධර්මය නිසා කම්පා නො වන සිත් ඇති බව.**
2. **ශෝක නැත්තා වූ සිත් ඇති බව.**
3. **රාගාදි රජස් රහිත සිත් ඇති බව.**
4. **චතුරෝස භයින් මිදුණු සිත් ඇති බව** යන මොවුහුයි.

*Non-commercial distribution*

## 35. අෂ්ට ලෝක ධර්මයෙන් කම්පා නොවීම

ලෝක ධර්මයෝ නම් බුදු පසේ බුදු මහරහතුන් පවා නොහැර සියල්ලන් වෙත පැමිණ ලෝකය අභිභවනය කරමින් පවත්නා වූ ධර්මයෝය. ඒ ධර්මයෝ අටදෙනෙක් බව තථාගතයන් වහන්සේ විසින් මෙසේ වදරණ ලදී :-

**''ලාභො අලාභො අයසො යසො ච**
**නින්ද පසංසාච සුඛංච දුක්ඛං**
**එතෙ අනිච්චා මනුජෙසු ධම්මා**
**අසස්සතා විපරිණාම ධම්මා''**

ලාභොච, ධන ධාන්‍යාදි වස්තූන් ලැබීමද: අලාභොච, ලැබූ වස්තූන් නැතිවීම හා නොලැබීම ද: අයසො ච, පරිවාර ජනයන් නැතිවීමද:යසොච, පරිවාර ජනයන් ඇති වීමද: නින්ද ච, නින්දච ද: පසංසාච, ස්තුතිය ද: සුඛංච, සැපය ද: දුක්ඛංච, දුකද යන: එතෙ, මේ අෂ්ට ලෝක ධර්මයෝ: මනුජෙසු, මනුෂ්‍යයන් කෙරෙහි: අනිච්චා, අනිත්‍ය වූවෝය: අසස්සතා, ස්ථිර නො වූවෝ ය: විපරිණාම ධම්මා, පෙරළෙන ස්වභාවයෝය - යනු ගාථාවෙහි අර්ථයි.

මේ ගාථාවෙන් දැක්වෙන අෂ්ටලෝක ධර්ම මෙසේයි.

**1 ලාභ** :- රන් රිදී මුතු මැණික් ගෙවල් වතු කුඹුරු යාන වාහන ආදී වස්තූන් ලැබීම.

**2. අලාභ** :- වස්තුව නොලැබීම හා ලැබූ වස්තුව වියදම් වීමෙන් හෝ සතුරු පීඩා ආදි අන් කාරණයකින් හෝ නැති වී යාම හෙවත් දුප්පත් වීම.

**3. අයස** :- දූ දරුවන් සහෝදර සහෝදරියන් නෑයන් මිතුරන් ගෙන් වෙන් වීම හෙවත් උපකාරයක් නැති වීම.

Non-commercial distribution

**4. යස** :– දූ දරුවන් සහෝදර සහෝදරියන් නෑයන් මිතුරන් ආදි පක්ෂ ජනයන් ඇති වීම.

**5. නින්ද** :– අවනම්බු ලැබීම

**6. පසංසා** :– ලෝකයාගෙන් ගරු නම්බු ලැබීම

**7. සුඛං** :– නොයෙක් පරිද්දෙන් සැප ලැබීම

**8 දුක්ඛං** :– නොයෙක් දුක් ලැබීම.

**මේ අෂ්ට ලෝක ධර්මය** වනාහි සියල්ලට ම චක්‍රයක් සේ කැරකෙන්නේය. බුදුවරයකුට පවා මෙයින් මිදිය හැකි නොවේ. කෙනෙක් කලෙක බොහෝ වස්තුව ලබා පොහොසත්ව සිට තව කලෙකදී තුබූ වස්තුව හීන වී ඔහු දුප්පතෙක් වෙයි. දුප්පත්ව අමාරුවෙන් කාලය ගත කරන්නාට ද වස්තුව ලැබෙන කාලයක් ද වන්නේය. එකල්හි ඔහු පොහොසතෙක් වේ.

කලෙක කෙනෙක් බොහෝ නෑයන් මිතුරන් පිරිවර කොට ඉසුරුමත්ව වෙසේ. කලෙකදී ඔහු පිරිවරින් පිරිහී කිසිවකු විසින් ගණන් නොගන්නා කෙනෙක් වී හුදකලාව වෙසේ. කිසි ම කටයුත්තකට කිසිවකු නො මැතිව සිටි තැනැත්තාද කලකදී බොහෝ පිරිවර ඇති ඉසුරුමත් කෙනෙක් වේ.

කලෙකදී කෙනෙක් ලෝකයාගේ බොහෝ ගරු නම්බු ස්තුති ලබන්නේය. ඒ කාලයෙහි ඔහුගේ අගුණ පවා ගුණ සේ අන්‍යයෝ වර්ණනා කරති. කලකදී ඔහු ලෝකයාට එපා කෙනෙක් වේ. එදට ඔහුගේ ගුණ පවා අගුණ වේ. කිසිවකු ගෙන් ගරු නම්බු නො ලබන්නා වූ තැනැත්තා ද කලෙක නොයෙක් පරිද්දෙන් ගරු නම්බු ලබන්නේය.

කලෙක අපමණ සැප ඇතිව සිටි තැනැත්තා ද කලෙක මහත් වූ දුකින් පෙළෙන්නේය. දුකින් සිටි තැනැත්තා ද තව කලෙක දෙව් සැප වැනි මහත් සැප ලබන්නෙක් ද වෙයි. මේ ලෝක ධර්මයේ සැටිය. ලෝක ධර්මය මෙසේ පෙරළෙන්නක් බැවින් කිසිවෙක් සැම කල්හි ම එක් පරිද්දෙකින් නොසිටී. එබැවින් භාග්‍යවතුන් වහන්සේ විසින් ලෝක ධර්මයෝ අනිත්‍යයෝ යයි වදාරන ලදී.

Non-commercial distribution

කෙලෙස් දුරු කළා වූ බුදු පසේ බුදු මහරහතන් වහන්සේලා හැර සෙස්සෝ ලෝක ධර්‍මය පෙරළෙන පරිදි තම තමාගේ සිත් ද පෙරළා ගනිති. එහෙත් එහි විශේෂයක් තිබේ.

**ලෝකයෙහි තථාගත ධර්මය දත් තථාගත ධර්මය ඇසුරු කරන්නා වූ පුද්ගලයෝය, ධර්‍මය නොදත් ධර්‍මයෙන් ඈත්ව වාසය කරන්නා වූ පුද්ගලයෝ යයි දෙකොටසකි.** ඒ දෙපක්ෂයෙන් ධර්මය නොදත් ධර්‍මයෙන් ඈත්ව වෙසෙන පුද්ගලයෝ ලෝක ධර්මයාගේ පෙරළීමෙන් මහත් සේ විපර්‍ය්‍යාසයට පැමිණෙති. එයින් ඔවුහු මෙලොව පරලොව දෙකින් ම පිරිහීමට පැමිණෙති. ධර්මය දත් ධර්මය ඇසුරු කරන්නා වූ පුද්ගලයෝ ලෝක ධර්මය පෙරළෙන පමණට ම තම තමාගේ සිත පෙරළා නො ගනිති. ඔවුන්ගේ සිත් සමහර විටකදී පමණක් පෙරළෙති. එසේ පෙරළෙන කල්හිදු ආත්මාර්ථ පරාර්ථයන් සිදෙන සේ දෙලොව වැඩ නැසෙන සේ නො පෙරළෙති.

**ධර්‍මය නො දත් අන්ධ පෘථග්ජන පුද්ගලයාට වස්තු ලාභය වී පොහොසතෙක් වූ කල්හි ඔහු එයින් මත් වෙයි.** ඔහුට තමා අජරාමර වූවකු සේ ද තමාට උසස් තවත් කෙනකු නැති සේ ද තමාට වඩා දැනුම් ඇත්තකු තවත් නැති සේ ද සිතේ. මෙසේ මත් වූ ඔහු රසයෙහි ගිජු වී සතුන් මරා කෑමටත්, මත්පැන් පානයටත්, තිබෙන වස්තුවෙන් තෘප්තියට නො පැමිණ දුර්‍වලයන්ගේ වතු කුඹුරු පැහැර ගන්නටත්, කම් සැපයෙහි ලොල්ව පරඹුවන් දූෂණය කරන්නටත්, ඇතැම් තරුණියන් විපතට පමුණුවන්නටත්, වැඩි මහල්ලන්ට සිල්වතුන්ට ගුණවතුන්ට නැණවතුන්ට හා සෙස්සන්ටත් නිගා කරන්නටත් පටන් ගන්නේය. මෙසේ කොට ඔහු මෙලොව ම අවමානාදියට පැමිණ මරණින් මතු ද අපාගත වන්නේය.

**ධර්‍මය දත් ධර්මය සලකන්නා වූ තැනැත්තා** වනාහි ලාභයක් වූ කල්හි “ මේ වස්තූහු අනිත්‍ය වූවෝය. මා ජීවත්ව සිටියදී හෝ මේ වස්තුව මාගෙන් නැතුව යන්නේය. එසේ නොවුවහොත් කාලක්‍රියාවෙන් මම හෝ මේ වස්තුවෙන් වෙන් වන්නෙමි” යි සලකා ඔහු වස්තු ලාභයෙන් මත් නොවේ. ඔහු නුවණින් ඒ වස්තුව පරිහරණය කෙරේ. ඒ වස්තුවෙන් තමාගේ ආත්මය ද සුවපත් කෙරේ.

Non-commercial distribution

මව්පියන් දූ දරුවන් අසල්වැසියන් සුවපත් කරයි. සිල්වත් ගුණවත් භික්ෂූන් වහන්සේලාට හා දුගී මගී යාචකාදීන්ට දන් දෙයි. මෙසේ කොට මෙලොව ද ප්‍රශංසාවට භාජනව මරණින් මතු ද ස්වර්ග පරායණ වෙයි.

සෑම කල්හිම නො පැවතීම අනිත්‍ය වූ අසාර වූ වස්තුවෙහි ස්භාවයකි. ස්වභාව ධර්මය වූ පරිද්දෙන් වස්තු විනාශ වී අලාභ යයි කියන ලද දුප්පත් කම නමැති ලෝක ධර්මය පෙරළී ආ කල්හි ධර්මයෙන් තොරව විසූ තැනැත්තාගේ ශෝකාග්නිය හෘදයෙන් නැඟී හිස මුදුනෙන් නික්මෙයි. ඔහුගේ උගුර කට වේ ලෙන්නට පටන් ගනී. ඇසින් ඇස් දහර ගලන්නට වෙයි. හිස බර වෙයි. කය වෙව්ලන්නට වෙයි. ශෝකාග්නියෙන් දැවෙන්නා වූ ඔහු වරකදී සුසුම් ලයි. වරකදී නන් දොඩයි. ඔවුන් නිසා මාගේ වස්තුව විනාශ වී යයි වරකදී අනුන් උදෙසා ක්‍රෝධ කරයි. මෙසේ වස්තු හානිය නිසා මෙලොව මහත් වූ දුකට පැමිණ මරණින් මතු ද අපායට යයි.

**ධර්ම ඥානය ඇත්තා වූ සත්පුරුෂයාට** වනාහි මෙසේ ධන හානියක් වුවද ඔහු ධර්මය සලකා ශෝක නො කොට මධ්‍යස්ථ වෙයි. අනුන් කෙරෙහි ක්‍රෝධ නො කරයි. මෙසේ ලාභලාභ දෙක්හිම සම වූ පැවැත්ම ඇත්තා වූ තැනැත්තාට ඒ දෙක අනර්ථය පිණිස නො පවතී. ලාභ වූ කලී ඔහුට අර්ථය පිණිස ම වන්නේය. ලෝක ධර්මයෙන් සිත කම්පා වී යයි කියන ලද්දේ ලාභයෙහි උඩඟුවීම හා අලාභයෙහි ශෝක වීමයි. මේ දෙකෙහි මධ්‍යස්ථභාවය භජනය කිරීම ලෝක ධර්මයෙන් කම්පා නොවීමයි. ඒ කම්පා නොවීම දෙලොව වැඩට හේතු බැවින් උතුම් මංගලයකි.

**ධර්මයෙන් වෙන් වූ තැනැත්තාට** බලවත් ඥාති මිත්‍ර පිරිසක් ඇති කල්හි හේ එයින් උඩඟුව පිරිස ආවුද කොට ගෙන නොයෙක් පව්කම් කරයි. ඒ අපරාධ කරු කෙරෙහි පිරිස කලකිරී ඔහු පිරිස විසින් අත්හළ කල්හි හෝ පිරිස පිරිහී ගිය කල්හි මහත් වූ ශෝකයට පැමිණෙයි. මගේ දරුවා නැති වූයේය, සහෝදරයා නැති වූයේය යනාදීන් මහත් වූ ශෝකයෙන් හේ පෙළෙයි. මෙසේ

Non-commercial distribution

පිරිස නිසා උඩඟුවීම හා තැවීමත් යන දෙකම ලෝක ධර්මය නිසා කම්පා වීමයි.

**ධර්මය දන්නා වූ සත්පුරුෂයා** වනාහි පිරිස ඇති කල්හි ද පිරිසෙහි අනිත්‍යාදිය සලකා නිහතමානීව වෙසෙයි. ඥාති මිත්‍රාදීන් අභාවයට පැමිණි කල්හි අනිත්‍යතාව සලකා ශෝකයෙන් නො තැවී මැදහත් වෙයි. මෙසේ මැදහත්ව සිටීම ලෝක ධර්මයෙන් කම්පා නොවීමය. එය දෙලොව වැඩට හේතු වූයෙන් උතුම් මංගලයකි. නින්ද ප්‍රශංසා දෙකෙහි හා සැප දුක් දෙකෙහි ද කම්පා වන ආකාරය හා කම්පා නොවන ආකාරය යටකී ක්‍රමයෙන් තේරුම් ගත යුතු. ලෝක ධර්මයෙහි සම්පූර්ණයෙන් සිත එක සේ පවත්වා ගැනීම පෘථග්ජනයන්ට නො හැකි දෙයක් වුවද එයින් අධික විපයර්‍යාසයකට නො පැමිණෙන සේ සිත පුරුදු කර නොගත් දුර්වල සිත් ඇතියන්ට දෙලොව වැඩ සාද ගැනීම දුෂ්කරය. එබැවින් ලෝකධර්මයෙහි සිත සමව පැවැත්විය හැකි සේ තම තමාගේ සිත පුරුදු කර ගත යුතු.

Non-commercial distribution

## 36. ශෝක නැත්තා වූ සිත් ඇති බව

" **ශෝකය** " යනු නෑයන් විනාශ වීම නිසා හෝ වස්තුව විනාශවීම නිසා හෝ අන්‍ය වූ දුකක් නිසා හෝ කණගාටුවීම් වශයෙන් ඇතිවන්නා වූ ද්වේෂමූලික චිත්තයන්හි වූ ද්වේෂ චෛතසිකයයි. ද්වේෂ මූලික චිත්තයන් අභිධර්මයෙහි අකුශල චිත්තයන්ට ඇතුළත් කොට වදරන ලද බැවින්, ශෝකය හෙවත් කණගාටු වීම ප්‍රාණඝාතාදි කර්මයන් සේ බරපතල පාපයක් නුවූවද සූක්ෂ්ම වූ පාපයකි. යමක් ගැන කණගාටු වෙමින් සිටින කල කාලක්‍රියා කළහොත් එයින් ද අපායට යා හැකි වේ.

ශෝකවන්නා වූ තැනැත්තාට මෙලොවින් ද පරිහාණියක් මිස ඉන් කිසි යහපතක් නොවේ. එබැවින් කොපමණ මහත් විපතකදී වුවත් ශෝක නොවී සිටීමට ඉගෙන ගත යුතුයි. **මේ කාලයෙහි බොහෝ දෙන** ඇත්ත වශයෙන් ශෝකයක් නැතිවත්, යම් යම් අය මළ කල්හි බොරු ශෝකප්‍රකාශ පත්‍රිකා මුද්‍රණය කරවා විසුරුවා හැරීමෙන් අන්‍යයන්ට ද ශෝක කරන්නට උගන්වති. එය ඉතා නො මැනවි. ශෝක වීමෙහි නිෂ්ඵලතාව තථාගතයන් වහන්සේ නොයෙක් පරිද්දෙන් වදරා තිබේ. ශෝකය මෙලොව පරලොව දෙක්හි ම අනර්ථයට හේතු වන කල්හි එයින් වැළකීම හෙවත් විපතෙහිදී ද මැදහත් විය හැකි බව දෙලොව වැඩට හේතුවන බැවින් **මංගලයකි**.

ශෝක නොවී සිටීම පිණිස ආදර්ශයට ගැනීමට හා ශෝකයෙහි ආදීනවයන් දැනගැනීමට උපකාර වන්නා වූ කථාවක් මෙසේ දත යුතු. පෙර කසී රට බරණැස් නුවර " **ධර්මපාල** " නම් වූ බ්‍රාහ්මණ පවුලක් විය. ඒ ගෙදර මහ බමුණා හා බැමිණිය පුත්‍රයෙක්ය දුවෙක්ය යෙහෙළියක්ය දසියක්ය යි සදෙනෙක් විසූහ. ඒ සියල්ලෝ ම මරණානුස්මෘති භාවනාව කළෝය. **මරණානුස්මෘති භාවනාවය** යනු තමන් හා අන්‍යයන් ඒකාන්තයෙන් මරණයට

Non-commercial distribution

පැමිණෙන බව, සියලු සත්ත්වයන් මරණයට පැමිණිය යුතු බව, ජීවිතයේ අනිත්‍ය බව, නැවත නැවත මෙනෙහි කිරීමයි.

දිනක් බමුණා හා තරුණ වියෙහි සිටි ඔහුගේ පුත්‍රයා ද යන දෙදෙන කුඹුරට ගොස් වැඩ කරන අතර සර්පයකු දෂ්ට කරනු ලැබ පුත්‍රයා කුඹුරේදී ම කාලක්‍රියා කෙළේය. ඒ පුත්‍රයා නම් අප මහ බෝසතාණන් වහන්සේ ය. කාලක්‍රියා කළා වූ හෙතෙම දෙව්ලොව ශක්‍රව උපන්නේය.

බ්‍රාහ්මණ තෙමේ පුත්‍රයා මැරී සිටිනු දැක ඒ සමීපයෙන් යන්නා වූ කෙනකුට කථාකොට නා පිරිසිදු වස්ත්‍ර හැඳ එක් කෙනකුට පමණක් බත ගෙන ගෙයි සිටින සැමට ම කුඹුරට එන ලෙස කියා යැවීය. ඒ පුරුෂයා ද බමුණු ගෙට ගොස් ඒ පණිවිඩය කීවේය. ගෙයි සිටි සියල්ලෝම බමුණාට බත ද ගෙන, කියා යැවූ පරිදි කුඹුරට පැමිණියෝය. බ්‍රාහ්මණයා ද නා පිරිසිදුව බත් කා එහි ම දර රැස්කොට සෙසු නෑයන් සමග පුත්‍රයාගේ ශරීරය දවන්නට පටන් ගත්තේය. සියල්ලෝ ම අනිත්‍ය මෙනෙහි කරමින් ඒ කටයුත්ත සිදු කළෝය. ශෝක කරන්නා වූ හඬන්නා වූ කිසිවෙක් එහි නො වූහ. ශක්‍රව උපන් **බෝසතාණන් වහන්සේ** ද නෑයන් කෙරෙහි අනුකම්පාවෙන් බ්‍රාහ්මණ වේසයෙන් එහි පැමිණ ශෝක නො කරන්නා වූ නෑයන් දැක කියන්නාහු පින්වත්නි! නුඹලා මුවකු මරා දවන්නාහුයයි සිතමි. මට ද මස් ටිකක් දුන මැනව' යි කීහ. එකල්හි බෝසතාණන් වහන්සේගේ පියාණන් වූ බ්‍රාහ්මණයා, පින්වත! අප දවන්නේ මුවකු නොව මළ මිනියකැයි කීයේය. එවිට බෝසතාණෝ මේ මළ තැනැත්තා නුඹලාගේ සතුරකු දැයි විචාළෝය. බ්‍රාහ්මණ තෙමේ "නැත, මේ ඉතා ගුණවත් වූ තරුණ වියෙහි සිටියා වූ මාගේ පුත්‍රයා ය" යි කීවේය. එකල්හි බෝසතාණෝ එසේ නම් නුඹලා කුමක් නිසා නො හඬනාහුදැයි ඇසූහ. බ්‍රාහ්මණ තෙමේ තමන් නොහඬන කාරණය මෙසේ පැවසීය.

උරගොව තචං ජිණ්ණං - හිත්වා ගච්ඡති සංතනුං
එවං සරීරෙ නිබ්භොගෙ - පෙතෙ කාලකතෙ සති
ඩය්හමානො න ජානාති - ඤාතීනං පරිදෙවිතං
තස්මා එතං න රෝදමි - ගතො සො තස්ස යා ගති

Non-commercial distribution

යම් සේ සර්පයා දිරා ගියා වූ පරණ සැව ගලවා දමා යේ ද, එපරිද්දෙන් ම සංසාරයෙහි හැසිරෙන සත්ත්වයා පුරාණ කර්ම ක්ෂය වීමෙන් දිරා ගියා වූ තමාගේ ශරීරය හැර යන්නේය. මරණයට පැමිණීමෙන් මෙසේ ශරීරය නිරර්ථක බවට පැමිණි කල්හි සිත් නැත්තා වූ ඒ ශරීරය දවන දුක හෝ නෑයන්ගේ හැඬීම හෝ නො දන්නේ ය. මළ තැනැත්තාගේ මරණයට අනතුරුව ම අනික් භවයකට ගියේය. ඔහු නෑයන්ගේ හැඬීම ගැන බලාපොරොත්තු නො වන්නේය. එබැවින් මම නො හඬමිය යනු මෙහි අදහසයි.

**ඉක්බිති ශක්‍ර දේවේන්ද්‍ර තෙමේ** බැමිණිය අමතා, පින්වත් බැමිණිය! පුරුෂයන්ගේ සිත ස්වභාවයෙන් ම දැඩි බැවින් නො හඬතත් මව්වරුන්ගේ සිත ඉතා මෘදුය. හුනුවන සුලුය. එහෙත් තී කුමක් නිසා පුත්‍රයාගේ මරණය ගැන නො හඬන්නීදැයි විචාළේය. එකල්හි බැමිණිය ද තමා නොහඬන කාරණය මෙසේ කීවාය.

අනව්හිතො තතො ආග - අනනුඤ්ඤාතො ඉතො ගතො
යථාගතො තථාගතො - තත්ථ කා පරිදෙවනා
ඩය්හමානො න ජානාති - ඤාතීනං පරිදෙවිතං
තස්මා එතං න රොදමි - ගතො සො තස්ස යා ගතී

මෙහි අවුත් මට පුතෙක් වේවායි අපගේ කැඳවීමක් නැතිවම ඔහු මට පුතෙක් වූයේය. අප විසින් පිටත් කරනු නොලැබ ඔහුම පරලොවට ගියේය. යම් සේ ඔහු තමාගේ කර්මය වූ පරිද්දෙන් අපගේ කැඳවීමක් නැතිව මෙලොවට ආයේ ද එසේ ම පරලොවට ගියේය. එසේ ඇති කල්හි ඒ ගැන හැඬීමෙන් කිනම් ප්‍රයෝජනයක්ද? ප්‍රයෝජනයක් නැත. ඉදින් අප හැඬුවත් මේ දැවෙන්නා වූ තැනැත්තා ඒ අපගේ හැඬීම නො දන්නේය. ඔහු මරණය සමග කර්මානුකූලව යම් කිසි තැනකට ගියේය. එබැවින් මම ශෝක නො කරමිය - යනු අදහසයි.

මවු බැමිණිය මෙසේ තමා නො හඬනා කාරණය කී කල්හි බමුණු වෙසින් සිටි ශක්‍ර දේවේන්ද්‍රයෝ එතැන සිටි තවත් ස්ත්‍රියකට

Non-commercial distribution

කථාකොට මේ දවනු ලබන තැනැත්තා තිට කවරෙක් වේදැයි විචාළෝය. ඇය මාගේ වැඩිමහලු සහෝදරයා යයි කී කල්හි සහෝදරයා මළ කල්හි තී කුමක් නිසා නො හඬන්නී දැයි විචාළෝය. එකල්හි නැඟනිය ද තමා නො හඬන කාරණය මෙසේ කීවාය.

සචෙ රොදෙ කිසා අස්සං - තත්ථ මෙ කිං ඵලං සියා
ඤාති මිත්තා සුහජ්ජානං - භීයො නො අරතී සියා
ඩය්හමානො න ජානාතී - ඤාතීනං පරිදේවිතං
තස්මා එතං න රොදමි - ගතො සො තස්ස යා ගති.

ඉදින් අඬන්නෙම් නම් එයින් මම කෘෂ වන්නෙමි. සහෝදරයාගේ මරණයට මා හැඬීමෙන් වන ඵලය කුමක්ද? එයින් මාගේ සහෝදරා නැවත මේ ලෝකයට එන්නේ ද නොවෙයි. සුගතියට හෝ යන්නේ ද නොවෙයි. හුදෙක් මාගේ හැඬීම ඤාති මිත්‍රයන්ට වඩ වඩාත් දුක් පිණිස පමණක් වන්නේය. එබැවින් මම නොහඬමි. යනු එහි අදහසයි.

මෙසේ සහෝදරිය පිළිතුරු දුන් කල්හි ශක්‍ර දේවේන්ද්‍රයෝ මළ තැනැත්තාගේ භාර්‍ය්‍යාවගෙන් නො හඬන කාරණය විචාළෝය. එකල්හි බිරිඳ ද මෙසේ කීවාය.

යථාපි දරකො චන්දං - ගච්ඡන්ත මනු රොදතී
එවං සම්පද මෙවෙතං - යො පෙත මනු සොචතී
ඩය්හමානො න ජානාතී - ඤාතීනං පරිදෙවිතං
තස්මා එතං න රොදමි - ගතො සො තස්ස යා ගතී

යමෙක් මළ කෙනකු උදෙසා හඬා නම් එය අහසෙහි යන සඳ මඬල ඉල්ලා හඬන ළදරුවකුගේ හැඬීම වැනිය. දවනු ලබන තැනැත්තේ නෑයන්ගේ හැඬීම නො දන්නේය. ඔහු කම් වූ පරිදි පරලොව ගියේය. එබැවින් ඒ තැනැත්තා ගැන මම ශෝක නොකරමිය යනු අදහසයි.

ඉක්බිති ශක්‍ර දේවේන්ද්‍රයෝ දසියගෙන් නො හඬනා කාරණය විචාළෝය. **දසියද** මෙසේ කීවාය.

Non-commercial distribution

යථාපි බ්‍රහ්මෙ උදකුම්භො -භින්නො අප්පටි සන්ධියො
එවං සම්පද මෙවෙතං - යො පෙත මනු සොචති
ඩය්හමානෝ න ජානාති - ඤාතීනං පරිදෙවිතං
තස්මා එතං න සොචාමි - ගතො සො තස්ස යා ගතී

බ්‍රාහ්මණය! බිඳුනා වූ වතුර කළය නැවත සන්ධි කළ නො හැක්කේය. මළ තැනැත්තා ද නැවත ඉපදවිය හැක්කේ නොවේ. ඉපදවිය නො හැකි වූ මළ අයකු උදෙසා හැඬීම නම් බිඳුණු කළය ගැන හැඬීම වැනිය. අපි කොපමණ හැඬුවත් අපගේ හැඬීම, දවනු ලබන තැනැත්තා නො දන්නේය. ඔහු කම් වූ පරිද්දෙන් යා යුතු තැනකට ගියේය. එබැවින් මම ඒ කාරණය ගැන නො හඬමි.

**ශක්‍ර දේවේන්ද්‍රයෝ** ඔවුන් පස්දෙනා කී ධර්ම කථා අසා සතුටුව නුඹලා මරණානුස්මෘතිය භාවනා කර තිබෙන පරිදි යහපත් යයි ඔවුන් සැමට ම ස්තුති කොට මෙතැන් පටන් නුඹලා විසින් ගොවිතැන් කොට දුක් ගැනීමට කම් නැත යයි කියා ඔවුන්ගේ ගෙය වස්තුවෙන් පුරවා දෙව්ලොවට ම ගියෝය. ඒ ගෙයි ඉතිරි වූ පස්දෙනා දිවි ඇතිතාක් දනාදි පින්කම් කරමින් සිට ආයු කෙළවර දෙව් ලොවට ගියෝ ය.

මේ කථාව ආදර්ශයට ගෙන යම්කිසි විපතක් වූ කල්හි ශෝක නො කොට නො හඬා සිටීමට පුරුදු කර ගත යුතුය. කෙනකු මළ කල්හි බොහෝ දෙන හඬති. ස්ත්‍රීහු වැඩියෙන් හැඬීම කරති. එය ඉතා ලාමක සිරිතකි. නුවණ මඳ කම නිසා කරන්නකි. සමහරු තමාට වූ පාඩුව නො ඉවසිය හැක්කේ හඬති. ඒ අතර ම තවත් සමහරෙක් බොරුවට ද හඬති. එය ඉතා අමනෝඥ ක්‍රියාවකි. මළ කෙනකු නිසා නො හඬා සිටීම සමහරු අගෞරවයක් සේ සලකති. හැඬීම මළවුන්ට කරන ගෞරවයක් හෝ සැලකිල්ලක් නොවන බැවින් ඒ හිස් කල්පනාව තම තමා කෙරෙන් තුරන් කර ගත යුතු.

Non-commercial distribution

## 37. රාගාදි රජස් රහිත සිත් ඇති බව

සත්ත්වයන්ගේ ප්‍රකෘති චිත්තය වනාහි ඔප නැඟූ මාණික්‍යයක් සේ බබලන්නා වූ ශුද්ධ වස්තුවකි. ග්‍රීෂ්ම කාලවලදී මහපොළොවෙන් නැඟ වාතය හා එක්ව ඒ ඒ තැනට පැමිණ ඇඳ පුටු මේස අල්මාරි වස්ත්‍රාභරණ ආදි භාණ්ඩයන් කිලිටි කරන්නා වූ ධූලි සේ සත්ත්වයන්ගේ සිත් කිලිටි කරන්නා වූ වසාගන්නා වූ ධූලි වර්ගයක් ඇත්තේය. එනම් රාග ද්වේෂ මෝහ මානාදි **ක්ලේශයෝය**. මේ රාගාදි ධූලි වනාහි බඩු කිලිටි කරන ධූලි මෙන් පිටතින් පැමිණෙන්නාහු නොව ඒ ඒ සත්ත්වයන්ගේ සිත්හිම හටගන්නා වර්ගයෙකි.

ධූලියෙන් වැසුන කල කොපමණ අලංකාර භාණ්ඩයක වුවත් අලංකාරය නැති වන්නාක් මෙන්, කොපමණ බැබළීම ඇති භාණ්ඩයක් වුවත් අඳුරු වන්නාක් මෙන්, රාගාදි ධූලි හටගැනීමෙන් සිත ද අපවිත්‍ර බවට අඳුරු බවට පැමිණේ. එතැන් සිට සත්ත්වයා අන්ධයකු සේ ක්‍රියා කරයි. ඔහුට ගරු කළ යුත්තා කවිද? ගරු නො කළ යුත්තා කවිද? කළ යුත්ත කුමක්ද, නො කළ යුත්ත කුමක්ද, කුමක් කිරීම වැඩ දයකද, කුමක් කිරීම අවැඩ පිණිස පවතීද යන බව නො පෙනේ. මෙසේ අන්ධයකු මෙන් වූ පුද්ගලතෙමේ කොපමණ නීච නින්දිත ක්‍රියාවක් වුවත් කරන්නේය. කොපමණ දරුණු ක්‍රියාවක් වුවත් කරන්නේය. එබැවින් සිත්හි රාගාදි ධූලි නැති බව **උතුම් මංගලයක්** වන්නේය.

**සිත්හි රාගාදි ධූලි ඇති වීමෙහි ආදීනවයෝ බොහෝය. මහබෝසත් කුසරජතුමාගේ සිත් තුළ** ප්‍රභාවතී දේවිය නිසා ඇති වූ රාගය නිසා එතුමාට තමා දඹදිව අගරජ බව නො පෙණුනේය. එතුමා ප්‍රභාවතී නිසා මදු රජුගේ ගෙදරට ගොස් තමාගේ තත්ත්වයට කිසිසේත් නොගැලපෙන්නා වූ අරක්කැමිකම සත් වසක් මුළුල්ලෙහි

Non-commercial distribution

කෙළේය. රජ කෙනකුව සිටියත් ස්ත්‍රියක නිසා අනුන්ගේ ගෙයකට ගොස් මෙහෙවර කිරීම කොපමණ ලාමක ක්‍රියාවක්ද? රාගයේ බලය නිසා එතුමාට එය කොහෙත්ම නො පෙණුනේය. රාගය නමැති ධූලියෙන් සිත වසාගත් කල්හි කුසරජතුමා වැනි මහෝත්තමයන්ටත් මෙසේ සිදුවන කල ඒ රාගය නිසා සෙස්සන්ට කිනම් විපතක් සිදු නොවේද? අහෝ රාගයේ භයානකත්වය.

**භයානක වූ මේ රාගය නිසා** ඇතැම් කාන්තාවෝ බලාපොරොත්තුව සිටි පෙම්වතා නො ලැබීමෙන් වස කා මැරෙති. ඇසිඩ් බී මියෙති. දියේ පැන මැරෙති. එල්ලී මැරෙති. උමතු වෙති. ඇතැම් පුරුෂයෝ ද පෙම් බැඳ සිටි කාන්තාව නො ලද කල එසේම සිය දිවි හානි කර ගනිති. මව්පියන් පවා මරති. සහෝදර සහෝදරියන් මරති.

**රාගය නිසා භාර්‍යාවගෙන් ආත්ම සතරකම මැරුම් කෑ පුරුෂයෙක්**

ඇතැම් පුරුෂයෝ රාගය නිසා තමන් ඇලුම් කරන්නා වූ ස්ත්‍රීන් විසින් මරනු ලැබ විනාශ වෙති. **පෙර එක් පුරුෂයෙක්** තමාගේ වැඩි මහලු සහෝදරයාගේ භාර්‍යාව හා අනාචාරයෙහි හැසුරුණේය. ඒ ස්ත්‍රියට ද ස්වකීය පුරුෂයාට වඩා ඔහු ම ප්‍රිය විය. දිනක් ස්ත්‍රිය ඒ පුරුෂයාට කියන්නී, පින්වත! අපගේ මේ රහස හෙළි වී නම් අප දෙදෙනාට ම වන්නේ මහත් නින්දවකි. ඊට පළමු නුඹගේ සහෝදරයා මරවයි කීය. මෙසේ තුන් වරක්ම ඒ ස්ත්‍රිය ඇවිටිලි බස් කී පසු රාගයෙන් අන්ධ වූ හෙතෙම සිය සොහොයුරා නැසීය.

භාර්‍යාව කෙරෙහි පැවති රාගය (ඇල්ම) නිසා ඒ මැරුම් කෑ පුරුෂයා ද තම ගෙදර මහ ගැරඩියෙක්ව උපන. ගැරඩියා ඒ ස්ත්‍රිය සිටින තැන් වලට ගොස් ඇය මතු පිට වැටෙන්නේය. වැටී ඇගේ පටලැවෙන්නේය. ඉක්බිති ස්ත්‍රිය මේ ගැරඩියා මළ පුරුෂයා ම විය යුතු යයි සිතා ගැරඩියා ද මැරවීය. ගැරඩියා මැරී ස්ත්‍රිය කෙරෙහි ආලයෙන් ම තම ගෙදර බල්ලෙක් විය. ඒ බල්ලා ද කුඩා කල පටන් ම ස්ත්‍රිය පසු පස්සේ යන්නට විය. මේ දුටු අසල් වැසියෝ සරදම්

Non-commercial distribution

කරන්නට වූහ. ඉක්බිති ස්ත්‍රිය මේත් ඒ පුරුෂයාම විය හැකි යයි සිතා බල්ලා මැරවූවාය. බල්ලා මැරී ස්ත්‍රිය කෙරෙහි ආලයෙන් තම ගෙදර **වසු පැටවෙක්ව** උපන. ඒ වස්සා ද පෙර සේම ඒ ස්ත්‍රිය පසු පස්සේ ම යන්නට විය. අසල් වැසියෝ එයට ද සරදම් කළහ. ඉක්බිති ස්ත්‍රිය මේත් ඒ පුරුෂයා ම යයි සිතා වස්සා මැරවූවාය. මෙසේ තමන් ඇලුම් කරන ස්ත්‍රිය විසින් සතර වාරයක් ම මරණු ලැබ ද ඒ කාලකන්නි සත්ත්වයාට ඈ කෙරෙහි පවත්නා ඇල්ම අතහැර යන්නට නුපුළුවන් වී නැවත ඒ ස්ත්‍රියගේ කුසයෙහි ම උපන්නේය.

මෙසේ රාගය නිසා තමා ඇලුම් කරන ස්ත්‍රිය ගෙන්ම සතර වරක් මැරුම් කැවාක් මෙන්ම රාග නමැති ධූලිය නිසා බොහෝ පුරුෂයෝ තමා ඇලුම් කරන ස්ත්‍රීන් අතින් ම මැරුම් කති. තවත් නොයෙක් ගැහැට ද ලබති. ඒ නිසා අන්‍යයන්ගෙන් ලැබෙන දුක් කරදරවල ද ප්‍රමාණයක් නැත. අපායෙහි වැටී විඳින්නට වන දුක් වල ද ප්‍රමාණයක් නැත. එබැවින් රාගාදි සියලු කෙලෙසුන් තබා රාගය නමැති මේ එකම ධර්මය තමා තුළ ඇතිවෙන්නට නොදී සිත රැකගැනීම මහත් වූ මංගලයකි. සෙතකි.

**ද්වේෂය රාගයට ද වඩා භයානක බැව්.**

සිතෙහි හටගන්නා වූ සිත වසාගන්නාවූ රාගය නමැති ධූලිය හෙවත් රජස පහසුවෙන් දුරු කළ හැක්කක් නොවේ. එය ජාති බොහෝ ගණනක් යන තුරුත් පවතී. නුමුත් රාගයෙන් කිලිටු වූ සිත් ඇත්තේ, ආත්මාර්ථ පරාර්ථ නාශක රෞද්‍ර ක්‍රියාවලට එතරම් ඉක්මන් නොවේ. **ද්වේෂය** නමැති රජසින් කිලිටි වූ සිත් ඇත්තේ එසේ නොවේ. ඔහු අනුන්ට පහර දීමට අනුන් නැසීමට ඉක්මන් වේ. නුමුත් එය පහසුවෙන් දුරුකර ගත හැකි වේ. ක්‍රෝධය හට ගත් කල්හි ඉක්මන් නොවී එය දුරු වන තෙක් ඉවසීමට පුරුදු පුහුණු කර ගත යුතුයි. එසේ පුරුදු කර ගැනීමෙන් ද්වේෂය නිසා වන්නා වූ අනර්ථයන්ගෙන් දුරු විය හැකිය. එසේ නො වුවහොත් එය රාගයට ද වඩා විපත්තිකරය.

පෙර බරණැස් නුවර **කිතවාස** නම් රජහට නපුරු පුත්‍රයෙක් විය. දුෂ්ට කුමාරයා යනු ඔහුගේ නමය. ඔහු උප රජකම ද ලබා

Non-commercial distribution

සිටියේය. ඔහු කුඩා කලැ කවද නමුත් පැන් නොලබා මිය යන බව බමුණෝ කීහ. කිතවාස රජ කුමාරයා පැන් නොලබා මිය යතියි බියෙන් නුවර තැනින් තැන විශාල පොකුණු තනවා තැබීය. මංසන්ධිවල ද ලොකු පැන් සැල් පිහිට විය. දිනක් ඒ කුමරා උයනට යනුයේ අතරමඟ පිඬු සිඟා වඩනා පසේ බුදුන් වහන්සේ නමක් දිටීය.

ඔහු පිරිවරා ගිය ජනයෝ පසේ බුදුන් වහන්සේට වඳින්නට පුදන්නට වූහ. මානය නමැති ධූලියෙන් හා මෝහය නමැති ධූලියෙන් කිලිටි වූ සිත් ඇති ඒ කුමරාගේ සිත ද්වේෂය නමැති රජසින් වසා ගත්තේය. කුමරා මොවුහු මා වැනි රජකු සමග යද්දී මා ගැන නො සලකා මේ මහණාට වඳිතියි පුදතියි පසේ බුදුන් කෙරෙහි කිපී, ඇතු පිටින් බැස පසේ බුදුන් අතේ වූ පාත්‍රය උදුරා ගෙන බිම දමා පයින් ගසා පොඩි කොට තව තවත් පාගා සුණු විසුණු කෙළේය.

පසේ බුදුන් වහන්සේ මේ අඥ සත්ත්වතෙම තමා විනාශ කර ගත්තේ යයි අනුකම්පාවෙන් ඔහු දෙස බැලූසේක. එවිට කුමරා කියනුයේ මහණ! කිතවාස රජුගේ පුත්‍රවූ දුෂ්ට කුමාරයා නම් මමය. නුඹ කිපී ඔරවා බලා මට කුමක් කරන්නෙහිදැයි කීය. පසේ බුදුන් වහන්සේ අහසට පැන නැගී වාසස්ථානය වූ **නන්දමූල** නම් ලෙනට වැඩි සේක. දුෂ්ට කුමාරයාගේ දුෂ්ට ක්‍රියාවෙන් එදින උන්වහන්සේට අහර නැති විය. උන්වහන්සේ වැඩිය වහාම යුව රජුට ඒ පාපකර්මය විපාක දෙන්නට විය.

නිරපරාධී වූ බුදු පසේබුදු මහරහතන් වහන්සේලා කෙරෙහි කරන්නා වූ අපරාධයෝ බොහෝ සෙයින් එවෙලේ ම විපාක දෙති. යුව රජුට නැවත ඇතු පිටට නගින්නට නුවූයේය. ගිනිමැලයක ලූවාක් මෙන් ඔහුගේ ශරීරය දැවෙන්නට විය. ඔහු දැවෙනවාය දැවෙනවා යයි කෑ ගාමින් එතනම ඇද වැටුණේය. අසල තිබූ පැන් සැල්වල පැන් සිඳිණ. ඔහුට පෙවීමට පැන් බිඳකුදු සොයා ගත නොහැකි විය. හෙතෙම එතැනම වියළී කලුරිය කොට අවීචියෙහි උපන්නේය.

දුෂ්ට කුමාරයාට වූයේ කිව නොහැකි තරම් විශාල විපතකි. මේ විපත වූයේ මානය ද්වේෂය මෝහය යන රජස් වලින් ඔහුගේ

Non-commercial distribution

සිත කිලිටි වූ බැවිනි. ඔහුගේ සිත මානාදි කෙලෙස් රජස් තට්ටුවෙන් වැසී තුබූ බැවින් පසේ බුදුන් වහන්සේ තමාට වඩා උත්තමයකු බව තමා විසින් වැඳිය යුත්තකු බව නො පෙණුනේය. එබඳු උත්තමයන් කෙරෙහි නො කිපිය යුතු බව අපරාධ නො කළ යුතු බව ඔහුට නො පෙණුනේය. එබඳු උත්තමයන්ට කරන්නා වූ ස්වල්ප වූ ද අපරාධය මහා සාවද්‍ය බව ද එයින් නරකයෙන් නො මිදිය හැකි බව ද ඔහුට නො පෙණුනේය.

රාග ද්වේෂ මෝහ මානාදි කෙලෙස් රජස්වලින් සිත අපවිත්‍ර කරගෙන සිටියහොත් කා අතින් වුවත් මේ දුෂ්ට කුමාරයාට සිදු වූ දෙයට සමාන වූ දේ සිදුවීමෙන් දෙලොව වැඩ විනාශ විය හැකිය. එබැවින් තම තමාගේ දෙලොව වැඩ සිදුකරගනු කැමති සියල්ලෝ ම කෙලෙස් රජස්වලින් සිත කිලිටි කර නො ගැනීමට උත්සාහ කෙරෙත්වා!

Non-commercial distribution

# 38. චතුර්යෝග භයින් මිදුණු සිත් ඇති බව

මේ වූ කලී මංගල ධර්ම වදාළ අවසාන ගාථාවෙහි ප්‍රකාශිත සිව්වැනි කරුණ වූ මේ මංගල ගාථාවෙහි අටතිස් වැනි මංගල යයි. **එහි චතුර්යෝග නම්** :– 1. කාම යෝග, 2. භව යෝග, 3. දෘෂ්ටි යෝග, 4. අවිද්‍යා යෝග යන මොවුහුයි. **කාමයෝගය** යනු රූප ශබ්ද ගන්ධ රස ස්පර්ශ යන පංච කාමය පිළිබඳ වූ ආශාවය. **භවයෝගය** යනු භවය කෙරෙහි හෙවත් ස්වකීය ආත්මය කෙරෙහි ආශාවය. **දෘෂ්ටි යෝගය** යනු තෙවැදෑරුම් නියත මිථ්‍යාදෘෂ්ටිය, දෙසැට මිථ්‍යාදෘෂ්ටිය, විසිවැදෑරුම් සත්කාය දෘෂ්ටිය යන මේ මිථ්‍යාදෘෂ්ටිහුය. **අවිද්‍යායෝගය** යනු චතුරාර්‍ය්‍ය සතය වසන්නා වූ මෝහයයි. මෙසේ යෝග සතරක් වුවත් කාම යෝග භව යෝග යන මේ දෙකින්ම දක්වනුයේ ලෝභය ම හෙයින් කොටින් කියතහොත් ලෝභය, දෘෂ්ටිය, මෝහයයි කියා යෝගයෝ තිදෙනෙකි.

**යෝගයන් සත්ත්වයා දුකෙහි යොදවන බැව්**

ගැලවෙන්නට නොදී සත්ත්වයා නැවත නැවත සංසාර දුඃඛයෙහි යොදවන බැවින් මේ ධර්මයෝ තිදෙන යෝග නම් වූහ. චිත්ත සන්තානයෙහි යෝගයන් ඇතිතාක් සත්ත්වයාහට අපාය භයින් ද මිදිය හැකි නොවේ. ජාති ජරා මරණාදි සංසාර භයින් ද මිදිය හැකි නොවේ. එසේ ම ඔහු මිනිස් ලොවැ මිනිසකුව සිටියත්, දෙව් ලොව දෙවියකුව සිටියත්. බඹලොවැ බඹෙකුව සිටියත් ඔහු අපාය භයින් මිදුනෙක් නො වේ. අපායෝප්පත්තියට බීජ වූ යෝගයන් ඇත්තා වූ සත්ත්වයා හට කොතැනක ඉපද සිටියත් ඒ තැන්වලින් චුතවී නැවත අපායට පැමිණීමට ඉඩ තිබේ. බඹලොවින් චුතව ගම් ඊරියක් වූ **සූකරපෝතිකාවගේ** කථා පුවත මෙහිලා

Non-commercial distribution

හොඳ නිදසුනකි. (එය දම් පියා අටුවාවෙන් හෝ සද්ධර්ම රත්නාවලියෙන් හෝ බලා දතයුතු.)

මෙසේ යෝගයන් ප්‍රහාණය නො කළා වූ සියල්ලෝ ම භවාග්‍රයට පැමිණ සිටියත් නැවත අවීචි මහා නරකයට ද පැමිණෙති. එබැවින් යෝගයන් ගේ පැවැත්ම මහත් වූ භයකි. එසේ භය ජනක වූ කාමාදි යෝගයන්ගේ නැති බව **උතුම් මංගලයකි**. එහි අගයද ප්‍රමාණ කළ නොහේ.

නිරවශේෂයෙන් යෝගයන් ප්‍රහාණය කිරීම තබා යම්කිසි එක යෝගයක තාවකාලික වූ ප්‍රහාණය ද මහත් වූ මංගලයකි. පෙර දඹදිවැ සේවත්‍ය නුවරැ **"පායාසි රාජඤ්ඤ"** නම් වූ අධිපතියෙක් විය. ඔහු නියත මිථ්‍යාදෘෂ්ටිකයෙකි. "පරලොවක් නැත. පිනක් පවක් කියා දෙයක් නැත." යනු ඔහුගේ බලවත් විශ්වාසය විය. මෙබඳු දෘෂ්ටිය ඇති තැනැත්තාත් ඒ දෘෂ්ටිය අත් නොහැර කාලක්‍රියා කළහොත් ඒකාන්තයෙන් නරකයෙහි උපදී

**මවු මැරීමය, පියා මැරීමය, රහතන් මැරීමය. බුදුවරයකුගේ ඇගේ ලේ සෙලවීමය, සංඝයා භේද කිරීමය යන මේ පස පඤ්චානන්තරිය කර්ම නම්**. එයින් යම් කිසි කර්මයක් කළ අය ඒකාන්තයෙන් මරණින් මතු නරකයෙහි උපදී. කල්පයක් තුළ නරකයෙහි පැසී කල්පාන්තයෙහි නරකයෙන් මිදේ. **නියත මිථ්‍යාදෘෂ්ටිය ගත් තැනැත්තා** වනාහි කල්පාන්තයෙහි ද නරකයෙන් නො මිදේ. එය එපමණ බරපතල වූ පාපයකි.

එහෙත් පායාසි රාජඤ්ඤ මෙසේ නපුරු දෘෂ්ටිය ගෙන සිටින කාලයේදී **කුමාර කාශ්‍යප** ස්ථවිරයන් වහන්සේ වෙත පැමිණ ඔහු ත.මාගේ ලබ්ධිය උන්වහන්සේට සැලකළේය. කුමාර කාශ්‍යප ස්ථවිරයන් වහන්සේ ඔහුට නොයෙක් හේතු උපමාවන් ගෙන හැර පා මනහර ධර්මදේශනාවක් කළහ. ඒ ධර්මය ඇසීමෙන් පායාසි රාජඤ්ඤගේ මිථ්‍යාදෘෂ්ටිය පහ විය.

ඔහු දෘෂ්ටි බන්ධනයෙන් මිදී සම්‍යක් දෘෂ්ටියෙහි පිහිටා ශ්‍රමණ බ්‍රාහ්මණාදීන්ට දන් දෙන්නට විය. ප්‍රකෘතියෙන්ම අශ්‍රද්ධාවත් වූ හෙතෙමේ දන් දෙනුයේ ද නො මනා කොට දුන්නේය. ප්‍රතිග්‍රාහකයන්ගේ

Non-commercial distribution

මන දොළ පුරවා ප්‍රණීත ආහාර පානයෙන් සංග්‍රහ නො කෙළ්ය. වස්ත්‍ර දෙන්නේ ද ඉතා ස්වල්ප කොට දුන්නේය. එබැවින් ඔහුට මහත් වූ යස ඉසුරු ඇතිව දෙව් ලොව උපදින්නට නුපුළුවන් විය. එහෙත් චාතුර්මහාරාජික දිව්‍ය ලෝකයෙහි කිසිවකු නැති පාළු දිව්‍ය විමානයක ඔහු උපන්නේය.

එය ද ඔහුට මහත් වූ මංගලයකි. ඉදින් දෘෂ්ටිය අත නොහැර ඔහුට කලුරිය කරන්නට වී නම් තිබුණේ අවීචි මහ නරකයට පැමිණ කපක් මුළුල්ලෙහි දුක් විඳීමටය. එයින් නිදහස් වූයේ දෘෂ්ටිය අත්හළ හෙයිනි. මෙසේ තදංග වශයෙන් වුව ද යෝගයන් ප්‍රහාණය කොට යෝග භයින් මිදීම මහත් වූ මංගලයකි. එබැවින් සසර දුකින් මිදෙනු කැමැත්තන් විසින් තම තමන් තුළ පවත්නා කාමාදි යෝගයන් දුරු කිරීමට උත්සාහ කළ යුතු.

## දේශනාව නිම කිරීම

**ඉක්බිති බුදුන් වහන්සේ :–**

**ඵතාදිසානි කත්වාන -**
**සබ්බත්ථ මපරාජිතා**
**සබ්බත්ථ සොත්ථිං ගච්ඡන්ති -**
**තං තෙසං මංගල මුත්තමන්ති**

යන මංගල සූත්‍රයෙහි අවසාන ගාථාවෙන් ''යම් සත්ත්ව කෙනෙක් යට දැක්වූ තිස් අටක් වූ උතුම් මංගල ධර්මයන් පූරණය කෙරෙත් ද, ඔවුහු සියලු තන්හි පරාජය නොවී සැපයට පැමිණෙත්. එහෙයින් ඔවුනට ඒ අට තිස් මඟුල් උතුම් මඟුල් වෙතියි '' ද වදරා මංගල සූත්‍රය අවසන් කළ සේක.

**සූත්‍ර දේශනාවගේ අවසානයෙහි** කෝටි ලක්ෂයක් දේවතාවෝ අර්හත් ඵලයට පැමිණ නිවන් දුටුවෝය. සෝවාන් සකෘදගාමි අනාගාමි යන යට මාර්ග ඵලයන්ට පැමිණි දේවතාවන්ගේ ප්‍රමාණයක් නැත්තේය. ඒ සියල්ලෝ ම භාග්‍යවතුන් වහන්සේගේ මංගල ධර්ම දේශනාවට සතුටු වී උන්වහන්සේ ද වැඳ එහි ම අතුරුදහන් වූහ.

Non-commercial distribution

රාත්‍රියෙහි මංගල සූත්‍රය දෙවියන්ට වදරා, පසුදින **තථාගතයන් වහන්සේ** අනඳ තෙරුන් අමතා ආනන්දය! මේ රාත්‍රියෙහි එක්තරා දිව්‍ය පුත්‍රයෙක් මා කරා අවුත් මංගල ප්‍රශ්නය විචාළේය. ඔහුට මම අටතිසක් මඟුල් දක්වා දහම් දෙසීමි''යි වදරා. ආනන්ද ස්ථවිරයන් වහන්සේට ද මේ මංගල සූත්‍ර ධර්මය වදාළ සේක. අනඳ තෙරුන් විසින් තථාගතයන් වහන්සේ වදාළ පරිදි ඒ මංගල සූත්‍ර ධර්මය භික්ෂූන්ට ද උගන්වන ලදුව අද දක්වා ම එම ධර්මය පැවත එන්නේය.

පින්වත් සත්පුරුෂයෙනි! කල්ප ශතසහශ්‍රයෙනුදු අති දුර්ලභ වූ සකලාර්ථ සංසිද්ධියට හේතු වූ මේ මංගල ධර්ම මාර්ගය ආදරයෙන් උගෙන එහි පැවතීමෙන් සසර දුක් ගිනි නිවා, සකල බුද්ධ, ප්‍රත්‍යෙක බුද්ධ. අග්‍රශ්‍රාවක, මහා ශ්‍රාවකාදි ආර්‍යයන් වහන්සේ විසින් පැමිණ වදළා වූ අජරාමර ලෝකෝත්තර නිර්වාණ අභය පුරයට පැමිණීමට උත්සාහ කටයුතු.

**සකල ලෝකයාට උතුම් වූ**
**මංගලයක් වේවා!**

Non-commercial distribution